

ලංකා විදුලිබල මණ්ඩලය

# වාර්ෂික වාර්තාව 2020



# පටුන


| | |
|---|---|
| අපගේ ඉදිරි දැක්ම, අපගේ මෙහෙවර හා සාරධර්ම | 1 |
| අපගේ පාරිසරික ප්‍රතිපත්තිය | 2 |
| බැලූ බැල්මට | 3 |
| විශේෂ අවස්ථා | 4 |
| අතීත කාර්ය සාධනයන් | 5 |
| ආයතනික තොරතුරු | 6 |
| සංවිධාන ව්‍යුහය | 8 |
| අනු-ආයතනද සහිත ලං.වි.ම. ආයතනික ව්‍යුහය - 2020 | 10 |
| සභාපතිතුමාගේ සමාලෝචනය | 12 |
| සාමාන්‍යාධිකාරීතුමාගේ සමාලෝචනය | 14 |
| ලං.වි.ම. සම්ප්‍රේෂණ පද්ධතිය | 16 |
| මෙහෙයුම් සමාලෝචනය | 17 |
| ජනන අංශය | 17 |
| සම්ප්‍රේෂණ අංශය | 26 |
| බෙදාහැරීමේ අංශ | 35 |
| ව්‍යාපෘති අංශය | 46 |
| වත්කම් කළමනාකරණ අංශය | 57 |
| ආයතනික ක්‍රමෝපාය අංශය | 64 |
| අනෙකුත් ශාඛා / ඒකක සහ සිදුවීම් | 71 |
| අවදානම් සමාලෝචනය | 79 |
| තිරසාරභාවය පිළිබඳ වාර්තාව | 83 |
| ආයතනික සමාජ වගකීම් වාර්තාව | 85 |
| මූල්‍ය අංශය සහ මූල්‍ය තොරතුරු | 87 |
| අධ්‍යක්ෂකවරුන්ගේ වාර්තාව | 100 |
| ලාභ හෝ අලාභ ප්‍රකාශනය | 103 |
| විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය | 104 |
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය | 105 |
| සමූහය - ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය | 106 |
| මණ්ඩලය - ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය | 108 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශනය | 109 |
| මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන් | 110 |
| විගණකාධිපති වාර්තාව (සමූහ මූල්‍ය ප්‍රකාශන) | 173 |
| විගණකාධිපති වාර්තාවට පිළිතුරු | 180 |
| විගණකාධිපති වාර්තාව (ලංවිම මූල්‍ය ප්‍රකාශන) | 191 |
| විගණකාධිපති වාර්තාවට පිළිතුරු | 200 |
| කෙටි යෙදුම් | 217 |

## අපගේ දැක්ම

සසිරිමත් දිවියකට
විදුලිය

## අපගේ මෙහෙවර

අපගේ සාරධර්මයන්ට
අනුගත වෙමින් සමස්ත
ශ්‍රී ලංකාවට කාර්යක්ෂම
සමායෝජිත සහ සකසුරුවම්
විදුලිය සැපයුමක්
සංවර්ධනය කර
පවත්වාගෙන යාම

## අපගේ සාරධර්ම

ගුණාත්මක බව
ජාතියට සේවා සැලසීම
කාර්යක්ෂමතාව සහ ඵලදායිතාව
කැපවීම
සුරක්ෂිත බව
වෘත්තීය නිපුණතාව
තිරසාර බව





# අපගේ පාරිසරික ප්‍රතිපත්තිය

ලංකා විදුලිබල මණ්ඩලය එහි සියලු වාණිජ ක්‍රියාකාරකම් ඉටු කරන්නේ ස්වභාවික පරිසරය සහ මිනිසා විසින් නිර්මිත පරිසරය ආරක්ෂා කරමින්, සංවර්ධනය සඳහා චිරස්ථායි දායකත්වයක් ලබා දෙමිනි. පාරිසරික ප්‍රශ්න සම්බන්ධයෙන් විවෘතව කටයුතු කිරීම මගින් මහජනතාව, පාරිභෝගිකයන්, අධිකාරීන්, සේවකයන් සහ අයිතිකරුවන් තුළ අපගේ ක්‍රියාකාරකම් සම්බන්ධ විශ්වාසයක් ඇති කිරීමට අපි බලාපොරොත්තු වෙමු. අපගේ ක්‍රියාකාරකම් සඳහා පාරිසරික වැදගත්කමින් යුත් කරුණු අන්තර්ගත කර ගැනීම සහ අනුකලනය සඳහා වූ ප්‍රතිපත්තියක් අපි ක්‍රියාශීලී ලෙස අනුගමනය කරමු.

# බැලූ බැල්මට



සමාරම්භය
**1969**



ශුද්ධ ජනනය
**15,714**
ගි.වො.පැ.

සේවකයන්
**25,624**





පිරිවැය
**21.21**
රු./කි.වො.පැ.



අලෙවි කරන මිල
**16.72**
රු./කි.වො.පැ.

ජල විදුලි ධාරිතාවය
**1,383**
මෙ.වො.



තාප ධාරිතාවය
**2,168**
මෙ.වො.





සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බල ශක්තිය ධාරිතාවය
**715**
මෙ.වො.



වහළ මත සවි කරන විදුලි පද්ධති ධාරිතාවය
**275**
මෙ.වො.

පාරිභෝගික ගිණුම්
**6,636,266**



ආදායම
ශ්‍රී ලං.රු.මි.
**238,911**

අලෙවි පිරිවැය
ශ්‍රී ලං.රු.මි.
**302,949**



# විශේෂ අවස්ථා

## "තම්බපවණි" සුළං විදුලිබල ව්‍යාපෘතිය විවෘත කිරීම...

ශ්‍රී ලංකාවේ පුනර්ජනනීය බලශක්ති සංවර්ධනයේ සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් රටේ විශාලතම සුළං විදුලිබල ව්‍යාපෘතිය වන "තම්බපවණි" 2020 දෙසැම්බර් මස 8 වන දින බලගන්වන ලදී. මෙමගින් ෆොසිල ඉන්ධන බැහැර කරමින් පවිත්‍ර විදුලිය නිෂ්පාදනය කිරීමෙහි ලා ලං.වි.ම.හි පවත්නා කැපවීම තහවුරු කරන ලදී.

මෙම ප්‍රධාන ව්‍යාපෘතියේ මෙ.වො. 30ක කොටස ජාතික ජාලය වෙත සම්බන්ධ කරමින් මන්නාරම සුළං ගොවිපල පළමු අදියර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අග්‍රාමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් විවෘත කරන ලදී.




මෙ.වො. 103.5

වසරකට ගි.වො.පැ. 400

රු./ කි.වො.පැ. 8.00

## විශිෂ්ටත්වය වෙනුවෙන් CEBAssist සම්මානයෙන් පුද ලබයි...

CEBAssist යෙදවුම වෙනුවෙන් රජය හා රාජ්‍ය නොවන සංවිධාන යටතේ එන හොඳම අංකිත හැකියාගත නිෂ්පාදනය/සේවාව හා 2018/19 අංකිත අති විශිෂ්ටත්වය සඳහා වූ SLT Zero One සම්මාන ප්‍රදානෝත්සවයේදී හොඳම ජංගම යෙදවුම සඳහා වූ සම්මානයද පිරිනමන ලදී.

## මෙම වසංගත සමය තුළ දවස පුරා විදුලි සැපයුම සහතික කරන ලදී...

කොවිඩ් 19 වසංගත සමය තුළ පවා ලං.වි.ම. විසින් දවසේ පැය 24 පුරා විදුලි සැපයුම සහතික කරන ලදී. ලං.වි.ම. සේවක මහතුන් විසින් මෙහිලා දක්වන ලද කැපවීම හා දායකත්වය ඇගයිය යුතුවේ.





# අතීත කාර්ය සාධනයන්



| | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| දළ බලශක්ති ජනනය (ගි.වො.පැ.) | 11,528 | 11,801 | 11,962 | 12,423 | 13,154 | 14,249 | 14,773 | 15,985 | 16,556 | 16,392 |
| සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය* (ගි.වො.පැ.) | 725 | 736 | 1,179 | 1,217 | 1,467 | 1,160 | 1,464 | 1,832 | 1,761 | 1,866 |
| උපරිම ඉල්ලුම (මෙ.වො.) | 2,163 | 2,146 | 2,164 | 2,152 | 2,283 | 2,453 | 2,523 | 2,616 | 2,669 | 2,717 |
| විදුලිය අලෙවිය (ගි.වො.පැ.) | 10,023 | 10,474 | 10,621 | 11,063 | 11,786 | 12,785 | 13,431 | 14,091 | 14,611 | 14,286 |
| පාරිභෝගික ගිණුම් (සංඛ්‍යාව) | 4,717448 | 4,979,862 | 5,210,761 | 5,417,532 | 5,648,132 | 5,964,194 | 6,193,131 | 6,354,281 | 6,500,641 | 6,636,266 |
| පද්ධතිමය බලශක්ති හානිය (%) | 11.72 | 11.24 | 11.14 | 10.91 | 10.40 | 10.28 | 8.45 | 8.34 | 8.23 | 9.08 |
| ආදායම (ශ්‍රී ලං.රු.මි.) | 132,460 | 163,513 | 194,147 | 202,645 | 188,684 | 206,811 | 218,450 | 229,571 | 242,950 | 238,911 |
| සාමාන්‍ය විකුණුම් මිල (රු./කි.වො.පැ.) – (අ) | 13.21 | 15.56 | 17.93 | 18.50 | 16.00 | 16.18 | 16.26 | 16.29 | 16.63 | 16.72 |
| අලෙවි ලක්ෂයයේදී සාමාන්‍ය පිරිවැය (රු./කි.වො.පැ.) – (අ) | 16.21 | 23.66 | 16.94 | 20.00 | 15.07 | 18.08 | 20.34 | 19.12 | 24.12 | 21.21 |
| වසර තුළ විදුලියනය කළ නිවාස (සංඛ්‍යාව) | 206,909 | 225,707 | 198,484 | 178,300 | 198,166 | 277,038 | 181,627 | 118,077 | 108,315 | 98,829 |

* - සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය - (කුඩා ජලවිදුලි, සුළං, සූර්ය, ඩෙන්ඩ්‍රෝ, ජෛවස්කන්ධ හා නාගරික අපද්‍රව්‍ය)

(අ) - තාවකාලික

# ආයතනික තොරතුරු

## නෛතික ස්වභාවය

ලංකා විදුලිබල මණ්ඩලය (ලං.වි.ම.) යනු 1969 අංක 31, 1979 අංක 29 හා 1988 අංක 32 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 17 දරන පාර්ලිමේන්තු පනත මගින් හා 2013 අංක 31 දරන පනත මගින් සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත මගින් ස්ථාපිත, සංස්ථාපිත මණ්ඩලයකි.

## අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්

**සභාපති**

| | |
|---|---|
| ඉංජි. එච්.එම්. විජිත හේරත් මහතා | 23.12.2019 සිට |

**උප සභාපති**

| | |
|---|---|
| වයි.ජී.අයි. සමන් කුමාර මහතා | 30.01.2020 සිට |
| | 14.12.2020 දක්වා |
| එන්.එස්. ඉලංගකෝන් මහතා | 16.12.2020 සිට |

**සාමාජික/ක්‍රියාකාරී අධ්‍යක්ෂ**

| | |
|---|---|
| එන්.ඒ. රන්ජිත් මහතා | 16.01.2020 සිට |
| | 24.04.2020 දක්වා |

## මහා භාණ්ඩාගාරය නියෝජනය කරන සාමාජික

| | |
|---|---|
| එස්.ඩී. ජූඩ් නිලුක්ෂාන් මහතා | 13.01.2020 සිට |

**සාමාජිකයෝ**

| | |
|---|---|
| එම්.එම්. නයිමුදීන් මහතා | 17.01.2020 සිට |
| බී.කේ. ජගත් පෙරේරා මහතා | 14.01.2020 සිට |
| ඒ.එච්.කේ. ජගත් චන්ද්‍රසිරි මහතා | 26.02.2020 සිට |
| | 30.09.2020 දක්වා |
| එල්.පී. ප්‍රේමසිරි මහතා | 07.10.2020 සිට |
| ආර්. වික්‍රමාරච්චි මහතා | 24.04.2020 සිට |

**අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්**

එච්.ආර්.පී. පත්බේරිය මහත්මිය (වැඩ බලන)

**සාමාන්‍යාධිකාරී**

| | |
|---|---|
| ඉංජිනේරු එස්.ඩී.ඩබ්. ගුණවර්ධන මහතා | 24.01.2020 දක්වා |
| ඉංජිනේරු ඩී.ඩී.කේ. කරුණාරත්න මහතා | 25.01.2020 සිට |
| | 06.12.2020 දක්වා |
| ඉංජිනේරු එන්.ඩබ්. කේ. හේරත් මහත්මිය | 07.12.2020 සිට |

## ආයතනික කළමනාකරණය

**අතිරේක සාමාන්‍යාධිකාරී (ජනන)**

| | |
|---|---|
| ඉංජිනේරු පී.එල්.ජී. කාරියවසම් මහතා | 19.04.2020 දක්වා |
| ඉංජිනේරු එච්.එම්.ඒ. හේරත් මහතා | 20.04.2020 සිට |

**අතිරේක සාමාන්‍යාධිකාරී (සම්ප්‍රේෂණ)**

| | |
|---|---|
| ඉංජිනේරු (ආචාර්ය) එම්.එන්.එස්. පෙරේරා මහතා | 02.11.2020 දක්වා |
| ඉංජිනේරු එම්.එම්.එස්.එම්.කේ. ගුණරත්න මහතා | 03.11.2020 සිට |

**අතිරේක සාමාන්‍යාධිකාරී (බෙ.අ. 1)**

| | |
|---|---|
| ඉංජිනේරු ඩී.ඩී.කේ. කරුණාරත්න මහතා | 24.01.2020 දක්වා |
| ඉංජිනේරු එන්.ඩබ්.කේ. හේරත් මහත්මිය | 25.01.2020 සිට |
| | 06.12.2020 දක්වා |
| ඉංජිනේරු ජේ. මීගොඩ මහතා | 07.12.2020 සිට |

**අතිරේක සාමාන්‍යාධිකාරී (බෙ.අ. 2)**

| | |
|---|---|
| ඉංජිනේරු එම්.ඒ.ඩී.එන්. ශ්‍රේෂන් මහතා | 07.10.2020 දක්වා |
| ඉංජිනේරු එම්.එම්.එස්.එම්.කේ ගුණරත්න මහතා | 08.10.2020 සිට |
| | 02.11.2020 දක්වා |
| ඉංජිනේරු ටී.ඒ.කේ. ජයසේකර මහත්මිය | 03.11.2020 සිට |

**අතිරේක සාමාන්‍යාධිකාරී (බෙ.අ. 3)**

| | |
|---|---|
| ඉංජිනේරු ආර්.කේ. පියදාස මහතා | 23.10.2020 දක්වා |
| ඉංජිනේරු ජේ. මීගොඩ මහතා | 24.10.2020 සිට |
| | 06.12.2020 දක්වා |
| ඉංජිනේරු ජේ. නන්දකුමාර් මහතා | 07.12.2020 සිට |

**අතිරේක සාමාන්‍යාධිකාරී (බෙ.අ. 4)**

| | |
|---|---|
| ඉංජිනේරු එම්.ආර්. රණතුංග මහතා | 04.02.2020 දක්වා |
| ඉංජිනේරු ජී.ඒ.ඩී.ආර්.පී. සෙනෙවිරත්න මහතා | 05.02.2020 සිට |

**අතිරේක සාමාන්‍යාධිකාරී (වත්කම් කළමනාකරණ)**

| | |
|---|---|
| ඉංජිනේරු එච්.එම්.ඒ. හේරත් මහතා | 19.04.2020 දක්වා |
| ඉංජිනේරු කේ.කේ.එස්. දසනායක මහතා | 20.04.2020 සිට |

**අතිරේක සාමාන්‍යාධිකාරී (ආයතනික ක්‍රමෝපාය)**

| | |
|---|---|
| ඉංජිනේරු එන්.ඩබ්.කේ. හේරත් මිය | 24.01.2020 දක්වා |
| ඉංජිනේරු (ආචාර්ය) ඩී.සී.ආර්. අබේසේකර මහතා | 25.01.2020 සිට |

**අතිරේක සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති)**

| | |
|---|---|
| ඉංජිනේරු එම්.කේ.සී.එන්.කේ. අමරසිරි මහත්මිය | 04.02.2020 දක්වා |
| ඉංජිනේරු එම්.ආර්. රණතුංග මහතා | 05.02.2020 සිට |

**මූල්‍ය කළමනාකරු**

ටී.කේ. ලියනගේ මහතා



# සංවිධාන ව්‍යුහය 2020



නි.සා. (ව්‍යාපාර හා මෙහෙයුම් ක්‍රමෝපාය)
නි.සා. (ආයතනික ක්‍රමෝපාය හා නියාමන කටයුතු)
නි.සා. (ක්‍රියාකාරී ක්‍රමෝපාය හා කාර්යක්‍රම ප්‍රවර්ධන)
නි.සා. (තොරතුරු තාක්ෂණ)
නි.සා. (පර්යේෂණ හා සංවර්ධන)
ව්‍යා.අ. (ව්‍යාවසාය සම්පත් සැලසුම් ව්‍යාපෘතිය)

නි.සා. (බලශක්ති විකුණුම්)
නි.සා. (ආයතනික කටයුතු)
නි.සා. (තාපබල සංකීර්ණ)
නි.සා. (වත්කම් කළමනාකරණ තාප විදුලි)
නි.සා. (මහවැලි සංකීර්ණය)
නි.සා. (වත්කම් කළමනාකරණ ජල විදුලි)
නි.සා. (ලක්ෂපාන සංකීර්ණය)
නි.සා. (වත්කම් කළමනාකරණ තාප යාන්ත්‍රික
නි.සා. (වත්කම් කළමනාකරණ ජල යාන්ත්‍රික)
නි.සා. (ජනන ව්‍යාපෘති)
නි.සා. (සමනල සංකීර්ණය)
නි.සා. (වේලි ආරක්ෂණ, පරිසර හා සිවිල් ව්‍යුහ නඩත්තු)
නි.සා. (ජනන ආරක්ෂණ)
බ.ක. (ලක්විජය විදුලි බලාගාරය)
අ.මු.ක. (ජනන)

නි.සා. (බලශක්තිය මිලදී ගැනීම්)
නි.සා. (සම්ප්‍රේෂණ හා ජනන සැලසුම්)
නි.සා. (ආයතනික හා නියාමන සම්බන්ධතා)
නි.සා. (සම්ප්‍රේෂණ මෙහෙයුම් හා නඩත්තු - දකුණ)
නි.සා. (සම්ප්‍රේෂණ මෙහෙයුම් හා නඩත්තු - උතුර)
නි.සා. (වත්කම් කළමනාකරණ හා තත්ත්ව නියාමන)
නි.සා. (පද්ධති පාලන)
නි.සා. (සන්නිවේදන)
නි.සා. (බලශක්ති අලෙවිකරණ)
නි.සා. (සම්ප්‍රේෂණ පාලන හා ආරක්ෂණ)
නි.සා. (පුද්ගලික බලශක්ති සංවර්ධන)
නි.සා. (පුනර්ජනනීය බලශක්ති සංවර්ධන හා කාර්ය සාධන අධීක්ෂණ)
අ.මු.ක. (සම්ප්‍රේෂණ)

නි.සා. (වාණිජ හා ආයතනික)
නි.සා. (ව්‍යාපෘති හා අධිසැර නඩත්තු)
නි.සා. (සැලසුම් හා සංවර්ධන)
නි.සා. (කොළඹ නගර)
නි.සා. (වයඹ පළාත)
නි.සා. (උතුරු මැද පළාත)
නි.සා. (උතුරු පළාත)
නි.සා. (බෙදාහැරීම් සම්බන්ධීකරණ)
ව්‍යා.අ. (කොළඹ වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය)
ව්‍යා.අ. (විදුලි සැපයුම් විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය)
අ.මු.ක. (බෙදාහැරීමේ අංශය 1)

නි.සා. (වාණිජ හා ආයතනික)
නි.සා. (ව්‍යාපෘති හා අධිසැර නඩත්තු)
නි.සා. (සැලසුම් හා සංවර්ධන)
නි.සා. (මධ්‍යම පළාත I)
නි.සා. (මධ්‍යම පළාත II)
නි.සා. (බස්නාහිර පළාත උතුර)
නි.සා. (නැගෙනහිර පළාත)
අ.මු.ක. (බෙදාහැරීමේ අංශය 2)

නි.සා. (වාණිජ හා ආයතනික)
නි.සා. (ව්‍යාපෘති හා අධිසැර නඩත්තු)
නි.සා. (සැලසුම් හා සංවර්ධන)
නි.සා. (බස්නාහිර පළාත දකුණ II)
නි.සා. (සබරගමුව පළාත)
නි.සා. (ඌව පළාත)
අ.මු.ක. (බෙදාහැරීමේ අංශය 3)

නි.සා. (වාණිජ හා ආයතනික)
නි.සා. (ව්‍යාපෘති හා අධිසැර නඩත්තු)
නි.සා. (සැලසුම් හා සංවර්ධන)
නි.සා. (බස්නාහිර පළාත දකුණ I)
නි.සා. (දකුණු පළාත I)
නි.සා. (දකුණු පළාත II)
ව්‍යා.අ. (විදුලක්පාය)
අ.මු.ක. (බෙදාහැරීමේ අංශය 4)

නි.සා. (වත්කම් කළමනාකරණ හා ආයතනික)
නි.සා. (පුහුණු කිරීම්)
නි.සා. (සිවිල් කටයුතු හා ගොඩනැගිලි)
නි.සා. (වැඩපළ හා උපකාරක සේවා)
නි.සා. (වෘත්තීයමය සෞඛ්‍යය හා ආරක්ෂාව)
අ.මු.ක. (වත්කම් කළමනාකරණ)

නි.සා. (සම්ප්‍රේෂණ නිර්මාණ හා පරිසර)
නි.සා. (සම්ප්‍රේෂණ ව්‍යාපෘති)
නි.සා. (සම්ප්‍රේෂණ ඉදිකිරීම් ව්‍යාපෘති)
නි.සා. (ඉංජිනේරු උපදේශන සේවා)
නි.සා. (ආයතනික හා ව්‍යාපෘති සම්බන්ධීකරණ)
ව්‍යා.අ. (ඉහළ කොත්මලේ ජල විදුලි ව්‍යාපෘතිය)
ව්‍යා.අ. (ගල් අඟුරු විදුලිබල ව්‍යාපෘතිය)
ව්‍යා.අ. (පුත්තලම ගල් අඟුරු විදුලිබල ව්‍යාපෘතිය අදියර II)
ව්‍යා.අ. (පුත්තලම ගල් අඟුරු විදුලිබල ව්‍යාපෘතිය අදියර II ස.බ. හා සේ.ස.)
ව්‍යා.අ. (බ්‍රෝඩ්ලන්ඩ්ස් ජල විදුලි ව්‍යාපෘතිය)
ව්‍යා.අ. (උමා ඔය ජල විදුලි ව්‍යාපෘතිය)
ව්‍යා.අ. (මහ කොළඹ සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ හානි අවමකරණ ව්‍යාපෘතිය)
ව්‍යා.අ. (මොරගොල්ල ජල විදුලි ව්‍යාපෘතිය)
ව්‍යා.අ. (ජාතික සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ ජාල සංවර්ධන සහ කාර්යක්ෂමතා ප්‍රවර්ධන ව්‍යාපෘතිය)
ව්‍යා.අ. (හරිත විදුලිබල සංවර්ධන හා බලශක්ති කාර්යක්ෂමතා ප්‍රවර්ධන ආයෝජන ව්‍යාපෘතිය - අදියර II)
ව්‍යා.අ. (මන්නාරම සුළං විදුලි ව්‍යාපෘතිය)
ව්‍යා.අ. (ද්‍රව ස්වභාවික වායු)
ව්‍යා.අ. (පුනර්ජනීය බලශක්ති අවශෝෂණ සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය)
ව්‍යා.අ. (විදුලිබල පද්ධති විශ්වසනීයත්වය බලගැන්වීමේ ව්‍යාපෘතිය)
අ.මු.ක. (ව්‍යාපෘති)

අ.මු.ක. (මූලස්ථාන)
අ.මු.ක. (ආයතනික)
අ.මු.ක. (භාණ්ඩාගාර කළමනාකරණ)

නි.සා. (සම්බන්ධීකරණ)
නි.සා. (පිරිස්)
ප්‍රධාන අභ්‍යන්තර විගණක

ප්‍රධාන නීති නිලධාරී

විමර්ශන කළමනාකරු

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

# අනු-ආයතනද සහිත ලං.වි.ම. ආයතනික ව්‍යුහය - 2020





වේවැල්වත්ත කොටුමා උපපොළ

# කළමනාකරණ සමාලෝචනය

# සභාපතිතුමාගේ සමාලෝචනය

"ආයතනයේ මූල්‍ය තත්ත්වයට හානිකර බලපෑමක් ඇති වුවද, ලං.වි.ම. විසින් ගෘහස්ථ කාණ්ඩයේ පාරිභෝගිකයන් වෙත ශ්‍රී ලං.රු. බිලියන 5.9 ක සහනයක් ප්‍රදානය කරන ලදී. රජයේ ප්‍රතිපත්තිමය තීරණයකට අනුව සිය පාරිභෝගිකයන් වෙත වසංගත තත්ත්වයට මුහුණ දීම සඳහා සහාය සලසනු පිණිස විදුලි බිල්පත් පියවීම සඳහා ලං.වි.ම. විසින් සහන කාල පරිච්ඡේදයක් ලබා දුන් අතර, බිල්පත් නොගෙවන ලද ගෘහයන්හි විදුලිය විසන්ධි කිරීමද ප්‍රමාද කරන ලදී."



වසර 2020 වූකලි අමාත්‍ය ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමාගේ මාර්ගෝපදේශකත්වයෙන් ලංකා විදුලිබල මණ්ඩලය ක්‍රියාත්මක වූ පළමු වසර වේ. "රට හදන සෞභාග්‍යයේ දැක්ම" ජාතික ප්‍රතිපත්ති රාමුව හා අනුගතව "පුනර්ජනනීය බලශක්තිය කරා පරිවර්තනය වීමේ" අරමුණ පෙරදැරිව වසර තුළ කටයුතු ශක්තිමත් ලෙස ක්‍රියාත්මක කරන ලද අතර එහි ප්‍රතිඵලයක් ලෙස ලං.වි.ම.හි කාර්යක්ෂමතාවය හා ඵලදායකත්වයද ඉහළ නැංවිණි.

කොවිඩ් - 19 වසංගතයෙහි හානිකර ප්‍රතිඵලයන් මධ්‍යයේ වුව, රටපුරා අඛණ්ඩව දවසේ පැය 24 පුරා විදුලි බලය සැපයීමේ සිය කර්තව්‍යය ලං.වි.ම. විසින් නොකඩවා සිදු කරන ලදී. වාර්තාගත ශුද්ධ ජනනය ගි.වො. පැය 15,714ක් විය. මෙතුළ වසංගතයෙන් වූ බලපෑම නිරූපණය කරමින් පසුගිය වසරට සාපේක්ෂව ජනනයෙහි 1.3% ක අඩුවීමක් පෙන්නුම් කෙරේ. මෙම ජනනයෙන් 0.05% ක් මන්නාරම (තම්බපවනි) සුළං විදුලි බලාගාරයෙන් එක් කෙරිණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අග්‍රාමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා අතින් 2020 දෙසැම්බර් මස 8 වන දින තම්බපවනි ජාතික විදුලිබල පද්ධතියට එක් කෙරිණි.

තම්බපවනිය ජාල අන්තර් සම්බන්ධ කිරීම පහසු කටයුත්තක් නොවීය. පාස්කු ප්‍රහාරය හා කොවිඩ් - 19 වසංගතයද ඇතුළත් බොහෝ විපත් පරයා ඉදිරි ගමනක නිරත වීමට ව්‍යාපෘති බලධාරීන් හට හැකිවිය. සාමාන්‍ය ජන ජීවිතය, සංචාර, සමාජ සම්බන්ධතා සීමා කරනු ලැබ පැවති තත්ත්වයන් මධ්‍යයේ 2020 වර්ෂාවසානයට පළමු අදියර මෙහෙයුම් කටයුතු සාක්ෂාත් කරගැනීම ව්‍යාපෘති බලධාරීන්ගේ කැපවීම නොවන්නට කළ නොහැක්කක් වන්නට ඉඩ තිබිණි. ශ්‍රී ලංකාව තුළ මෙන්ම ඉන් බැහැරවද ආර්ථික කටයුතු නැවතීම් සහ පාලන හා මූල්‍ය කටයුතුවලට සිදුවූ බාධාවන් දරා සිටීමට ආයතනයට සිදුවිය. එසේ වුවද, ලං.වි.ම. සතු හා එය විසින් මෙහෙයවනු ලබන රටේ විශාලතම සුළං විදුලි බලාගාරය ජාතික ජාලයට එක් කිරීමට ආයතනයට හැකිවිය. ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ හා කොන්ත්‍රාත්කරුවන්ගේ කැපවීම අගය කරමි. මෙම සාර්ථකත්වය ඇති කරන ලද්දේ ඔවුන්ගේ කැපවීම තුළිනි.

ගෝලීය උණුසුම් වීමේ ප්‍රතිඵලයන් ක්‍රමානුකූලව අත් වෙමින් පවතී. මින් ශ්‍රී ලංකාවටද මිදී පැවතීමේ හැකියාවක් නොමැත. කාලගුණ රටාවන්ද විපර්යාසයනට බඳුන්ව ඇත. මේවන විට නියං සමයන් කිහිපයකට හෝ අනපේක්ෂිත වර්ෂාපතනයනටද අපි මුහුණ දෙන්නෙමු. වසර ආරම්භයේදී පසුගිය වසර 20 තුළ දක්නට ලැබුණු දෙවන අඩුම ජල ආගලනය වාර්තා විය. 2020 අගෝස්තු හා සැප්තැම්බර් මාසයන් තුළ නිරිත දිග මෝසම ඉතා සක්‍රීයව පැවතිණි. එහි ප්‍රතිඵලයක් ලෙස පසුගිය වසර 20 තුළ ඇතිවූ දෙවන ඉහළම ජල ආගලන ප්‍රමාණයද වාර්තා විය. ඒ අනුව, පසුගිය වසරේ සිට ලං.වි.ම. සතු ජල විදුලි බලාගාරයන්හි ශුද්ධ ජනනය ගි.වො.පැය 127.94ක (3.38 %) අගයක විය. තවද, පසුගිය වසර හා සන්සන්දනාත්මකව ගල් අඟුරු බලාගාරයෙන් ඇති කෙරුණු ශුද්ධ ජනනය ගි.වො.පැය 393.38ක වර්ධනයක් වාර්තා කරන ලද බැවින් මූල්‍ය තත්ත්වය මත ධනාත්මක බලපෑමක් ඇති කරමින් ස්වාධීන විදුලිබල නිෂ්පාදකයන්ගේ දායකත්වය 5.49% කින් පහත වැටිණි.

විවිධාකාර වූ බාහිර අභියෝගයන් මධ්‍යයේ ආයතනය විසින් 2020 වසර තුළ ශ්‍රී ලං.රු. බිලියන 239ක ආදායමක් උපයන ලද අතර, එමගින් 2019 වසර හා සාපේක්ෂව 2% ක ආදායම් පහත වැටීමක් නිරූපණය කෙරිණි. ආදායම පහත වැටීමට ප්‍රධාන කොටම බලපෑ හේතුව වූයේ පැතිරී ගිය කොවිඩ් - 19 වසංගත තත්ත්වයයි. ගෘහස්ථ කාණ්ඩය තුළ ඉල්ලුමේ වර්ධනයක් සිදු වුවද, මෙම වසංගතය පැතිරීම හේතුකොට කර්මාන්ත, පොදුකාර්ය හා හෝටල් කාණ්ඩයන්හි ඉල්ලුම සැලකිය යුතු ලෙස පහත වැටිණි. අභියෝගාත්මක සමාජ හා ආර්ථික තත්ත්වයන් තුළ විදුලි ඒකක ඉල්ලුමද 2% කින් පහත වැටිණි.

රජයේ ප්‍රතිපත්තියක් වශයෙන්, පොදුකාර්ය කාණ්ඩය හැර ගෘහස්ථ හා සෙසු කාණ්ඩයන්හි අඩු පරිභෝජන මට්ටමක පසුවන පාරිභෝගිකයන් හට විදුලිය අලෙවි කිරීමේ අවස්ථාවේදී පවත්නා පිරිවැයට අඩු මිලකට ලං.වි.ම. විසින් විදුලිය ලබාදෙනු ලබයි. එබැවින්, ගෘහස්ථ කාණ්ඩයේ හා පොදුකාර්ය කාණ්ඩයේ ඉහළ පරිභෝජන මට්ටමක් සහිත පාරිභෝගිකයන් හට මෙම

# සභාපතිතුමාගේ සමාලෝචනය

අතිරේක පිරිවැයෙන් කොටසක් දැරීමට සිදුවිය. පසුගිය වසරේ ශ්‍රී ලං.රු.මිලියන 5,827ක් ලෙස පැවති අගය හා සාපේක්ෂව 2020 වසර සඳහා අය කරන ලද සමස්ත අතිරික්තය ශ්‍රී ලං.රු.මිලියන 14,883ක් විය. මෙම වර්ධනය කොවිඩ් - 19 වසංගත සමය තුළ ගෘහස්ථ පාරිභෝගිකයන්ගේ පරිභෝජනයේ ඉහළ යාම හේතුකොට ඇති වූවකි. රජයේ සහනාධාර ප්‍රතිපත්තිය හා යෝජිත අවම පිරිවැය විදුලි ජනන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙහි සිදුවූ ප්‍රමාදය හේතුකොට, ආයතනය විසින් 2020 වසර අවසානය වනවිට ශ්‍රී ලං.රු. බිලියන 62.5ක ශුද්ධ අලාභයක් වාර්තා කරන ලදී. කෙසේ වුවද, 2019 වසර හා සාපේක්ෂව ශුද්ධ අලාභය 36% කින් පහත හෙළමින් අවසන් ප්‍රතිඵලය සමනය කරගැනීමට ආයතනයට හැකිවිය. පසුගිය මූල්‍ය වර්ෂය හා සාපේක්ෂව අලාභයේ සිදුවූ මෙම අඩුවීම ප්‍රධාන වශයෙන් ඉල්ලුමේ වර්ධනය, ඉන්ධන මිල අඩුවීම හා ජල හා ගල් අඟුරු විදුලිබල ජනනයේ වර්ධනයද හේතුකොට සිදුවිය.

ආයතනයේ මූල්‍ය තත්ත්වයට හානිකර බලපෑමක් ඇති වුවද, ලං.වි.ම. විසින් ගෘහස්ථ කාණ්ඩයේ පාරිභෝගිකයන් වෙත ශ්‍රී ලං.රු. බිලියන 5.9 ක සහනයක් ප්‍රදානය කරන ලදී. රජයේ ප්‍රතිපත්තිමය තීරණයකට අනුව සිය පාරිභෝගිකයන් වෙත වසංගත තත්ත්වයට මුහුණ දීම සඳහා සහාය සලසනු පිණිස විදුලි බිල්පත් පියවීම සඳහා ලං.වි.ම. විසින් සහන කාල පරිච්ඡේදයක් ලබා දුන් අතර, බිල්පත් නොගෙවන ලද ගෘහයන්හි විදුලිය විසන්ධි කිරීමද ප්‍රමාද කරන ලදී.

වසංගතයෙන් ඇතිවූ හානිකර බලපෑම් නොතකමින් ලං.වි.ම. විසින් ජාතික විදුලිබල රාමුව හා අනුගතව පුනර්ජනනීය බලශක්ති අරමුණ සාක්ෂාත් කරගැනීම කරා නොකඩවා කටයුතු කරන ලදී. සුළං හා සූර්ය වෝල්ටීයතා බලාගාරයන්ගෙන් මෙ.වො. 210 ක විදුලිය ප්‍රමාණයක් ලබාගැනීම සඳහා ටෙන්ඩර් කැඳවීමට හැකිවිය. මෙයට අමතරව, වසර තුළ මෙ.වො. 48 ක සමස්ත ධාරිතාවයක් සහිත නව සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති බලාගාර 23 ක් මෙහෙවරෙහි යොදවන ලදී. අපද්‍රව්‍ය (නාගරික ඝණ අපද්‍රව්‍ය) තුළින් බලශක්තිය නිපදවීමේ පළමු මහා පරිමාණ ව්‍යාපෘතියද සම්බන්ධ කරන ලදී. මෙම මූලාරම්භයන් මගින් ඉන්ධන විවිධාංගීකරණය තුළින් ආයතනයේ තිරසරබව සඳහා සැලකිය යුතු ධනාත්මක දායකත්වයක් ලබාදෙනු ඇත.

තවද, ලං.වි.ම. විසින් වසර තුළ ආසන්න වශයෙන් ශ්‍රී ලං.රු. බිලියන 37.2 ක වටිනාකමකින් යුත් ව්‍යාපෘති සංඛ්‍යාවක් සිදු කරන ලදී. ඒ අතරින්, බ්‍රෝඩ්ලන්ඩ්ස් මෙ.වො. 35 හා උමා ඔය මෙ.වො. 120 ජල විදුලි ව්‍යාපෘති හා ද්‍රව ස්වභාවික වායු ව්‍යාපෘතිය 2021 වසර වනවිට වාණිජ මෙහෙයුම්කරණය දක්වා ප්‍රගමණය විය. මෙම ව්‍යාපෘති මගින් ජනන පිරිවැය අවම කිරීමෙහි ලා ධනාත්මක දායකත්වයක් ලබාදෙනු ඇත.

හරිත විදුලිබල සංවර්ධන හා බලශක්ති කාර්යක්ෂමතා ප්‍රවර්ධන ආයොජන වැඩසටහන, ජාතික සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ ජාල සංවර්ධන හා කාර්යක්ෂමතා ප්‍රවර්ධන ව්‍යාපෘතිය සහ විදුලිබල පද්ධතිවල විශ්වසනීයත්වය බලගැන්වීමේ ව්‍යාපෘතියද, කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් ඇතිවූ බාධක මධ්‍යයේ වුව, වසර තුළ කටයුතු සම්පූර්ණ කිරීම දක්වා වූ ප්‍රගතියක් අත්කර ගන්නා ලදී. මන්නාරම කොටුමා උපපොළ, මාළිබොඩ කොටුමා උපපොළ, වේවැල්වත්ත කොටුමා උපපොළ හා මාලිබොඩ - පොල්පිටිය සම්ප්‍රේෂණ රැහැන වසර තුළ පිවිතුරු බලශක්ති හා ජාලගත කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය හා පුනර්ජනනීය බලශක්ති අවශෝෂණ සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සාර්ථකව මෙහෙවරෙහි යොදවන ලදී. මෙම ව්‍යාපෘති මගින් පුනර්ජනනීය සංවර්ධනයනට අවශ්‍ය පහසුකම් සලසන ලදී.

විදුලිබල අමාත්‍ය ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමා සහ සූර්යබල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍ය ගරු දුමින්ද දිසානායක මැතිතුමාද විසින් අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලයද සමගින් ලබාදෙන ලද ශක්තිමත් නායකත්වය ලං.වි.ම.ට විපත් මධ්‍යයේ ඉදිරියට ගමන් කරමින් අපගේ අගනා පාරිභෝගික හවතුන් වෙත අත්‍යවශ්‍ය සේවාවක් ලබාදීමට සහායක් විය.

සුදුසුකම් ලත් හා විෂය ධාරා සමූහයක සමත්කම් සහිත අධ්‍යක්ෂ මණ්ඩලයද, කැපී පෙනෙන සාමාන්‍යාධිකාරීවරයෙකු හා කැපවූ හා සේවා ලැදි කාර්ය මණ්ඩලයද නොවන්නට 2020 වසර තුළ ලං.වි.ම.හි කාර්ය සාධනය සාක්ෂාත් කරගැනීමට නොහැකි වන්නට ඉඩ තිබිණි.

අපගේ අනුබද්ධ ආයතන, බැංකුකරුවන් හා ස්වාධීන විදුලි නිෂ්පාදනායතනයන් විසින්ද ලබාදුන් සහාය හා දායකත්වය හඳුනා ගනිමින් ඇගයීම සිදු නොකරන්නේ නම් මාගේ කාර්යය සම්පූර්ණ නොකළා වේ. අඛණ්ඩව ලබාදුන් මූල්‍ය සහාය වෙනුවෙන් අපගේ අරමුදල් සැපයීමේ නියෝජිතායතනයන්, ආසියානු සංවර්ධන බැංකුව, ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය හා චීන කර්මාන්ත හා වාණිජ බැංකුව වෙතද මාගේ කෘතවේදිත්වය පළ කිරීමට මෙය අවස්ථාව කරගනිමි.

අවසන, 2020 වසර පුරා ආයතනයේ ගමන සාර්ථක කරගැනීම සඳහා දායකත්වය ලබාදුන් ඉහළ හා පහළ මට්ටමේ සියලු දෙනා වෙතද කෘතවේදී වෙමි.



**ඉංජිනේරු එච්. එම්. විජිත හේරත්**
සභාපති
ලංකා විදුලිබල මණ්ඩලය

# සාමාන්‍යාධිකාරීතුමාගේ සමාලෝචනය

"වසරේ ප්‍රධානතම සාර්ථකත්වය වූයේ 2020 දෙසැම්බර් මස 8 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අග්‍රාමාත්‍යතුමා විසින් මන්නාරමේ පළමු මහා පරිමාණ සුළං විදුලි බලාගාරය මෙහෙවරෙහි යොදවා විවෘත කිරීමයි. මෙය වූකලී පසුගිය වසර 6ක කාල පරිච්ඡේදය තුළ සම්පූර්ණ කිරීමට හැකිවූ පළමු මහා පරිමාණ විදුලි බලාගාරයයි."



ලංකා විදුලිබල මණ්ඩලයේ (ලං.වි.ම.) සාමාන්‍යාධිකාරීවරයා හා ප්‍රධාන විධායක නිලධාරීවරයා වශයෙන්ද, 2020 වසර තුළ ලං.වි.ම. ප්‍රගතිය/ තත්ත්වය ඇගයීමට කැමැත්තෙමි. ලං.වි.ම. හා රට වෙතද ප්‍රවර්ධිත ප්‍රතිලාභ ගෙන එන ලද පෙර වසරේ බොහෝ කඩඉම් පසු කිරීමෙන් අනතුරුව, තාක්ෂණික කාර්ය සාධනයන්හි අති විශිෂ්ටත්වයකට පත්වීම සඳහා වූ බොහෝ අපේක්ෂා හා ඉලක්ක පෙරදැරිව වසර ආරම්භ වූ අතර, ආයතනයේ වටිනා පාරිභෝගික භවතුන් සමගින් පවත්නා සම්බන්ධය වැඩිදියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී. කෙසේ වුවද, බොහෝ කටයුතුවල ප්‍රගතියට වසංගත තත්ත්වයෙන් බරපතල බලපෑම් එල්ල විය. පෙර නොවූ විරූ මෙකී තත්ත්වය විසින් ඉස්මතු කරවන ලද අභියෝග මධ්‍යයේ වුව, ලං.වි.ම. සේවාවන් මත රඳා පවත්නාවූ අපගේ පාරිභෝගිකයන් වෙත අඛන්ඩ සේවාවක් සැපයීමට ලං.වි.ම.ට හැකිවිය. දැඩි සෞඛ්‍ය මාර්ගෝපදේශයනට අනුගත වෙමින්, ලං.වි.ම.ට එහි සියලු කාර්යාල හා ස්ථාපනයන්ද ක්‍රියාත්මක කිරීමට හැකිවිය. වසර තුළ මුහුණ දෙන ලද දුෂ්කරතාවයන් මධ්‍යයේ වුව, ගෘහස්ථ පාරිභෝගිකයන් විසින් මාර්තු, අප්‍රේල් හා මැයි මාසවලදී සිදුවූ අගුලු දැමීමේ කාල සීමාවන් තුළ පරිභෝජනය කරන ලද අතිරේක විදුලි ගාස්තුවලින් ඔවුන් මුදවාලමින් එම පාරිභෝගිකයන් වෙත රු. බිලියන 5.9 ක විශේෂ සහනයක් ලං.වි.ම. විසින් සලසන ලදී.

සියල්ලන් වෙත ගුණාත්මක හා විශ්වසනීය විදුලි සම්පාදනයක් විෂයයෙහි වූ රජයෙහි ප්‍රතිපත්තියෙන් ලද මාර්ගෝපදේශයට අනුව, පාරිභෝගිකයන් වෙත ගුණාත්මක හා විශ්වසනීය විදුලි සැපයුමක් ලබා දෙමින් අපේක්ෂිත සියලු පාරිභෝගිකයන් හටද සේවය විහිදුවාලීම පිණිස වූ පරිශ්‍රමයන්හි ලං.වි.ම. ප්‍රබල ලෙස නිරත විය. ඒ අනුව, වසර තුළ පාරිභෝගිකයන් 135,625 දෙනෙකු හට නව සම්බන්ධතා ලබාදෙන ලදී. වසංගත තත්ත්වය හේතුකොට දිවයින තුළ බලශක්තිය පරිභෝජනයේ සුවිශාල අඩුවීමක් ඇතිවිය. වසර තුළ සපුරාලන ලද සමස්ත බලශක්ති ඉල්ලුම ගි.වො.පැ. 14,286ක් වූ අතර, මෙය පසුගිය වසරේ ඉල්ලුම හා සාපේක්ෂව 2% ක අඩුවීමකි.

පුනර්ජනනීය බලශක්ති බලාගාරයන් වෙතින් ලබාදුන් සමස්ත දායකත්වය සමස්ත ජනනයෙන් 36.8%ක් වේ. ප්‍රධාන ජලවිදුලි බලාගාරයන් මගින් 24.9%ක දායකත්වයක්ද, සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති බලාගාර වෙතින් 11.9%ක්ද වශයෙන් සමස්ත ජනනයට එක් කෙරිණි. ශ්‍රී ලංකාවේ විශාලතම විදුලි බලාගාරය වන ලක්විජය විදුලි බලාගාරය විසින් සමස්ත ජනනයෙන් 36.6%ක දායකත්වයක් ලබාදෙමින් ගි.වො.පැ. 5,754ක් ජනනය කරන ලදී. මෙය වූකලී ලක්විජය විදුලි බලාගාරය විසින් මේ දක්වා ලබාදෙන ලද ඉහළම වාර්ෂික දායකත්වයයි. ඉතිරි 26.6%ක ප්‍රමාණය ලං.වි.ම. හා ස්වාධීන විදුලි නිෂ්පාදකයන්ගේ තෙල් බලැති විදුලි බලාගාරයන් උපයෝගයෙන් ජනනය කෙරිණි. වසර තුළ සමස්ත ජනනය හුදෙක් ගි.වො.පැ. 15,714ක අගයක පැවතිණි. මෙය වසර සඳහා සැලසුම්ගත ජනනයෙන් 11%ක අඩුවීමකි.

වසරේ ප්‍රධානතම සාර්ථකත්වය වූයේ 2020 දෙසැම්බර් මස 8 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අග්‍රාමාත්‍යතුමා විසින් මන්නාරමේ පළමු මහා පරිමාණ සුළං විදුලි බලාගාරය මෙහෙවරෙහි යොදවා විවෘත කිරීමයි. මෙය වූකලී පසුගිය වසර 6ක කාල පරිච්ඡේදය තුළ සම්පූර්ණ කිරීමට හැකිවූ පළමු මහා පරිමාණ විදුලි බලාගාරයයි. වාර්ෂිකව කාබන්ඩයොක්සයිඩ් මෙට්‍රික් ටොන් ලක්ෂ තුනකට වැඩි ප්‍රමාණයක් වළකාලමින් විශාල ප්‍රමාණයක ෆොසිල ඉන්ධන පදනම්ගත විදුලි ජනනයක් බැහැර ලමින් ගි.වො.පැ. 400ක් ජනනය කිරීමට අපේක්ෂිතය. කෙසේ වුවද, විවිධ සංචාරක සීමාකරණයන් හේතුකොට මාස 10කට වැඩි කාල පරිච්ඡේදයක් පුරා මෙම ව්‍යාපෘතිය ප්‍රමාද කෙරිණි. වසර අවසානයේදී සම්පූර්ණ කිරීමට නියමිතව පැවති අනෙක් ප්‍රධාන ජනන ව්‍යාපෘතිය වූ බ්‍රෝඩ්ලන්ඩ්ස් ජලවිදුලි ව්‍යාපෘතිය විවිධ සංචාරක සීමාවන් හේතුකොට මෙහෙවරෙහි යෙදවිය නොහැකි විය.

වසර තුළ මන්නාරම, මාළිබොඩ හා වේවැල්වත්ත කොටුමා උපපොළයන් හා මාළිබොඩ - පොල්පිටිය, මන්නාරම - නඩුකුඩා සම්ප්‍රේෂණ මාර්ගද මෙහෙවරෙහි යෙදවීම තුළින් සම්ප්‍රේෂණ ජාලයේ පුනර්ජනනීය බලශක්ති අවශෝෂණ හැකියාව වැඩිදියුණු

# සාමාන්‍යාධිකාරීතුමාගේ සමාලෝචනය

කෙරිණි. මෙමගින් හරිත බලශක්තිය ඒකාබද්ධ කිරීමේ හැකියාව ප්‍රශස්තකරණයට පහසුකම් සැලසෙනු ඇත. සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ජනනය නිරීක්ෂණය කරමින් පුරෝකථනය කරනු පිණිස පද්ධති පාලන මධ්‍යස්ථානයේ පුනර්ජනනීය බලශක්ති මේසයක් ස්ථාපනය කරන ලදී. බරපතල සීමාකරණයන් විසින් පනවන ලද අභියෝගයන් මධ්‍යයේ වුවද, සෙසු සම්ප්‍රේෂණ ව්‍යාපෘතීනටද මන්දගාමී වුව සැලකිය යුතු ප්‍රගතියක් අත්පත් කරගැනීමට හැකිවිය.

ලං.වි.ම. ඉංජිනේරුවරුන් විසින් සංවර්ධනය කරන ලද CEBAssit යනු පාරිභෝගික සත්කාරය, පාරිභෝගික කාර්ය නියුක්තිය, සේවා ස්ථාන කාර්යක්ෂමතාවය, අභ්‍යන්තර ක්‍රියාවලි හා සේවයේ ගුණාත්මකභාවයද වැඩිදියුණු කළ එක් යෙදවුමකි. 2018/2019 සඳහා වූ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන යටතේ අංකිත සක්‍රීයකරණීය නිෂ්පාදනය/ සේවය හා ත්‍යාග ප්‍රදානෝත්සවයේදී SLT Zero One Awards හි හොඳම අංකිත පරිහරණ සම්මානයද ඒ විසින් දිනාගන්නා ලදී. 2020 වසර තුළ මුහුණ දෙන ලද විශේෂ අභියෝගයනට සහාය වනු පිණිස වසර තුළ මෙම යෙදවුම තවදුරටත් වැඩිදියුණු කරමින් වෙනස් කිරීම්වලට භාජනය කරන ලදී.

පිරිවැය පිළිබිඹු නොකරන්නාවූ අයක්‍රමය හා යෝජිත අවම පිරිවැය විදුලි ජනන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයද හේතුකොට රු. බිලියන 62.5 ක ශුද්ධ අලාභයක් වාර්තා කළ 2020 මූල්‍ය වර්ෂය ලං.වි.ම.ට තවත් අසීරු වසරක් විය. කෙසේ වුවද, පෙර වසරේ වූ රු. බිලියන 97.4 ක් වූ අලාභය හා සාපේක්ෂව වසර තුළ වාර්තාගත ශුද්ධ අලාභයෙහි අඩුවීමක් පෙන්නුම් කෙරිණි. ඉල්ලුමේ අඩුවීම හා ජල හා පිරිවැය අඩු ජනනයන්හි වර්ධනයද මගින් වියදම් අධික තෙල් ඉන්ධනගත විදුලි බලාගාරයන් වෙතින් නිකුත් කෙරුණු විදුලිය ප්‍රමාණය පහත වැටිණි. මෙකරුණ හා උදුන් තෙල් මිල රු. 96.00 සිට රු. 70.00 දක්වා පහත බැසීමද හේතුකොට සෘජු ජනනයට අදාළ මූල්‍ය බර ඉමහත් සේ පහත වැටිණි. ජාත්‍යන්තර වෙළඳපලයන්හි පිරිවැය ප්‍රශස්තකරණය හා සාපේක්ෂව අඩු ඉන්ධන හා ගල් අඟුරු මිල ගණන්ද කෙරෙහි වූ අවධාරණය වසර තුළ මෙහෙයුම් පිරිවැය සැහැල්ලු කිරීමට උපකාරී විය. රට තුළ ආර්ථික හා සෙසු කටයුතු පහත වැටීම හා මෙහෙයුම් කාර්යක්ෂමතාවයන් වැඩිදියුණු කිරීම කෙරෙහි වූ අවධාරණයද පිරිවැය කළමනාකරණයෙහි ලා පවත්වාගත යුතුවන දැඩි විනයද මගින් 2019 වසර හා සාපේක්ෂව 19%කින් මෙහෙයුම් හා නඩත්තු පිරිවැය පහත වැටිණි.

2019 වසර හා සන්සන්දනාත්මකව 4%ක වර්ධනයක් පිළිබිඹු කරමින් 2020 වසර අවසානයේදී ලං.වි.ම. විසින් රු. බිලියන 953 ක වටිනාකමින් යුත් වත්කම් පදනමක් පවත්වාගෙන යන ලදී. ඉන්ධන මිල ස්ථායිකරණ අරමුදලෙන් ලද රු. බිලියන 48 ක සම කොටස් ආයෝජනය ලං.වි.ම. විසින් මහත් සේ අගය කරනු ලබයි. මෙම සමස්ත මුදලම ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව වෙත ගෙවන ලදී. එමගින් ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව වෙත ගෙවිය යුතුව පවත්නා ණය ප්‍රමාණය අඩකින් පමණ අඩුවූ අතර, වාර්ෂික පොළී පිරිවැය බොහෝ සෙයින් අඩුවිය. සිල්ලර පාරිභෝගිකයන් විසින් මුහුණ දෙන ලද දුෂ්කරතාවයන් හේතුකොට ඔවුන් වෙතින් ණය පියවා ගැනීමද දුෂ්කරය යන කරුණ ලං.වි.ම.ට වැටහෙන්නට වූ බැවින්, මෙම මුදල් ඇතුලු කිරීම මූල්‍ය ධාරා තත්ත්වයටද ඉමහත් උපකාරයක් විය.

ඉහත විස්තර කරන ලද බොහෝ වූ සීමාවන් පැවති වර්ෂය තුළ ආයතනයේ කාර්ය සාධනය විශ්වසනීය හා ධනාත්මක එකක් වූ අතර ස්ථිර සේවා නියුක්තිකයන් 21,262 දෙනෙකුගෙන්ද, අනියම්/ කොන්ත්‍රාත් සේවා නියුක්තිකයන් 1,603 දෙනෙකුගෙන්ද, අභ්‍යාසලාභීන් 2,759 දෙනෙකුගෙන්ද සමන්විත ලං.වි.ම. කාර්ය මණ්ඩලය විසින් වෙහෙස නොබලා, විශ්වාසවන්ත ලෙස ලබාදුන් සේවය නොවන්නට එය සාක්ෂාත් කරගැනීම කළ නොහැක්කක් වන්නට ඉඩ තිබිණි.

අමාත්‍යාංශ කාර්යාල ව්‍යුහයද සමගින් විදුලිබල අමාත්‍ය ගරු ඩලස් අලහප්පෙරුම මහතා සහ රාජ්‍ය අමාත්‍ය ගරු දුමින්ද දිසානායක මහතා විසින් ලබාදෙන ලද සහාය හා මග පෙන්වීම බොහෝ සෙයින් අගය කොට සලකමි.

මෙම අභියෝගාත්මක සමයන් තුළ ආයතනය ඉදිරියට ගෙනයාම සඳහා සභාපති, ඉංජි. විජිත හේරත් මහතා හා අධ්‍යක්ෂ මණ්ඩලය සමගින් කටයුතු කිරීමට හැකිවීම සතුටට කරුණක් මෙන්ම වරප්‍රසාදයක් සේ සලකමි. තවද, මෙම සාර්ථකත්වය සාක්ෂාත් කරගැනීම සඳහා මා වෙත සහාය හා ශක්තිය ලබාදුන් ආයතනික කළමනාකරණ කණ්ඩායමේ මාගේ සගයන් හා ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වෙතද කෘතවේදිත්වය පළ කරමි.

ආයතනයේ ගමන සාර්ථක කිරීම සඳහා සිය සහාය ලබාදුන් මුදල් අමාත්‍යාංශය, බැංකුකරුවන්, අරමුදල් සපයන නියෝජිතායතන හා සියලු බලධාරීන් වෙතද මාගේ කෘතඥතාවය සටහන් කරමින්ද, එකරුණු නිහතමානීව අගයන බවද ප්‍රකාශ කරමින්ද මාගේ පණිවිඩය සමාප්ත කරමි.



**ඉංජිනේරු ඩී.ඩී.කේ. කරුණාරත්න**
සාමාන්‍යාධිකාරී

# ලං.වි.ම. සම්ප්‍රේෂණ පද්ධතිය





ලක්විජය විදුලි බලාගාරය

මෙහෙයුම් සමාලෝචනය

# ජනන අංශය

# ජනන අංශය

ලංකා විදුලිබල මණ්ඩලය සතු සියලු විදුලි බලාගාර මෙහෙයුම්කරණය, නඩත්තුව හා ප්‍රතිසංස්කරණය සම්බන්ධ වගකීම ජනන අංශය සතුවේ. ජනන අංශය සතුව මෙ.වො. 1383ක ස්ථාපිත ධාරිතාවයක් සහිත ජල විදුලි බලාගාර දාහතක්ද, මෙ.වො. 654ක ස්ථාපිත ධාරිතාවයක් සහිත තෙල් ඉන්ධනගත තාප බලාගාර හතක්ද, මෙ.වො. 900ක ධාරිතාවයෙන් යුත් ගල් අඟුරු විදුලි බලාගාරයක්ද පවතී. යාපනය අර්ධද්වීපය ආශ්‍රිත දූපත්වලද ඩීසල් බලාගාර කිහිපයක් ක්‍රියාත්මක කරනු ලබයි. 2020 වසර අවසානය වනවිට ලං.වි.ම. හිමිකාරිත්වය සහිත විදුලි බලාගාරයන්හි සමස්ත ස්ථාපිත ධාරිතාවය මෙ.වො. 2,968ක් විය.

## විදුලි බලාගාරයන්හි කාර්ය සාධනය

2020 වසර මහවැලි සංකීර්ණයට සැලකිය යුතු වැදගත්කමකින් යුත් වසරක් විය. මහවැලි සංකීර්ණයේ විදුලි බලාගාරයන් විසින් ගි.වො.පැය 1,890ක් ජනනය කර ඇත. එය වූකලි ලං.වි.ම.හි සමස්ත ජල විදුලි ජනනයෙන් 48%ක පමණ අගයකි. උකුවෙල හා බෝවතැන්න විදුලි බලාගාරයන්හි වාර්ෂික ජනන ඉලක්කයන් ඉක්මවා යමින් හා කොත්මලේ හා ඉහළ කොත්මලේ විදුලි බලාගාරයන්ගෙන් ලැබීමට සැලසුම්කළ බලශක්ති ඉලක්කයන්ගෙන් 80%කට වැඩි ප්‍රමාණයක් ජනනය කිරීමෙන් මෙම ඉලක්ක සාක්ෂාත් කරගන්නා ලදී.

ලක්ෂපාන සංකීර්ණය මගින් ගි.වො.පැය 1,443ක් ජනනය කර ඇති අතර එය ගි.වො. පැය 1,550ක් ලෙස වූ වාර්ෂික අපේක්ෂිත බලශක්ති ප්‍රමාණයෙන් 93%කි.

සමනල සංකීර්ණයේ උඩවලව හා ඉඟිනියාගල විදුලි බලාගාරයන් මගින් වාරි ජලය මුදා හැරීම සඳහා නියාමනය කරන ලද තත්ත්වයන් යටතේ වාර්ෂිකව අපේක්ෂා කරන ලද බලශක්තිය ප්‍රමාණය ඉක්මවූ බලශක්තිය ප්‍රමාණයක් ජනනය කරන ලදී.

වසර තුළ, තාප (තෙල්) විදුලි බලාගාරයන් මගින් ගි.වො. පැය 1,465ක් ජනනය කිරීමට හැකිවූ අතර, ශ්‍රී ලංකාවේ එකම ගල් අඟුරු විදුලි බලාගාරය වන ලක්විජය විදුලි බලාගාරය මගින් ජාතික ජාලය වෙත ගි.වො.පැය 5,754 ඉක්මවූ දායකත්වයක් ලබාදෙන ලදී. මෙය වූ කලී ලක්විජය බලාගාරය 2014 වර්ෂයේදී සියලු අදියරයන් සඳහා මෙහෙවරෙහි යෙදවීමෙන් අනතුරුව එය විසින් ලබාදෙන ලද ඉහළම වාර්ෂික දායකත්වයයි.

2020 වසර තුළ විදුලි බලාගාරයන් හා සෙසු ආශ්‍රිත සාධකයන් තුළින් ජනිත විදුලිය පහත ලැයිස්තුගත කොට ඇත.

**වගුව 01 : ජල විදුලි බලාගාරයන්හි දායකත්වය**

| විදුලි බලාගාරය | ස්ථාපිත ධාරිතාව (මෙ.වො.) | ජනනය (ගි.වො. පැ.) | උපයෝජ්‍යතා සාධකය (%) | බලාගාර සාධකය (%) |
|---|---|---|---|---|
| වික්ටෝරියා | 210 | 506 | 99.8 | 27.2 |
| කොත්මලේ | 201 | 398 | 99.8 | 22.6 |
| ඉහළ කොත්මලේ | 150 | 351 | 99.3 | 26.7 |
| රන්දෙණිගල | 122.6 | 266 | 99.4 | 23.9 |
| රන්ටැඹේ | 50 | 127 | 99.7 | 29.2 |
| උකුවෙල | 40 | 180 | 99.1 | 50.9 |
| බෝවතැන්න | 40 | 55 | 99.8 | 15.7 |
| නිල්ලඹේ | 3.2 | 8 | 99.5 | 28.3 |
| **මහවැලි සංකීර්ණයේ එකතුව** | **816.8** | **1,891** | | |

| විදුලි බලාගාරය | ස්ථාපිත ධාරිතාව (මෙ.වො.) | ජනනය (ගි.වො. පැ.) | උපයෝජ්‍යතා සාධකය (%) | බලාගාර සාධකය (%) |
|---|---|---|---|---|
| සමනලවැව | 120 | 243 | 80.5 | 23.3 |
| කුකුළේගඟ | 75 | 296 | 93.2 | 48.6 |
| උඩවලව | 6 | 8 | 63.5 | 24.7 |
| ඉඟිනියාගල | 11.25 | 30 | 97.7 | 30.8 |
| **සමනල සංකීර්ණයේ එකතුව** | **212.25** | **577** | | |
| පැරණි ලක්ෂපාන අදියර I | 3x9.6 | 276 | 99.5 | 58.4 |
| පැරණි ලක්ෂපාන අදියර II | 2x12.5 | | | |
| නව ලක්ෂපාන | 2x50 | 503 | 99.0 | 53.1 |
| සමනල | 2x45 | 418 | 98.8 | 52.5 |
| විමලසුරේන්ද්‍ර | 2x25 | 102 | 93.8 | 23.3 |
| කැනියන් | 2x30 | 145 | 94.4 | 27.6 |
| **ලක්ෂපාන සංකීර්ණයේ එකතුව** | **353.8** | **1,444** | | |
| **ජල විදුලිය එකතුව** | **1,383.25** | **3,911** | | |

# ජනන අංශය

වගුව 02 : තාප (තෙල්) විදුලි බලාගාරයන්හි දායකත්වය

| විදුලි බලාගාරය | ස්ථාපිත ධාරිතාව (මෙ.වො.) | පවත්නා උපරිම සමස්ත ධාරිතාව (මෙ.වො.) | ජනනය කළ බලශක්තිය (ගි.වො.පැ.) | උපයෝජ්‍යතා සාධකය (%) | බලාගාර සාධකය (%) |
|---|---|---|---|---|---|
| සපුගස්කන්ද - A | 80 | 70 | 331 | 93.8 | 55.7 |
| සපුගස්කන්ද - B | 80 | 72 | 415 | 96.0 | 68.3 |
| කැළණිතිස්ස සං.ච.වි.බ. - වායු තලබමන | 110 | 110 | - | - | - |
| කැළණිතිස්ස සං.ච.වි.බ. - වාෂ්ප තලබමන | 55 | 55 | -1 | - | - |
| කැළණිතිස්ස වායු තලබමන - 07 | 115 | 115 | 97 | 57.0 | 12.0 |
| කැළණිතිස්ස Frame V GTT | 80 | 54 | 35 | 46.8 | 6.1 |
| හදිසි විදුලිය | 50 | 40 | 78 | 90.1 | 23.6 |
| උතුරු ජනනි | 24 | 22 | 108 | 89.0 | 55.0 |
| යාත්‍රාවක නැංවූ බලාගාරය | 60 | 62.4 | 399 | 95.6 | 75.6 |
| **තාප (තෙල්) එකතුව** | **654** | **602.4** | **1,462** | | |

වගුව 03 : ලක්විජය විදුලි බලාගාරයේ දායකත්වය

| | | පළමු ඒකකය | දෙවන ඒකකය | තුන්වන ඒකකය | එකතුව |
|---|---|---|---|---|---|
| ස්ථාපිත ධාරිතාවය | මෙ.වො. | 300 | 300 | 300 | 900 |
| ජනනය කරන ලද දළ බලශක්තිය | ගි.වො.පැ. | 2,152 | 2,258 | 1,955 | 6,365 |
| පිටකරන ලද ශුද්ධ බලශක්තිය | ගි.වො.පැ. | 1,948 | 2,036 | 1,770 | 5,754 |
| උපකාරක පරිභෝජනය | ගි.වො.පැ. | 205 | 221 | 185 | 611 |
| උපයෝජ්‍යතා සාධකය | % | 97 | 95 | 90 | 94 |
| ධාරිතා සාධකය | % | 82 | 86 | 74 | 81 |

## විශේෂ කරුණු

### විශේෂ නඩත්තු කටයුතු

ජනන ඒකකයන්හි හා විදුලි බලාගාරයන්හි අතිරේක පද්ධතීන්හි එදිනෙදා නඩත්තු කටයුතු හැරුණු කොට, වත්කම් කළමනාකරණ (ජල විදුලි), වත්කම් කළමනාකරණ (ජල තාක්ෂණ), වත්කම් කළමනාකරණ (තාප විදුලි), වත්කම් කළමනාකරණ (තාප තාක්ෂණ), වේලි ආරක්ෂණ පරිසර හා සිවිල් ව්‍යුහ නඩත්තු හා ජනන ආරක්ෂණ ශාඛාවන්හි සහභාගිත්වය හා දායකත්වයද සහිතව සංකීර්ණ අනුව පහත සඳහන් විශේෂ නඩත්තු කටයුතු සිදු කරන ලදී.

### ලක්ෂපාන, කැනියන් හා සමනල විදුලි බලාගාරයන්හි අන්තර්ජාල ප්‍රොටෝකෝල ආරක්ෂණ පද්ධතිය ස්ථාපනය

ලක්ෂපාන විදුලි බලාගාරයෙහි අන්තර්ජාල ප්‍රොටෝකෝල ආරක්ෂණ කැමරා 76කින්ද, කැන්යන් විදුලි බලාගාරයෙහි අන්තර්ජාල ප්‍රොටෝකෝල ආරක්ෂණ කැමරා 46කින්ද සමනල විදුලි බලාගාරයෙහි අන්තර්ජාල ප්‍රොටෝකෝල ආරක්ෂණ කැමරා 45කින්ද සමන්විත සී.සී.ටී.වී. පද්ධතියක් ස්ථාපනය කරන ලදී.

ව්‍යාපෘති පිරිවැය ආසන්න වශයෙන් ශ්‍රී ලං.රු.මිලියන 21ක් විය.



අන්තර්ජාල ප්‍රොටෝකෝල ආරක්ෂණ පද්ධතිය

### මාඋස්සාකැලේ ජලාශයෙහි ජල පිවිසුම් ද්වාරය අලුත්වැඩියාව

වසර ගණනාවකට පෙර ස්ථාපනය කරන ලද බැවින් ජල පිවිසුම් ද්වාරය බොහෝ සෙයින් මළ බැඳී, රබර් මුද්‍රාවන් ගෙවී ගොස් ද්වාරයෙහි ප්‍රධාන ඔසොවිච් අක්‍රියව පැවතිණි. සියලු උපකරණ අලුත්වැඩියා කරන ලදුව ජල පිවිසුම් ද්වාරය ආරක්ෂිතව හා විශ්වසනීයව ක්‍රියාත්මකවන බවට තහවුරු කරනු පිණිස නැවත මෙහෙවරෙහි යොදවන ලදී.

# ජනන අංශය



මාඋස්සාකැලේ ජල පිවිසුම් ද්වාරය අළුත්වැඩියාව

## මාඋස්සාකැලේ ජලාශයෙහි නිදහස් ජල මුදා හැරුම් වැල්වය (Howell Bunger Valve) අලුත්වැඩියාව

වැල්වයෙහි පිටත මතුපිට ගැඹුරින් මල බැඳීම හේතුකොට බොහෝ සෙයින් හානියට පත්ව තිබූ අතර සම්බන්ධක ඇණවලටද හානි සිදුවී බාල තත්ත්වයට පත්ව තිබිණි.

ටී.අයි.ජී. පෑස්සුම් හා කෝල්ඩ් පෑස්සුම් කටයුතු මගින් වැල්වයේ පිටත බඳ අලුත්වැඩියා කරන ලදී. ගියර පෙට්ටිය, ප්‍රධාන ඇඳුම් හා දන්ඩද නිපදවා අලුතින් යොදන ලදී. ප්‍රවාහ උමං මඟට අදාළ සේවාවන් ක්‍රියාත්මක නොවන කාල පරිච්ඡේදය තුළ මෙහෙවරෙහි යෙදවීමේ කටයුතු සිදු කිරීමට සැලසුම් කර ඇත.



මාඋස්සාකැලේ නිදහස් ජල මුදාහැරුම් වැල්මය අළුත්වැඩියාව

## කොත්මලේ විදුලි බලාගාරයේ කි.වෝ. 220 අවම තෙල් පරිපථ කඩනයන් අලුත්වැඩියාව සඳහා ගලවා ඉවත් කිරීම

කොත්මලේ ස්විච් අංගනයෙහි කි.වෝ 220 අවම තෙල් පරිපථ කඩනයන් 1984දී ස්ථාපනය කරන ලදී. එබැවින්, 110 හා 330 දරන පරිපථ කඩනයන් සඳහා අලුත්වැඩියා කිරීමේ කටයුතු සැලසුම් කොට සපුරන ලදී. අලුත්වැඩියා කටයුතුවලදී ගෙවීගිය කොටස් මාරු කොට, තාරා නියාමිත විචල්‍යයන් (PRVs) අලුත්වැඩියා කොට නිශ්චිත අදාළ තෙල් වර්ගයන් පරිපථ කඩනයන් තුළට පුරවන ලදී.

ඉන්පසු මුල් උපකරණ නිෂ්පාදනායතනයේ (OEM) පිරිවිතරයනට අනුව කාල සැකසුම් හා සෙසු පරාමිතීන්ද ගලපන ලදී.



කොත්මලේ බලාගාරයේ පරිපථ කඩනය

## කොත්මලේ විදුලි බලාගාරයේ දත්ත උකහා ගැනුම් (DAQ) පද්ධතිය මෙහෙවරෙහි යෙදවීම

2020 වසර තුළ 02වන ඒකකය හා 03වන ඒකකය සඳහා දත්ත උකහා ගැනුම් පද්ධතිය මෙහෙවරෙහි යොදවන ලදී. සියලු ඒකකයන්හි නිවේදන පද්ධතිය හා ආරම්භන අනුපිළිවෙලයන් අන්තර්ගත කරන ලදී. වැඩිදුර නවීකරණයන් හා වැඩිදියුණු කිරීම් 2021 වසර තුළ සිදු කෙරෙනු ඇත.

## කොත්මලේ විදුලි බලාගාරයෙහි අංකිත පීඩන සංවේදක ස්ථාපනය

පවත්නා පීඩන සංවේදක ඇනලොග් උපකරණ විය. අංකිත පීඩන සංවේදකයන් ස්ථාපනය කරමින් පද්ධතිය වැඩිදියුණු කරන ලදී. දත්ත උකහා ගැනුම් පද්ධතියටද නව අංකිත පීඩන සංවේදක සම්බන්ධ කරන ලදී.

## කොත්මලේ විදුලි බලාගාරයෙහි බලාගාර උදුකුරුව (rectifier) 01 හා 02 ස්ථාපනය හා මෙහෙවරෙහි යෙදවීම.

බලාගාරයෙහි පවත්නා උදුකුරු පද්ධතිය 1984දී ස්ථාපනය කර ඇත. පවත්නා උදුකුරු පද්ධතිය නැවත සවි කිරීමට තීරණය කරන ලදී. අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු සිදුකරන ලදුව උදුකුරු පද්ධතිය නැවත සවි කරන ලදී.



කොත්මලේ බලාගාරයෙහි බලාගාර උදුකුරුව ස්ථාපනය

# ජනන අංශය

### කොත්මලේ විදුලි බලාගාරයෙහි සර්ජන කුටි ද්වාරය (Surge Chamber Gate) හා ව්‍යුහයන් යැවීමේ පිපිරවීම (Sand Blasting) හා පින්තාරුකරණය

ස්ථාපිතකර දිගු කලක් හේතුකොට මෙම සර්ජන කුටි ද්වාරය මල බැඳී තිබිණි. (වර්ග මීටර 720කට ආසන්න වර්ගඵලයක් සහිත) ද්වාරය Sa2.5 හා ISO12944-1 ප්‍රකාර යැවීම් පිපිරවීම් කොට පින්තාරු කරන ලදී.

### කොත්මලේ විදුලි බලාගාරයේ වාතාශ්‍රක යන්ත්‍රාගාරයේ වාතාශ්‍රක ලූවර අලුත්වැඩියාව

විදුලි බලාගාරය මෙහෙවරෙහි යෙදීමේදී වාත්‍රාශ්‍රක යන්ත්‍රාගාරයේ වා ප්‍රවේශකය ස්ථාපනය කරනු ලැබ ඇත. ගැඹුරු මළ බැඳීමක් හා හානියක් සිදුවී ඇති බවට නිරීක්ෂණය විය. ඒ අනුව, වාත්‍රාශක වා ප්‍රවේශක කට්ටලයක් මාරු කර අලුතින් යොදන ලදී.

### ඉහළ කොත්මලේ විදුලි බලාගාරය - තලවකැලේ වේල්ලේ අසාමාන්‍ය කාලගුණික තත්ත්වයනට ඔරොත්තු දෙන පරිදි සිදු කරන ලද වාං මාර්ග ප්‍රවේශයේ කොන්ක්‍රීට් මතුපිට සත්කාරය.

තලවකැලේ වේල්ලෙහි කොන්ක්‍රීට් මතුපිට අසාමාන්‍ය කාලගුණික තත්ත්වයනට හසුව තිබිණි. තවදුරටත් කාලගුණික තත්ත්වයනට හසුවීමෙන් වළකාලනු පිණිස ජල කාන්දු නොවන ද්‍රව්‍ය යොදා (පළමු අදියර ලෙස) වාං මාර්ග ප්‍රවේශ විවරයන්හි කොන්ක්‍රීට් මතුපිට සත්කාරයන් සිදු කිරීමට තීරණය කරන ලදී. වේලි ආරක්ෂණ, පරිසර හා සිවිල් ව්‍යුහ නඩත්තු (DSE&CSM) ශාඛාව විසින් ටෙන්ඩරයක් ආරම්භ කොට එය ෆිනෙක්ස් ඉන්ජිනියරින් පුද්ගලික සමාගම වෙත පිරිනමන ලදී. වාං ගේට්ටු පහේම කොන්ක්‍රීට් මතුපිටයන් ජල කාන්දු නොවන පරිදි අලුත්වැඩියා කරන ලදී.



තලවකැලේ වේල්ලේ වාං මාර්ග ප්‍රවේශයේ කොන්ක්‍රීට් මතුපිට සත්කාරය

### ඉහළ කොත්මලේ විදුලි බලාගාරය - පළමු ඒකකයේ ජල බැසුම් නල කාණු කපාටය මාරු කිරීම

පළමු ඒකකයේ ජල පිවිසුම් කපාටයේ (MIV) ජලය පහතට ගලායන පෙදෙසේ පෑස්සුම් පුට්ටුවෙහි පිපුරුමක් නිරීක්ෂණය වූ අතර එය මාරු කොට අතිරේක කපාටයක් යොදන ලදී. 2020 සැප්තැම්බරයේදී මාරු කරන ලද කපාටයේ එම ස්ථානයේම නව පිපිරුමක් නිරීක්ෂණය විය. ඒ වෙනුවට පෙරදී අලුත්වැඩියා කරන ලද පිපිරූ කපාටය යොදා එය මාරු කරන ලදී.



ඉහළ කොත්මලේ බලාගාරයේ ජල බැසුම් නල කාණු කපාටය මාරු කිරීම

### සමනලවැව විදුලි බලාගාරය - පාලන/අධීක්ෂණ පාලන හා දත්ත උකහා ගැනුම් (SCADA) ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය

සන්නිවේදන නාලිකාවක් නොතිබීම හේතුකොට වේල්ල හා විදුලි බලාගාර පාලන කාමරය අතර පාලන හා දත්ත හුවමාරුව සිදුකළ නොහැකි විය. ලං.වි.ම. ඉංජිනේරුවරුන් විසින් මේ සඳහා විසඳුමක් නිර්මාණය කරන ලද අතර, තාත්වික ප්‍රාය පුද්ගලික ජාලය (VPN) සම්බන්ධතාවයක් ස්ථාපනය කරන ලදුව වේල්ල වැඩබිමෙහි බල රැහැන් සංදේශ පද්ධතියක් (PLC) ස්ථාපනය කරන ලද තත්ත්වයක මේවන විට විදුලි බලාගාර පාලන කාමරයේ දත්ත හා පාලන ක්‍රියාවලි ක්‍රියාත්මක වේ.

### සමනලවැව විදුලි බලාගාරයේ ද්‍රව ඛනිජතෙල් (LP) සිසිලන යන්ත්‍රය ප්‍රතිසංස්කරණය කරන ලදී

විදුලි බලාගාර ඉංජිනේරුවරුන්ගේ අධීක්ෂණය යටතේ අඩු පීඩන තෙල් සිසිලන යන්ත්‍ර පහක් දේශීය වශයෙන් ප්‍රතිසංස්කරණය කොට නැවත සවි කරන ලදී.

විදුලි ජනන යන්ත්‍රයේ පහළ ගයිඩ් බෙයාරින්වල තෙල් සිසිලන යන්ත්‍රය ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කොට නැවත සවි කරන ලදී.

### සමනලවැව විදුලි බලාගාරය - වේල්ලෙහි වාං මාර්ග ගේට්ටු හා ආශ්‍රිත වානේ ව්‍යුහයන් යැවීම් පිපිරවීම හා පින්තාරුකරණය

සමනලවැව වේල්ල සතුව හයිඩ්‍රෝලික් බලයෙන් ක්‍රියාත්මක වාංමාර්ග ගේට්ටු තුනක්, යති පෝරු (stoplogs) හතරක්, ලකනක පද්ධතිය (anchoring system), මැසි දොඹකරය (gantry crane) හා ආශ්‍රිත වානේ ව්‍යුහයන්ද පවතී. මෙම වානේ ආකෘතීන්හි ආරක්ෂිත පින්තාරු ආවරණයන් 1990 ගණන්වලදී සිදුකරන ලද මෙම විදුලි බලාගාරය ඉදිකිරීමේ අවස්ථාවේදී සිදුකර තිබිණි.

වානේ ආකෘතීන්හි හදිසි යැවීමේ පිපිරවීම් හා පින්තාරුකරණයන් තුන්වන පාර්ශ්වයේ පින්තාරු පරීක්ෂකවරයෙකු හා ලං.වි.ම. පුද්ගලයන්ගෙන් සැදි විශේෂඥ කණ්ඩායමක් විසින් නිර්දේශ කරන ලදී.

ඉහත නිර්දේශය මත, ටෙන්ඩර් ක්‍රියාවලිය ආරම්භ කොට තරගකාරී ලංසු ක්‍රියාවලියක් අනුගමනය කිරීමෙන් අනතුරුව ඩොක්යාඩ් ජෙනරල් ඉන්ජිනියරින් සර්විසස් පුද්ගලික සමාගම වෙත පිරිනමන ලදී.

පින්තාරු කරන ලද මුළු ක්ෂේත්‍රඵලය වර්ග මීටර 8,210ක් වන අතර, දරන ලද සමස්ත පිරිවැය ශ්‍රී ලං.රු.මිලියන 85කි.

පින්තාරු කටයුතු සිදු කෙරෙමින් පවත්නා අතර, වැඩ කටයුතුවලින් 50 % කට වැඩි ප්‍රමාණයක් සම්පූර්ණ කොට ඇත.

# ජනන අංශය



යැවීම් පිපිරවීම හා පින්තාරුකරණය

### සමනලවැව විදුලි බලාගාරය - දෙවන ඒකකයෙහි ස්ථායුකය අලුත්වැඩියා කටයුතු හා හදිසි ප්‍රතිසංස්කරණ

2019 නොවැම්බර් මාසයේ එතුම් දෝෂය නිවැරදි කරනු පිණිස මෙම අලුත්වැඩියා කාර්යය ආරම්භ කරන ලදී. ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය තුළ විදුලි ජනන යන්ත්‍ර වැඩබිම් අධීක්ෂණ කටයුතු එක්සත් රාජධානියේ ක්වාර්ට්සෙලෙක් ආයතනය විසින්ද, වැඩබිම් ඉංජිනේරු කටයුතු හා අධීක්ෂණ කටයුතු මුළුමනින්ම ලං.වි.ම. ඉංජිනේරුවරුන් විසින්ද සිදු කරන ලදී.

ප්‍රතිසංස්කරණ කටයුතු මුළුමනින්ම පාහේ සම්පූර්ණ කරන ලද අතර මේවන විට මෙහෙවරෙහි යෙදවීමේ කටයුතු සිදු වෙමින් පවතී.



සමනලවැව බලාගාරයේ ස්ථායුකය අළුත් වැඩියාව

### කුකුළේගඟ විදුලි බලාගාරය - වාං මාර්ග ගේට්ටු යැවීම් පිපිරවීම හා පින්තාරුකරණය

මෙම ගේට්ටු ස්ථාපනයෙන් පසු පළමු වතාවට පින්තාරු කරන ලදී. ඒ සඳහා වූ කොන්ත්‍රාත්තුව ඩොක්යාඩ් ජෙනරල් ඉංජිනියරින් සර්විස් ආයතනය වෙත පිරිනමන ලදුව, විදුලි බලාගාරයේ කාර්ය මණ්ඩලය විසින් අධීක්ෂණය කරන ලදී. සින්ක් රිච් ප්‍රයිමර් ආවරණ හා ඉපොක්සි සහිත යැවීම් පිපිරවීම හා පින්තාරුකරණය සිදු කරන ලදී.

### කුකුළේගඟ විදුලි බලාගාරය - විදුලි බලාගාර පාලන පද්ධතිය හා අධීක්ෂණ පාලන හා දත්ත උකහා ගැනුම් පද්ධතිය නංවාලීම

විදුලි බලාගාරයේ පාලන පද්ධතිය හා අධීක්ෂණ පාලන සහ දත්ත උකහා ගැනුම් පද්ධතිය යල්පැනගොස් තිබූ අතර, මුල් උපකරණ නිෂ්පාදනායතනය විසින් නිෂ්පාදන සේවාකරණය අවසන් කොට තිබිණි. එබැවින්, කුකුළේගඟ විදුලි බලාගාරයේ හා වත්කම් කළමනාකරණ ජල විදුලි (AMHE) අංශයෙහි ඉංජිනේරුවරුන් විසින් පාලන පද්ධතිය නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන තිබිණි. මෙම ප්‍රවේශය මගින්, යන්ත්‍රාගාර නාස්තිය අවම වන පරිදි හා අවම පිරිවැයකින් නවීකරණය සිදුකළ හැකිවිය.

මෙම නවීකරණය ක්‍රියාත්මක කිරීමේදී ඇස්තමේන්තුගත ඉතිරිය ශ්‍රී ලං.රු.මි. 400ක් පමණ වනු ඇත. මෙම ව්‍යාපෘතිය 2020 වසරේදී ආරම්භ වූ අතර, 2021 වසර තුළ සම්පූර්ණ කිරීමට සැලසුම් කර ඇත.

### උඩවලව විදුලි බලාගාරය - 01 ඒකකයේ ටර්බයින බල ජනන යන්ත්‍රය ප්‍රතිසංස්කරණය

වසර කිහිපයක් පුරා අක්‍රියව පැවති වම් ඉවුරේ පිහිටි ජනන යන්ත්‍රය අලුත්වැඩියාව සඳහා යොමු කරන ලදී. මෙකී සමස්ත අලුත්වැඩියා හා මෙහෙවරෙන් ඉවත් කිරීමේ ක්‍රියාවලිය උඩවලව විදුලි බලාගාරයේ කාර්මික කාර්ය මණ්ඩලය හා ඉංජිනේරුවරුන් විසින් සිදු කරන ලදී. විකට් ගේට්ටු, සර්වෝ මෝටර් මුද්‍රා, බ්‍රේක් ජැක්, ගවර්නර් කොන්ට්‍රෝල් පැනල් හා හයිඩ්‍රෝලික් පොම්ප පරීක්ෂා කර අලුත්වැඩියා කරන ලදී.

### උඩවලව විදුලි බලාගාරය - ස්වයංක්‍රීය සම්මුහුර්තකය ස්ථාපනය

උඩවලවේ විදුලි බලාගාරයට ස්වයංක්‍රීය සම්මුහුර්තකයක් නොතිබී අතර, විදුලි ජනන යන්ත්‍ර සම්මුහුර්තකරණය අතින් සිදු කරන ලදී. 2020 වසරේදී විදුලි බලාගාර ඉංජිනේරුවරුන් හා වත්කම් කළමනාකරණ ජල විදුලි අංශයේ ඉංජිනේරුවරුන් විසින් උඩවලවේ විදුලි බලාගාරයෙහි ස්වයංක්‍රීය සම්මුහුර්තකරණ පද්ධතියක් ස්ථාපනය කරන ලදී.

### උඩවලව විදුලි බලාගාරය - සිදුකළ වෙනස්කම්

- ඉම් (Bus) වෝල්ටීයතා මනුව ස්ථාපනය කොට මෙහෙවරෙහි යොදවන ලදී.
- අංකිත බහු කාර්ය මනුවක් මාරු කොට මෙහෙවරෙහි යොදවන ලදී.
- වත්කම් කළමනාකරණ ජල විදුලි ශාඛාවේ සම්බන්ධීකරණයෙන් සමීපස්ථතා සංවේදකයක් මගින් වේග සංවේදන යාන්ත්‍රණය ස්ථාපනය කරන ලදී.
- වම් ඉවුරු තනි පීළි දොඹකරය අලුත්වැඩියා කොට යළි එකළස් කොට නැවත සවි කරන ලදී.
- අංක 02 තරාපැවියේ උදාසීන බිම්ගත ප්‍රතිරෝධකය (NGR) මෙහෙවරෙහි යොදවනු ලැබ පළමුවන තරාපැවියේ උදාසීන බිම්ගත ප්‍රතිරෝධකය සඳහා පදනම සකසන ලදී.
- වල් වැඩී වර්ධනය වීම හේතුකොට ස්විච් අංගනය නඩත්තු කිරීම ඉතා දුෂ්කර කාර්යයක් විය. තවද Metal කැබලි,

# ජනන අංශය

කොන්ක්‍රීට් ගල් පසට මිශ්‍රව තිබිණි. දේශීය වශයෙන් Metal කැබලි, කොන්ක්‍රීට් ගල පිරිසිදුකරණ යන්ත්‍රයක් නිර්මාණය කොට පිරිසිදු කිරීමේ කාර්යය ආරම්භ කරන ලදී.



Metal පිරිසිදුකරන යන්ත්‍රය

### ඉඟිනියාගල විදුලි බලාගාරය - 01 වන ඒකකයේ ප්‍රධාන අලුත්වැඩියාව

2015 වසරේදී 01 වන ඒකකයෙහි ස්ථායුක එතුම් පරිවරණ දෝෂයක් සිදුවූ අතර එය අලුත්වැඩියා කරන ලදී. මෙයින් අනතුරුව, 01 වන ඒකකයෙහි විදුලි ජනන යන්ත්‍ර බැර ක්‍රියාවලියට බාධා සිදුවිය. මෙයට අමතරව, කල්ගතවීම හා මල බැඳීම හේතුකොට මෙම වසරේදී ටර්බයිනයෙහි දෝෂයක් ඇතිවිය. ටර්බයිනය වෙනුවට අතිරේක ටර්බයිනයක් යොදා 01 වන ඒකකය අලුත්වැඩියා කිරීමට තීරණය කෙරිණි.

ජල පිවිසුම් කපාටය හරහා ජලය කාන්දු වීම 01 වන ඒකකය අලුත්වැඩියා කිරීමට පැවති ප්‍රධාන බාධකය විය. මාරු කිරීමේ හා අලුත්වැඩියා කිරීමේ කාර්යය ආරම්භ වීමට පෙර උමඟෙහි ජලය ඉවත් කොට ජල පිවිසුම් කපාටයෙහි මුද්‍රා තබන ලදී.



ඉඟිනියාගල බලාගාරයේ අළුත්වැඩියාව

### ඉඟිනියාගල විදුලි බලාගාරය - පිවිසුම් කුලුනෙහි දිය යට පරීක්ෂාව

ජල ගැලුම් රටාව සැළකිල්ලට ගැනීමේදී ජල පිවිසුම් කුලුනෙහි පාර්ශ්වීය අවහිරයක් සම්බන්ධ සැකයක් පැවතිණි. එබැවින්, කිමිදුම්කරුවන් කණ්ඩායමක් විසින් දියයට පරීක්ෂාව සිදු කරන ලදී. කිසිදු සිරවීමක් හෝ ප්‍රධාන පිපිරුමක් සොයා ගැනීමට නොහැකි විය. මෙය 01වන ඒකකයේ ප්‍රධාන අලුත්වැඩියා කටයුතු තීරණය කිරීමට උපකාරී විය.

### ඉඟිනියාගල විදුලි බලාගාරය (IPS) - උඩිස් දොඹකරයේ බැර පරීක්ෂාව

අංක 01 ඒකකය අලුත්වැඩියාව සඳහා වූ පූර්ව වැඩ සූදානමක් වශයෙන් ඉඟිනියාගල විදුලි බලාගාරයේ උඩිස් පාළම් දොඹකරය පරීක්ෂා කොට, අලුත්වැඩියා කොට පූර්ණ ධාරිතාවය සඳහා බැර පරීක්ෂාව **(load test)** සිදු කරන ලදී.

### සපුගස්කන්ද විදුලි බලාගාරය - එන්ජින් අංක 04හි කැම් දණ්ඩ (Camshaft) මාරු කිරීම

එන්ජිමේ විශ්වසනීයත්වය සහතික කරනු පිණිස එන්ජින් අංක 04හි තාවකාලිකව අලුත්වැඩියා කළ කැම් දණ්ඩ වෙනුවට අලුත් කැම් දණ්ඩයක් යොදන ලදී. එය මාරු කිරීමේ පිරිවැය ශ්‍රී ලං.රු.මි. 35කි.

### සපුගස්කන්ද විදුලි බලාගාරය - කි.වෝ. 132 ධාරා තරාපැවි මාරු කිරීම

අධිකර තරාපැවිවල කි.වෝ. 132 පැත්තේ ධාරා තරාපැවි මාරු කිරීම සිදුකරන ලදී.

### සපුගස්කන්ද විදුලි බලාගාරය - එන්ජින් අංක 02හි එක්ස්හෝස්ට් බොයිලේරු ටියුබ කට්ටලය මාරු කිරීම

පවත්නා ගෑස් බොයිලේරුවල උණුසුම් ජල නල හා වරල් මළ බැඳීම හේතුකොට ජල කාන්දු හා උෂ්ණය මාරු කිරීමේ දුර්වලතාද පැවතිණි. එහි ප්‍රතිඵලයක් ලෙස, ඉන්ධන මාරු කිරීමට ගත කරන්නට සිදුවූ කාලය වැඩිවූ අතර ඒ හේතුකොට වඩා ඉහළ මෙහෙයුම් පිරිවැය ඇති කරමින් එන්ජින්වලට වඩා දිගු කාල පරිච්ඡේදයක් ඩීසල් බලයෙන් ක්‍රියාත්මක වීමට සිදුවිය. මෙම අඩුපාඩුව නිවැරදි කරනු පිණිස, ශ්‍රී ලං.රු.මි. 25ක පිරිවැයක් යොදා අංක 02 දරන එන්ජිමෙහි එක්ස්හෝස්ට් බොයිලේරු ටියුබ කට්ටලය මාරු කරන ලදී.

### ලක්විජය විදුලි බලාගාරය - 03 වන ඒකකයේ මුහුදු ජල ප්‍රවේශ සොරොව්ව පිරිසිදු කිරීම

අංක 03 ඒකකයෙහි සැලසුම්ගත ලෙස විදුලිය ඇණ හිටුවා තිබූ කාල පරිච්ඡේදය තුළ මෙම කාර්යය සිදු කරන ලදී. ප්‍රවේශ සොරොව්වෙහි සමස්ත දිග ප්‍රමාණය මීටර 438ක් පමණ වේ.

සාමාන්‍යයෙන් මෙයාකාරයේ විශේෂ කටයුතු තෙවන පාර්ශ්වයේ කිමිදුම් කණ්ඩායමක් විසින් සිදු කරනු ලබයි. සොරොව්ව, ප්‍රවේශ මුදුන, පොම්පාගාර පත්ල ආදිය නිරීක්ෂණය කිරීමේ හෝ දැක විපරම් කර බැලීමේ ප්‍රවේශයක් ලං.වි.ම. සතු නොවේ. ඒ අනුව ලං.වි.ම.ට පිටස්තර කොන්ත්‍රාත්කරුවෙකු විසින් සපයා දෙනු ලබන තොරතුරු මත රඳා පැවැත්මට සිදුවේ.



ලක්විජය විදුලි බලාගාරයේ කිමිදුම් කණ්ඩායම

කෙසේ වුවද, නිරීක්ෂණ කාර්යයට අවතීර්ණ වෙමින් ලක්විජය විදුලි බලාගාර කිමිදුම් කණ්ඩායම විසින් මෙම බාධකය ඉවත් කරන ලදී. අංක 03 ඒකකයේ මුහුදු ජල ප්‍රවේශක සොරොව්ව පිරිසිදු කිරීම කෙරෙහි ලක්විජය විදුලි බලාගාර කිමිදුම් කණ්ඩායම විසින් ලබාදෙන ලද කැපවීම හා දායකත්වය සාර්ථක විය.

# ජනන අංශය



ලක්විජය බලාගාරයේ මුහුදු ජල ප්‍රවේශක සොරොව්ව පිරිසිදු කිරීම

## විශේෂ ප්‍රතිසංස්කරණ හා ව්‍යාපෘති කටයුතු

### ලක්විජය විදුලි බලාගාරය - ගල් අඟුරු අංගනයේ ධාරිතාවය ප්‍රවර්ධනය

ගල් අඟුරු විදුලි බලාගාරයක් මෙහෙයවීම සම්බන්ධයෙන් පසුගිය වසර කිහිපය තුළ ලබාගත් අත්දැකීම් සමගින්, ගල් අඟුරු පවත්නා ප්‍රමාණය වර්ධනය කළහොත් බලාගාරයේ විශ්වසනීයත්වය වැඩිදියුණු කළ හැකි බව හඳුනා ගන්නා ලදී. අයහපත් කාලගුණයේ, ගල් අඟරු ප්‍රසම්පාදන ප්‍රමාදයන්ගේ හා ගල් අඟුරු සම්බන්ධයෙන් කටයුතු කිරීමේ පවත්නා ගැටලු යන කරුණුවලින් ඇතිවන හානිකර ප්‍රතිවිපාක වළකාලනු පිණිස, පවත්නා ගල් අඟුරු බලාගාරයේ ගල් අඟුරු ගබඩා කිරීමේ හා පවත්වාගෙන යාමේ ධාරිතාවය වර්ධනය කිරීමට තීරණය කරන ලදී.



ලක්විජය බලාගාරයේ ගල්අඟුරු අංගනයේ ධාරිතාව වැඩි කිරීම



ලක්විජය බලාගාරයේ ගල්අඟුරු අංගනයේ ධාරිතාව වැඩි කිරීම

අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගනිමින් කොන්ත්‍රාත්තුව 2019 ඔක්තෝබරයේදී චයිනා මැෂිනරි ඉන්ජිනියරින් කෝපරේෂන් වෙත පිරිනමන ලදී. ව්‍යාපෘතිය 2020.09.10 දින නිල වශයෙන් ආරම්භ වූ අතර මේවන විට හොඳින් ක්‍රියාත්මක වේ. වසර අවසානය වනවිට, ව්‍යාපෘතියේ භෞතිකව අවසන් කොට ඇති ප්‍රමාණය 8%ක් පමණ වේ. ව්‍යාපෘතිය 2022 සැප්තැම්බරය වන විට අවසන් කිරීමට සැලසුම් කර ඇත.

### කැළණිතිස්ස විදුලි බලාගාරය - V රාමු ගෑස් ටර්බයින ප්‍රතිසංස්කරණය

කැළණිතිස්ස විදුලි බලාගාරයේ V රාමු ගෑස් ටර්බයිනවල පවත්නා නිශ්චිත ගුණාංග හේතුකොට ඒවා විසින් ප්‍රධාන කාර්ය භාරයක් සිදු කරමින් පැවතිණි. අවම වශයෙන් වසර හයකින් මෙම ගෑස් ටර්බයිනයන්හි ඉවත් කිරීමේ වයස දිගු කිරීමට තීරණය කරන ලදී. ගෑස් ටර්බයිනය - 01, ගෑස් ටර්බයිනය - 02, ගෑස් ටර්බයිනය - 04 හා ගෑස් ටර්බයිනය - 05 යන V රාමු ගෑස් ටර්බයින හතරෙහි විශ්‍රාමික හෙවත් ඉවත් කිරීමේ වයස දිගු කිරීම පිණිස ප්‍රමාණවත් අමතර කොටස් ප්‍රමාණයක් ප්‍රසම්පාදනය කරගැනීමෙන් අනතුරුව ඒකකයන්හි ප්‍රධාන නඩත්තු /ප්‍රතිසංස්කරණ සිදු කිරීම අවශ්‍ය වේ.

ජනන ව්‍යාපෘති ශාඛාව විසින් ස්ථාපනය කරන ලද ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ව්‍යාපෘති කටයුතු භාරගන්නා ලදී. මෙම ව්‍යාපෘතිය සමාන්තරව ක්‍රියාත්මකවන විදුලි, උපකරණ හා පාලන, හා යාන්ත්‍රික යන අනු ඒකකවලින් ප්‍රධාන වශයෙන් සමන්විත වේ.

ප්‍රතිසංස්කරණය කිරීමෙන් අනතුරුව, කොළඹ නගර ප්‍රදේශයේ පද්ධතිමය වෝල්ටීයතාවය නියාමනය කිරීමට ගෑස් ටර්බයිනය - 01, ගෑස් ටර්බයිනය - 02 හා ගෑස් ටර්බයිනය - 04 අවම විදුලි අවශ්‍යතා හෙවත් අවම බැර මාදිලිය (base load mode) හා සම්මුහුර්ත ධාරිත්‍රක (Synchronous-Condenser) මාදිලියෙන් මේවන විට ක්‍රියාත්මක වේ. ගෑස් ටර්බයිනය - 05හි ඉතිරි ප්‍රතිසංස්කරණ කටයුතු මේවන විට සිදු කෙරෙමින් පවත්නා අතර ව්‍යාපෘතියේ කටයුතුවලින් 60% ක් මේවන විට අවසන්ව ඇත.

ව්‍යාපෘතිය 2021 නොවැම්බර් අවසානය වනවිට සම්පූර්ණ කිරීමට අපේක්ෂිතය.

# ජනන අංශය

වගුව 04 : ජනන පිරිවැය

| සංකීර්ණය | බලාගාරය | සමුච්චිත සැබෑ ජනනය (ගි.වො.පැ.) | සමුච්චිත සැබෑ වියදම (රු. මිලි.) | සාමාන්‍ය ඒකක පිරිවැය (රු./කි.වො.පැ.) |
|---|---|---|---|---|
| තාප | කැළණිතිස්ස වි.බ. - ගෑස් ටර්බයිනය | 133.87 | 8,773.39 | 65.54 |
| | කැළණිතිස්ස වි.බ. - සංයුක්ත චක්‍රීය | - | - | - |
| | සපුගස්කන්ද | 775.31 | 18,786.09 | 24.23 |
| | දූපත් කුඩා ජනන යන්ත්‍ර | 2.61 | 180.16 | 69.00 |
| | උතුරු ජනනි | 111.49 | 2,857.03 | 25.63 |
| | යාත්‍රාවක නැංවූ වි.බ. | 413.54 | 8,856.68 | 21.42 |
| | හදිසි විදුලිය - මෙ.වො.1 x 50 | 78.24 | 2,621.55 | 33.68 |
| | **සමස්ත තාප - ඉන්ධන** | **1,515.06** | **45,356.65** | **29.94** |
| **ගල් අඟුරු** | **ගල් අඟුරු** | **6,364.95** | **62,455.46** | **9.81** |
| **සමස්ත තාප** | **සමස්ත තාප** | 7,880.01 | 107,812.10 | 13.68 |
| මහවැලි | වික්ටෝරියා | 507.13 | 963.10 | 1.90 |
| | කොත්මලේ | 399.94 | 1,003.40 | 2.51 |
| | උකුවෙල | 180.12 | 277.38 | 1.54 |
| | බෝවතැන්න | 55.24 | 187.98 | 3.40 |
| | රන්දෙනිගල/රන්ටැඹේ | 395.72 | 1,126.84 | 2.85 |
| | නිල්ලඹේ | 8.24 | 101.49 | 12.31 |
| | ඉහළ කොත්මලේ | 352.19 | 1,342.77 | 3.81 |
| | **සමස්ත මහවැලි** | **1,898.58** | **5,002.96** | **2.64** |
| ලක්ෂපාන | පැරණි හා නව ලක්ෂපාන | 781.48 | 889.92 | 1.14 |
| | සමනල | 418.61 | 629.96 | 1.50 |
| | විමලසුරේන්ද්‍ර | 102.24 | 417.53 | 4.08 |
| | කැනියන් | 145.12 | 354.50 | 2.44 |
| | **සමස්ත ලක්ෂපාන** | **1,447.45** | **2,291.90** | **1.58** |
| සමනල | සමනලවැව | 245.78 | 1,096.50 | 4.46 |
| | කුකුලේ | 298.52 | 481.57 | 1.61 |
| | ඉඟිනියාගල | 30.43 | 110.24 | 3.62 |
| | උඩවලවේ | 8.66 | 137.91 | 15.92 |
| | **සමස්ත සමනල** | **583.39** | **1,826.21** | **3.13** |
| **සමස්ත ජල** | **සමස්ත ජල** | **3,929.42** | **9,121.07** | **2.32** |
| **සමස්ත ලං.වි.ම.** | **සමස්ත ලං.වි.ම.* (ජනන ලක්ෂ්‍යයේදී)** | **11,809.07** | **116,933.18** | **9.90** |

* - මන්නාරම සුළං විදුලි බලාගාර ජනනය රහිතව



බෝලවත්ත කොටුමා උපපොළ

මෙහෙයුම් සමාලෝචනය

# සම්ප්‍රේෂණ අංශය

# සම්ප්‍රේෂණ අංශය

රට වෙනුවෙන් අරපිරිමැසුම්දායී සම්ප්‍රේෂණ පද්ධතියක් ගොඩනගා, මෙහෙයවමින් පවත්වාගෙන යාමේ ව්‍යවස්ථාපිත වගකීමක් ලං.වි.ම. සතුවේ. මෙයට අමතරව, රටේ පුරෝකථනය කරනු ලබන විදුලි ඉල්ලුම සපුරාලනු පිණිස ප්‍රමාණවත් ජනනයක් පවත්වාගෙන යාම ලං.වි.ම.හි ව්‍යවස්ථාපිත වගකීමයි. මෙම ව්‍යවස්ථාපිත කාර්යයන් මෙන්ම සෙසු වගකීම්ද ඇතුළත් වන පරිදි ශ්‍රී ලංකා විදුලිබල පනත ප්‍රකාර ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් ලං.වි.ම. වෙත සම්ප්‍රේෂණ බලපත්‍රයක් නිකුත් කර ඇත.

අංශයේ මෙහෙයුම් අරමුණු පහත පරිදි වේ:

- කාර්යක්ෂම, සමායෝජිත, විශ්වසනීය හා අරපිරිමැසුම්දායී සම්ප්‍රේෂණ පද්ධතියක් ගොඩනගා පවත්වාගෙන යාම.
- පාරිභෝගිකයක් වෙත ආරක්ෂිත, විශ්වසනීය හා අරපිරිමැසුම්දායී විදුලි සැපයුමක් ලබාදෙන බවට සහතික වනු පිණිස බෙදාහැරීමේ බලපත්ලාභීන් වෙත තොග වශයෙන් විදුලිය ලබාගෙන අලෙවි කිරීම.
- සැලකිය යුතු පුරෝකථනීය විදුලි ඉල්ලුමක් සපුරාලනු පිණිස ජනන බලාගාරයන් වෙතින් ප්‍රමාණවත් ධාරිතාවයක් පවත්වාගෙන යන බවට වගබලා ගැනීම
- කි.වෝ. 132 හා කි.වෝ. 220 සඳහා පද්ධතිමය සම්ප්‍රේෂණ වෝල්ටීයතා විචලනයන් ±10 % ඇතුළතද, සංඛ්‍යාතය හර්ට්ස් 50 හි ±1 % ඇතුළතද පවත්වාගෙන යාම.

ලං.වි.ම.හි සෙසු අංශ වෙත සේවා සපයන අතර ලං.වි.ම. වෙනුවෙන් මෙකී අරමුණු පෙරදැරිව ඉහත කී කාර්යයන් ඉටු කිරීමේ වගකීම සම්ප්‍රේෂණ අංශය සතුවේ.

සම්ප්‍රේෂණ අංශය යටතේ ශාඛා දහතුනක් ස්ථාපනය කර ඇත.

නිසි කලට ස්වාධීන විදුලි සම්පාදනායතන විදුලි බලාගාර ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, 2020 වසරේදී නව ශාඛාවක් වන පුද්ගලික විදුලි සංවර්ධන ශාඛාව ස්ථාපනය කරන ලදී.

සවිස්තරාත්මක අධ්‍යයනයන් සිදු කිරීමෙන් අනතුරුව, සම්ප්‍රේෂණ අංශය විසින් දිගු කාලීන ජනන ව්‍යාප්ති සැලැස්ම (LTGEP) පළ කරනු ලබයි. දිගු කාලීන ජනන ව්‍යාපෘති සැලැස්ම මගින් වසර 20 ක කාල පරිච්ඡේදයක් සඳහා රටේ විදුලිබල පද්ධතියට සිදුකරන අවශ්‍ය වූ අනාගත ජනන එක් කිරීම් පිළිබඳ විස්තර සපයනු ලබයි. තවද, දිගු කාලීන ජනන ව්‍යාපෘති සැලැස්ම මත පදනම් වූ දිගු කාලීන සම්ප්‍රේෂණ සංවර්ධන සැලැස්ම (LTTDP) මගින් එළැඹෙන වසර 10 ක කාල පරිච්ඡේදය සඳහා සිදුකිරීමට අවශ්‍ය සම්ප්‍රේෂණ මාර්ග හා සෙසු යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම් හඳුනාගනු ලබයි. දිගු කාලීන සම්ප්‍රේෂණ සංවර්ධන සැලැස්ම විකාශන සැලැස්මක් ලෙසද පළ කරනු ලබයි.

සම්ප්‍රේෂණ අංශය විසින් කි.වෝ. 220 හා කි.වෝ. 132 සම්ප්‍රේෂණ ජාලය යොදාගනිමින් සියලු ජනන බලාගාර මගින් ජාතික ජාලය වෙත සපයනු ලබන විදුලිය සිය පද්ධති පාලන මධ්‍යස්ථානය හරහා බෙදාහැරීමේ අංශ වෙත ලබාදෙනු ලබයි. මෙම අංශය විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් (PPA) පිළිබඳ කොන්ත්‍රාත්වලට එළැඹීම මගින් නිදහස් විදුලිය සම්පාදකයන්ගේ විදුලි බලාගාර ක්‍රියාත්මක කිරීම හා සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති (NCRE) හෝ සෙසු පුනර්ජනනීය බලශක්ති (ORE) බලාගාර ක්‍රියාත්මක කිරීමේ වගකීමද දරයි. මෙයට අමතරව, මෙම අංශය ජනන බලපත්ලාභීන් (GLs) වෙතින් විදුලිය 'මිලදී ගැනීමේ' හා ලංකා විදුලි පෞද්ගලික සමාගමද ඇතුළත් බෙදාහැරීමේ බලපත්ලාභීන් පස් දෙනෙකු අතර ඒවා අලෙවි කිරීමේ කාර්යයෙහිද නියැලේ. 2015 අනුමත අයක්‍රම ක්‍රමවේදයට අනුව සෑම මාස 6කටම වරක් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත තොග සැපයුම් අයක්‍රම (BST) ඉදිරිපත් කිරීමද මෙම අංශය විසින් සිදු කරනු ලබයි.

සම්ප්‍රේෂණ ජාලය මෙහෙයවීම හා නඩත්තුව අංශයේ මූලික වගකීම වේ. වත්කම් කළමනාකරණය හා නඩත්තු කළමනාකරණය පරිගණකගත නඩත්තු කළමනාකරණ පද්ධතියක් (CMMS) මත පදනම්ව සිදු කෙරේ. මෙහෙයුම් හා නඩත්තු කටයුතු විමධ්‍යගත කර ඇත.

තවද, අවශ්‍ය ආරක්ෂණ දර්ශනයන් හඳුනා ගනිමින් ඒවා පවත්නා විදුලිබල ජාලය ආරක්ෂා කිරීම හා මතු වැඩිදියුණුව වෙනුවෙන් යෙදවීම හෝ විදුලිබල ජාලය ප්‍රතිසංස්කරණයද සිදු කරනු ලබයි. සම්ප්‍රේෂණ අංශය විසින් ලං.වි.ම. ඇතුළත හඬ හා දත්ත සන්නිවේදන අවශ්‍යතාවයන්ද සම්පාදනය කරනු ලබයි. මෙතුළට හඬ හා දත්ත මෙහෙයවීම හා නඩත්තුවද, හඬ හා දත්ත ආරක්ෂණ සංඥාකරණය හා පාලනයද ඇතුළත් වේ.

මෙයට අමතරව, පවරා ඇති මානව සම්පත් හා මූල්‍ය කටයුතුද මෙම අංශය විසින් සිදු කරනු ලබයි.

### සම්ප්‍රේෂණ අංශයේ කාර්ය සාධනය

වසර අවසානය වනවිට සම්ප්‍රේෂණ පද්ධතිය පිළිබඳ විස්තර පහත දී ඇත

**වගුව T 1 : 2020 දෙසැම්බර් 31 වන දිනට සම්ප්‍රේෂණ පද්ධතිය**

| වෝල්ටීයතා මට්ටම | අයිතමය | ඒකකය | ප්‍රමාණය |
|---|---|---|---|
| කි.වෝ. **220** | උඩිස් රැහැන් | කි.මී. | 777 |
| | භූගත රැහැන් | කි.මී. | 22 |
| කි.වෝ. **132** | උඩිස් රැහැන් | කි.මී. | 2,306 |
| | භූගත රැහැන් | කි.මී. | 55 |
| කි.වෝ. **220/ 132/ 33** | කොටුමා උපපොළයන් | සංඛ්‍යාව | 4 |
| | තරාපැවි | සංඛ්‍යාව | 8 |
| | | මෙ.වො.ඇ. | 1,600/380 |
| කි.වෝ. **220/132** | කොටුමා උපපොළයන් | සංඛ්‍යාව | 6 |
| | තරාපැවි | සංඛ්‍යාව | 12 |
| | | මෙ.වො.ඇ. | 2,510 |
| කි.වෝ. **132/33** | කොටුමා උපපොළයන් | සංඛ්‍යාව | 58 |
| | තරාපැවි | සංඛ්‍යාව | 146 |
| | | මෙ.වො.ඇ. | 4,631.5 |
| කි.වෝ. **132/11** | කොටුමා උපපොළයන් | සංඛ්‍යාව | 8 |
| | තරාපැවි | සංඛ්‍යාව | 22 |
| | | මෙ.වො.ඇ. | 792 |
| කි.වෝ. **220/33** | කොටුමා උපපොළයන් | සංඛ්‍යාව | 3 |
| | තරාපැවි | සංඛ්‍යාව | 4 |
| | | මෙ.වො.ඇ. | 246 |

### විදුලිබල පද්ධති කාර්ය සාධනය

2020 වසර සඳහා වූ ශුද්ධ විදුලි ජනනය ගි.වො.පැ. 15,714 ක් විය. කොවිඩ් - 19 වසංගත තත්ත්වයෙහි බලපෑම හේතුකොට 2019 වසරට සාපේක්ෂව ශුද්ධ ජනනය 1.3% කින් පහත වැටිණි.

2020 වසර තුළ ලං.වි.ම. සතු ජල විදුලි බලාගාරයන්ගෙන් ලද ශුද්ධ ජනනය ගි.වො.පැ. 3,911 ක් වූ අතර 2019 වසරේ සිට 3.4%

# සම්ප්‍රේෂණ අංශය

ක වර්ධනයක් වාර්තා කරමින් 2020 වසරේ ශුද්ධ ජනනයට 24.9% ක දායකත්වයක් ලබාදෙන ලදී.

මන්නාරම සුළං විදුලි බලාගාරය (MWPP) විසින් 2020.11.07 දින පරීක්ෂණ කටයුතු සඳහා සිය මෙහෙයුම් ආරම්භ කරන ලදී. මන්නාරම සුළං විදුලි බලාගාරයෙන් ලද සමස්ත ජනනය ගි.වො.පැය 8ක් වූ අතර එය සමස්ත ජනනයෙන් 0.05% ක් ලෙසද, වහළය මත සවි කරන සූර්ය බල උත්පාදකයන් හැර සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති බලාගාරයන්ගෙන් ලද සමස්ත ජනනයෙන් 0.5% ක් ලෙසද වාර්තා විය.

2020 සඳහා වහළය මත සවි කරන සූර්ය බල ජනනය හැරුණු කොට සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තියෙන් (NCRE) හා ස්වාධීන විදුලි නිෂ්පාදකයන්ගෙන් ලද දායකත්වය ගි.වො.පැය 1,589 ක් වූ අතර, ශුද්ධ ජනනයෙන් 10.1% ක් වූ එතුළ 2019 වසරේ සිට ගි.වො.පැය 10 ක වර්ධනයක් වාර්තා කෙරිණි.

**රූපය T 1: 2020 වසරේ ශුද්ධ බලශක්ති ජනන මුහුව**




(*) – ජෛවස්කන්ධ, ඩෙන්ඩ්‍රෝ හා නාගරික ඝණ අපද්‍රව්‍ය

2020 වසර තුළ ලං.වි.ම., අඩු වෝල්ටීයතා හා මධ්‍ය වෝල්ටීයතා ජාලය වෙත යවන ලද වහළය මත සවි කරන සූර්ය බල ජනන සමස්තය ගි.වො.පැ. 269ක් වූ අතර, ශුද්ධ ජනනයෙන් 1.7% ක් වූ එතුළ 2019 වසරේ සිට ගි.වො.පැ. 87 ක වර්ධනයක් වාර්තා විය.

2020 වසර සඳහා සමස්ත තාප ජනනය ගි.වො.පැ. 9,936 ක් විය. ලක්විජය ගල් අඟුරු බලාගාරයෙහි දායකත්වය 58% ක් (ගි.වො.පැය 5,754 ක්) වූ අතර, මෙය 2019 වසරේ සිට ගි.වො.පැය 393 ක වර්ධනයක් විය. 2020 වසරේ සමස්ත තාප ජනනය තුළ 4% ක අඩුවීමක් වාර්තා වූ අතර, එය 2019 වසරේ සමස්ත තාප ජනන අගයට වඩා ගි.වො.පැය 441 ක පහත වැටීමක් විය. 2020 වසරේ ස්වාධීන විදුලි නිෂ්පාදකයන් විසින් සිදුකළ තාප ජනනය ගි.වො.පැය 2,717 ක අගයක් ගත් අතර එතුළ 2019 වසර හා සාපේක්ෂව ගි.වො.පැය 158 ක (5.5%) පහත වැටීමක් පෙන්නුම් කරයි.

2018, 2019 හා 2020 වර්ෂවල සාමාන්‍ය මාසික ශුද්ධ ජනන සන්සන්දනය රූපය T2හි දක්වා ඇත. වසරේ පළමු මාස දෙක ඇතුළත ජනනයෙහි වර්ධනයක් නිරීක්ෂණය වුවද, කොවිඩ් - 19 වසංගතයට එරෙහිව පූර්ණ වශයෙන් හා කොටස් වශයෙන් රට වසා දැමීම සඳහා ගන්නා ලද තීරණයන් හේතුකොට විදුලි ඉල්ලුමෙහි අඩුවීමක් නිරූපණය කරමින් ජනනය පහත වැටිණි.

2019 වසරට සාපේක්ෂව 2020 වසරේ මාසික බලශක්ති ජනනයෙහි සාමාන්‍ය වර්ධනයට/පහත වැටීමට අදාළ සන්සන්දනයක් පහත T3 රූපයෙහි දී ඇති අතර, මෙතුළ කොවිඩ් - 19 වසංගත තත්ත්වයෙහි බලපෑම පැහැදිලිව පෙන්නුම් කරයි.

**රූපය T 2 : 2018/2019/2020 වර්ෂයන්හි සාමාන්‍ය මාසික ශුද්ධ ජනන පැති පෙනුම**




**රූපය T 3: 2020 හා 2019 සාමාන්‍ය මාසික බලශක්ති ජනනය ඉහළ/පහළ යාම සම්බන්ධ සන්සන්දනය**




සමාලෝචිත වසර තුළ දෛනික සාමාන්‍ය බලශක්ති පරිභෝජනය ගි.වො.පැ. 42.9ක් විය. මෙතුළ 2019 වසරේ සිට 1.6%ක අඩුවීමක් පෙන්නුම් කරයි. 2019 වසර හා 2020 වසර තුළ සාමාන්‍ය දෛනික විදුලිය පරිභෝජන සන්සන්දනය රූපය T4 තුළ දී ඇත.

2020.08.17 දින පැය 12:30ට දීපව්‍යාප්ත විදුලි විසන්ධියක් සිදුවූ අතර, 2020 වසර තුළ තවත් ප්‍රධාන දෝෂ 5ක් හා පාර්ශ්වීය දෝෂ 11ක්ද සිදුවිය.

2020 වසර තුළ පද්ධතියේ සිදුවූ දෝෂයන් හෝ ජනන හිඟතාවයන් හේතුකොට බෙදා නොහරින ලද සමස්ත බලශක්තිය ප්‍රමාණය ගි.වො.පැ. 18.7ක් විය.

2020 වසරේ රාත්‍රී කාලයේ සිදුවූ උපරිම ඉල්ලුම 2020.03.11 දින පැය 19:15ට වාර්තාවූ අතර එහිදී විදුලිය ඉල්ලුම මෙ.වො. 2,717 සීමාවට ප්‍රවිෂ්ට විය. එදිනම දිවා කාලයේ උපරිම ඉල්ලුම පැය 16:00ට මෙ.වො. 2,377ක් විය. 2020.03.11 දින බැර පැති පෙනුම

# සම්ප්‍රේෂණ අංශය

රූපය T 4 : සාමාන්‍ය දෛනික බලශක්ති පරිභෝජනය මාසික පදනමින් (ගි.වො.පැ.)




T5 රූපයේ දී ඇති අතර, පසුගිය වසර තුන ඇතුළත උපරිම රාත්‍රී කාල ඉල්ලුම් වාර්තා වූ දිනයන්හි බැර වක්‍ර T6 රූපයේ දී ඇත.

2020 වසරේ උපරිම දිවා කාල ඉල්ලුම 2020.03.12 දින පැය 16:00ට වාර්තා වූ අතර, විදුලි ඉල්ලුම මෙ.වො. 2,394ක අගයක් ගන්නා ලදී.

2020 වසරේ අඩුම ඉල්ලුම 2020.09.07 දින පැය 03:15ට වාර්තා වූ අතර, වාර්තාගත ඉල්ලුම මෙ.වො. 892ක් විය.

රූපය T 5 : වසරේ උපරිමය වාර්තා කළ දින අඩපැය ජනන බැර පැති පෙනුම




ගි.වො.පැ. 49.4ක් වූ උපරිම දෛනික ජනනයක් 2020.03.12 දින වාර්තා වූ අතර, ගි.වො.පැ. 27.8ක් වූ අවම දෛනික ජනනයක් 2020.08.17 දින හෙවත් පූර්ණ විදුලිය බිඳ වැටීමක් සිදුවූ දින වාර්තා විය. කෙසේ වුවද, ගි.වො.පැ. 28.4ක් වූ දෙවන අඩුම දෛනික ජනනය සිංහල හා හින්දු අලුත් අවුරුදු දිනය යෙදුණු 2020.04.14 දින වාර්තා විය. 2020 වසර සඳහා වූ සාමාන්‍ය දෛනික ජනනය ගි.වො.පැ. 42.7ක් විය.

රූපය T 6 : වාර්ෂික රාත්‍රී කාල උපරිමය වාර්තා වූ දින බැර වක්‍ර (2018 -2020)




**ජලාශ කාර්ය සාධනය**

ගි.වො.පැ. 1,071ක සමස්ත ජල ගබඩාකරණයක්ද සහිතව 2020 වසර ආරම්භ විය. මෙය වූකලි ගි.වො.පැ. 1,194ක් වන පද්ධතියේ පූර්ණ ගබඩා ධාරිතාවයෙන් 89.7%ක අගයකි.

2020 වසර තුළ ලද සමස්ත ආගලනය ගි.වො.පැ. 3,732ක් වන අතර එය සාමාන්‍ය මට්ටමට පහළ තත්ත්වයක් සේ සැලකේ. දෙවන අන්තර් මෝසම් හා ඊසාන දිග මෝසම් කාල සීමාවන් තුළ පැවති අඩු වර්ෂාපතනය හා අතිශයින් වියළි කාලගුණය හේතුකොට මාර්තු සහ අප්‍රේල් මාසවලදී, පසුගිය වසර 20 තුළ දක්නට ලැබුණු දෙවන පහළම ආගලනය වාර්තා විය. ඔක්තෝබර් මාසයේ සිට දෙසැම්බර් මස අවසානය දක්වා සාපේක්ෂව අඩු ජල ආගලනයන් වාර්තාවිය. ගි.වො.පැ. 19.9ක් වූ උපරිම සාමාන්‍ය දෛනික ආගලනය 2020 සැප්තැම්බර් මාසය තුළ ලැබිණි.

අඩුම ගබඩාකරණය 2020.05.05 දින වාර්තා වූ අතර එදින වාර්තා වූ ගබඩාකරණය ගි.වො.පැ. 550ක් විය. වර්ෂාවසාන ගබඩාකරණය ගි.වො.පැ. 888ක් වූ අතර, මෙය 2019 වසර හා සාපේක්ෂව 17.6%ක අඩුවීමකි.

රූපය T 7 : 2019 හා 2020 සමස්ත ජලාශ ගබඩාකරණයේ විචලනය



# සම්ප්‍රේෂණ අංශය

## සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති (NCRE) ව්‍යාපෘතිවල කාර්ය සාධනය

**වගුව T 2 : මෙහෙවරෙහි යොදවන ලද ස.නො.පු.බ. ව්‍යාපෘති**

| කාණ්ඩය | 2020 දී මෙහෙවරෙහි යොදවන ලද | | 2020 වර්ෂාවසානය වනවිට සමුච්චිත මෙහෙවරෙහි යොදවන ලද ව්‍යාපෘති | |
|---|---|---|---|---|
| | බලාගාර සංඛ්‍යාව | ධාරිතාවය (මෙ.වො.) | බලාගාර සංඛ්‍යාව | ධාරිතාවය (මෙ.වො.) |
| කුඩා ජල විදුලි | 2 | - | 208 | 410 |
| ජෛවස්කන්ධ | - | - | 13 | 40 |
| සුළං | 2 | 20 | 17 | 148 |
| සූර්ය | 18 | 18 | 32 | 75 |
| නාගරික ඝණ අපද්‍රව්‍ය | 1 | 10 | 1 | 10 |
| **එකතුව** | **23** | **48** | **271** | **683** |

### ප්‍රමිතිගත අයකුම යටතේ විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් අත්සන් කොට මෙහෙවරෙහි නොයොදවන ලද ව්‍යාපෘති

විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් අත්සන් කර ඇති ඇතැම් ව්‍යාපෘති ඉඩම්, පාරිසරික හා සමාජමය ගැටලු හේතුකොට මේ දක්වාද මෙහෙවරෙහි යොදවා නොමැත. ඒවාහි සාරාංශයක් පහත දී ඇත:

**වගුව T 3 : ප්‍රමිතිගත අයකුම යටතේ එන මෙහෙවරෙහි නොයොදවන ලද සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති**

| | බලාගාර සංඛ්‍යාව | ධාරිතාව (මෙ.වො.) |
|---|---|---|
| කුඩා ජලවිදුලි | 48 | 79 |
| ජෛවස්කන්ධ | 11 | 58 |
| සුළං | 1 | 11 |
| නාගරික ඝණ අපද්‍රව්‍ය | 2 | 10.13 |
| **එකතුව** | **64** | **158.13** |

### ටෙන්ඩර් ක්‍රියාවලිය සිදුවෙමින් පවත්නා ව්‍යාපෘති පිළිබඳ සාරාංශය

2013 වසරේදී විදුලි පනත සංශෝධනය කිරීමත් සමගින්, සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය සංවර්ධනයද තරගකාරී ලංසු ක්‍රමය හරහා සිදුවිය යුතුව ඇත. 2015දී මෙ.වො. 10 සුළං විදුලි බලාගාර දෙකක් සඳහා වූ පළමු ටෙන්ඩරය කැඳවන ලදී. ඉන්පසු ටෙන්ඩර් කිහිපයක් කැඳවනු ලැබ ඇත. සාරාංශයක් පහත දී ඇත.

**වගුව T 4 : ටෙන්ඩර් ක්‍රියාවලියට යටත්ව පවත්නා ස.නො.පු.බ. ව්‍යාපෘති විස්තර**

| ටෙන්ඩරය | බලාගාර සංඛ්‍යාව | මුළු ධාරිතාව (මෙ.වො.) | වෙනත් කරුණු |
|---|---|---|---|
| චුන්නාක්කම් සුළං | 2 | 20 | මෙහෙවරෙහි යොදවන ලදී |
| මෙ.වො. 60x 1 (සූර්ය) | 60 | 60 | ව්‍යාපෘති 35ක් පිරිනමනු ලැබ විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් අත්සන් කරන ලදී. ව්‍යාපෘති 20ක් මෙහෙවරෙහි යොදවන ලදී. |
| මෙ.වො. 90x 1 (සූර්ය) | 90 | 90 | ව්‍යාපෘති 70ක් පිරිනමනු ලැබ ව්‍යාපෘති 29ක් සඳහා විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් අත්සන් කරන ලදී. ව්‍යාපෘති 04ක් මෙහෙව-රෙහි යොදවන ලදී. |
| මෙ.වො. 2x 10 (සූර්ය) | 2 | 20 | ටෙන්ඩරය පිරිනමන ලදී විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් අත්සන් කිරීමට නියමිතය |
| ගොවිපල සහිත සූර්ය විදුලි | 1 | 10 | ටෙන්ඩරය පිරිනමන ලදී අභිප්‍රාය ලිපිය ලැබීමට නියමිතය |
| මෙ.වො. (1~10) සුළං බලාගාර | තීරණය කළ යුතුව ඇත | 60 | ටෙන්ඩරය වසා දමන ලදී පිරිනැමීමට නියමිතය |
| මෙ.වො. (1~10) සූර්ය බලාගාර | තීරණය කළ යුතුව ඇත | 150 | ටෙන්ඩරය වසා දමන ලදී පිරිනැමීමට නියමිතය |
| **එකතුව** | | **410** | |

**වගුව T 5 : විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් හා අභිප්‍රාය ලිපි අදියරයන්හි පවත්නා ව්‍යාපෘති විස්තර**

| | විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් අත්සන් කරන ලද | | අභිප්‍රාය ලිපි නිකුත් කරන ලද | |
|---|---|---|---|---|
| | බලාගාර සංඛ්‍යාව | ධාරිතාව (මෙ.වො.) | බලාගාර සංඛ්‍යාව | ධාරිතාව (මෙ.වො.) |
| සූර්ය | 40 | 40 | 43 | 61 |

### ස.නො.පු.බ. සංවර්ධනය හා අතීත කාර්ය සාධනය

**රූපය T 8 : මෙහෙවරෙහි යොදවන ලද සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සමුච්චිත එකතුව (වහළය මත සවිකරන සූර්ය යන්ත්‍රාගාර හැර)**



# සම්ප්‍රේෂණ අංශය

**රූපය T 9 : සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති මගින් බලශක්ති ජනනය (වහළය මත සවිකරන සූර්ය යන්ත්‍රාගාර හැර)**




**රූපය T 10 : ජාතික බලශක්ති ජනනයට සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති දායකත්වය (වහළය මත සවිකරන සූර්ය යන්ත්‍රාගාර හැර)**




**රූපය T 11 :2020 වසර සඳහා සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තියෙහි තාක්ෂණය අනුව බෙදුණු දායකත්වය (වහළය මත සවිකරන සූර්ය යන්ත්‍රාගාර හැර)**




**රූපය T 12 : 2020 වසරේ සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තියෙහි සාමාන්‍ය පිරිවැය (වහළය මත සවිකරන සූර්ය යන්ත්‍රාගාර හැර)**




### සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති සංවර්ධනයන්හි අනාගතය

ඉහත සඳහන් කරන ලද වැඩිදියුණුවීම්වලට අමතරව, පහත සඳහන් ව්‍යාපෘතිද සංවර්ධනය වෙමින් පවතී:

- පූනරින් මෙ.වො. 233 සුළං උද්‍යානය
- සියඹලාණ්ඩුව මෙ.වො. 100 සූර්ය උද්‍යානය
- මන්නාරම් දූපතේ අදියර II - මෙ.වො. 100 සුළං ව්‍යාපෘතිය
- මෙ.වො. 90 කුඩා ජල විදුලි සංවර්ධනයන්
- මෙ.වො. 190 සූර්ය හා සුළං ටෙන්ඩරය (මෙ.වො. 150 සූර්ය හා මෙ.වො. 40 සුළං)

### උද්දීපනයන්

2020 වසරේදී අංශයට හා එහි කාර්ය මණ්ඩලයට මුහුණ පෑමට සිදුවූ ප්‍රධාන ගැටලුව වූයේ කොවිඩ් - 19 වසංගත තත්ත්වයයි. ප්‍රායෝගිකව ඉතා අපහසු වූ, විශේෂයෙන් දැඩි මාර්ගෝපදේශ සහිත තත්ත්වයක නඩත්තු හා ආශ්‍රිත කටයුතුවලදී අභියෝගය වඩාත් තීව්‍ර විය.

#### අනාගතය උදෙසා වූ නව සැලසුම්

2020-2039 සැලසුම් කාලය සඳහා වූ දිගු කාලීන ජනන ව්‍යාප්ති සැලැස්මේ කෙටුම්පත 2019 මැයි මස 24වන දින ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අතර, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ ඉල්ලීම පරිදි ප්‍රතිශෝධිත ඉදිරිපත් කිරීමක් 2020 මාර්තු මස 12වන දිනද සිදුකරන ලදී. එය ජල, තාප හා සෙසු පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍රයන්ගෙන්ද (සුළං, සූර්ය, කුඩා ජලවිදුලි හා ජෛවස්කන්ධ) යුත් මුහුවක් සහිතව එළැඹෙන වසර 20ක කාල පරිච්ඡේදය තුළ පද්ධතිය වෙත මෙ.වො. 10,782ක ජනන ධාරිතාවයක් එක් කිරීම සඳහා විය.

පුනර්ජනනීය බලශක්ති කොටස ඉහළ නැංවීම ශ්‍රී ලංකා ජාතික බලශක්ති ප්‍රතිපත්තියෙහි හා ක්‍රමෝපායන්හි එක් අරමුණක් වේ. තවද, 2030 වනවිට පුනර්ජනනීය බලශක්තියෙන් සිදුකරන විදුලි ජනනය උපරිම කිරීම සඳහා සැලසුම් සකස් කළයුතු බවට 'සෞභාග්‍යයේ දැක්ම' ප්‍රතිපත්ති රාමුව තුළ නිර්දේශ කර ඇත. ඒ අනුව, අතීතය හා සන්සන්දනය කරන කල, ලං.වි.ම. විසින් එළැඹෙන වසර 20 ඇතුළත සැලකිය යුතු පුනර්ජනනීය බලශක්ති ධාරිතාවයක් එක් කිරීමට සැලසුම් කර ඇත. පුනර්ජනනීය බලශක්ති සම්පත් තුළ 'ස්ථාවර' විදුලිබල ධාරිතාවයක් නොමැත. ඒවා ස්වභාවයෙන්ම නිතර වෙනස්වන සුළුවේ. තත් කාලීනව විදුලි ඉල්ලුම අනුව ක්‍රියාත්මකවනු පිණිස විචල්‍ය පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍රයන්ගෙන් සිදු කෙරෙන ජනනය සමතුලනය කිරීම සඳහා සෙසු

# සම්ප්‍රේෂණ අංශය

ජාල මට්ටමේ ස්ථාවර ධාරිතා විදුලි ජනනයක් අවශ්‍ය කෙරේ. එවන් ස්ථාවර ධාරිතාවයක් එක් කිරීමේ වඩාත් යෝග්‍ය වූද, දිගු කාලීන පැවැත්මක් සහිත වූද විසඳුම වශයෙන් පොම්පකල ගබඩා ජල විදුලි බලාගාරයක් (PSHPP) ලං.වි.ම. විසින් හඳුනාගෙන තිබිණි. ශ්‍රී ලංකාවේ පළමු පොම්පකළ ගබඩා ජල විදුලි ව්‍යාපෘතිය ස්ථානගත කිරීම සඳහා වඩාත් සුදුසු වැඩබිම තෝරා ගැනීමේ කටයුතු ආරම්භ කරන ලදී. මහඔය ද්‍රෝණියේ අරණායක ප්‍රදේශයෙහි හා තවත් මෑතකදී සොයාගත් වැඩබිමක් ලෙස දැනට පවත්නා වික්ටෝරියා ජලාශයේ වේවතැන්න ඉහළ ධාරාගත ප්‍රදේශයෙහි වූ ස්ථානයක්ද ලෙස සුභවාදී ස්ථාන දෙකක් පවතී.

**රූපය T 13 : ප්‍රතිශෝධිත පදනම් ක්‍රමයට එළැඹෙන වසර 20ක කාලය පුරා ජනන ධාරිතා මුහුව**




විදුලි අංශ ප්‍රධාන සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ වැඩසටහනෙහි ධාරිතා සංවර්ධනය සඳහා වූ ව්‍යාපෘතිය ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනයේ (JICA) සහායෙන් ආරම්භ කරන ලදී.

2020 වසර තුළ ප්‍රධාන ව්‍යාපෘති තුනකට අරමුදල් සපයනු සඳහා ආසියානු සංවර්ධන බැංකුව, Agence Française de Development (AFD) හා ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (AIIB) යන අරමුදල් සම්පාදන මූලශ්‍ර තුනක් සූදානම් කරගන්නා ලදී.

මෙම ව්‍යාපෘති තුළට නව ස්විච් අංගන හා ජාල උපපොළ ඉදිකිරීම මෙන්ම පවත්නා උපපොළ සංවර්ධනය හා නව සම්ප්‍රේෂණ මාර්ග ඉදිකිරීමද ඇතුළත් වේ. මෙම ව්‍යාපෘතීන්හි සමස්ත ඇස්තමේන්තුගත පිරිවැය ශ්‍රී ලං.රු. බිලියන 56ක් පමණ වේ. මෙම අරමුදල්කරණයන් සඳහා වූ අවසන් එකඟතාවයන් නුදුරේදීම අවසන් කිරීමට අපේක්ෂිතය.

## නව කොටුමා උපපොළයන්

2020 වසර තුළ පහත සඳහන් කොටුමා උපපොළයන් සම්ප්‍රේශණ අංශය වෙත භාර දෙන ලදී.

| කොටුමා උපපොළ | වෝල්ටීයතා මට්ටම | ධාරිතාවය |
|---|---|---|
| මාලිබොඩ | කි.වෝ. 132/33 | මෙ.වෝ.ඇ. 63 |
| වේවැල්වත්ත | කි.වෝ. 132/33 | මෙ.වෝ.ඇ. 63 |
| කොළඹ A | කි.වෝ. 132/33 | මෙ.වෝ.ඇ. 63 |
| කොළඹ F | කි.වෝ. 132/33 | මෙ.වෝ.ඇ. 63 |

## දැරිය හැකි මිලකට පුනර්ජනනීය බලශක්තිය

ලං.වි.ම. පුනර්ජනනීය බලශක්තිය සම්බන්ධ සිය අපේක්ෂා සහගත ඉලක්ක කරා නොකඩවා ගමන් කරන්නට විය. ඉදිකර, ක්‍රියාත්මක කර හිමිකර ගැනීමේ (BOO) පදනමින් සුළං හා සූර්ය බලාගාර දෙකක් සඳහා ටෙන්ඩර් දෙකක් කැඳවීමට හැකිවිය. එක් ටෙන්ඩරයක් මෙ.වො. 150ක සමස්ත අගයක් සහිත සූර්ය බලාගාර (එකක මෙ.වො. 10ක බලාගාර ධාරිතාවයක් සහිත වනසේ) සඳහාද, අනෙක් ටෙන්ඩරය (එකක මෙ.වො. 10ක බලාගාර ධාරිතාවයක් සහිත) සුළං විදුලිබල මෙ.වො. 60ක් සඳහාද විය. තරගකාරී ලංසු කැඳවීම තුළ සාධාරණ අයක්‍රමයන් ඇතිකළ හැක්කේය යන කරුණ ටෙන්ඩර් සඳහා ලන්සු වශයෙන් ලබාදෙන ලද අයක්‍රමයන් තුළ තහවුරු කෙරිණි.

සමස්ත ධාරිතාවය මෙ.වො. 48ක් සහිත නව සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති බලාගාර 23ක් වසර තුළ මෙහෙවරෙහි යොදවන ලදී. වසරේ ප්‍රධාන උද්දීපනීය කරුණක් වූයේ තරගකාරී ලංසු යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිත පළමු සුළං විදුලිබල ව්‍යාපෘති මෙහෙවරෙහි යෙදවීමයි. 2017 ටෙන්ඩරයට අනුව ඉදිකර, ක්‍රියාත්මක කර හිමිකර ගැනීමේ පදනමින් M/s Vayushakti Vitpaner පුද්ගලික සමාගම සහ Yaal Vayupahawan පුද්ගලික සමාගම විසින් ක්‍රියාත්මක කරන ලද චාවකච්චේරියේ මෙ.වො. 10 සුළං ව්‍යාපෘති දෙක 2020.05.27 දින ජාතික ජාලයට සම්බන්ධ කරන ලදී.

මෙයට අමතරව, පළමු මහා පරිමාණ අපද්‍රව්‍ය මගින් බලශක්තිය නිපදවීමේ (W2E) (නාගරික ඝණ අපද්‍රව්‍ය) ව්‍යාපෘතියද 2020 වසරේදී ජාතික ජාලයට සම්බන්ධ කරන ලදී. වෙස්ටර්න් පවර් පුද්ගලික සමාගම විසින් ක්‍රියාත්මක කරන ලද අපද්‍රව්‍ය මගින් බලශක්තිය නිපදවීමේ බලාගාරය මෙ.වො. 10ක බලාගාරයක් වන අතර එය කෙරවලපිටියේ පිහිටා ඇත.



**රූපය T 14: කෙරවළපිටියේ අපද්‍රව්‍ය මගින් බලශක්තිය නිපදවීමේ විදුලි බලාගාරය**

# සම්ප්‍රේෂණ අංශය

## පද්ධති පාලන මධ්‍යස්ථානයේ (SCC) පුනර්ජනනීය මේසය

පද්ධති පාලන මධ්‍යස්ථානයේ 'පුනර්ජනනීය මේසයක්' ස්ථාපනය කිරීමත් සමගින් 2020 වසරේදී ස.නො.පු.බ. සංවර්ධන ඒකාබද්ධකරණ ඉතිහාසයේ කඩඉමක් සාක්ෂාත් කරගන්නා ලදී. ඉල්ලුම්-සැපයුම් තුලනය පවත්වාගෙන යන අතර ස.නො.පු.බ. ජනන විනිවිද යාම සඳහා නිරතුරු ලං.වි.ම. විසින් පහසුකම් සපයා ඇත. සැලකිල්ලට බඳුන් වූ එක් කරුණක් වූයේ ස.නො.පු.බ. බලාගාරයන්හි තත් කාලීන ජනනය නිරීක්ෂණය කිරීමේ නොහැකියාවයි. ස.නො.පු.බ. ජනනය සෘණ ඉල්ලුමක් වශයෙන් පිළිබිඹු කෙරේ. පර්යේෂණ හා සංවර්ධන ශාඛාවද සමගින් පද්ධති පාලන ශාඛාව විසින් ස.නො.පු.බ. බලාගාර 50ක තත් කාලීන ජනනය නිරීක්ෂණය කිරීම සඳහා නියමු ව්‍යාපෘතියක් දියත් කරන ලදී. තත් කාලීන නිරීක්ෂණ කාර්යය සිදු කිරීමේ හැකියාව ලබා දෙමින් ශාඛා දෙකේ ඉංජිනේරුවරුන් විසින් පාලන කාමරයේ ස.නො.පු.බ. මේසයක් ස්ථාපනය කරන ලදී. ඉදිරි දින මුදා හැරීම් සැලැස්ම මෙන්ම එම මුදා හැරීමේ ආර්ථික තත්ත්වටද අදාළ නිරවද්‍යතාවය වැඩි වර්ධනය කිරීමටද එමගින් ඉමහත් පිටුබලයක් සැපයේ.



රූපය T 15 : පද්ධති පාලන මධ්‍යස්ථානයෙහි පුනර්ජනනීය මේසය

## ස.නො.පු.බ. සංවර්ධනයන් සඳහා 15+ හඳුන්වා දීම

1996 සිට 2008 දක්වා වූ වර්ෂයන් තුළ, ස.නො.පු.බ. විශේෂ විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම්, වළකන ලද පිරිවැය පදනම්ගත අයක්‍රමයක් සහිතව වසර 15ක කාල පරිච්ඡේදයක් සඳහා විය. මෙම විශේෂ විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් තවත් වසර 05ක කාලයක් සඳහා පමණක් දීර්ඝ කරන ලදී. අයක්‍රමයක් හා නිසි ගෙවීම් ව්‍යුහයක්ද නොමැති වීමේ හේතුවෙන්, විශේෂ විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් අත් හිටුවිණි. 2020 වසරේදී විසඳුමක් යෝජනා කරනු ලැබ සිය මෙහෙයුම් කාල සීමාව දීර්ඝ කිරීම සඳහා සියලු සුදුසුකම් ලත් කුඩා ජල විදුලි බලාගාරයන් වෙත අවස්ථාවක් ලබාදෙන ලදී.

## වසංගත කාල සීමාව තුළ ජාලය පවත්වාගෙන යාම

කොවිඩ්-19 වසංගත තත්ත්වය හමුවේ වුව, වැළකුම් නඩත්තු කටයුතු බොහොමයක් මෙන්ම හදිසි අලුත්වැඩියා කටයුතු කෙරෙහිද අවධානය යොමු කරන ලදී.

කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුකොට ඇතිවූ හානිකර තත්ත්වය මධ්‍යයේ වුවද, විදුලි තරාපැවි 218ක් අතරින් 81% ක ද්‍රාවිත වායු විශ්ලේෂණ (DGA) සපුරන ලදී. පිරිමැදුම් සංඛ්‍යාත ප්‍රතිචාර විශ්ලේෂණය (SFRA) මගින් එහි තත්ත්ව ඇඟිලි සළකුණු අතරින් 64%ක්ද සම්පූර්ණ කරන ලදී.



රූපය T 16: මාදම්පේ කොටුමා උපපොළෙහි තරාපැවි ගැස්කට් මාරු කිරීම

වත්කම් කළමනාකරණ හා නඩත්තු කළමනාකරණ කාර්යය සඳහා 2020 වසර තුළ පරිගණකගත නඩත්තු කළමනාකරණ ක්‍රමය (CMMS) උපයෝගී කරගැනීම වැදගත් විය. සිදුවීම් වාර්තා පවත්වාගෙන යාම, නඩත්තු කටයුතු සඳහා මෙන්ම පරීක්ෂණ කටයුතු සඳහාද වැඩ ඇණවුම් නිර්මාණය, නඩත්තු කටයුතු වාර්තාකරණය, නඩත්තු කටයුතු සඳහා මෙන්ම පරීක්ෂණ කටයුතු සඳහාද විදුලිය අත් හිටුවීම් ඉල්ලා සිටීම හා ද්‍රව්‍ය ඉල්ලුම්පත්‍රයද පරිගණකගත නඩත්තු කළමනාකරණ ක්‍රමය මගින් සිදු කරන ලදී. වසරේ අවසන් කාර්තුව තුළ පරිගණකගත නඩත්තු කළමනාකරණ ක්‍රමය පුළුල් ලෙස ප්‍රයෝජනයට ගන්නා ලද බව වාර්තා විය.

## විශ්වසනීයත්වය වැඩි වර්ධනය කරගැනීම කරා වූ පියවර

නොරොච්චෝලේ විදුලි බලාගාරයේ සිට නව හලාවත කොටුමා උපපොළ දක්වා වූ කි.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ගය වූකලි ශ්‍රී ලංකාවේ සම්ප්‍රේෂණ ජාලයෙහි තීරණාත්මක මාර්ගයකි. මෙම මාර්ගය සැලකිය යුතු තරම් වූ ඉහළ සුළං තත්ත්වයන්ගෙන් යුත් අධික ලවණ සහිත පරිසරයක් තුළින් ගමන් කරයි. එබැවින්, කුලුනුවල හා පරිවාරක කම්බි මළ බැඳීම සහ පරිවාරක කම්බි හරහා කොරෝනා පිටවීමේ තත්ත්වයන්ද නිරතුරු නිරීක්ෂණය වේ. මෙම තත්ත්වය සම්ප්‍රේෂණ ජාලයෙහි විශ්වසනීයත්වයට අයහපත් බලපෑමක් ඇති කරයි.

මල බැඳීම හා ලවණ හානිය අවම කිරීමේ ප්‍රතිකර්මක ක්‍රියාමාර්ග යක් වශයෙන් සම්ප්‍රේෂණ මාර්ග නඩත්තු ඒකකය විසින් කූර මතින් තොප්පිය හා කූර සහිත හා කූර මතින් තුත්තනාගම් අතක් සහිත වර්ගයේ වීදුරු පරිවාරකයක් හා පරිවාරකය මතින් සිලිකන් ආවරණයක්ද ස්ථාපනය කරන ලදී.

# සම්ප්‍රේෂණ අංශය



**රූපය T 17 : උණුසුම් කාලගුණික තත්ත්වය තුළ පරිවාරකය මාරු කිරීමේ කටයුතු සිදු කරමින්**

### ලං.වි.ම. සන්නිවේදන ජාලය සංවර්ධනය කිරීම

සන්නිවේදන ජාලය සඳහා පහත සඳහන් කැපී පෙනෙන සංවර්ධන කටයුතු සිදු කරන ලදී.

- ලං.වි.ම. ෆයිබර් ඔප්ටික් ජාලය මතින් නව සන්නිවේදන ජාලයක් (ගිගාබිට් ඊතර්නෙට් ජාලය) ස්ථාපනය කරන ලදුව පහත සම්පාදනයන් උදෙසා විය ව්‍යාප්ත කරන ලදී:
    - කොටුමා උපපොළයන්හි සිට පරිගණකගත නඩත්තු කළමනාකරණ පද්ධති (CMMS) මෘදුකාංගය හා MITFIN පැකේජයට ප්‍රවේශය
    - පාලන හා ආරක්ෂණ ශාඛාව සඳහා කොටුමා උපපොළයන්හි උපපොළ ස්වයංක්‍රීයකරණ පද්ධතිය (SAS) වෙත දුරස්ථ ප්‍රවේශය.
    - කෙන්ට් පාරේ ලං.වි.ම. කාර්යාල සංකීර්ණයේ සිට ලං.වි.ම. අභ්‍යන්තර ජාල පහසුකම් වෙත ප්‍රවේශය
- ජාතික පද්ධති පාලන මධ්‍යස්ථානයේ (NSCC) ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතියට (GPS) අයත් ඔරලෝසු පද්ධතියක් ස්ථාපනය කරන ලද අතර සම්මුහුර්තක අංකිත ධූරානුක්‍රමයේ (SDH) සියලු ප්‍රකාශ තන්තු බහුවිධකරණ නෝඩු (fiber optic multiplexer nodes) සම්මුහුර්තකරණය කරන ලදී.
- කොළඹ 09, කෙන්ට් පාරේ ලං.වි.ම. සංකීර්ණයේ සිට පහසුකම් දුරස්ථව නිරීක්ෂණය කරන්නාවූ අධීක්ෂණ පාලන හා දත්ත උකහා ගැනුම් (SCADA) උපකරණ (RTU & Gateway) ස්ථාපනය කරන ලදී.

### නව සාමාන්‍යකරණයට අනුගත වීම

කොවිඩ් 19 සීමාවන් මධ්‍යයේ දුරස්ථව සිට කටයුතු සිදු කරනු පිණිස, ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය විසින් පූර්ණ වශයෙන් වැඩිදියුණු කරන ලද වීඩියෝ සම්මන්ත්‍රණ පද්ධති තුනක් ලං.වි.ම. වෙත ප්‍රදානය කරන ලදී. ඒවා මේවන විට සාමාන්‍යාධිකාරීවරයාගේ කාර්යාලයේ, ජනන හා සම්ප්‍රේෂණ සැලසුම්කරණ ශාඛාවේ හා පද්ධති පාලන මධ්‍යස්ථානයේ ස්ථාපනය කර ඇත.

### නව සම්ප්‍රේෂණ මූලස්ථානය

උපදේශකනායතනය වන රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් 2020 වසර තුළ නව සම්ප්‍රේෂණ ගොඩනැගිල්ල සඳහා වූ කෙටුම්පත් සැලැස්ම හා ටෙන්ඩර් ලේඛන සම්පූර්ණ කරන ලදී. ලං.වි.ම.හි පවත්නා මූල්‍යමය දුෂ්කරතා හේතුකොට වැඩිදුර කටයුතු කිරීම නතර කෙරිනි.

### විශේෂයේ අවසන් කොටසද අවසන්ව ඇත

සමනලවැව - ඇඹිලිපිටිය කි.වෝ. 132 මාර්ගය 1 හා 2 තුළ වූ, Brown, Boveri & Compagnie (BBC) විසින් නිෂ්පාදනය කරන ලද LZ32 විද්‍යුත් යාන්ත්‍රික ප්‍රතිචාරකයන් වෙනුවට වසර තුළ SEL411L ලෙස අංකමය වශයෙන් වෙනස් වූ ප්‍රතිචාරකයන් යොදන ලදී. ඉවත් කරන ලද ප්‍රතිචාරකයන් දෙක වූකලි ප්‍රධාන ආරක්ෂණ ප්‍රතිචාරකයන් ලෙස කි.වෝ 220/කි.වෝ. 132 සම්ප්‍රේෂණ ජාලයෙහි ක්‍රියාත්මකව පැවති අවසන් විද්‍යුත් යාන්ත්‍රික ප්‍රතිචාරකයන් විය. ඒවා ඉවත් කොට මාරු කිරීම තුළ විද්‍යුත් යාන්ත්‍රික යුගයේ සිට ස්ථිතික හා අංකන යුගයක් කරා වූ සංක්‍රමණය දක්වන කඩ ඉමක් සනිටුහන් කෙරිණි.



**රූපය T 18 : පැරණි ප්‍රතිචාරකය හා නව ප්‍රතිචාරකය**




ජාඇල පෝලිම් කළමණාකරන ක්‍රමය



මෙහෙයුම් සමාලෝචනය

# බෙදාහැරීමේ අංශ

# බෙදාහැරීමේ අංශ

ලංකා විදුලිබල මණ්ඩලය විසින් සමස්ත අලෙවි ධාරිතාවයෙන් 90% ක ප්‍රමාණයක් බෙදා හරිනු ලබන අතර ඉතිරිය එහි අනු-ආයතනයක් වන ලංකා විදුලි පෞද්ගලික සමාගම (LECO) විසින් බෙදාහැරීම කරනු ලබයි.

ලං.වි.ම. සමස්ත බෙදාහැරීමේ පද්ධතිය බෙදාහැරීමේ අංශය 1, බෙදාහැරීමේ අංශය 2, බෙදාහැරීමේ අංශය 3 හා බෙදාහැරීමේ අංශය 4 නමින් යුත් අංශ හතරකට භූගෝලීය වශයෙන් වෙන්කර ඇත. මෙම වෙන්කිරීම ප්‍රධාන වශයෙන් පරිපාලනයේ හා මෙහෙයුම් කටයුතුවල පහසුව උදෙසා මෙන්ම සැපයුමේ කාර්යක්ෂමතාවය හා ගුණාත්මකභාවයද වැඩිදියුණු කිරීමේ අරමුණින් සිදුකරන ලද්දකි.

බොදාහැරීමේ ජාලය කි.වෝ. 33 හා කි.වෝ 11 මැදි වෝල්ටීයතා (MV) මාර්ග, වෝ. 400 අඩු වෝල්ටීයතා (LV) මාර්ග හා බෙදාහැරීමේ තරාපැව්වලින් සමන්විත වේ. කි.වෝ. 220 හා කි.වෝ. 132 සම්ප්‍රේෂණ පද්ධති මගින් දිවයින පුරා පිහිටි කොටුමා උපපොළයන්හි සිට බෙදාහැරීමේ ජාලය වෙත විදුලිය ගමන් කරවනු ලබයි.

## මෙහෙයුම් ව්‍යුහය

සෑම අංශයක්ම ලං.වි.ම. සාමාන්‍යාධිකාරීවරයා වෙත සෘජුවම වාර්තා කරන්නාවූ අතිරේක සාමාන්‍යාධිකාරීවරයෙකු යටතේ ක්‍රියාත්මක වේ. බෙදාහැරීමේ අංශ පළාත්වලට බෙදා ඇති අතර, ඒ එක් එක් පළාතක් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයෙකු යටතේ ක්‍රියාත්මක වේ. එක් එක් අංශය යටතේ එන පළාත් පහත පරිදි වේ:

| අංශයේ නම | පළාත |
|---|---|
| අංශය 1 (බෙ.අ. 1) | කොළඹ නගරය, වයඹ, උතුරු මැද හා උතුරු පළාත් |
| අංශය 2 (බෙ.අ. 2) | බස්නාහිර පළාත උතුර, මධ්‍යම හා නැගෙනහිර පළාත් |
| අංශය 3 (බෙ.අ. 3) | බස්නාහිර පළාත දකුණ II, ඌව හා සබරගමුව පළාත් |
| අංශය 4 (බෙ.අ. 4) | බස්නාහිර පළාත දකුණ I හා දකුණු පළාත |

පළාතක් එමගින් සේවය සලසන පාරිභෝගිකයන් සංඛ්‍යාව පදනම් කරගනිමින් ප්‍රාදේශීය ප්‍රධාන විදුලි ඉංජිනේරුවරුන් හෝ ප්‍රාදේශීය විදුලි ඉංජිනේරුවරුන්ගේ කළමනාකාරිත්වයට යටත් කෙරේ. ප්‍රදේශයක් තවදුරටත් විදුලි අධිකාරීවරයෙකුගේ යටතේ ක්‍රියාත්මක පාරිභෝගික සේවා මධ්‍යස්ථාන (CSCs) ගණනාවකට බෙදනු ලැබේ.

## මෙහෙයුම් ප්‍රදේශය

බෙදාහැරීමේ අංශය 1 වයඹ, උතුරු මැද, උතුරු හා කොළඹ නගරය ප්‍රදේශය නමින් යුත් පරිපාලන පළාත් හතරකින් සමන්විත වේ. උතුරු මැද පළාත ප්‍රදේශ තුනකට බෙදා ඇති අතර, උතුරු පළාත ප්‍රදේශ හතරකට බෙදා ඇත. 2020 දී අලුතින් එක් කරන ලද මහව ප්‍රදේශයද සහිතව වයඹ පළාත ප්‍රදේශ අටකට බෙදෙන අතර, කොළඹ නගරය ප්‍රදේශ හතරකට බෙදේ.

| අංශය | පළාත | ප්‍රදේශය |
|---|---|---|
| බෙදාහැරීමේ අංශය 1 | වයඹ | හලාවත, කුරුණෑගල, කුලියාපිටිය, වාරියපොල, වෙන්නප්පුව, පුත්තලම, නාරම්මල හා මහව |
| | උතුරු මැද | අනුරාධපුර, කැකිරාව හා මින්නේරිය. |
| | උතුර | යාපනය, යාපනය - නැගෙනහිර, කිලිනොච්චිය හා වව්නියාව |
| | කොළඹ නගරය | කොළඹ උතුර, කොළඹ දකුණ, කොළඹ බටහිර හා කොළඹ නැගෙනහිර |

බෙදාහැරීමේ අංශය 2 මගින් ප්‍රාදේශීය කාර්යාල 24ක් හරහා සමස්ත නැගෙනහිර හා මධ්‍යම පළාත්ද, බස්නාහිර හා සබරගමුව පළාත්වල කොටස් කිහිපයක්ද ආවරණය කරනු ලබයි. පළාත් තුන අතරින්, නැගෙනහිර පළාත ප්‍රදේශ පහකටද, මධ්‍යම පළාත ප්‍රදේශ දොළහකටද බස්නාහිර පළාත 2020 වසරේ අලුතින් එක් කරන ලද කිරිඳිවැල ප්‍රදේශයද සමගින් ප්‍රදේශ හතකටද බෙදේ.

| අංශය | පළාත | ප්‍රදේශය |
|---|---|---|
| බෙදාහැරීමේ අංශය 2 | නැගෙනහිර | අම්පාර, මඩකලපුව, ත්‍රිකුණාමලය, වාලච්චේන හා කල්මුණේ |
| | මධ්‍යම පළාත | කෑගල්ල, මාවනැල්ල, මහනුවර නගරය, පේරාදෙණිය, කුණ්ඩසාලේ, කටුගස්තොට, ගලගෙදර, මාතලේ, දඹුල්ල, නුවරඑළිය, ගිණිගත්හේන, නාවලපිටිය |
| | බස්නාහිර පළාත උතුර | ගම්පහ, කැළණිය, මීගමුව, ජා-ඇල, දිවුලපිටිය, වේයන්ගොඩ හා කිරිඳිවැල |

බෙදාහැරීමේ අංශය 3 මගින් බස්නාහිර පළාත දකුණ II ලෙස නම් කෙරුණු බස්නාහිර පළාතේ කොටසක්ද, සබරගමුව පළාත හා උතුරු පළාතද ආවරණය කෙරේ. බස්නාහිර පළාත දකුණ II ප්‍රදේශ පහකට නැවත බෙදේ. සමස්ත රත්නපුර දිස්ත්‍රික්කයම හා කෑගල්ල දිස්ත්‍රික්කයේ කොටසක්ද ආවරණය වන පරිදි සබරගමුව පළාත ප්‍රදේශ පහකට නැවත බෙදේ. බදුල්ල හා මොණරාගල දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි ඌව පළාත ප්‍රදේශ හතරකට නැවත බෙදේ.

| අංශය | පළාත | ප්‍රදේශය |
|---|---|---|
| බෙදාහැරීමේ අංශය 3 | බස්නාහිර පළාත දකුණ II | බණ්ඩාරගම, හෝමාගම, අවිස්සාවේල්ල, ශ්‍රී ජයවර්ධනපුර හා හොරණ |
| | සබරගමුව | රත්නපුර, කහවත්ත, රුවන්වැල්ල, ඇහැලියගොඩ හා ඇඹිලිපිටිය |
| | ඌව | බදුල්ල, දියතලාව, මොණරාගල හා මහියංගනය |

# බෙදාහැරීමේ අංශ

බෙදාහැරීමේ අංශය 4 මගින් බස්නාහිර පළාතේ කොටසක්ද (බස්නාහිර පළාත දකුණ I), සමස්ත දකුණු පළාත හා සබරගමුව සහ ඌව පළාත්හි කොටස් කිහිපයක්ද ආවරණය කෙරේ. බස්නාහිර පළාත දකුණ I මගින් ප්‍රදේශ හතරක්ද, දකුණු පළාත මගින් ප්‍රදේශ හතක්ද ආවරණය කෙරේ.

| අංශය | පළාත | ප්‍රදේශය |
|---|---|---|
| බෙදාහැරීමේ අංශය 4 | දකුණු පළාත | අම්බලන්ගොඩ, ගාල්ල, අකුරැස්ස, බද්දේගම, තංගල්ල, හම්බන්තොට හා මාතර |
| | බස්නාහිර පළාත දකුණ I | රත්මලාන, කළුතර, දෙහිවල හා මතුගම |

පළාත්වලට අමතරව, එක් එක් අංශයේ මෙහෙයුම් අඛණ්ඩව හා ක්‍රමවත්ව පවත්වාගනු පිණිස අවශ්‍ය සහාය සේවා සිදුකිරීම උදෙසා සියලු බෙදාහැරීමේ අංශයන් තුළ වෙනම ශාඛා තුනක් ස්ථාපනය කර ඇත. ඒවානම්, ව්‍යාපෘති හා අධිසැර නඩත්තු ශාඛාව, සැලසුම් හා සංවර්ධන ශාඛාව සහ වාණිජ හා ආයතනික ශාඛාව වශයෙනි. බෙදාහැරීමේ අංශය 1 බෙදාහැරීමේ සම්බන්ධීකරණ ශාඛාවෙන්ද සමන්විත වේ.

### බෙදාහැරීමේ අංශයන්හි ප්‍රධාන අරමුණු

- අංශය තුළ ව්‍යවස්ථාපිත මට්ටම්වලින් සියලු පාරිභෝගිකයන් වෙත විශ්වසනීය විදුලිය සැපයුමක් සම්පාදනය කිරීම.
- පවත්නා ඉල්ලුම හා අපේක්ෂිත අනාගත අවශ්‍යතාවයන්ද සපුරාලමින් වියදම පිරිමසාගනු සඳහා විදුලිය අලෙවි කිරීම හා සැලසුම්ගත ආදායම් සාක්ෂාත් කරගැනීම.
- නවීන කර්මාන්තයේ වඩාත් ශක්තිමත් ප්‍රමිතීන් සපුරාලන්නාවූ ඉහළ ගුණාත්මකභාවයෙන් යුත්, ඵලදායී හා ආරක්ෂිත තාක්ෂණයන් සමගින් උපරිම පාරිභෝගික තෘප්තිය සහතික කරමින් සියලු දෙනා වෙත විදුලිය සම්පාදනය.
- පද්ධතිමය අලාභ අවම කරමින් ජාත්‍යන්තර ප්‍රමිතීන් හා අනුගත වන මට්ටමකට විශ්වසනීයත්වය, ගුණාත්මකභාවය හා කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමට විදුලිය බෙදා හැරීමේ පද්ධතිය සංවර්ධනය කරන බවට වගබලා ගැනීම.
- නඩත්තු සේවා හා මෙහෙයුම් කාර්යක්ෂමතාවය ඒකාබද්ධ කිරීම හා වැඩිදියුණු කිරීම.
- විදුලිය බෙදා හැරීම සඳහා නව තාක්ෂණයන් වැඩිදියුණු කරනු වස් පර්යේෂණ හා සංවර්ධන කටයුතු ඒකාබද්ධ කිරීම හා වැඩිදියුණු කිරීම.
- කාර්යක්ෂම ශ්‍රම බලකායක් ඇතිකර ගැනීම හා ආරක්ෂිත, සුරක්ෂිත හා සෞඛ්‍ය සම්පන්න සේවා පරිසරයක් පවත්වා ගනිමින් සාර්ථකත්වය කරා වූ ඔවුන්ගේ අවස්ථාවන් උපරිම කිරීම.
- ක්‍රියාත්මක තැන්හි පරිසරය ආරක්ෂා කිරීම හා සංරක්ෂණය සඳහා කැපවීම.

# බෙදාහැරීමේ අංශ


ලං.වි.ම. බෙදාහැරීමේ සීමා
හා ලං.වි.ම. ප්‍රදේශ සීමා
ලං.වි.ම. බෙදා.අංශ.
අංශය - 01
උතුරු
NA1 යාපනය
NB2 කිලිනොච්චි
NC3 වව්නියා
NE4 යාපනය නැගෙනහිර
උතුරු මැද
NC1 අනුරාධපුර
NC2 කැකිරාව
NC3 මින්නේරිය
වයඹ
NW1 හලාවත
NW2 කුරුණෑගල
NW3 කුලියාපිටිය
NW4 වෙන්නප්පුව
NW5 වාරියපොල
NW6 පුත්තලම
NW7 නාරම්මල
NW8 මහව
කොළඹ නගරය
CO කොළඹ උතුර
කොළඹ දකුණ
කොළඹ නැ'හිර
කොළඹ බස්නාහිර
අංශය - 02
බස්නාහිර උතුර
WN1 මීගමුව
WN2 වේයන්ගොඩ
WN3 ජා-ඇල
WN4 කැළණිය
WN5 ගම්පහ
WN6 දිවුලපිටිය
WN7 කිරිඳිවැල
මධ්‍යම
C1 මාතලේ
C2 කටුගස්තොට
C3 කුණ්ඩසාලේ
C4 පේරාදෙණිය
C5 නුවර එළිය
C6 ගිනිගත්හේන
C7 මහනුවර නගර
C8 දඹුල්ල
C9 නාවලපිටිය
C10 ගලගෙදර
SA1 කෑගල්ල
SA2 මාවනැල්ල
නැගෙනහිර
E1 ත්‍රිකුණාමලය
E2 මඩකලපුව
E3 අම්පාර
E4 කල්මුණේ
E5 වාලච්චේන
අංශය - 03
බස්නාහිර දකුණ 2
WS1 ශ්‍රී ජයවර්ධනපුර
WS2 අවිස්සාවේල්ල
WS5 හෝමාගම
WS6 හොරණ
WS7 බණ්ඩාරගම
සබරගමුව
SA3 රුවන්වැල්ල
SA4 ඇහැලියගොඩ
SA5 රත්නපුර
SA6 කහවත්ත
SA7 ඇඹිලිපිටිය
ඌව
U1 දියතලාව
U2 බදුල්ල
U3 මොණරාගල
U4 මහියංගනය
අංශය - 04
බස්නාහිර දකුණ 1
WS3 දෙහිවල
WS4 රත්මලාන
WS8 කළුතර
WS9 මතුගම
දකුණු
S1 අම්බලන්ගොඩ
S2 බද්දේගම
S3 ගාල්ල
S4 අකුරැස්ස
S5 මාතර
S6 තංගල්ල
S7 හම්බන්තොට
විස්තරය
ලං.වි.ම. පළාත් මායිම
ලං.වි.ම. ප්‍රදේශ මායිම
ලං.වි.ම. බෙදා.අං. - 01
ලං.වි.ම. බෙදා.අං. - 02
ලං.වි.ම. බෙදා.අං. - 03
ලං.වි.ම. බෙදා.අං. - 04
ලං.වි.පෞ.ස.
උතුරු
උතුරු මැද
වයඹ
නැගෙනහිර
මධ්‍යම
බස්නාහිර
සබරගමුව
ඌව
දකුණ
බෙදා. අංශය - 1
බෙදා. අංශය - 2
බෙදා. අංශය - 3
බෙදා. අංශය - 4
NA1
NE4
NB2
NC3
NC1
NC2
NW1
NW2
NW3
NW4
NW5
NW6
NW7
NW8
E1
E2
E3
E4
E5
C1
C2
C3
C4
C5
C6
C7
C8
C9
C10
SA1
SA2
SA3
SA4
SA5
SA6
SA7
WN1
WN2
WN3
WN4
WN5
WN6
WN7
CO
City
LECO
WS1
WS2
WS3
WS4
WS5
WS6
WS7
WS8
WS9
U1
U2
U3
U4
S1
S2
S3
S4
S5
S6
S7
සැලසුම් හා සංවර්ධන ශාඛාව
බෙදාහැරීමේ අංශය - 02
2021-05-20

# බෙදාහැරීමේ අංශ

## බෙදාහැරීමේ අංශවල විහිදුම් පරාසය

| විස්තරය | බෙ.අ.1 | බෙ.අ. 2 | බෙ.අ. 3 | බෙ.අ. 4 |
|---|---|---|---|---|
| සේවා ප්‍රදේශය (වර්ග කි.මී.)* | 26,929 | 17,935 | 12,178 | 6,870 |
| ප්‍රදේශ (සංඛ්‍යාව) | 19 | 24 | 14 | 11 |
| පාරිභෝගික සේවා මධ්‍යස්ථාන (සංඛ්‍යාව) | 58 | 89 | 49 | 41 |
| ලංකා විදුලිබල මණ්ඩලය මෙහෙයවන එකතු කිරීමේ මධ්‍යස්ථාන (සංඛ්‍යාව) | 15 | 21 | 13 | 28 |
| පාලන මධ්‍යස්ථාන (සංඛ්‍යාව) | 4 | 3 | 2 | 0 |
| ඇමතුම් මධ්‍යස්ථාන (සංඛ්‍යාව) | 4 | 4 | 3 | 2 |
| තොග පාරිභෝගිකයන් (සංඛ්‍යාව) | 4,388 | 3,605 | 2,124 | 1937 |
| සිල්ලර පාරිභෝගිකයන් (සංඛ්‍යාව) | 1,912,516 | 2,273,110 | 1,345,825 | 1,092,759 |
| පද්ධති සාමාන්‍ය අතුරු බිඳුම් දර්ශකය (SAIDI) (විනාඩි/වර්ෂය) | 4705 | 4722 | 4711 | 4981 |
| පද්ධති සාමාන්‍ය අතුරු බිඳුම් වාර දර්ශකය (SAIFI) (වර්ෂයකට/අතුරු බිඳුම්/පාරිභෝගිකයන්) | 25.9 | 35.9 | 44.5 | 35.8 |
| * විදුලි ජාලයක් නොමැති වනාන්තර හා දූපත් හැර | | | | |

## බෙදාහැරීමේ යටිතල පහසුකම්

| විස්තරය | ඒකක | බෙ.අ. 1 | බෙ.අ. 2 | බෙ.අ. 3 | බෙ.අ. 4 | එකතුව |
|---|---|---|---|---|---|---|
| බෙදාහැරීමේ රැහැන් | | | | | | |
| කි.වෝ. 33 | කි.මී. | 11,114 | 9,990 | 7,371 | 4,735 | 33,209 |
| කි.වෝ. 11 | කි.මී. | 694 | 428 | 40 | 220 | 1,382 |
| අඩු වෝල්ටීයතා | කි.මී. | 46,559 | 41,589 | 32,516 | 29,509 | 150,173 |
| යටිබිම් බහන් | | | | | | |
| කි.වෝ. 33 | කි.මී. | 21.88 | 9.4 | 7.87 | 8.6 | 47.78 |
| කි.වෝ. 11 | කි.මී. | 835.46 | 141.76 | 5.04 | 26.2 | 1,008.46 |
| අඩු වෝල්ටීයතා | කි.මී. | 731.35 | 73.72 | 1.11 | 7.4 | 813.54 |
| උපපොළ | | | | | | |
| කි.වෝ. 33/11 ප්‍රාථමික උපපොළ | සංඛ්‍යාව | 43 | 29 | 12 | 41 | 125 |
| අඩු වෝල්ටීයතා බෙදාහැරීමේ උපපොළ | සංඛ්‍යාව | 12,174 | 10,688 | 6,456 | 5,337 | 34,655 |
| වෙනත් | | | | | | |
| අටළු අංගන | සංඛ්‍යාව | 67 | 96 | 42 | 47 | 252 |
| A/R | සංඛ්‍යාව | 422 | 498 | 193 | 155 | 1,268 |

## 2020 වර්ෂයේ සුවිශේෂ කාර්යසාධනයන්

| විස්තරය | ඒකකය | බෙ.අ. 1 | බෙ.අ. 2 | බෙ.අ. 3 | බෙ.අ. 4 | එකතුව |
|---|---|---|---|---|---|---|
| අංශය විසින් මිලදී ගත් ඒකක | ගි.වො.පැ. | 4,149 | 4,785 | 2,689 | 2,073 | 13,696 |
| අංශය තුළ අලෙවි කළ ඒකක | ගි.වො.පැ. | 3,936 | 4,390 | 2,465 | 1,890 | 12,681 |
| අලෙවි කළ ඒකකවලින් උපයාගත් ආදායම | ශ්‍රී ලං.රු.මි. | 71,383 | 70,058 | 40,006 | 31,747 | 213,194 |
| සාමාන්‍ය විකුණුම් මිල | ශ්‍රී ලං.රු. | 18.14 | 15.96 | 16.23 | 16.80 | 16.81 |
| බෙදාහැරීමේ අලාභය | % | 5.13 | 8.25 | 8.33 | 8.83 | 7.41 |
| වර්ෂය තුලදී ලබාදුන් නව සම්බන්ධතා | සංඛ්‍යාව | 41,052 | 46,941 | 27,123 | 20,509 | 135,625 |

# බෙදාහැරීමේ අංශ

## මෙහෙයුම් දත්ත

### අයකුම වර්ගය අනුව ගිණුම් සංඛ්‍යාව - 2020

(සංඛ්‍යා)

| අයකුමය | බෙ.අ. 1 | බෙ.අ. 2 | බෙ.අ. 3 | බෙ.අ. 4 | එකතුව |
|---|---|---|---|---|---|
| ගෘහස්ථ | 1,624,745 | 1,978,566 | 1,185,492 | 961,478 | 5,750,281 |
| ආගමික | 14,107 | 14,178 | 7,613 | 5,907 | 41,805 |
| කර්මාන්ත | 36,163 | 15,281 | 8,808 | 6,579 | 66,831 |
| හෝටල් | 116 | 152 | 39 | 150 | 457 |
| රජයය | 163 | 2,886 | 58 | 1,509 | 4,616 |
| පොදු කාර්ය | 241,610 | 265,652 | 145,939 | 119,073 | 772,274 |
| **එකතුව** | **1,916,904** | **2,276,715** | **1,347,949** | **1,094,696** | **6,636,264** |

### අයකුම කාණ්ඩයට අනුව අලෙවිය - 2020

(ගි.වො.පැ.)

| අයකුමය | බෙ.අ. 1 | බෙ.අ. 2 | බෙ.අ. 3 | බෙ.අ. 4 | එකතුව |
|---|---|---|---|---|---|
| ගෘහස්ථ | 1,474 | 1,746 | 985 | 885 | 5,090 |
| ආගමික | 32 | 26 | 12 | 12 | 82 |
| කර්මාන්ත | 968 | 1,753 | 946 | 496 | 4,163 |
| හෝටල් | 83 | 48 | 6 | 55 | 192 |
| රජයය | 79 | 64 | 23 | 42 | 208 |
| පොදු කාර්ය | 1,259 | 716 | 482 | 381 | 2,838 |
| වීථි ලාම්පු | 41 | 37 | 11 | 19 | 108 |
| **එකතුව** | **3,936** | **4,390** | **2,465** | **1,890** | **12,681** |

### අයකුම කාණ්ඩයට අනුව ආදායම - 2020

(ශ්‍රී ලං.රු.මි.)

| අයකුමය | බෙ.අ. 1 | බෙ.අ. 2 | බෙ.අ. 3 | බෙ.අ. 4 | එකතුව |
|---|---|---|---|---|---|
| ගෘහස්ථ | 23,363 | 24,930 | 13,905 | 13,468 | 75,666 |
| ආගමික | 240 | 181 | 82 | 86 | 589 |
| කර්මාන්ත | 14,492 | 25,926 | 13,975 | 7,396 | 61,789 |
| හෝටල් | 1,449 | 926 | 123 | 998 | 3,496 |
| රජයය | 1,433 | 1,155 | 426 | 738 | 3,752 |
| පොදු කාර්ය | 30,406 | 16,937 | 11,495 | 9,061 | 67,899 |
| වීථි ලාම්පු | - | 3 | - | - | 3 |
| **එකතුව** | **71,383** | **70,058** | **40,006** | **31,747** | **213,194** |

# බෙදාහැරීමේ අංශ

### පාරිභෝගික ගිණුම්වල වසර පහක ප්‍රගතිය




| | 2016 | 2017 | 2018 | 2019 | 2020 |
|---|---|---|---|---|---|
| බෙ.අ.1 | 1,701,790 | 1,782,105 | 1,832,829 | 1,875,852 | 1,916,904 |
| බෙ.අ.2 | 2,045,063 | 2,122,740 | 2,178,082 | 2,229,774 | 2,276,715 |
| බෙ.අ.3 | 1,214,109 | 1,260,090 | 1,291,700 | 1,320,826 | 1,347,949 |
| බෙ.අ.4 | 1,003,230 | 1,028,194 | 1,051,668 | 1,074,187 | 1,094,696 |

## ප්‍රගති මිනුම් - 2020 වසර

### විදුලියනය සඳහා වූ ප්‍රවේශය

විදුලිය ලබාගැනීමේ ප්‍රවේශයක් සහිත ජන ප්‍රතිශතයන් අදාළ පළාතේ සංවර්ධන මට්ටමට අනුව වෙනස් වේ. පළාත් දොළහ අතරින් කොළඹ නගර, බස්නාහිර පළාත උතුර, බස්නාහිර දකුණ I හා දකුණු පළාත විසින් ආධාර ආයතන, ශ්‍රී ලංකා රජය හා ලං.වි.ම. විසින් සිදුකර ඇති කැපවීම් හරහා විදුලිය සඳහා 100% ක ප්‍රවේශ හැකියාව අත්පත් කරගෙන ඇත.

**රූපය D 1 : 2019/2020 වසරේ විදුලියන මට්ටම**




### විදුලියන යෝජනාක්‍රම හා දිගු/ව්‍යාප්ති

| අංශය | පළාත | යෝජනාක්‍රම | | දිගු/ව්‍යාප්ති | |
|---|---|---|---|---|---|
| | | සම්පූර්ණ කළ කාර්යයන් සංඛ්‍යාව | පිරිවැය (ශ්‍රී ලං.රු.මි.) | සම්පූර්ණ කළ කාර්යයන් සංඛ්‍යාව | පිරිවැය (ශ්‍රී ලං.රු.මි.) |
| බෙ.අ.1 | උතුර | 1 | 8.9 | 78 | 74.3 |
| | වයඹ | - | - | 159 | 73 |
| | උතුරු මැද | 1 | 3.68 | 46 | 39 |
| | කොළඹ නගරය | - | - | - | - |
| බෙ.අ.2 | බස්නාහිර උතුර | - | - | 300 | 31.41 |
| | මධ්‍යම | 3 | 3.04 | 3 | 1.82 |
| | නැගෙනහිර | 1 | 12.34 | 46 | 55.38 |
| බෙ.අ.3 | බස්නාහිර දකුණ II | 1 | 5.7 | 2 | 1.53 |
| | ඌව | 2 | 11.34 | 7 | 11.31 |
| | සබරගමුව | - | - | 22 | 49.03 |
| බෙ.අ.4 | බස්නාහිර දකුණ I | - | - | 19 | 8.31 |
| | දකුණ | 13 | 39.40 | 3 | 3.49 |

# බෙදාහැරීමේ අංශ

## ඉදිකිරීම් කටයුතු පිළිබඳ කාර්ය සාධනය

| අංශය | පළාත | අධි වෝල්ටියතා (කි.මී.) | අඩු වෝල්ටියතා (කි.මී.) | බෙදාහැරීමේ උපපොළ | අඩු වෝල්ටියතා රැහැන් වලට පරිවර්තනය (කි.මී.) | පිරිවැය (ශ්‍රී ලං.රු.මි) |
|---|---|---|---|---|---|---|
| බෙ.අ.1 | උතුර | 31.51 | 14.07 | 54 | - | 109.58 |
| | වයඹ | 100.00 | 80.00 | 237 | 59 | 1,085.00 |
| | උතුරු මැද | 34.59 | 104.23 | 168 | 42.11 | 626.40 |
| | කොළඹ නගරය | 10.42 | 7.63 | 31 | - | 680.92 |
| බෙ.අ.2 | බස්නාහිර උතුර | 77.47 | 48.77 | 220 | 380.16 | 1,416.85 |
| | මධ්‍යම | 161.09 | 217.07 | 164 | 414.18 | 1,173.99 |
| | නැගෙනහිර | 71.57 | 83.53 | 109 | 395.54 | 1,276.72 |
| බෙ.අ.3 | බස්නාහිර දකුණ II | 4.03 | 35.15 | 59 | 74.13 | 345.14 |
| | ඌව | 92.69 | 204.94 | 35 | 137.16 | 330.14 |
| | සබරගමුව | 20.20 | 1.80 | 9 | 264.67 | 556.26 |
| බෙ.අ.4 | බස්නාහිර දකුණ I | 6.83 | 27.22 | 37 | 32.67 | 275.19 |
| | දකුණ | 49.46 | 119.60 | 122 | 31.84 | 829.09 |

## වහළය මත සවි කරන සූර්ය බලාගාර

ශුද්ධ මානනය (Net Metering), ශුද්ධ ගිණුම්කරණය (Net Accounting) හා ශුද්ධ ධන (Net Plus) නමැති යෝජනාක්‍රම තුනක් යටතේ වහළය මත සවි කරන ජනන යන්ත්‍රයක් මගින් බලශක්තිය පරිභෝජනය හා අපනයනය කරන අතර සිය පරිශ්‍රයන් තුළ විදුලිය ජනනය කරමින් ලං.වි.ම. පද්ධතිය සමගින් සිය ජනන යන්ත්‍ර සම්මුහුර්ත කිරීමට විදුලි පාරිභෝගිකයන් හට අවසර ලබාදෙනු ලබයි.

| අයක්‍රමය | බෙ.අ. 1 | බෙ.අ. 2 | බෙ.අ. 3 | බෙ.අ. 4 | එකතුව |
|---|---|---|---|---|---|
| **පාරිභෝගිකයන් (සංඛ්‍යාව)** | | | | | |
| ශුද්ධ මානනය | 3,235 | 2,151 | 2,183 | 1,891 | 9,460 |
| ශුද්ධ ගිණුම්කරණය | 2,939 | 2,612 | 1,924 | 2,261 | 9,736 |
| ශුද්ධ ධන | 466 | 220 | 216 | 243 | 1,145 |
| **එකතුව** | **6,640** | **4,983** | **4,323** | **4,395** | **20,341** |
| **ධාරිතාව (කි.වො.)** | | | | | |
| ශුද්ධ මානනය | 23,893 | 13,615 | 12,922 | 13,864 | 64,294 |
| ශුද්ධ ගිණුම්කරණය | 30,059 | 20,608 | 14,379 | 18,137 | 83,183 |
| ශුද්ධ ධන | 29,676 | 40,568 | 31,916 | 25,379 | 127,539 |
| **එකතුව** | **83,628** | **74,791** | **59,217** | **57,380** | **275,016** |

## ජාල ප්‍රවර්ධනයන්

වසර තුළ බෙදාහැරීමේ ජාලයෙහි විශ්වසනීයත්වය වැඩිදියුණු කොට නංවාලනු පිණිස බෙදාහැරීමේ අංශ විසින් පහත සඳහන් කාර්යයන් සිදුකරන ලදී.

| විස්තරය | ඒකක | බෙ.අ. 1 | බෙ.අ. 2 | බෙ.අ. 3 | බෙ.අ. 4 |
|---|---|---|---|---|---|
| කි.වෝ. 33 කුළුනු රැහැන් ඉදිකිරීම | කි.මී. | 65 | 232 | 138 | 140 |
| ප්‍රාථමික උපපොළ ඉදිකිරීම | සංඛ්‍යා | 03 | - | - | 01 |
| බෙදාහැරීමේ උපපොළ ඉදිකිරීම | සංඛ්‍යා | 440 | 448 | 117 | 174 |

## විශේෂ කරුණු

### කොළඹ වරාය නගරය සංවර්ධන ව්‍යාපෘතිය (CPCDP)

කොළඹ වරාය නගරය සංවර්ධන ව්‍යාපෘතිය යනු සැලසුම් කොට, ගොඩනගා පවරා දීමේ (DBT) ව්‍යාපෘතියකි. CHEC Port City Colombo පුද්ගලික සමාගම කොළඹ වරාය නගරය සංවර්ධන ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් ආයතනය වේ. මෙම ව්‍යාපෘතියෙහි අදියර දෙකකි. පළමු අදියර යටිබිම් බහන් ලූප 14කින් සමන්විත කි.වෝ. 220/33, මෙ.වො. 120 කොටුමා උපපොළ 4ක් හා කි.වෝ. 33 බෙදාහැරීමේ යටිබිම් බහන් ජාලයකින්ද සමන්විත වේ.

සැලසුම් කටයුතු හා ද්‍රව්‍ය තෝරාගැනීම් අතරින් බොහොමයක් වසර තුළ සම්පූර්ණ කරන ලදී. සිවිල් ආකෘති ඉදි වෙමින් පවත්නා අතර ප්‍රධාන උපකරණ නිෂ්පාදන කටයුතු ආරම්භ කරන ලදී.

# බෙදාහැරීමේ අංශ

ව්‍යාපෘති පිරිවැය බෙදී යාම පහත පරිදි වේ.

| වර්ෂය | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
|---|---|---|---|---|---|
| පිරිවැය (ඩී.ජ.ඩො.) | 42,329,322 | 3,417,240 | 3,417,240 | 3,417,240 | 3,417,240 |

## ප්‍රාථමික උපපොළ D විශාලන ව්‍යාපෘතිය

රෝහල්, රජයේ ආයතන ඇතුලුව කොළඹ 07, 08 හා 09 ප්‍රදේශයන්හි පාරිභෝගිකයන් වෙනුවෙන් විදුලි සැපයුම ප්‍රාථමික උපපොළ D මගින් සිදු කරනු ලබයි. මෙම උපපොළ රජයේ විදුලිබල පවරාගැනීම් දෙපාර්තමේන්තුව විසින් වසර 60කට පමණ ඉහතදී මෙහෙවරෙහි යොදවන ලදී.

ප්‍රදේශයේ විදුලි ජාලයෙහි විශ්වසනීයත්වය ප්‍රවර්ධනය කරනු පිණිස, කොළඹ නගර කාර්ය මණ්ඩලය විසින් ශ්‍රී ලං.රු.මි. 650ක පිරිවැයකින් කි.වෝ. 11, කි.වෝ. 33 ස්විච් ගියර හා උපාංග සහිත මෙ.වෝ.ඇ. 16 තරාපැවි 3ක් සවි කිරීමෙන් ප්‍රාථමික උපපොළ D විශාලන කටයුතු සාර්ථකව සම්පූර්ණ කර ඇත. සිය සාමාන්‍ය රාජකාරි කටයුතුවලට අමතර වශයෙන් සියලු මූල්‍යකරණ, සැලසුම්කරණ, මෝස්තරකරණ, ප්‍රසම්පාදන, සවි කිරීමේ හා මෙහෙවරෙහි යෙදීමේ කටයුතුද කොළඹ නගර කාර්ය මණ්ඩලය විසින් සිදුකරන ලදී.

නවීකරණය කරන ලද උපපොළ 2020.09.29 දින ජාතික විදුලිය බෙදාහැරීමේ පද්ධතියට අන්තර් සම්බන්ධ කරන ලදී.

## මාර්ගගත නඩත්තු කළමනාකරණ පද්ධතිය

රැහැන් ඉදිකිරීමේ හා නඩත්තු ඒකකය මැදි වෝල්ටීයතා නඩත්තු කළමනාකරණ පද්ධතිය (MVMMS) මගින් කි.වෝ. 33 කුලුනු රැහැන සඳහා වූ මාර්ගගත පරිගණක යෙදවුම කරා ගමන් කරමින් සිටී. වාර්ෂික නඩත්තු සැලැස්මට අනුව මෙම පරිගණක යෙදවුම හරහා විදුලිය ගමන් කරන හා විදුලිය ගමන් නොකරන රැහැන් දෙවර්ගයේම නඩත්තු කළමනාකරණය කිරීම අරඹන ලදී. නිවැරදි සැලසුම්කරණය, විස්තීර්ණ නඩත්තු ඉතිහාසයක් පවත්වාගෙන යාම, මාර්ග අවසර වාර්තාකරණ හා ප්‍රගති නිරීක්ෂණ පහසුව මෙම පද්ධතියේ ප්‍රධාන පැතිකඩයන් වේ.



රූපය D 2: MVMMS පරිශීලක අතුරුමුහුණත

## කි.වෝ. 33 ලින්ක්ස් (Lynx) ද්විත්ව පරිපථ (D/C) කුලුණු මාර්ගයක් ලක්ෂ උයනේ සිට කඳුරුවෙල දක්වා ඉදි කිරීම

ලක්ෂ උයනේ සිට කදුරුවෙල දක්වා කි.වෝ. 33 ලින්ක්ස් ද්විත්ව පරිපථ කුලුණු මාර්ගයක් (කි.මී. 7.8) ඉදිකිරීම බෙදාහැරීමේ අංශය 1හි මැදි වෝල්ටීයතා බෙදාහැරීමේ සැලැස්ම - 2016/2025 ප්‍රකාර සම්පූර්ණ කරන ලදී. ව්‍යාපෘතියේ සමස්ත පිරිවැය ශ්‍රී ලං.රු.මි. 144ක් විය.



රූපය D 3 : ලක්ෂා උයන - කඳුරුවෙල මාර්ගයේ රැහැන් මාර්ග ඉදිකිරීමේ ප්‍රගතිය

## නව අනුරාධපුර කොටුමා උපපොළේ සිට නොච්චියාගම දක්වා කි.වෝ. 33 ලින්ක්ස් ද්විත්ව පරිපථ කුලුණු මාර්ගයක් ඉදිකිරීම

මෙම ව්‍යාපෘතිය අදියර 3කින් සමන්විත වේ: අදියර 1; නොච්චියාගම සිට තලාව දක්වා - කි.මී. 15, අදියර 2; තලාව සිට අනුරාධපුර දක්වා - කි.මී. 11 සහ අදියර 3; අනුරාධපුර සිට නව අනුරාධපුර කොටුමා උපපොළ දක්වා - කි.මී. 2.5.

ව්‍යාපෘතියේ අදියර 1 සම්පූර්ණ කරන ලදී. අදියර II යටතේ සන්නායක පිහිටුවීමේ කාර්යය සිදු කෙරෙමින් පවතී (ස්ථාපන කාර්යයෙහි 20% ක් සම්පූර්ණ කර ඇත). අදියර III කුලුණු රැහැන් සැලසුම්කරණ කාර්යය සම්පූර්ණ කරන ලදී.

ව්‍යාපෘතියේ සමස්ත ඇස්තමේන්තුගත පිරිවැය ශ්‍රී ලං.රු.මි. 386.5ක් වේ.

## යන්තම්පලාව ප්‍රාථමික උපපොළ (PSS) විශාලනය

යන්තම්පලාව ප්‍රාථමික උපපොළ මෙ.වෝ.ඇ. 2 සිට මෙ.වෝ.ඇ. 5 දක්වා විශාල කරන ලදී. ව්‍යාපෘතියේ සමස්ත පිරිවැය ශ්‍රී ලං.රු.මි. 17ක් විය.



රූපය D 4: යන්තම්පලාව ප්‍රාථමික උපපොළෙහි කටයුතු සිදුවෙමින්

# බෙදාහැරීමේ අංශ

### මනම්පිටියේ කොටස් දෙකකින් යුත් තනි බස්බාර් කුලුණු අටළු අංගනයක් (single busbar tower gantry) ඉදිකිරීම

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මනම්පිටිය ප්‍රදේශයේ කොටස් 2 කින් යුත් තනි බස්බාර් කුලුණු අටළු අංගනයක් ඉදිකර මෙහෙවරෙහි යොදවල ලදී. ව්‍යාපෘතියේ සමස්ත පිරිවැය ශ්‍රී ලං.රු.මි. 28.9ක් විය.

### කොළඹ නගරයේ බෙදාහැරීමේ උපපොළ/පෝෂක කුලුණු/ කුඩා පෝෂක කුලුණු ප්‍රතිසංස්කරණය

කොළඹ නගර බෙදාහැරීමේ ජාලයට අදාළ දෘෂ්ටීන් මෙන්ම විශ්වසනීයත්වයද වැඩිදියුණු කරනු පිණිස බෙදාහැරීමේ උපපොළ/ පෝෂක කුලුණු/කුඩා පෝෂක කුලුණුද ප්‍රතිසංස්කරණය කරන ලදී.

### පෝළිම් කළමනාකරණ පද්ධතියක් (QMS) හඳුන්වා දීම

පෝළිම් කළමනාකරණ පද්ධතිය 2020 වසරේදී කුරුණෑගල, කුලියාපිටිය, හලාවත හා පුත්තලම ප්‍රාදේශීය කාර්යාලයන්හි ආරම්භ කරන ලදී.

### මාර්ගගත බිල්පත්කරණ පද්ධතිය ආරම්භ කිරීම

ලං.වි.ම. මාර්ගගත බිල්පත්කරණ පද්ධතිය 2020.01.17 දින මීගමුව ප්‍රදේශයේදී උත්සවාකාරයෙන් ආරම්භ කරන ලදී. මනු කියවීම මත එමගින් තත් කාලීන බිල්පත් විස්තර යාවත්කාලීන කිරීම් සම්පාදනය කරනු ලබයි. පෙරදී යාවත්කාලීන වීම සඳහා මාසයක පමණ කාලයක් ගතවූ නමුත් මනු කියවන්නා විසින් බිල්පත ලබාදීමෙන් තත්පර කිහිපයක් ඇතුළත බිල්පත් දත්ත මධ්‍යම බිල්පත්කරණ පද්ධතිය තුළ යාවත්කාලීන වේ.

ගනුදෙනුකරුවන් හට ඕනෑම මාර්ගගත මාධ්‍යයක් හරහා යාවත්කාලීන වූ බිල්පත්කරණ විස්තර දැකිය හැක. යම් නොගෙවන ලද බිල්පතක් පියවීම සඳහා මුද්‍රිත බිල්පත ලැබෙන තෙක් බලා සිටීමේ අවශ්‍යතාවයක් නොමැත. මාර්ගගත බිල්පත්කරණ පද්ධතිය කොවිඩ් - 19 වසංගත තත්ත්වය මධ්‍යයේ පවා 2020 වසර තුළ සමස්ත පළාත තුළටම ඇතුළත් කෙරුණු අතර මේවන විට එය සාර්ථකව ක්‍රියාත්මක වේ. මෙම පද්ධතිය යටතේ මාර්ගගතව ගෙවන්නා හට ගෙවිය යුතුව පවත්නා නිවැරදි මුදල මාර්ගගතවම දැකිය හැකි බැවින් එය ලං.වි.ම. ගාස්තු අයකර ගැනීම් සඳහා වඩාත් යහපත් වේ.



රූපය D 5: මාර්ගගත බිල්පත්කරණ පද්ධතිය ආරම්භ කිරීම

### බදුල්ලේ කි.වෝ. 33 කුලුණු විතැන් කිරීම - පස්සර කි.වෝ. 33 කුලුණු රැහැන

බදුල්ල කොටුමා උපපොළේ සිට රන්දෙණිය (උමා ඔය ව්‍යාපෘතිය) දක්වා වූ කි.වෝ. 132 සම්ප්‍රේෂණ රැහැන ඉදිකිරීම සඳහා අවශ්‍ය මාර්ග හෙළි කිරීමේ කටයුතුවලට අවශ්‍ය පහසුකම් සලසනු පිණිස මාස දෙකක කාල පරිච්ඡේදයක් ඇතුළත කුලුණු දෙකක් විතැන් කරන ලදී. ව්‍යාපෘතියේ සමස්ත පිරිවැය ශ්‍රී ලං.රු.මි. 25ක් විය.



රූපය D 6: කුලුණු විතැන්කරණ කටයුතු සිදුවෙමින්

### දුරෙක්කන්ද අටළු අංගනය කොටස් දෙකකින් යුත් තනි බස්බාර් (2SSBB) අටළු අංගනයයක් දක්වා විශාලනය

බෙදාහැරීමේ අංශය 3හි මැදි වෝල්ටීයතා බෙදාහැරීමේ පද්ධති සංවර්ධන සැලැස්ම 2019-2028 ප්‍රකාර විදුලියේ විශ්වසනීයත්වය හා ගුණාත්මකභාවය නංවාලනු පිණිස රත්නපුර දිස්ත්‍රික්කයේ දුරෙක්කන්ද ප්‍රදේශයේ කොටස් දෙකකින් යුත් තනි බස්බාර් වානේ අටළු අංගනයක් ඉදි කරන ලදී. තවද, අලුතින් ඉදිකරන ලද වේවැල්වත්ත කොටුමා උපපොළෙහි කුඩා ජල විදුලි බලාගාරයන් විසින් ජනිත විදුලිය ගමන් කරවීමට මෙම අටළු අංගනය මගින් පහසුකම් සලසනු ලබයි. ව්‍යාපෘතියේ සමස්ත පිරිවැය ශ්‍රී ලං.රු.මි. 32ක් විය.

### හම්බන්තොට වරායේ කොටස් හතරකින් යුත් තනි බස්බාර් අටළු අංගනය හා මෙ.වෝ. ඈ. 4x5 ප්‍රාථමික උපපොළ ඉදි කිරීම

හම්බන්තොට වරායට හා ඒ ආශ්‍රිත කර්මාන්තයනට විදුලි සැපයුම සම්පාදනය කරනු පිණිස හම්බන්තොට වරාය පරිශ්‍රයේ කොටස් හතරකින් යුත් තනි බස්බාර් අටළු අංගනය හා මෙ.වෝ.ඈ. 4x5 ප්‍රාථමික උපපොළක් ඉදි කරන ලදී. මෙම ව්‍යාපෘතියේ සමස්ත පිරිවැය ශ්‍රී ලං.රු.මි. 250ක් විය.



රූපය D 7: හම්බන්තොට වරාය ප්‍රාථමික උපපොළ

# බෙදාහැරීමේ අංශ

### රත්මලානේ සිට අඟුලාන ප්‍රාථමික උපපොළ දක්වා භූගත යොත ඉදි කිරීම

අඟුලාන ප්‍රාථමික උපපොළෙහි විශ්වසනීයත්වය නංවාලනු පිණිස රත්මලාන කොටුමා උපපොළේ සිට අඟුලාන ප්‍රාථමික කොටුමා උපපොළ දක්වා වූ කි.වෝ. 33 භූගත යොතෙහි කි.මී. 2ක් එළන ලදී. තිරස් දිශානුගත විදුම් (HDD) ක්‍රමය යොදා ගනිමින් ගාලු පාර හරහා යොත එළීමේ කාර්යය සාර්ථකව අවසන් කරන ලදී. මෙම යොත අඟුලාන ප්‍රාථමික උපපොළෙහි සමස්ත ධාරිතාවය (20MW) සම්පාදනය කිරීමේ හැකියාවෙන් යුක්ත එකකි. රත්මලාන කොටුමා උපපොළ පෝෂකය හා අඟුලාන ප්‍රාථමික උපපොළ එකිනෙක සම්බන්ධ කරමින් භූගත යොත හා සමාන්තරව හර 24 ප්‍රකාශ තන්තු යොතක් එළා ඇත. මෙම ව්‍යාපෘතියේ සමස්ත පිරිවැය ශ්‍රී ලං.රු.මි. 70ක් විය.



**රූපය D 8: යොත් එළීම සිදු වෙමින්**




තම්බපවණී සුළං බලාගාරය

මෙහෙයුම් සමාලෝචනය

# ව්‍යාපෘති අංශය

# ව්‍යාපෘති අංශය

විදේශ/ශ්‍රී ලංකා හා ලං.වි.ම. අරමුදල්ගත සියලු ජනන හා සම්ප්‍රේෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අරමුණින් 2010 වසර තුළ ලංකා විදුලිබල මණ්ඩලයේ ව්‍යාපෘති අංශය ස්ථාපනය කරන ලදී. ඒ අනුව මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ධාරිතා වර්ධනය හා සමස්ත විදුලිබල පද්ධතියෙහි විශ්වසනීයත්වය ප්‍රවර්ධනයෙහි ලා ප්‍රධාන කාර්ය භාරයක් ඉටු කරයි. අංශය අතිරේක සාමාන්‍යාධිකාරීවරයෙකුගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක වේ. ව්‍යාපෘති අංශයේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා ඔහු යටතේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් හය දෙනෙකුද ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් එකොළොස් දෙනෙකුද (I පන්තියේ නිලධාරීන්) එක් අතිරේක මුදල් කළමනාකරුවෙකුද වේ.

වසංගත තත්ත්වයක් යටතේ ව්‍යාපෘති අංශය විසින් ශ්‍රී ලං.රු. බිලියන 37 ඉක්මවූ ව්‍යාපෘති කටයුතු සිදුකරන ලද බැවින් 2020 වසර ව්‍යාපෘති අංශයට තවත් අභියෝගාත්මක වසරක් විය.

2020 වසර තුළ සිදුකරන ලද ව්‍යාපෘති කටයුතු පිළිබඳ විස්තරය පහත පරිදි වේ.

## මන්නාරම සුළං විදුලි ව්‍යාපෘතිය

මන්නාරම සුළං විදුලි ව්‍යාපෘතිය (MWWP) යනු ශ්‍රී ලංකාවේ පළමු ලං.වි.ම. සතු මහා පරිමාණ නවීන තාක්ෂණයෙන් සැකසුණු සුළං විදුලි බලාගාරය වේ. එය මන්නාරම් දූපතේ දකුණු වෙරළ තීරයෙහි පිහිටා ඇත. මහා පරිමාණ සුළං විදුලි ජනනයෙහිදි හමුවන දුෂ්කරතා මැඩ පැවැත්වීමේ අරමුණින් ලං.වි.ම. විසින් නව 'අර්ධ වශයෙන් පිටත් කළ හැකි' ('semi-dispatchable') සුළං විදුලි සංකල්පයක් ඉදිරියට ගෙන එන ලදී.

ලෝක ප්‍රකට ඩෙන්මාර්ක් ටර්බයින් නිෂ්පාදනායතනයක් වන Vestas Asia Pacific AS ආයතනය ඉංජිනේරු, ප්‍රසම්පාදන හා ඉදිකිරීමේ (EPC) කොන්ත්‍රාත් ආයතනය විය. මෙම ව්‍යාපෘතිය මෙ.වො. 3.45ක අගයකින් යුත්, මීටර් 90 ක කේන්ද්‍ර උසින් ස්ථාපිත සුළං ටර්බයින 30කින් සමන්විත වේ. සුළං ගොවිපලෙහි සමස්ත ස්ථාපිත ධාරිතාවය මෙ.වො. 103.5කි. ඩෙන්මාර්කයේ COWI AS ආයතනය විසින් ව්‍යාපෘතිය සඳහා තාක්ෂණික සහාය ලබාදෙන ලදී.

ශ්‍රී ලංකාවේ පුනර්ජනනීය බලශක්ති සංවර්ධනයේ කඩඉමක් සනිටුහන් කරමින් මන්නාරම සුළං විදුලිබල ව්‍යාපෘතියේ පළමු අදියර 2020.12.08 දින බලගන්වන ලදී. පවිත්‍ර විදුලි බලය නිෂ්පාදනය කරමින් ෆොසිල ඉන්ධන පදනම්ගත විදුලි ජනනයෙන් බැහැර වීමේ ලං.වි.ම.හි දිගු කාලීන කැපවීම මෙමගින් නැවත තහවුරු කරන ලදී.

2019 වසරේ මැද භාගයේ සිදුවූ පාස්කු ප්‍රහාරයේ සිට 2020 වසරේ මුල් භාගයේ සිට ලොව ගිලගත් කොවිඩ් - 19 වසංගතය දක්වා විහිදුණු බොහෝ විපත් මධ්‍යයේ මෙම ව්‍යාපෘතිය මෙහෙයවන ලදී. සාමාන්‍ය ජන ජීවිතය, සංචාරය, සමාජ සම්බන්ධතා සිදුකළ නොහැකි පසුබිමක පැවති තත්ත්වයන් තුළ 2020 වසර තුළ පළමු ව්‍යාපෘති අදියර සාක්ෂාත් කරගැනීමේ අභියෝගාත්මක කාල පරිච්ඡේදයක් මෙන්ම එය ප්‍රධාන ගණයේ සාර්ථකත්වයක්ද විය. අවස්ථා කිහිපයකදීම ශ්‍රී ලංකාව තුළ මෙන්ම ඉන් පිටතද පරිපාලන හා මූල්‍ය කටයුතුවලට සිදුවූ බාධක මෙන්ම ආර්ථික කටයුතු මුළුමනින්ම නැවතුණු තත්ත්වයන්ද ව්‍යාපෘතියට දරා ගැනීමට සිදුවිය.

ව්‍යාපෘති කළමනාකාරිත්වයෙහි, ව්‍යාපෘති කාර්ය මණ්ඩලයේ, ප්‍රධාන කොන්ත්‍රාත්කරුගේ හා එහි අතුරු උප කොන්ත්‍රාත්කරුවන්ගේ උද්යෝගය හා කැපවීම හේතුකොටගෙන මෙම සාර්ථකත්වය අත්පත් විය.

මූලික යටිතල පහසුකම් සහිත පසුබිමක ව්‍යාපෘති කාර්ය මණ්ඩලයට රළු කාලගුණය මධ්‍යයේ නොකඩවා දිවා-රාත්‍රී කාර්යයන්හි නිරත වෙමින්, දුරස්ථ සේවා ස්ථානයක දැඩි සූර්ය රශ්මියෙන්ද, ධාරානිපාත වර්ෂාවන්ගෙන්ද, දැඩි සුළං තත්ත්වයන්ගෙන්ද වූ පීඩා මධ්‍යයේ කටයුතු කිරීමට සිදුවූ තත්ත්වයක වැඩ බිමෙහි භෞතික තත්ත්වයන් හා පරිසරයද දැඩි එදිරිවාදී ස්වරූපයේ එකක් විය.

## බ්‍රෝඩ්ලන්ඩ්ස් ජල විදුලි ව්‍යාපෘතිය

කොළඹින් කි.මී. 90ක් පමණ ඊසාන දෙසට වන්නට පිහිටි බ්‍රෝඩ්ලන්ඩ්ස් ජල විදුලි ව්‍යාපෘතිය කිතුල්ගල නගරය ආසන්නයේ කැළණි ගඟෙහි ගොඩනගන ලද ගලන නදී දියෙන් දුවන ව්‍යාපෘතියකි. ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වනුයේ පවත්නා පොල්පිටිය විදුලි බලාගාරයේ පහළ ධාරාවේ ජල විභවයෙන් ඵල නෙළා ගැනීමයි. ව්‍යාපෘතියෙහි මෙ.වො. 2X17.5 ක ස්ථාපිත ධාරිතාවයක් පවතිනු ඇත. විදුලි බලාගාරය මගින් වාර්ෂිකව ගි.වො.පැ. 126ක විදුලි බලශක්තියක් ජනනය කිරීමට සැලසුම් කර ඇත. කෙසේ වුවද, කිතුල්ගල ප්‍රදේශයේ ගංගා ජලයේ සිදුකරන දිය මත ජල පහුරු ක්‍රීඩාව ආරක්ෂා කිරීම සඳහා සැලකිය යුතු ජල ධාරිතාවයක් නොකඩවා මුදා හැරීමට තීරණය කර ඇති බැවින් වාර්ෂික බලශක්ති ජනනයෙහි අඩුවීමක් සිදුවනු ඇත. ජනනයෙහි ඇතිවන අඩුවීම අවම කිරීම සඳහා ජලය මුදා හැරීම කුඩා ජලවිදුලි බලාගාරයක් හරහා සිදු කෙරේ.

China National Electric Equipment Corporation Ltd, (CNEEC) ආයතනය ව්‍යාපෘතියේ ප්‍රධාන කොන්ත්‍රාත්කරු ලෙස තෝරාගන්නා ලදී. සමස්ත ව්‍යාපෘති පිරිවැය එ.ජ.ඩො.මි. 82කි. අරමුදල් චීනයේ Industrial and Commercial බැංකුවෙන් (ICBC)ද, ශ්‍රී ලංකාවේ හැටන් නැෂනල් බැංකුවෙන් සහ මහජන බැංකුවෙන්ද ලබාගනු ලබයි.

2013 වසරේ අගෝස්තු මාසයේදී කොන්ත්‍රාත් ආයතනය වැඩබිමට පැමිණ ඉදිකිරීම් කටයුතු ආරම්භ කළේය. ප්‍රධාන වේල්ලේ, ප්‍රධාන උමං මාර්ගයේ, හැරවුම් උමං මාර්ගයේ, විදුලි උපපොළ සහ



**රූපය P 1: මන්නාරම සුළං විදුලි ව්‍යාපෘතියේ දර්ශනය**



**රූපය P 2: බලාගාරය**

# ව්‍යාපෘති අංශය

වහරු අංගන වැඩබිමෙහි ඉදිකිරීමේ කටයුතු සමාන්තරව සිදුවේ. ව්‍යාපෘතියේ කටයුතු 2021 වසර මැද භාගය වනවිට සම්පූර්ණ කිරීමට නියමිතය. බ්‍රෝඩ්ලන්ඩ්ස් ජල විදුලිබල ව්‍යාපෘතිය යනු ශ්‍රී ලංකාව තුල පවිත්‍ර සංවර්ධන යාන්ත්‍රණ (CDM) ලියාපදිංචිය ලබා ඇති පළමු මහා පරිමාණ ජල විදුලි බලාගාරය වේ.

## මොරගොල්ල ජල විදුලි බලාගාරය

පහසුවෙන් ප්‍රයෝජනයට ගත හැකි ජල විදුලිය සහිත ස්ථාන දැනටමත් උපයෝජනය කොට ඇති බැවින් පසුගිය වසර 30ක කාල පරිච්ඡේදය තුළ ෆොසිල ඉන්ධන මගින් විදුලිය ජනනය ජල විදුලි ජනනය ඉක්මවා වර්ධනය වී ඇත. මොරගොල්ල ජල විදුලි ව්‍යාපාතිය (MHPP) වූකලි ෆොසිල ඉන්ධන මගින් විදුලිය ජනනය අවම කිරීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් හඳුනාගෙන ඇති ජල විදුලි ව්‍යාපෘති කිහිපය අතරින් එකකි. මූල්‍ය සහාය ආසියානු සංවර්ධන බැංකුව (ADB) මගින් සපයනු ලබන අතර, මෙ.වො. 30.5ක ස්ථාපිත ධාරිතාවයක් සහිතව ව්‍යාපෘතිය මගින් වාර්ෂිකව ගි.වො.පැ. 100ක ධාරිතාවයක් ජනනය කරනු ඇතැයි අපේක්ෂිතය.

පාරිසරික බලපෑම් තක්සේරුව (EIA) ව්‍යාපෘතිය අනුමත කිරීමේ බලධාරියා වන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් අනුමත කරන ලදී.



**රූපය P 3 : බලාගාරයේ ඉදිකිරීම් කටයුතු**

ව්‍යාපෘතියේ උපදේශකවරුන් පත්කරන ලදුව, යාන්ත්‍රික හා විදුලි පහසුකම්හි සැලසුම් කටයුතු හා ප්‍රධාන සිවිල් කටයුතුවල ඉදිකිරීම් අධීක්ෂණ කටයුතු සිදු වෙමින් පවතී.

ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වූ පුද්ගලයන් (PAPs) සඳහා වූ නැවත පදිංචි කිරීමේ නිවාස ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කරන ලදුව, ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වූ පුද්ගලයන් වෙත නිවාස විස්සක් භාර දෙන ලදී.

ව්‍යාපෘතියේ සංරචක පිළිබඳ විස්තර පහත දී ඇත:

| සංරචකය | කොන්ත්‍රාත්කරු | තත්ත්වය |
|---|---|---|
| **කොටස-A1- සූදානම් කටයුතු** | වී.වී. කරුණාරත්න සහ සමාගම<br><br>2018 මාර්තු මස 27වන දින පිරිනමන ලදී | මහවැලි නදිය හරහා දිය මංකඩද සමගින් විදුලි බලාගාරය දක්වා වූ පිවිසුම් මාර්ගය හා සේවා කාර්යාල ගොඩනැගිල්ලේ කටයුතු සම්පූර්ණ කරන ලදී.<br><br>සමස්ත ප්‍රගතිය 55%ක් පමණ වේ. |
| **කොටස A2- ප්‍රධාන සිවිල් කටයුතු** | China Gezhouba Group Co. Ltd<br><br>2019 ඔක්තෝබර් මස 04වන දින පිරිනමන ලදී. | කොන්ත්‍රාත්කරුගේ කඳවුරු ගොඩනැගිලි, වට පාළමද ඇතුළත්ව වේල්ල කරා වූ තාවකාලික ප්‍රවේශ මාර්ගය ඉදිකිරීමේ කටයුතු බොහෝ දුරට සම්පූර්ණ කොට ඇත. වේල්ලේ වම් හා දකුණු ඉවුරුවල කැණීම් කටයුතු සිදු වෙමින් පවතී. බෙදුම් උමගේ කැණීම් කටයුතු පහළ ධාරා කෙළවරේ සිට ආරම්භ කොට ඇත. විදුලි බලාගාරය වැඩබිමේ තාවකාලික ප්‍රවේශ මාර්ග යේ කැණීම් කටයුතු හා ඉදිකිරීම් ආරම්භ කරන ලදී (රූපය G3).<br><br>කටයුතුවලට අදාළ සමස්ත ප්‍රගතිය 7.5%ක් පමණ වේ. |
| **කොටස B - යාන්ත්‍රික හා විදුලි පහසුකම්** | චීනයේ Dongfang Electric International Corporation<br><br>2020 මැයි මස 13වන දින පිරිනමන ලදී | 2020 ජුනි මස 30වන දින කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කරන ලදී. කොන්ත්‍රාත්තුව ආරම්භ කළ දිනය 2020 ඔක්තෝබර් මස 02වන දිනයයි. කොන්ත්‍රාත්කරු විසින් සැලසුම් කටයුතු ආරම්භ කොට ඇත. |

# ව්‍යාපෘති අංශය

## උමා ඔය බහු කාර්ය සංවර්ධන ව්‍යාපෘතිය

උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය යනු වාරිමාර්ග කටයුතු සඳහා උමා ඔය ද්‍රෝණියේ සිට කිරිඳි ඔය ද්‍රෝණිය දක්වා වාර්ෂිකව ජලය කියුබික් මීටර් මිලියන 168ක් හරවා යවන්නාවූ ද්‍රෝණි අතර ජලය හරවා යැවීමේ ව්‍යාපෘතියක් හා බද්ධ වූ ජල විදුලි බලශක්ති ජනන ව්‍යාපෘතියකි. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය එ.ජ.ඩො.මි. 514ක් වේ.

මෙම ව්‍යාපෘතිය තුළට මීටර් 35ක් උසින් යුත් රෝලර් සංයුක්ත කොන්ක්‍රීට් (RCC) වේල්ලක් හා මීටර් 50ක් උසින් යුත් ඩයිරාබා රෝලර් සංයුක්ත කොන්ක්‍රීට් වේල්ලක්ද ඇතුළත් වේ. ඩයිරාබා ප්‍රවේශයෙන් එන ප්‍රධාන ජල මාර්ගය මගින් කි.මී. 15.1ක් දිග පෙරාර උමගක් (HRT), මීටර් 630ක් උස වානේ සිරස් පීඩන පතුවළක්, මෙ.වො. 2 x 60 ජල විදුලි ජනන යන්ත්‍ර හා කි.මී. 3.6ක් දිග අවරාර උමගක් හරහා අලිකොට ආර වේල්ල තුළට තත්පරයට ජලය ඝණ මීටර 19.50ක් ගමන් කරවනු ලබයි.

උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භයේ දී වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරන ලදී. එය මේවන විට වාරිමාර්ග අමාත්‍යාංශයේ විෂය පථය යටතට ගැනේ. ව්‍යාපෘතියේ කටයුතු 2020 ජුනි මාසයේදී අවසන් කිරීමට අපේක්ෂා කෙරේ. වසර අවසානය වනවිට වාර්තාගත භෞතික ප්‍රගතිය 96%කි.

2020 වසර තුළ පහත සඳහන් කටයුතු සිදුකරන ලදී.

### උමා ඔය විදුලි බලාගාරයේ ද්‍රාව්‍ය රහිත මෙහෙවර කටයුතු අවසන් කිරීම

1 ඒකකයේ හා 2 ඒකකයේද ප්‍රධාන ජල පිවිසුම් කපාට (MIV), ටර්බයිනය හා සංයාමකය, ජනන යන්ත්‍රය, උද්දීපනය, ජනන යන්ත්‍ර සහායක, ප්‍රත්‍යාවර්ථ ධාරා පද්ධතිය, සෘජු ධාරා පද්ධතිය, සිසිලන ජල පද්ධතිය හා සම්පීඩිත වා පද්ධතියද ඇතුළත් උමා ඔය විදුලි බලාගාරයේ ප්‍රධාන උපකරණ ද්‍රාව්‍ය රහිත මෙහෙවර කටයුතු 2020 පෙබරවාරි අවසානය වනවිට අවසන් කෙරිණි.

ප්‍රධාන ජල පිවිසුම් කපාටය, ටර්බයිනය හා සංයාමකය, ජනන යන්ත්‍රය, උද්දීපනය, ජනන යන්ත්‍ර සහායක ද්‍රව්‍ය රහිත මෙහෙවර කටයුතු ඔස්ට්‍රියාවේ Andritz Hydro ආයතනය විසින් සිදුකරන ලද අතර, ප්‍රත්‍යාවර්ථ ධාරා පද්ධතිය, සෘජු ධාරා පද්ධතිය, සිසිලන ජල පද්ධතිය හා සම්පීඩිත වා පද්ධතියද ද්‍රාව්‍ය රහිත මෙහෙවර කටයුතු මුල් උපකරණ නිෂ්පාදනායතනයන්ගේ නිර්දේශද සහිතව Iranian EPC contractor Farab (FC) විසින් සිදුකරන ලදී.



රූපය P 4: උමා ඔය විදුලි බලාගාරයේ ද්‍රාව්‍ය රහිත මෙහෙවර කටයුතු

### කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගය හා තනි කුලුණු පදනම ආරම්භ කිරීම

කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගයෙහි කුලුණු ඉදිකිරීම් කටයුතු 2020 වසර තුළ ඉදිරියට සිදුකරගෙන යන ලදී. තවද, බදුල්ල ස්විච් අංගනය අසලින් උමා ඔය විදුලි බලාගාරය සම්බන්ධ කරමින් කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගය කෙළවර විශේෂ ඒකධ්‍රැව කුලුණු තුනක් ඉදිකිරීමට තීරණය කර ඇත. ඒකධ්‍රැව මුහු කුලුණු ශ්‍රී ලංකාවේ පළමුවන වරට භාවිත කෙරෙනු ඇත. එම කුලුණු පදනම් ඉදිකිරීම 2020 දෙසැම්බර් මාසයේදී ආරම්භ කරන ලදී.



රූපය P 5: කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම

### පුහුල්පොල වේල්ල පරිරෝධන කටයුතු සම්පූර්ණ කිරීම

පුහුල්පොල හා ඩයිරාබා යනු උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලද ජලාශයන් දෙක වේ. පුහුල්පොල වේල්ල පරිරෝධනය හා H&M මෙහෙවරෙහි යෙදවීමේ කටයුතු 2020 වසර තුළ සම්පූර්ණ කරන ලදී.



රූපය P 6: පුහුල්පොල වේල්ල ගුවනින් පෙනෙන අයුරු

## ද්‍රව ස්වභාවික වායු ව්‍යාපෘතිය (LNGP)

කොළඹ පදනම්ගත විදුලි බලාගාර සඳහා ද්‍රව ස්වභාවික වායු (LNG) යෙදීම සඳහා වූ පූර්ව ශක්‍යතා අධ්‍යයනයක් ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) සහාය යටතේ 2018 වසර තුළ සිදු කරන ලදී. මෙම අධ්‍යයනය මගින් රටේ විදුලි අංශය සඳහා ස්වභාවික වායු හඳුන්වා දීමට අපේක්ෂා කරන ලද අතර, ඒ අනුව, ද්‍රව ස්වභාවික වායු යටිතල පහසුකම් සංවර්ධනය සඳහා අවශ්‍යවන තාක්ෂණික සැකසුම, ස්ථානය හා යෝග්‍ය ව්‍යාපාරික මාදිලියද නිර්දේශ කරන ලදී. කෙරවලපිටිය අක්වෙරවළ නවතා ඇති පාවෙන ගබඩා ප්‍රති වායුකරණ ඒකකය විදුලි ජනනය සඳහා ද්‍රව ස්වභාවික වායු යෙදවීමේ වඩාත් යහපත් විකල්පය වන බවට නිගමනය කරන ලදී.

# ව්‍යාපෘති අංශය

පූර්ව ශක්‍යතා අධ්‍යයනයෙන් අනතුරුව, සවිස්තරාත්මක ශක්‍යතා අධ්‍යයනය සිදු කරනු පිණිස ලං.වි.ම. උපදේශකවරුන් සමගින් කටයුතු කිරීමට ආසියානු සංවර්ධන බැංකුව විසින් PricewaterhouseCoopers (PwC) ආයතනයේ උපදේශකවරුන් පත්කරන ලදී. විවිධ සාගර පාරිසරික තත්ත්ව/ ජලගතිකත්ව තත්ත්ව මාදිලි වටපිටාවන් යටතේ නැව් මෙහෙයුම් කටයුතුවලට අදාළ සාගර පාරිසරික තත්ත්ව / ජල ගතිකත්ව අධ්‍යයන හා අංකිත සමාකරණ කටයුතුවල ලංකා හයිඩ්‍රෝලික් ආයතනය හා ෆෝස් ටෙක්නොලජි ඩෙන්මාර්ක් ආයතනය නියැළිණි. ඒ සමගම ලං.වි.ම හා ජඅක උපදේශකවරුන් විසින් :

- පාවෙන ගබඩා ප්‍රති වායුකරණ ඒකකය (FSRU) හා නැවතුම් පද්ධතිය කෙරවළපිටිය අක්වෙරළ ප්‍රදේශයෙහි යෙදවීම
- සාගර දිය යට හා වෙරළ මත නළ මාර්ග පද්ධතියක් ඉදිකිරීම
- පාවෙන ගබඩා ප්‍රති වායුකරණ ඒකකය වෙත ද්‍රව ස්වභාවික වායු මූලාශ්‍රකරණය

සඳහා ජාත්‍යන්තර තරගකාරී ලංසුකරණය මගින් යෝජනා කැඳවීමට ව්‍යාපෘති ගිවිසුම්ද ඇතුළත් යෝජනා ඉල්ලුම් ලේඛනයක් සකස් කරන ලදී.

2020 ජුනි මාසයේදී අමාත්‍ය මණ්ඩලය විසින් ද්‍රව ස්වභාවික වායු ස්ථානගත කිරීමේ ව්‍යාපෘතිය අනුමතකරන ලද අතර, පාවෙන ගබඩා ප්‍රති වායුකරණ ඒකකය (FSRU) හා නැවතුම් පද්ධතිය ස්ථානගත කිරීමට හා පාවෙන ගබඩා ප්‍රති වායුකරණ ඒකකය වෙත ද්‍රව ස්වභාවික වායු ලබාගැනීම සඳහාද ලං.වි.ම. වෙත බලය පවරන ලදී.

කෙරවළපිටියෙන් කි.මී. 5ක් අක්වෙරළට වන්නට නවතා ඇති මෙකී යෝජිත පාවෙන ගබඩා ප්‍රති වායුකරණ ඒකකය (FSRU) මගින් කැළණිතිස්ස හා කෙරවළපිටිය දැනට පවත්නා විදුලි බලාගාරයනට අමතරව අනාගතයේ ඇතිවන සංයුක්ත චක්‍රීය විදුලි බලාගාරයන් වෙතද ද්‍රව ස්වභාවික වායු සැපයෙනු ඇති අතර, ජාතිය වෙත වඩ වඩාත් පාරිසරික ප්‍රතිලාභ ලබාදීමේ හැකියාව ඇතිකරනු ඇත.

## ත්‍රිකුණාමලය ගල්අඟුරු විදුලි ව්‍යාපෘතිය (TCPP)

සාම්පූර්හි යෝජිත මෙ.වො. 500 විදුලි බලාගාරයේ සංවර්ධන කටයුතු තාවකාලිකව අත්හිටුවා ඇති නමුත්, විදුලි පද්ධතිය වැඩිදියුණු කිරීම් සඳහා අවශ්‍යවන හබරණ - වේයන්ගොඩ සම්ප්‍රේෂණ මාර්ග ව්‍යාපෘතිය ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනයේ (JICA) සහාය සහිතව ක්‍රියාත්මක කෙරෙමින් පවතී.

ව්‍යාපෘතියේ නව කි.වෝ. 220/ කි.වෝ. 132/ කි.වෝ. 33 හබරණ කොටුමා උපපොළ ඉදිකිරීමේ හා වේයන්ගොඩ කොටුමා උපපොළ විශාලනය කිරීමේ කොන්ත්‍රාත්තුවේ කටයුතුවල ප්‍රගතිය 2020 වසර අවසානය වනවිට 84%ක් ලෙස වාර්තා විය. (කොටස A)



**රූපය P 7: කි.වෝ. 220/132/33 නව හබරණ කොටුමා උපපොළ**

ව්‍යාපෘතියේ කි.මී. 148, කි.වෝ 220 සම්ප්‍රේෂණ මාර්ගයක් වේයන්ගොඩ සිට නව හබරණ කොටුමා උපපොළ දක්වා ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව හා ඒ ආශ්‍රිත මාර්ග හැරවුම් විසින් වසර 2020 අවසානයේදී 85%ක කාර්ය ප්‍රගතියක් වාර්තා කරන ලදී. (කොටස B)

## සීතාවක ගඟ ජල විදුලි ව්‍යාපෘතිය

ව්‍යාපෘතියේ සවිස්තරාත්ම සැලැස්ම හා ලංසු ලේඛන කෙටුම්පත් 2020 ජනවාරි මාසයේදී සකස් කොට අවසන් කරන ලදී. තවද, වන්දි ගෙවීම හා ඉඩම් අත්පත් කරගැනීම සම්බන්ධයෙන් 2020 ජුනි මාසයේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලුහුඬු නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම අනුමත කරන ලද අතර, ලං.වි.ම. පනතේ විධිවිධාන හා අනුගතව 2020 අගෝස්තු මාසයේදී ඉඩම් අත්පත් කරගැනීමේ නියෝග ගැසට් නිවේදන පළ කරන ලදී. පාරිසරික බලපෑම් තක්සේරු අවසන් වාර්තාව අනුමැතිය සඳහා මධ්‍යම පරිසර අධිකාරිය වෙත ඉදිරිපත් කරන ලදී. කොවිඩ් - 19 වසංගත ගැටලුව හේතුකොට අවසන් අනුමැතිය මෙතෙක් ලැබී නොමැත. කෙසේ වුවද, විකල්ප ක්‍රමයක් මගින් ලං.වි.ම. සතු ව්‍යාපෘතියක් ලෙස මෙම බලාගාරය ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇත.

## හරිත බලශක්ති සංවර්ධන හා බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන (දෙවන අදියර)

හරිත බලශක්ති සංවර්ධන හා බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ වැඩසටහන (දෙවන අදියර) සම්ප්‍රේෂණ යටිතල පහසුකම් ප්‍රවර්ධනය, මැදි වෝල්ටීයතා ජාලයේ කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය හා සුහුරු කොටුමා හා මනු නියමු උප ව්‍යාපෘතිද ඇතුළත් ඉල්ලුම් පාර්ශ්ව කළමනාකරණය යන අංගයන්ගෙන් සමන්විත වේ.

මෙම ව්‍යාපෘතියේ විෂය පථය තුළට සුළං විදුලි ව්‍යාපෘතියෙන් ජනනය කරන බලශක්තිය සම්ප්‍රේෂණය කරනු පිණිස මන්නාරමේ කි.වෝ. 220 සම්ප්‍රේෂණ සංවර්ධනය, කි.වෝ. 220 පොල්පිටිය - හම්බන්තොට සම්ප්‍රේෂණ මාර්ගය, හොරණ - පාදුක්ක සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම, කි.වෝ. 132 හබරණ - වාලච්චේන සම්ප්‍රේෂණ මාර්ගයේ, හම්බන්තොට කි.වෝ. 220 කොටුමා උපපොළ, කි.වෝ. 132/33 කොළඹ ඊ උපපොළ දෙවන පරිපථ කම්බි ඇදීම, දෙහිවල, හොරණ, පාදුක්ක, කොළොන්නාව, මාදම්පේ හා කොටුගොඩ කොටුමා උපපොළ විශාලනය, බියගම කොටුමා උපපොළෙහි කි.වෝ. 220/33 ධාරිතා වර්ධනය, අනුරාධපුර ප්‍රදේශයේ ඇතාගල මැදි වෝල්ටීයතා බෙදාහැරීම ප්‍රවර්ධනය, කප්පල්තුරේ - චීන වරාය කි.වෝ. 33 මාර්ග ඉදිකිරීම, බස්නාහිර හා දකුණු පළාත්වල වෝල්ටීයතා ප්‍රවර්ධනය සඳහා වෝල්ටීයතා සංවර්ධනය හා පාලනය ඇතුළත් වේ. එය බෙදාහැරීමේ හා ඉල්ලුම් පාර්ශ්ව කළමනාකරණ (DSM) අංගයකින්ද නවෝත්පාදනීය සුහුරු ජාල හා මනු නියාමන උප ව්‍යාපෘතියකින්ද සමන්විත වේ.

ඌව පළාත හැර ශ්‍රී ලංකාවේ සියලු පළාත්වලට මෙම වැඩසටහනේ සම්ප්‍රේෂණ, බෙදාහැරීමේ හා ඉල්ලුම් පාර්ශ්ව කළමනාකරණ අංගයන් ක්‍රියාත්මක කිරීම මගින් සෘජු ප්‍රතිලාභ අත්වනු ඇත.

2 කොටසේ සමස්ත ආයෝජන පිරිවැය එ.ජ.ඩො.මි. 260කි. ආසියානු සංවර්ධන බැංකුව විසින් එ.ජ.ඩො.මි. 150ක් හා ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනය (AFD) විසින් එ.ජ.ඩො.මිලි 30ක් සම්පාදනය කරනු ඇත. ව්‍යාපෘතිය 2021 දෙසැම්බර් මාසයේදී සම්පූර්ණ කිරීමට අපේක්ෂිතය. සම්ප්‍රේෂණ යටිතල පහසුකම් ප්‍රවර්ධන සංරචකයේ පිරිවැය එ.ජ.ඩො.මි. 154.6කි.

# ව්‍යාපෘති අංශය

සම්ප්‍රේෂණ යටිතල පහසුකම් ප්‍රවර්ධන සංරචකයේ පැකේජ තුන යටතේ කොටස් 8ක් පවතී. මෙම කොන්ත්‍රාත්තු පිරිනැමූ පසු, එ.ජ.ඩො.මි. 31ක පමණ ඉතිරියක් අත්පත් වූ අතර, එබැවින් ඉතුරුම් උපයෝජනය කරනු පිණිස තවත් පැකේජ දෙකක් හඳුන්වා දී ඇත.



රූපය P 8: මන්නාරම - නාඩුකුඩා සම්ප්‍රේෂණ මාර්ගය

අලුතින් හඳුන්වා දෙන ලද විෂය පථය තුළට වැඩි පුනර්ජනනීය බලශක්ති අවශෝෂණයක් සඳහා පහසුකම් සලසමින් ප්‍රදේශයේ පිහිටි කර්මාන්තයන්ගේ වර්ධනය වෙමින් පවත්නා විදුලි ඉල්ලුම සපුරාලීම පිණිස චුන්නාකම්, නඩුකුඩා, ආනියාකන්ද, පන්නල හා අම්බලන්ගොඩ නමැති කොටුමා උපපොළ පහක් විශාලනයද ඇතුළත් වේ.

අලුතින් හඳුන්වා දෙන ලද පැකේජය 9 විෂය පථය තුළ කෙරවළපිටියේ ඉදිකිරීමට නියමිත යෝජිත ද්‍රව ස්වභාවික වායු බලාගාරයන් වෙතින් බලශක්තිය අවශෝෂණය කරගැනීමේ කාර්යය සඳහා පහසුකම් සලසනු පිණිස කෙරවළපිටියේ කි.වෝ. 220 වායු වෙනුරූ වහරූ වාරන (GIS) ඉදිකිරීමද ඇතුළත් වේ.



රූපය P 9: නව පොල්පිටිය - හම්බන්තොට සම්ප්‍රේෂණ මාර්ගය



රූපය P 10: දෙහිවල කොටුමා උපපොළෙහි කි.වෝ. 132/කි.වෝ. 33 මෙ.වෝ.ඇ. 31.5 තරාපැවිය ස්ථානගත කිරීම



රූපය P 11: දෙහිවල කොටුමා උපපොළෙහි කි.වෝ. 132/කි.වෝ. 33 මෙ.වෝ.ඇ. 31.5 තරාපැවිය ස්ථානගත කිරීම

පැකේජය 1 යටතේ මන්නාරම - නාඩුකුඩා කි.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීමේ කටයුතු 2020 අගෝස්තු මාසයේදී සම්පූර්ණ කරන ලද අතර, නඩුකුඩා කි.වෝ. 220/33 කොටුමා උපපොළ 2021 අප්‍රේල් මාසයේදී වැඩ අවසන් කෙරෙනු ඇත.

පැකේජය 2 යටතේ හම්බන්තොට කි.වෝ. 220 සංවර්ධන කටයුතු ආසන්න වශයෙන් 60%ක් පමණ අවසන්ව ඇති අතර, 2021 සැප්තැම්බරයේදී සම්පූර්ණ වනු ඇත.

පැකේජය 3 යටතේ, කොටුමා උපපොළ හයක් විශාලනය කිරීමේ කටයුතුවල 70%ක ප්‍රගතියක්ද (A 2 කොටස), කොළඹ කොටුමා උපපොළ ඉදිකිරීමේ කටයුතුවල 25%ක ප්‍රගතියක්ද බියගම කි.වෝ. 220/33 කොටුමා උපපොළ ඉදිකිරීමේ කටයුතු 73%ක ප්‍රගතියක්ද වසර අවසානය වනවිට වාර්තාකර තිබිණි.

අළුතින් එක්කරන ලද පැකේජයන් අතරින්, පැකේජය 8ට අදාළ ටෙන්ඩර් කැඳවා ලංසු විසා දමන ලද අතර, පැකේජය 9ට අදාළ ටෙන්ඩරය පිරිනමනු ලැබ කටයුතු ආරම්භ කරන ලදී.

සමාලෝචිත වසර තුළ ව්‍යාපෘති කටයුතු සතුටුදායක ලෙස ඉදිරියට ගමන් කළද, කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුකොට ඇතිවන ප්‍රමාදයන් සම්බන්ධයෙන් කටයුතු කිරීමට හා අළුතින් එක් කරන ලද කටයුතු සම්භාරය අවසන් කරනු පිණිස ණය ගිවිසුම හා කොන්ත්‍රාත් ගිවිසුම සඳහා කාලය දීර්ඝ කරගැනීමට අවශ්‍ය වනු ඇත.

# ව්‍යාපෘති අංශය

## ජාතික සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ ජාල සංවර්ධනය හා කාර්යක්ෂමතා ප්‍රවර්ධන ව්‍යාපෘතිය (NTDND & EIP)

ණය අංක SLP-113 යටතේ මෙම ව්‍යාපෘතියට ජපන් ජාත්‍යන්තර සහයෝගිතා මූල්‍යායතනය විසින් අරමුදල් සපයනු ලබයි. ව්‍යාපෘතිය තුළ පැකේජ හතරක් අන්තර්ගත වේ.

පැකේජය 1 කි.වෝ. 132/ කි.වෝ. 220/ කි.වෝ. 400 සම්ප්‍රේෂණ මාර්ග ඉදිකිරීම සඳහා වේ. පැකේජය සඳහා වූ කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කර ඇති අතර වසර අවසානයේදී ඉදිකිරීම් ප්‍රගතිය 19%ක් ලෙස වාර්තා විය.

පැකේජය 2 වෙන් වනුයේ කි.වෝ. 220/132 කිරිඳිවැල ස්විච් පොළ, කි.වෝ. 132/33 කිරිඳිවැල කොටුමා උපපොළ, කි.වෝ. 132/33 බත්තරමුල්ල ගෘහස්ථ උපපොළ ඉදිකිරීම හා පවත්නා කොටුමා උපපොළ කිහිපයක් විශාලනය කිරීමේ කටයුතු සඳහාය. පැකේජය සඳහා වූ කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කරනු ලැබ ඇති අතර, වසර අවසානය වනවිට ඉදිකිරීම් ප්‍රගතිය **30%**ක් ලෙස වාර්තා විය.

පැකේජය 3 වෙන් වනුයේ කොත්මලේ කොටුමා උපපොළේ සිට නව පොල්පිටිය කොටුමා උපපොළ දක්වා කි.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම හා පොල්පිටිය කොටුමා උපපොළේ සිට නව හබරණ කොටුමා උපපොළ දක්වා කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ග යක් ඉදිකිරීම සඳහාය. පැකේජය සඳහා වූ කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කරනු ලැබ, වසර අවසානය වනවිට ඉදිකිරීම් ප්‍රගතිය 25%ක් ලෙස වාර්තා විය.

පැකේජය 4 වෙන් වනුයේ ප්‍රාථමික උපපොළ ඉදිකිරීම, දෙහිවල, ගල්කිස්ස හා බත්තරමුල්ල අධීක්ෂණ පාලන හා දත්ත උකහා ගැනුම්/බෙදාහැරුම් ඈන්ටනා පද්ධති (SCADA/DAS) සහිත කි.වෝ. 11 භූගත යොත් ඉදිකිරීම සඳහාය. පැකේජය සඳහා වූ කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කරනු ලැබ ඇති අතර, වසර අවසානය වනවිට ඉදිකිරීම් ප්‍රගතිය 5%ක් ලෙස වාර්තා විය.

## මහ කොළඹ සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ සහ හානි අවමකරණ ව්‍යාපෘතිය (GCT&DLRP)

මහ කොළඹ සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ සහ හානි අවමකරණ ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීම මගින් කොළඹ නගර භූගත සම්ප්‍රේෂණ පද්ධතියේ ධාරිතාවය දෙගුණ කරන ලදී. සම්පූර්ණ කරන ලද කාර්ය පථයට අමතරව, කෙරවළපිටිය කොටුමා උපපොළ හා කොළඹ L කොටුමා උපොළ අතර කි.වෝ. 220, ව.මි.මී. 1600, 3xතනි හර, හරස් සම්බන්ධක පොලිඑතිලීන් (XLPE) පරිවරණිත තවත් තනි පරිපථයේ භූගත යොත් පද්ධතියක් එළීමට සැලසුම් කර ඇත.

මෙම නව කේබලය මගින් සම්ප්‍රේෂණ ජාලයේ ධාරිතාවය තවදුරටත් ඉහළ නංවනු ඇති අතර, කෙරවළපිටියේ ඉදිකිරීමට නියමිත නව ද්‍රව ස්වභාවික වායු බලාගාරයන් මගින් ජනනය කරනු ලබන විදුලිය සම්ප්‍රේෂණය සඳහා යොදාගනු ඇත. තවද, ධාරා තරාපැවි ධාරිතාවයන්හි පවත්නා සීමා බාධක ඉවත් කිරීම සඳහා කොළඹ E හා F කොටුමා උපපොළයන්හි ආරක්ෂණ ක්‍රම හා ධාරා තරාපැවි මාරු කිරීමද මෙම ව්‍යාපෘතිය යටතේම සිදු කෙරෙනු ඇත.

මෙම කොන්ත්‍රාත්තුව මේවන විටද ජර්මනියේ ABB Power Grids yd Schneider Electric Lanka පුද්ගලික සමාගම වෙත පිරිනමන ලදුව 2021 සැප්තැම්බර් මාසය වනවිට වැඩ අවසන් කිරීමට සැලසුම් කර ඇත.

## විදුලිබල පද්ධතිවල විශ්වසනීයත්වය බලගැන්වීමේ ව්‍යාපෘතිය (PSRSP)

නොරොච්චෝලේ ලක්විජය විදුලි බලාගාරය මගින් ජනනය කරනු ලබන විදුලිය පිට කරමින් විශ්වසනීය හා අඛණ්ඩව විදුලිබල සැපයුම් තත්ත්වයක් සපුරා ගැනීමේ හා රටේ සංවර්ධන ක්‍රමෝපාය සමගින් සම්බන්ධ වීමේ අදහසින් විදුලිබල පද්ධතිවල විශ්වසනීයත්වය බලගැන්වීමේ ව්‍යාපෘතිය (PSRSP) ආරම්භ කරන ලදී. පිරිවැය එ.ජ.ඩො.මි. 123ක් වන අතර 2021 වසරේ අත්සන් කිරීමට අපේක්ෂිත ආසියානු සංවර්ධන බැංකු ණය පැකේජය යටතේ අරමුදල් සැපයේ.

ව්‍යාපෘතිය 2023 වසර වනවිට වැඩ අවසන් කිරීමට නියමිතය.

මෙම ව්‍යාපෘතියට මීරිගම කි.වෝ. 220/33 කොටුමා උපපොළ , පෑලියගොඩ, හෝමාගම, තිස්සමහාරාමය, බද්දේගම, කලවාන හා මීගමුව කි.වෝ. 132/33 කොටුමා උපපොළයන් ඉදිකිරීම, ඉහත කී කොටුමා උපපොළයන් එකිනෙක සම්බන්ධ කිරීම සඳහා ඒ ආශ්‍රිත සම්ප්‍රේෂණ මාර්ග හා භූගත යොත් ඉදිකිරීම, නව හබරණ හා නව අනුරාධපුර කොටුමා උපපොළයන් අතර කි.වෝ 220 ද්විත්ව පරිපථ සම්ප්‍රේෂණ මාර්ගයේ කි.මී. 46 ක් ඉදිකිරීම හා මාතර සහ හම්බන්තොට කොටුමා උපපොළයන් අතර ද්විත්ව පරිපථ කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගයේ කි.මී. 77ක් ඉදිකිරීමද ඇතුළත් වේ.

මාතර - හම්බන්තොට, හම්බන්තොට - තිස්සමහාරාමය සම්ප්‍රේෂණ මාර්ගයන්හි සහ හෝමාගම කොටුමා උපපොළ වෙත වූ සම්ප්‍රේෂණ මාර්ගයේ පැතිකඩ සමීක්ෂණ කටයුතු සම්පූර්ණ කරන ලදුව, නව හබරණ - නව අනුරාධපුර හා කුකුලේ - කලවාන සම්ප්‍රේෂණ මාර්ගයන්හි පැතිකඩ සමීක්ෂණ සිදු වෙමින් පවතී.

පැකේජය 3 (තිස්සමහාරාමය, බද්දේගම, හෝමාගම හා පෑලියගොඩ කි.වෝ. 132/33 කොටුමා උපපොළයනට අදාළ ඉදිකිරීම්) හා පැකේජය 2 - A කොටස (මාතර - හම්බන්තොට, හම්බන්තොට - තිස්සමහාරාමය අතර කි.වෝ. 132 මාර්ගය, බද්දේගම කොටුමා උපපොලෙහි ඇතුලු හා පිටත සම්බන්ධතාවය ඉදිකිරීම හා කැළණිය විශ්වවිද්‍යාලයේ කුලුණු ඉදිකිරීම) ටෙන්ඩර් කැඳවීම 2020.10.01 දින සිදුකරන ලද අතර, ලංසු කැඳවීමට පෙර රැස්වීම් හා වැඩබිම් නිරීක්ෂණ කටයුතු සම්පූර්ණ කරන ලදී. මෙම ටෙන්ඩර් පිළිවෙලින් 2021.01.03 හා 2021.01.20 දිනයන්හි අවසන් කිරීමට නියමිතය.

## සම්ප්‍රේෂණ ව්‍යාපෘති ශාඛාව

### හරිත විදුලිබල සංවර්ධන හා බලශක්ති කාර්යක්ෂමතා ප්‍රවර්ධන ආයෝජන වැඩසටහන (1 අදියර) 2 කොටස

මෙම සම්ප්‍රේෂණ ව්‍යාපෘතියට අරමුදල් සැපයීම ආසියානු සංවර්ධන බැංකුව විසින්ද (එ.ජ.ඩො.මි. 23.9) සම මූල්‍යකරණය ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනය (AFD) විසින්ද (එ.ජ.ඩො.මි. 30.0) සිදු කරනු ලබයි.

මෙම ව්‍යාපෘතිය යටතේ, ත්‍රිකුණාමලය, කටුනායක හා නව අනුරාධපුර කි.වෝ. 132/33 කොටුමා උපපොළයන් හා කෙරවළපිටිය කි.වෝ. 220/33 කොටුමා උපපොළයන් විශාලන කටයුතු සම්පූර්ණ කොට 2019 වසරේදී වාණිජමය වශයෙන් බලශක්ති ගන්වන ලදී.

සමාලෝචිත වසර තුළ, කප්පල්තුරෙයි, අනුරාධපුර, කළුතර හා කැස්බෑව කොටුමා උපපොළයන් හා බැඳී සම්ප්‍රේෂණ මාර්ග අවසන් කොට බලශක්ති ගන්වන ලදී.

අනුරාධපුර, කළුතර හා කැස්බෑව යෝජිත නව කි.වෝ. 132/33 කොටුමා උපපොළයන් සහ කප්පල්තුරෙයි කි.වෝ. 220/කි.වෝ. 33 කොටුමා උපපොළ ඉදි කෙරෙමින් පවත්නා අතර, ඒවා 2021 වසර තුළ සම්පූර්ණ කිරීමට අපේක්ෂිතය.

# ව්‍යාපෘති අංශය

**පුනර්ජනනීය බලශක්ති අවශෝෂණ සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය**

ව්‍යාපෘතියේ අරමුණ වනුයේ ජාතික ජාලය වෙත පුනර්ජනනීය බලශක්තිය අවශෝෂණය කරගැනීමට හා මධ්‍යම හා සබරගමුව පළාත්හි වර්ධනය වෙමින් පවත්නා විදුලි ඉල්ලුම සපයා දීමට පහසුකම් සැලසීම වේ.

ඉහත කී අවශ්‍යතාවයන් සපුරාගනු පිණිස, මෙම ව්‍යාපෘතිය යටතේ මාලිබොඩ, වේවැල්වත්ත, නාවලපිටිය හා රාගල නව කොටුමා උපපොළයන් හා ආශ්‍රිත සම්ප්‍රේෂණ මාර්ග ඉදිකිරීමට තීරණය කර ඇත.

ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය වනුයේ ඇ.ජ.ඩො.මි. 48කි. ඒ අතරින් යුරෝ මිලියන 30ක් ප්‍රංශයේ ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනය (AFD) විසින් ලබාදෙන අතර, ශේෂය ලං.වි.ම. විසින් අරමුදල්කරණය කිරීමට අපේක්ෂිතය.

මෙම ව්‍යාපෘතිය ලං.වි.ම. ඉංජිනේරුවරුන් විසින් සැලසුම් කිරීම, ප්‍රසම්පාදනය හා ඉදිකිරීම් කටයුතු පිළිබඳ වගකීම් දරන්නාවූ නියමු ව්‍යාපෘතියක් ලෙස සෘජුවම ක්‍රියාත්මක කෙරේ. මෙය වූකලි 'පූර්ණ නිමි භාණ්ඩ මුදා හැරීමේ' සංකල්පයෙන් වෙන් වූවකි. මෙම නව සංකල්පය මගින් ව්‍යාපෘති කටයුතුවලදී ලං.වි.ම. ඉංජිනේරුවරුන්ගේ හා තාක්ෂණික කාර්ය මණ්ඩලයේ දැනුම වර්ධනය කරවන ලදී. එය ලං.වි.ම. සේවා නියුක්තිකයන්ගේ කුසලතා සංවර්ධනයේ ධනාත්මක ප්‍රවණතාවයක් ලෙස සනිටුහන් කෙරේ.



රූපය P 12: මාලිබොඩ කොටුමා උපපොළ



රූපය P 13: මාලිබොඩ - පොල්පිටිය සම්ප්‍රේෂණ මාර්ගය

මෙම ව්‍යාපෘතියේ භාණ්ඩ ප්‍රසම්පාදනය සඳහා කොන්ත්‍රාත් දොළහක් පැවති අතර, කාර්ය ප්‍රසම්පාදනය සඳහා කොන්ත්‍රාත් තුනක් පැවතිණි. තරගකාරී ලංසු, ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනයේ හා ශ්‍රී ලංකා රජයේ අවශ්‍යතාවයන් සමගින් අනුගත වීම යන කරුණු මෙම ක්‍රියාවලිය තුළ අනුගමනය කරන ලදී. තවද, මෙම අලුතින් හඳුන්වා දෙන ලද සෘජු ප්‍රසම්පාදන සංකල්පය අනුගමනය මගින් ලං.වි.ම. විසින් සැලකිය යුතු ඉතිරියක් අත්පත් කරගන්නා ලදී.

කොවිඩ් - 19 වසංගත තත්ත්වය සමගින් ගොඩනැගුණු විවිධාකාර වූ බාධක යටතේ පවා, මාලිබොඩ කොටුමා උපපොළ, වේවැල්වත්ත කොටුමා උපපොළ හා මාලිබොඩ - පොල්පිටිය සම්ප්‍රේෂණ මාර්ග යද 2020 වසර තුළ සාර්ථකව මෙහෙවරෙහි යොදවන ලදී. 2021 ජූනි මාසයේදී නාවලපිටිය හා රාගල කොටුමා උපපොළයන් බලශක්ති ගැන්වීමට අපේක්ෂිතය.

මෙම ව්‍යාපෘතියේ කටයුතු අවසන් වීමත් සමගින්, මධ්‍යම හා සබරගමුව පළාත්වල වලින් ජාතික ජාලයට කුඩා ජලවිදුලි සංවර්ධන මගින් අතිරේක ඒකක මෙ.වො. 100ක ප්‍රමාණයක් අවශෝෂණය කරගත හැක.

**පිවිතුරු බලශක්ති හා ජාල කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය**

මෙම ව්‍යාපෘතිය පැකේජ හතරකින් සමන්විත වන අතර, ව්‍යාපෘතිය සඳහා අරමුදල් සම්පාදනය කරන ලද ආසියානු සංවර්ධන බැංකු ණය අංක 2892/2893 වසා දැමීමත් සමගින් 2019 මැද භාගය වනවිට ඉදිකිරීම් කටයුතුවලින් බොහෝ කොටසක් සාර්ථකව අවසන් කරන ලදී.

කෙසේ වුවද, ලං.වි.ම. පාලනයෙන් බැහැර හේතු මත ව්‍යාපෘතියේ පහත සඳහන් සංරචක ප්‍රමාද වූ අතර, ප්‍රමාද වූ දංවරනයන්හි පවත්නා තත්ත්වය පහත දී ඇත:

**පැකේජය 01- A කොටස**

මන්නාරම කොටුමා උපපොළ ඉදිකිරීම් කටයුතු සාර්ථකව අවසන් කරන ලදුව 2020 පෙබරවාරි මාසයේදී බලශක්ති ගන්වන ලදී.



රූපය P 14: මන්නාරම කොටුමා උපපොළ

**පැකේජය 02: කි.වෝ. 132 සම්ප්‍රේෂණ යටිතල පහසුකම් ව්‍යාපෘතිය**

අතුරුගිරිය - කොළොන්නාව සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීමේ කටයුතු සඳහා මුදා නොහරින ලද බැවින් එම මාර්ගයේ නැවත ඉදිකිරීම් කටයුතු නැවතී ඇත.

අතුරුගිරිය - පාදුක්ක කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගය ඉදි වෙමින් පවත්නා අතර, 2021 පෙබරවාරි මාසය වනවිට කටයුතු අවසන් කිරීමට අපේක්ෂිතය.

**පැකේජය 03- B කොටස**

වසර තුළ පාදුක්ක - පන්නිපිටිය සම්ප්‍රේෂණ මාර්ගයේ ඉදිකිරීම් කටයුතු ඉදිරියට සිදුවූ අතර, 2021 වසර වනවිට කටයුතු සම්පූර්ණ කිරීමට අපේක්ෂිතය.

# ව්‍යාපෘති අංශය



**රූපය P 15: පාදුක්ක-පන්නිපිටිය සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීමේ කටයුතු**

## සම්ප්‍රේෂණ ඉදිකිරීම් ව්‍යාපෘති ශාඛාව

ලං.වි.ම. සම්ප්‍රේෂණ ජාලයේ නව ඉදිකිරීම්, විශාලනයන්, නැවත ඉදිකිරීම් හා ප්‍රතිසංස්කරණයන් ඇතුළත් වන්නාවූ සම්ප්‍රේෂණ ඉදිකිරීම් ක්‍රියාත්මක කරනු පිණිස මෙම ශාඛාව 2012 වසරේදී ස්ථාපනය කරන ලදී. අවශ්‍ය උපකරණ හා ද්‍රව්‍ය මිලදී ගැනීමේ සිට ඉදිකිරීම් කටයුතු දක්වා වෙන්කරන ලද කාර්ය ක්ෂේත්‍ර අතරින් හැකි උපරිමයකට අදාළ කටයුතු සිදු කරනු පිණිස සිය ශාඛාවේම කාර්ය මණ්ඩලය යෙදවීම කෙරෙහි ශාඛාවේ අවධානය යොමුවිය. ශාඛාවේම කාර්ය මණ්ඩලය යොදවමින් ඉටුකළ නොහැකි හඳුනාගත් කාර්ය කොටස් පමණක් තරගකාරී ලංසු කැඳවීම් හරහා උප-කොන්ත්‍රාත්කරණය කරන ලදී.

## කොටුමා උපපොළ ඉදිකිරීම් ව්‍යාපෘති (GSCP) ඒකකය

2020 වසර තුළ ඉටු කරන ලද ඉදිකිරීම් කටයුතු පහත ලැයිස්තුගත කර ඇත:

| කාර්යය | විස්තරය/තත්ත්වය |
|---|---|
| **නව අනුරාධපුර කොටුමා උපපොළෙහි මෙ.වෝ.ඇ. 100 ප්‍රතිවාරකය හා මන්නාරම කොටුමා උපපොළෙහි මෙ.වෝ.ඇ. 50 ප්‍රතිවාරක සවි කිරීම** | • සීමාවන් තුළ පද්ධතියේ කි.වෝ. 220ක වෝල්ටීයතාවයක් පවත්වාගෙන යාම.<br>• මෙම ව්‍යාපෘතිය 2019 අගෝස්තු මස ආරම්භ වූ අතර, 2021 මාර්තු මාසයේදී කටයුතු අවසන් වනු ඇත.<br>• ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත සමස්ත පිරිවැය ශ්‍රී ලං.රු.මි. 1,375කි. |
| **වගවත්ත කොටුමා උපපොළ ඉදිකිරීම** | • වගවත්ත කර්මාන්ත කළාපය වෙත මෙ.වෝ.ඇ. 30ක විදුලි සැපයුමක් ලබාදීම හා මිල්ලනිය යෝජිත කර්මාන්ත කළාපය වෙත මෙ.වෝ.ඇ. 25ක විදුලි සැපයුමක් ලබාදීම.<br>• ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත පිරිවැය ශ්‍රී ලං.රු.මි. 1,898ක් වන අතර, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (BOI) විසින් අරමුදල් සම්පාදනය කරනු ලබයි.<br>• ව්‍යාපෘතියේ කටයුතු 2021 දෙසැම්බර් මාසයේදී අවසන් කිරීමට සැලසුම් කර ඇත. |
| **නව පොල්පිටිය ස්විච් පොළෙහි කි.වෝ. 220 ද්විත්ව බස්බාර් සම්ප්‍රේෂණ මාර්ග රාක්ක 02ක් ඉදිකිරීම.** | • නව පොල්පිටිය - හම්බන්තොට කි.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ගයේ ජාල සම්බන්ධතාවය සඳහා පහසුකම් සැලසීම.<br>• 2021 අප්‍රේල් මස ව්‍යාපෘතිය අවසන් වීමට නියමිතය. |
| **රත්මලාන කොටුමා උපපොළෙහි කි.වෝ. 33 පෝෂක රාක්ක දෙකක් (02) ඉදිකිරීම** | • යෝජිත කරදියාන ජල විදුලි ව්‍යාපෘතිය (මෙ.වො. 10) ජාතික ජාලයට සම්බන්ධ කිරීම.<br>• මෙම ව්‍යාපෘතියේ කටයුතු සිදු කෙරෙමින් පවත්නා අතර ඇස්තමේන්තුගත පිරිවැය ශ්‍රී ලං.රු.මි. 147.9කි. |
| **කැළණිතිස්ස කි.වෝ. 132 වායු වෙනුරූ වහරූ වාරන ව්‍යාප්ති කටයුත්ත** | • කැළණිතිස්ස නව වායු ටර්බයින ව්‍යාපෘතිය (KNGTP) යටතේ සවි කරන ලද වායු ටර්බයින තුනක් (03) සම්බන්ධ කිරීම. මෙම ව්‍යාපෘතියේ කටයුතු සිදු වෙමින් පවත්නා අතර, ඇස්තමේන්තුගත පිරිවැය ශ්‍රී ලං.රු.මි. 465කි. |
| **කළුතර කොටුමා උපපොළෙහි කි.වෝ. 33 පෝෂක රාක්ක ඉදිකිරීම** | • මෙම ව්‍යාපෘතියේ කටයුතු සිදු වෙමින් පවත්නා අතර, ඇස්තමේන්තුගත පිරිවැය ශ්‍රී ලං.රු.මි. 35කි. |

# ව්‍යාපෘති අංශය

### සම්ප්‍රේෂණ මාර්ග ඉදිකිරීමේ ව්‍යාපෘති (TLCP) ඒකකය

2020 වසර තුළ සිදුකරන ලද ඉදිකිරීම් කටයුතු පහත දක්වා ඇත:

| කාර්යය | විස්තරය / තත්ත්වය |
|---|---|
| **බදුල්ල - මැදගම කි.වෝ. 132 ද්විත්ව පරිපථ, සීබ්‍රා සම්ප්‍රේෂණ මාර්ගය නැවත ඉදි කිරීම** | • බදුල්ල කොටුමා උපපොළේ සිට ඉඟිනියාගල විදුලි බලාගාරය දක්වා කි.වෝ. 132 තනි පරිපථ සම්ප්‍රේෂණ මාර්ගය 1963දී ගොඩනගන ලදී.<br>• දැනට පවත්නා බදුල්ල - ඉඟිනියාගල කි.වෝ. 132 සම්ප්‍රේෂණ රැහැන් (Oriole) විදුලිය ගෙන යාමේ ධාරිතාවය හා විශ්වසනීයත්වය වැඩිදියුණු කරනු පිණිස, තනි පරිපථ සම්ප්‍රේෂණ මාර්ගය 1963දී ඉදි කරන ලදී. බදුල්ල - මැදගම කි.මී. 32.5ක් වූ කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ග කොටස ද්විත්ව පරිපථ, සීබ්‍රා සම්ප්‍රේෂණ මාර්ගයක් සහිතව නැවත ඉදි කිරීමට යෝජනා කරන ලදී.<br>• ඉදිකිරීම් 2020 ජුනි මාසයේදී අවසන් කරන ලද අතර, උමා ඔය සම්ප්‍රේෂණ මාර්ගය හා සම්බන්ධිතව ක්‍රියාත්මක කුලුණු තුනෙහි කටයුතු අවසන් වූ පසු බලශක්ති ගැන්වීමට නියමිතය. |
| **වගවත්ත අත්තිවාරම ඉදි කිරීම හා කුලුණ ඉදි කිරීම** | • යෝජිත වගවත්ත කොටුමා උපපොළ පන්නිපිටිය / මතුගම - හොරණ කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගයට අන්තර් සම්බන්ධ කරනු පිණිස කුලුණක් ඉදි කරන ලදී. |
| **අතුරුගිරිය - පාදුක්ක කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගය සඳහා කුලුණු දෙකක් ඉදි කිරීම** | • ඉදිකිරීම් කටයුතු 2020 වසර අවසානය වනවිට අවසන් කෙරිණි. |

### සම්ප්‍රේෂණ නිර්මාණ හා පරිසර ශාඛාව

සම්ප්‍රේෂණ නිර්මාණ ඒකකය හා පරිසර ඒකකය මෙම ශාඛාවේ විෂය පථය යටතේ ක්‍රියාත්මක වේ.

#### සම්ප්‍රේෂණ නිර්මාණ ඒකකය

ඒකකය විසින් 2020 වසර තුළ සිදුකරන ලද කාර්යයන් පහත සාරාංශගත කර ඇත:

- පහත සඳහන් ව්‍යාපෘති සඳහා ටෙන්ඩර් ලේඛන සැකසීම අවසන් කොට ඇත:
  - හරිත විදුලිබල සංවර්ධන හා බලශක්ති කාර්යක්ෂමතා ප්‍රවර්ධන ආයෝජන වැඩසටහන් ව්‍යාපෘතිය (GPD&EEIPP) - අදියර 2 - පැකේජය 8, A කොටස හා B කොටස
  - විදුලිබල පද්ධති විශ්වසනීයත්වය බලගැන්වීමේ ව්‍යාපෘතිය (PSRSP) පැකේජය 2, A කොටස හා පැකේජය 3
- විදුලිබල පද්ධති විශ්වසනීයත්වය බලගැන්වීමේ ව්‍යාපෘතිය - පැකේජය 3,4 හා 5 ට අදාළ සැපයුම් ණය යෝජනාක්‍රමය සඳහා වූ කෙටුම්පත් ටෙන්ඩර් ලේඛන සැකසීමේ කටයුතු අවසන් කෙරිණි.
- විදුලිබල පද්ධති විශ්වසනීයත්වය බලගැන්වීමේ ව්‍යාපෘතිය - පැකේජය 1B හා 2B සඳහා වූ ආසියානු සංවර්ධන බැංකු මාර්ගෝපදේශ ප්‍රකාර කෙටුම්පත් ටෙන්ඩර් ලේඛන සැකසීම් කාර්යය අවසන් කෙරිණි.
- පහත සඳහන් ව්‍යාපෘති යටතේ ඉදිරිපත් කරන ලද සැලසුම් සඳහා සැලසුම් සමාලෝචන සිදු කරන ලදී.
  - පිවිතුරු බලශක්ති හා ජාල කාර්යක්ෂමතා ප්‍රවර්ධන ව්‍යාපෘතිය (CE)NEIP)-අදියර 1, අදියර 2 හා අදියර 3
  - හරිත විදුලිබල සංවර්ධන හා බලශක්ති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන් ව්‍යාපෘතිය - අදියර 1 - 2 කොටස - B1 කැබැල්ල
  - උමා ඔය ජල විදුලි ව්‍යාපෘතිය - කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගය
  - හරිත විදුලිබල සංවර්ධන හා බලශක්ති කාර්යක්ෂමතා ප්‍රවර්ධන ආයෝජන වැඩසටහන් ව්‍යාපෘතිය - අදියර 1 - අදියර II - පැකේජය 3: කොටස A2 හා කොටස B
  - පුනර්ජනනීය බලශක්ති අවශෝෂණ සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය (REATDP)
  - හබරණ - වේයන්ගොඩ සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය
  - ජාතික සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ ජාල සංවර්ධන හා කාර්යක්ෂමතා ප්‍රවර්ධන ව්‍යාපෘතිය (NTDND) EIP) පැකේජය I, පැකේජය II හා පැකේජය III
  - කොළඹ වරාය නගරය සංවර්ධන ව්‍යාපෘතිය
  - මන්නාරම සුළං ගොවිපල සංවර්ධන ව්‍යාපෘතිය
  - විදුලි සැපයුම්හි විශ්වසනීයත්වය ප්‍රවර්ධනය සඳහා සහාය දැක්වීමේ ව්‍යාපෘතිය (SESRIP) - කොටස A1 හා කොටස A2
- කොවිඩ් - 19 වසංගතය හේතුකොට පවත්වාගත නොහැකිවූ තරාපැවි හා පරිවරණ කම්බි කට්ටල අටක් වෙනුවෙන් මාර්ගගතව කර්මාන්තශාලා පිළිගැනීම් පරීක්ෂණ පවත්වනු ලැබීය.
- කි.වෝ. 132/ කි.වෝ. 220 භූගත යොත් සඳහා නව පිරිවිතරයක් සකසන ලදී.
  - කෙරවළපිටිය - කොටුමා උපපොළ "L" - දෙවන යොත ස්ථාපනය වෙනුවෙන් ඉංජිනේරු වාර්තාවක් සකස් කරන ලදී.
  - නොරොච්චෝලේ කි.වෝ. 245 වායු වෙනුරූ වහරු වාරනයෙහි 1.5 තඩන යෝජනාක්‍රමය සඳහා සැලසුම් කටයුතු සිදු කරන ලදී.
  - වේයන්ගොඩ - තුල්හිරිය කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගය, බියගම - පන්නිපිටිය මාර්ගය සඳහා පැතිකඩ සමීක්ෂණ

# ව්‍යාපෘති අංශය

කටයුතුද, මීරිගම කොටුමා උපපොළ, කොටදෙණියාව, නොරොච්චෝලේ හා තුල්හිරිය කොටුමා උපපොළයන් සඳහා සවිස්තරාත්මක සමීක්ෂණද සිදු කරන ලදී.

- මහජන අවශ්‍යතා සඳහා දැනට පවත්නා සම්ප්‍රේෂණ මාර්ග වෙනුවෙන් ආරක්ෂණ නිෂ්කාශන කටයුතු සම්පාදනය කරන ලදී.
- නව පොල්පිටිය, පාදුක්ක හා වේවැල්වත්ත කොටුමා උපපොළයන් මෙහෙවරෙහි යෙදවීම හා බලශක්ති ගැන්වීම සඳහා සහාය ලබාදෙන ලදී.

## පරිසර ඒකකය

ලං.වි.ම. විසින් සිදු කරනු ලබන සංවර්ධන ව්‍යාපෘතිවලට අදාළ පරිසරය හා සම්බන්ධ කටයුතු වෙනුවෙන් පරිසර ඒකකය කේන්ද්‍රීය ලක්ෂ්‍යය වේ. පරිසර ඒකකයේ ප්‍රධාන වගකීම් අතරට ලං.වි.ම. හි නව සම්ප්‍රේෂණ හා ජනන ව්‍යාපෘති සඳහා පරිසර අනුමැති ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම, ජාතික පාරිසරික පනත (NEA) මෙන්ම (අදාළ වන්නේ නම්) අරමුදල් සපයන නියෝජිතායනයන්හි මාර්ගෝපදේශද ප්‍රකාර පාරිසරික ආරක්ෂණ ලේඛන සැකසීම, අදාළ පාරිසරික අනුමැතීන් ලබාගැනීම, ආරක්ෂණ කටයුතු ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය සහ ලං..වි.ම. හා එහි පර්ශවකරුවන් සඳහා පාරිසරික දැනුවත්භාවය ලබාදීමේ වැඩසටහන් පැවැත්වීමද ඇතුළත් වේ.

2020 වසර තුළ, විදුලිබල අංශයේ විශ්වසනීයත්වය බලගැන්වීමේ ව්‍යාපෘතිය යටතේ වූ අනු-ව්‍යාපෘති සඳහා පාරිසරික අධ්‍යයනයන් සම්පූර්ණ කොට මධ්‍යම පරිසර අධිකාරිය වෙත ඉදිරිපත් කරන ලදී. පූනරින්හි හා සියඹලාණ්ඩුවේ පුනර්ජනනීය බලශක්ති ජනනය ආශ්‍රිත සම්ප්‍රේෂණ මාර්ග එරිසර ඇගයීම් අවසන් කරන ලද අතර, සුනිත්‍ය බලශක්ති අධිකාරිය හා ආශ්‍රිතව පාරිසරික අධ්‍යයනයන් සිදු කරන ලදී. කෙරවළපිටිය - කිරිඳිවැල කි.වෝ. 400 සම්ප්‍රේෂණ මාර්ගය සඳහා වූ පරිසර බලපෑම් තක්සේරුව සිදුකරන ලදුව මහජන අදහස් වෙනුවෙන් විවෘත කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය වෙත ඉදිරිපත් කරන ලදී. කෙරවළපිටිය - උප L කි.වෝ. 220 භූගත යොත් සඳහා වූ පාරිසරික හා සමාජ බලපෑම් තක්සේරුව ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවේ (AIIB) අරමුදල්කරණය යටතේ ආරම්භ කරන ලදී.

## ආයතනික හා ව්‍යාපෘති සම්බන්ධීකරණ (C&PC) ශාඛාව

මෙම ශාඛාව මගින් ආයතනික කටයුතු ක්‍රියාත්මක කරන අතර, අංශය තුළ ව්‍යාපෘති කටයුතු සම්බන්ධීකරණය කරනු ලබයි.

ආයතනික කටයුතු යටතේ, ප්‍රශස්ත මට්ටමේ පාරිශ්‍රමික සහිතව, ආරක්ෂිත හා සුවදායී සේවා පරිසරයක් තුළ පූර්ණ පුහුණුවක් සහිත, නිසි හැකියාවෙන් යුත්, වගකීමෙන් බැඳී සිටින ඉහළ කාර්ය සාධනයක් සහිතව ක්‍රියාත්මක කළමනාකරණ කාර්ය මණ්ඩලයක් හා සේවා බලකායක් සපයමින් සැම කල්හි නඩත්තු කිරීමේ කාර්යය එය සතුවේ. එය විසින් විවිධ ශ්‍රේණිවලට අයත් විධායක නිලධාරීන් 176 දෙනෙකු හා සේවා නියුක්තිකයන් 540 දෙනෙකු සඳහා සේවා සම්පාදනය කරන ලදී. එය කොන්ත්‍රාත් සේවා නියුක්තිකයන්ද ඇතුළත්ව අංශයේ සේවා නියුක්තිකයන් 716 දෙනෙකුගේ එකතුවක් විය.

ව්‍යාපෘති සම්බන්ධීකරණය යටතේ, නිසි කලට අවසන් කාර්ය පූර්ණත්වයක් ඇතිකර ගැනීම පිණිස ක්‍රියාත්මකව පවත්නා සියලු ව්‍යාපෘති නිසි පරිදි සම්බන්ධීකරණයද එයට අයත් වේ.



මෙහෙයුම් සමාලෝචනය

# වත්කම් කළමනාකරණ අංශය

# වත්කම් කළමනාකරණ අංශය

වත්කම් කළමනාකරණය යනු යටිතල පහසුකම් සංවර්ධන පරිවර්තනයේ කොටසකි. මෙම අංශය එහි ආර්ථික වර්ධනය, සමාජ ප්‍රගමණය හා පාරිසරික සංවර්ධනය සඳහා සුවිශේෂී කාර්ය භාරයක් ඉටු කරයි. මෙම අංශය පහත විස්තර කරන පරිදි ශාඛා පහකින් සමන්විත වේ.

## වත්කම් කළමනාකරණ හා ආයතනික ශාඛාව

වත්කම් කළමනාකරණ හා ආයතනික ශාඛාවේ වගකීම වනුයේ මානව සම්පත ප්‍රශස්ත අයුරින් ප්‍රයෝජනයට ගැනීමෙන් වත්කම් කළමනාකරණ අංශය නිසි පරිදි ක්‍රියාත්මකවන බව සහතික කිරීමයි. සේවක මහතුන්ගේ මානව හිමිකම් හා ආයතනික කටයුතු හැරුණු කොට, ශාඛාව විසින් ලං.වි.ම. වත්කම් කළමනාකරණ කාර්යයන් ඉටු කරනු ලබයි.

ශාඛාවේ මූලික කාර්යයන් වනුයේ ලං.වි.ම. ඉඩම් හා ගොඩනැගිලි වඩා යහපත් ලෙස කළමනාකරණය කරමින් කේන්ද්‍රීය ව්‍යවස්ථාපිත කාර්යයනට බලපෑමක් නොවන පරිදි එම කේන්ද්‍රීය කාර්යයන් හැර සෙසු ප්‍රයෝජනයන් සඳහා පවත්නා සම්පත් හා වත්කම් ප්‍රයෝජනයට ගනිමින් අතිරේක ආදායමක් උපදවා ගැනීමයි.

වසර තුළ ශාඛාව විසින් ඉටු කරනු ලැබූ ප්‍රධාන කාර්යයන් පහත දක්වා ඇත.

- ඉඩම් හා ගොඩනැගිලි දත්ත පදනමට අදාළ වත්කම් ලේඛන සකසා පවත්වාගෙන යන ලදී (වසර තුළ ජනන අංශයෙන් ඉඩම් කට්ටි 786ක්ද, සම්ප්‍රේෂණ අංශයෙන් 5ක්ද, බෙදාහැරීමේ අංශයෙන් 12ක්ද හඳුනා ගන්නා ලදී. ඒ අනුව ජනන අංශයෙන් ලද සමස්ත කට්ටි ප්‍රමාණය 1056ක්ද, සෙසු අංශවලින් ලද කට්ටි ප්‍රමාණය 1008ක්ද වේ).
- සියලු පළාත්වල ඉඩම් හා සම්බන්ධ දත්ත ගබඩා කොට තබාගෙන අවසන් පරිහාරකයාගේ මට්ටමින් ඉඩම් හා සම්බන්ධ දත්ත ගබඩා කිරීමට පහසුකම් සැලසීම සඳහා කැපවූ ජාල පදනම්ගත CEBAssist දත්ත කළමනාකරණ ක්‍රමයක් ස්ථාපනය කරන ලදී. ඉහත පද්ධතියේ ආරම්භක සංවර්ධන අදියරේදී, මැනුම් සැලසුම්, හිමිකම් ලේඛන, තක්සේරු සංඛ්‍යා, ස්ථානය, ඉඩම පරිහරණය කරන්නා ආදී විවිධ දත්ත සහිත ඉඩම් 1031ක් පද්ධතිය තුළ ගබඩා කරන ලදී.
- රජයේ විදුලිබල පවරාගැනීම් දෙපාර්තමේන්තුව වෙතින් කාසල්රී ජලාශ පරිශ්‍රයෙහි ලං.වි.ම. වෙත පවරන ලද ඉඩම්වල මායිම් නැවත සළකුණු කොට බලහත්කාරයෙන් ඉඩම් පරිහරණයනට එරෙහිව ක්‍රියාමාර්ග ගන්නා ලදී.
- කොළොන්නාව ලං.වි.ම. පරිශ්‍රයෙහි හා උකුවෙල විදුලි බලාගාරයෙහි තක්සේරුකරණ කාර්යය අවසන් කරන ලදී. සමස්ත තක්සේරුව ශ්‍රී ලං.රු.බි. 2.6ක් විය. මෙපරිදි ශ්‍රී ලං.රු.බි. 29.2ක් වූ තක්සේරුකරණය සම්පූර්ණ කරන ලද ඉඩම් වත්කම්වල සමුච්චිත එකතුව ලැබේ. බෝවතැන්න විදුලි බලාගාරයේ තක්සේරු කාර්යය සිදු වෙමින් පවතී.
- මාවුස්සාකැලේ ජලාශ පරිශ්‍රයෙහි හා කැළණිතිස්ස විදුලි බලාගාර පරිශ්‍රයෙහි මිනුම් සැලසුම් සකස් කිරීමේ කාර්යය අවසන් කරන ලදී. විමලසුරේන්ද්‍ර විදුලි බලාග ාරයේ හා නෝර්ටන් තටාක ප්‍රදේශ පරිශ්‍රයේ ලං.වි.ම. ඉඩම් වත්කම්වල සීමා මායිම් නැවත නිර්ණය කිරීම නොකඩවා සිදු කෙරිණි.
- ලං.වි.ම. වාහන කළමනාකරණය කරනු පිණිස ලං.වි.ම. වාහන දත්ත පදනම සංවර්ධනය කොට පවත්වාගෙන යන ලදී.
- පාවෙන ඔරු හා බෝට්ටු සේවාවන් පවත්වාගෙන යාම වැනි විනෝදාත්මක කටයුතු හා සංචාරක කර්මාන්තය වෙනුවෙන් ලං.වි.ම. ජල විදුලිබල ජලාශ බදු දෙන ලදී.
- වත්කම් කළමනාකරණ අංශයේ ආයනික කාර්යයන් නොකඩවා සිදු කරන ලදී.



**රූපය A 1: මාවුස්සාකැලේ ලං.වි.ම. පරිශ්‍රයෙහි මිනුම්කරණය**

## පුහුණු ශාඛාව

අඛණ්ඩ ඉගෙනුම් ප්‍රතිපත්තියක් ස්ථාපනය යනු ආයතනයේ අරමුණු සාක්ෂාත් කරගැනීම පිණිස හඳුනාගත් ප්‍රධාන ක්‍රමෝපායකි. ලං.වි.ම. පුහුණු ශාඛාව උපරිම අධ්‍යාපනික සේවා සම්පාදනය වෙනුවෙන් කැපවී සිටින අතර, ආකල්ප සංවර්ධනය නංවාලීමේ කාර්යයට උර දෙන අතර වර්තමාන හා අනාගත අභියෝගයනට මුහුණ දීම සඳහා අවශ්‍යවන කුසලතා හා දැනුම තුළින් සේවා නියුක්තිකයන් සන්නද්ධ කරන්නාවූ පුහුණු අවස්ථාවන් නොකඩවා ලබාදීමේ කාර්යය සිදු කරමින් සිටී. මෙයට අමතරව, මෙම ශාඛාව අපගේ සේවා නියුක්තිකයන්ගේ වටිනාකම් බලගැන්වීම කෙරෙහිද කැපවී සිටී. ඒවා වනුයේ රාජ්‍ය අංශ ප්‍රතිපත්ති මාර්ගෝපදේශ යටතේ ක්‍රියාත්මක වටිනාකම්ය.

2020 වසර අන් කිසිදු වසරකට වඩා වෙනස් වසරක් විය. කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුකොට පුහුණු ශාඛාවට සුවිශේෂී අභියෝගයනට මුහුණ දෙන්නට සිදුවිය. වසංගතයට ප්‍රතිචාර ලෙස, මින් පෙර කිසි දින සිදු නොකළ පරිදි දුරස්ථ හා නම්‍යශීලී ඉගෙනුම් කරා ශාඛාවට මාරු වන්නට සිදුවිය.

කාර්ය මණ්ඩලය විසින් පෙන්වන ලද කැපවීම හේතුකොට, ශාඛාවට එහි පිළියන්දල පුහුණු මධ්‍යස්ථානය විදුලි කාර්මික, කම්බි මාර්ග කරු හා යාන්ත්‍රික ශිල්පී සහ පෑස්සුම්කරු යන තනතුරු සඳහා ජාතික වෘත්තීය සුදුසුකම්වල සිවුවන මට්ටම දක්වාවූ පුහුණුවක්

# වත්කම් කළමනාකරණ අංශය

ඕනෑම අයෙකු වෙත ලබාදීමට හැකි ජාතික මට්ටමේ පුහුණු මධ්‍යස්ථානයක තත්ත්වයට ඔසවා තැබීමට හැකිවිය. මේවන විට පුහුණු ශාඛාව විසින් මෙම පුහුණු මධ්‍යස්ථානය බහු තාක්ෂණික ආයතනයක මට්ටම දක්වා වෙනස් කිරීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී.

ශාඛාවේ විවිධ ඒකකයන්හි කාර්යයන් හා වගකීම් පහත පරිදි වේ:

### තාක්ෂණික පුහුණු ඒකකය

මෙම ඒකකය විසින් ලං.වි.ම. බඳවා ගැනීමේ හා උසස් කිරීමේ යෝජනාක්‍රමය ප්‍රකාර රියැදුරන්, මැදි මට්ටමේ තාක්ෂණික ශ්‍රේණි ඇතුළත් ලං.වි.ම. ක්ෂේත්‍ර සේවා හා පුහුණු ශ්‍රේණිවල සේවා නියුක්තිකයන් සඳහා තාක්ෂණික පුහුණුව හා උසස් වීම් සඳහා අවශ්‍ය පුහුණුවද ලබාදීම, විධායක නිලධාරීන් සඳහා අවශ්‍ය වෘත්තීය සංවර්ධන වැඩසටහන් හා කණිෂ්ඨ විධායක නිලධාරීන්ගේ හා මැදි මට්ටමේ තාක්ෂණික ශ්‍රේණිවල සෙසු පුහුණු අවශ්‍යතා සපුරාලීම, ලිපිකරු හා සමාන්තර ශ්‍රේණිවල සේවා නියුක්තිකයන් හා කාර්යාල සේවක සේවය හැර සියලු සේවා කාණ්ඩයන් සඳහා කාර්ය හුරු කරවීමේ පුහුණු සැසි පැවැත්වීම, බාහිර ආයතන සඳහා තාක්ෂණික පුහුණු වැඩසටහන් සංවිධානය හා බාහිර ආයතන සඳහා පිළියන්දල ලං.වි.ම. කාර්මික විද්‍යාලයේ, කලවාන කාර්මික විද්‍යාලයේ හා කින්නියගුනේ කාර්මික විද්‍යාලයේ සම්පත් ලබාදීම සිදුකරනු ලබයි.

### අභ්‍යන්තර පුහුණු ඒකකය

මෙම ඒකකය විසින් ලං.වි.ම. බඳවා ගැනීමේ හා උසස් කිරීමේ යෝජනාක්‍රමය ප්‍රකාර ලං.වි.ම. ලිපිකරු හා සමාන්තර සේවා, කාර්යාල සේවක සේවය හා ආරක්ෂක සේවයට අදාළ උසස් වීමේ අවශ්‍යතා වෙනුවෙන් පුහුණු සැසි සංවිධානය, හුරු කරවීමේ පුහුණු සංවිධානය, ඉංජිනේරු උපාධි අපේක්ෂකයන්, ඉංජිනේරු ඩිප්ලෝමා අපේක්ෂකයන් හා කාර්මික සිසුන් සඳහා කාර්මික පුහුණු සංවිධානය, සෙසු පිළිගත් දේශීය ආයතන මගින් සේවා නියුක්තිකයන් සඳහා පුහුණු අවස්ථා ලබාදීම සිදුකරනු ලබයි.

### කාසල්රී පුහුණු මධ්‍යස්ථානය

කාසල්රී පුහුණු මධ්‍යස්ථානය විසින් ලං.වි.ම. බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය ප්‍රකාර අභ්‍යාසලාභී කණිෂ්ඨ කාර්මික සහයකයන්, පුහුණුවන කණිෂ්ඨ කාර්මික සහයනයන් හා කණිෂ්ඨ කාර්මික සහයකයන් සඳහා පුහුණු සැසි සංවිධානය කරනු ලබයි. තවද, එය විසින් ලං.වි.ම. සේවා නියුක්තිකයන්, සේවා සම්පාදනායතනයන්හි සේවා නියුක්තිකයන් හා බාහිර පුද්ගලයන් සඳහාද අඛණ්ඩ වෘත්තීය සංවර්ධන (CPD) වැඩසටහන් ගණනාවක් පවත්වනු ලබයි.

### පද්ධති පුහුණු ඒකකය

මෙම ඒකකය විසින් සියලු සේවක ශ්‍රේණිවල ගුණාත්මකභාවය, ඵලදායකත්වය හා පාරිභෝගික සේවා හැකියාවන් වැඩි දියුණු කරනු පිණිස පුහුණු සැසි පැවැත්වීම, ප්‍රථමාධාර හා විදුලි ආරක්ෂාව සම්බන්ධ පුහුණු සැසි සංවිධානය, ජපානයේ එස් 5 ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම හා ජාත්‍යන්තර ප්‍රමිති සහතික මට්ටම් ක්‍රියාත්මක කිරීම සඳහා වූ පුහුණු සැසි පැවැත්වීම සිදු කරනු ලබයි.

ඉංජිනේරුවන්, මධ්‍යම මට්ටමේ තාක්ෂණික සේවා, ලිපිකරු හා සමාන්තර සේවා හා ක්ෂේත්‍ර සේවයද ඇතුළත් සමස්ත සේවා නියුක්තිකයන් 436 දෙනෙකු වෙත බාහිර පුහුණු ආයතන විසින් පවත්වන ලද පුහුණු වැඩසටහන් මගින් සිය කාර්යයනට අදාළ පුහුණුවක් ලබාදෙන ලදී. රටේ සියලු රජයේ විශ්වවිද්‍යාලයන්හි ඉංජිනේරු පීඨවල උපාධි අපේක්ෂකයන් 300 දෙනෙකු හා රජයේ බහු තාක්ෂණික ආයතනයන්හි ඩිප්ලෝමා මට්ටමේ සිසුන් 120 දෙනෙකු වෙත මෙම වසර තුළ ලං.වි.ම. කාර්මික පුහුණුව ලබාදෙන ලදී.

රූපය A 2 : පිළියන්දල කාර්මික විද්‍යාලයේ පවත්වන පුහුණු වැඩසටහන් විස්තර




රූපය A 3 : කාසල්රී කාර්මික විද්‍යාලයේ පවත්වන පුහුණු වැඩසටහන් විස්තර




රූපය A 4 : ප්‍රථමාධාර හා ගිනි ආරක්ෂාව සඳහා පවත්වන ලද පුහුණු වැඩසටහන් විස්තරය



# වත්කම් කළමනාකරණ අංශය

කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුකොට, මෙම වසර තුළ පැවැත්විය හැකිවූ පුහුණු වැඩසටහන් සංඛ්‍යාව 2019 වසර හා සාපේක්ෂව සැලකිය යුතු පහළ මට්ටමක පැවතිණි.

පවත්නා පුහුණු අවශ්‍යතා හා ඉදිරියට එන්නාවූ තාක්ෂණයන් සැලකිල්ලට ගනිමින් නව පුහුණු වැඩසටහන් හඳුන්වා දීම මගින් මධ්‍යස්ථානයේ ඵලදායකත්වය වැඩිදියුණු කරන ලදී. සේවයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කරනු පිණිස යටිතල පහසුකම් තවදුරටත් සංවර්ධනය කරන ලදී.

## බාහිර පුහුණු ඒකකය

මෙම ඒකකය මගින් ලං.වි.ම. සේවා නියුක්තිකයන් සඳහා විදේශීය පුහුණු සැසි සඳහා පහසුකම් සලසනු ලබයි.

මෙම වසරේ රටතුළ පවත්නා කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුකොට, බොහෝ පුහුණු, සම්මන්ත්‍රණ හා පූර්ව නැවිතොග පරීක්ෂා කිරීම් මාර්ගගතව සිදුවිය.

**රූපය A 5 : පවත්වන ලද විභාග පිළිබඳ විස්තර**




## විභාග ඒකකය

මෙම ඒකකය විසින් හැකි උපරිමයෙන් විභාග ක්‍රියාවලියේ රහස්‍යභාවය හා ගුණාත්මකභාවයද පවත්වා ගනිමින් වරලත් පිරිස් කළමනාකරණ ආයතනය (CIPM)" ජාතික වෘත්තීය පුහුණු ආයතනය (NVTI) හා මොරටුව විශ්වවිද්‍යාලය වැනි බාහිර ආයතනයන්හිද සහාය සහිතව බාහිර බඳවාගැනීම, අභ්‍යන්තර බඳවා ගැනීම හා උසස් වීම් සඳහා වූ විභාග සංවිධානය කොට

**රූපය A 6 : පවත්වන ලද විභාග පිළිබඳ විස්තර**




පවත්වනු ලබයි. වසර ආරම්භයේදී සකස් කරන ලද දින දර්ශනයට අනුව විභාග පැවැත්වීමට බාධා පමුණුවන පරිදි වසර තුළ අත් විඳින්නට සිදුවූ වසංගත තත්ත්වය හේතුකොට ලබාගත් ප්‍රගතිය අඩු මට්ටමක පැවතිණි.

2020 වසර තුළ ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන් 12 දෙනෙකු හට ව්‍යාපාර පරිපාලනපති හා විද්‍යාපති පාඨමාලා හැදෑරීම සඳහාද, යටත් සේවා නියුක්තිකයන් 08 දෙනෙකු හට ඩිප්ලෝමා හා සමාන මට්ටමේ පාඨමාලා හැදෑරීම සඳහාද අනුමැතිය ලබාදෙන ලදී.

## වැඩපොළ හා උපකාරක සේවා ශාඛාව

වැඩපොළ හා උපකාරක සේවා ශාඛාව විදුලි බලාගාර ඒකකය, විදුලි සෝපාන ඒකකය, වායු සමීකරණ හා ශීතකරණ ඒකකය හා මධ්‍යම වැඩපළ හා ගරාජය යන නමින් යුත් මෙහෙයුම් ඒකකයන් හතරකින් සමන්විත වේ.

## විදුලි බලාගාර ඒකකය

විදුලි බලාගාර ඒකකය පොරොත්තු ජනන යන්ත්‍ර නඩත්තුව, ඩීසල් ජනන යන්ත්‍ර අලුත්වැඩියාව /ප්‍රතිසංස්කරණය, ලං.වි.ම., පුද්ගලික ආයතන, ජනාධිපති ආරක්ෂක අංශය හා අග්‍රාමාත්‍ය ආරක්ෂක අංශය යන ආයතනයන්හි අවශ්‍යතාවයන් සඳහා ඩීසල් ජනන යන්ත්‍ර කුලියට ලබාදීම යන කාර්යයන්හි නියැළේ. වසර තුළ ඉටු කරන ලද කාර්යයන් පිළිබඳ සාරාංශයක් පහත දී ඇත:

| කාර්ය කාණ්ඩය | කාර්ය සංඛ්‍යාව | වටිනාකම (ශ්‍රී ලං.රු.මි.) |
|---|---|---|
| පොරොත්තු ඩීසල් ජනන යන්ත්‍ර වාර්ෂික නඩත්තුව | 94 | 103 |
| ඩීසල් ජනන යන්ත්‍ර අලුත්වැඩියාව / ප්‍රතිසංස්කරණය | 47 | 73 |
| ලං.වි.ම. අවශ්‍යතාවයන් සඳහා ඩීසල් ජනන යන්ත්‍ර කුලියට ලබාදීම | 38 | 11 |
| පුද්ගලික අංශ, ජනාධිපති ආරක්ෂක අංශය, අග්‍රාමාත්‍ය ආරක්ෂක අංශය යන අංශයන්හි අවශ්‍යතාවයන් සඳහා ඩීසල් ජනන යන්ත්‍ර කුලියට ලබාදීම | 67 | 61 |
| සෙසු කාර්යයන් | 18 | 0.6 |
| එකතුව | | **248.6** |

## වායු සමීකරණ හා ශීතකරණ ඒකකය

වායු සමීකරණ හා ශීතකරණ ඒකකය මගින් දිවයින පුරා පිහිටි රජයේ ආරෝග්‍ය ශාලා, රජයේ ආයතන, ලං.වි.ම. මෙහෙයුම් ඒකක හා විදුලි බලාගාරයන්හි ස්ථාපනය කර ඇති මධ්‍යගත හා කොටස් බෙදුම් සහිත වායු සමීකරණ ඒකක, ශීත කාමර මෙන්ම මෘත ශරීරාගාර සිසිලනයන් සඳහාද අවශ්‍ය සියලු සේවා හා නඩත්තු කටයුතු සම්පාදනය කරනු ලබයි.

| කාර්ය කාණ්ඩය | බාහිර | | අභ්‍යන්තර | |
|---|---|---|---|---|
| | කාර්ය සංඛ්‍යාව | වටිනාකම ශ්‍රී ලං.රු.මි. | කාර්ය සංඛ්‍යාව | වටිනාකම ශ්‍රී ලං.රු.මි. |
| වාර්ෂික නඩත්තුව | 33 | 243.6 | 283 | 54.7 |
| නව ස්ථාපනයන් | - | - | 35 | 23.0 |
| අලුත්වැඩියා හා ප්‍රතිසංස්කරණ | 6 | 1.6 | 29 | 3.2 |
| **එකතුව** | **39** | **245.2** | **347** | **80.9** |

# වත්කම් කළමනාකරණ අංශය

2020 වසර තුළ සිදුකරන ලද කාර්යයනට අදාළ සමස්ත වටිනාකම පහත සටහන්ගත කර ඇත:



**රූපය A 7: මහනුවර ජාතික රෝහලේ ප්‍රතිසංස්කරණ කටයුතු**

## විදුලි සෝපාන ඒකකය



**රූපය A 8: ලක්විජය විදුලි බලාගාරයේ අංක 02 දරන බොයිලේරුවේ සෝපානයේ ඇදුම් මෝටරය මාරු කිරීමේ කටයුතු**

විදුලි සෝපාන ඒකකය විසින් දිවයින පුරා පිහිටි රජයේ රෝහල්, රජයේ ආයතන, ලං.වි.ම. මෙහෙයුම් ඒකක හා විදුලි බලාගාරයන්හි සවිකර ඇති ඇදීම් වර්ගයේ හා හයිඩ්‍රෝලික් වර්ගයේ සෝපාන

| කාර්ය කාණ්ඩය | බාහිර | | අභ්‍යන්තර | |
|---|---|---|---|---|
| | සංඛ්‍යාව | වටිනාකම (ශ්‍රී ලං.රු.මි.) | සංඛ්‍යාව | වටිනාකම (ශ්‍රී ලං.රු.මි.) |
| වාර්ෂික නඩත්තුව | 20 | 23.6 | 9 | 3.7 |
| අලුතින් සවි කිරීම | - | - | 1 | 7.0 |
| අලුත්වැඩියා හා ප්‍රතිසංස්කරණ | 4 | 4.2 | 3 | 0.8 |
| වෙනත් (පරීක්ෂණ හා උපදේශන) | 3 | 0.5 | - | - |
| **එකතුව** | **27** | **28.3** | **13** | **11.5** |

සඳහා අවශ්‍ය සියලු සේවා සපයනු ලබයි. තවද, ලං.වි.ම. ප්‍රධාන කාර්යාලයේ පිහිටි පැටර්නෝස්ටර් වර්ගයේ සෝපානයද එමගින් නඩත්තු කරනු ලබයි.

වසර තුළ සිදුකරන ලද කාර්යයන්හි සමස්ත ඇස්තමේන්තුගත පිරිවැය පහත සටහන්ගත කර ඇත.

## මධ්‍යම වැඩපල හා ගරාජ ඒකකය

වසර තුළම මධ්‍යම වැඩපල හා ගරාජ ඒකකය විසින් අවසන් කරන ලද කාර්යයන් සංඛ්‍යාව පහත දක්වා ඇත.

| කාර්ය කාණ්ඩය | කාර්ය විස්තරය | සංඛ්‍යා | වටිනාකම (ශ්‍රී ලං.රු.මි.) |
|---|---|---|---|
| යාන්ත්‍රික | ලං.වි.ම. මූලස්ථානයේ වෝල්ටීයතාවය වැඩි කිරීමේ තරාපැවි සිසිලන පංකා ආවරණ, ප්‍රදර්ශක පුවරුවේ වානේ ආවරණය, රවුටර පරිමන්දක හා ලෝකඩ පෙල්ටන් රෝද ස්මාරකය පිරිසැකසුම්කරණය | 04 | 0.82 |
| විදුලි | සපුගස්කන්ද විදුලි බලාගාරයේ සිසිලන පංකා මෝටර නැවත එතීම | 33 | 3.20 |
| නිෂ්පාදන | බෙදාහැරීමේ අංශ සඳහා D කරවර, T අල්ලු නිෂ්පාදනය | 16 | 11.9 |
| වාහන අළුත්වැඩියා | ලං.වි.ම. වාහන අලුත්වැඩියා, පින්තාරු හා ටින්කරින් කටයුතු | 67 | 7.24 |
| වාහන සේවාකරණ | ලං.වි.ම. වාහන සේවාකරණය | 66 | 1.62 |
| වෙනත් | ස්වයංක්‍රීය පොම්ප පාලන පැනලය අලුත්වැඩියා කිරීම | 01 | 0.46 |
| **එකතුව** | | | **25.24** |

මෙම ඒකකය විසින් ලං.වි.ම. ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලට පිවිසෙන ස්ථානයේ ස්මාරකයක් ලෙස පෙල්ටන් ධාවකයක් සවි කිරීමේ කාර්යය භාරගන්නා ලදී.

ලක්ෂපාන විදුලි බලාගාරයෙන් ඉවත් කරන ලද පෙල්ටන් ධාවකයක් වැඩපල වෙත ගෙන එන ලදුව, යෝග්‍ය නැංවුම් වැඩ පිළිවෙලයන් පිරිසැකසුම්කරණය කරන ලදී. එය 2020.12.03 දින ලං.වි.ම. ප්‍රධාන කාර්යාලයේ සවි කරන ලදී.



**රූපය A 9: ලං.වි.ම. ප්‍රධාන කාර්යාලයේ සවිකර ඇති පෙල්ටන් ධාවකය**

# වත්කම් කළමනාකරණ අංශය

## සිවිල් වැඩ හා ගොඩනැගිලි ශාඛාව (CW & B)

සිවිල් වැඩ හා ගොඩනැගිලි ශාඛාව නව ගොඩනැගිලි ඉදිකිරීම, පවත්නා ගොඩනැගිලි/කාර්යාල ප්‍රතිසංස්කරණය/විශාලනය, මූලස්ථාන ගොඩනැගිල්ල හා ලං.වි.ම.ට අයත්ව රටපුරා පවත්නා සංචාරක බංගලාවන්හිද නඩත්තු කටයුතු සිදු කිරීමෙහි නිරතව සිටී. මෙම ශාඛාව නවීනතම මෘදුකාංග භාවිතයෙන් ව්‍යුහාත්මක සැලසුම් හා ඒ ආශ්‍රිත ඇඳීම් කටයුතු සිදු කිරීමේ හැකියාවක් සහිත එයටම අයත් ආකෘති සැලසුම් ඒකකයකින්ද සමන්විත වේ. සිවිල් වැඩ හා ගොඩනැගිලි ශාඛාවට අනුයුක්තව පවත්නා පහසුකම් කළමනාකරණ ඒකකය ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ හා සංචාරක බංගලාවන්හිද නඩත්තු කටයුතු සිදු කිරීමේ වගකීම දරයි.

| විස්තරය | වටිනාකම (ශ්‍රී ලං.රු.මි.) |
|---|---|
| අනුරාධපුර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (උතුරු මැද පළාත) කාර්යාලයේ ඉදිකිරීමේ හා අභ්‍යන්තර වැඩ | 232 |
| පුත්තලම ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයේ ඉදිකිරීම් | 65 |
| ජා-ඇල පිහිටි ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු කාර්යාලයේ විශාල කිරීමේ හා ප්‍රතිසංස්කරණ කටයුතු | 48 |
| ලං.වි.ම. ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ ප්‍රති-සැකසුම් කටයුතු | 143 |
| ගොඩකවෙල පාරිභෝගික සේවා මධ්‍යස්ථානය ඉදිකිරීම | 38 |
| වේයන්ගොඩ පාරිභෝගික සේවා මධ්‍යස්ථාන ගොඩනැගිල්ල නවීකරණය | 17 |
| ආනියාකන්ද මධ්‍යම වැඩපල හා ගරාජයේ අලුත්වැඩියා කටයුතු | 8 |
| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඌව) කාර්යාලය නවීකරණය | 10 |
| හාලි ඇල පළාත් ගබඩාව නවීකරණය | 28 |
| කොළොන්නාව ආරක්ෂක මූලස්ථානය අලුත්වැඩියාව | 11 |



**රූපය A 10: අනුරාධපුර නි.සා. (උ.මැ.ප.) කාර්යාලය ඉදිකිරීම හා අභ්‍යන්තර කටයුතු**



**රූපය A 11: ජා-ඇල ප්‍රාදේශීය කාර්යාලය නවීකරණයෙන් අනතුරුව**

වසර තුළ සම්පූර්ණ කරන ලද කාර්යයන් පිළිබඳ තත්ත්වය පහත පරිදි වේ.

## වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂණ ශාඛාව

සිදුවන හදිසි අනතුරු හා ආපදා සංඛ්‍යාව අවම කිරීම සඳහා සේවා නියුක්තිකයන් අතර ආරක්ෂිත සේවා පරිසරයක් හා සෞඛ්‍යය හා ආරක්ෂාව පිළිබඳ දැනුවත්භාවයක් ලබාදෙන බවට සහතික වෙමින් සංවිධානය තුළ ආරක්ෂක සංස්කෘතිය වැඩිදියුණු කිරීමේ අරමුණින් 2015 වර්ෂයේදී ලං.වි.ම. තුළ වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂක (OH&S) ශාඛාව පිහිටුවන ලදී.

2020 වසර තුළ, ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලයේ හා ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි සේවකයන් 1394 දෙනෙකු වෙනුවෙන් වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂක වැඩසටහන් 35ක් පවත්වන ලද අතර විදුලි බලාගාර කාර්ය මණ්ඩලයේ 270 දෙනෙකු වෙනුවෙන් වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂක වැඩසටහන් 07ක් පවත්වන ලදී.

දිනපතා රාජකාරි කටයුතු තුළ පවත්වන තීරණාත්මක කටයුතු හා සම්බන්ධ ආරක්ෂක පැතිකඩයන් පිළිබඳව සේවා නියුක්තිකයන් වෙත අධ්‍යාපනයක් ලබාදීමේ අවශ්‍යතාවය ශාඛාව විසින් හඳුනාගෙන ඇත. වඩාත් යහපත් ආරක්ෂක පිළිවෙත් සන්නිවේදනය කිරීමේ විධික්‍රමයක් වශයෙන්, ශාඛාව විසින් කලින් කලට සේවා නියුක්තිකයන් අතර ආරක්ෂාව පිළිබඳ නිවේදන පත්‍රිකා පළ කරනු ලබයි. ආරක්ෂක නිවේදන පත්‍රිකාවේ තුන්වන වෙළුම 2020 වසර තුළ පළ කොට බෙදා හරින ලදී.

ලං.වි.ම. සේවා නියුක්තිකයන් සඳහා ආරක්ෂිත සේවා ස්ථානයක් සහතික කරනු පිණිස ආරක්ෂක විගණනයන් සිදු කිරීමේ කාර්යය ශාඛාව වෙත පවරා ඇත. එහි පළමු පියවර වශයෙන්, ක්ෂේත්‍ර සේවකයන් හා පොදු ජනතාව වෙත හදිසි අනතුරු ඇතිකළ හැකි ප්‍රමාද දෝෂයන් හඳුනාගනු පිණිස රට පුරා විහිදි ප්‍රාථමික උපපොළ හා අටළු අංගන පරීක්ෂා කිරීමට ශාඛාව විසින් ක්‍රියාමාර්ග ගෙන ඇත. වසර තුළ පවත්වන ලද මෙම පරීක්ෂාවන් පිළිබඳ විස්තර පහත දී ඇත:

| අංශය | පරීක්ෂා කරන ලද ප්‍රාථමික උපපොළ සංඛ්‍යාව | පරීක්ෂා කරන ලද අටළු අංගන සංඛ්‍යාව | පරීක්ෂා කරන ලද පාරිභෝගික සේවා මධ්‍යස්ථාන සංඛ්‍යාව |
|---|---|---|---|
| බෙදාහැරීමේ අංශය 1 | 07 | - | - |
| බෙදාහැරීමේ අංශය 2 | 17 | 06 | - |
| බෙදාහැරීමේ අංශය 3 | 04 | - | 01 |
| බෙදාහැරීමේ අංශය 4 | 05 | 01 | 01 |
| **එකතුව** | **33** | **07** | **02** |

තවද, හදිසි අනතුරුවලින් නිදහස්, ආරක්ෂිත කාර්ය පරිසරයක් හා සෞඛ්‍ය සම්පන්න කාර්ය බලකායක් ඇති කරනු පිණිස ශාඛාව විසින් ලං.වි.ම. තුළ ප්‍රධාන කාර්ය භාරයක් ඉටු කිරීමට සූදානම්ව සිටී. හදිසි අනතුරු සටහන් පිළිබඳ සාරාංශයක් පහත දී ඇත.

# වත්කම් කළමනාකරණ අංශය

රූපය A 12 : හදිසි අනතුරු සාරාංශය




## ආරක්ෂක අංශය

ජනන, සම්ප්‍රේෂණ, බෙදාහැරීමේ හා වත්කම් කළමනාකරණ අංශයන්හි සියලු සංවේදී ස්ථානයන්හි ජීවිත හා දේපළවල ආරක්ෂාව සම්බන්ධ වගකීම ලං.වි.ම. සතුවේ. පුද්ගලික ආරක්ෂක සේවා මෙන්ම සිවිල් ආරක්ෂක සේවාවනටද අනුයුක්ත ආරක්ෂක නිලධාරීන් ලං.වි.ම. ඇතැම් පරිශ්‍රයන් තුළ දීප ව්‍යාප්ත මට්ටමින් අනුයුක්ත කොට ඇත. ඔවුන්ද ලං.වි.ම. ආරක්ෂක අංශය මගින් අධීක්ෂණය හා නිරීක්ෂණය කරනු ලබයි.

අවි ආයුධ හැසිරවීම, වෙඩි තැබීම, ගිනි ආරක්ෂාව, මුදල් පරිවාර හා ප්‍රභූ පරිවාර රාජකාරි, ප්‍රථමාධාර, ආපදා අවස්ථාවන්හි පුද්ගලයන් එම ස්ථානයෙන් ඉවත් කිරීමේ පුහුණු, නායකත්ව හා කළමනාකරණ පුහුණු සම්බන්ධයෙන් 2020 වසර තුළ ආරක්ෂක නිලධාරීන් වෙත පුහුණු අවස්ථා ලබාදෙන ලදී.

වසර තුළ පවත්වන ලද පුහුණු වැඩසටහන් සාරාංශයක් පහත දී ඇත.

| වැඩසටහන | සහාගිවූවන් සංඛ්‍යාව |
|---|---|
| ජීව උණ්ඩ යොදා වෙඩි තැබීමේ පුහුණුව | 765 |
| වෘත්තීය සෞඛ්‍යය හා ආරක්ෂාව | 200 |
| අලුතින් උසස් කරන ලද ආරක්ෂක නිලධාරීන් සඳහා වූ පුහුණු වැඩසටහන් | 11 |
| ආරක්ෂක නිලධාරී II A මට්ටම සඳහා පුහුණු වැඩසටහන් | 31 |



මෙහෙයුම් සමාලෝචනය

# ආයතනික ක්‍රමෝපාය අංශය

# ආයතනික ක්‍රමෝපාය අංශය

ආයතනික ක්‍රමෝපාය අංශය යනු ලං.වි.ම. ආයතනික අරමුණු සාක්ෂාත් කරගනු පිණිස ක්‍රමෝපාය ගොඩනගා ක්‍රියාත්මක කිරීම සඳහා වූ සම්බන්ධීකරණ ආයතනයයි. අතිරේක සාමාන්‍යාධිකාරීවරයෙකුගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක මෙම අංශය ව්‍යාපාර හා මෙහෙයුම් ක්‍රමෝපාය, ආයතනික ක්‍රමෝපාය හා නියාමන කටයුතු, ක්‍රියාකාරී ක්‍රමෝපාය හා කාර්යක්‍රම ප්‍රවර්ධන, තොරතුරු තාක්ෂණ (IT) හා පර්යේෂණ සහ සංවර්ධන නමින් යුත් ශාඛා පහකින් සමන්විත වේ. මේ එක් එක් ශාඛාවක් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයෙකුගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක වේ. මෙයට අමතරව, ලං.වි.ම. වෙනුවෙන් ව්‍යාවසාය සම්පත් සැලසුම්කරණයක් ක්‍රියාත්මක කරනු පිණිස ව්‍යාපෘති අධ්‍යක්ෂවරයෙකුගේ ප්‍රධානත්වයෙන් ආයතනික ක්‍රමෝපාය අංශයේ විෂය පථය යටතේ ව්‍යාපෘතියක්ද ක්‍රියාත්මක වේ. 2020 වසර තුළ එක් එක් ශාඛාවේ කාර්ය සාධනයන් මෙහි දක්වා ඇත.

## ව්‍යාපාර හා මෙහෙයුම් ක්‍රමෝපාය ශාඛාව

ව්‍යාපාර හා මෙහෙයුම් ක්‍රමෝපාය ශාඛාව (B&OS) මූලික වශයෙන් ලං.වි.ම. අත්‍යවශ්‍ය ව්‍යාපාර හා මෙහෙයුම් කටයුතුවලට අදාළ ක්‍රමෝපාය සකස් කිරීමේ වගකීම දරයි. ආයතනික ප්‍රතිරූපය ගොඩනගා ප්‍රවර්ධනය කිරීමද ව්‍යාපාර හා මෙහෙයුම් ක්‍රමෝපාය ශාඛාවේ විෂය පථය යටතට වැටේ. තවද, ආයතනික සැලැස්ම (2019-2023) තුළ ප්‍රකාශිත ක්‍රමෝපාය ක්‍රියාත්මක කිරීමට අදාළව ආයතනයේ කාර්ය සාධනය අධීක්ෂණයද ප්‍රධාන කටයුතු අතර වේ.

ආයතනයේ අරමුණු කවර ප්‍රමාණයකින් සාක්ෂාත් කරගනු ලැබ ඇත්තේද යන්න ලං.වි.ම. කළමනාකාරිත්වයට මැන ගැනීමට හැකිවනු පිණිස 2020 වසර තුළ කාර්තුමය වශයෙන් අරමුණු (I - මට්ටම) සඳහා ප්‍රධාන කාර්ය සාධන දර්ශකයනට අදාළ මෙහෙයුම් සමාලෝචනය සිදුකරන ලදී.

ආයතනික ප්‍රතිරූපය ගොඩනගා ස්ථිරසාරව පවත්වාගෙන යාමට අදාළ කටයුතු වෙනුවෙන් කැපවූ ක්‍රමෝපාය සන්නිවේදන ඒකකයක් (SCU) ඇති කිරීමේ යෝජනාවක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත. එය ශාඛාවේ විෂය පථය හා අනුගත වේ. ලක්විජය විදුලි බලාගාරයේ මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් මාධ්‍යවේදීන් විසින් පළ කරන ලද සාවද්‍ය අදහස් පැවති බැවින්, මාධ්‍යවේදීන් අතර පැවති එම සාවද්‍ය සංකල්පනාවන් ඉවත් කිරීමේ අදහසින් 2020 මාර්තු මස 04වන දින ව්‍යාපාර හා මෙහෙයුම් ක්‍රමෝපාය ශාඛාව විසින් ලක්විජය විදුලි බලාගාරය වෙත 'මාධ්‍යවේදීන්ගේ චාරිකාවක්' සංවිධානය කරන ලදී. ලක්විජය විදුලි බලාගාරයේ කළමනාකරිත්වය විසින් ඵලදායක මාධ්‍ය හමුවක් පවත්වන ලදී. මුද්‍රිත, විද්‍යුත් හා වෙබ් අඩවිගත මාධ්‍ය තුළ ධනාත්මක මාධ්‍ය ආවරණයක් ලබාදෙන ලදී.

ලං.වි.ම. 51වන සංවත්සරය හා සමගාමීව, ආයතනික ප්‍රතිරූපය නංවාලනු පිණිස සාකච්ඡා හා වාර්තා වැඩසටහන් පෙළක් නිෂ්පාදනය කොට ශ්‍රී ලංකා රූපවාහිනි සංස්ථාව හා ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව හරහා විකාශනය කරවන ලදී. විශේෂඥතාවයක් සහිත ලං.වි.ම. නිලධාරීන් විසින් පහත සඳහන් වැඩසටහන් හරහා සිය දැනුම බෙදා ගන්නා ලදී.

- ශ්‍රී ලංකා රූපවාහිනි සංස්ථාවේ "Morning Show" වැඩසටහන මගින් 2020 ඔක්තෝබර් මස 02වන දින ලක්විජය විදුලි බලාගාරය සම්බන්ධ සාකච්ඡාවක් විකාශනය කරන ලදී.
- 2020 ඔක්තෝබර් මස 10වන දින ශ්‍රී ලංකා රූපවාහිනි සංස්ථාවේ 'ශනිදා ආයුබෝවන්' වැඩසටහනෙහි 'ලං.වි.ම. පාරිභෝගික සේවා හා ප්‍රතිලාභ' පිළිබඳ සාකච්ඡාවක්ද 2020 ඔක්තෝබර් මස 31වන දින 'ලං.වි.ම. 51වන සංවත්සරය හා අනාගතය' පිළිබඳ සාකච්ඡාවක්ද විකාශනය කරන ලදී.
- ශ්‍රී ලංකා රූපවාහිනි සංස්ථාව විසින් 2020 ඔක්තෝබර් මස 31වන දින 'ලක්ෂපාන විදුලි බලාගාරයේ 70වන සංවත්සරය' පිළිබඳ වාර්තා වැඩසටහනක් විකාශනය කරන ලදී.
- ශ්‍රී ලංකා රූපවාහිනි සංස්ථාවේ 2020 නොවැම්බර් මස පළමුවැනි දින 'ඉරිදා ආයුබෝවන්' වැඩසටහනෙහි 'ලං.වි.ම. හි ඉතිහාසය, වර්තමානය හා අනාගතය' පිළිබඳ සාකච්ඡාවක් විකාශනය කරන ලදී.
- ශ්‍රී ලංකා රූපවාහිනි සංස්ථාව විසින් 2020 නොවැම්බර් මස පළමුවැනි දින විශේෂ සංවත්සර වැඩසටහනක් විකාශනය කරන ලදී.

ඉහත වැඩසටහන් ප්‍රවර්ධනය කොට ආයතනයේ සංවත්සරය සැමරීම සඳහා තරග පවත්වන ලදී. ජයග්‍රාහකයන් වෙත වටිනා ත්‍යාග පිරිනමන ලදී.



**රූපය C 1: ශ්‍රී ලං.ගු.සං. සමගින් 51වන සංවත්සර වැඩසටහනෙහි ජයග්‍රාහකයන් තෝරා ගැනීම**

ව්‍යාපාර හා මෙහෙයුම් ක්‍රමෝපාය ශාඛාවට සුභවාදී මුද්‍රිත මාධ්‍ය ආවරණයක් ලබාගැනීමට හැකිවිය. ක්‍රමෝපායිකව හා සන්දර්භමය වශයෙන් තීරණාත්මක විෂය කරුණු සම්බන්ධයෙන් ලං.වි.ම. නිලධාරීන්ගේ පහත සඳහන් සම්මුඛ සාකච්ඡා ජාතික පුවත්පත්වල පළ විය. මේවා ආයතනයේ ප්‍රතිරූපය ගොඩනගා ජනතාව අතර පැවති සාවද්‍ය මත බැහැර කරලීමට උපකාරී විය.

- මව්බිම පුවත්පත (2020 නොවැම්බර් පළමුවැනි දින) - අතිරේක සාමාන්‍යාධිකාරී (සම්ප්‍රේෂණ) ඉංජි. (ආචාර්ය) සුසන්ත පෙරේරා මහතා විසින් රචිත ලිපියක් හා ලං.වි.ම. පිළිබඳ සුළු හා මධ්‍ය පරිමාන ව්‍යාපාර වෙතින් නිකුත් කෙරුණු නිවේදන පිටු දෙකක් පුරා ආවරණය කෙරිණි.
- Sunday Times (2020 නොවැම්බර් මස පළමුවැනි දින) අතිරේක සාමාන්‍යාධිකාරී (බෙදාහැරීමේ අංශය 04) ඉංජි. රොහාන් සෙනෙවිරත්න මහතා සමගින් පවත්වන ලද සාකච්ඡාවක් පිටුවක් පුරා ආවරණය කෙරිණි.
- The Sunday Morning හා 'සති අග අරුණ' (2020 නොවැම්බර් පළමුවැනි දින) පුවත්පත් දැන්වීම්.
- මව්බිම පුවත්පතේ වෙබ් අඩවියෙහි වෙබ් අඩවිගත දැන්වීම් පළ කිරීම.
- ලං.වි.ම. සභාපති ඉංජි. විජිත හේරත් මහතා හා ලං.වි.ම. සාමාන්‍යාධිකාරී ඉංජි. කීර්ති කරුණාරත්න මහතා විසින් නිකුත් කරන ලද ළමා දින වැඩසටහන් පණිවිඩ.
- ළමා දින වැඩසටහන හා සමගාමීව අතිරේක සාමාන්‍යාධිකාරී (බෙදාහැරීමේ අංශය 1) ඉංජි. එන්.ඩබ්.කේ. හේරත් මහත්මිය සමගින් සාකච්ඡාවක්.
- අතිරේක සාමාන්‍යාධිකාරී (ආයතනික ක්‍රමෝපාය) ඉංජි. (අචාර්ය) ඩී.සී.ආර්. අබේසේකර මහතා විසින් CEB Care ජංගම යෙදවුම සම්බන්ධයෙන් පළ කරන ලද ලිපියක්.

# ආයතනික ක්‍රමෝපාය අංශය

මන්නාරමේ 'තම්බපවණි' සුළං බලාගාරය විවෘත කිරීමේ උත්සවය ලං.වි.ම. හා විදුලිබල අමාත්‍යාංශය විසින් ඒකාබද්ධව සංවිධානය කරන ලදී. 2020 දෙසැම්බර් මස 8වන දින විදුලිබල අමාත්‍ය ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමාගේ හා සූර්ය, සුළං හා ජලවිදුලි උත්පාදන රාජ්‍ය අමාත්‍ය ගරු දුමින්ද දිසානායක මැතිතුමාගේද සහභාගිත්වය සහිතව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අග්‍රාමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා අතින් 'තම්බපවණි' සුළං බලාගාරය විවෘත කෙරිණි.

## ආයතනික ක්‍රමෝපාය හා නියාමන කටයුතු ශාඛාව

ආයතනික ක්‍රමෝපාය හා නියාමන කටයුතු (CS&RA) ශාඛාව විසින් ලංකා විදුලිබල මණ්ඩලය වෙත නිකුත් කොට ඇති ජනන, සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ බලපත් සම්බන්ධයෙන් මෙන්ම බලපත්ලාභීන් අතරද ඉස්මතුවන කරුණු මෙන්ම ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව සමගින්ද සම්බන්ධීකරණ කටයුතු සිදු කරනු ලබයි. නියාමන කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීමට අමතරව, මෙම ශාඛාව ලං.වි.ම. වෙනුවෙන් ආයතනික ක්‍රමෝපාය සැකසීම සම්බන්ධ සම්බන්ධීකරණ වගකීමද දරයි.

සියලු ලං..වි.ම. බලපත්ලාභීන්ගේ වගකීම් සපරාලනු පිණිස බලපත්ලාභීන් සමගින් මෙන්ම ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව සමගින්ද වසර තුළ නියාමන කටයුතු ඒකකය විසින් සමීපව කටයුතු කරන ලදී. විශේෂයෙන්, ඒකකයේ අවධානය යොමුවූයේ විදුලිබලය (බෙදාහැරීමේ) කාර්ය සාධන ප්‍රමිති, විදුලිය (සම්ප්‍රේෂණ) කාර්ය සාධන ප්‍රමිති, විදුලිය (ආරක්ෂාව, ගුණාත්මකභාවය හා අඛන්ඩතාවය) රෙගුලාසි හා විදුලිය (උපයෝගිතාවය මගින් යොමු කරවනු ලබන ඉල්ලුම් පාර්ශ්ව කළමනාකරණය) රෙගුලාසි වැනි රෙගුලාසි ක්‍රියාත්මක කරන බවට වගබලා ගැනීම කෙරෙහිය. මෙයට අමතරව, දැනට පවත්නා මාර්ගෝපදේශ වැඩිදියුණු කරගැනීම මෙන්ම කුසලතා අනුපිළිවෙල අනුව විදුලිය ලබාදීමේ කාර්ය පරිපාටිය හා ප්‍රධාන මාර්ගයන්හි විදුලි කණු/ රැහැන් විතැන් කිරීම/ ඉවත් කිරීම සඳහා නව මාර්ගෝපදේශ සකස් කිරීම සඳහාද ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව මෙන්ම ලං.වි.ම. බලපත්ලාභීන් සමගින්ද නියාමන කටයුතු ඒකකය විසින් අවශ්‍ය කටයුතු කරන ලදී. පෙරකී පරිදි පවත්නා මාර්ගෝපදේශ වැඩිදියුණු කරගැනීමේ කාර්යය අවසන් වීමත් සමගින්, ප්‍රලේඛන හා වාර්තාකරණය සම්බන්ධයෙන් පද්ධති පාලන මධ්‍යස්ථානයේ පවත්නා මෙහෙයුම් කාර්ය පරිපාටිය ශක්තිමත් කෙරෙනු ඇත. දැනට පවත්නා සැලසුම් හා විදුලිය ලබාදීමේ කාර්ය පරිපාටීන් සමාලෝචනයටද අදහස් කර ඇත. පෙරකී පරිදි නව මාර්ගෝපදේශ සකස් කිරීමේ කාර්යය අවසන් වූ පසු, ප්‍රසිද්ධ මාර්ග යන්හි පවත්නා විදුලි කණු විතැන් කිරීමේ ස්ථාවර, ඵලදායී හා සහභාගිත්ව කාර්ය පරිපාටියක් බලාත්මක වනු ඇත.

මෙයට අමතරව, දෙවැනි මෙ.වො. 300 ස්වභාවික ද්‍රව වායු විදුලි බලාගාරයේ යෝජනා ඉල්ලුම (RFP), ලක්විජය විදුලි බලාගාරයේ මෙ.වො. 300 ගල් අඟුරු විදුලි බලාගාර ව්‍යාපෘති කාර්යයේ යෝජනා ඉල්ලුම හා කෙරවළපිටියේ (පළමු) මෙ.වො. 300 ස්වභාවික ද්‍රව වායු විදුලි බලාගාරයට අදාළ විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම සඳහාද එකඟතාවය ලබගනු වස් නියාමන කටයුතු ඒකකය විසින් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව සමගින් සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදී.

විසඳුම් ලබාදීමකින් තොරව වසර ගණනාවක් පුරා නතරවී පැවති කාර්යයන් නැවත ක්‍රියාත්මක කරනු පිණිස අමාත්‍ය මණ්ඩල එකඟතාවය ලබාගනු සඳහා 2013දී සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ දැනට පවත්නා ගැටලු සම්පාදනය සඳහා නියාමන කටයුතු ඒකකය විසින් ප්‍රමුඛ කාර්ය භාරයක් ඉටු කරන ලදී. කාර්යක්ෂමතාවයන් ප්‍රවර්ධනය කරනු පිණිස සංශෝධනය කළ යුතුව පවත්නා නිශ්චිත වගන්ති සාමාන්‍යාධිකාරීවරයා විසින් පත් කරන ලද කමිටුව විසින් ලැයිස්තුගත කරන ලදී.

2020 වසර, පිරිවැය පිළිබිඹු කරන්නාවූ අය ක්‍රමයක් ලබාගැනීමකින් තොරව පිළිවෙලින් ගතවූ තවත් වසරක් ලෙස ගණන් ගැනේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස 2020 වසර සඳහාද සෘණ ශේෂ පත්‍රයක් නිර්මාණය විය. 2013 වසරේ සිට වසර 7ක් දක්වා අයක්‍රම ප්‍රතිශෝධනය නොකිරීමේ රජයේ ප්‍රතිපත්තිය හේතුකොට මසක් පාසා ලැබිය යුතුව පවත්නා සහනාධාර පිළිබඳ ලං.වි.ම. විසින් නිරතුරු සිහිපත් කරන ලදී. 2016 සිට 2020 ජුනි මාසය දක්වා වූ වර්තමාන අයක්‍රම කාල පරිච්ඡේදය සඳහා රජයෙන් ලැබිය යුතුව පවත්නා සමුච්චිත සහනාධාරය ශ්‍රී ලං.රු.බි. 307.5කි.

අයක්‍රම ඒකකය විසින් 2020 ජනවාරි සිට ජුනි දක්වාද, 2020 ජුලි සිට දෙසැම්බර් දක්වාද වූ කාල පරිච්ඡේද දෙක සඳහා වූ තොග සැපයුම් අයක්‍රම ගොනුගත කිරීමේ කටයුතු සම්බන්ධීකරණය කරන ලදී. මෙයට අමතරව, ඒකකය විසින් වසරේ කාර්තු හතර සඳහාම ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව සමගින් ඒකාකාර ජාතික අයක්‍රම (UNT) ගැලපීම් කටයුතු සම්බන්ධීකරණය කරන ලදී. තවද, ඒකකය විසින් මාසිකව මුදල් අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත තොග සැපයුම් ගනුදෙනු ගිණුම් (BSTA) ඉදිරිපත් කරන ලදී.

2021-2025 කාල පරිච්ඡේදය සඳහා බහු වාර්ෂික අයක්‍රම ගොනුගතකරණය ආරම්භ කිරීමත් සමගින් 2020 වසර කාර්ය බහුල වර්ෂයක් විය. බහු වාර්ෂික අයක්‍රම රාමු සම්ප්‍රේෂණ බලපත්ලාභී ක්‍රමය යටතේ බෙදාහැරීමේ බලපත්ලාභීන් සිවු දෙනා විසින් වසර පහක කාල පරිච්ඡේදය සඳහා ඒ එක් එක් බලපත්ලාභියා වෙත ලබාදී ඇති ව්‍යාපාර කටයුතු සඳහා වූ අයක්‍රමයන්ගෙන් අපේක්ෂිත ආදායම හා සමුච්චිත ආදායම් අවශ්‍යතාවයද ගණනය කරනු ලබයි. වර්තමාන අයක්‍රම ගොනුගතකරණය වූකලි විදුලි නියාමනායතනයක් බලගැන්වීමෙන් අනතුරුව ලං.වි.ම. විසින් සිදුකරන ලද 3වන ගොනුගතකරණයයි. මෙම කාර්යය ලං.වි.ම. සියලු අංශ නියෝජනය කරමින් පත් කරන ලද කමිටුවක් මගින් 2020 මැද භාගයේදී ආරම්භ කරන ලදී. මෙය වූකලි ඉංජිනේරුවරුන් හා ගිණුම්කරණ කාර්ය මණ්ඩලයෙන්ද සමන්විත විශාල පුද්ගල කණ්ඩායමකගේ දායකත්වයක් සහිතව ක්‍රියාත්මක කරනු ලබන කටයුතු අතරින් එකකි. සියලු පිරිවැය මධ්‍යස්ථාන ආවරණය වන පරිදි අයක්‍රම මාදිලිය වෙත ඇතුළත් කරන කරුණු ඒකරාශි කිරීම සඳහා කමිටු රැස්වීම් දහයකට වැඩි සංඛ්‍යාවක්ද, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ රැස්වීම් දෙකක්ද, බෙදාහැරීමේ සම්බන්ධීකරණ කමිටු රැස්වීමක්ද පැවැත්වීමට සිදුවිය. අදාළ තොරතුරු ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත නිසි කලට, එනම් 2020 නොවැම්බර් මස මැද භාගය වන විට, ඉදිරිපත් කරන ලදී.

2020දී මෙම ඒකකය විසින් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව ආරම්භ කළ අයක්‍රම ක්‍රමවේදය ප්‍රතිශෝධනය කිරීම සඳහා වූ අධ්‍යයනයක් සඳහා සහභාගිත්වය ලබාදෙන ලදී. නියාමන ගිණුම්කරණ ක්‍රමය හා අයක්‍රම තීරණ විශ්ලේෂණය හා සමගාමීව දැනට පවත්නා අයක්‍රම ඇති කිරීමේ ක්‍රියාවලි හා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද අයක්‍රම ක්‍රමවේදය, බලපත්ලාභීන් විසින් සිදුකරන ගොනුගත කිරීම් හා අයක්‍රම තීරණ විශ්ලේෂණ සමාලෝචනද මෙම අධ්‍යයනයට ඇතුළත් විය.

ආයතනික ක්‍රමෝපාය කාර්යය හා සමගාමීව, ආයතනික සැලසුම්, ක්‍රියාකාරී සැලසුම්, වාර්ෂික වාර්තා, සංඛ්‍යාන සංග්‍රහයන්, අලෙවි හා ජනන දත්ත පොත් හා ලං.වි.ම. කාර්ය සාධනය හා වැඩසටහන්ද ඇතුළත් ලං.වි.ම. ආයතනික ලේඛන සම්පාදනය කොට පළ කිරීමේ කාර්යය ශාඛාව විසින් සිදුකරන ලදී.

2020 වසර තුළ ශාඛාව යටතේ පහත සඳහන් ලේඛන සම්පාදනය කරන ලදී:



**රූපය C 2: සංඛ්‍යාති සංග්‍රහය-2019**

# ආයතනික ක්‍රමෝපාය අංශය

- වාර්ෂික වාර්තාව - 2019
- ක්‍රියාකාරී සැලැස්ම - 2020
- සංඛ්‍යාති සංග්‍රහය - 2019
- අලෙවි හා ජනන දත්ත පොත - 2019
- කාර්ය සාධනය - 2020 හා වැඩසටහන් - 2021

තවද, හඳුනාගත් දුෂ්කරතා හා අඩු ලුහුඬුතාවයන් මැඩ පැවැත්වීම සඳහා ක්‍රියාකාරී සැලැස්ම සැකසීම හා ප්‍රගති වාර්තාකරණය ස්වයංක්‍රීයකරණය කරනු පිණිස මූලාරම්භයන් ගෙන ඇත. මෙය ලං.වි.ම. තොරතුරු තාක්ෂණ ශාඛාවේ සහාය සහිතව සිදු කරන ලදී. 2021 ජුනි මාසය වනවිට මෙම ස්වයංක්‍රීයකරණ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමට අපේක්ෂිතය.

## ක්‍රියාකාරී ක්‍රමෝපාය හා කාර්යක්‍රම ප්‍රවර්ධන ශාඛාව

භෞතිකව සිදු කරනු ලබන රැස්වීම්, පරදුකරු සාකච්ඡා, සාමූහිකව ගැටලු විසඳීමේ සැසි, සමීප කණ්ඩායම් සාකච්ඡා වැනි ශාඛාවේ ප්‍රධාන මෙහෙයුම් මාදිලි මත වසංගත තත්ත්වය විසින් ඇතිකරන ලද අභියෝගයන් ගණනාවක් මධ්‍යයේ වුවද, ක්‍රියාකාරී ක්‍රමෝපාය හා කාර්යක්‍රම ප්‍රවර්ධන (FS & PD) ශාඛාවට 2020 වසර තුළ එහි සාමාන්‍ය කටයුතු බොහොමයක් සිදු කිරීමට හැකිවිය.

කොවිඩ් - 19 වසංගතයේ පළමු රැල්ල සන්සිඳීමෙන් ඉක්බිතිවම, බොහෝ කලක් අපේක්ෂාවෙන් සිටි සැපයුම්වල විශ්වසනීයත්වය හා සේවයේ ගුණාත්මකභාවය නංවාලනු පිණිස බෙදාහැරීමේ අංශය ප්‍රති-සංවිධානගත කිරීමේ කාර්යය, 2020 මැයි මස 20වන දින ඉදිරිපත් කරන ලද අධ්‍යක්ෂ මණ්ඩලය පත්‍රිකාවක් මගින් මාර්ග සිතියමක් සඳහා අනුමැතිය ලබා ගැනීමෙන් සාක්ෂාත් කරගන්නා ලදී. ක්‍රියාකාරී ක්‍රමෝපාය හා කාර්යක්‍රම ප්‍රවර්ධන ශාඛාව විසින් දීර්ඝ කාලයක් පුරා සිදුකරන ලද විමර්ශනයක හා විවිධ අංශ නියෝජිතයන් මගින් සිදුකරන ලද කරුණු සෙයාබැලීම් ගණනාවක ප්‍රතිඵලයක් වූ මෙම මාර්ග සිතියම අනුමත කිරීම මගින් ඊළඟ වසර පහ ඇතුළත පළාත් 05ක්, ප්‍රාදේශීක 16ක් හා පාරිභෝගික සේවා මධ්‍යස්ථාන 35ක් ඇති කිරීම සඳහා මග හෙළි කරන ලදී. යෝජිත ඇතැම් නව කාර්යාල ඇති කිරීම දැනටමත් ඒ ඒ ප්‍රාදේශිකයන් විසින් ආරම්භ කොට ඇත. මෙම ක්‍රියාමාර්ගය මගින් ලං.වි.ම.ට එහි ගනුදෙනුකරුවන් වෙත වඩාත් කාර්යක්ෂම සේවයක් සැලසීමට ඉඩකඩ සලසනු ඇතැයි අපේක්ෂිතය.

මෙයට අමතරව, පුහුණු ශාඛාව ප්‍රති ව්‍යුහගත කිරීම සඳහා හා අනෙක පිරිස් ශාඛාව ප්‍රති ව්‍යුහගත කිරීම සඳහා ලෙස වූ නව ප්‍රධාන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා දෙකක් ප්‍රතිශෝධනය කොට සමාලෝචනය සඳහා පරදුකරුවන් වෙත ලබාදෙන ලදී. සාමාන්‍යාධිකාරීවරයාගේ ආයතනික කාර්යාලය සඳහා අවශ්‍ය ව්‍යුහාත්මක වෙනස්කම් වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ඉල්ලා සිටින තවත් වැදගත් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක්ද අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ පසු මෙම යෝජනාව මගින් දිගු කාලීනව අපේක්ෂා කරන ලද ඉංජිනේරු විගණන ශාඛාව මෙන්ම අංකිත පාලන ශාඛාවද ඇති කරමින් ශක්තිමත් සහාය කාර්යාල සහයෝගයක් ලබා දීම හරහා සාමාන්‍යාධිකාරීවරයාගේ එදිනෙදා කළමනාකරණ කටයුතු හා පරිපාලන කටයුතුද ශක්තිමත් කරනු ඇත.




**රූපය C 3: බෙදා හරින ලද නව අත්පොත්**

2020 වසර තුළ කාර්ය ක්‍රමෝපාය හා ක්‍රියාවලි සංවර්ධන මෙහෙයුම් අත්පොත් සඳහා පෙර නුවූ විරූ ඉල්ලුමක් ලැබුණු අතර, එම අත්පොත් එදිනෙදා මෙහෙයුම් කටයුතුවලදී යොමුගත වීම සඳහා ශාඛාවන් විසින් භාවිත කරනු ලබයි. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වාණිජ හා ආයතනික) අත්පොත, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සැලසුම් හා සංවර්ධන) අත්පොත හා නියෝජ්‍ය මුදල් කළමනාකරු (බෙදාහැරීම්) අත්පොත සඳහා සාමාන්‍යාධිකාරීවරයාගේ අනුමැතිය ලැබිණි. අදාළ අංශයන්හි පරිහරණය සඳහා ඒවා මුද්‍රණය කිරීමට කටයුතු සලස්වා ඇත. මුද්‍රිත අත්පොත් සඳහා ලැබුණු ඉහළ ඉල්ලුම හේතුකොට, පිරිස් හා මෙහෙයුම් අත්පොත් ගණනාවක් නැවත මුද්‍රණය කොට බෙදා හරින ලදී.

වැටුප් හා වේතන අත්පොත, ස්ථානමාරු අත්පොත හා නිවාඩු අත්පොත් ප්‍රතිශෝධනය හා යාවත්කාලීන කිරීමේ කාර්යය සංවිධානය කරන ලදී. භෞතිකව රැස්වීම් සඳහා අවස්ථා පැවති සෑම අවස්ථාවකදීම විනය කාර්ය පරිපාටිය රීති සම්බන්ධ දෙමළ පරිවර්තනයන් සිදු කරන ලදී. වැටුප් හා වේතන සහ නිවාඩු දින වැටුප් අත්පොත්වල සිංහල හා දෙමළ පරිවර්තනයන් දිවුරුම් දුන් භාෂා පරිවර්තකවරුන් වෙතින් සකස් කොට ගන්නා ලදී.

වසංගත සෞඛ්‍ය මාර්ගෝපදේශයනට අදාළ දැඩි සීමාවනට අනුගත වෙමින් එකී සියලු කටයුතු සිදු කරන ලදී. මෙහෙයුම් අත්පොත් කෙටුම්පත්කරණයේදී අවශ්‍යවන සාකච්ඡාවන්හි සවිස්තරාත්මක ස්වභාවය හේතුවෙන් භෞතිකව රැස්වීම් පැවැත්වීමෙන් ලබන ඵලදායකත්ව මට්ටම එයාකාරයෙන්ම මාර්ගගත රැස්වීම් තුළින් සපුරාගත නොහැකි වේ. එබැවින්, ක්‍රියාකාරී ක්‍රමෝපාය හා කාර්යක්‍රම ප්‍රවර්ධන ශාඛාවට සෞඛ්‍ය මාර්ගෝපදේශ ප්‍රකාර කාර්යාලයේ අවම කාර්ය මණ්ඩලයක් පවත්වාගෙන යන අතර ශාඛාව තුළ සියලු සහභාගිකරුවන්ගේ හා කාර්ය මණ්ඩලයේ ආරක්ෂාව සහතික කරනු පිණිස එවන් රැස්වීම් සංවිධානය කිරීමේදී පෙර සූදානම් කටයුතු ගණනාවක නිරත වීමට සිදුවිය.

## තොරතුරු තාක්ෂණ ශාඛාව

ලං.වි.ම.හි ව්‍යාපාර ක්‍රියාවලි වටහා ගනිමින් කාර්යක්ෂමතාවය හා පාරිභෝගික තෘප්තිය ගෙන එනු පිණිස ඒවා සුදුසු තාක්ෂණයට අනුගත කිරීම තොරතුරු තාක්ෂණ ශාඛාවේ වගකීම වේ.

අංකිතකරණ අවශ්‍යතා සපුරාලීමේදී, තොරතුරු තාක්ෂණ අංශය විසින් ගෘහස්ථ සංවර්ධනය ත ආයතනයේ අවශ්‍යතාවනට ගලපනු ලබන දැනට පවත්නා නිෂ්පාදන ත තොරතුරු තාක්ෂණ ශාඛාවෙන් බාහිරව සංවර්ධන හා නවෝත්පාදන කාර්යයන් පෝෂණය කිරීම ; හා පිටතින් සම්පත් දායකයන් ලබාගැනීම යන චතුර්විධ ක්‍රමෝපායන් යොදාගනු ලබයි.

2020 වසර තොරතුරු තාක්ෂණ ශාඛාවට අභියෝගාත්මක වසරක් විය. වසංගත තත්ත්වය තුළ තොරතුරු තාක්ෂණ ශාඛාව විසින් නිවසේ සිට රාජකාරි සිදු කරමින් පාරිභෝගිකයන් හට බාධාවකින් තොරව සේවාවන් ලබාදීම සඳහා මාර්ගගත රැස්වීම් පැවැත්වීම සඳහා සිය සේවා නියුක්තිකයන් බලගන්වන ලදී.

අභියෝගාත්මක තත්ත්වයන් මධ්‍යයේ වුව තොරතුරු තාක්ෂණ ශාඛාව විසින් සාර්ථක වසරක් සම්පූර්ණ කරන ලදී. සාර්ථකත්වයේ එක් කථාවක් වනුයේ යටිතල පහසුකම් විෂයයෙහි කර්මාන්තයට අදාළ අලුත්වැඩියාවන් සිදු කිරීමයි. නව පරිගණකගත හා ස්වයංක්‍රීයකරණය කරන ලද දෘඪාංග වේදිකාව මගින් දෝෂ පිරික්සුම් සහිත හා ඉහළ පැවැත්මක් සහිත විශ්වසනීය දෘඪාංග සේවාවන් ලබාදෙන බවට සහතික කරනු ලබයි.




**රූපය C 4: CEB Assist හරහා ව්‍යාපාරික මෙහෙයුම් කටයුතු කළමනාකරණය කිරීම**

# ආයතනික ක්‍රමෝපාය අංශය

මනු කියවන්නා පැමිණි පසු සිය නිවැරදි ගිණුම් ශේෂය ලබාගනු පිණිස පාරිභෝගිකයන් හට හැකියාව ලබා දෙමින් මෙන්ම ලං.වි.ම.ට සිය අලෙවි තත්ත්වය හඳුනා ගැනීමට අවකාශ සලසා දෙමින් පසුකරන ලද තවත් කඩඉමක් ලෙස මාර්ගගත මනු කියවීමේ හා ක්ෂණික බිල්පත් පිරිසැකසුම්කරණය හඳුන්වා දී ඇත. බස්නාහිර පළාත උතුර කළාපය තුළ මෙය ආරම්භ කරන ලද අතර මේවන විට සියලු බෙදාහැරීමේ අංශ වෙත ව්‍යාප්ත කෙරෙමින් පවතී.

2020 වසර තුළ දෙවතාවක් CEBAssist එහි විසඳුම් විශිෂ්ටත්වය වෙනුවෙන් සම්මානයට පාත්‍ර වී ඇත. එනම්, 2018/19 අංකිත විශිෂ්ටත්වය වෙනුවෙන් SLT Zero One සම්මාන ප්‍රදානෝත්සවයේදී රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන යටතේ වූ හොඳම අංකිත සක්‍රීයකරණ නිෂ්පාදනය / සේවාව ලෙස හා හොඳම ජංගම පරිහරණ සම්මානයද වශයෙනි. CEBAssist විසඳුම් මගින් පාරිභෝගික සේවාව, පාරිභෝගික සහභාගිත්වය, සේවා ස්ථාන කාර්යක්ෂමතාවය, අභ්‍යන්තර ක්‍රියාවලි හා සේවයේ ගුණාත්මකභාවයද වැඩිදියුණු කරනු ලබයි. උසස් අංග ලක්ෂණද තොරතුරු ලබාගැනීමේ පූර්ණ ප්‍රවේශ හැකියාවද සමගින් පාරිභෝගිකයන් වෙත වේගවත් අංකිත සේවාවන් සැපයීම මගින් CEBAssist උපයෝගිතා වෙළඳපල පෙරළියක් සිදුකර ඇත.




**රූපය C 5: 2018/19 අංකිත විශිෂ්ටත්වය වෙනුවෙන් SLT Zero One ත්‍යාග ප්‍රදානෝත්සවයේ හොඳම ජංගම පරිහරණ සම්මානය**

ගෙවීම් වවුචර (PIV) මාර්ගගත ක්‍රමය හා අලෙවි ස්ථාන (PoS) ක්‍රම නවීකරණය මගින් අදාළ පළාත් කවුළු වෙත පමණක් ගෙවීම් සිදුකළ යුතුවන බවට පාරිභෝගිකයන් වෙත අවධාරණය කළාවූ යම් සීමාවන් තොරතුරු තාක්ෂණ ශාඛාව විසින් ඉවත් කර ඇත. මෙමගින් පාරිභෝගිකයාගේ හා මුදල් අංශයේද පහසුව වැඩිදියුණු කර ඇත.

සම්පත් ප්‍රශස්තකරණය කරමින් වියදම් අවම කරනු පිණිස යොදාගනු ලබන තාක්ෂණික වේදිකාවන් ස්ථාවර කිරීමේ ගමනක් තොරතුරු තාක්ෂණ ශාඛාව විසින් ආරම්භ කර ඇත. තොරතුරු තාක්ෂණ ශාඛාව විසින් මේවන විට සේවාවක් ලෙස වේදිකාව (PaaS) හා සේවාවක් ලෙස යටිතල පහසුකම් (IaaS) යන සේවාවන් වෙනත් ශාඛාවන් වෙත ලබාදෙමින් සිටින අතර සේවයේ ගුණාත්මකභාවය හා ආරක්ෂාව වැඩිදියුණු කරමින් සිටී.

තවද, අංකිතකරණයේ ඊළඟ මට්ටම කරා වූ ලං.වි.ම. ගමන ඉදිරියට ගෙනයනු පිණිස සුහුරු මනුකරණ හා සුහුරු ජාල නියමු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා තොරතුරු තාක්ෂණ ශාඛාව පර්යේෂණ හා සංවර්ධන ශාඛාව හා සෙසු ශාඛාවන් සමගින් සහයෝගීව කටයුතු කරමින් සිටී.

පරිහාරක පුහුණු හා තොරතුරු තාක්ෂණ සහාය සේවාවන් මගින් පරිහාරකයන් පහසුවෙන් අංකිත කාර්යාවලීන් සමගින් අනුගතවන බවට වගබලාගනු ලබයි.

තෙරතුරු තාක්ෂණ ශාඛාව විසින් ආයතනයේ මෙහෙයුම් කාර්යක්ෂමතාවය වැඩිදියුණු කරනු පිණිස සිය සේවා නියුක්තිකයන් වෙත කර්මාන්තය තුළ පිළිගත් තාක්ෂණයන්ගේ සහාය සහිතව විශිෂ්ට සේවා පරිසරයක් ලබාදීමේ දර්ශනයක් සහිතව කටයුතු කර ඇත. එම දර්ශනය තුළ තොරතුරු තාක්ෂණ ශාඛාව විසින් පවත්නා විද්‍යුත් තැපැල් සේවා වැඩිදියුණු කිරීම, සහයෝගී හා එක්සත් සන්නිවේදන යටිතල පහසුකම් පද්ධතියක්, සහයෝගී ලේඛන කළමනාකරණ ද්වාරයක් හා සේවාදායක උපකරණ කළමනාකරණයක් ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘතියක් සැලසුම් කර ඇත.

යටිතල පහසුකම් ඒකකය, අංකිත සේවා ඒකකය, ව්‍යාපාර ක්‍රියාවලි ඒකකය, තොරතුරු පද්ධති සංවර්ධන ඒකකය හා තොරතුරු පද්ධති මෙහෙයුම් ඒකකය නමින් යුත් තොරතුරු තාක්ෂණ ශාඛාවේ ඒකක පහ විසින් ලං.වි.ම. හා එහි පාරිභෝගිකයන්ගේ යහපත උදෙසා තොරතුරු තාක්ෂණ සේවා වැඩිදියුණු කිරීම සඳහා නොකඩවා කටයුතු කරමින් සිටී.

## පර්යේෂණ හා සංවර්ධන ශාඛාව

පර්යේෂණ හා සංවර්ධන (R&D) ශාඛාව ඉල්ලුම් පාර්ශ්ව කළමනාකරණ ඒකකය, පර්යේෂණ හා සංවර්ධන ඒකකය හා ආලෝකකරණ ප්‍රාදේශීය මධ්‍යස්ථානය යන අංශයන්ගෙන් සමන්විත වේ. 2020දී කටුනායක සුහුරු මනුකරණ ව්‍යාපෘතියේ 2වන අදියර ක්‍රියාත්මක කරනු පිණිස ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් (PMU) සකස් කරන ලදී.

## ඉල්ලුම් පාර්ශ්ව කළමනාකරණ ඒකකය

රටේ ධාරිතා පැතිකඩට අදාළ ඉහළ සවස් කාල උපරිම මට්ටම සමනය කරනු පිණිස මෑත කාලීනව පියවර ගෙන ඇත. ගෘහ කාණ්ඩය සඳහා වූ අයක්‍රම ව්‍යුහය යනු එවන් එක් පියවරකි. උපරිම ඉල්ලුම හා සාමාන්‍ය ඉල්ලුම අතර අනුපාතය ලෙස අර්ථ කථනය කෙරෙන වාර්ෂික ධාරිතා සාධකය පැහැදිලි වර්ධන ප්‍රවණතාවයක් නොකඩවා පෙන්නුම් කරමින් සිටී. එබැවින්, පද්ධති ධාරිතා පැතිකඩ අධ්‍යයනය කරමින් පද්ධතිය සමතුලනය කිරීම සඳහා වැඩිදුර විකල්පයන් සොයා ගැනීම කාලීන අවශ්‍යතාවයකි. ඉල්ලුම් පාර්ශ්ව කළමනාකරණ (DSM) ඒකකය මෙම ගැටලුව විසඳනු සඳහා ස්ථාපනය කර ඇත.

නැගෙනහිර පළාතේ ධාරිතා පර්යේෂණ වැඩසටහනක් (LRP) පවත්වන ලද අතර, එහි අවසන් වාර්තාව කොටුම්පත් කරන ලදී. ඉල්ලුම් පාර්ශ්ව කළමනාකරණ ඒකකය විසින් තවදුරටත් පාරිභෝගිකයන්ගේ ඉල්ලුම මත පදනම්ව පුහුණු බලශක්ති විගණනයන් සිදුකරන ලදී. මධ්‍යම පළාතේ ලං.වි.ම. කාර්ය මණ්ඩලය සඳහා බලශක්ති කළමනාකරණය හා බලශක්ති කාර්යක්ෂමතාවය පිළිබඳ පුහුණු වැඩසටහනක්ද පවත්වන ලදී.

ආසියානු සංවර්ධන බැංකුවේ අරමුදල්ගත සුහුරු මනුකරණ නියමු ඉල්ලුම් පාර්ශ්ව කළමනාකරණ ව්‍යාපෘතිය 2019 වසර තුළ සම්පූර්ණ කරන ලද අතර, නියමු පදනමින් සුහුරු මනු 1,000ක් සවි කොට අධීක්ෂණය කරන ලදී. ගෘහස්ථ ප්‍රදර්ශක හා Piggy Back කෙවෙණි හඳුන්වා දීමේ ඵලදායකත්වය ඇගයීම සඳහා සමීක්ෂණයක් පවත්වන ලදී. උගත් පාඩම් සමගින් කටුනායක භූගෝලීය ප්‍රදේශයේ සුහුරු මනු 13,000ක් දක්වා ව්‍යාපෘතිය ව්‍යාප්ත කෙරෙනු ඇත.

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව විසින් ආයතනික ක්‍රමෝපාය හා නියාමන කටයුතු ශාඛාව (CS&RA) ආරම්භ කළ පෙර ගෙවුම් මනුකරණය සම්බන්ධ අධ්‍යයනයක් සඳහා පහසුකම් සලසන ලදී. මෙම අධ්‍යයනය සඳහා ආසියානු සංවර්ධන බැංකුව විසින් අරමුදල් ලබාදෙන ලද අතර, උපදේශනායතනය විසින් 2020 වසර තුළ එම කාර්යය අවසන් කරන ලදී.

## පර්යේෂණ හා සංවර්ධන ඒකකය

ලං.වි.ම. තුළ පවත්වනු ලබන පර්යේෂණ හා සංවර්ධන කටයුතු පෝෂණය කිරීමේ අපේක්ෂාවෙන්, පර්යේෂණ හා සංවර්ධන (R&D) ඒකකය විසින් විවිධ හඳුනාගත් පර්යේෂණ මාතෘකා සම්බන්ධ පර්යේෂණ සම්බන්ධීකරණය සිදු කරයි. එම පර්යේෂණයන්හි සම්බන්ධතාවයට අදාළ ප්‍රතිඵලය 2020 ලං.වි.ම. පර්යේෂණ හා සංවිධාන සඟරාව තුළ සම්පාදනය කර ඇත. සඟරාව තුළ ඇතුළත් කර ඇති පර්යේෂණ මාතෘකා අතරට අඩු වෝල්ටීයතා ජාල තුළට වහළය මත සවි කරන සූර්ය බලාගාර පද්ධති මගින් ඇතිකරන වෝල්ටීයතා බලපෑම හා සමන ක්‍රියාමාර්ග, පවත්නා ලං.වි.ම. සම්ප්‍රේෂණ පද්ධතියේ ආර්ථික තක්සේරුව හා ප්‍රතිචාරක

# ආයතනික ක්‍රමෝපාය අංශය

විදුලිබල ධාරාව ප්‍රශස්තකරණය, අපවර්තන සහ අපවර්තන නොවන ශීතකරණයන්හි බලශක්ති පරිභෝජන සැසඳුම, ශීතකරණ පැය තුනක් විදුලිය විසන්ධි කොට තැබූ කල ආහාරවල ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක ස්ථාවරත්වයට ඇති කරන බලපෑම, බෙදාහැරීමේ ජාලය මත අකුණු මගින් ඇතිකරන බලපෑම තක්සේරු කිරීම හා අකුණු අවදානම් ඉහළ ප්‍රදේශයන් සඳහා ක්‍රියාත්මක කළ හැකි විසඳුම් සොයාගැනීම, NAMA ව්‍යාපෘතිය යටතේ ස්ථාපිත PV+ බැටරි ගබඩාකරණ ගෘහස්ථ පද්ධතිවල තාක්ෂණික හා ආර්ථික කාර්ය සාධනයද ඇතුළත් විය.

පර්යේෂණ හා සංවර්ධන ඒකකය විසින් බෙදාහැරීමේ උපපොළ නඩත්තුවට අදාළ වාර්තා වීඩියෝව නිෂ්පාදනය කිරීමේ කාර්යය අවසන් කරන ලදී. එය බෙදාහැරීමේ සම්බන්ධීකරණ කමිටුව වෙත ඉදිරිපත් කරන ලදුව, බෙදාහැරීමේ උපපොළ බඳු ස්ථාපනයන් නඩත්තු කිරීමේදී අනුගමනය කළ යුතුවන යහ පරිචයන් පිළිබඳ දැනුම බෙදා හැරීම පිණිස ලං.වි.ම. පුරා බෙදා හරින ලදී.



**රූපය C 6: ලං.වි.ම. පර්යේෂණ හා සංවර්ධන සඟරාව ජූනි, 2020**

තවද, ලං.වි.ම. පුරා ලං.වි.ම. නවෝත්පාදන තරගයේ සම්මානලාභී නවෝත්පාදනයන් බෙදා හැරීමේ කටයුතුවලද පර්යේෂණ හා සංවර්ධන ඒකකය නිරත විය. එහි කොටසක් ලෙස, පර්යේෂණ හා සංවර්ධන ඒකකය විසින් ලං.වි.ම. අදාළ ආයතන වෙත නවෝත්පාදන 4ක් පිළිබඳ යෝජනා සම්පාදනය කරන ලදී. පුද්ගලයන් නොයොදන ලද ප්‍රාථමික උපපොළයන්හි තරාපැවි සඳහා අඩු-පිරිවැය උසස් ආරක්ෂක පද්ධතියක් ගොඩනැගීමට අදාළ නවෝත්පාදනය ක්‍රියාත්මක කිරීම සලකා බැලිය හැක්කේද යන්න පිළිබඳ බෙදාහැරීමේ සම්බන්ධීකරණ කමිටුව වෙත නිර්දේශ ලබාදෙන ලදී. සමනලවැව විදුලි බලාගාරයේ සංවර්ධනය කරන ලද පරිසර හිතකාමී ලිහිසි තෙල් පෙරනයන් නවෝත්පාදනයට අදාළ ක්‍රියාවලි ආවරණය කරමින් වාර්තා වීඩියෝවක් නිෂ්පාදනය කරන ලද අතර, එය ඉන්පසු ජනන අංශය හා ජල විදුලිබල සංකීර්ණ අතර බෙදා හරින ලදී.

උසස් මනුකරණ යටිතල පහසුකමක් (AMI) ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා GPRS පදනම්ගත සන්නිවේදන මොඩියුල සහිත ANTE LECO සුහුරු මනු යොදාගැනීමේ ශක්‍යතාවය අධ්‍යයනය කරන ලදී. ANTE LECO වෙතින් සන්නිවේදන මොඩියුලයන්ද සමගින් කොළඹ නගර පළාත තුළ ස්ථාපිත සුහුරු මනු 50ක් මෙම අධ්‍යයනය සඳහා යොදාගන්නා ලදී. දුරස්ථ මනු කියවීම හා බිල්පත් සකස් කිරීම සඳහා CEBAssist මෘදුකාංගය සමගින් මනු ඒකාබද්ධ කරන ලදී. මෙම කාර්යය හා සමගාමීව, සන්නිවේදන මොඩියුලයක් ගෘහස්ථව සැලසුම් කිරීමේ කාර්යය පර්යේෂණ හා සංවර්ධන ශාඛාවේ පවත්නා විශේෂඥ දැනුම උපයෝගයෙන් ආරම්භ කරන ලදී. සන්නිවේදන මොඩියුල, පාලක head end පද්ධතියක් හා සෙසු අන්තර්මධ්‍ය මෘදුකාංග අන්තර්ගත සම්පූර්ණ පද්ධතියක් ගොඩනගන ලදී. මෙම අභ්‍යාසයේදී භාවිත කරන ලද අන්තර්ජාල තාක්ෂණයද සමගින් GPRS සන්නිවේදන තාක්ෂණය මගින් අඩු පිරිවැය සහිත ද්වි-පාර්ශ්වික සන්නිවේදනය සඳහා හැකියාවක් ලබාදෙන ලදී. ක්ෂේත්‍ර පරීක්ෂණ ගණනාවක් පැවැත්වීමෙන් අනතුරුව, CEBAssist පද්ධතිය සමගින් ඒකාබද්ධ කළ පසු මෙම විසඳුම බිල්පත්කරණ මෙහෙයුම් කටයුතු සඳහා යෝග්‍ය බවට නිගමනය කරන ලදී.

අන්තර්ජාල පදනම්ගත දත්ත උකහා ගැනීමේ පද්ධතියක් සැලසුම් කොට ගොඩනැගීමෙන් සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති විදුලි බලාගාරයන්හි පුනර්ජනනීය බලශක්තිය ජනනය කිරීමට අදාළව දිගු කලක් පුරා පවත්නා ගැටලුවට විසඳුමක් සොයා ගැනීමට පර්යේෂණ හා සංවර්ධන ශාඛාව විසින් පද්ධති පාලන මධ්‍යස්ථානය වෙත සිය සහාය ලබාදෙන ලදී. බිල්පත්කරණ බලශක්ති මනු වෙතින් බලශක්ති දත්ත උකහා ගෙන MQTT බ්‍රෝකරයක් හරහා මධ්‍ය මෙහෙයුම් පද්ධතියක් වෙත මාරු කරන ලදී. බලශක්ති දත්ත මෙන්ම පද්ධතියේ සෞඛ්‍ය තත්ත්වයද නිරීක්ෂණය කරනු පිණිස උපකරණ පුවරුවක් ගොඩනගන ලදී. ප්‍රාග්ධන හා පුනරාවර්තන පිරිවැය ප්‍රකාර පිරිවැය ඵලදායී විසඳුමක් ලෙස මෙම විසඳුම හඳුනා ගැනේ.


**රූපය C 7: ස.නො.පු.බ. විදුලි බලාගාරයක සවිකර ඇති සන්නිවේදන උපකරණය**

අඩු ආතති ධාරා විදුලි ජාලයෙහි ශ්‍රී ලංකා ප්‍රමිති අංක 1680:2020 හා අනුගත උපකරණ ඒකාබද්ධ කිරීමක් පර්යේෂණ හා සංවර්ධන ඒකකය විසින් සම්පූර්ණ කරන ලදී. ජාල සැපයුම් ඇණ හිටින අවස්ථාවන්හි පවා බාධක රහිත විදුලි සැපයුමක් ලබාගැනීමේ පාරිභෝගික තෘප්තිය නංවාලනු සඳහා පරිහරණ කාලයට අදාළ අයක්‍රමයන්ට යටත් ගෘහස්ථ පාරිභෝගිකයන් හට බැටරියක් සහිත වහළය මත සවි කරන සූර්ය විදුලි බලාගාර පද්ධතියක් සවිකර ගැනීමට මෙම පද්ධතිය මගින් පහසුව සලසා දෙනු ලබයි.

## ආලෝකකරණය සඳහා වූ කළාපීය මධ්‍යස්ථානය (RCL)

ආලෝකකරණය සඳහා වූ කළාපීය මධ්‍යස්ථානයේ අරමුණු වනුයේ ආලෝකකරණය මගින් විදුලි ඉල්ලුම අවම කරනු පිණිස බලශක්ති කාර්යක්ෂම, විශ්වසනීය හා පවිත්‍ර ආලෝකකරණ තාක්ෂණයන් හා ඒවාහි යෙදවුම් පිළිබඳ දැනුවත්භාවය හා ඒවා ලබාගැනීමේ හැකියාව වර්ධනය කිරීම පිණිස කළාපයේ ආර්ථිකය වැඩිදියුණු කිරීම සඳහා බලශක්ති කාර්යක්ෂම ආලෝකකරණ නිෂ්පාදනයන්හි කළාපීය නිෂ්පාදනය උත්ප්‍රේරණය කොට බොහෝ අඩු වරප්‍රසාද සහිත පුරවැසියන් හට ආලෝකකරණය යන්න ලබාගත හැකි පහසුකමක් බවට පත්කොට දකුණු ආසියාවේ තිරසර ආලෝකකරණයක් ඇති කරනු පිණිස කළාපය තුළ අවශ්‍ය කාර්ය බලකායක් වෙත පුහුණුව හා අධ්‍යාපනය ලබා දීමයි.

## නිෂ්පාදන පරීක්ෂණය

ආලෝකකරණය සඳහා වූ කළාපීය මධ්‍යස්ථානය තුළ පූර්ණ පහසුකම්වලින් සන්නද්ධ වූ, පිළිගත් දීප්තිමිතික රසායනාගාරයක් පවතී. ප්‍රධාන උපකරණ ලෙස එහි මී. 1 හා මී. 2 විශ්කම්භයේ ඒකාබද්ධ ගෝලයන් දෙකක්ද පවතී. මෙය වූකලි ආලෝක වස්තූන්හි තීව්‍රතා බෙදාහැරීම ග්‍රහණය කරගැනීමේ හැකියාවක් සහිත වූ ශ්‍රී ලංකාවේ පළමු තලංකෝණමානයයි. තවද, වඩා විශාල ඒකාබද්ධ ගෝලයන් මගින් සාමාන්‍ය ආලෝක මූලාශ්‍රයනට අමතරව දිගු රේඛීය ආලෝක මූලාශ්‍රයන්හි දීප්තිමිතික පරාමිතීන් මැනීමේ හැකියාවද අප වෙත ලබාදෙනු ඇත.

ආලෝකකරණය සඳහා වූ කළාපීය මධ්‍යස්ථානය විසින් සම්ප්‍රදායික ආලෝකකරණ නිෂ්පාදනයන්හි හා ගුණ තත්ත්වයේ ආලෝකකරණ නිෂ්පාදනයන්හි දීප්තිමිතික හා විදුලි පරාමිතීන් පරීක්ෂා කිරීම් සිදු කරනු ලබයි. මේවන විට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් ආනයනික සියලු සංයුක්ත ප්‍රතිදීප්ත විදුලි පහන් (CFL) මත ලේබල්කරණ වැඩසටහනක් ක්‍රියාත්මක කර ඇත. සියලු සංයුක්ත ප්‍රතිදීප්ත විදුලි පහන් SLS 1231 හා SLS 1225 අවශ්‍යතා සපුරාලිය

# ආයතනික ක්‍රමෝපාය අංශය

යුතුය. මෙම ශ්‍රී ලංකා ප්‍රමිති මට්ටම් හා අනුගත වන්නේද යන්න විමසා බලනු පිණිස ආනයනික සංයුක්ත ප්‍රතිදීප්ත විදුලි පහන් පරීක්ෂණයට ලක් කිරීමේ කාර්ය භාරයද ආලෝකකරණය සඳහා වූ කළාපීය මධ්‍යස්ථානය විසින් ඉටු කරනු ලබයි. තවද, IEC 62612 ප්‍රමිති ප්‍රකාර LED නිෂ්පාදන පරීක්ෂණයට ලක් කිරීමද, SLS **1530:2016** ප්‍රමිතිය හා අනුගත වන්නේද යන්න විමසා බලනු පිණිස LED පහන් පරීක්ෂණයට ලක් කිරීමද, පොදු ආලෝකකරණ සේවාවන් සඳහා ස්වයං තුලබරු LED පහන් ශ්‍රී ලංකා ප්‍රමිති අවම බලශක්ති කාර්යක්ෂමතා ප්‍රමිතියට (MEPS) අනුගත වන්නේද යන්න පරීක්ෂාකර බැලීමද ආලෝකකරණය සඳහා වූ කළාපීය මධ්‍යස්ථානය විසින් ඉටු කරනු ලබයි.

## කටුනායක සුහුරු මනුකරණ ව්‍යාපෘතිය - අදියර 2ට අදාළ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය

කටුනායක සුහුරු ජාල නියමු ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව, එම ව්‍යාපෘතියේම අදියර 2 ක්‍රියාත්මක කරනු සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් (PMU) පිහිටුවන ලද අතර, එමගින් ස්ථාපිතයන් 13,000කට ආසන්න සංඛ්‍යාවකින් සමන්විත සමස්ත කටුනායක පාරිභෝගික සේවා මධ්‍යස්ථාන ප්‍රදේශයම ආවරණය කරනු ලබයි. ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් බාහිර උපදේශන සේවාවන්හි කිසිදු සහායකින් තොරව සවිස්තරාත්මක ලංසු ලේඛන කට්ටලයක් ගොඩනගන ලදී. ලංසු ලේඛනය 2020 දෙසැම්බර් මාසයේ පළ කරන ලද අතර, 2021 පෙබරවාරි මාසයේදී වසා දමනු ඇත. මෙය ක්‍රියාත්මක කිරීමේ කාර්යය දින 300කින් අවසන් කිරීමට සැලසුම් කර ඇත. ව්‍යාපෘතිය අවසන් වූ පසු, ස්වයංක්‍රීය මනු කියවීම හා දුරස්ථ සම්බන්ධතා පහසුකම් පද්ධතියේ ප්‍රධාන සුභවාදී ලක්ෂණ වනු ඇති බැවින් කටුනායක පාරිභෝගික සේවා මධ්‍යස්ථානය සඳහා කිසිදු මනු කියවන්නෙකු හා විසන්ධිකරණ කණ්ඩායමක් අවශ්‍ය නොවනු ඇත. මෙයට අමතරව, බෙදාහැරීමේ උපපොළ නිරීක්ෂණ පද්ධතියක් හා ධාරිතා පැතිකඩ වැනි අගය එක්කළ සේවාවක්ද එතුළ පවතිනු ඇත. මෙම පද්ධතිය ලං.වි.ම. ව්‍යාවසාය සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතිය විසින් හඳුන්වා දීමට නියමිත මනු දත්ත කළමනාකරණ පද්ධතිය සමගින් අනාගතයේ ඒකාබද්ධ කිරීමටද සැලසුම් කර ඇත. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය එ.ජ.ඩො.මි. 2.0ක් වේ.

## ව්‍යාවසාය සම්පත් සැලසුකම්රණ ව්‍යාපෘතිය

සමස්ත ආයතනය පුරා තොරතුරු ඒකාබද්ධ කිරීමේ අදහසින් ලං.වි.ම. ව්‍යාවසාය සම්පත් සැලසුම්කරණ (ERP) පද්ධතිය විසින් ව්‍යාපාර ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය කරනු ඇත. සියලු මට්ටම්වලදී ආයතනය පුරා තොරතුරු ගලායන පරිදි ජනන, සම්ප්‍රේෂණ, බෙදාහැරීමේ හා මධ්‍යගත සේවාවන් දක්වාද විහිදෙන වෙන් වෙන් වශයෙන් වූ ව්‍යාපාරික ක්‍රියාවලීන් ඒකාබද්ධ කෙරෙනු ඇත.

2020 වසර තුළ ව්‍යාවසාය සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘති ටෙන්ඩර් ක්‍රියාවලිය නොකඩවා සිදු කෙරිණි. ආසියානු සංවර්ධන බැංකුවේ ණයකරුවන් සඳහා වූ ප්‍රසම්පාදන රෙගුලාසි හා අනුගත වෙමින් ව්‍යාවසාය සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන කටයුතු තුළ ජාත්‍යන්තර තරගකාරී ලංසුකරණය, තනි අදියර දෙකවර ලංසුකරණ ක්‍රියාවලියද අනුගමනය කෙරිණි. ලං.වි.ම. වෙතින් විෂය ප්‍රවීණයන් 50 දෙනෙකු පමණද ලංසුකරු නියෝජනය කරමින් ප්‍රවීණයන් 30 දෙනෙකුද සහභාගි කරගනිමින් ලං.වි.ම. තුළ තාත්වික ප්‍රාය සංකල්ප සාක්ෂි (POC) ක්‍රියාවලියක් ඉතිහාසයේ පළමු වරට සිදු කිරීමට ලං.වි.ම.ට හැකිවිය. 2020 සිව්වන කාර්තුව වනවිට, ලංසු තක්සේරුකරණයේ අවසන් අදියරට එළැඹ තිබිණි.

ව්‍යාපෘතියේ පළමු අදියර වසර 02කින්ද ව්‍යාපෘතියේ දෙවන අදියර තවත් වසරකින්ද සම්පූර්ණ කිරීමට අපේක්ෂිතය.

**ව්‍යා.ස.සැ. ව්‍යාපෘති**




**රූපය C 8: ව්‍යවසාය සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘති ප්‍රවේශය**



මෙහෙයුම් සමාලෝචනය

# පිරිස් ශාඛාව
# අභ්‍යන්තර විගණන ශාඛාව
# නීති ඒකකය
# විශේෂ විමර්ශන ඒකකය
# වෙනත් සිදුවීම්

# පිරිස් ශාඛාව

ලං.වි.ම. පිරිස් ශාඛාව කේන්ද්‍රීය කාර්යයනට සහාය වනු පිණිස උපරිම මට්ටමින් මානව සම්පත් බඳවා ගැනීම, පුහුණු කිරීම හා පවත්වාගෙන යාම සඳහා කැපවී සිටී. මෙම ඉලක්කය සාක්ෂාත් කරගනු පිණිස, පිරිස් ශාඛාව විසින් මානව සම්පත් සැලසුම්කරණය, බඳවා ගැනීම, ස්ථානගත කිරීම, උසස් කිරීම් හා මාරු කිරීම්, විවිධ කාර්ය මණ්ඩල ප්‍රතිපත්ති සැකසීම, ත්‍යාග කළමනාකරණය හා විනය කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීම වැනි විවිධාකාර වූ මානව සම්පත් කාර්යයන් සිදු කිරීමේ වගකීම දරනු ලබයි.

සමාලෝචිත වසර තුළ ආයතනයේ නව බඳවා ගැනීම් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

**රූපය 01 : නව බඳවා ගැනීමේ විස්තර - 2020 වසර**




තවද, මෙම කාල පරිච්ඡේදය තුළ 399 දෙනෙකු විශ්‍රාම ලබා ඇති අතර, ඉල්ලා අස්වීම, මරණයන් හා සේවය අවසන් කිරීම් වැනි විවිධ හේතු මත සේවකයින් 81 දෙනෙකු ඉවත්ව ඇත. වසර අවසානයේදී, සමස්ත කාර්ය මණ්ඩලය ස්ථිර සේවකයින් 21,262 දෙනෙකුගෙන්ද, අනියම් සේවකයින් 1,485 දෙනෙකුගෙන්ද, කොන්ත්‍රාත් සේවකයින් 118 දෙනෙකුගෙන්ද සිවු වසර ආධුනිකත්ව පුහුණු යෝජනාක්‍රමය යටතේ පුහුණුවන පුහුණු ලාභීන් 2,759 දෙනෙකුගෙන්ද සමන්විත විය. මෙම සේවකයින් වයස අවුරුදු 18 සිට 60 දක්වා වූ විවිධ වයස් කාණ්ඩයන් යටතට වැටේ.

පහත ප්‍රස්ථාරය තුළ 2020 වසර අවසානයේදී සේවකයන්ට සම්බන්ධ වයස් විග්‍රහය ඉදිරිපත් කරනු ලබයි.

**රූපය 02 : 2020 දෙසැම්බර් 31 දිනට වයස් විග්‍රහය**




විවිධත්වයෙන් යුත් කාර්ය බලකායක් පැවතීම හේතුකොට, අවුරුදු 3ට අඩු සේවා කාලයක සිට අවුරුදු 30ට වැඩි සේවා කාලයක් දක්වා වූ සේවා කාලයන් සහිත සේවකයින් ලං.වි.ම. සතුවේ. පහත දැක්වෙන සටහන තුළ සේවය කරන ලද වර්ෂ සංඛ්‍යාව හා සම්බන්ධව සමස්ත ලං.වි.ම. කාර්ය මණ්ඩලයේ සේවා අත්දැකීම් ගෙනහැර දක්වනු ලබයි.

**රූපය 03 : 2020 දෙසැම්බර් මස 31වන දිනට සේවකයන්ගේ සේවා විග්‍රහය**




ලං.වි.ම. සමස්ත කාර්ය බලකාය තවදුරටත් විධායක, මධ්‍යම මට්ටමේ කාර්මික සේවා, පුහුණු කාර්මික සේවා, කණිෂ්ඨ හා නුපුහුණු කාර්මික සේවා, ලිපිකරු හා සමාන්තර සේවා සහ වෙනත් තාක්ෂණික නොවන මාණ්ඩලික සේවා ශ්‍රේණි ලෙස විවිධ ශ්‍රේණිවලට කාණ්ඩගත කළ හැක. සේවා කාණ්ඩයනට අනුව සේවක විග්‍රහය පහත දැක්වේ.

**රූපය 04 : 2020 දෙසැම්බර් මස 31වන දිනට සේවක විග්‍රහ කාණ්ඩය**




## ප්‍රතිපත්ති ඒකකය

මානව සම්පත් සැලසුම්කරණය, කාලීන යාවත්කාලීන කිරීම් සමගින් ලං.වි.ම.පිරිස් ප්‍රතිපත්ති පවත්වාගෙන යාම, ලං.වි.ම. සේවකයන්ගේ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය පවත්වාගෙන යාම හා අවශ්‍ය පරිදි අවශ්‍ය සංශෝධන සිදු කිරීම, මානව සම්පත් පාලනයට අදාළ ගැටලු සම්බන්ධයෙන් පැහැදිලි කිරීම් සිදු කිරීම, සේවක වැටුප් සම්බන්ධ කරුණු කළමනාකරණය, පිරිස් කටයුතුවලට අදාළ වැදගත් නඩු කටයුතු කළමනාකරණය හා මානව සම්පත් ප්‍රතිපත්ති හා පරිපාලනයට අදාළ චක්‍රලේඛ නිකුත් කිරීමට අදාළ වගකීම් මෙම ඒකකය විසින් දරනු ලබයි.

වසර තුළ, ප්‍රතිපත්ති ඒකකය විසින් චක්‍රලේඛ 21ක් නිකුත් කළ අතර, පිරිස් කරුණුවලට අදාළ වැදගත් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා 12ක් ඉදිරිපත් කරන ලදී.

## බඳවා ගැනීමේ, උසස් කිරීමේ හා විනය කරුණු ඒකකය

මෙම ඒකකය විසින් සාමාන්‍යාධිකාරීවරයාගේ විෂය පථය යටතේ සියලු අභ්‍යන්තර හා බාහිර බඳවා ගැනීම්වලට සම්බන්ධ සියලු කටයුතු, විධායක තනතුරු සඳහා අභ්‍යන්තර වෙළඳ දැන්වීම් පළ කිරීම හා පුරප්පාඩු පළ කිරීම, සියලු සේවක සංඛ්‍යාවනට සීමා වූ උසස්වීම් හා විධායක නිලධාරීන්ගේ සියලු ශ්‍රේණි අතර උසස්වීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම සිදුකරනු ලබයි.

## ස්ථාන මාරු හා සාමාන්‍ය ඒකකය

අංශ අතර සියලු කාණ්ඩවල වාර්ෂික ස්ථාන මාරු හා සුහද ස්ථාන මාරු ක්‍රියාත්ක කිරීම මෙම ඒකකය මගින් සිදු කරනු ලබයි.

සමාලෝචිත වසර තුළ ඒකකයේ ප්‍රගතිය පහත පරිදි වේ:

රූපය 05 : 2020 වසර තුළ සිදුකරන ලද ස්ථාන මාරු පිළිබඳ විස්තර




## පුද්ගලික ලිපිගොනු ඒකකය

සාමාන්‍යාධිකාරීවරයා යටතේ ඇති සහ ආයතනික ක්‍රමෝපාය අංශය යටතේ ඇති හා ශාඛාවන්හි සහ ඒකකයන්හි සේවය කරන සියලු සේවා නියුක්තිකයන්ගේ පුද්ගලික ලිපිගොනු මෙම ඒකකයේ විෂය පථය යටතට වැටේ. ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන්ගේ ලිපිගොනු 92ක්ද ඇතුළත්ව පුද්ගලික ලිපිගොනු 608ක මුලු සංඛ්‍යාවකට අදාළ කටයුතු මෙම ඒකකය විසින් සිදු කරනු ලබයි.

## සුභසාධන ඒකකය

ලං.වි.ම. සේවා නියුක්තිකයන්ගේ සුභ සාධනය පිළිබඳ වගබලා ගැනීම සඳහා ස්ථාපනය කොට ඇති සුභසාධන ඒකකය ලං.වි.ම. සේවා නියුක්තිකයන් හට ඔවුන්ගේ සේවා ජීවිත සමතුලනය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් හා උපයෝගිතා පහසුකම් සම්පාදනය කිරීමේ අරමුණ ඉටු කරයි.

දැරිය හැකි මිලකට ආරක්ෂිත නවාතැන් හා සෙසු පහසුකම් ලබාදීමේ අපේක්ෂාව සහිතව, දිවයින පුරා වැදගත් ස්ථානයන්හි ලං.වි.ම. විසින් ලං.වි.ම. සංචාරක බංගලා ජාලයක් පවත්වාගෙන යනු ලබයි. සේවා නියුක්තිකයන් හට විවේක පහසුකම් හා නිල නවාතැන් සම්පාදනය කිරීම පිණිස සමස්තයක් ලෙස රට පුරා සංචාරක බංගලා 33ක් මෙහෙයවනු ලබයි. මෙම පහසුකම වූකලි සේවා නියුක්තිකයන් හට පවත්නා පහසුකම් අතරින් එක් ප්‍රධාන පහසුකමකි. සේවා නියුක්තිකයන් වෙත වඩාත් යහපත් සේවයක් ලබාදීමේ අරමුණින් මෙම බංගලාවන්හි සපයනු ලබන සේවාවන් අඛණ්ඩව වැඩිදියුණු කෙරේ.



රූපය 06 : නවීකරණය කළ සංචාරක බංගලාව - නුවරඑළිය

දැඩි නීතිරීති යටතේ හා නිරන්තර අධීක්ෂණයන් හා කොවිඩ් - 19 මාර්ගෝපදේශයනට අනුගත වෙමින්ද, ලං.වි.ම. සේවා නියුක්තිකයන් හට නිල නවාතැන් පහසුකම් සලසනු වස් වසංගත සමය තුළ පවා මෙම සංචාරක බංගලා ක්‍රියාත්මක විය.

සමාලෝචිත වසර තුළ, රාජකාරි කටයුතු සඳහා කොළඹ හදවත බඳු කොළඹ 02 ප්‍රදේශයේ නව සංචාරක බංගලාවක් ස්ථාපනය කරන ලද අතර, නුවරඑළිය සංචාරක බංගලාව නවීන ගෘහ නිර්මාණ ශිල්පීය පෙනුමක් සහිතව නවීකරණය කරන ලදී.

ආගමික කටයුතුවලට දිරි දෙමින්, ලං.වි.ම. බෞද්ධ සංගමය හා ක්‍රිස්තියානි සංගමය වැනි සමාජ හරහා සේවා නියුක්තිකයන් විසින් සංවිධානය කරනු ලබන වෙසක්, පොසොන් හා නත්තල් උත්සව සඳහා ලං.වි.ම. විසින් වාර්ෂික දායකත්වයන් ලබාදෙනු ලබයි.

රටට වසංගත තත්ත්වයකට මුහුණ පෑමට සිදු වුවද, 2020 වසර තුළදීද සරල වුවද උත්සවාකාරයෙන් එකී සියලු උත්සව පවත්වන ලදී. සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලදුව මිහින්තලේ පවත්වන ලද “ජාතික පොසොන් උත්සවය” හා “මිහින්තලා ආලෝක පූජාව-2020” සඳහා ලං.වි.ම. සම අනුග්‍රහය ලබාදෙන ලදී. මෙම උත්සව සාර්ථක කරනු පිණිස රජයේ ආයතන අතර සියලු නිල සංවිධාන කටයුතු සඳහා සුභසාධන ඒකකය විසින් පහසුකම් සලසන ලදී.

සුභසාධන ඒකකය විසින් 2020.02.28 දින ලං.වි.ම. පරිශ්‍රයෙහි දීපව්‍යාප්ත ශ්‍රමදාන වැඩසටහනක් සංවිධානය කරන ලදී. පිළිවෙලින් ඉංජි. ඩී.ජේ. විමලසුරේන්ද්‍රයන්ගේ 146වන ජන්ම සංවත්සරය හා ආයතනයේ 51වන සංවත්සරයද සැමරීම සඳහා 2020.09.17 දින හා 2020.11.02 දින නිල සැමරුම් උත්සව පවත්වන ලදී.

කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුකොට, ලං.වි.ම. ක්‍රීඩා සමාජය විසින් සම්බන්ධීකරණය කරන ලද ක්‍රීඩා කටයුතු පසුගිය වර්ෂයන් තුළ නොපවත්වන ලදී. කෙසේ වුවද, ලංකා විදුලිබල මණ්ඩලයේ ක්‍රිකට් කණ්ඩායම සිය තරග තුනම ජයග්‍රහණය කළ අතර 2019/2020 රාජ්‍ය සේවා ක්‍රිකට් තරගාවලියේ C/D අංශයට තෝරා ගන්නා ලදී.

# අභ්‍යන්තර විගණන ශාඛාව

අභ්‍යන්තර විගණන ශාඛාව ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා යටතේ ක්‍රියාත්මකවන අතර ඔහුට සහාය පිණිස එම ශාඛාවෙහි කාර්ය මණ්ඩල සාමාජිකයන් 85 දෙනෙකුද වේ. මෙම ශාඛාව විසින් ආයතනික පාලන වගකීම් දැරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලයට හා කළමනාකාරිත්වයට සහාය දක්වන අතරම ආයතනය තුළ ඵලදායී හා කාර්යක්ෂම ව්‍යාපාර හා මෙහෙයුම් ක්‍රියාවලි වැඩිදියුණු කිරීමේ හා ප්‍රවර්ධනය කිරීමේ කාර්යයටද සහාය ලබාදෙනු ලබයි.

අභ්‍යන්තර විගණන ශාඛාවේ විෂය පථය වනුයේ ආයතනයේ දැනට පවත්නා අවදානම් කළමනාකරණ, පාලන හා පරිපාලන ක්‍රියාවලීන් අපේක්ෂිත පරිදි ක්‍රියාත්මක වන්නේද හා ආයතනයේ සපුරාගත යුතුවන අභිමතාර්ථ සාධනය කරගැනීමට ඒවා මගින් හැකියාවක් ලබා දෙන්නේද යන්න ස්වාධීනව තක්සේරු කර බලනු පිණිස එකී අවදානම් කළමනාකරණ, පාලන හා පරිපාලන ක්‍රියාවලීන්හි ප්‍රමාණවත්භාවය හා ඵලදායකත්වය ඇගයීමට ලක් කිරීමයි.

තක්සේරු කරනු ලබන අවදානමේ මට්ටම හා දැනට සිටින කාර්ය මණ්ඩලයට අනුව තීරණය වන අවස්ථා ගණනකින් සියලු ඒකක, ශාඛා හා අංශ පිළිබඳ විගණනයන් සිදු කෙරේ. 2020 වසර තුළ සිදුකරන ලද විගණන කාර්යයන් පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

**රූපය 07 : 2020 වසර තුළ පවත්වන ලද විගණන පිළිබඳ විස්තර**




ලං.වි.ම. තුළට හඳුන්වා දෙන ලද යම් නිශ්චිත ක්‍රමයක් වේනම් එය ක්‍රියාත්මකව පවත්නේද හා අදාළ නිලධාරීන් විසින් ඒවා ඵලදායක ලෙස ක්‍රියාත්මක කරනු ලබන්නේද යන්න පරීක්ෂාකර බලන්නාවූ පද්ධතිමය විගණනයන් කෙරෙහි 2020 වසර තුළ අවධානය යොමු කරන ලදී.

## නීති ඒකකය

ලං.වි.ම. විසින් ගොනු කරන ලද නඩු තුළින් මෙන්ම සෙසු පාර්ශ්වයන් විසින් ලං.වි.ම.ට එරෙහිව ගොනු කරන ලද නඩු තුළින්ද පැන නගින්නාවූ නීතිමය කටයුතු ඇතුළත් ආයතනයේ සියලු නීතිමය කටයුතු හා නඩු කටයුතු නීති ඒකකය විසින් කළමනාකරණය කරනු ලබයි.

පළමු කාණ්ඩය තුළ පහත කරුණු ආවරණය කෙරේ:

- මනු ආශ්‍රිත දෝෂ/ විදුලිය අයථා ලෙස ලබාගැනීම් ආදිය ආශ්‍රිතව සිදුකරන විදුලිය විසන්ධි කිරීම්/ ප්‍රතිශෝධනයන්ගෙන් අනතුරුව හිඟ මුදල් පියවා ගැනීම.
- ගිවිසුම්/ කොන්ත්‍රාත් කඩ කිරීම් තුළින් පැන නගින ගැටලු.
- ලං.වි.ම. දේපළ/ වාහන වෙත සිදුවූ අලාභහානි පියවා ගැනීම.
- ලං.වි.ම. නිල නිවාස /ඉඩම් අයිතිය ආපසු ලබාගැනීම.

දෙවන කාණ්ඩය තුළ පහත කරුණු ආවරණය කෙරේ:

- විදුලිය විසන්ධි කිරීම් හා බිල්පත් ප්‍රතිශෝධනය කිරීම්වලට එරෙහිව පවරන ලද නඩු.
- අදාළ දේපළ, ඉඩම්, ගස් / භෝග ආදියට සිදුවූ හානි වෙනුවෙන් වන්දි ඉල්ලා සිටීමින් තුන්වන පාර්ශ්වයේ දේපළ මතින් විදුලි රැහැන් ඇදීමට එරෙහිව නිකුත් කර ඇති තහනම් නියෝග / වාරණ නියෝග
- කාර්ය පරිපාටිය කඩ කිරීම, උල්ලංඝනය කිරීමට එරෙහිව අලාභ ඉල්ලා සිටිමින් ඉදිරිපත් කරන ටෙන්ඩර්/කොන්ත්‍රාත් කරුණු.
- සේවය අවසන් කිරීම, සේවායෝජකට එරෙහිව සේවා දායකයා විසින් පැවරූ නඩු කටයුතු ආදියට අදාළ වූ මූලික අයිතිවාසිකම් අයැදුම්පත්, කම්කරු විනිශ්චය සභා/ කාර්මික අධිකරණ/කම්කරු දෙපාර්තමේන්තුමය කරුණු.

සමාලෝචිත වසර තුළ ඒකකය විසින් කටයුතු කරන ලද අධිකරණමය කටයුතු පිළිබඳ විස්තර පහත දී ඇත:

| අධිකරණයේ නම | නඩු සංඛ්‍යාව |
|---|---|
| ශ්‍රේෂ්ඨාධිකරණය | 35 |
| අභියාචනාධිකරණය | 45 |
| සිවිල් අභියාචනා මහාධිකරණය හා මහාධිකරණය | 23 |
| දිසා අධිකරණය | 164 |
| කම්කරු විනිශ්චය අධිකාරිය හා කර්මාන්ත අධිකරණය | 32 |
| මහේස්ත්‍රාත් අධිකරණය | 12 |

ඉහත කරුණුවලට අමතරව, අධ්‍යක්ෂ මණ්ඩලය හා සේවා නියුක්තිකයන් අතර ආරවුල්, සේවය අවසන් කිරීමට අදාළව සේවා නියුක්තිකයන්ගේ ගැටලු, සේවය හැරයාමේ නිවේදන හා දුක්ගැනවිලිද සම්බන්ධයෙන් දැනට පවත්නා නීතිවලට අනුව පහත සඳහන් විනිශ්චය අධිකාරීන්හි කටයුතු කෙරිණි.

- කම්කරු විනිශ්චය අධිකාරිය
- කම්කරු දෙපාර්තමේන්තුව
- මානව හිමිකම් කොමිෂන් සභාව
- කර්මාන්ත අධිකරණය

චෝදනා පත්‍ර, ස්ථාවර කාල කොන්ත්‍රාත් මත කරනු ලබන පත්කිරීමේ ලිපි ආදිය පරීක්ෂාකර බැලීම හා ලබන්නන් වෙත නිල වශයෙන් නිකුත් කිරීමට පෙර කම්කරු ගැටලුවලට අදාළ ලේඛන කටයුතු පරීක්ෂාකර බැලීමද නීති ඒකකයේ වගකීම වේ.

සියලු මූල්‍ය ගිවිසුම්, වාණිජ ගිවිසුම් හා විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම්ද ඇතුළත්ව බාහිර පාර්ශ්වයන් සමගින් ලං.වි.ම. එළැඹෙන්නාවූ සියලු ගිවිසුම් / කොන්ත්‍රාත්වල නීත්‍යනුකූලභාවය සහතික කිරීමද ඒකකයේ වගකීම වේ.

මෙයට අමතරව, නීති ඒකකය 2020 වසර තුළ බේරුම්කරණ කටයුතු පහකටද සම්බන්ධ විය.

## විශේෂ විමර්ශන ඒකකය

විදුලිය නීති විරෝධී ලෙස ලබාගැනීම හා මනු වෙනස් කිරීම සම්බන්ධ විමර්ශන කඩිනම් කරනු පිණිස 1995 වර්ෂයේදී විශේෂ විමර්ශන ඒකකයක් ස්ථාපනය කරන ලදී. විමර්ශන සිදු කරනු පිණිස පළාත් තුළ කඩාපනින කණ්ඩායම් දහ අටක් ස්ථානගත කර ඇත.

කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුකොට, ඒකකයට වසර තුළ වැටලීම් සිදුකළ හැකි වූයේ මාස හයක් තුළ පමණි. ඒ පිළිබඳ තොරතුරු පහත සටහන තුළ දක්වා ඇත.

| කාරණය | සාර්ථක වූ අවස්ථා | අධිකරණ දඩය (ශ්‍රී ලං.රු.මි.) | ලං.වි.ම. අලාභය (ශ්‍රී ලං.රු.මි.) | එකතුව (ශ්‍රී ලං.රු.මි.) |
|---|---|---|---|---|
| මනු වෙනස් කිරීමේ අවස්ථා | 1090 | 3.09 | 60.25 | 63.34 |
| නීති විරෝධීව විදුලිය ලබාගත් අවස්ථා | 149 | 0.43 | 2.05 | 2.48 |
| **එකතුව** | **1239** | **3.51** | **62.31** | **65.82** |

එම කටයුතුවලට අමතරව, විවිධ මූලාශ්‍රයන් මගින් විශේෂ විමර්ශන ඒකකය වෙත යොමු කරන ලද අක්‍රමිකතාවයන් පරීක්ෂාකර බලනු පිණිස විමර්ශන ගණනාවක් පවත්වන ලද අතර, වැරදිකරුවන් බවට හඳුනාගත් නිලධාරීන් හා සේවා නියුක්තිකයන්ට එරෙහිව ක්‍රියා මාර්ග ගන්නා ලදී.

# වෙනත් සිදුවීම් 2020

## ජනවාරි

2020 ජනවාරි මස 09 වන දින සිංහ සමාජයේද සහාය සහිතව ඉහළ කොත්මලේ විදුලි බලාගාරයේ සුභසාධන සමිතිය විසින් ලේ දන්දීමේ ව්‍යාපාරයක් හා නොමිලයේ සෞඛ්‍ය කඳවුරක්ද සංවිධානය කරන ලදී. එම අවස්ථාවේදී රුධිරය පයින්ට් 200 ක් පරිත්‍යාග කෙරිණි.

## මැයි

2020 මැයි මස 23 වන දින ගොඩකවෙල පාරිභෝගික සේවා මධ්‍යස්ථානය නව ස්ථානයකට ගෙනයන ලදී.



## ජූනි

කිරාන් පාරිභෝගික සේවා මධ්‍යස්ථානය 2020 ජූනි මස 26 වන දින මඩකලපුව ප්‍රදේශයේ ස්ථාපනය කරන ලදී.



## ජූලි



හාලිඇල පළාත් ගබඩාව 2020 ජූලි මස 22 වන දින නව ගොඩනැගිල්ලක ස්ථාපනය කරන ලදී.



රත්මලාන ප්‍රාදේශීය කාර්යාලය 2020 ජූලි මස 30 වන දින නව ස්ථානයකට ගෙනයන ලදී.

# වෙනත් සිදුවීම් 2020

## අගෝස්තු



2020 අගෝස්තු මස 14 වන දින මහියංගනයේ නව ප්‍රාදේශීය කාර්යාලයක් ස්ථාපනය කරන ලදී.



2020 අගෝස්තු මස 14 වන දින රිදීමාලියැද්දේ නව පාරිභෝගික සේවා මධ්‍යස්ථානයක් ස්ථාපනය කරන ලදී.



2020 අගෝස්තු මස 30 වන දින දෙහිවලදී නව බෙදාහැරීමේ මධ්‍යස්ථානය 4 හි මූලස්ථාන ගොඩනැගිල්ලෙහි කටයුතු ආරම්භ කොට ගතවූ පළමු වසර සමරනු පිණිස දානමය පින්කමක් සංවිධානය කරන ලදී.

## සැප්තැම්බර්

- 2020 සැප්තැම්බර් මස 17 වන දින මදුරන්කුලිය පාරිභෝගික සේවා මධ්‍යස්ථානය ස්ථාපනය කරන ලදී.
- 2020 සැප්තැම්බර් මස 17 වන දින කෑගලු ප්‍රදේශයේ ආලගමදී නව පාරිභෝගික සේවා මධ්‍යස්ථානයක් ස්ථාපනය කරන ලදී.
- 2020 සැප්තැම්බර් මස 18 වන දින ගම්පොළ ප්‍රදේශයේ කුරුඳුවත්තේදී නව අලෙවි ස්ථාන කවුලුවක් ස්ථාපනය කරන ලදී.
- 2020 සැප්තැම්බර් මස 23 වන දින බෙදාහැරීමේ අංශය 4 මූලස්ථානයේදී පිරිත් සජ්ජායනා වැඩසටහනක් සංවිධානය කරන ලදී.
- 2020 සැප්තැම්බර් මස 29 වන දින අලුතින් නවීකරණය කරන ලද D උපපොළ විවෘත කරන ලදී.
- 2020 සැප්තැම්බර් මස 29 වන දින සේරුනුවර විදුලි පාරිභෝගික සේවා මධ්‍යස්ථානය ස්ථාපනය කරන ලදී.
- 2020 සැප්තැම්බර් මස 30 වන දින අම්පාර ප්‍රදේශයේදී උහන පාරිභෝගික සේවා මධ්‍යස්ථානය ස්ථාපනය කරන ලදී.







# වෙනත් සිදුවීම් 2020

## ඔක්තෝබර්

2020 ඔක්තෝබර් මස 6 වන දින මහව ප්‍රාදේශීය කාර්යාලය ස්ථාපනය කරන ලදී.



## නොවැම්බර්

- 2020 නොවැම්බර් මස 18 වන දින අභ්‍යන්තර සන්නිවේදන කටයුතු සඳහා රජයේ ආයතනයක් වෙත අංකිත අත්සන් පහසුකම රටේ පළමුවන වතාවට හඳුන්වා දෙන ලදී. (බෙදාහැරීමේ අංශය 4 මූලස්ථානය)
- 2020 නොවැම්බර් මස 27 වන දින අම්බලන්තොට පාරිභෝගික සේවා මධ්‍යස්ථානය ස්ථාපනය කරන ලදී.



## දෙසැම්බර්

- 2020 දෙසැම්බර් මස 9වන දින පුත්තලම ප්‍රාදේශීය කාර්යාලය නව ගොඩනැගිල්ලක් වෙත ගෙනයන ලදී.
- 2020 දෙසැම්බර් මස 10වන දින යාපනය නැගෙනහිර ප්‍රාදේශීය කාර්යාලය ස්ථාපනය කරන ලදී.
- 2020 දෙසැම්බර් මස 24වන දින බස්නාහිර පළාත දකුණ 1 තරාපැටි නඩත්තු ඒකකය ස්ථාපනය කරන ලදී.
- රත්මලානේ නව ඉදිකිරීම් අංශයක් ස්ථාපනය කරන ලදී.
- ගලේවෙල පාරිභෝගික සේවා මධ්‍යස්ථානය දඹුල්ල ප්‍රදේශයේ ස්ථාපනය කරන ලදී.
- 2020 දෙසැම්බර් මස 31වන දින කිරිඳිවැල ප්‍රාදේශීය කාර්යාලය ගම්පහ ප්‍රදේශයේ ස්ථාපනය කරන ලදී.







**මෙහෙයුම් සමාලෝචනය**

අවදානම් සමාලෝචනය

තිරසාරභාවය පිළිබඳ වාර්තාව

ආයතනික සමාජ වගකීම් වාර්තාව

# අවදානම් සමාලෝචනය

මේ දක්වා ලං.වි.ම. මුළුමනින්ම අවදානම් ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම හෝ සිය මෙහෙයුම් කටයුතු තුළට විධිමත් අවදානම් කළමනාකරණ රාමුවක් ඒකාබද්ධ කිරීමක් සිදුකොට නොමැත. අවදානම් ප්‍රතිපත්තියක් සකස් කොට අවදානම් තක්සේරු කිරීමේ කාර්ය පරිපාටියක් අන්තර්ගත කිරීම සඳහා ආයතනික ක්‍රමෝපාය අංශය මගින් පෙරදී තාවකාලික පියවරයන් ගනු ලැබූ නමුත් අනපේක්ෂිත, අතිශය අසුභවාදී සිදුවීමක් ලෙස කොවිඩ් - 19 වසංගතය ඇතිවීමත් සමගින් එම කටයුත්ත හදිසියේ නතර කිරීමට සිදුවිය.

කොවිඩ් - 19 වසංගතය සමස්ත ලං.වි.ම. මතටම බරපතල බලපෑමක් ඇතිකළ අතර, සියලු මෙහෙයුම් අංශ එහි බලපෑමට ලක්විය. සංචරණ සීමාවන්, අගුළු දැමීම්, දැඩි නමුත් සීමාකරණීය සෞඛ්‍ය රෙගුලාසි හා ගෝලීය මට්ටමින් සමාජ, පරිපාලන හා මූල්‍ය කටයුතුවලට සිදුවූ බලපෑමට මුහුණ දෙනු පිණිස ඔවුනට කාර්ය පරිපාටි වෙනස් කිරීමට සිදුවිය. කෙසේ වුවද, අවදානම් තුළ සෘණාත්මක ප්‍රතිවිපාක පමණක් පැවතීම අවශ්‍යම වූවක් නොවේ. ලං.වි.ම. සිය අංකිත විසඳුම් සංවර්ධනයෙහි ලා ගත් ඉදිරි පියවර කොවිඩ් - 19 වසංගතයෙහි ධනාත්මක ප්‍රතිවිපාකයකි. බොහෝ කොටම ප්‍රධාන නාය යාම්, චණ්ඩ මාරුත වැනි වෙනත් සිදුවීමේ අඩු සම්භාවිතාවක් ඇති සෘණාත්මක ප්‍රතිවිපාක සහිත සිදුවීම් 2020 වසර තුළ සිදු නොවීය. ජාතික ආපදා කළමනාකරණ බලධාරීන් සමගින් ලං.වි.ම. පවත්වාගත් සම්බන්ධතාවය තුළින් මෙම අවදානම් සමනය කෙරිණි.

## ඉහළ ප්‍රතිවිපාක සහිත අවදානම් සාධක

### තාක්ෂණික පැතිකඩයන්

### අවදානම හඳුනා ගැනීම

කාර්යයන්හි ස්වභාවයට හා විදුලියේ පවත්නා භයානකත්වයට අනුව, අවදානම් සමන කාර්ය පරිපාටි ලං.වි.ම. මෙහෙයුම් කටයුතුවල කොටසක් වේ. ගුණාත්මක, විශ්වසනීය හා අරපිරිමැසුම්දායී විදුලි සැපයුම්කරුවෙකු වශයෙන් ආයතනයේ නිසි ක්‍රියාකාරිත්වයට බලපෑමක් ඇතිකළ හැකි අවදානම් තත්ත්වයන් ලංකා විදුලිබල මණ්ඩලය විසින් හඳුනාගෙන ඇත.

අවදානම් හඳුනා ගනිමින් සිදුවීමේ සම්භාවිතාව හා සෘණාත්මක හෝ ධනාත්මක ලෙස සිදුවන ප්‍රතිවිපාකවල පෘථුලත්වයට අනුව එය කාණ්ඩගත කොට සුදුසු ක්‍රියාමාර්ග ගැනීම අත්‍යවශ්‍ය වේ. හඳුනාගත් හා කාණ්ඩගත කරන ලද ඉහළ ප්‍රතිවිපාක සහිත අවදානම් අතරින් සමහරක් සැලසුම්කරණ ක්‍රියාවලිය, ආයතනික සැලැස්ම, දිගු කාලීන ජනන ව්‍යාප්ති සැලැස්ම, දිගු කාලීන සම්ප්‍රේෂණ සංවර්ධන සැලැස්ම හා අයවැය තුළ ආමන්ත්‍රණය කෙරේ. සෙසු ඒවා වගකිව යුතුවන අංශ මගින් හදිසි කාර්ය පරිපාටි තුළ ආමන්ත්‍රණය කරනු ලබයි. ඇතිවීමේ බොහෝ අවකාශ සහිත හා ඉහළ සෘණාත්මක ප්‍රතිවිපාක සහිත සිදුවීමක් ලෙස හඳුනාගත් සිදුවීමක් වන, 2020.08.17 දින සිදුවූ දීප ව්‍යාප්ත විදුලිය බිඳ වැටීමෙන් අනතුරුව පද්ධතිය යථා තත්ත්වයට ගෙන ඒම සඳහා අනුගමනය කරන ලද කාර්ය පරිපාටි මේ සඳහා නිදසුනකි.

## මූල්‍ය අවදානම හා තාක්ෂණික කාර්ය සාධනය කෙරෙහි එමගින් ඇතිකරන බලපෑම

පිරිවැය පිළිබිඹු කරන සුළුවූ / පිරිවැය පියවා ගැනීමේ අයක්‍රමයක් නොපැවතීම ඉහළ ප්‍රතිවිපාක සහිත අවදානම් සාධකයකි. එම අවදානම මූල්‍ය කාර්ය සාධනයට පමණක් නොව තාක්ෂණික කාර්ය සාධනයටද බලපෑම් ඇතිකර ඇත.

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 30(2)(ආ) වගන්තිය යටතේ, බලයලත් කටයුතු ක්‍රියාත්මක කිරීමේදී දැරීමට සිදුවූ සියලු සාධාරණ පිරිවැය පියවා ගැනීමට ලං.වි.ම. වෙත අවසර ලබාදී ඇත. එම වගන්තියෙහි අරමුණ වනුයේ ලං.වි.ම. වෙත මූල්‍යමය ලෙස ක්‍රියාත්මක වියහැකි ආකාරයකින් එහි සියලු කේන්ද්‍රීය කටයුතු නොකඩවා සිදු  කිරීමට හැකිවන බවට වගබලා ගැනීමයි. කෙසේ වුවද, පිරිවැය පියවා ගැනීමේ අයක්‍රමයක් නොමැති වීම මගින් ලං.වි.ම.ට එහි කේන්ද්‍රීය කාර්යයන් කාර්යක්ෂමව හා ඵලදායක ලෙස සිදු කිරීමට නොහැකි වීමේ අවදානම ඉහළ නංවා තිබිණි.

1969 ලංකා විදුලිබල මණ්ඩල පනතේ V කොටස යටතේ, ලං.වි.ම.ට සිය පිරිවැය පියවා ගැනීම සඳහා අයක්‍රම හා ගාස්තු පැනවීමේ බලතල පැවතිණි. කෙසේ වුවද, ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩල පනත යටතේ එම බලතල පරිච්ඡින්න කොට නියාමනායතනය වන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත ලබාදෙන ලදී. සමස්ත රට තුළම 'ඒකාකාර වූ ජාතික අයක්‍රමයක්' (UNT) පැවතීම රජයේ ප්‍රතිපත්තිය වන බැවින්, එසේ ඒකාකාර වූ ජාතික අයක්‍රමයක් පවත්නා කාල පරිච්ඡේදයන්හි සියලු පාරිභෝගිකයන් වෙත අදාළ වන්නාවූ අවසන් පරිභාරක අයක්‍රම සැලැස්මක් ස්ථාපනය කිරීම තනි බලපත්‍රලාභියෙකු හට සිදුකළ නොහැකි කාර්යයක් වන බැවින්, එය ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ වගකීම බවට පත් කෙරිණි. අඩු පිරිවැය විදුලි බලාගාර ඉදි කිරීමේ නොහැකියාව මගින්ද මූල්‍ය අලාභය වඩාත් අයහපත් අතට හරවා තිබිණි. ද්‍රව ස්වභාවික වායු හඳුන්වා දීමත් සමගින්, ජනන පිරිවැයෙහි යම් අඩුවීමක් සිදුවනු ඇතැයි ලං.වි.ම. අපේක්ෂා කරයි. කෙසේ වුවද, ද්‍රව ස්වභාවික වායු සහිත තත්ත්වයක පවා, ගාස්තු ඉහළ නැංවීමකින් හෝ සහනාධාර ලබාදීම හරහා රාජ්‍ය මැදිහත්වීමකින් හෝ තොරව පිරිවැය පියවා ගැනීමේ මට්ටමට ලං.වි.ම. ආදායම ළඟාවනු ඇතැයි අපේක්ෂා නොකෙරේ.

රජයේ ප්‍රතිපත්තිමය තීරණ මගින් අවශ්‍යතාවයක් ඇති කොට ඇති බැවින්, සහනාධාරය ප්‍රතිපූරණය කරගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස මේ දක්වාද ලං.වි.ම. විසින් නොකඩවා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙතින් ඉල්ලීම් කර ඇත.

## ප්‍රමාණවත් නොවන ජනන ධාරිතා අවදානම

ලං.වි.ම. දිගු කාලීන ජනන ව්‍යාප්ති සැලසුම් තුළ හඳුනාගෙන ඇති (දිගු කාලීන අවශ්‍යතා මෙන්ම මැදි කාලීන රික්තයන් පිරවීමේ අවශ්‍යතා සඳහාද වූ) විදුලි ධාරිතාවයන් සැලසුම්ගත අයුරින් ක්‍රියාත්මක කොට නොමැති අතර, ඒ හේතුකොට ලං.වි.ම.ට අපේක්ෂිත මට්ටමට වඩා අඩුවූ සංචිත ධාරිතා ආන්තිකයක් සමගින් ක්‍රියාත්මක වන්නට සිදුව ඇත. කලින් කලට සැලසුම්ගත ජනන එක් කිරීම් ඉදි කිරීමට නොහැකි වීම මගින් දුෂ්ට චක්‍රයක් ක්‍රියාත්මක කරවනු ලබයි. අඩු සංචිත ආන්තිකයන් ඇති විටදී පවත්නා විදුලි බලාගාර සැලසුම්ගත පරිදි වැළකුම් නඩත්තු කටයුතු හෝ වෙනත් එදිනෙදා නඩත්තු කටයුතු සඳහා ගෙන යාමේ හැකියාව වළකාලනු ලබයි. එය එම යන්ත්‍රවල විශ්වසනීයත්වයට බලපෑමක් ඇති කරන අතර ඉල්ලුම සපුරාලීම සඳහා පවත්නා ධාරිතාවය තවදුරටත් පහළ මට්ටමකට ඇද දමනු ලබයි. සංචිත ධාරිතාවය පහළ යාම මගින් විශාල බලාගාරයක් දිගු කාලීනව විදුලිය ඇණ හිටි තත්ත්වයක පවත්නා විටදී අතින් භාර වැගිරීම් (Load Schedding) ඇති කළ යුතුවන තත්තවයක් නිර්මාණය කරනු ලබයි. තවද, පද්ධතිය තුළ පවත්නා සංචිත ජනන ධාරිතාවයේ අප්‍රමාණවත්බව මගින් දිගු කාලීන වියළි කාලගුණික තත්ත්වයන් තුළ හා/හෝ විශාල ජනන ඒකකයක් ඇණහිට ඇති අවස්ථාවක වරින් වර කෙටි කාලීන පරිපූරක විදුලි ප්‍රසම්පාදනයන් සිදු කළයුතු තත්ත්වයක් ලං.වි.ම. කෙරෙහි ඇති කරවනු ලබයි.

## ජාල පුළුල් කිරීමේ අවදානම - ජාල පුළුල් කිරීමේ ප්‍රමාදය

අනාගත විදුලි බලාගාරයන් වෙතින් විදුලිය ගෙන යාම පිණිස හා වඩාත් විශ්වසනීය අයුරකින් වර්ධනය වෙමින් පවත්නා බලශක්ති ඉල්ලුම සපුරාලනු පිණිසද, අධි, මැදි හා අඩු වෝල්ටීයතාවයන් සඳහා ජාල ව්‍යාප්ති කටයුතු සැලසුම් කෙරේ. මේවා තුළට නව සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ පරිපථ ඉදිකිරීම, නව උපපොළ විශාලනය / ඉදිකිරීම, ජාල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම් ආදිය ඇතුළත් වේ. ජනන බලාගාරයන් වෙතින් විදුලිය පිට

# අවදානම් සමාලෝචනය

කිරීම සඳහා නව සම්ප්‍රේෂණ රැහැන් ඉදි කිරීම ජනන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමත් සමගින් නිසි පරිදි කාල සැලසුම්ගත කළ යුතුය. මක් නිසාද, ඉහත මුල් කරුණ ප්‍රමාද වන්නට වන්නට පසුකී ඒකකයන් වෙතින් විදුලිය හිස් කිරීම ප්‍රමාද කෙරෙන බැවිනි. තවද, වසර 20ක් හෝ එයටද වැඩි කාලයක් සේවය සලසා ඇති මැදි වෝල්ටීයතා ජාලයේ සංගත වායු පරිවරණිත උපපොළද ඇතුළු යම් ස්විච්චිපන්නයන්හි විශ්වසනීයත්වය විග්‍රහ කොට බැලීමට කාලය එළැඹ ඇත. මෙම ප්‍රධාන සේවා හා කර්මාන්ත වෙත නොකඩවා විදුලිය සපයන බවට වගබලාගනු පිණිස විදුලි සැපයුම් විකල්ප පවත්නේද යන්න විමසා බැලීමේ අදහසින්, ජල සම්පාදන, ඛනිජ තෙල් හා අපනයන සැකසුම් කළාපයන් බඳු කර්මාන්තයන් වෙතද ප්‍රධාන උපයෝගිතා සේවාවන් සපයන එවන් උපපොළයන්හි විශ්වසනීයත්වය නව්‍ය දෘෂ්ටි කෝණයකින් විමසා බැලිය යුතුව පවතී. තවද, ජාලයන්හි විශ්වසනීයත්වය වැඩිදියුණු කරනු පිණිස මාරු කළ යුතුවන පැරණි ජාල උපකරණයන්ද පවතී. එවන් මාරු කිරීම් සඳහා මෙන්ම ජනන මෙන්ම සම්ප්‍රේෂණ ජාලයන්හිද සංචිත හා අතිරික්ත ධාරිතා තත්ත්වයන් මධ්‍යයේ එවන් කාර්යයන් සිදු කිරීම සඳහා විදුලිය ඇණ හිටුවීම් ලබාගැනීම සඳහාද අරමුදල් ලබාගැනීම බරපතල අභියෝගයක් හා අවදානමක් සේ පෙනීගොස් ඇත. යන්ත්‍ර ක්‍රියා විරහිතව පවත්නා කාලයන්හි සිදුවන ප්‍රමාදයන්ගෙන් හෝ දැඩි විපත්තියක් ඇති කිරීමකින් හෝ තොරව කල් තබා යථාවත් කිරීමේ කාර්යයන් ආරම්භ කළ හැකිවන පරිදි දෝෂ අවස්ථාවන් කල්තබා පුරෝකථනය කිරීමේ හැකියාව ලබා දෙන්නාවූ තත්ත්ව නිරීක්ෂණ අභ්‍යාස නොකඩවා සිදු කිරීම මගින් යම්තාක් දුරකට මෙම ජාල උපකරණ සමහරක පැවැත්ම ආශ්‍රිත අවදානම අවම කරනු ලබයි.

## මානව සම්පත් අවදානම - පුහුණු හා අභිප්‍රේරිත කාර්ය බලකායක් පවත්වාගෙන යාමේ අභියෝග

පුහුණු කාර්ය බලකායක් සිටීම යනු අස්පර්ශනීය වත්කමක් වන අතර, ජාල උපකරණ මනා සේ පවත්වාගෙන යාම සඳහා එය අත්‍යවශ්‍ය වේ. ජාතිය වෙත ගුණාත්මක සේවාවක් ලබාදීමේ අපේක්ෂාව පෙරදැරි කොටගත් ලං.වි.ම. කේන්ද්‍රීය කටයුතු පවත්වාගෙන යාම සඳහා සේවා නියුක්තිකයන් අභිප්‍රේරණය කරගැනීම වැදගත් වේ. තවද, සේවා නියුක්තිකයන්ගේ තෘප්තිමත්භාවය කර්මාන්තය ආශ්‍රිත ආරවුල් වළකාලීමේ ප්‍රධාන සාධකයක් වේ. අඛණ්ඩ පුහුණු වැඩසටහන් හා සේවාස්ථ පුහුණු මගින් ලං.වි.ම. විසින් කුසලතා පූර්ණ කාර්ය බලකායක් නඩත්තු කරනු ලබයි. මෙම අභ්‍යාසය නොකඩවා සිදු කිරීම විෂයයෙහි කොවිඩ් - 19 වසංගතය මගින් යම් අහිතකර බලපෑමක් ඇති කළේ වුවද, මෙම ප්‍රවීණත්වය නොකඩවා පවත්වාගෙන යනු පිණිස හැකිතාක් දුරට මාර්ගගත පුහුණු හා ධාරිතා සංවර්ධන වැඩසටහන් සිදු කිරීමේ ප්‍රයත්නයන් දරනු ලබයි. ඇතැම් රැකියාමය කටයුතුවල පවත්නා ඉහළ විශේෂඥතා ස්වරූපය සැලකිල්ලට ගනිමින්, අත්‍යවශ්‍ය තාක්ෂණික ක්ෂේත්‍රයන්හි ප්‍රවීණත්ව හැකියාවන් රඳවා ගැනීමේ අදහසින් සම්ප්‍රදායික ස්ථාන මාරු ප්‍රතිපත්තියට නව මංපෙත් හඳුන්වා දීමට අපේක්ෂා කරනු ලබයි.

## ණය දෙන ආයතනයන් වෙතින් ඇති කෙරෙන පීඩනය හේතුකොට ප්‍රමුඛතා ක්ෂේත්‍රයන් වෙතින් අරමුදල් ලබාගැනීමේ අවදානම

1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතේ 38වන වගන්තිය යටතේ, මණ්ඩලයේ සේවාවන් සංවර්ධනය කිරීමේ පිරිවැයෙන් සැලකිය යුතු කොටසක් ආවරණය කිරීම සඳහා මණ්ඩලයේ ආදායම ප්‍රමාණවත් වන බවට වගබලා ගැනීමේ වගකීම මණ්ඩලය වෙත පවරන ලදී. අයක්‍රම හා ගාස්තු පැනවීමේ බලතල නමැති එවන් අරමුදල් ලබාගැනීම සඳහා ලං.වි.ම. සතු 'මෙවලම' 2009 වසරේදී ලං.වි.ම. වෙතින් ඉවත් කරන ලදුව, ශ්‍රී ලංකා විදුලිබල පනත මගින් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත ලබාදෙන ලදී. විශේෂයෙන් ජාත්‍යන්තර අරමුදල් ලබාගත නොහැකිවන තැන්හිදී, ආයතනය සතු අරමුදල් නොමැති වීම ජනන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මෙන්ම සම්ප්‍රේෂණ / බෙදාහැරීමේ ජාල ප්‍රවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන්ද පවත්නා පොදු ගැටලුවකි. විදුලි ක්ෂේත්‍රයේ ආයෝජන තීරණ, විදුලි ඉල්ලුම, වෙනස්වන රජයේ ප්‍රතිපත්ති, පරදුකරු අපේක්ෂාවන්, සැපයුම් ජාල ගැටලු, ව්‍යාපාර සහ සම්බන්ධතා මෙන්ම දේශගුණික ප්‍රතිපත්ති මගින් ඇති කෙරෙන පීඩනයද ඇතුළත් සංකීර්ණ සාධක ගණනාවක් මගින් හැඩ ගස්වනු ලබයි. ෆොසිල ඉන්ධන, රජය සතු උපයෝගිතා ව්‍යුහ ආදිය කෙරෙහි ලෝකයේ වෙනස් වෙමින් පවත්නා අදහස් හා අනුගත වනු පිණිස අරමුදල් සපයන ආයතන විසින්ද ඔවුන්ගේම අරමුදල් සැපයීමේ ප්‍රතිපත්ති ගොඩනගනු ලැබ ඇත. එබැවින්, ලං.වි.ම. සැබෑ අවශ්‍යතාවයට වඩා අරමුදල් සපයන ආයතනයන්හි ප්‍රතිපත්ති සම්පූර්ණ කරන්නාවූ ක්ෂේත්‍ර කෙරෙහි පමණි අරමුදල් සපයනු ලබන්නේ.

ණය ගිවිසුම් හරහා කොන්දේසිවලට අනුගතව කටයුතු කළ යුතු බවට අවධාරණය කිරීම තුළින්ද ප්‍රමුඛතා ක්ෂේත්‍රයනට වඩා ණය දෙන ආයතන ණය ලබාදීමට කැමැත්තක් දක්වන ක්ෂේත්‍ර වැනි ක්ෂේත්‍ර කෙරෙහි සීමිත ණය ගැනීමේ අවකාශයද යෙදවීමට ආයතනයට බල කෙරී ඇත.

## මහජන අවබෝධයෙහි අවදානම හා උපයෝගිතා සැලසුම් කෙරෙහි පවත්නා අභියෝග

විදුලිය හුදෙක් රටේ සමස්ත බලශක්ති පරිභරණයෙන් 12%ක ප්‍රමාණයකට පමණක් වග කියනු ලබන නමුදු, ඉතිරි 88%ට වඩා, බොහෝ විට පවත්නා ඉහළ වාණිජමය ඇල්ම හේතුවෙන්, මාධ්‍ය, රාජ්‍ය නොවන සංවිධාන, පාරිසරික බලපෑම් කණ්ඩායම් ආදියෙහි වැඩි අවධානයක් විදුලි අංශය වෙත ආකර්ශනය වේ. විදුලි අංශය යනු පොදු ජනතාවගේ පමණක් නොව විදුලි පද්ධතිමය අත්දැකීම් නොමැති මූලික ඉංජිනේරු අධ්‍යාපනයක් සහිත අයගේද අවබෝධයෙන් බැහැරව පවත්නාවූ අතිශය විශේෂීකරණය වූ විෂයයකි. එහෙයින්, උපයෝගිතා සැලසුම් හා තීරණ පිළිබඳව පොදු ජනතාව හා මාධ්‍ය වෙත ඒත්තු ගැන්වීම හා සාධාරණීකරණය කිරීම ඉතා දුෂ්කර කාර්යයකි. විදුලි අංශය තුළ අතිශය ආකර්ශනීය ව්‍යාපාරික අවස්ථාවන් පවත්නා බැවින්, තමාට සම්බන්ධ විය හැකි ව්‍යාපාරික ක්ෂේත්‍රයනට සහාය දක්වනු ලබන අයුරින් සැලසුම් හා ප්‍රතිපත්ති වෙනස් කරමින් තම ව්‍යාපාරික කටයුතුවලට අදාළ තාක්ෂණයනට අවකාශ සැලසීමේ ව්‍යාපාරික අභිලාශයන් සහිත කණ්ඩායම් වෙතින් එල්ලවන බලපෑම් පිළිබඳ සැලකිය යුතු අවදානමක් පවතී.

ලං.වි.ම. සැලසුම්, ව්‍යාපෘති හා කාර්යයන් පිළිබඳ වරදවා වටහා ගැනීමේ මෙකී අවදානම් තත්ත්වයන් යම්තාක් දුරකට සමනය කරනු පිණිස, ආයතනික ප්‍රතිරූපය ගොඩනගා පවත්වාගෙන යාමට අදාළ කටයුතු සඳහා කැපවූ ක්‍රමෝපාය සන්නිවේදන ඒකකයක් (SCU) ඇති කිරීම සඳහා වූ යෝජනාවක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කොට ඇත.

## ප්‍රතිපත්ති වෙනස් කිරීමේ අවදානම

විදුලි ව්‍යාපෘතීනට දිගු කාලීන වර්ධන කාල පරිච්ඡේදයන් පවත්නා බැවින් සංවර්ධන කටයුතු කල්තබා ආරම්භ කරනු පිණිස අවශ්‍ය දිනට බොහෝ පෙර සිට සැලසුම් සකස් කෙරේ. විදුලිය ව්‍යාප්ත කිරීම සඳහා සැලසුම් කිරීම පවා සැලකිය යුතු කාලයක් ගත වන්නකි. එබැවින්, රජයේ ප්‍රතිපත්ති පැහැදිලි හා අඛණ්ඩ ඒවා විය යුතුවේ. වෙනස් වන හා අඛණ්ඩ නොවූ රාජ්‍ය ප්‍රතිපත්ති මගින් උපයෝගිතා සැලසුම්කරණයට හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ප්‍රධාන පෙළේ අභියෝග හා අවදානම් ඇති කරවනු ලබයි.

## සයිබර් අවදානම

ආයතනය වඩ වඩාත් තොරතුරු තාක්ෂණයට නැඹුරු වී ඇත. සියලුම ශාඛාවන් පාහේ ජාල ගතකොට එකිනෙක හා සම්බන්ධ කොට ඇත. එක් ස්ථානයකට සයිබර් ප්‍රහාර ස්වරූපයෙන් ඇතුළු වීමක් යනු එය සමස්ත ජාලය පුරා විහිදී යා හැක්කක් වන බැවින්, මෙමගින් ඒවා බාහිර සයිබර් ප්‍රහාරයන්හි බලපෑමට ලක්වීමේ ඉහළ අවදානමකට පත්ව ඇත.

ලං.වි.ම. වැනි විදුලි උපයෝගිතා ආයතන විසින් පොදුවේ භාවිත කරනු ලබන මෙහෙයුම්ගත තොරතුරු තාක්ෂණ පද්ධති විසින් සන්නිවේදන හා පාලන අවශ්‍යතා උදෙසා තොරතුරු තාක්ෂණය

# අවදානම් සමාලෝචනය

පුළුල්ව යොදාගෙන ඇත. කෙසේ වුවද, මෙම මෙහෙයුම් හා පද්ධති බොහෝ කොටම හුදෙකලා ඒකක වශයෙන් ක්‍රියාත්මකවන අතර, කළමනාකරණ තොරතුරු තාක්ෂණ පද්ධතීන් මෙන් නොව බාහිර සමගින් සම්බන්ධ වනුයේ අල්ප වශයෙනි. තවද, මෙහෙයුම් තොරතුරු තාක්ෂණ පද්ධති බාහිරට සම්බන්ධ කෙරෙන විටදී, ඒවාහි ද්වාරයන් ලෙස පිරිවැය අධික ආරක්ෂක උපකරණ පවතින ස්වරූපයක් දැකිය හැක. එබැවින් ඒවා කෙරෙහි බාහිරින් ප්‍රහාර එල්ල වීමේ හා බාහිර මැදිහත්වීම් ඇතිවීමේ ඇති අවදානම පහළ අගයක් ගනී. කෙසේ වුවද, නිරතුරු සයිබර් ප්‍රහාර අවදානමක් පවතී. ප්‍රහාරකයන් ආරක්ෂක පද්ධතිවල පවත්නා හිදැස්වලින් ප්‍රයෝජන ගැනීම හා මානව දුර්වලතා හා අත් වැරදීම් හේතුකොට මෙය සිදුවිය හැක. තාක්ෂණිකව ඉහළ දියුණුවක් ලබා ඇති රටවල් පවා මෙහෙයුම්ගත තොරතුරු තාක්ෂණ පද්ධතිවලට මැදිහත් වන්නාවූ අනවසරයෙන් දත්ත ලබාගන්නන්ගේ ඉලක්ක හා ප්‍රහාරයනට ලක්ව ඇත.

## මූල්‍යමය පැතිකඩයන්

ජාතිය වෙත විදුලිය සැපයීමේ ඒකාධිකරයකට සමාන තත්ත්වයක් පවත්වාගෙන යන රජය සතු නිශ්චිත ව්‍යාපාරයක් වන ලංකා විදුලිබල මණ්ඩලය බොහෝ අවදානම්වලටද නිරාවරණයව පවතී. මූල්‍යමය නොවන ජනන, සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ අවදානම් කෙරෙහි සුවිශාල නිරාවරණයක් සහිත උපයෝගිතා ආයතනයක් වුවද, විවිධ ප්‍රචාරණ මාර්ග ඔස්සේ ලං.වි.ම. මූල්‍ය අවදානම්වලටද නිරාවරණයව ඇත.

අයක්‍රම ව්‍යුහයේ පවත්නා සීමාවන් හේතුකොට, ලං.වි.ම. ව්‍යාපාරික මාදිලිය තුළ දේශීය මෙන්ම විදේශීය බැංකු වෙතින්ද ණය ගැනීමේ කටයුතු ඇතුළත් වන අතර එහිදී ආයතනය ඉහළ පහළ යන්නාවූ පොළී අනුපාත හා විනිමය අනුපාතයනටද නිරාවරණය වේ. ණය ගැනීම් හා බලශක්ති මූලාශ්‍රයන් මිලදී ගැනීම සඳහා විදේශ විනිමය පිටතට ගලා යාම් ඒ හා සමාන විදේශ විනිමය ආගලනයන් මගින් සමතුලනය කළ නොහැකි වනුයේ ලං.වි.ම.හි විදුලි අලෙවියට අදාළ ප්‍රධාන මූල්‍ය ආගලනයන් දේශීය මුදල් ඒකකය තුළින් මිනුම්ගත වන බැවිනි. විවිධාකාර වූ සාර්ව ආර්ථික හේතු පාදක කොටගෙන අරමුදල් සැපයීමේ පිරිවැයෙහි සිදුවන ඉහළ යාමට අනුපාතිකව අලෙවි ආදායම ඉහළ නැංවීමේ හැකියාවක් ලං.වි.ම. සතු නොවේ. එබැවින් ආයතනයේ ආර්ථික වටිනාකම ආරක්ෂා කරගනු වස් අඛන්ඩ මූල්‍ය අවදානම් විශ්ලේෂණයන් හා අවදානම් කළමනාකරණයන් පවත්වාගෙන යාම අතිශයින් වැදගත් වේ.

## මූල්‍ය අවදානම් කළමනාකරණ රාමුව

ලං.වි.ම. අධ්‍යක්ෂ මණ්ඩලය හා සාමාන්‍යාධිකාරීවරයා ආයතනයේ අවදානම් කළමනාකරණය හා විශ්ලේෂණය සම්බන්ධයෙන් අවසාන වගකියන්නෝ වෙති. කෙසේ වුවද, සාමාන්‍යාධිකාරීවරයා යටතේ කටයුතු කරමින් මූල්‍ය කළමනාකරු වෙත සෘජුව වාර්තා කරන්නාවූ අතිරේක මූල්‍ය කළමනාකරුවෙකුගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක, 2018දී ස්ථාපනය කරන ලද භාණ්ඩාගාර කළමනාකරණ ශාඛාව ලං.වි.ම. මූල්‍ය අවදානම් කළමනාකරණයෙහි ලා තීරණාත්මක කාර්ය භාරයක් ඉටු කරයි.

## මූල්‍ය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය

ලං.වි.ම. අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය ලං.වි.ම. හා එහි අංශ සඳහා ස්ථාපිත සමස්ත අවදානම්, ද්‍රවශීලතා හා මූල්‍ය ධාරා කළමනාකරණ රාමුවෙහි කොටසක් වේ. ප්‍රතිපත්තියේ මූලික අරමුණ වනුයේ ද්‍රව්‍යාත්මක මූල්‍ය අවදානම් හඳුනාගෙන, මිනුම්ගතකොට, සීමා කොට, කළමනාකරණය කරමින් නිරීක්ෂණය කිරීමේ ශක්තිමත් රාමුවක් අර්ථ කථනය කිරීමයි. එමගින් ආයතනය තුළ මූල්‍ය අවදානම් සඳහා වූ දැක්ම හා දැනුවත්භාය වැඩිදියුණු කරන්නාවූ ඵලදායක අවදානම් සංස්කෘතියක් පිහිටුවීම ඉලක්කගත කෙරේ. තවද, දැරිය හැකි මට්ටමකට අවදානම් වෙත වූ නිරාවරණ තත්ත්වය සීමා කරමින් මූල්‍ය වෙළඳපලයන් වෙතින් එන කම්පනයනට එරෙහිව ලං.වි.ම. සේවාවන් ප්‍රතිශක්තිකරණය කිරීම එමගින් සිදු කරනු ලබයි. ඒ අනුව, භාණ්ඩාගාර කළමනාකරණ කණ්ඩායම් විසින් පවත්නා අවදානම් නිරාවරණ තත්ත්වය හඳුනාගනු පිණිස නොකඩවා මූල්‍ය දත්ත විශ්ලේෂණය කිරීම සිදුකරන අතර, අවදානම් සමනය කරනු පිණිස ගත යුතුවන ප්‍රතිකර්මක ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් සාමාන්‍යාධිකාරීවරයා හා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ ලබා දෙනු ලබයි.

## මූල්‍ය අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය

ලං.වි.ම.හි මූල්‍ය අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය තුළ පියවර 5ක් අන්තර්ගත වේ.




"අවදානම හඳුනා ගැනීම" යනු වාර්ෂිකව සිදුවන ඉහළ සිට පහළට විහිදෙන්නාවූ ක්‍රියාවලියකි. ආරම්භක පියවරක් වශයෙන් අඩු ආදායම් හා ඉහළ පිරිවැය ඇති කරවන්නාවූ හේතු සාධක විමසා බැලීම සඳහා හා ඉන්පසු ද්‍රවශීලතා තත්ත්වය ප්‍රකම්පණය කරවන්නාවූ අනපේක්ෂිත ලෙස ඉහළ පිටත ගලනයන් ඇති කරවන ගනුදෙනු හා හේතු සාධක ලෙසද, ආදායම් ප්‍රකාශනය ප්‍රධාන සංරචකවලට වෙන් කෙරේ. ඒ අනුව, අනාගත ආදායම් හා පිරිවැය ප්‍රමාණකරණය කිරීමේ හැකියාව ලබාදෙන ඉල්ලුම සපුරා ලීම පිණිස අනාගත ඉල්ලුම් අවශ්‍යතා හා ජනන මුහුව හඳුනා ගැනීම සඳහා භාණ්ඩාගාර කළමනාකරණ කණ්ඩායම විසින් දිගු කාලීන ජනන සැලැස්ම ප්‍රවේශමින් අධ්‍යයනය කරනු ලබයි. ඒ අනුව, අනාගත මුදල් හිඟතාවයන් හා ද්‍රවශීලතා අවදානම් හඳුනාගනු ලැබ එම තත්ත්වයට මුහුණ දෙනු පිණිස මූල්‍ය සැලැස්ම සකස් කෙරේ.

"අවදානම් මිනුම්කරණය" යනු මිල ගණන්වල සිදුවන විචලනයනට යටත්ව ධාරිතාවය ප්‍රමාණකරණය හා යම් දෙනලද කාල පරිච්ඡේදයක් ඇතුළත සිදුවිය හැකි මිල උච්චාවචනයන්හි විශාලත්වයයි. විවිධ ජනන මුහු මත පදනම් වූ තත්ත්ව විශ්ලේෂණය යනු මූල්‍ය බලපෑම හා ආශ්‍රිත අවදානම් ප්‍රමාණකරණය පිණිස විවිධ තත්ත්වයන් යටතේ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය හා මූල්‍ය ධාරා තත්ත්වය, ලාභ/අලාභ මැනීම සඳහා යොදාගනු ලබන ප්‍රධාන මෙවලමකි.

"අවදානම් රුචිය" යන්නෙන් හැඳීන්වෙන්නේ පහසුවෙන් ගත හැකි අවදානම් ප්‍රමාණය ලෙස අධ්‍යක්ෂ මණ්ඩලයට හැඟෙන්නාවූ අවදානම් ප්‍රමාණය වන අතර, එය වාර්ෂිකව සකස් කරනු ලැබ, ලං.වි.ම. සාමාන්‍යාධිකාරීවරයාගේ නිර්දේශය මත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලබයි. "සීමා පැනවීම" මගින් අවදානම් රුචිය මෙහෙයුම්ගත කරනු ලබයි. යම් යම් අවදානම්වලට මුහුණ දෙන්නන් විසින් භාරගැනීමට අවසර ලබාදෙනු ලබන අවදානමේ ප්‍රමාණය අර්ථ නිරූපණය කරමින් එතුළ අවදානම් රුචිය කළමනාකරණය කළ හැකි ප්‍රමාණයනට බෙදා දක්වනු ලබයි. එක් එක් විධායක කාණ්ඩ සඳහා මෙන්ම ප්‍රසම්පාදන කමිටුවල විවිධ මට්ටම් සඳහාද වූ මූල්‍ය බලයේ සීමාවන් ස්ථාපනය කරමින් කලින් කලට චක්‍රලේඛ නිකුත් කෙරේ. මෙමගින් ඉහළ අවදානම් තත්ත්වයන් භාර ගැනීමෙහි වැඩි හැකියාවක් සහිත හා එම කටයුත්ත සඳහා අවසර ලබාදී ඇති වැඩි අත්දැකීම් සහිත හා දක්ෂ නිලධාරීන් විසින් ඉහල වටිනාකම් සහිත ගනුදෙනු විමසා බලා අනුමත කරන බවට වගබලාගනු ලබයි.

අවදානම් භාරගැනීම විමධ්‍යගතකිරීමක් පවත්නේ වුවද, මධ්‍යගත අවදානම් කළමනාකරණය ලං.වි.ම. "අවදානනම් කළමනාකරණයෙහි" පදනම්ගත මූලධර්මය වේ. කුඩා පරිමාණ ඒවා බොහෝ ගණනකට වඩා මහා පරිමාණ අවදානම් සමන ගනුදෙනුවලට පිවිසීම මගින් උපරිම වශයෙන් නිරාවරණ නිරවද්‍යකරණයක් සිදු කිරීමේ හැකියාව නමැති වාසි සහගත තත්ත්වයන් හේතුකොට අවදානම් කළමනාකරණය මධ්‍යගත කෙරේ. එක් එක් අංශයෙහි සතිපතා මුදල් අවශ්‍යතාවය මුදල් අංශයේ ගෙවීම් ඒකකය වෙත යොමු කෙරෙන අතර, එම ඒකකය මගින් දෛනික රැස්කිරීම් හා දෛනික මුදල් අවශ්‍යතාවයන් තක්සේරු කරනු ලබයි. ඒ අනුව, සමස්ත ලං.වි.ම. අරමුදල්කරණ අවශ්‍යතාවය හඳුනාගනු ලැබ, මුදල් අවශ්‍යතා සපුරාලමින් එක් එක් අංශයෙහි අවශ්‍යතා සඳහා එම අංශ වෙත අරමුදල් වෙන් කිරීම පිණිස වාසිදායක පොළී අනුපාත හා අරමුදල්කරණ වැඩපිළිවෙල වෙනුවෙන් බැංකු සමගින් සාකච්ඡා කෙරේ.

# අවදානම් සමාලෝචනය

"අවදානම් වාර්තාකරණය" යනු ලං.වි.ම. විසින් භාරගනු ලබන සැබෑ අවදානම් හා ඒවා මැඩ පැවැත්වීම පිණිස සිදුකරනු ලබන නිර්දේශ නිරතුරු වාර්තා කිරීමයි. මුදල් අංශය විසින් සකස් කරනු ලැබ, සාමාන්‍යාධිකාරීවරයාගේ නිර්දේශය මත අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරෙන මාසික කාර්ය සාධන වාර්තාවක් මගින් මූල්‍ය කාර්ය සාධනය, මූල්‍ය තත්ත්වය හා මුදල් ප්‍රවාහයන්හි සංචලනය පිළිබඳ සවිස්තරාත්මක විග්‍රහයක් ඉදිරිපත් කරනු ලබයි. තවද, ක්‍රියාත්මක කිරීමේ තීරණ ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට හැකියාව ලබා දෙමින් එමගින් ඉහත කී විශ්ලේෂණය හා එයට අදාළ නිර්දේශ මගින් හඳුනාගනු ලැබූ ඇතිවිය හැකි මූල්‍ය අවදානම් උද්දීපනය කරනු ලබයි.

## මූල්‍ය අවදානම් විග්‍රහය 2020

වසර 2020 ලං.වි.ම.ට පමණක් නොව සමස්ත ලෝකයටම අභියෝගාත්මක වසරක් විය. රට අගුලු දැමීම්, නිරෝධායනයන්, සමාජ දුරස්ථභාවයන් හා අත්‍යවශ්‍ය නොවන සේවා වසා දැමීමද ඇතුළුව කොවිඩ් - 19 වෛරසය පැතිර යාම සීමා කිරීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග මගින් ආර්ථිකය මන්දගාමී කරමින් ව්‍යාපාර කටයුතුවලට සැලකිය යුතු මට්ටමක බාධා ඇතිවිය.

## මුදල් හා ද්‍රවශීලතා කළමනාකරණය

කාර්යක්ෂම මුදල් හා ද්‍රවශීලතා කළමනාකරණයක් මගින් ආයතනයක ලාභදායකත්වය, ව්‍යාපාරයේ අඛන්ඩතාවය හා වර්ධනයද සැලකිය යුතු මට්ටමකින් වැඩිදියුණු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. තරගකාරී පරිසරය මගින් ලං.වි.ම.ට එහි අභ්‍යන්තර ක්‍රියාවලි ප්‍රමිතිකරණය කරමින් එහි අභ්‍යන්තර පාලනයන් ශක්තිමත් කරමින් වඩා දියුණු මුදල් කළමාකරණ විසඳුම් ගොඩනැගීම මගින් සිය රැස්කිරීමේ හා ගෙවීම් කාර්යයන් නැවත සමාලෝචනය කිරීමට බල කර ඇත.

වෛරසය පැතිර යාමත් සමගින්, ගනුදෙනුකරුවන්ගේ වැයකළ හැකි ආදායම පහත වැටී ඇත. බිල්පත් පියවීම සඳහා සහන කාලයක් ලබා දෙමින් ගාස්තු නොගෙවන ලද පාරිභෝගිකයන්ගේ විදුලි සම්බන්ධතා විසන්ධි කිරීම කල් දැමීම සඳහා වූ රජයේ තීරණය මගින් දැනටමත් බාධාවට ලක්ව ඇති මුදල් ප්‍රවාහයනට සැලකිය යුතු බලපෑමක් ඇතිවිය. එබැවින්, භාණ්ඩාගාර කළමනාකරණ කණ්ඩායමේ නිර්දේශය සහිතව, එම තත්ත්වය මැඩ පැවැත්වීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත සඳහන් ක්‍රමෝපායන් අනුමත කරන ලදී.

- කෙටි කාලීන බැරකම් මැදි කාලීන ණය මෙවලමක් බවට පරිවර්තනය කරමින් ශ්‍රී ලං.රු. බිලියන 20ක් වටිනා ජ්‍යෙෂ්ඨ ලැයිස්තුගත ණයකරයක් නිකුත් කිරීමට කටයුතු කිරීම වූකලි ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයට අදාළව ලං.වි.ම. පසුකළ ඓතිහාසික අවස්ථාවක් විය.
- මුදල් ගෙවීමේ කටයුතු දැඩිසේ ප්‍රමුඛතාගත කරමින් අත්‍යවශ්‍ය කටයුතුවලට පමණක් මූලධන වියදම් සීමා කිරීම මගින් වැදගත් මූල්‍ය ගනුදෙනු දැඩිසේ නිරීක්ෂණය කිරීමේ හැකියාව ලබාදෙන ලදී.
- MITFIN පද්ධතියෙහි ගෙවීම් සිදුකළ හැකි මොඩියුලයෙහි තාක්ෂණික ප්‍රගතිය මගින් මණ්ඩලයේ දෛනික ණය නිරාවරණ තත්ත්වයක් පවත්වාගෙන යාමේ හැකියාව ලබාදෙන ලද අතර, එය අනාගත මුදල් අවශ්‍යතාවයන් සැලසුම් කිරීමට උපකාරී විය.
- සැපයුම්කරුවන්ගේ ණය කාල පරිච්ඡේදය උපරිම වශයෙන් උපයෝජනය කරගැනීම මගින් ප්‍රමුඛතාගත ගෙවීම් සඳහා පවත්නා මුදල් යොමු කරවන ලදී.
- අඩු පොළී අනුපාතිකයන් හා දීර්ඝ කරන ලද ආපසු ගෙවීමේ කාල පරිච්ඡේදයන් දක්වා දැනට පවත්නා ණය කළඹ ප්‍රති-ව්‍යුහගත කිරීම.
- අලෙවි ආදායම් නිසි කලට රැස්කරගැනීමේ හැකියාව වර්ධනය කරමින් මාර්ගගතව මුදල් රැස් කිරීමේ පහසුකම් ව්‍යාප්ත කිරීම මගින් මෙම වසංගත තත්ත්වය තුළ සිය බිල්පත් පියවීම සඳහා පාරිභෝගිකයන් වෙත වැඩි විකල්ප අවස්ථාවන් පිරිනමන ලදී.
- තරගකාරී පොළී අනුපාතිකයන් ආකර්ශනය කරගනු පිණිස රජයේ බැංකුවලට අමතරව පුද්ගලික වාණිජ බැංකු කරාද මූල්‍ය විකල්ප ව්‍යාප්ත කරවන ලදී.
- මූල්‍ය තත්ත්වය ශක්තිමත් කිරීම සඳහා මුදල් අයකර ගැනීමේ මාදිලිය සකස් කිරීම.

# තිරසාරභාවය පිළිබඳ වාර්තාව

### විදුලි කර්මාන්තයේ තිරසරබව වෙනුවෙන් අපගේ ප්‍රවේශය

තිරසරබව යනු ලං.වි.ම. මෙහෙවර ප්‍රකාශනය තුළ ඇතුළත් කර ඇති, ආයතනයේ හර වටිනාකම් අතරින් එකකි. ලං.වි.ම. විශ්වාසය වනුයේ සමාජ, පාරිසරික හා ආර්ථික නමැති කුලුණු තුන මත තිරසරබව රඳා පවත්නා බවයි. එබැවින්, සමාජ, පාරිසරික හා ආර්ථික පැතිකඩයන් අතර නිවැරදි සමතුලනයක් පවත්වා ගනිමින් සිය ප්‍රධාන මෙහෙයුම් කටයුතු සියල්ල සිදු කිරීමට ලං.වි.ම. කැපවී සිටී.




### ආර්ථික තිරසරබව

ශ්‍රී ලංකා ආර්ථිකයේ විදුලිබල අංශය තුළ, ලං.වි.ම. යනු බලවත් ආයතනයකි. එම ආයතනය මගින් අන් කිසිදු මූලාශ්‍රයකින් ආදේශනය කිරීම දුෂ්කර වන අත්‍යවශ්‍ය දෙයක් වන විදුලිය නොකඩවා වර්ධනය වන ඉල්ලුම සපුරාලීමේ අදහසින් සපයනු ලබයි. ලං.වි.ම. පාඩු ලබන ආයතනයක් නොවිය යුතුය යන්නට මූලික ආර්ථික විද්‍යාත්මක න්‍යායක් තුළ තර්කයක් ගොඩ නැගිය හැක. කෙසේ වුවද, 1969 වසරේ ආරම්භයෙන් පසු ලං.වි.ම. වසර ගණනාවක් පුරා පාඩු ලබමින් සිටී. මක් නිසාද, සමාජමය හා දේශපාලනික සන්දර්භයක් තුළ, ලං.වි.ම. යන්න ජනතාවට සේවා සපයන ආයතනයක් ලෙස සැලකෙන බැවිනි.

ඒ අනුව, විදුලිය ජනනය, සම්ප්‍රේෂණය හා බෙදාහැරීම හා ඉනික්බිති ඒවාට අදාළ ඉදිකිරීම්, මෙහෙයුම් හා නඩත්තු අදියරයනට අදාළ ආයෝජනයන් සඳහාද වූ සැලසුම් කටයුතු ලං.වි.ම. විසින් සිදු කරනු ලබයි. මෙම කටයුතු (සංශෝධිත) 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත, 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනත, 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව පනත, 1980 අංක 47 දරන මධ්‍යම පරිසර අධිකාරිය පනත, පළාත් / මහනගර / පළාත් පාලන ආයතන නියමයන් මගින් මාර්ගෝපදේශනය, පාලනය හා නියාමනය කෙරේ.

ආයතනයේ ශක්‍යතාවය හා අනුගත මූල්‍යමය මූලධර්මයනට පටහැනිව එහි දිගු කාලීන ජනන ව්‍යාප්ති සැලැස්ම (LTGEP) සමස්ත රටම සඳහා වූ ආර්ථික මූලධර්ම මත සැකසේ. දිගු කාලීන ජනන ව්‍යාප්ති සැලැස්ම ශ්‍රී ලංකාවේ යටිතල පහසුකම් ආයෝජනයේ සැලකිය යුතු ප්‍රතිශතයකට වග කියන්නකි. දිගු කාලීන සම්ප්‍රේෂණ සැලැස්ම හා අංශයන්හි බෙදාහැරීමේ සැලසුම් ඒ අනුව ගෘහස්ථ, ආගමික, කර්මාන්ත හා වාණිජ වශයෙන් වූ පාරිභෝගිකයන් වෙත බලාගාර ප්‍රශස්ත අයුරින් සම්බන්ධ කරවයි.

ආයතනයේ මෙන්ම රටේද ආර්ථික තිරසරභාවය ආරක්ෂා කරනු පිණිස වාර්මාර්ග අවශ්‍යතාවයන්හි නිසි ක්‍රියාකාරිත්වයට බාධා සිදුකිරීමකින් තොරව හා ජනන මුහුව නිසි පරිදි සමතුලනය කරමින් ලං.වි.ම. විසින් ප්‍රශස්ත ජනන මුදාහැරීමක් සිදු කරන බවට වගබලාගනු ලබයි. එහි ප්‍රතිඵලයක් ලෙස, ආයතනයට නිෂ්පාදනයේ සාමාන්‍ය පිරිවැය කි.වො.පැයට ශ්‍රී ලං.රු. 21.21 අනුපාතයක පවත්වාගෙන යාමට හැකිවිය. කෙසේ වුවද, ලං.වි.ම. විසින් කි.වො.පැයකට ශ්‍රී ලං.රු. 16.72ක් වැනි අවම මිලකට විදුලිය අලෙවි කළ බැවින් පසුගිය වසර 8 පුරා විදුලි අයකුම ප්‍රතිශෝධනය නොකිරීම මූල්‍ය තිරසර බවට හානිකර බලපෑමක් විය.

### පාරිසරික තිරසරබව

ලං.වි.ම. විසින් සම්ප්‍රදායික පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතිද ඇතුළත් එහි කටයුතු තුළ පරිසරය ආරක්ෂා කිරීම සඳහාවූ නීතිරීතිවලට ක්‍රමානුකූලව අනුගතව ඇත.

ශ්‍රී ලංකාව යනු දේශගුණික විපර්යාසවල බලපෑමට ලක්වන රටක් වන අතර, සමන හා අනුගතකරණ විධික්‍රම දෙකම අවශ්‍ය වේ. දේශගුණික විපර්යාස මගින් ඇතිකරන ලද අභියෝගයනට ප්‍රතිචාරී ලෙස, සිදුවිය හැකි බලපෑම් ආමන්ත්‍රණය කිරීම සඳහා වූ ජාතික ප්‍රතිපත්ති, ක්‍රමෝපාය හා කටයුතුද හඳුන්වා දෙමින් ශ්‍රී ලංකා රජය විසින් ධනාත්මක පියවර ගණනාවක් ගෙන ඇත. සම්ප්‍රදායික ෆොසිල ඉන්ධන පදනම්ගත බලශක්ති මූලාශ්‍රයන් හා ඒකාබද්ධව පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍රයන් වඩ වඩාත් ඒකාබද්ධ කිරීම එක් ක්‍රමෝපායකි. ජාතික බලශක්ති ප්‍රතිපත්ති හා ක්‍රමෝපාය මගින් පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍රයන් තුළට වඩ වඩාත් කාවැදීමේ ක්‍රමවේදයක් ප්‍රකාශයට පත්කර ඇත. ඒ අනුව, ලං.වි.ම. විසින් එහි පුනර්ජනනීය බලශක්ති ධාරිතාවය 2020 වසර තුළ ස්ථාපිත සමස්ත ධාරිතාවයෙන් 49% දක්වා වර්ධනය කර ඇත. එය පසුගිය වසර හා සන්සන්දනාත්මකව 3.2%ක වර්ධනයකි.

තවද, මහා පරිමාණ සුළං විදුලි ගොවිපල, සූර්ය ගොවිපල ආදිය ස්ථාපනය හා සෙසු පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍රයන් පවත්වාගෙන යමින් ගවේෂණයද වඩා පවිත්‍ර පරිසරයක් ඇති කරවීමේ අදහසින් වසර තුළ සිදු කෙරිණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ලං.වි.ම. විසින් ලං.වි.ම. සතු පළමු මහා පරිමාණ සුළං විදුලි බලාගාරය ජාතික වෙත ප්‍රදානය කරන ලදී. එය මන්නාරමේ තම්බපවනි සුළං විදුලි බලාගාරයයි.

අනෙක් අතින්, අඩු පිරිවැය ජනනය ආර්ථික තිරසර බවේ පදනමයි. ආයතනයේ මෙන්ම සමස්තයක් ලෙස මුළු රටේමද ආර්ථික තිරසරබව පවත්වාගෙන යනු සඳහා ලං.වි.ම. විසින් ගල් අඟුරු හා ද්‍රව ස්වභාවික වායු වැනි අඩු පිරිවැය විදුලි ජනන මූලාශ්‍රයන් ඇතුළත් කිරීමේ අරගලයක නිරතව සිටී.

කවර වූ හෝ විදුලි බලාගාරයක්, සම්ප්‍රේෂණ මාර්ගයක් හෝ ජාල උපපොළක් ඉදි කිරීමේදී වන නාශනය හෝ ශාකවල කොටසක් හෝ අහිමි වීම නොවැළැක්විය හැක්කකි. කෙසේ වුවද, මෙම ඉදිකිරීම් අනුමත පාරිසරික බලපෑම් තක්සේරු අධ්‍යයනයන්හි නිර්දේශ ප්‍රකාර සිදු කෙරේ. සැලකිල්ලට ලක් වෙමින් පවත්නා සංවර්ධන විකල්ප පාරිසරිකව භව්‍ය හා තිරසර ඒවා වන බවට වග බලාගනු පිණිස පාරිසරික බලපෑම් තක්සේරු අධ්‍යයනයන් සිදු කරනු ලබයි. ඒ අනුව ව්‍යාපෘතිය සැලසුම් කිරීමේ මුල් අදියරේදීම පාරිසරික ප්‍රතිවිපාක හඳුනා ගනිමින් සැලකිල්ලට ලක් කිරීමට හැකිවනු පණිස, සැලසුම්ගත සංවර්ධන කාර්යය හේතුකොට ඇතිවන බලපෑම් පිළිබඳ සිය අදහස් ඉදිරිපත් කිරීමට මහජනතාවට හා සෙසු පරදුකරුවන් හට අවකාශ සලසා දුන්නෙමු. නිදසුනක් ලෙස, පාරිසරික බලපෑම් තක්සේරු අධ්‍යයනයන් තුළ පෙන්වා දෙන පරිදි වන නාශනයක් සිදුවන සෑම ඉදිකිරීමක් සඳහාම වන වගාවන් නැවත ස්ථාපනය කරමින් පවත්වාගෙන යාමේ පිරිවැය සපුරනු පිණිස (වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඇස්තමේන්තුගත කරනු ලබන) වන්දි මුදලක් ලං.වි.ම. විසින් එම දෙපාර්තමේන්තුව වෙත ගෙවනු ලබයි.

# තිරසාරභාවය පිළිබඳ වාර්තාව

සමාලෝචිත වසර තුළ, ජනන හා සම්ප්‍රේෂණ ව්‍යාපෘති දියත් කිරීමේදී හානිකර බලපෑම් වළකාලීම හෝ අවම කිරීම හා ධනාත්මක බලපෑම් වැඩි වර්ධනය කිරීම පිණිස එම අධ්‍යයනයන් තුළින් තවත් බොහෝ ක්‍රියාමාර්ග යෝජනා කර ඇත.

නිසි පරිදි සිදු කෙරෙන පාරිසරික බලපෑම් තක්සේරු ක්‍රියාවලියක් මගින් සියල්ලටම පළමු ස්වභාවික සම්පත් පරිහරණයට අපේක්ෂා කරන්නාවූ ව්‍යාපෘති යෝජකට හා සෙසු සංවර්ධනකරුවන් හට සෙත සලසනු ලබයි. මෙයට අමතරව, පාරිසරික බලපෑම් තක්සේරු ක්‍රියාවලිය මගින් ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති සිදු කිරීමට පෙර පාරිසරික (භෞතික හා ජීව විද්‍යාත්මක) හා සමාජමය කරුණු සැලකිල්ලට ගන්නා බව රජයේ ආයතන මෙන්ම ජනතාව විසින්ද වගබලාගන්නා එක්තරා ආකාරයක් සම්පාදනය කරනු ලබයි. කෙටියෙන් පවසන්නේ නම්, පාරිසරික බලපෑම් තක්සේරුව මගින් සංවර්ධකයන් හට තිරසර ආයෝජනයක්ද, ජනතාවට ජීවත් විය හැකි පරිසරයක්ද ලබාදෙන බවට සහතික කරනු ලබයි.

ජනන යන්ත්‍ර ක්‍රියාත්මක කිරීමේදී ලං.වි.ම. රටට අදාළ වන්නාවූ සියලුම පාරිසරික මාර්ගෝපදේශයනටම පාහේ අනුගතව කටයුතු කරන අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් සමාලෝචිත වසර තුළ ලං.වි.ම. විසින් සාමාන්‍ය විමෝචන දර්ශකය 0.555 කි.ග්‍රෑ./කි.වො.පැ. මට්ටමක පවත්වා ගන්නා ලදී. බලපත්‍රලාභියා විසින් පනවන ලද සීමාවන් තුළ මෙහෙයුම් කටයුතු සිදුවන බවට වගබලාගනු පිණිස වසර පුරා ලක්විජය ගල් අඟුරු විදුලි බලාගාරයේ මෙහෙයුම් කටයුතු කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වන ලදී.

තවද, පුද්ගලයන්ගේ හා උපකරණවල ආරක්ෂාව සහතික කරනු සඳහා විවිධ මට්ටම්හිදී විදුලි රැහැන් කි.මී. 187,848කට ආසන්න ප්‍රමාණයක මාර්ග හිම්කම පවත්වාගනු පිණිස ලං.වි.ම.ට (වනාන්තරවල, වගා භූමිවල හෝ ගෙවතුවල) ගස් කපා දැමීමට සිදුවිය. වන නාශනයට වන්දි පිණිස හා පාරිසරික තිරසරබව සහතික කරනු පිණිසද පසුගිය වසරවලදී මෙන් සමාලෝචිත වසර තුළදීද වගකිවයුතු ආයතනයක් වශයෙන් ලං.වි.ම. විසින් රුක් රෝපණ වැඩසටහන් පවත්වන ලද අතර, 2020 වසර තුළ පැල 6,500ක් පමණ රෝපණය කරන ලදී.

හිස් සන්නායකයන් වෙනුවට පරිවරණිත සමූහ සන්නායකයන් යෙදීම බඳු සෙසු අතින් බෙදාහැරීමේ සංවර්ධන කාර්යයන් මගින් මූලික තාක්ෂණික හේතුවලට ඔබ්බෙන් ජනතා ආරක්ෂාව සහතික කිරීම, ප්‍රශස්ත වගා කළමනාකරණය මගින් අවට පරිසරය ආරක්ෂා කිරීම ආදියට අදාළ සමාජ ගැටලු වක්‍රව ආමන්ත්‍රණය කරන ලදී. ශුද්ධ මානනය (Net Metering), ශුද්ධ ගිණුම්කරණය (Net Accounting) හා ශුද්ධ ධන (Net Plus) නමැති යෝජනාක්‍රම තුනක් යටතේ බලශක්තිය පරිභෝජනය හා අපනයනය කරමින් සිය ජනන යන්ත්‍ර ලං.වි.ම. පද්ධතිය සමගින් සම්මුහුර්ත කිරීම සඳහා සිය පරිශ්‍ර ඇතුළත වහළය මත විදුලිය ජනනය කිරීමට විදුලි පාරිභෝගිකයන් හට අවසර ලබාදෙනු ලබයි. මෙය ෆොසිල ඉන්ධන පරිහරණය මත රඳා පැවැත්ම අවම කිරීමේ ක්‍රියා මාර්ගයකි.

## සමාජ තිරසරබව

විදුලි කර්මාන්තයේ ප්‍රමුඛයා වශයෙන් ලං.වි.ම. විදුලි පද්ධතිය විශ්වසනීය ලෙස ක්‍රියාත්මක කිරීම ජාතියේ සමාජමය හා ආර්ථික තිරසර බවේ කොඳු නාරටිය වේ.

ආයතනය වසර කිහිපයකට පෙර විදුලියනය සඳහා 100%ක ප්‍රවේශයක් සාක්ෂාත් කරගත් අතර, සමාජ තිරසර බව සඳහා අවශ්‍ය පදනම සකස් කරන ලදී. මෙය වූකලි ලං.වි.ම.ට ආඩම්බර විය හැකි සාර්ථකත්වයකි. සිය ප්‍රදේශයනට විදුලිය ලැබෙන විටදී සමාජ ජීවිතය සැලකිය යුතු පරිවර්තනයකට බඳුන් වේ. අධ්‍යාපනික හා සේවා නියුක්ති අවස්ථා ජනතාවට විවෘත වේ. ඇති හැකි හා නැති බැරි දෙපිරිස අතර පවත්නා පරතරය අවම වේ.

2020 මාර්තු මාසයේ සිට ක්‍රියාත්මක කරන ලද රට අගුලු දැමීමේ ක්‍රියාමාර්ගයනට ක්ෂණිකව ප්‍රතිචාර දක්වමින් ශ්‍රී ලංකාව පුරා පැය 24 පුරා සේවය ලබා දෙමින් කොවිඩ් - 19 වසංගත තත්ත්වයෙන් අනතුරුව පවා ලං.වි.ම. විසින් සිය වටිනාකම් පවත්වාගෙන යන ලදී. අප විසින් අපගේ පාරිභෝගිකයන්ගේ විශ්වාසය ප්‍රවර්ධනය කොට ඇති අතර පවත්නා අවදානම් හා අවිනිශ්චිතතාවයන් මධ්‍යයේ වුව ලං.වි.ම. නව කාර්ය සාධන මට්ටමක් කරා ගෙනයනු පිණිසද ඔවුන්ගේ සහාය අපේක්ෂා කරන්නෙමු.

ඉහත කරුණුවලට අමතරව, ලං.වි.ම. විසින් පියවරක් ඉදිරියට ගනිමින් 2020 වසර අග භාගයේදී නාගරික අපද්‍රව්‍ය මත පදනම් වූ ශ්‍රී ලංකාවේ පළමු විදුලි බලාගාරය (IPP) ජාතික ජාලය වෙත ජාලමය වශයෙන් අන්තර් සම්බන්ධ කිරීමේ ඉදිරි පියවරක් තබමින් අවශ්‍ය පහසුකම් සලසන ලදී. වඩාත් ලාභදායී සෙසු මූලාශ්‍ර සමගින් සසඳන කල මෙම බලාගාරයේ ඒකක පිරිවැය සාපේක්ෂව ඉහළ අගයක් ගත්තද, නාගරික අපද්‍රව්‍ය රැස්වීමේ ජාතික ගැටලුව ආමන්ත්‍රණයෙහි ලා මෙම බලාගාරය මගින් සහායක් ලැබෙන බැවින් ලං.වි.ම. මෙම සංවර්ධන කාර්යය සඳහා සිය සහයෝගය ලබාදෙන අතර, නාගරික අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 500-700 අතර ප්‍රමාණයක් විදුලිය බවට පරිවර්තනය කරමින් මෙ.වො. 11.5ක විදුලියක් ජනනය කිරීම සඳහා මෙමගින් කොළඹ මහ නගර සභා ප්‍රදේශයේ ගණ අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කරන බැවින් මෙම කර්තව්‍යය මගින් පාරිසරික තිරසර බවද ඇතිවන්නේය යන්න එහි විශ්වාසය වේ.

ඉහත සඳහන් කළ පරිදි, තිරසරබව යනු පරිසරය, සමාජය හා ආර්ථිකය පිළිබඳ සැලකිලිමත්ව අපගේ වටිනාකම් පවත්වාගෙන යමින් ආයතනයේ හා ආර්ථිකයේ තිරසරබව සඳහා මෙම කුලුණු තුන අතර තුලනයක් පවත්වාගනු පිණිස දුෂ්කර කාල පරිච්ඡේදයන්හි දුෂ්කර තීරණ ගැනීමයි.

# ආයතනික සමාජ වගකීම් වාර්තාව

සමාලෝචිත වර්ෂය තුළ සමාජයේ සෞඛ්‍යය, සුභ සාධනය හා තිරසර සංවර්ධනය කෙරෙහි දායකත්වය ලබාදීම සඳහා සියලු ප්‍රයත්නයන් දරන ලදී. එවන් ප්‍රයත්නයන් අතරින් සමහරක් මෙම කොටස තුළ විස්තර කෙරේ.




## පළමුව ළමුන්

කොවිඩ් - 19 වසංගතය මගින් ජනතාව අතර අතිශය බියක් හා අවිනිශ්චිතතාවයක් ඇති කරන ලදී. මින් වඩාත් පීඩනයට පත්වූවෝ ළමුන්ය. එබැවින්, ආයතනික සමාජ වගකීම් (CSR) නමැති තේමාව යටතේ, නව ළමා ගීතයක්ද එළි දක්වමින් ලෝක ළමා දිනය සමරනු සඳහා 2020 සැප්තැම්බර් මස 30වන දින ලං.වි.ම. මූලස්ථානයේදී උත්සවයක් පවත්වන ලදී. එහි අරමුණ වූයේ කොවිඩ් - 19 ආශ්‍රිත සාංකාවන් අත් විඳින්නාවූ, තනිවූ ළමුන් ප්‍රබෝධමත් කිරීමයි. 'විදුලි එළියෙන් අකුරු කරනා' නමැති ගීතය ප්‍රකට සංගීතඥ කීර්ති පැස්කුවල් මහතා විසින් ලං.වි.ම. වෙනුවෙන් නිපදවන ලදී.



බාල පරපුර වෙත පහසුකම් සලසනු පිණිස ශ්‍රී ලං.රු.මි. 3.72ක සමස්ත පිරිවැයක් දරමින් පු/කල්/පනයාඩි රෝමානු කතෝලික දෙමළ විද්‍යාලය සඳහා 25' x 50' පන්ති කාමර ගොඩනැගිල්ලක් ජනන අංශය විසින් ඉදිකරන ලදී.



## යටිතල පහසුකම් සංවර්ධනය මගින් වඩා යහපත් අනාගතයක් නිර්මාණය කරනු ලබයි

ජනන අංශය මගින් ගම් වාසීන්ගේ ප්‍රයෝජනය පිණිස ශ්‍රී ලං.රු.මි. 48.58ක සමස්ත පිරිවැයක් දරමින් නොරොච්චෝලේ - පනයාඩිය මාර්ගය ප්‍රතිසංස්කරණය කරන ලදී.



## වසංගත තත්වය සමගින් කටයුතු කිරීම

ලෝකය වටා කොවිඩ් - 19 ආශ්‍රිත අඟුලු දැමීම් තත්ත්වයන්හි පසුවූ ශ්‍රී ලාංකිකයනට සහාය දක්වනු පිණිස ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ හා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේද සහාය සහිතව ව්‍යාපාර හා මෙහෙයුම් ක්‍රමෝපාය ශාඛාව විසින් සංගීත වැඩසටහනක් සංවිධානය කරන ලදී. 2020 නොවැම්බර් මස පළමුවැනි දින පවත්වන ලද මෙම සංගීත වැඩසටහන දේශීය වශයෙන් සජීවීව විකාශනය කරන ලදී. විදේශීය ප්‍රේක්ෂකයන් සඳහා එය ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ ආයතනික වෙබ් අඩවිය මගින් ලබාගැනීම සඳහාද යොමු කරන ලදී.

සිංහල - දෙමළ අලුත් අවුරුදු සමය තුළ, පුරවැසියන්ගේ චිත්ත ධෛර්යය නංවනු පිණිස ව්‍යාපාර හා මෙහෙයුම් ක්‍රමෝපාය ශාඛාව විසින් ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථා වැඩසටහන් පෙළක් සංවිධානය කරන ලදී. සිටි එෆ්.එම්. 'බක්මහ සැණකෙළිය' සඳහාද ලං.වි.ම. අනුග්‍රාහකත්වය ලබාදෙන ලද අතර එය මෙම මූලාරම්භයට අයත් ප්‍රධාන පෙළේ අංගයක් විය.

## නොමිලේ විදුලිය

ලං.වි.ම. 51වන සංවත්සරය සමරණු පිණිස ව්‍යාපාර හා මෙහෙයුම් ක්‍රමෝපාය ශාඛාව විසින් විදුලි සේවා සම්බන්ධතා ලබාගැනීම සඳහා දිවයින වටා පදිංචි අඩු ආදායම්ලාභී පවුල් 51ක් වෙත ආධාර කිරීම සඳහා වූ වැඩපිළිවෙලක් සකසන ලද අතර, නොමිලයේ අභ්‍යන්තර විදුලි රැහැන් ඇදීම් කටයුතු සම්පූර්ණ කරන ලදී.

## ප්‍රාදේශීය ජනතාව බලගැන්වීම

මන්නාරම සුළං විදුලි ව්‍යාපෘතිය යනු වචනයේ පරිසමාප්තාර්ථයෙන්ම ජාත්‍යන්තර ඇගයුමට ලක්වූ සුළං විදුලිබල සංවර්ධනයෙහි යහ පරිචයන් අන්තර්ගත කඩඉම් ව්‍යාපෘතියකි. එය අනාගත සුළං විදුලිබල සංවර්ධනය සඳහා වූ ආදර්ශ ව්‍යාපෘතියක් ලෙස හඳුනාගෙන ඇත. ඇතැම් විට එහි එන වඩාත් ධනාත්මක පැතිකඩ වනුයේ සෘජු හා බාහිර සේවා නියුක්ති අවස්ථාවන් සපයමින්, මාර්ග ජාලය වැඩිදියුණු කරමින් හා ධීවර ප්‍රජාව සඳහා පවත්නා සනීපාරක්ෂක පහසුකම්ද වැඩිදියුණු කරමින් ප්‍රාදේශීය ප්‍රජාවන්හි දායකත්වය ලබාගත් ආකාරයයි. ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය කරනු සඳහා පළාත් පාලන ආයතනයන් වෙත ලබාදුන් සහාය හා එවන් අන් බොහෝ ප්‍රයත්නයන්ද සියලු ප්‍රාදේශීය ජනතාවන්ගේ සහාය දිනා ගැනීමට සමත් විය.

## වඩා පිරිසිදු පරිසරයක්

වන හායනය යනු ශ්‍රී ලංකාවේ බරපතල ගැටලුවකි. විදුලි සම්ප්‍රේෂණ රැහැන් සඳහා මං හෙළි කරනු පිණිස නිරතුරු (වනාන්තරවල, වැවිලි හෝ ගෙවතුවල) ගස් කපා දැමීමට අවශ්‍ය වේ. ලං.වි.ම.

# ආයතනික සමාජ වගකීම් වාර්තාව



විදුලි බලාගාර/ ජාල උපපොළ හෝ වෙනයම් ව්‍යාපෘති අංගයක ක්‍රියාත්මක කිරීමක් අතරතුර ඉඩම් හෙළි වීම/ ජලයෙන් යටවීම සිදුවිය හැක. එවන් වන හායනයන් සමනය කරනු පිණිස යෝග්‍ය ස්ථානයන්හි නැවත රුක් රෝපණය කිරීම හා වනාන්තර නඩත්තු කිරීම සඳහා ලං.වි.ම. විසින් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත වන්දි ලබාදෙන්නේය යන කරුණ සටහන් කළ යුතුය. එපමණක් නොව, වගකිව යුතු ආයතනයක් වශයෙන් වඩා පවිත්‍ර පරිසරයක් ඇති කිරීම සහතික කරනු පිණිස ලං.වි.ම. විසින් වසරකට රුක් රෝපණ වැඩසටහන් ගණනාවක් සංවිධානය කරනු ලබයි. සමාලෝචිත වසර තුළ, රටපුරා කුඹුක්, මී, කොස්, කැටකෑල, ඖෂධ හා පළතුරු ශාකද 6500කට වැඩි සංඛ්‍යාවක් රෝපණය කරන ලදී.



මෙහෙයුම් සමාලෝචනය

# මූල්‍ය අංශය සහ මූල්‍ය තොරතුරු

# මූල්‍ය අංශය

ව්‍යාපාරයේ තිරසාරභාවයට සහ වර්ධනයට අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා මූල්‍ය සැලසුම්කරණය,භාණ්ඩාගාර කළමනාකරණය, මූල්‍ය හා කළමනාකරණ වාර්තාකරණය, ව්‍යවස්ථාපිත සබඳතා, බදුකරණය, මුදල් කළමනාකරණය සහ ආයතනික හා ව්‍යාපෘති මූල්‍ය කටයුතු සඳහා මූල්‍ය අංශය සම්බන්ධ වේ. එහි මූලික වගකීම වනුයේ මූල්‍ය තීරණ, පිරිවැය කාර්යක්ෂමතාවයට දායක වන හොඳ නිර්ණායක මත පදනම් වී ඇති බව සහතික කිරීමයි.

## මෙහෙයුම් ව්‍යුහය

ලංවිම සාමාන්‍යාධිකාරී වෙත සෘජුවම වාර්තා කරන, මූල්‍ය කළමනාකරු විසින් මූල්‍ය අංශය මෙහෙයවනු ලබයි.අතිරේක මුදල් කළමණාකරු (මූලස්ථාන), අතිරේක මුදල් කළමණාකරු (ආයතනික) සහ අතිරේක මුදල් කළමණාකරු (භාණ්ඩාගාර කළමනාකරණ) යන අතිරේක මුදල් කළමණාකරුවන් තිදෙනෙකු ඔහු යටතේ සෘජුවම රාජකාරී සිදුකරනු ලබන අතර, අංශ භාර අතිරේක සාමාන්‍යාධිකාරීවරුන් වෙත සෘජුවම වාර්තා කරන සහ මූල්‍යමය කාරණා සම්බන්ධව මූල්‍ය කළමනාකරුට ක්‍රියාකාරීව වගකිව යුතු අතිරේක මුදල් කළමනාකරුවන් අට දෙනෙකු මූල්‍ය අංශය සතුවේ.

මුදල් කළමනාකරණය, ව්‍යාපෘති සම්බන්ධීකරණය හා මුදල් එකතු කිරීමේ කළමනාකරණය යන කාර්යයන් සඳහා අතිරේක මුදල් කළමණාකරු (මූලස්ථාන) ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. තවද, ලංවිම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම, ඉදිරිපත් කිරීම සහ අයවැය ඇතුළු කළමනාකරණ තොරතුරු ලබාදීම අතිරේක මුදල් කළමණාකරු (ආයතනික) ගේ ප්‍රධාන කාර්යයන් වේ. අතිරේක මුදල් කළමණාකරු (භාණ්ඩාගාර කළමනාකරණ) යටතේ භාණ්ඩාගාර කළමනාකරණ ශාඛාව පිහිටුවීමත් සමඟ අර්ථසාධක හා විශ්‍රාම වැටුප් අරමුදල් කළමනාකරණය කිරීම සහ එදිනෙදා කටයුතු සඳහා සහ ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා අරමුදල් සම්පාදනය කිරීම අතිරේක මුදල් කළමණාකරු (භාණ්ඩාගාර කළමනාකරණ) විසින් මෙහෙයවනු ලැබේ. එක් එක් ශ්‍රිතයේ ක්‍රියාකාරීත්වය වැඩි දියුණු කිරීම සඳහා ගනු ලබන ප්‍රධාන ක්‍රියාමාර්ග සහ පියවර පිළිබඳ කෙටි විස්තරයක් පහත දැක්වේ.

## මුදල් කළමනාකරණය

ලංවිම තුල සියලුම මුදල් බෙදාහැරීම් මෙහෙයවනු ලබමින් ගෙවීම් ඒකකය ලංවිම මූල්‍ය අංශය තුල සුවිශේෂී කාර්යය භාරයක් ඉටුකරනු ලබයි. කොවිඩ්-19 වසංගතයේ පැතිරීයාම හේතුවෙන් ගෙවීම් ඒකකයට මෙම වසර තීරණාත්මක කාල පරිච්ඡේදයක් විය. එහි ප්‍රතිඵලයක් ලෙස, ද්‍රවශීලතා ගැටළු ද ඇතුළුව මුදල් හා කාරක ප්‍රාග්ධනයට සැලකිය යුතු බාධක අත්විඳිමින් වුවද ලංවිම විදුලි බිල සඳහා පාරිභෝගිකයින්ට සහන කිහිපයක් ලබා දුන්නේය. කෙසේ වෙතත්, භාණ්ඩාගාර කළමනාකරණ ශාඛාවේ සහාය ඇතිව ප්‍රමුඛතා පදනම මත ගෙවීම් සිදුකරමින් පවතින අරමුදල් කාර්යක්ෂමව වෙන් කිරීමට ගෙවීම් ඒකකය සමත්විය.

තවද මෙහෙයුම් පද්ධතිය සුමට කිරීමේ අරමුණින් ගෙවීම් ඒකකය මාර්ගගත PIV බේරුම්කරණ පද්ධතියක් ආරම්භ කර ඇත.

## එකතු කිරීමේ කළමනාකරණය

කොවිඩ් -19 වෛරසය පැතිරීම පාලනය කිරීම සඳහා රජය විසින් පනවා ඇති සීමාවන්, අගුලු දැමීම, ඇඳිරි නීතිය, සමාජ දුරස්ථභාවය සහ අත්‍යවශ්‍යය නොවන සේවාවන් තාවකාලිකව වසා දැමීම, මනු කියවීම සඳහා මෙන්ම බිල් ගෙවීම් සඳහා විදුලි පාරිභෝගිකයින්ට ප්‍රවේශ වීම සීමා කළේය. ගනුදෙනුකරුවන් මෙන්ම සේවකයින් ද ආරක්ෂා කිරීම සඳහා සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුව සියලුම POS කවුන්ටර නැවත සකස් කරන ලදී. තවද, විදුලි බිල්පත් ගෙවීම වඩාත් පහසු සහ කාර්යක්ෂම කිරීමට පහසුකම් සැලසීම සඳහා පහත සඳහන් මුලපිරීම් වර්ෂය තුළ සිදු විය.

- බිල්පත් ගෙවන අවස්ථාවේදීම පරිගණක පද්ධතිය යාවත්කාලීන වීමේ පහසුකම (Online Real Time) එකතු කිරීමේ නියෝජිතයන් වන යූනියන් බැංකුව හා හැටන් නැෂනල් බැංකුව දක්වා පුළුල් කිරීම.
- කොමර්ෂල් බැංකුව, සම්පත් බැංකුව සහ සෙලාන් බැංකුව හරහා මාර්ගගත ස්ථාවර නියෝග මඟින් ඒකාබද්ධ ස්වයංක්‍රීය විදුලි බිල්පත් ගෙවීම් ක්‍රියාත්මක කිරීම.
- ලංවිම අන්තර්ජාල ගෙවීම් දොරටුව (IGP-වෙබ් අඩවිය) හරහා දැනට තිබෙන වීසා/මාස්ටර් ක්‍රෙඩිට් කාඩ් වලට අමතරව ඇමෙක්ස් කාඩ්" මඟින්ද නොමිලේ ක්‍රෙඩිට් කාඩ්පත් මගින් ගෙවීම් කිරීමේ පහසුකම් සලසා ඇත.
- CEB Assist App මෘදුකාංග පහසුකම හරහා මනු කියවීම් ලද විගස බිල්පත් යාවත්කාලීන කිරීමෙන් බිල්පත් චක්‍රය ලිත් දිනයට සමාන කිරීමට හැකි විය. මෙම ක්‍රියාවලිය මඟින් බිල්පත් ක්‍රමය සහ ලෙජරය අතර ආදායම් හා එකතු කිරීම සම්බන්ධව පැවති දිගු කාලීන ගැටලු ඉවත් කෙරෙනු ඇත.

## ව්‍යාපෘති සම්බන්ධීකරණය

ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකය අරමුදල් සපයන ආයතන, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU), බාහිර සම්පත් දෙපාර්තමේන්තුව (ERD) සහ මහා භාණ්ඩාගාරය යන ආයතන සමඟ සම්බන්ධ වෙමින් ණය සම්බන්ධ කටයුතු සම්බන්ධීකරණය කිරීමට සහාය වීමෙන් සියලුම විදේශීය අරමුදල් තුලින් ක්‍රියාත්මක ව්‍යාපෘති සඳහා සම්බන්ධීකරණ ඒකකයක් ලෙස ක්‍රියා කරයි. ණය/ බැර ගිවිසුම් අනුකූලව අරමුදල් සපයන ආයතන විසින් ඉල්ලා සිටින අවස්ථාවන් වලදී විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් තොරතුරු ඉදිරිපත් කිරීම මෙම ඒකකයේ ප්‍රධාන කාර්යභාරයක් වේ. තවද, ණය ස්කන්ධයට පරිවර්තනය කිරීමේදී මහා භාණ්ඩාගාරය සමඟ සම්බන්ධීකරණය වීම සහ තීරණ ගැනීමේදී අවශ්‍ය ණය සම්බන්ධ තොරතුරු සැපයීම මඟින් ලංවිම කළමනාකරණයට සහාය වීම මෙන්ම ක්‍රියාත්මක කිරීමේ ආයතනයේ අනාගත මෙහෙයුම් සැලසුම් කිරීම ද මෙම ඒකකයේ විෂය පථයට අයත්ය.

කොවිඩ් -19 වසංගතයේ පැතිරීමත් සමඟ ව්‍යාපෘතින්හී විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ණය දෙන ආයතනයට නියමිත කාල සීමාවන් තුල ඉදිරිපත් කිරීම අභියෝගාත්මක විය.කෙසේ වෙතත්, ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකය ව්‍යාපෘති කළමණාකරන ඒකකය සහ විගණකවරුන් සමඟ සම්බන්ධවෙමින් අවශ්‍ය සියලු ප්‍රකාශන නියමිත වේලාවට ඉදිරිපත් කිරීමට සමත් විය. තවද, පුත්තලම් ගල් අඟුරු බලශක්ති ව්‍යාපෘතියේ ණය ආපසු ගෙවීම මුදල් අමාත්‍යාංශයේ සම්බන්ධීකරණයෙන් අඛණ්ඩව දෙවන වරටත් ස්කන්ධ ප්‍රාග්ධනය බවට පරිවර්තනය කරන ලදී. ණය සඳහා ස්කන්ධ අනුපාත ශක්තිමත් කිරීම සදහා මුදල් අමාත්‍යාංශය විසින් මෙම ණය ස්කන්ධ ප්‍රාග්ධනය බවට පරිවර්තනය කිරීම සිදුකරන ලදී

# මුල්‍ය අංශය

## භාණ්ඩාගාර කළමනාකරණය

මුදල්, ආයෝජන සහ වෙනත් මුල්‍ය වත්කම් කළමනාකරණය කිරීමෙන් භාණ්ඩාගාර කළමනාකරණ ශාඛාව වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. කෙසේ වෙතත්, කෝවිඩ් -19 වසංගතය පැතිරීම හේතුවෙන් මෙම මුල්‍ය වර්ෂය අතීතයේ වඩාත්ම අභියෝගාත්මක වසරක් විය. 2020 මාර්තු මැද භාගයේදී දිවයින පුරා ඇඳිරි නීතිය පැනවීමෙන් පසුව ලංවීම මුල්‍ය දුෂ්කරතා රැසකට මුහුණ දුන්නේය. එම ගැටළු විසඳීම සඳහා අවශ්‍ය පියවර මාලාවක් භාණ්ඩාගාර කළමනාකරණ ශාඛාව විසින් ආරම්භ කල අතර අඩු ප්‍රමුඛතා ප්‍රාග්ධන වියදම් අත්හිටුවීම, කාලීන ණය ලබා ගැනීම සඳහා වාණිජ බැංකු සමග සාකච්ඡා කිරීම සහ ද්‍රවශීලතා තත්ත්වය කළමනාකරණය කිරීම සඳහා මුදල් ගලා ඒම සහ ගලා යාම කළමණාකරණය කිරීම සදහා අවශ්‍ය ගෙවීම් අකෘති ක්‍රියාත්මක කිරීම මේ අතර වේ.

තවද, සාම්ප්‍රදායික නොවන මුල්‍ය උපකරණ හරහා අරමුදල් ලබා ගැනීමට ඉදිරි පියවරක් ගෙන එහි ප්‍රතිඵලයක් ලෙස ලැයිස්තුගත ණය සුරැකුම්පත් නිකුත් කල පළමු රාජ්‍ය ආයතනය බවට පත්විය.

තීරණ ගැනීම සඳහා කාලෝචිත තොරතුරු ලබා ගැනීමට වෙළඳපල තොරතුරු වෙත ළඟාවීම සඳහා භාණ්ඩාගාර කළමනාකරණ ශාඛාව රොයිටර් මුල්‍ය වේදිකාව (Reuters financial platform) සමග සම්බන්ධවී ඇත.

## අරමුදල් කළමනාකරණය

### ලංවීම අර්ථසාධක අරමුදල

ලංකා විදුලිබල මණ්ඩලයේ අර්ථසාධක අරමුදල 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනතේ විධිවිධාන යටතේ පිහිටුවන ලද පුද්ගලික අර්ථසාධක අරමුදලකි.

එය පරිපාලනය සාමාජිකයන් හත් දෙනෙකුගෙන් සමන්විත කළමනාකරණ කමිටුවක් විසින් සිදුකරනු ලබන අතර, කමිටුවේ සභාපතිවරයා ලංවීම සභාපතිවරයා වන අතර උප සභාපතිවරයා ලංවීම සාමාන්‍යාධිකාරීවරයා වේ. මුල්‍ය කළමණාකරු සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පිරිස්) එහි නිලබලයෙන් පත්වූ සෙසු නිලධාරීන් වේ. ඉතිරි සාමාජිකයින් තිදෙනා ලංවීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නම් කරනු ලැබේ. එදිනෙදා පරිපාලනය සඳහා වගකිව යුතු වන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරනු ලබන අරමුදලේ ලේකම් සහ ගණකාධිකාරීවරයා අරමුදලේ භාණ්ඩාගාරිකද වේ.

2020 වර්ෂයේදී අරමුදල විසින් සැලකිය යුතු ප්‍රගතියක් හා ජයග්‍රහන රැසක් වාර්තා කර ඇත. එම ජයග්‍රහණයන් කිහිපයක් පහත පරිදිවේ.

- වර්ෂය සඳහා සේවායෝජකයාගේ සහ සේවකයාගේ මුළු දායකත්වය රුපියල් බිලියන 4.80 ක් වූ අතර එය පෙර වසරට සාපේක්ෂව 1.74% ක සුළු අඩුවීමකි.
- වාර්තා කරන දිනය වන විට ආයෝජන කළඹේ වටිනාකම රුපියල් බිලියන 45.4 සිට රුපියල් බිලියන 50 දක්වා වැඩිවී තිබුනි.කෙසේ වෙතත් 2019 වර්ෂයේ රුපියල් බිලියන 6.8 ට සාපේක්ෂව වර්ෂය තුළ සමස්ත ආයෝජන ආදායම බිලියන 6.2 ක් ලෙස සටහන් වී ඇති අතර එය 9.6% ක අඩුවීමක් පෙන්නුම් කළේය.
- මෙම අරමුදල පසුගිය වසරේ රුපියල් බිලියන 5.8 හා සාපේක්ෂව මෙම වසරේදී රුපියල් බිලියන 5.3 ක ශුද්ධ ලාභයක් උපයා ඇති අතර අරමුදලෙන් රුපියල් මිලියන 450 ක් ආයෝජන සංචිත අරමුදලට මාරු කර ඇත. තවද වර්ෂය අවසානයේදී සාමාජිකයින්ට 8% ක ලාභාංශයක් ප්‍රකාශයට පත් කළේය.
- වර්ෂය අවසානයේ අරමුදලේ මුළු ශුද්ධ වත්කම් වටිනාකම රුපියල් බිලියන 66 ඉක්මවා ඇත.
- සමස්ත ආදායමේ ප්‍රතිශතයක් ලෙස මෙහෙයුම් වියදම් 2020 දී 0.07% සිට 0.06% දක්වා අඩු විය. මෙය මෙම කාල සීමාව සඳහා අරමුදලේ වැඩිදියුණු කළ මෙහෙයුම් කාර්යක්ෂමතාවයේ පිළිබිඹුවකි.
- සාමාජිකයින්ට අර්ථසාධක අරමුදල් පද්ධතියට ප්‍රවේශ වීමට බලය ලබා දීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් ඔවුන්ගේ මාසික දායකත්වය සහ ලබා ගත හැකි ණය ශේෂයන් මෙන්ම ගෙවිය යුතු ණය ශේෂයන් පරිශීලනය කිරීමට හැකිවන පරිදි එක්වර සාමාජික ඇමතුම් 05 ක් හැසිරවීම සඳහා IVR පහසුකම (අන්තර් ක්‍රියාකාරී හඬ ප්‍රතිචාරය) සහිත PABX පද්ධතිය වසර පුරා සමගාමීව අඛණ්ඩව ක්‍රියාත්මක වීම.
- දත්ත ගබඩා කාමරය ඩිජිටල්කරණය කිරීමේ කටයුතු 2017 වර්ෂයේ දත්ත දක්වා සම්පූර්ණ කර ඇති අතර, පවතින කාර්යාල ප්‍රමාණය ප්‍රශස්ත ලෙස පරිශීලනය කිරීම සඳහා මෙය දිගටම කරගෙන යාමට අපේක්ෂා කෙරේ.



# මූල්‍ය අංශය

### රූපසටහන F 1 : පොළී සහ ලාභාංශ (ශ්‍රී.ලං.රු. බිලියන)




### රූපසටහන F 5 : ගෙවූ ආදායම් බදු (ශ්‍රී ලං.රු.)




### රූපසටහන F 2 : ආදායම (ශ්‍රී ලං.රු.බි.) ට සාපේක්ෂව වියදම (ශ්‍රී ලං.රු.මි.)




### රූපසටහන F6 : රජයේ බැංකුවල සමස්ත ආයෝජන (ශ්‍රී ලං.රු.මි.)




### රූපසටහන F 3 : ප්‍රදානය කල ණය (ශ්‍රී. ලං. රු. මිලියන)




### රූපසටහන F 4 : ආයෝජන කළඹ %




## ලංවීම විශ්‍රාම වැටුප් අරමුදල

1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතේ 12 (ජේ) වගන්තිය යටතේ විශ්‍රාම වැටුප් අරමුදල 1994 ජනවාරි 1 වන දින පිහිටුවන ලදී. එය කළමනාකරණය කරනු ලබන්නේ සාමාජිකයින් අට දෙනෙකුගෙන් සමන්විත කළමනාකරණ කමිටුව විසිනි. ලංවීම සභාපති සහ සාමාන්‍යාධිකාරී පිළිවෙලින් කමිටුවේ සභාපති සහ උප සභාපති වේ. මුදල් කළමණාකරු සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පිරිස්) මෙම කමිටුවේ නිල බලයෙන් පත්වන නිලධාරීන් වේ. ඉතිරි සාමාජිකයන් සිව්දෙනා අධ්‍යක්ෂක මණ්ඩලය විසින් නම් කරනු ලබන ලංවිමෙහි ස්ථිර සේවකයින් වේ. ලේකම් සහ ගණකාධිකාරී අරමුදලේ භාණ්ඩාගාරික මෙන්ම පරිපාලකද වන අතර මෙය ලංවිම භාණ්ඩාගාර කළමනාකරණ ඒකකය යටතේ ක්‍රියාත්මක වේ.

2020 අවසානයේ ක්‍රියාකාරී විශ්‍රාමිකයින්ගේ සංඛ්‍යාව 7839 ක් වූ අතර පසුගිය වසර පහ තුළ විශ්‍රාමිකයින්ගේ වැඩිවීම පහත දැක්වේ.

| වර්ෂය | විශ්‍රාමිකයින්ගේ සංඛ්‍යාව | විශ්‍රාමිකයින්ගේ වැඩිවීම | |
|---|---|---|---|
| | | සංඛ්‍යාව | % |
| 2015 | 5721 | | |
| 2016 | 6194 | 473 | 8.3% |
| 2017 | 6622 | 428 | 6.9% |
| 2018 | 7061 | 439 | 6.6% |
| 2019 | 7533 | 472 | 6.7% |
| 2020 | 7839 | 306 | 3.9% |

# මූල්‍ය අංශය

රූපසටහන F7 : විශ්‍රාමිකයින්ගේ සංඛ්‍යාව




විශ්‍රාම වැටුප් අරමුදලේ ප්‍රධාන ලැබීම් ප්‍රභවයන් වන්නේ ක්‍රියාකාරී සේවකයින් වෙනුවෙන් ලංවිම දායකත්වය සහ ආයෝජන වලින් ලැබෙන ප්‍රතිලාභයි. පසුගිය වසර පහ තුළ විශ්‍රාම වැටුප් ගෙවීම් 50% කින් වැඩිවීම සහ 2015 විශ්‍රාමිකයින්ගේ සංඛ්‍යාව ප්‍රතිශතයක් වැඩිවීම හේතුවෙන් විශ්‍රාම වැටුප් ගෙවීම් සඳහා වන අරමුදල්වල අඩුවීම වාර්ෂිකව ඉහළ ගොස් තිබේ. 2015 වර්ෂයේ සිට විශ්‍රාමිකයින්ගේ සමාන්‍ය වැඩිවීම 8% කි.

| වර්ෂය | ලංවීම දායකත්වය (ශ්‍රී.ලං.රු.මි.) | පොළී ආදායම (ශ්‍රී.ලං.රු.මි.) | වාර්ශික වීශ්‍රාම වැටුප් ගෙවීම් | වර්ධනය (%) |
|---|---|---|---|---|
| 2015 | 921 | 20 | 941 | |
| 2016 | 974 | 158 | 1,132 | 20% |
| 2017 | 1,029 | 364 | 1,393 | 23% |
| 2018 | 1,420 | 480 | 1,900 | 36% |
| 2019 | 1,405 | 499 | 1,904 | 0.21% |
| 2020 | 1,389 | 431 | 2,035 | 7% |

රූපසටහන F8 : වාර්ෂික විශ්‍රාම වැටුප් ගෙවීමේ සංයුතිය




| වර්ෂය | ශුද්ධ වත්කම් (ශ්‍රී.ලං.රු.මි.) | වැඩිවීම් වටිනාකම (ශ්‍රී.ලං.රු.මි.) | වර්ධනය % |
|---|---|---|---|
| 2015 | 16,962 | | |
| 2016 | 18,211 | 1,249 | 7% |
| 2017 | 19,863 | 1,652 | 9% |
| 2018 | 21,384 | 1,521 | 7.6% |
| 2019 | 22,695 | 1,311 | 6% |
| 2020 | 23,919 | 1,224 | 5% |

රූපසටහන F9 : ශුද්ධ වත්කම් (ශ්‍රී.ලං.රු. මිලියන)



# සමස්ථ මෙහෙයුම් හා මූල්‍ය සමාලෝචනය

අඛණ්ඩ විදුලිබල සැපයුම ශ්‍රී ලාංකිකයන්ගේ ජීවිත සාරවත් කිරීම සඳහා පූර්ව අවශ්‍යතාවයක් වන අතර ආර්ථික වර්ධනය හා සංවර්ධනය සඳහා මෙමගින් ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. 2020 වර්ෂය වන විට ශ්‍රී ලංකාවේ ජාතික විදුලිබල මට්ටම 99.5% ඉක්මවා ගොස් ඇති අතර එය ආසියානු කාලාපය තුළ කැපී පෙනෙන ජයග්‍රහණයකි. පැය 24 පුරා විදුලිය සපයන 100 % කට ආසන්න විදුලි ප්‍රවේශයක් ඇති දකුණු ආසියාවේ එකම රට ශ්‍රී ලංකාවයි.

රටේ වගකිවයුතු රාජ්‍ය ආයතනයක් ලෙස සමස්ථ ආර්ථික වර්ධන වේගය සාක්ෂාත් කර ගැනීම සඳහා කාර්මික, කෘෂිකාර්මික සහ සේවා යන සියළුම අංශයන්ට පහසුකම් සැලසීම තුලින් සියලු දෙනාගේ වර්ධනයට සහාය වීමට ලංවිම සිය කාර්යයන් මෙහෙයවනු ලැබීය. මෑත වසරවලදී,තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන් පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ට ප්‍රවේශවීමට ලංවිම උත්සාහ කර ඇති අතර මෙම මුලාරම්භයන් අපගේ සියලු පාර්ශවකරුවන්ට වටිනාකමක් එක් කිරීමට මග සලසා ඇත

## මූල්‍ය කාර්යසාධනය

### ආදායම

විවිධ වු බාහිර අභියෝග රැසකට මුහුණ දෙමින් වුවද ලංවිම 2020 වර්ෂයේදී රුපියල් බිලියන 239 ක ආදායමක් අත්කර ගෙන ඇති අතර එය 2019 වසරට සාපේක්ෂව 2% ක පහත වැටීමකි. කොවිඩ් -19 වසංගතයේ ව්‍යාප්තියත් සමග ගෘහස්ථ විදුලි ඉල්ලුමේ වර්ධනයක් පෙන්නුවද, සාපේක්ෂව කාර්මික, පොදු අරමුණු සහ හෝටල් කාණ්ඩවල ඉල්ලුම සැලකිය යුතු ලෙස අඩුවීම ආදායම පහත වැටීමට ප්‍රධාන වශයෙන් බලපා ඇත.තවද රටතුල පැවති අභියෝගාත්මක සමාජ ආර්ථික තත්වයන් හේතුවෙන් විදුලි ඒකක සඳහා ඇති ඉල්ලුමද 2% කින් අඩු විය. රජයේ ප්‍රතිපත්තිමය තීරණයන් හේතුවෙන් 2014 වර්ෂයේ සිට අය ක්‍රමය නොවෙනස්ව පවතින පසුබිමක විදුලි උත්පාදනයට අදාළ සියලු පිරිවැය සාධක වේගයෙන් ඉහළ යමින් පවතී.

**රූපසටහන F 1 : අලෙවි ආදායම් හා අලෙවි කළ ඒකක විචලනය**




**රූපසටහන F 2 : ජනන හා අලෙවි ඒකක විචලනය ගි.වො.පැයවලින්**




## ශුද්ධ ලාභ / (අලාභ)

පිරිවැයට අනුරූපී නොවන අය ක්‍රමය සහ යෝජිත අවම පිරිවැය විදුලිබල උත්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වීම හේතුවෙන් රුපියල් බිලියන 62.5 ක මූල්‍ය අලාභයක් සටහන් වූ 2020 මූල්‍ය වර්ෂය ලංවීමට තවත් අවිනිශ්චිත මූල්‍ය වර්ෂයක් බවට පත්විය.2019 වසරට සාපේක්ෂව මෙය 36% අඩුවීමක් වන අතර 2019 වර්ෂය සඳහා වාර්ථා කරන ලද ශුද්ධ අලාභය රුපියල් බිලියන 97.4 කි. විදුලිය සඳහා ඉල්ලුම අඩුවීම, ඉන්ධන මිල අඩු කිරීම සහ ජල හා ගල් අඟුරු ප්‍රභවයන් හරහා වැඩි උත්පාදනයක් සිදු කිරීම හේතුවෙන් පසුගිය මූල්‍ය වර්ෂයට සාපේක්ෂව මෙම අලාභය අඩු වී ඇත.

**රූපටසහන F 3 : මූල්‍ය කාර්ය සාධනය - වර්ෂය 2019/2020**




සටහන* : අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ බැඳීම් මත වන ලාභ/(අලාභ) වෙනත් ආදායම් සමග හිලව් කර ඇත.

විදුලිබල උත්පාදනය සඳහා ජල හා ගල් අඟුරු ප්‍රභවයන්ගේ දායකත්වය සමස්ථ වාර්ෂික ශුද්ධ උත්පාදනයෙන් 62% ක් නියෝජනය කල අතර මෙය 2019 වර්ෂයේදී 57% විය. තාප බල

# සමස්ථ මෙහෙයුම් හා මූල්‍ය සමාලෝචනය

ප්‍රභවයන්ගෙන් සාපේක්ෂව අඩු බලශක්ති උත්පාදනය සහ ජාත්‍යන්තර වෙළඳ පොළ තුල ඉන්ධන සහ ගල් අඟුරු වැනි භාණ්ඩ වල මිල අඩුවීම බලපා ඇත. තවද, රජය විසින් දැවි තෙල් සඳහා ලංවීමට සහ ස්වාධීන විදුලිබල නිෂ්පාදකයින්ට (තාප) ලීටරයකට රුපියල් 70/- බැගින් පිළිවෙලින් 2020 මාර්තු 19 සිට 2020 අප්‍රේල් 08 දක්වා බලපැවැත්වෙන පරිදි මිල සංශෝධනයක්ද ලබා දීම යන කරුනු මෙහෙයුම් පිරිවැය පහත වැටීමට හේතු වී ඇත. තවද පෙර වසරට සාපේක්ෂව Net Plus/ Net Accounting යෝජනා ක්‍රම යටතේ වහල මත සවිකල සූර්ය බලශක්ති උත්පාදනයෙහි ඇති ක්‍රමානුකූල වර්ධනයක් පෙන්නුම් කර ඇත.

රූපසටහන F 4 : උත්පාදන මිශ්‍රණය 2019/2020




## පිරිවැය ව්‍යුහය

පෙර වර්ෂයට සාපේක්ෂව සෘජු උත්පාදන පිරිවැය 17% කින් පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ඉන්ධන සහ ස්වාධීන තාප විදුලි මිලදී ගැනීම් අඩුවීමත් ගල් අඟුරු සහ ස්වාධීන සුනිත්‍ය බලශක්ති මිලදී ගැනීම් පිරිවැය අඩුවීමයි. දැවි තෙල් සඳහා ලබා දුන් මිල සංශෝධනයට අමතරව, 2020 වර්ෂය තුළ ඉන්ධන සඳහා දැරූ වියදම් මූලික වශයෙන් අඩු වී ඇත්තේ විදුලි උත්පාදන මිශ්‍රණයේ අස්ථාවරත්වය සහ නඩත්තු කරමින් පැවති ඇතැම් ලංවීම තාප බලාගාර වලින් බලශක්ති උත්පාදනය පහත වැටීම හේතුවෙනි.විදුලිබල උත්පාදනය සඳහා ගල් අඟුරු ප්‍රභවයන්ගේ වැඩි දායකත්වයෙන් හා ජල උත්පාදනයේ සිදුවූ සුළු දියුණුව හේතුවෙන් තාප බලශක්ති උත්පාදනයයේ සිදුවූ අඩුව පියවා ඇත. බලශක්ති උත්පාදනයේ 7% ක වර්ධනයක් තිබියදීත්, 2019 වර්ෂයට සාපේක්ෂව 2020 දී ගල් අඟුරු වියදම් වලින් 8% ක පිරිවැය ඉතිරියක් පෙන්නුම් කරයි. බලශක්ති ඉල්ලුමේ අඩුවීම ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින්ගේ බලශක්තිය මිලදී ගැනීම අඩු කිරීම සඳහා හේතුවූ අතර එය ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින්ගේ විදුලිය සඳහා වන පිරිවැය පහත වැටීමට සක්‍රිය දායකත්වයක් ලබා දුනි.

සෘජු ජනන පිරිවැය අඩුවීම 2020 වර්ෂයේ උත්පාදක ස්ථානයේ ඒකකයක පිරිවැය අඩුවීමට ධනාත්මක ලෙස බලපා ඇති අතර එය 2019 දී රුපියල් 15.74 / කි.වො.පැ හා සසඳන විට රුපියල් 13.53/ කි.වො.පැ ලෙස සටහන් විය.

රූපසටහන F 5 : පිරිවැය ව්‍යුහය 2020




රූපසටහන F 6 - පිරිවැය ව්‍යුහය 2019




කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සහ පිරිවැය ප්‍රශස්ත කිරීම කෙරෙහි අඛණ්ඩව අවධානය යොමු කිරීම නිසා 2019 වසරට සාපේක්ෂව 14%ක අඩුවීමක් සහිතව වසර තුළදී සිය මෙහෙයුම් හා නඩත්තු පිරිවැය රුපියල් බිලියන 95.94 ක් ලෙස පවත්වා ගැනීමට ලංවීම සමත් විය. තවද, කැබිනට් තීරණයකට අනුව, COVID-19 වසංගතයෙන් පීඩාවට පත් ගෘහස්ථ පාරිභෝගිකයින්ට සහන සැලසීම සඳහා ලංවීම විසින් රුපියල් බිලියන 5.91 ක සහන ලබා දී ඇත.

අවසන් පාරිභෝගිකයා සඳහා විකුණන අවස්ථාවේ දී, විදුලි ඒකකයක පිරිවැය 2019 වර්ෂය සඳහා කිලෝවොට් පැයට රුපියල් 24.12 ක් වූ අතර 2020 වර්ෂය සඳහා එය රුපියල් 21.21 ක් විය. ඒ අනුව, විකුණුම් පිරිවැය පෙර මූල්‍ය වර්ෂයට සාපේක්ෂව 12% කින් අඩු වී තිබේ.

## ණයට ගැනීම සහ මූල්‍ය පිරිවැය

2020 වර්ෂය තුළ මූල්‍ය වියදම් රුපියල් බිලියන 19.71 දක්වා අඩු වී ඇති අතර එය 2019 වසරට සාපේක්ෂව 13% ක අඩුවීමක් පෙන්නුම් කරයි. ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ විදුලි මිලදී ගැනීම්

# සමස්ථ මෙහෙයුම් හා මුල්‍ය සමාලෝචනය

සදහා  ගෙවීම් සඳහා වූ පොළිය පිළිවෙලින් 38% සහ 39%කින් අඩු වීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතුවිය. 2020 මාර්තු මාසයේදී ලැබුනු රුපියල් බිලියන 48 ක් වූ රජයේ ප්‍රදාන මඟින් ප්‍රධාන සැපයුම්කරුවන් වන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ ස්වාධීන විදුලිබල නිෂ්පාදකයින්ගේ හිඟ ශේෂයන් අර්ධ වශයෙන් පියවීම හේතුවෙන් මෙම ප්‍රතිඵල අත්විය.

වර්ෂය තුළ රුපියල් බිලියන 29 ක නව ණය ගැනීම් තිබියදීත්, පොලී අනුපාත සංශෝධනය කිරීමෙන් සහ ණය ආපසු ගෙවීමේ කාල සීමාවන් දීර්ඝ කිරීමෙන් පවත්නා ණය කළඹ ප්‍රතිව්‍යුහගත කිරීම තුලින් පොලී පිරිවැය කළමනාකරණය කරන ලදී. තවද, රජයේ බැංකු හැරුණු විට පෞද්ගලික වාණිජ බැංකුවලින් වාසිදායක පොලී අනුපාත යටතේ නව ණය පහසුකම් ලබා ගැනීමට ලංවිම සමත් වී ඇති අතර එය වර්ෂය තුළ සමස්ත මුල්‍ය  වියදම් පහත වැටීමට ධනාත්මක දායකත්වයක් සැපයුවේය.

## මුල්‍ය තත්වය

බලශක්ති ක්ෂේත්‍රයේ පුරෝගාමියා වන ලංවීම සතු මුළු වත්කම් ප්‍රමාණය රුපියල් බිලියන 953 ක් වන අතර එය 2019 වසරට සාපේක්ෂව 4%ක වැඩිවීමකි. මේ අතර, ජංගම නොවන වත්කම් සහ ජංගම වත්කම් පිළිවෙලින් 4% සහ 5% කින් ඉහළ ගොස් ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස 2020 දෙසැම්බර් අවසානය වන විට වත්කම් සංයුතිය 88% :12% ක් බවට පත්වී තිබුණි.

රූපසටහන F 7 : වත්කම්වල චලනය




ලංවීම සතු මුළු වත්කම්වලින් 86% ක් දේපල, පිරියත සහ උපකරණ වලින් සමන්විත වන අතර  තොග සහ වෙළඳ හා වෙනත් ලැබිය යුතු දේ 12% කින් සමන්විතවේ. 2020 වර්ෂය අවසන් වන ශේෂපත්‍ර දිනය  වන විට මෙම තොග සහ ලැබිය යුතු දෑ වල ධාරණ අගය පිළිවෙලින් රුපියල් බිලියන 44ක්  සහ රුපියල් බිලියන 66 විය.

ලංවීම සතු මුළු වත්කම්වලින් 39% ක් ණය මගින් ගොඩනගා ඇති අතර එය පෙර වසරට සාපේක්ෂව නොවෙනස්ව පවති. තවද මුළු වගකීම් 5% ක් සහ ස්කන්ධ ප්‍රාග්ධනය  3% ක වැඩිවීමක් පිළිබිඹු කෙරිනි. සමාලෝචනයට භාජනය වූ කාල සීමාව තුළ අඛණ්ඩ විදුලිබල සැපයුමක් පවත්වා ගැනීම සඳහා වාණිජ බැංකුවලින් සහ අනුබද්ධ සමාගමක් වන ලංකා විදුලි පුද්ගලික සමාගම වෙතින් රුපියල් බිලියන 29 ක මුදලක් ණයට ගැනීම ලංවිම විසින් සිදු කරන ලදී.

වෙළඳ හා වෙනත් ලැබිය යුතු දේ ඉහළ වූ අභියෝගාත්මක වසංගත වාතාවරණයක් තිබියදීත්, 2019 වර්ෂය හා සසඳන විට ලංවිමෙහි ද්‍රවශීලතා තත්ත්වය වැඩි දියුණු වී ඇති අතර වර්ෂය තුළ රජයේ ප්‍රදාන මඟින් ලද පහසුකම් තුලින් වෙළඳ හා වෙනත් ගෙවිය යුතු ගෙවීම් අඩු කරගැනීමට හැකිවීම මේ සඳහා හේතුවී ඇත. තවද ලංවීම තෝලන අනුපාතය පෙර වර්ෂයේ 52% සිට මෙම වර්ෂයේ 49% දක්වා ආන්තික අඩුවීමක් පෙන්නුම් කරයි.පුත්තලම් ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතියට භාණ්ඩාගාරය ලබා දුන් ණය මුදලින් රුපියල් බිලියන 17.3 ක් ස්කන්ධ ප්‍රාග්ධනය බවට පරිවර්තනය කිරීම ලංවිමෙහි ශුද්ධ වත්කම් යහපත් කරගැනීමට සැලකිය යුතු දායකත්වයක් ලබා දුන්නේය.

## මුල්‍ය උද්දීපනයන්

මුළු වත්කම්






# සමස්ථ මෙහෙයුම් හා මුල්‍ය සමාලෝචනය

## මුළු වගකීම් සහ ස්කන්ධය




## ජංගම නොවන වත්කම් සංයුතිය




## ජංගම වත්කම් සංයුතිය



# සමස්ථ මෙහෙයුම් හා මූල්‍ය සමාලෝචනය

**මූල්‍ය අනුපාත**

| අනුපාත | 2020 | 2019 |
|---|---|---|
| ජංගම අනුපාතය | 0.55:1 | 0.49:1 |
| වත්කම් සඳහා ණය අනුපාතය | 39% | 38% |
| ස්කන්ධය සඳහා ණය | 95% | 107% |
| තෝලන අනුපාතය | 49% | 52% |
| ස්කන්ධය සඳහා ප්‍රතිලාභ අනුපාතය | -16% | -30% |
| ණය සේවා අවරණ අනුපාතය | -0.26 | -0.38 |

## අවසාන පරිශීලක ගාස්තු සහ රජයේ ප්‍රතිපත්ති

ලංවීම විසින් රජයේ ප්‍රතිපත්තියක් ලෙස විකුණුම් ස්ථානයේ සැබෑ පිරිවැයට වඩා අඩු මිලකට, අඩු පරිභෝජන මට්ටක් සහිත ගෘහස්ථ පාරිභෝගිකයින්ට සහ සාමාන්‍ය අරමුණු හැර අනෙකුත් බොහෝ පාරිභෝගික කාණ්ඩවලට විදුලිය ලබා දෙනු ලබයි

එබැවින් ඉහල පරිභෝජනයක් සහිත ගෘහස්ථ කාණ්ඩයේ / පොදු අරමුණු කාණ්ඩයේ පාරිභෝගිකයන්ට මෙම අතිරික්ත පිරිවැයෙන් කොටසක් දැරීමට සිදුවේ. පෙර වර්ෂයේ රුපියල් මිලියන 5,827 හා සසඳන විට 2020 වර්ෂය සඳහා අය කරන ලද මුළු අතිරික්තය රුපියල් මිලියන 14,883 ක් විය. බොහෝ දුරට COVID-19 වසංගත කාලය තුළ ගෘහස්ථ පාරිභෝගිකයින්ගේ බලශක්ති පරිභෝජනය වැඩිවීම ඊට හේතුවයි.

ඒ අනුව, රජයේ සහනාධාර ප්‍රතිපත්තිය හේතුවෙන් ලංවිම මූල්‍ය ප්‍රකාශන සඳහා වන ශුද්ධ බලපෑම පහත පරිදි වේ.

| | 2020 (රු. මිලියන) | 2019 (රු. මිලියන) |
|---|---|---|
| රජයේ ප්‍රතිපත්ති මත අලාභ/ හිඟ | (78,922) | (115,243) |
| අයකරන ලද අතිරික්තය | 14,883 | 5,827 |
| ශුද්ධ අලාභ | (64,039) | (109,416) |
| වෙනත් ආදායම් | 1,477 | 11,994 |
| **මූල්‍ය ප්‍රකාශන අනුව ලාභය/ (අලාභය)** | (62,561) | (97,422) |

## කොවිඩ්-19 හි බලපෑම

විදුලිබල සැපයුම අත්‍යවශ්‍යය සේවාවක් වන අතර, COVID-19 වසංගතය පැතිර යාමෙන් පසුව ඇති වූ අභියෝග මධ්‍යයේ වුවද, රට පුරා විදුලිය උත්පාදනය, සම්ප්‍රේෂණය සහ බෙදාහැරීම යන ප්‍රධාන මෙහෙයුම් අඛණ්ඩව සිදු කළේය. වෛරසය පැතිරීම අවම කිරීම සඳහා රජය විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ දැඩි ලෙස පිළිපදිමින් ලංවිම විසින් සියළුම මෙහෙයුම් ස්ථානවල සනීපාරක්ෂාව සහතික කිරීම සහ කාර්යාල සේවකයින් සඳහා නිවසින් බැහැර හා දුරස්ථ වැඩ කිරීමේ පියවරයන් සඳහා පහසුකම් සැලසීම මගින් සේවකයින්ගේ සෞඛ්‍ය හා ආරක්ෂාව සහතික කරන ලදි.

2020 මාර්තු සිට මැයි මැද භාගය දක්වා දිවයින පුරා ඇඳිරි නීතිය පැනවීම හේතුවෙන් සහ 2020 ඔක්තෝබර් - දෙසැම්බර් කාලය තුළ රටේ සමහර ප්‍රදේශවල පැවති දැඩි සංචරණ සීමා සහ රට තුළ පැවති අනෙකුත් සීමාවන් නිසා ගෘහස්ථ පාරිභෝගිකයින්ගේ විදුලි ඉල්ලුම ඉහළ යාමක් පෙන්නුම් කළ අතර කාර්මික, පොදු අරමුණු සහ හෝටල් කාණ්ඩවල ඉල්ලුම සැලකිය යුතු ලෙස පහත වැටුණි. කෙසේ වෙතත්, COVID-19 වසංගතය හේතුවෙන් විදුලිය සඳහා ඇති ඉල්ලුම අඩුවීම, අධික පිරිවැය සහිත තාප බලශක්ති ප්‍රභවයන් මත අඩු යැපීමක් සහිත වාසිදායක උත්පාදක මිශ්‍රණයකට තුඩු දුන් අතර එය 2020 වර්ෂය සඳහා ලංවීම මූල්‍ය අලාභය අඩු කිරීමට එලදායී ලෙස බලපාන ලදී.

එසේ වුවද, 2020/07/17 දිනැති කැබිනට් තීරණය අංක 20/1063/22/062 අනුව ගෘහස්ථ පාරිභෝගිකයින් සඳහා රුපියල් බිලියන 5.9 ක සහනයක් ලබා දීම ලංවිම මූල්‍ය කටයුතු කෙරෙහි අහිතකර ලෙස බලපෑම් ඇති කළේය. තවද, රජය විසින් පනවා ඇති සෞඛ්‍යමය හා සංචරණ සීමාවන් හේතුවෙන් මනු කියවීමේ හා එකතු කිරීමේ ක්‍රියාවලියටද බාධා ඇති විය.

පාරිභෝගිකයින්ගේ වැයකල හැකි ආදායමේ සිදුවු අඩුවීම් මත විදුලි බිල් පියවීම සඳහා සහන කාලයක් ලබා දීමට සහ නොගෙවූ පාරිභෝගිකයින් විසන්ධි කිරීම කල් දැමීමට රජය ගත් තීරණයත් සමඟ දැනටමත් ලංවිමෙහි පවතින අහිතකර මුදල් ප්‍රවාහයට තවදුරටත් දැඩි ලෙස බලපෑම් ඇති කළේය. එකතු කිරීමේ ක්‍රියාවලියේ ඇති වූ දුෂ්කරතා, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (CPC), ස්වාධීන විදුලිබල නිෂ්පාදකයින් (IPP) ඇතුළු උත්පාදන කාර්යයන් සදහා ප්‍රධාන සැපයුම්කරුවන්ගේ ගෙවීම් කටයුතු වලටත් ගල් අඟුරු ප්‍රසම්පාදනය සඳහා මුදල් සැපයීමටත් බලපා ඇත.

මුදල් ප්‍රවාහයට අදාළ අභියෝග අවම කිරීම සඳහා,ප්‍රාග්ධන වියදම් විදුලිබල උත්පාදනයට සෘජුවම සම්බන්ධ කාර්යයන් සඳහා පමණක් සීමා කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කළේය. තවද, 2020 වර්ෂය සඳහා අනුමත පුනරාවර්ථන අයවැයෙන් පොදු කාර්ය වියදම් (මූල්‍ය පිරිවැය හැර) 20% කින් අඩු කිරීමට තීරණය විය. පවත්නා ණයවල කොන්දේසි ප්‍රතිව්‍යුහගත කිරීම සහ ද්‍රවශීලතා මට්ටම් එලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා තරඟකාරී මිල ගණන් යටතේ නව කෙටි කාලීන ණය පහසුකම් ලබා ගැනීම සඳහා ලංවිම භාණ්ඩාගාර කළමණාකරණ කණ්ඩායම කල්තියාම කටයුතු සැලසුම් කර තිබුණි .

ශ්‍රී ලංකාව තුල මෙන්ම ගෝලීය වශයෙන් වසංගතයේ කාලසීමාව හා තීව්‍රතාවය පිළිබඳ වර්තමානයේ ඇති අවිනිශ්චිතතාවය සැලකිල්ලට ගෙන, ලංවීම මූල්‍ය කාර්ය සාධනය කෙරෙහි COVID-19 හි නිශ්චිත බලපෑම තක්සේරු කිරීම සහ ගණනය කිරීම අත්‍යවශ්‍ය වේ.කෙසේ වෙතත්, ලංවිමෙහි මූල්‍ය ස්ථායිතාව ආරක්ෂා කිරීම සඳහා උපාය මාර්ග ක්‍රියාත්මක කර සමාලෝචනය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදු කරනු ලැබේ.

# දස වසරක සාරාංශය

පසුගිය වසර 10 තුළ ලංකා විදුලිබල මණ්ඩලයේ ක්‍රියාකාරිත්වයේ ප්‍රතිඵල සහ වත්කම් තත්ත්වය පහත පරිදි දක්වා ඇත.

| දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා | 2020 ශ්‍රී. ලං. රු මිලියන | 2019 ශ්‍රී. ලං. රු මිලියන ප්‍රතිප්‍රකාශිත | 2018 ශ්‍රී. ලං. රු මිලියන ප්‍රතිප්‍රකාශිත | 2017 ශ්‍රී. ලං. රු මිලියන ප්‍රතිප්‍රකාශිත | 2016 ශ්‍රී. ලං. රු මිලියන ප්‍රතිප්‍රකාශිත | 2015 ශ්‍රී. ලං. රු මිලියන ප්‍රතිප්‍රකාශිත | 2014 ශ්‍රී. ලං. රු මිලියන ප්‍රතිප්‍රකාශිත | 2013 ශ්‍රී. ලං. රු මිලියන ප්‍රතිප්‍රකාශිත | 2012 ශ්‍රී. ලං. රු මිලියන ප්‍රතිප්‍රකාශිත | 2011 ශ්‍රී. ලං. රු මිලියන ප්‍රතිප්‍රකාශිත |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| **මෙහෙයුම් ප්‍රතිඵල** | | | | | | | | | | |
| අදායම | 238,910 | 242,950 | 229,571 | 218,450 | 206,811 | 188,684 | 202,645 | 194,147 | 163,513 | 132,460 |
| විකුණුම් පිරිවැය | (270,134) | (322,522) | (251,964) | (260,273) | (222,097) | (168,781) | (213,646) | (165,509) | (222,419) | (151,448) |
| දළ ලාභය/ (අලාභය*) | (37,131) | (79,571) | (22,393) | (41,823) | (15,286) | 19,903 | (11,001) | 28,638 | (58,907) | (18,988) |
| අනෙකුත් ආදායම් හා ලැබීම් | 8,817 | 10,307 | 9,450 | 8,143 | 10,323 | 8,292 | 5,871 | 5,107 | 4,225 | 3,810 |
| පරිපාලන වියදම් | (7,149) | (7,280) | (5,832) | (5,110) | (4,965) | (4,086) | (3,146) | (2,556) | (2,997) | (1,636) |
| මූල්‍ය ආදායම | 1338 | 1,751 | 1,466 | 1,194 | 1,049 | 434 | 304 | 1,677 | 2,429 | 416 |
| මූල්‍ය පිරිවැය | (19,705) | (22,526) | (13,036) | (8,415) | (4,312) | (5,134) | (7,030) | (10,601) | (6,198) | (3,787) |
| බදු පෙර ලාභය/ (අලාභය) | (53,830) | (97,319) | (30,345) | (46,011) | (13,191) | 19,409 | (15,002) | 22,265 | (61,448) | (20,185) |
| අදායම් බදු වියදම | (52,970) | (39) | (51) | (231) | (263) | (61) | (95) | - | - | - |
| විලම්භිත බදු (අයකිරීම්)/ හැරවීම් | - | - | - | - | - | - | 996 | (1,325) | (16,198) | (830) |
| විස්තීරණ ආදායම් | (62,561) | (97,422) | (31,936) | (47,581) | (14,457) | 20,300 | (17,285) | 20,900 | (77,770) | (21,323) |

| දෙසැම්බර් 31 දිනට | 2020 ශ්‍රී. ලං. රු මිලියන | 2019 ශ්‍රී. ලං. රු මිලියන ප්‍රතිප්‍රකාශිත | 2018 ශ්‍රී. ලං. රු මිලියන ප්‍රතිප්‍රකාශිත | 2017 ශ්‍රී. ලං. රු මිලියන ප්‍රතිප්‍රකාශිත | 2016 ශ්‍රී. ලං. රු මිලියන ප්‍රතිප්‍රකාශිත | 2015 ශ්‍රී. ලං. රු මිලියන ප්‍රතිප්‍රකාශිත | 2014 ශ්‍රී. ලං. රු මිලියන ප්‍රතිප්‍රකාශිත | 2013 ශ්‍රී. ලං. රු මිලියන ප්‍රතිප්‍රකාශිත | 2012 ශ්‍රී. ලං. රු මිලියන ප්‍රතිප්‍රකාශිත | 2011 ශ්‍රී. ලං. රු මිලියන ප්‍රතිප්‍රකාශිත |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | | | | | | |
| දේපළ පිරියත හා උපකරණ | 815,972 | 781,517 | 747,012 | 724,068 | 704,695 | 694,415 | 681,471 | 648,130 | 621,088 | 493,050 |
| පරිපාලිත සමාගම්වල ආයෝජන | 912 | 912 | 912 | 912 | 912 | 912 | 785 | 785 | 762 | 737 |
| හවුල් ව්‍යාපාරවල ආයෝජන | 329 | 329 | 329 | 329 | 329 | 329 | 150 | 150 | 150 | |
| රක්ෂණ සංචිත අරමුදලේ ආයෝජන | 9,980 | 8,997 | 8,070 | 7,246 | 6,496 | 6,036 | 5,653 | 5,250 | 4,433 | 3,710 |
| අනෙකුත් මූල්‍ය වත්කම් | 8,859 | 9,951 | 10,204 | 8,912 | 8,983 | 3,848 | 2,291 | - | - | - |
| අනෙකුත් ජංගම නොවන වත්කම් | 1,074 | 1,489 | 1,242 | 961 | 949 | 896 | - | - | - | - |
| විකිණීම සඳහා තබා ඇති ජංගම නොවන වත්කම් | 0.076 | 0.076 | 0.076 | 0.655 | 1,022 | 1,025 | 1,023 | 1,021 | - | - |
| ජංගම වත්කම් | 116,180 | 110,576 | 102,338 | 89,065 | 80,968 | 69,391 | 72,662 | 91,423 | 101,295 | 109,173 |
| **මුළු වත්කම්** | **953,306** | **913,771** | **870,107** | **831,494** | **804,354** | **776,852** | **764,035** | **746,759** | **727,728** | **606,671** |
| **වගකීම්** | | | | | | | | | | |
| පොළී දරණ ණය සහ ණය ගැනීම් | 345,387 | 318,149 | 281,262 | 236,129 | 220,476 | 214,299 | 221,735 | 355,043 | 345,700 | 184,243 |
| පාරිභෝගික තැම්පතු | 15,641 | 15,014 | 14,311 | 13,557 | 12,753 | 11,484 | 10,458 | 9,722 | 8,899 | 7,544 |
| ප්‍රතිපාදන සහ අනෙකුත් විලම්භිත වගකීම් | 20,121 | 10,482 | 10,038 | 8,622 | 7,262 | 6,116 | 6,572 | 3,236 | 3,593 | 2,930 |
| රාජ්‍ය ප්‍රදාන | 200 | 213 | 228 | 243 | 211 | - | - | - | - | - |
| විලම්භිත ආදායම් | - | - | - | - | - | 71,696 | 66,292 | 60,343 | 55,208 | 44,390 |
| කොන්ත්‍රාත් වගකීම් | 95,770 | 89,746 | 86,335 | 82,564 | 77,628 | - | - | - | - | - |
| විලම්භිත බදු | - | - | - | - | - | - | - | 22,182 | 20,857 | 17,142 |
| ජංගම වගකීම් | 212,927 | 223,803 | 145,712 | 123,682 | 72,661 | 43,630 | 64,147 | 69,134 | 96,171 | 84,945 |
| **මුළු වගකීම්** | **690,046** | **657,407** | **537,886** | **464,797** | **390,991** | **347,225** | **369,204** | **519,660** | **530,428** | **341,194** |
| **ස්කන්ධය** | | | | | | | | | | |
| දායක ප්‍රග්ධනය | 391,731 | 323,194 | 302,695 | 302,695 | 302,695 | 302,228 | 289,038 | 121,708 | 110,862 | 83,311 |
| සංචිත | 39,254 | 37,110 | 34,881 | 32,783 | 30,283 | 28,463 | 27,434 | 25,999 | 24,460 | 23,436 |
| රඳවා ගත් ඉපයීම් | (167,725) | (103,940) | (5,355) | 31,219 | 80,385 | 98,936 | 78,359 | 79,392 | 61,978 | 158,730 |
| **මුළු ස්කන්ධය** | **263,260** | **256,364** | **332,221** | **366,697** | **413,363** | **429,627** | **394,831** | **227,099** | **197,300** | **265,477** |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | **953,306** | **913,771** | **870,107** | **831,494** | **804,354** | **776,852** | **764,035** | **746,759** | **727,728** | **606,671** |

# අගය එකතු කිරීමේ ප්‍රකාශය

| | 2020<br>ශ්‍රී.ලං.රු. මිලියන | 2019<br>ශ්‍රී.ලං.රු. මිලියන |
|---|---|---|
| **එකතු කල අගය** | | |
| අදායම | 238,911 | 242,950 |
| අනෙකුත් ආදායම් | 8,817 | 10,307 |
| මූල්‍ය ආදායම | 1,338 | 1,751 |
| තෙවන පාර්ශවයන් විසින් සපයනු ලබන සම්පත් වල පිරිවැය | (148,011) | (141,255) |
| | **101,054** | **113,753** |
| **අගය බෙදාහැරීම** | | |
| **සේවකයින්ට වැටුප් හා අනෙකුත් ප්‍රතිලාභ වශයෙන්** | **38,224** | **39,743** |
| **රජයේ ආදායමට** | | |
| අදායම් බදු | 53 | 40 |
| අනෙකුත බදු | 3,173 | 7,862 |
| **ප්‍රාග්ධනය සඳහා ණය සපයන්නන්ට** | | |
| ණය මත පොළී | 19,705 | 22,526 |
| **ප්‍රජාවට** | | |
| ආයතනික සමාජ වගකීම | 69 | 306 |
| COVID-19 හේතුවෙන් සහන සැපයීම | 5,908 | - |
| සහන ගාස්තු යටතේ විදුලිය ලබා දීම | 64,039 | 109,416 |
| **වර්ධනය හා ව්‍යාප්තිය සඳහා රඳවා ගත් අගය** | | |
| රදවා ගත් අගය | (62,561) | (97,422) |
| ක්ෂය | 32,445 | 31,283 |
| | **101,054** | **113,753** |



# අධ්‍යක්ෂකවරුන්ගේ වාර්තාව

# විගණිත සමූහ මූල්‍ය ප්‍රකාශන

# අධ්‍යක්ෂකවරුන්ගේ වාර්තාව

1969 අංක 17 දරණ ලංකා විදුලිබල මණ්ඩල පනතේ 49 වන වගන්තිය ප්‍රකාරව, ලංකා විදුලිබල මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන තම විගණනය කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ සතුටින් ඉදිරිපත් කරයි.

### මූලික කාර්යයන්

මණ්ඩලයේ මූලික කාර්යයන් වන්නේ විදුලිබල උත්පාදනය, ප්‍රසම්පාදනය, සම්ප්‍රේෂණය, එලදායී බෙදා හැරීම හා විකිණීමයි. මණ්ඩලය විසින් රටේ පවතින නීති හා රෙගුලාසී වලට පටහැනි කිසිදු කටයුත්තක නිරත වී නොමැත.

### පරිපාලිතයන් හා බද්ධ ව්‍යාපාර

පරිපාලිතයන් හා බද්ධ ව්‍යාපාර වල මූලික කාර්යයන් මූල්‍ය ප්‍රකාශන වල සටහන් යටතේ පිටු අංක 110 හි දැක්වේ. සමාලෝචිත වර්ෂය තුළ මණ්ඩලයේ හා සමූහයේ ප්‍රධාන කාර්යයන්හි සැලකිය යුතු වෙනස්කම් සිදුවී නොමැත

### සමූහයේ ව්‍යුහයේ වෙනස්කම්

වර්ෂය තුළ සමූහයේ ව්‍යුහයේ වෙනස්වීම් මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 138 සිට 139 දක්වා වන මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 12 හා 13 යටතේ දක්වා ඇත.

### වර්ෂයේ කාර්ය සාධනය පිළිබඳ සමාලෝචනය

පිටු අංක 12 සිට 13 දක්වා සභාපතිවරයාගේ පණිවුඩයෙහි මණ්ඩලයේ/සමූහයේ වර්ෂයේ කාර්ය සාධනය දැක්වේ. පිටු අංක 14 සිට 15 දක්වා ඇති සාමාන්‍යාධිකාරීවරයාගේ සමාලෝචනයෙහි සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ මෙහෙයුම් පිළිබඳ විස්තරාත්මක සටහනක් සපයා ඇත. පිටු අංක 92 සිට 98 දක්වා "මූල්‍ය අංශය" මාතෘකාව යටතේ මණ්ඩලයේ මූල්‍ය කාර්ය සාධනය හා මූල්‍ය තත්ත්වය පිළිබඳ විස්තරාත්මක විශ්ලේෂණයක් සපයයි. වාර්ෂික වාර්තාවේ අවශ්‍ය අංගයක් වන මෙම වාර්තා මණ්ඩලයේ කටයුතු පිළිබඳ සාධාරණ සමාලෝචනයක් සපයයි.

### ආයතනික සමාජ වගකීම (CSR)

සමාලෝචනයට භාජනය වූ කාලය තුළ ක්‍රියාකාරකම් පිටු අංක 85 සිට 86 දක්වා ඇත.

### මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂකවරුන්ගේ වගකීම

පවත්නා තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ ප්‍රතිරූපයක් ප්‍රතිබිම්බනය කරන්නා වූ මූල්‍ය ප්‍රකාශන සැකසීම අධ්‍යක්ෂකවරුන්ගේ වගකීම වේ. මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අවශ්‍යතාවයන්ට හා 1969 අංක 17 දරණ ලංකා විදුලිබල මණ්ඩල පනතට අනුකූලව සකස් කර ඇති බව අධ්‍යක්ෂකවරුන්ගේ මතයයි. පරිපාලිත සමාගම් සම්බන්ධයෙන් 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන වලට ද අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කරනු ලැබේ.

### විගණකවරුන්ගේ වාර්ථාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වගන්තියේ විධිවිධාන හා 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතේ 51 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති ලංකා විදුලිබල මණ්ඩලයේ විගණකවරයා වේ. 2020 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන සහ මණ්ඩලය හා එහි පරිපාලිතයන්ගේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තා මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 191 සිට 199 දක්වා සහ පිටු අංක 173 සිට 179 පිළිවෙලින් දක්වා ඇත.

### ගිණුම්කරණ ප්‍රතිපත්ති

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රිලංගිප්‍ර) හා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට (ශ්‍රිලංමුවප්‍ර) අනුකූලව සමූහය හා මණ්ඩලය විසින් එහි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත. මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති පිටු 110 සිට 126 දක්වා ඇත. ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ දක්වා තිබෙන වෙනස්කම් වලට අමතරව සමාලෝචිත වර්ෂය තුළ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල ප්‍රමාණාත්මක වෙනසක් සිදුවී නොමැත.

### මණ්ඩලය සමග අධ්‍යක්ෂවරුන්ගේ බැඳීම

ලංකා විදුලිබල මණ්ඩලයේ සභාපති ලෙස එච්. එම්.විජිත හේරත් මහතා 2019 දෙසැම්බර් 23 දින පත්කර ලද අතර 2020 වර්ෂය සඳහා ඔහු සේවය සලසන ලදී. එසේම ඔහු ලංකා විදුලිබල මණ්ඩලයේ පාරිපාලිතයන් වන සීමාසහිත එල්ටීඑල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම සහ සීමාසහිත ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගමේ සභාපති වරයා ලෙසද සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු ලෙස ද පත්කරන ලදී. එසේම ඔහු 2020 වර්ෂයේදී ලංවිම හා එන්ටීපීසී - ඉන්දියා (NTPC) බද්ධ ව්‍යාපාරය වන සීමාසහිත ත්‍රිකුණාමලය විදුලිබල සමාගමෙහි ද (TPCL) සභාපති ලෙස සේවය කරන ලදී.

ලංකා විදුලිබල මණ්ඩලයේ උප සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස 2020 ජනවාරි 30 දින වයි.ජී.අයි. සමන් කුමාර මහතා පත්කරන ලද අතර ඔහු 2020 දෙසැම්බර් 14 දක්වා සේවය කරන ලදී. සමන් කුමාර මහතා ඔහුගේ ලංවිම සේවා කාලපරිච්ඡේදය තුළදී සීමාසහිත ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂවරයෙකු වශයෙන්ද පත්වීම් ලබා තිබුණි.2020 දෙසැම්බර් 16 දින එන්.එස්.ඉලංගකෝන් මහතා ලංකා විදුලිබල මණ්ඩලයේ උප සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස පත්කරන ලද අතර ඔහු සීමාසහිත ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම,සීමාසහිත එල්ටීඑල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම සහ සීමාසහිත ත්‍රිකුණාමලය විදුලිබල සමාගමේ (TPCL) අධ්‍යක්ෂවරයෙකු වශයෙන්ද පත්වීම් ලබා තිබුණි.

එන්. ඒ. රංජිත් මහතා ලංකා විදුලිබල මණ්ලයේ ක්‍රියාකාරී අධ්‍යක්ෂක සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස 2020 ජනවාරි 16 දින පත් කරන ලදුව 2020 අප්‍රේල් 24 දක්වා ලංකා විදුලිබල මණ්ඩලයේ සේවය කරන ලදී.

කර්මාන්ත හා සැපයුම්දාම කළමණාකරන අමාත්‍යාංශයේ රාජ්‍ය ලේකම්, ඩී.එච්.කේ.ජගත් චන්ද්‍රසිරි මහතා 2020 පෙබරවාරි 26 දින ලංකා විදුලිබල මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස පත් කරන ලද අතර, කර්මාන්ත අමාත්‍යාංශයේ ප්‍රධාන මූල්‍ය නිළධාරී එල්.ජී. ප්‍රේමසිරි මහතා ඩී.එච්.කේ.ජගත් චන්ද්‍රසිරි මහතා වෙනුවට අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස 2020 ඔක්තෝබර් 07 දින පත්කර තිබුණි.

ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් එස්.ඩී. ප්‍රඩි නිලුක්ෂාන් මහතා 2020 ජනවාරි 13 දින ලංකා විදුලිබල මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස පත් කරන ලද අතර 2020 වර්ෂය සඳහා ඔහු සේවය සලසන ලදී.

රාජ්‍ය සේවා පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (ව්‍යාපෘති අධීක්ෂණ) එම්.එම්. නයිමුදීන් මහතා 2020 ජනවාරි 17 දින ලංකා විදුලිබල මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස පත් කරන ලද අතර 2020 වර්ෂය සඳහා ඔහු සේවය සලසන ලදී.

බී.කේ. ජගත් පෙරේරා මහතා 2020 ජනවාරි 14 දින ලංකා විදුලිබල මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස පත් කරන ලද අතර 2020 වර්ෂය සඳහා ඔහු සේවය සලසන ලදී.

# අධ්‍යක්ෂකවරුන්ගේ වාර්තාව

රූබන් වික්‍රමාරච්චි මහතා අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයකු ලෙස 2020 අප්‍රේල් 24 දින පත්කරන ලද අතර ඔහු 2020 වර්ෂය තුළ ලංකා විදුලිබල මණ්ඩලයේ සේවය කරන ලදී.

මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 39 හි දක්වා ඇති හෙළිදරව් කිරීම් හැර 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධ්‍යක්ෂවරුන්ට මණ්ඩලය සමඟ කිසිදු ගිවිසුමක් හෝ යෝජිත ගිවිසුමක් සඳහා සම්බන්ධයක් නොමැත.

මණ්ඩලය විසින් පහත සඳහන් අනු කාරක සභා පහත පරිදි පත් කර ඇත

| නම | පිහිටවනු ලැබූ දිනය |
|---|---|
| සේවක දුක්ගැනවිලි කමිටුව | 2020 ජනවාරි 28 |
| විනය අභියාචනා මණ්ඩලය | 2020 ජනවාරි 28 |
| විගණන හා කළමනාකරණ කමිටුව | 2020 ජනවාරි 28 |
| ප්‍රසම්පාදන කමිටුව | 2020 ජනවාරි 28 |
| නීති කමිටුව | 2020 ජුනි 30 |

### 01. සේවක දුක්ගැනවිලි කමිටුව

ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයින්/හිටපු සේවකයින් පිළිබඳ දුක්ගැනිවිලි සලකා බැලීමට මණ්ඩලය විසින් පත්කරන ලද උප කමිටුව සේවක දුක්ගැනවිලි කමිටුවයි. අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනෙකුගෙන් සහ ලංවිම ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන් කිහිප දෙනෙකුගෙන් මෙම දුක්ගැනවිලි කමිටුව සමන්විත වේ.

2020 වර්ෂය තුළ දී මෙම කමිටුව එක්වරක් රැස්වී තිබූ අතර ලංවිම සේවකයින්/හිටපු සේවකයින්ගේ දුක් ගැනවිලි 03 ක් සමාලෝචනය කර සලකා බලා ඇත.

කමිටු රැස්වීම් වල සටහන් අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට ඉදිරිපත් කර ඇති අතර ඒ අනුව එකී තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා සමාන්‍යාධිකාරී /ලංවිම පියවර ගෙන ඇත.

2020 වර්ෂය සඳහා සේවක දුක්ගැනවිලි කමිටුවේ සාමාජිකයින්ගේ සංයුතිය පහත පරිදි වේ.

i. වයි.ජී.අයි. සමන් කුමාර මහතා, උප සභාපති ලංවිම, සභාපති ලෙස

ii. එන්. ඒ. රංජිත් මහතා ක්‍රියාකාරී අධ්‍යක්ෂක ලංවිම, සාමාජික ලෙස (2020 අප්‍රේල් 24 දක්වා)

iii. රූබන් වික්‍රමාරච්චි මහතා, සාමාජික ලෙස (2020 අප්‍රේල් 24 සිට)

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් මෙම උප කමිටුවේ කැඳවුම්කරු වේ.

### 02. විනය අභියාචනා මණ්ඩලය

විනය අභියාචනා මණ්ඩලය අධ්‍යක්ෂ මණ්ඩලයේ උප කමිටුවකි. ලංවිම සේවකයන්ගේ විනය කරුණු මෙහෙයවීම සඳහා මෙම කමිටුව ස්ථාපනය කරන ලදී. 2020 වර්ෂයේදී කමිටුව විධිමත්ව අවස්ථා 10 කදී රැස් වූ අතර කාරණා 24 ක් මෙහෙයවා තිබුණි.

කමිටුවේ සටහන් අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කර ඇති අතර ඒ අනුව එකී තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා ලංවිම සාමාන්‍යාධිකාරී විසින් අවශ්‍ය පියවර ගෙන ඇත

2020 වර්ෂය සඳහා විනය අභියාචනා මණ්ඩල කමිටුවේ සාමාජිකයින්ගේ සංයුතිය පහත පරිදි වේ.

i. වයි.ජී.අයි. සමන් කුමාර මහතා, උප සභාපති ලංවිම, සභාපති ලෙස (2020 දෙසැම්බර් 14 දක්වා)

ii. එන්.එස්.ඉලංගකෝන් මහතා, උප සභාපති ලංවිම, සභාපති ලෙස (2020 දෙසැම්බර් 14 සිට)

iii. එන්. ඒ. රංජිත් මහතා ක්‍රියාකාරී අධ්‍යක්ෂක ලංවිම, සාමාජික ලෙස (2020 අප්‍රේල් 24 දක්වා)

iv. රූබන් වික්‍රමාරච්චි මහතා, සාමාජික ලෙස (2020 අප්‍රේල් 24 සිට)

v. ජේ.ජී.එල්.එස්.ජයවර්ධන මහතා, අධ්‍යක්ෂ විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යංශය සාමාජික ලෙස

vi. ජගත් චන්ද්‍රසිරි මහතා, සාමාජික ලෙස (2020 සැප්තැම්බර් දක්වා)

vii. එල්.ජී. ප්‍රේමසිරි මහතා, සාමාජික ලෙස (2020 ඔක්තෝබර් සිට)

viii. පී.එස්. පතිරණ විශ්‍රාමික අතිරේක කම්කරු කොමසාරිස් ජනරාල්, සාමාජික ලෙස

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් මෙම උප කමිටුවේ කැඳවුම්කරු වේ.

### 03. නීති කමිටුව

නීති කමිටුව යනු මණ්ඩලයේ උප කමිටුවක් වන අතර ලංවිමයේ යහපත පිණිස සියළුම කටයුතු සුමටව සිදු වන බවට සහතික වීම සඳහා කමිටුව විසින් ලංවිමයේ නීතිමය කරුණු/අවස්ථා පිළිබඳව මණ්ඩලයට සමාලෝචනය කර උපදෙස් ලබා දෙනු ඇත.

2020 මූල්‍ය වර්ෂය තුළදී නීති කමිටුව නිල වශයෙන් එක්වරක් රැස්වී ඇත.

i. වයි.ජී.අයි. සමන් කුමාර මහතා, උප සභාපති ලංවිම, සභාපති ලෙස (2020 දෙසැම්බර් 14 දක්වා)

ii. එන්.එස්.ඉලංගකෝන් මහතා, උප සභාපති ලංවිම, සභාපති ලෙස (2020 දෙසැම්බර් 14 සිට)

iii. රූබන් වික්‍රමාරච්චි මහතා, සාමාජික ලෙස

iv. එම්.එම්. නයිමුදීන් මහතා, සාමාජික ලෙස

නීති නිළධාරී මෙම උප කමිටුවේ කැඳවුම්කරු වේ.

### 04. විගණන කමිටුව

ආයතනයේ පාලනය හා අවදානම් කළමනාකරණ පද්ධති සමාලෝචනය කිරීම, අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සහ අභ්‍යන්තර විගණනයේ හා බාහිර විගණනයේ කාර්යයන් පිළිබඳ විග්‍රහයක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ උප කමිටුවක් ලෙස විගණන කමිටුවට සමස්ත වගකීමක් ඇත.

#### සංයුතිය

විගණන කමිටුව මූල්‍ය, විගණන හා ආශ්‍රිත ක්ෂේත්‍රයන්හි මනා කුසලතා සහ පුළුල් අත්දැකීම් ඇති ස්වාධීන අධ්‍යක්ෂවරුන් හතර දෙදෙනෙකුගෙන් සමන්විත වන අතර අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධානී කමිටුවේ කැඳවුම්කරු ලෙස කටයුතු කරයි. ප්‍රධාන විධායක නිලධාරී ලෙස සාමාන්‍යාධිකාරී, මූල්‍ය කළමනාකරු හා විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතයකු සහ විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යංශයේ නියෝජිතයෙකු රැස්වීමට ආරාධිතව සහභාගී වෙයි.

# අධ්‍යක්ෂකවරුන්ගේ වාර්තාව

2020 වර්ෂය සඳහා විගණන කමිටුවේ සංයුතිය පහත පරිදි විය.

| | | |
|---|---|---|
| එස්.ඩී. ජුඩ් නිලුක්ෂාන් මහතා | - | සභාපති |
| එම්.එම්. නයිමුදීන් මහතා | - | සාමාජික |
| බී.කේ. ජගත් පෙරේරා මහතා | - | සාමාජික |
| ජගත් චන්ද්‍රසිරි මහතා | - | සාමාජික |
| එල්.ජී. ප්‍රේමසිරි මහතා | - | සාමාජික |

මෙහෙයුම් හා මූල්‍ය සමාලෝචන ක්ෂේත්‍රයන්හී සිදුකෙරෙන අභ්‍යන්තර විගණන හා බාහිර විගණන සඳහා ඉදිරිපත් කරන ලද වාර්තා විගණන කමිටුව විසින් සමාලෝචනය කර සාකච්ඡා කරයි. විගණන කමිටුව මෙම වාර්තා ඔවුන්ගේ පුළුල් අත්දැකීම් සහ විශේෂඥතාව භාවිතා කරමින් සමාලෝචනය කරන අතර පවත්නා අභ්‍යන්තර පාලන පද්ධති ශක්තිමත් කිරීම සඳහා ක්‍රියාත්මක කළ හැකි අතිරේක පාලනයන් හා අවදානම් අවම කිරීමේ උපාය මාර්ග නිර්දේශ කරයි. එමඟින් වංචා හා දෝෂ සිදුවීම් අවම කෙරෙන අතර ආයතනය මුහුණ දෙන මෙහෙයුම් හා මූල්‍ය අවධානම් අවම කෙරේ. වර්ෂය තුළ කමිටුව විධිමත්ව අවස්ථා 3ක දී රැස් වී තිබුණි.

### නීති හා රෙගුලාසි වලට අනුකූල වීම

සමූහය නීති හා රෙගුලාසි වලට පටහැනිව කිසිදු කාර්යයක නිරත වී නොමැති බව අධ්‍යක්ෂකවරු ඔවුන්ගේ උපරිම දැනුමෙන් හා විශ්වාසයෙන් සනාථ කරයි.

### පවතින නඩු කටයුතු

අධ්‍යක්ෂවරු/අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික මතය අනුව සහ මණ්ඩලයේ නීතිඥවරුන් විසින් සනාථ කරන ලද පරිදි වාර්තා කරන ලද මූල්‍ය ප්‍රතිඵල හෝ මණ්ඩලයේ ඉදිරි මෙහෙයුම් කටයුතු සඳහා දැනට මණ්ඩලයට එරෙහිව විභාග වෙමින් පවතින නඩු කටයුතු වලින් ප්‍රමාණවත් බලපෑමක් නොවනු ඇත.

### ව්‍යවස්ථාපිත ගෙවීම්

රජය සහ සේවකයන් සම්බන්ධයෙන් ගෙවිය යුතු සියළුම ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත වේලාවන්හිදීම සිදුකර ඇති බව මණ්ඩලය තහවුරු කරයි.

### ශේෂපත්‍ර දිනට පසු සිදුවීම්

මූල්‍ය වර්ෂය අවසානය සහ මෙම වාර්තාවේ දිනය අතර කාල පරතරය තුළ ගැළපීම් හෝ හෙළිදරව් කිරීම් අවශ්‍යවන ප්‍රමාණාත්මක සිදුවීම් කිසිවක් පැන නැගී නොමැති බව අධ්‍යක්ෂවරුන්ගේ අදහසයි

### අඛණ්ඩ පැවැත්ම

මණ්ඩලයේ සම්පත් එහි මෙහෙයුම් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් බව අධ්‍යක්ෂවරුන්ගේ විශ්වාසය වේ. එබැවින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී අඛණ්ඩ පැවැත්ම පදනම අදාළ කරගෙන ඇත.

# ලාභ හෝ අලාභ ප්‍රකාශනය

**2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා**

(සියළුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත)

| | | සමූහය | | මණ්ඩලය | |
|---|---|---|---|---|---|
| | සටහන | 2020 | 2019 | 2020 | 2019 |
| **අඛණ්ඩ මෙහෙයුම්** | | | ප්‍රතිප්‍රකාශිත | | ප්‍රතිප්‍රකාශිත |
| ආදායම | 4 | 264,266,258 | 267,041,265 | 238,910,553 | 242,950,327 |
| ගෘහස්ත පාරිභෝගිකයින් සඳහා සහන | 5 | (5,907,770) | - | (5,907,770) | - |
| විකුණුම් පිරිවැය | | (280,777,548) | (336,463,749) | (270,134,142) | (322,521,607) |
| **දළ ලාභය / (අලාභය)** | | **(22,419,060)** | **(69,422,484)** | **(37,131,359)** | **(79,571,280)** |
| වෙනත් මෙහෙයුම් ආදායම් සහ ලාභ | 6 | 9,843,996 | 17,021,754 | 8,817,160 | 10,306,591 |
| බෙදාහැරීමේ පිරිවැය | | (166,221) | (392,611) | - | - |
| වෙනත් වියදම් | | (3,163,877) | (355,200) | - | - |
| පරිපාලන වියදම් | | (11,588,301) | (11,967,383) | (7,149,157) | (7,280,014) |
| **මෙහෙයුම් ලාභය/ (අලාභය)** | | **(27,493,463)** | **(65,115,924)** | **(35,463,356)** | **(76,544,703)** |
| මූල්‍ය ආදායම | 7.1 | 2,823,643 | 3,848,623 | 1,337,772 | 1,751,170 |
| මූල්‍ය පිරිවැය | 7.2 | (21,429,720) | (24,103,238) | (19,705,301) | (22,525,622) |
| මූල්‍ය පිරිවැය-ශුද්ධ | | (18,606,077) | (20,254,615) | (18,367,529) | (20,774,452) |
| බද්ධ ව්‍යාපාරයේ අලාභ කොටස | 13 | (6,143) | (6,850) | - | - |
| **බදු පෙර ලාභය /(අලාභය)** | **8** | **(46,105,683)** | **(85,377,389)** | **(53,830,885)** | **(97,319,155)** |
| ආදායම් බදු වියදම් | 9.1 | (2,641,845) | (1,901,477) | (52,970) | (39,529) |
| විලම්භිත බදු (ගාස්තු)/ ප්‍රතිවර්ථන | 9.2 | 211,805 | (522,385) | - | - |
| **අඛණ්ඩ මෙහෙයුම් මගින් වර්ෂය තුල උපයන ලද ලාභය/(අලාභය)** | | **(48,535,723)** | **(87,801,251)** | **(53,883,855)** | **(97,358,684)** |
| **විසර්ජනය** | | | | | |
| **පරිපාලන හිමි අයිතිය** | | (52,593,156) | (93,860,667) | | |
| **පාලනයට යටත් නොවන හිමිකම්** | | 4,057,433 | 6,059,416 | | |
| | | (48,535,723) | (87,801,251) | | |

පිටු අංක 110 සිට 172 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල කොටසක් වේ.

# විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

**2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා**

(සියළුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත)

| | සමූහය | | මණ්ඩලය | |
|---|---|---|---|---|
| | 2020 | 2019 ප්‍රතිප්‍රකාශිත | 2020 | 2019 ප්‍රතිප්‍රකාශිත |
| **අඛණ්ඩ මෙහෙයුම්වලින් වර්ෂය සඳහා ලාභ (අලාභය)** | **(48,535,723)** | **(87,801,251)** | **(53,883,855)** | **(97,358,684)** |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | | | |
| පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ බැදීම් මත ආයුගණක අලාභය | (8,877,951) | (65,714) | (8,677,629) | (63,710) |
| අයුගණක ලාභය/(අලාභය) මත විලම්භිත බදු වල බලපෑම | 55,961 | 562 | - | - |
| විදේශ පරිපාලිත මෙහෙයුම් පරිවර්තන මත විනිමය වෙනස්වීම් | 336,800 | (115,468) | - | - |
| විකුණුම සඳහා ඇති මූල්‍ය වත්කම් මත සාධාරණ අගයෙහි ලාභය | 126,398 | 466,166 | - | - |
| **වර්ෂය සඳහා බදු පසු මුළු විස්තීර්ණ ආදායම** | **(56,894,516)** | **(87,515,705)** | **(62,561,484)** | **(97,422,394)** |
| විසර්ජනය : | | | | |
| පරිපාලන හිමි අයිතිය | (61,181,043) | (93,713,405) | | |
| පාලනයට යටත් නොවන හිමිකම් | 4,286,527 | 6,197,700 | | |
| | **(56,894,516)** | **(87,515,705)** | | |

පිටු අංක 110 සිට 172 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල කොටසක් වේ.

# මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

**2020 දෙසැම්බර් 31 දිනට**

(සියළුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත)

| | සටහන | සමූහය 2020 | සමූහය 2019 ප්‍රතිප්‍රකාශිත | සමූහය ජනවාරි 01 දිනට 2019 ප්‍රතිප්‍රකාශිත | මණ්ඩලය 2020 | මණ්ඩලය 2019 ප්‍රතිප්‍රකාශිත | මණ්ඩලය ජනවාරි 01 දිනට 2019 ප්‍රතිප්‍රකාශිත |
|---|---|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | | | |
| දේපල පිරියත හා උපකරණ | 10 | 835,795,922 | 799,116,029 | 763,064,685 | 815,809,520 | 781,408,827 | 746,885,067 |
| කල්බදු ඉඩම් සඳහා ගෙවූ වාරික | | - | 235,577 | 229,042 | - | - | - |
| අස්පෘශ්‍ය වත්කම් | 11 | 512,455 | 499,056 | 532,736 | 161,508 | 107,718 | 127,226 |
| පරිපාලිත සමාගම්වල ආයෝජන | 12 | - | - | - | 911,813 | 911,813 | 911,813 |
| බද්ධ ව්‍යාපාරවල ආයෝජන | 13 | 30,757 | 36,900 | 43,750 | 328,606 | 328,606 | 328,606 |
| ලැබිය යුතු මූල්‍ය කල්බදු | 14 | 19,588,944 | 19,899,441 | 9,775,319 | - | - | - |
| වෙනත් ජංගම නොවන මූල්‍ය වත්කම් | 15 | 24,418,096 | 25,353,078 | 2,303,439 | 8,859,225 | 9,951,461 | 10,204,445 |
| වෙනත් ජංගම නොවන වත්කම් | 16 | 2,160,224 | 2,591,430 | 36,461,582 | 1,073,891 | 1,489,354 | 1,241,869 |
| රක්ෂණ සංචිතවල ආයෝජන | 17 | 9,980,730 | 8,996,893 | 8,070,253 | 9,980,730 | 8,996,893 | 8,070,253 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | 892,487,128 | 856,728,404 | 820,480,806 | 837,125,293 | 803,194,672 | 767,769,279 |
| විකුණුම් සදහා ඇති ජංගම නොවන වත්කම් | 18 | 76 | 76 | 76 | 76 | 76 | 76 |
| **ජංගම වත්කම්** | | | | | | | |
| භාණ්ඩ තොග | 19 | 52,113,549 | 55,852,975 | 48,309,728 | 44,174,621 | 48,253,593 | 42,712,420 |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ | 20 | 79,261,983 | 56,491,746 | 57,740,010 | 60,252,638 | 49,126,626 | 48,515,530 |
| සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු දෑ | 21 | - | - | - | 5,322,241 | 5,984,849 | 4,986,694 |
| ලැබිය යුතු උප මූල්‍ය කල්බදු | | - | 21,109 | - | - | - | - |
| ලැබිය යුතු මූල්‍ය කල්බදු | 14 | 1,015,236 | 910,171 | 569,718 | - | - | - |
| වෙනත් ජංගම මූල්‍ය වත්කම් | 15 | 33,652,650 | 27,080,350 | 19,565,808 | 2,826,654 | 3,485,735 | 3,872,615 |
| මුදල් හා බැංකු ශේෂ | 32 | 9,632,295 | 7,282,167 | 5,503,939 | 3,604,157 | 3,725,333 | 2,250,515 |
| **මුළු ජංගම වත්කම්** | | 175,675,713 | 147,638,518 | 131,689,203 | 116,180,311 | 110,576,136 | 102,337,774 |
| **මුළු වත්කම්** | | 1,068,162,917 | 1,004,366,998 | 952,170,085 | 953,305,680 | 913,770,884 | 870,107,129 |
| **ස්කන්ධය හා වගකීම්** | | | | | | | |
| **ප්‍රාග්ධනය හා ස්කන්ධය** | | | | | | | |
| දායක ප්‍රාග්ධනය | 22 | 391,730,584 | 323,194,038 | 302,694,797 | 391,730,584 | 323,194,038 | 302,694,797 |
| සංචිත | 23 | 52,807,114 | 50,082,923 | 44,511,162 | 39,253,987 | 37,109,568 | 34,881,039 |
| රඳවාගත් ඉපැයීම්/(අලාභ) | | (142,625,240) | (88,317,951) | 9,897,996 | (167,725,235) | (103,940,037) | (5,355,297) |
| **මව් සමාගමේ කොටස් හිමියන්ට අදාළ හිමිකම්** | | 301,912,458 | 284,959,010 | 357,103,955 | 263,259,336 | 256,363,569 | 332,220,539 |
| පාලනයට යටත් නොවන හිමිකම් | | 34,622,332 | 31,655,308 | 25,758,561 | - | - | - |
| **මුළු ස්ක්න්ධය** | | 336,534,790 | 316,614,318 | 382,862,516 | 263,259,336 | 256,363,569 | 332,220,539 |
| **ජංගම නොවන වත්කම් හා විලම්භිත ආදායම්** | | | | | | | |
| පොලිය සහිත ණය හා ණය ගැනීම් | 24 | 357,676,324 | 324,004,981 | 288,351,654 | 345,386,873 | 318,149,176 | 281,262,195 |
| පාරිභෝගික තැන්පතු | 25 | 15,640,571 | 15,013,791 | 14,311,008 | 15,640,571 | 15,013,788 | 14,311,005 |
| ප්‍රතිපාදන හා අනෙකුත් විලම්භිත වගකීම් | 26 | 21,801,592 | 11,788,539 | 11,257,055 | 20,120,599 | 10,482,144 | 10,038,368 |
| රාජ්‍ය ප්‍රදාන | 27 | 278,934 | 297,697 | 318,228 | 200,334 | 213,303 | 228,022 |
| ගිවිසුම් ගත වගකීම් | 28 | 100,694,746 | 94,421,389 | 90,809,989 | 95,770,723 | 89,746,084 | 86,335,217 |
| විලම්භිත බදු | 29 | 489,800 | 753,562 | 276,157 | - | - | - |
| | | 496,581,967 | 446,279,959 | 405,324,091 | 477,119,100 | 433,604,495 | 392,174,807 |
| **ජංගම වගකීම්** | | | | | | | |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ | 30 | 189,330,262 | 200,461,069 | 136,393,678 | 180,956,115 | 191,130,723 | 125,515,300 |
| ගෙවිය යුතු ලාභාංශ | | 905,034 | 2,303,807 | 2,258,669 | - | - | - |
| සම්බන්ධිත පාර්ශවයන්ට ගෙවිය යුතු මුදල | 31 | - | - | - | 4,213,942 | 2,989,787 | 3,557,973 |
| පොලිය සහිත ණය හා ණය ගැනීම් | 24 | 41,798,351 | 36,492,272 | 22,995,033 | 26,486,421 | 28,411,544 | 15,367,744 |
| ගෙවිය යුතු ආදායම් බදු | | 3,012,513 | 2,215,573 | 2,336,098 | 1,270,766 | 1,270,766 | 1,270,766 |
| | | 235,046,160 | 241,472,721 | 163,983,478 | 212,927,244 | 223,802,820 | 145,711,783 |
| **මුළු ස්කන්ධ හා වගකීම්** | | 1,068,162,917 | 1,004,366,998 | 952,170,085 | 953,305,680 | 913,770,884 | 870,107,129 |

පිටු අංක 110 සිට 172 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල කොටසක් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය හා කළමනාකාරීත්වය වගකීම දරයි මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලද්දේ ,


සභාපති


උප සභාපති


සාමාන්‍යාධිකාරී


මුදල් කළමනාකරු

කොළඹ
2021.06.15

# ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

**2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා**

| සමූහය | දායක ප්‍රාග්ධනය | ප්‍රාග්ධන සංචිත | ක්ෂය සංචිත | වත්කම් ප්‍රතිස්ථාපන සංචිත |
|---|---|---|---|---|
| **2019 ජනවාරි 01 වන දිනට ශේෂය (ප්‍රතිප්‍රකාශිත)** | 302,694,797 | 19,179,474 | 23,000 | 294,930 |
| වර්ෂය සඳහා ලාභය /(අලාභය) | - | - | - | - |
| විශ්‍රාම ප්‍රතිලාභ මත ආයුගණක ලාභය/(අලාභය) | - | - | - | - |
| ඕසීඅයි ආයෝජන වල සාධාරණ අගය මත ශුද්ධ ලාභ/(අලාභ) | - | - | - | - |
| හුවමාරු තුල්‍ය සංචිත | - | (39,667) | - | - |
| **මුළු විස්තීර්ණ ආදායම** | 302,694,797 | 19,139,807 | 23,000 | 294,930 |
| ස්කන්ධය ලෙස පරිවර්තිත ණය | 16,942,799 | - | - | - |
| පුත්තලම ගල් අඟුරු විදුලිබල ව්‍යාපෘතිය | 3,556,442 | - | - | - |
| රක්ෂණ සංචිත අරමුදලෙන් ලද පොලී ආදායම | - | - | - | - |
| ස්වයං රක්ෂණ සංචිතයට මාරුකිරීම් | - | - | - | - |
| ක්ෂය සංචිතයට මාරුකිරීම් | - | - | 1,000 | - |
| ආර්එච්සීපී ව්‍යාපෘතිය (පාරිභෝගිකයන්ගෙන් ලද පොළිය) | - | 58,045 | - | - |
| ආයෝජන සංචිතය | - | - | - | - |
| ස්ථාවර වත්කම් ප්‍රතිස්ථාපන සංචිතය | - | - | - | 17,564 |
| සංවර්ධන සංචිත | - | - | - | - |
| පාලන බලය වෙනස්වීමකින් තොරවූ හිමිකාරීත්වයේ වෙනස් වීම් | - | - | - | - |
| උප සමාගම් කොටස් නිකුත් කිරීම | - | - | - | - |
| ලාභාංශ ගෙවීම් - එල්ටීඑල් | - | - | - | - |
| ලාභාංශ ගෙවීම් - ලෙකෝ | - | - | - | - |
| **2019 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 323,194,038 | 19,197,852 | 24,000 | 312,494 |
| වර්ෂය සඳහා ලාභ/(අලාභ) | - | - | - | - |
| විශ්‍රාම ප්‍රතිලාභ මත ආයුගණක ලාභය/(අලාභය) | - | - | - | - |
| ඕසීඅයි ආයෝජන වල සාධාරණ අගය මත ශුද්ධ ලාභ/(අලාභ) | - | - | - | - |
| හුවමාරු තුල්‍ය සංචිත | - | 103,426 | - | - |
| **මුළු විස්තීර්ණ ආදායම** | 323,194,038 | 19,301,278 | 24,000 | 312,494 |
| ස්කන්ධය ලෙස පරිවර්තිත ණය | 17,361,455 | - | - | - |
| පුත්තලම ගල් අඟුරු විදුලිබල ව්‍යාපෘතිය | 3,175,091 | - | - | - |
| රක්ෂණ සංචිත අරමුදලෙන් ලද පොලී ආදායම | - | - | - | - |
| ඉන්ධන මිල ස්ථායිකරණ අරමුදලෙන් අතිරේක ස්කන්ධ ආයෝජනය(FPSF) | 48,000,000 | - | - | - |
| ස්වයං රක්ෂණ සංචිතයට මාරුකිරීම් | - | - | - | - |
| ක්ෂය සංචිතයට මාරුකිරීම් | - | - | 1,000 | - |
| ආර්එච්සීපී ව්‍යාපෘතිය (පාරිභෝගිකයින්ගෙන් ලද පොළී) | - | 36,601 | - | - |
| ආයෝජන සංචිතය | - | - | - | |
| සංවර්ධන සංචිත | - | - | - | - |
| උප සමාගම් කොටස් නිකුත් කිරීම | - | - | - | - |
| ලාභාංශ ගෙවීම් - එල්ටීඑල් | - | - | - | - |
| ලාභාංශ ගෙවීම් - ලෙකෝ | - | - | - | - |
| **2020 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 391,730,584 | 19,337,879 | 25,000 | 312,494 |

පිටු අංක 110 සිට 172 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල කොටසක් වේ.

# ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

**2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා**

(සියළුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත)

| ආයෝජන සංචිත | ස්වයං රක්ෂණ සංචිත | සාධාරණ අගය සංචිත | සංවර්ධන සංචිත | රඳවාගත් ඉපයීම් | පාලනයට යටත් නොවන කොටස් හිමිකම | එකතුව |
|---|---|---|---|---|---|---|
| 2,821,145 | 16,370,888 | 5,810,700 | 11,025 | 9,897,996 | 25,758,561 | 382,862,516 |
| - | - | - | - | (93,860,667) | 6,059,416 | (87,801,251) |
| - | - | - | - | (62,901) | (2,252) | (65,153) |
| - | - | 249,829 | - | - | 216,338 | 466,167 |
| - | - | - | - | - | (75,801) | (115,468) |
| 2,821,145 | 16,370,888 | 6,060,529 | 11,025 | (84,025,572) | 31,956,262 | 295,346,811 |
| - | - | - | - | - | - | 16,942,799 |
| - | - | - | - | - | - | 3,556,442 |
| - | 1,008,138 | - | - | - | - | 1,008,138 |
| - | 1,161,346 | - | - | (1,161,346) | - | - |
| - | - | - | - | (1,000) | - | - |
| - | - | - | - | - | - | 58,045 |
| 3,109,206 | - | - | - | (3,109,206) | - | - |
| - | - | - | - | (17,564) | - | - |
| - | - | - | 6,300 | (6,300) | - | - |
| - | - | - | - | 3,037 | (20,022) | (16,985) |
| - | - | - | - | - | 2,550,207 | 2,550,207 |
| - | - | - | - | - | (2,223,548) | (2,223,548) |
| - | - | - | - | - | (607,591) | (607,591) |
| 5,930,351 | 18,540,372 | 6,060,529 | 17,325 | (88,317,951) | 31,655,308 | 316,614,318 |
| - | - | - | - | (52,593,156) | 4,057,433 | (48,535,723) |
| - | - | - | - | (80,227) | (64,135) | (144,362) |
| - | - | 66,154 | - | - | 59,857 | 126,011 |
| - | - | - | - | - | 233,374 | 336,800 |
| 5,930,351 | 18,540,372 | 6,126,683 | 17,325 | (140,991,334) | 35,941,837 | 268,397,044 |
| - | - | - | - | - | - | 17,361,455 |
| - | - | - | - | - | - | 3,175,091 |
| - | 884,104 | - | - | - | - | 884,104 |
| - | - | - | - | - | - | 48,000,000 |
| - | 1,222,714 | - | - | (1,222,714) | - | - |
| - | - | - | - | (1,000) | - | - |
| - | - | - | - | - | - | 36,601 |
| 400,192 | - | - | - | (400,192) | - | - |
| - | - | - | 10,000 | (10,000) | - | - |
| - | - | - | - | - | 119,925 | 119,925 |
| - | - | - | - | - | (1,100,732) | (1,100,732) |
| - | - | - | - | - | (338,698) | (338,698) |
| 6,330,543 | 20,647,190 | 6,126,683 | 27,325 | (142,625,240) | 34,622,332 | 336,534,790 |

# ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

**2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා**

(සියළුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත)

| මණ්ඩලය | දායක ප්‍රාග්ධනය | අනෙකුත් ප්‍රාග්ධන සංචිත | ආර්. එච්. සී. පී. සංචිත | ණය නිදහස් කිරීමේ සංචිතය | ක්ෂය සංචිත | ස්වයං රක්ෂණ සංචිත | රඳවාගත් ඉපයීම් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| **2019 ජනවාරි මස 01 දිනට ශේෂය (ප්‍රතිප්‍රකාශිත)** | 302,694,797 | 165,446 | 890,594 | 17,447,062 | 23,000 | 16,354,937 | (5,355,297) | 332,220,539 |
| වර්ෂය සඳහා ලාභ /(අලාභ) | - | - | - | - | - | - | (97,422,394) | (97,422,394) |
| රක්ෂණ සංචිත අරමුදලෙන් ලද පොලී ආදායම | - | - | - | - | - | 1,008,138 | - | 1,008,138 |
| ස්කන්ධය ලෙස පරිවර්තිත ණය | 16,942,799 | - | - | - | - | - | - | 16,942,799 |
| පුත්තලම ගල් අඟුරු විදුලිබල ව්‍යාපෘතිය | 3,556,442 | - | - | - | - | - | - | 3,556,442 |
| ක්ෂය සංචිතයට මාරුකිරීම් | - | - | - | - | 1,000 | - | (1,000) | - |
| ස්වයං රක්ෂණ සංචිතයට මාරුකිරීම් | - | - | - | - | - | 1,161,346 | (1,161,346) | - |
| ආර්එච්සීපී ව්‍යාපෘතිය (පාරිභෝගිකයින්ගෙන් ලද පොලී) | - | - | 58,045 | - | - | - | - | 58,045 |
| **2019 දෙසැම්බර් මස 31 දිනට ශේෂය (ප්‍රතිප්‍රකාශිත)** | **323,194,038** | **165,446** | **948,639** | **17,447,062** | **24,000** | **18,524,421** | **(103,940,037)** | **256,363,569** |
| වර්ෂය සදහා ලාභ /(අලාභ) | - | - | - | - | - | - | (62,561,484) | (62,561,484) |
| රක්ෂණ සංචිත අරමුදලෙන් ලද පොලී ආදායම | - | - | - | - | - | 884,104 | - | 884,104 |
| ස්කන්ධය ලෙස පරිවර්තිත ණය | 3,175,091 | - | - | - | - | - | - | 3,175,091 |
| පුත්තලම ගල් අඟුරු විදුලිබල ව්‍යාපෘතිය | 17,361,455 | - | - | - | - | - | - | 17,361,455 |
| ඉන්ධන මිල ස්ථායිකරණ අරමුදලෙන් අතිරේක ස්කන්ධ ආයෝජනය (FPSF) | 48,000,000 | - | - | - | - | - | - | 48,000,000 |
| ක්ෂය සංචිතයට මාරු කිරීම් | - | - | - | - | 1,000 | - | (1,000) | - |
| ස්වයං රක්ෂණ සංචිකයට මාරු කිරීම් | - | - | - | - | - | 1,222,714 | (1,222,714) | - |
| ආර්එච්සීපී ව්‍යාපෘතිය (පාරිභෝගිකයින්ගෙන් ලද පොලී) | - | | 36,601 | - | - | - | - | 36,601 |
| **2020 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 391,730,584 | 165,446 | 985,240 | 17,447,062 | 25,000 | 20,631,239 | (167,725,235) | 263,259,336 |

පිටු අංක 110 සිට 172 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල කොටසක් වේ.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

**2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා**

(සියළුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත)

| | සමූහය | | මණ්ඩලය | |
|---|---|---|---|---|
| | 2020 | 2019 | 2020 | 2019 |
| **මෙහෙයුම් කටයුතුවල වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | | | |
| බදු පෙර ලාභ/(අලාභ) | (46,105,683) | (85,377,389) | (53,830,885) | (97,319,155) |
| **ගැලපීම්** | | | | |
| ක්ෂය-වර්ෂය සඳහා අයවීම | 34,126,242 | 32,893,574 | 32,445,270 | 31,282,934 |
| පාරිභෝගික දායකය ක්‍රමක්ෂය කිරීම | (3,841,968) | (3,975,636) | (3,440,050) | (3,594,603) |
| රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම් | (20,511) | (20,531) | (14,718) | (14,718) |
| දේපල, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද ලාභ/(අලාභ) | (48,658) | 13,234 | (31,285) | (3,131) |
| මූල්‍ය පිරිවැය | 21,445,900 | 15,758,216 | 19,719,633 | 14,177,340 |
| යල්පැන ගිය භාවිතා කළ නොහැකි තොග සඳහා ප්‍රතිපාදන | 15,069 | (12,887) | 71,706 | 61,228 |
| මිල විචලනය සඳහා ප්‍රතිපාදන | 347,263 | (958,460) | 347,263 | (958,460) |
| ණයකරුවන් හානිකරණය වීම සඳහා ප්‍රතිපාදන | 1,842,072 | 1,657,181 | 1,343,916 | 938,432 |
| බොල් ණය කපාහැරීම | - | 11,165 | - | 11,165 |
| විද්‍යුත් වාහන ආරෝපණ ආදායම | (2,836) | (3,782) | (2,836) | (3,782) |
| බද්ධ ව්‍යාපාරවල කොටස් ලාභ/(අලාභ) | 6,143 | 6,850 | - | - |
| අස්පෘෂ්‍ය වත්කම්වල ක්‍රමක්ෂය | 44,868 | 39,722 | - | - |
| මූල්‍ය ආදායම | (2,823,644) | (3,848,624) | (1,337,772) | (1,751,170) |
| ලාභාංශ ආදායම | (807,188) | (8,609,571) | (1,129,505) | (2,746,968) |
| විදේශ මුදල් ලාභ හෝ අලාභ | 51,963 | 650,805 | - | - |
| ලැබිය යුතු මූල්‍ය කල්බදු සඳහා අදායම් බැරකම් | 1,461,389 | 887,365 | - | - |
| නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම | 1,342,111 | 1,299,692 | 1,117,957 | 1,106,619 |
| විශ්‍රාම වැටුප් අරමුදලේ පිරිවැය | 534,584 | 212,058 | 534,584 | 212,058 |
| කලින් ගෙවූ කාර්ය මණ්ඩල පිරිවැය | 770,929 | 982,973 | 770,928 | 982,972 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභ/(අලාභ)** | 8,338,045 | (48,394,045) | (3,435,794) | (57,619,239) |
| භාණ්ඩ තොග (වැඩිවීම)/අඩුවීම | 3,739,426 | (5,603,865) | 5,013,879 | (3,621,559) |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ (වැඩිවීම)/අඩුවීම | (22,770,237) | 611,495 | (10,534,141) | (1,798,544) |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ වැඩිවීම/(අඩුවීම) | (11,130,807) | 63,100,741 | (4,931,331) | 64,098,696 |
| **මෙහෙයුම් වලින් ජනිත මුදල්** | (21,823,573) | 9,714,326 | (13,887,387) | 1,059,354 |
| ගෙවූ මූල්‍ය පිරිවැය | (21,431,568) | (12,190,937) | (19,705,300) | (10,610,061) |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් | (740,303) | (1,045,981) | (691,714) | (938,612) |
| ගෙවූ ආදායම් බදු | (1,947,109) | (2,543,303) | - | (39,529) |
| **මෙහෙයුම් කටයුතු වල (යෙදවූ)/කටයුතු වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | (45,942,553) | (6,065,895) | (34,284,401) | (10,528,848) |
| **ආයෝජන කටයුතු වල (යෙදවූ) /කටයුතු වලින් ජනනය වූ මුදල් ප්‍රවාහ** | | | | |
| දේපල පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම සහ කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ | (71,268,227) | (69,395,632) | (68,376,154) | (66,868,244) |
| උප සමාගම් ලැබිය යුතු මූල්‍ය කල්බදු අත්පත් කර ගැනීම | (68,224) | (13,449,665) | - | - |
| අස්පෘශ්‍ය වත්කම් අත්පත් කර ගැනීම | (89,732) | (20) | (89,732) | - |
| රක්ෂණ සංචිත අරමුදලේ නැවත ආයෝජනය | (983,837) | (926,640) | (983,837) | (926,640) |
| රක්ෂණ සංචිත අරමුලෙන් ලද පොලී | 884,104 | 1,008,138 | 884,104 | 1,008,138 |
| මූල්‍ය වත්කම්වල ආයෝජන | 12,607,086 | 3,289,048 | - | - |
| පාලනයට යටත් නොවන හිමිකම් අත්පත් කර ගැනීම | 96,300 | 2,569,179 | - | - |
| විදේශ ආයෝජන මත ආදායම | - | (5,218) | - | - |
| ලද ලාභාංශ | 807,188 | 8,609,571 | 2,204,559 | 2,636,334 |
| ලද පොලී | 1,445,566 | 2,864,461 | 566,843 | 767,007 |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද මුදල් | 36,009 | 7,541 | 31,322 | 3,131 |
| ගෙවූ ලාභාංශ | (3,209,977) | (2,825,529) | - | - |
| **අයෝජන කටයුතු වල (යෙදවූ)/කටයුතු වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | (59,743,744) | (68,254,766) | (65,762,895) | (63,380,274) |
| **මුදල් යෙදවීමේ කටයුතු වල (යෙදවූ) /කටයුතු වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | | | |
| දායක ප්‍රාග්ධන ලැබීම් | 51,175,091 | - | 51,175,091 | - |
| පාරිභෝගික දායකත්වය | 5,964,166 | 8,534,901 | 5,445,429 | 7,953,336 |
| විදුලි වාහන සඳහා ඊ-කාර්ඩ් පෙර ගෙවීම් | 2,977 | 4,458 | 2,977 | 4,458 |
| එච්ආර්සීපී ව්‍යාපෘතිය සඳහා අරමුදල් ලැබීම් | 36,601 | 58,045 | 36,601 | 58,045 |
| ප්‍රදාන ලැබීම් | 1,749 | - | 1,749 | - |
| පාරිභෝගික තැන්පතු ආපසු ගෙවීම් | (101,908) | (205,990) | (101,908) | (205,995) |
| පාරිභෝගික තැන්පතු ලැබීම් | 728,688 | 908,773 | 728,688 | 908,773 |
| කල්බදු ණයකරු ශුද්ධ සංචරන/(කල්බදු ගෙවීම්) | (98,328) | (16,917) | (64,629) | (107,645) |
| පොලී සහිත ණය සහ ණය ගැනීම් වලින් ලත් මුදල් | 83,786,760 | 124,553,253 | 63,196,153 | 111,822,169 |
| පොලී සහිත ණය සහ ණය ගැනීම් ආපසු ගෙවීම් | (34,068,909) | (62,930,314) | (20,656,691) | (50,409,795) |
| වරණීය කොටස් නිදහස් කිරීම | (689,477) | (679,297) | - | - |
| **මුදල් යෙදවීමේ කටයුතු වල (යෙදවූ)/ කටයුතු වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | 106,737,410 | 70,226,912 | 99,763,460 | 70,023,346 |
| **මුදල් සහ මුදල් වලට සමාන දෑ වල ශුද්ධ වැඩිවීම/(අඩුවීම)** | 1,051,113 | (4,093,749) | (283,836) | (3,885,776) |
| **වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් වලට සමාන දෑ** | (8,054,916) | (3,961,167) | (9,312,387) | (5,426,611) |
| **වර්ෂය අවසානයේදී මුදල් සහ මුදල් වලට සමාන දෑ** | (7,003,803) | (8,054,916) | (9,596,223) | (9,312,387) |

පිටු අංක 110 සිට 172 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල කොටසක් වේ.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා**

## 1. ආයතනික තොරතුරු

### 1.1 වාර්තාකරණ ආයතනය

1969 අංක : 17 දරණ ලංකා විදුලිබල මණ්ඩල පනත යටතේ ලංකා විදුලිබල මණ්ඩලය සංස්ථාපිත කර ඇත. මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය අංක 50, සර් චිත්තම්පලම් ඒ ගාර්ඩිනර් මාවත, කොළඹ 2 යන ස්ථානයේ පිහිටා ඇත.

### 1.2 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මණ්ඩලයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ලංකා විදුලිබල මණ්ඩලය (මණ්ඩලය) සහ එහි සියළුම අනුබද්ධ සමාගම් වලින් සමන්විත වේ

### 1.3 ප්‍රධාන ක්‍රියාකාරකම් හා මෙහෙයුම් වල ස්වභාවය

**මණ්ඩලය**

වර්ෂය තුළ මණ්ඩලයේ ප්‍රධාන ක්‍රියාකාරකම් වූයේ, විදුලි උත්පාදනය, ප්‍රසම්පාදනය, සම්ප්‍රේෂණය, සඵලදායී බෙදාහැරීම සහ විකිණීමයි.

මණ්ඩලයේ පරිපාලිත සමාගම් වල සහ බද්ධ ව්‍යාපාරයේ ප්‍රධාන ක්‍රියාකාරකම් පහත දැක්වෙන පරිදි වේ.

#### 1.3.1 පරිපාලිතයන්

**අ) සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම**

වර්ෂය තුළ සමාගමේ ප්‍රධාන කාර්යයන් වූයේ, ලංකා විදුලිබල මණ්ඩලයෙන් විදුලිය මිලදී ගැනීම හා එසේ මිලදී ගත් විදුලිය ගාල්ල, කළුතර, මොරටුව, කැළණිය, නුගේගොඩ, කෝට්ටේ සහ මීගමුවේ පිහිටි සමාගමේ ශාඛා හරහා ගෘහාශ්‍රිත හා කාර්මික පාරිභෝගිකයන්ට සිල්ලරට විකිණීමයි. කණ්ඩායමේ උපපරිපාලිත සමාගම් විදුලි මීටර නිෂ්පාදනය හා වෙළඳාම ඇතුළුව විදුලිය බෙදා හැරීම සඳහා යටිතල පහසුකම් සැපයීමේ නිරතව සිටිති.

**ආ) සීමාසහිත එල්ටීඑල් හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගම**

වර්ෂය තුළදී සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් වූයේ සමූහයට අයත් සමාගම්හි ව්‍යාපාරික අරමුණු ළඟා කර ගැනීමට උපායමාර්ගික ආයෝජනයන් සිදු කිරීමයි.මෙම පරිපාලිතයන් විදුලි උත්පාදනය, බලශක්ති උත්පාදනයට අදාළ යටිතල පහසුකම් සැපයීම, තාරාපැටි සහ පෝෂක කුළුණු නිෂ්පාදනය කිරීම සහ ගැල්වනයිස් කිරීමේ කටයුතු වල නිරත වෙති.

**ඇ) සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම**

නොරොච්චෝලේ පිහිටි ගල් අඟුරු බලාගාරයේ විදුලිබල උත්පාදනය සඳහා ගෙන්දගම් ප්‍රමාණය අඩු උසස් ප්‍රමිතියෙන් යුත් ගල් අඟුරු සැපයීමයි.

**ඈ) සීමාසහිත ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම**

සමාගමේ ප්‍රධාන කාර්යයන් වනුයේ, සම්ප්‍රේෂණ මාර්ග සහ ජාලක උප පොළවල් ඉදිකිරීමේ කටයුතු වල නිරතවීම, පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ඉදිකිරීම, නඩත්තු කිරීම හා මෙහෙයවීම සහ විදුලි බලශක්ති උත්පාදනය සඳහා අවශ්‍ය කටයුතු සිදුකිරීම, පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය සඳහා අවශ්‍ය කටයුතුවල නිරතවීම, මීටර් පෙට්ටි නිෂ්පාදනය කිරීම සහ මණ්ඩලයේ අවශ්‍යතා සඳහා මිනිස් බල සේවා සැපයීමයි.

සමාගමේ අනුබද්ධ සමාගම් මණ්ඩලයේ සේවාවන් සහ ජල විදුලි උත්පාදනය සඳහා අවශ්‍ය සේවක පිරිස් බඳවා ගැනීම හා සැපයීමෙහි යෙදී සිටී

#### 1.3.2 බද්ධ ව්‍යාපාරය

**සීමාසහිත ත්‍රිකුණාමල විදුලිබල සමාගම**

ලංකා විදුලිබල මණ්ඩලයේ ජාතික පද්ධතියට විදුලිබලය උත්පාදනය කර විකිණීමේ අරමුණ සහිතව සමාගම ස්ථාපිත කරන ලදී. සමාගම මේ වන විට ගල් අඟුරු බලාගාරයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය අතහැර දමා ඇතත් සාම්පූර්හි මෙගාවොට් 50 ක සූර්ය බලශක්ති බලාගාරය පිහිටුවීමට කැබිනට් අනුමැතිය ලැබී ඇත.

### 1.4 පරිපාලකය සහ මණ්ඩලයෙහි අවසන් භාරකාරිත්වය

මණ්ඩලය විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ විෂය පථයට අයත් වේ. අධ්‍යක්ෂකවරුන්ගේ මතය අනුව, ශ්‍රී ලංකා ආණ්ඩුව, ලංකා විදුලිබල මණ්ඩලයේ මවු අස්ථිත්වයත් අවසන් පාලන පාර්ශවයත් වනු ඇත.

### 1.5 නිකුතුව සඳහා බලය පැවරනු ලැබූ දිනය

2020 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා, ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට 2021.06.15 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරන ලද යෝජනාවට අනුව අනුමැතිය ලබාදී ඇත.

## 2. පිළියෙල කිරීමේ පදනම සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 2.1 පිළියෙල කිරීමේ පදනම

සාධාරණ අගයමත ගනනය කරනු ලබන මූල්‍ය වත්කම් වන, ආදායම් ප්‍රකාශනය තුලින් සාධාරණ අගය ගලපන වත්කම් හා විස්තීරණ අදායම තුලින් සාධාරණ අගය ගලපන වත්කම් හැරුනු විට, සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනය ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ උපචිත පදනම මත සකස් කර ඇත. ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනය ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කෙරෙන අතර වෙනත් අගයන් හැර අනෙක් සියලුම වටිනාකම් ලඟම ඇති දහස (රු. 1000) දක්වා වටයා ඇත

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන මගින් පෙර කාලයට සාපේක්ෂව සංසන්දනාත්මක තොරතුරු සපයයි. මීට අමතරව, පෙර කාලච්ඡේදයට බලපෑම් ඇති වන පරිදි ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සිදුවන වෙනස් වීමකදී හෝ පෙර කාලච්ඡේදයට බලපෑම් ඇති වන පරිදි මූල්‍ය ප්‍රකාශනවල ගැලපුම් කිරීම අවශ්‍ය වන විට, සමූහය විසින් පූර්ව කාලසීමාව ආරම්භය වෙනුවෙන් මූල්‍ය තත්ත්වය පිළිබඳ අතිරේක ප්‍රකාශයක් ඉදිරිපත් කරයි. සටහන 34 හි දක්වා ඇති හේතු නිසා 2019 ජනවාරි 01 දිනට අතිරේක මූල්‍ය ප්‍රකාශයක් මෙම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කෙරේ.

### 2.2 අනුකූලතා ප්‍රකාශනය

සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනය සමන්විත වන ලාභ හෝ අලාභ ප්‍රකාශනය, විස්තීර්ණ අදායම් ප්‍රකාශනය මූල්‍ය තත්ව ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් සකස් කරනු ලැබ ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (SLFRS/LKAS) වලට අනුකූලවය

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

## 2.3 අඛණ්ඩ පැවැත්ම

අඛන්ඩ පැවැත්මක් ලෙස සමූහය නොකඩවා පවත්වා ගෙන යෑමේ සමූහයේ හැකියාව ගැන අධ්‍යක්ෂකවරුන් විසින් තක්සේරුවක්කර තිබෙන අතර, පහත සඳහන් කරුණු හැර ඈවර කිරීමට හෝ ව්‍යාපාර කටයුතු නැවැත්වීමට ඔවුහු අදහස් නොකරයි.

### අඛණ්ඩ පැවැත්ම - සීමාසහිත හෙළදනව් සමාගම

සීමාසහිත හෙළදනව් සමාගම සහ ලංකා විදුලිබල මණ්ඩලය විසින් අත්සන් කරන ලද 2009 මැයි මස 09 දිනැති බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම 2014 දෙසැම්බර් මස 08 දින ඉකුත් වී තිබුණි. ආයතනයේ දෘෂ්ටි කෝණය අනුව ගිවිසුම කල් ඉකුත්වීමත් සමග ප්‍රවර්තන ව්‍යාපාරයක් වශයෙන් පවත්වා ගෙන යෑම ගැන සැළකිය යුතු මට්ටමේ අවිනිශ්චිතතාවයක් තිබේ.

ප්‍රවර්තන ව්‍යාපාරයක් වශයෙන් පවත්වා ගෙන යෑමේ ආයතනයේ හැකියාව ගැන වාර්තා කරන දිනය වන විට තක්සේරුවක් අධ්‍යක්ෂකවරුන් විසින් කර තිබෙන අතර, ප්‍රවර්තන ව්‍යාපාරයක් වශයෙන පවත්වා ගෙන යෑමට අස්ථිතියට ඇති හැකියාව පිළිබඳව සැලකිය යුතු සැකයක් තිබෙන බව ඔවුහු තීරණය කර තිබේ. එම නිසා හෙළදනව් සමාගමේ මූල්‍ය වාර්තා සකස් කිරීමේදී අඛණ්ඩ පැවැත්ම පිළිබඳ උපකල්පනය අනුව කටයුතු කිරීම උචිත නොවේ.

කෙසේ නමුත්, සීමාසහිත හෙළදනව් සමාගමේ දේපල පිරියත හා උපකරණ ජංගම නොවන වත්කම් යටතේ වර්ගීකරණය කර ඇති නිසා සමූහයේ ව්‍යාපාර කණ්ඩායම් මට්ටමින් එම වත්කම් පවරා ගැනීමට අපේක්ෂා කරේ.

### අඛණ්ඩ පැවැත්ම් - ලංකා ඉන්ඩස්ට්‍රියල් ප්‍රඩක්ස් ඉංජිනියරින් (පුද්ගලික ) සමාගම

2015 නොවැම්බර් මස 01 දින සිට මෙහෙයුම් නවත්වා සීමාසහිත එල්ටීඑල් ට්‍රාන්ස්ෆෝමර්ස් (පුද්) සමාගම වෙත සිය මෙහෙයුම් පැවරීමට අධ්‍යක්ෂකවරුන් තීරණයකර තිබේ. එම නිසා සීමාසහිත එල්ටීඑල් ට්‍රාන්ස්ෆෝමර්ස් (පුද්) සමාගමේ මූල්‍ය වාර්තා සකස් කිරීමේදී අඛණ්ඩ පැවැත්ම පිළිබඳ උපක්ලපනය අනුගමනය කර නොමැත.

### අඛණ්ඩ පැවැත්ම - ශ්‍රී ලංකා එනජීස් එච්. ආර් (පුද්ගලික) සමාගම

මෙම සමාගමේ බහුතරයක් වූ මිනිස්බල සේවකයන් ලංකා විදුලිබල මණ්ඩලයේ ස්ථිර සේවකයින් ලෙස පත් කරන ලද අතර එම තීරණයත් සමග මෙම සමාගමේ ආදායම විශාල ලෙස පහත වැටී ඇත. කෙසේ වෙතත් වාර්තාකරන දිනය වන විට සමාගම සම්බන්ධව කුමක් කිරීමට අදහස් කරන්නේද යන්න පිළිබඳව අධ්‍යක්ෂවරුන් විසින් කිසිදු තීරණයක් ගෙන නැති අතර ඈවර කිරීමට කිසිදු අදහසක් නොමැති හෙයින් සමාගමේ අඛණ්ඩ පැවැත්ම උදෙසා බලපෑමක් නොමැත්තේය යන පදනම මත මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත

## 2.4 සංසන්දනාත්මක තොරතුරු

වඩා හොඳ ඉදිරිපත් කිරීමකට හා වර්තමාන වර්ෂය සමඟ සැසඳීමට හැකි වන පරිදි පසුගිය වසරවල මූල්‍ය ප්‍රකාශන සංශෝධනය කර ඇත.

## 2.5 ඒකාබද්ධ කිරීමේ පදනම

සමූහයේ සහ එහි පරිපාලිතයන්හි 2020 දෙසැම්බර් මස 31 දිනට අදාළ මූල්‍ය ප්‍රකාශනයන් ගෙන් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සමන්විත වේ. සමූහය නිරාවරණය වූ විට හෝ අයිතිවාසිකම් ඇති විට හෝ ආයෝජිත සමග ඇති සම්බන්ධතාවයෙන් විචල්‍ය ප්‍රතිලාභ ලබා ගැනීම හෝ ආයෝජිත කෙරෙහි බලපෑම් කිරීමට ඇති හැකියාව තුළින් ප්‍රතිලාභ කෙරෙහි බලපෑම් කිරීමේ හැකියාව යන සාධක මත පාලනය බලය ලබා ගත හැකිය.

විශේෂයෙන් සමූහය සතුව පහත දැක්වෙන බලය ඇති විට පමණක් ආයෝජක පාලනය කෙරෙයි.

- ආයෝජක සම්බන්ධයෙන් අයිතියක් තිබේ නම් (එනම්, ආයෝජකගේ අදාළ ක්‍රියාකාරකම් මෙහෙය වීමට ප්‍රවර්තන හැකියාව ලැබෙන පවත්නා අයිතීන්)
- ආයෝජක සමග එහි සහභාගිත්වය සඳහා අදාල විචල්‍ය ප්‍රතිලාභ වලට අනාවරනය හෝ අයිතීන් ආවේදනය කිරීම සම්බන්ධයෙන් වන අයිතීන්
- එහි ලාභයන්ට බලපෑම් කිරීම සඳහා ආයෝජක කෙරෙහි සමූහයට ඇති හැකියාව

සාමාන්‍යයෙන් ඡන්දය දීමේ බහුතර අයිතීන් තිබීම මගින් පාලනයක් පවත්වා ගෙන යා හැකි බවට පූර්ව නිගමනයක් පවතී. මෙම පූර්ව නිගමනය තහවුරු කිරීමට සහ ආයෝජකයෙකු සතු ඡන්දය දීමේ හෝ වෙනත් සමාන අයිතිවාසිකම් බහුතරය වඩා අඩු ප්‍රමාණයක් සමූහයට ඇති විට සමූහයට

- වෙනත් ඡන්ද හිමියන් සමග වන ආයෝජකගේ ගිවිසුම් ගත විධිවිධාන
- වෙනත් ගිවිසුම්ගත විධිවිධාන තුලින් පැන නගින අයිතීන්
- සමූහයේ ඡන්ද අයිතීන් හා විභව්‍ය ඡන්ද අයිතීන් ඇතුළු සියළුම සාධක සලකා බැලීමෙන් ආයෝජකයාගේ අයිතිය ඇත්තේද යන්න තක්සේරු කර ගත යුතුය

පරිපාලිතයන්ගේ තොරතුරු පහත දැක්වේ.

| පරිපාලිත සමාගමේ නම | සංස්ථාගත කරන ලද රට | ආයතනය සතු ප්‍රතිශතය |
|---|---|---|
| සීමාසහිත එල්ටීඑල් හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගම | ශ්‍රී ලංකාව | 63% |
| සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම (LECO) | ශ්‍රී ලංකාව | 55.2% |
| සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම (LCC) | ශ්‍රී ලංකාව | 60% |
| සීමාසහිත ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම (SLE) | ශ්‍රී ලංකාව | 100% |
| **බද්ධ ව්‍යාපාරයේ නම** | **සංස්ථාගත කරන ලද රට** | **ආයතනය සතු ප්‍රතිශතය** |
| සීමාසහිත ත්‍රිකුණාමල විදුලිබල සමාගම (TPCL) | ශ්‍රී ලංකාව | 50% |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

සීමාසහිත එල්ටීඑල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගමේ පහත සඳහන් උප පරිපාත සමාගම් ශ්‍රී ලංකාවෙන් බැහැරව සංස්ථාපිත කර ඇත.

| පරිපාලිත සමාගමේ නම | සංස්ථාගත කරන ලද රට |
|---|---|
| සීමාසහිත බ්‍රයිට් ඉන්ටර්නැෂනල් පවර් (පුද්ගලික) සමාගම | සිංගප්පූරුව |
| සීමාසහිත රාජ් ලංකා පවර් සමාගම | බංගලාදේශය |
| සීමාසහිත ලක්දනව් බංගලා පවර් සමාගම | බංගලාදේශය |
| සීමාසහිත මැකරිගාඩ් හයිඩ්‍රෝපවර් (පුද්ගලික) සමාගම | නේපාලය |
| සීමාසහිත ඒෂියාටික් ඉලෙක්ට්‍රිකල් ඇන්ඩ් ස්විච් ගියර් (පුද්ගලික) සමාගම | ඉන්දියාව |
| ෆෙනී ලංකා පුද්ගලික සමාගම | බංගලාදේශය |

ලංකා විදුලිබල මණ්ඩලය, සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම, සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම සහ සීමාසහිත ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම යන සමාගම් සඳහා දෙසැම්බර් මාස 31 දිනෙන් අවසන් වන පොදු ගිණුම් වර්ෂයක් ඇති අතර සීමාසහිත එල්ටීඑල් හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගම සහ සීමාසහිත ත්‍රිකුණාමල විදුලිබල සමාගම යන සමාගම් වල මූල්‍ය වර්ෂය මාර්තු 31 දිනෙන් අවසන් වේ. කෙසේ වුවද එම සමාගම්වල දෙසැම්බර් 31 දිනට අදාල මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ධ ගිණුම් පිළියෙල කිරීමේ පරමාර්ථය මත විගණක වරුන් විසින් සහතික කර පිලියෙල කර ඇත.

ලංකා විදුලිබල මණ්ඩලයේ පරිපාලිත සමාගම් වල මුළු ලාභ/අලාභ ඒකාබද්ධ ආදායම් ප්‍රකාශන වල ඇතුළත් කර ඇති අතර ලංකා විදුලිබල මණ්ඩලයේ හිමිකරුවන්ට ආරෝපිත ලාභ හෝ අලාභ ගණනය කිරීමේදී, බාහිර කොටස්කරුවන්ට අදාළ ලාභ හෝ අලාභ අනුපාතිකයන් පාලනයට යටත් නොවන හිමිකම යන ශීර්ෂය යටතේ ගලපා ඇත.

ලංකා විදුලිබල මණ්ඩලයේ සහ එහි පරිපාලිත සමාගම් වල සියලු වත්කම් හා වගකීම්, මූල්‍ය තත්ත්ව පිළිබඳ ඒකාබද්ධ ප්‍රකාශනයට ඇතුළත් කර ඇත. පරිපාලිත සමාගම්වල බාහිර කොටස් හිමියන්ට අදාළ වත්කම් ඒකා බද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පාලනයට යටත් නොවන හිමිකම් ශීර්ෂය යටතේ ගලපා ඇත. අන්තර් සමූහ ශේෂයන් හා ගනුදෙනු සහ අන්තර් සමූහ ගනුදෙනු වලින් උද්ගත වන උපලබ්ධි නොවූ ලාභ/අලාභ සහ ලාභාංශ, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ ඉවත් කරණු ලැබේ.

පාලනය ගිලිහීයාමෙන් තොරව පරිපාලිතයේ අයිතියෙහි සිදු වන වෙනස් වීමක් ස්කන්ධ ගනුදෙනුවක් ලෙස ගිණුම්ගත කරණු ලැබේ. පරිපාලිත සමාගමක පාලනය සමූහයෙන් ගිලිහී ගියහොත්, එය

- පරිපාලිත සමාගමෙහි (කීර්තිනාමය ද ඇතුළු) වත්කම් සහ වගකීම් තවදුරටත් ගිණුම්වල හදුනා නොගනියි.
- පාලනයට යටත් නොවන හිමිකම් හී ධාරණ අගය ගිණුම්වල හදුනා නොගනියි.
- ස්කන්ධය තුල වාර්ථා කර ඇත සමුච්චිත පරිවර්ථන වෙනස්කම් තවදුටත් ගිණුම්වල හදුනා නොගනියි.
- ලද ප්‍රතිශ්ඨාවේ සාධාරණ අගය  ගිණුම්වල හඳුනා ගනියි.
- රඳවාගත් ආයෝජනයන්හි සාධාරණ අගය හදුනා ගනියි.
- ලාභ/අලාභයන්හි අතිරික්ත/ඌණතා හදුනා ගනියි.
- වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය හඳුනා ගෙන ඇති මව් සමාගමේ කොටස් සුදුසු පරිදි ලාභ/අලාභ යටතේ හෝ රඳවාගත් ඉපැයීම් යටතේ නැවත වර්ගීකරණය කරයි.

පාලනයට අදාල අංග තුනෙන් එකක හෝ වැඩි ගණනක වෙනස්කම් තිබේ දැයි කරුණු හා හේතූන් මගින් පෙන්නුම් කරන්නේ නම්, ආයෝජක පාලනය කරනවා ද නැද්ද යන්න සමූහය විසින් නැවත තක්සේරු කරණු ලබයි. පාලිත සමාගම ඒකාබද්ධ කිරීම ඇරඹෙනුයේ පාලිතය කෙරෙහි සමූහය විසින් පාලනය ලබා ගන්නා විට වන අතර, පාලිත සමාගම කෙරෙහි පාලනය සමූහයට අහිමි වන විට එය නවතී. සමුහය විසින් පාලනය ලබා ගන්නා දිනයේ සිට සමූහය විසින් පාලිත සමාගම පාලනය කිරීම නවතිනතෙක්, වසර තුළදී ලබාගත් හෝ බැහැර කළ පාලිත සමාගමක වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ වල ඇතුළත් වේ.

පාලනයේ නිරත නොවන පාර්ශවයට ඌන ශේෂයක් තිබුන ද, ලාභ හෝ අලාභ හා වෙනත් විස්තීර්ණ ආදායම් වල සෑම අංගයක්ම ආරෝපණය කරනුයේ සමූහයේ මව් සමාගමේ සම කොටස් දරන්නන් හා පාලනය නොකරන පාර්ශවයන් මතය. ඒකාබද්ධ කිරිමේදී සමූහය සම්පූර්ණයෙන්ම ඉවත් කෙරේ නම්, සමූහයේ සාමාජිකයින් අතර ගනුදෙනු වලට අදාළ වත්කම් හා බැරකම්, සමකොටස්, ආදායම්, වියදම් හා මුදල් ප්‍රවාහ ගැන මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය විට ගලපනු ලැබේ. පාලනයේ අහිමිවීමකින් තොරව පරිපාලිත සමාගමේ අයිතිවාසිකම් ලැදියාවේ වෙනසක් ගිනුම් ගත කරනුයේ ස්කන්ධ ගනුදෙනුවක් වශයෙනි.

පාලිත සමාගමක් සම්බන්ධයෙන් පාලනය සමූහය වෙතින් ගිලිහී ගියහොත්, එය විසින් අදාළ වත්කම් (කීර්ති නාමය ඇතුලුව), වගකීම්, පාලනය නොවන ලැදියාවන් හා සමකොටස් වල වෙනත් අංගයන් පිළිගනු ලබන අතර, ලාභයක් හෝ පාඩුවක් වශයෙන් වූ ඕනෑම ප්‍රතිඵලයක් ලාභයක් හෝ පාඩුවක් වශයෙන් පිළිගනු ලැබේ. රඳවා ගන්නා යම් ආයෝජනයක් සාධාරණ වටිනාකමක් මත පිළිගනු ලැබේ.

## 2.6 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පිළිබඳ සාරාංශය

මෙම මූල්‍ය ප්‍රකාශන  සකස් කිරීමේදී අදාළ කර ගන්නා ලද ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දක්වා ඇත. වෙනත් ආකාරයකින් දක්වා නොමැති නම් සෑම වසරක් සඳහාම මෙම ප්‍රතිපත්ති අඛණ්ඩව අදාළ වේ.

### 2.6.1 ජංගම සහ ජංගම නොවන වර්ගීකරණය

මණ්ඩලය සිය මූල්‍ය තත්ව ප්‍රකාශනයෙහි වත්කම් හා බැරකම් ජංගම/ ජංගම නොවන වර්ගීකරණය මත පදනම්ව ඉදිරිපත් කරයි. පහත අවස්ථාවන්හීදී වත්කමක් ජංගම වත්කම් ලෙස හඳුනාගනී.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

- සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුලදී උපලබ්ධි කිරීමට විකිණීමට, හෝ පරිභෝජනය කිරීමට අපේක්ෂා කරන වත්කම්
- වෙළඳාම සඳහා තබා ඇති වත්කම්
- වාර්තා කරන දිනෙන් පසු මාස දොළහක් ඇතුළත උපලබ්ද්ධි කර ගැනීමට අපේක්ෂා කෙරෙන වත්කම්
- වාර්තා කිරීමේ කාලයෙන් පසු අවම වශයෙන් මාස දොළහකටවත් හුවමාරු කිරීම හෝ වගකීමක් පියවීමට භාවිතා කිරීම සීමාකරන ලද හැර අනෙකුත් මුදල් හෝ මුදල් හා සමානදෑ

අනෙකුත් සියලුම වත්කම් ජංගම නොවන ලෙස වර්ගීකරණය කර ඇත

පහත අවස්ථාවන්හිදී වගකීමක් ජංගම වගකීමක් ලෙස හදුනාගනී

- සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුලදී ගෙවා නිදහස් කිරීමට අපේක්ෂා කරන වගකීම්
- වෙළඳාම සඳහා තබා ඇති වගකීම්
- වාර්තා කරන දිනෙන් පසු මාස දොළහක් ඇතුළත ගෙවා නිදහස් කල යුතු වගකීම්
- වාර්තා කිරීමේ කාලයෙන් පසු අවම වශයෙන් මාස දොළහක් වත් වගකීම් පියවීම කල් දැමීමට හැකියාවක් නොමැති වගකීම්

අනෙකුත් සියලුම වගකීම් ජංගම නොවන ලෙස වර්ගීකරණය කර ඇත.

විලම්භිත බදු වත්කම් සහ වගකීම් ජංගම නොවන වත්කම් හා වගකීම් ලෙස වර්ගීකරණය කර ඇත.

### 2.6.2 ව්‍යාපාර සංයෝජනය, පාලනය යටත් නොවන හිමිකම් අත්පත් කර ගැනීම හා කීර්තිනාමය

ව්‍යාපාර සංයෝජනය අදියර වශයෙන් සාක්ෂාත් කර ගන්නා විටක කලින් පැවති ඕනෑම හිමිකම් අයිතියක් එය ලබා ගත් දින පවතින සාධාරණ අගයෙන් නැවත මිනිනු ලබන අතර එයින් ලැබෙන ලාභයක් හෝ අලාභයක් ලාභ හෝ අලාභ වශයෙන් පිළිගනු ලැබේ

ව්‍යාපාර සංයෝජනයන්, අත්පත් කරගැනීමේ ක්‍රමය මත ගිණුම්ගත කරයි. අත්පත් කරගැනීමේ පිරිවැය, අත්පත් කරගන්න දිනට, සාධාරණ අගය මත ගණනය කරන ලද මාරු කල පිරිවැයත් අත්පත් කරගන්නාගේ පාලනයට යටත් නොවන හිමිකමෙහිත් එකතුව වේ. සෑම ව්‍යාපාර සංයෝජනයක් සඳහාම, පාලනය කල නොහැකි හිමිකමේ වටිනාකම සාධාරණ අගයට හෝ අත්පත්කරගන්නා සතු හදුනාගත හැකි වත්කම් වලට සමානුපාතික අගයකට අනුව මැනීමට, සමූහයට තීරණය කල හැකිය. අත්පත් කර ගැනීමේදී දරනු ලබන පිරිවැය පරිපාලන වියදම් යටතට ඇතුළත් කෙරේ.

සමූහය ව්‍යාපාරයක් අත්පත් කර ගත් විට, එය සතු මූල්‍ය වත්කම් හා වගකීම් ගිවිසුමේ කොන්දේසි, ආර්ථික තත්වයන් සහ අත්පත් කර ගත් දිනයේදී අදාළ කොන්දේසි වලට අනුකූලව සකස්කරගන්නා ලද උපකල්පන මත සුදුසු පරිදි වර්ගීකරණය සහ තක්සේරු කිරීම් කරනු ලැබේ.

කීර්තිනාමය, ආරම්භයේදී පිරිවැයට මිනිනු ලබන අතර, එය හඳුනා ගතහැකි වත්කම් හා දරන ලද වගකීම් වල ශුද්ධ අගයට වඩා පාලනයට යටත් හිමිකමෙහි හා මාරු කරනලද ප්‍රතිලාභයෙහි එකතුවට වඩා වැඩි වූ වටිනාකමයි. අත්පත් කරගත් ශුද්ධ වත්කම් වල සාධාරණ අගය ගෙවන ලද අගයට වඩා වැඩිනම්, එම ලාභය, ලාභ අලාභ ප්‍රකාශනයෙහි හඳුනා ගැනේ.

ව්‍යාපාරය අත්කර ගැනීමෙන් ලබාගත් ශුද්ධ වත්කම් වල සාධාරණ වටිනාකම ගෙවන ලද අගයට වඩා වැඩි නම්, සමූහය විසින් අත්පත් කරගත් සියළුම වත්කම් නිවැරදිව හඳුනාගෙන තිබේ දැයි නැවත තක්සේරු කරනු ලබන අතර වගකීම් භාරගෙන සියළු දේ මැන බැලීම සඳහා භාවිතා කල ක්‍රියාපටිපාටිය නැවත සමාලෝචනය කරයි. නැවත තක්සේරු කිරීම මඟින්ද ශුද්ධ වත්කම් වල සාධාරණ වටිනාකමට මාරු කරන ලද සමස්ථ වටිනාකමට වඩා වැඩිපුර ඇත්නම්,එය ලාභය ලෙස ලාභ හෝ අලාභ ප්‍රකාශනය තුළ හඳුනා ගැනේ.

මූලික හදුනාගැනීමෙන් පසු, කීර්තිනාමය මැනීම සඳහා පිරිවැයෙන් සමුච්චිත හාණිකරන පාඩු අඩුකරනු ලැබේ. හාණිකරන පරීක්ෂාව සිදුකිරීමේදී, අත්පත් කරගත් තැනැත්තාගේ වෙනත් වත්කම් හෝ වගකීම් එම එක් එක් ඒකකයන් සඳහා පවරා නැතත්, ව්‍යාපාර සංයෝජනයක් තුළින් ලබා ගත් කීර්තිනාමය, අත්පත් කර ගත් දිනයේ සිටම, සංයෝජනයේ ප්‍රතිලාභ ඇති සමූහයේ එක් එක් මුදල් උත්පාදන ඒකක සඳහා වෙන් කරනු ලැබේ.

මුදල් උත්පාදන ඒකකයක් සඳහා කීර්තිනාමය වෙන්කර ඇති විටක, එම ඒකකය තුළ ඇති මෙහෙයුම් කොටසක් බැහැර කරනු ලැබුවහොත්, බැහැර කිරීමේ ලාභය හෝ අලාභය තීරණය කිරීමේදී මෙහෙයුම් ඒකකයට අදාළ කීර්තිනාම කොටසද ධාරණ අගයට ඇතුලත් කරනු ලබයි. මෙම තත්වය තුළ බැහැර කළ කීර්තිනාමයේ වටිනාකම මිනිනු ලබන්නේ බැහැර කරන ලද මෙහෙයුමේ අගය හා මුදල් උත්පාදන ඒකකයේ රඳවා ගත ප්‍රමාණයේ වටිනාකමට සාපේක්ෂවය.

### 2.6.3 බද්ධ ව්‍යාපාරවල ආයෝජන

බද්ධ ව්‍යාපාරයක් යනු ව්‍යාපාරයේ ශුද්ධ වත්කම් සම්බන්ධයෙන් බද්ධ පාලන අයිතිවාසිකම් ඇති බද්ධ සංවිධාන වර්ගයකි. බද්ධ පාලනයක් යනු අදාල ක්‍රියාකාරකම් ගැන එලබෙන්නාවූ තීරණ සම්බන්ධයෙන් පාලනය බෙදා හදා ගන්නා පාර්ශවයන් අතර ඒකමතික කැමැත්තක් අවශ්‍ය වන්නාවූ ගිවිසුම්ගත එකගතාවයක් පවතින සංවිධානයක් වේ. සීමාසහිත ත්‍රිකුණාමල විදුලිබල සමාගම යනු ලංකා විදුලිබල මණ්ඩලය හා සීමාසහිත NTPC සමාගම අතර වු බද්ධව පාලනය වන ආයතනයකි. බද්ධ පාලනය පිලිබඳ තීරණය කිරීමේදී සැලකිල්ලට ගත යුතු කරුණු පරිපාලිත සමාගම් පාලනය කෙරෙහි ගනු ලබන තීරණයට සමානය.

සිය බද්ධ ව්‍යාපාරයේ මණ්ඩලයේ ආයෝජන ගණනය කරනුයේ සමකොටස් ක්‍රමවේදය යොදා ගනිමිනි.සමකොටස් ක්‍රමවේදය යටතේ බද්ධ ව්‍යාපාර ආයෝජන මුලදී හදුනාගන්නේ පිරිවැය මතය. අත්පත් කර ගැනීමේ දිනයේ සිට පවතින්නා වු ව්‍යාපාරයේ ශුද්ධ වත්කම්වලින් මණ්ඩලයේ කොටස් වල වෙනස්කම් හදුනා ගැනීම පිණිස ආයෝජනයේ ධාරණ වටිනාකම ව්‍යාපාරයට අදාළව (carrying amount) ගලපනු ලැබේ.බද්ධ ව්‍යාපාරයට අදාල කීර්ති නාමය ආයෝජනයේ ධාරණ වටිනාකමෙහි අඩංගු අතර අඩු කිරීම සඳහා තනි තනිව පරීක්ෂා නොකරේ.බද්ධ ව්‍යාපාරයේ මෙහෙයුම් ප්‍රතිඵලවල මණ්ඩලයේ කොටස

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

අදායම් ප්‍රකාශයේ පිළිඹිබු වේ. ආයෝජකයාගේ වෙනත් විස්තීරණ අදායම් වෙනස්කම් මණ්ඩලයේ වෙනත් විස්තීරණ අදායම් කොටස් වශයෙන් ඉදිරිපත් කරේ.

මෙයට අමතරව බද්ධ ව්‍යාපාරයේ සමකොටස් වල සෘජුව හදුනාගන්න වෙනසක් සිදුව ඇත්නම් සමකොටස් වල වෙනස්වීම පිලිබඳ ප්‍රකාශයේ වෙනස්වීම්වලට සිය කොටස මණ්ඩලය විසින් අදාල පරිදි හදුනා ගනී. බද්ධ ව්‍යාපාරය ගැන වූ උනන්දුවේ ප්‍රමාණය කොතෙක්දයත් මණ්ඩලය හා බද්ධ ව්‍යාපාරය අතර වූ ගනුදෙනු වලින් පැන නගින උපලබ්ධි නොවූ ලාභ හා පාඩු ඉවත්කරනු ලැබේ. මණ්ඩලයට අදාල බද්ධ ව්‍යාපාරයේ ලාභ හෝ අලාභ කොටස ලාභ අලාභ ප්‍රකාශනයෙහි මුහුණත පෙන්නුම් කරන අතර එය බද්ධ ව්‍යාපාරයේ බදු හා සුළු කොටස් හිමියන්ගේ අයිතියට පසු ලාභය හෝ අලාභය වේ.

### 2.6.4 විදේශ විනිමයන් පරිවර්ථනය, විදේශ විනිමය ගනුදෙනු සහ ශේෂයන්

#### අ). ව්‍යවහාරික හා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී යොදා ගන්නා මුදල

සමුහයේ මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කර තිබෙන්නේ ආයතනයේ ව්‍යවහාරික හා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී මුදල් වශයෙන් සැලකෙන "ශ්‍රී ලංකා රුපියල" වලිනි.

#### ආ). ගනුදෙනු හා ශේෂයන්

විදේශ විනිමය ගනුදෙනු ආරම්භක අවස්ථාවේදී ගනුදෙනු සිදු වන දිනයන්හි බල පවත්නා විනිමය අනුපාත යොදා ගනිමින් ව්‍යවහාරික මුදලින් වාර්තා කරයි. විදේශ මුදල් වල සඳහන් මුදල් වත්කම් හා බැරකම් වාර්තා කරන දිනයේදී පවතින ස්ථානීය අනුපාතයට අනුව නැවත ව්‍යවහාර මුදලට පරිවර්තනය කෙරේ. සියලු වෙනස්කම් ලාභ හෝ අලාභය පිළිබඳ ප්‍රකාශය වෙත ගෙන යනු ලැබේ.

ඓතිහාසික පිරිවැය අනුව විදේශ මුදල් වලින් මනිනු ලබන මුදල් නොවන අයිතමයන් මුල් ගනුදෙනු සිදු වූ දිනයේ පැවති විනිමය අනුපාත උපයෝගී කරගනිමින් පරිවර්තනය කෙරේ. මුදල් නොවන අයිතමයන්හි පරිවර්තනයෙන් මතුවන ලාභය හෝ අලාභය පරිවර්තන වෙනස ඇති කිරීමට හේතු වූ අයිතමයේ ලාභය හෝ අලාභය සමඟ පිළිගැනේ (වෙනත් විස්තීර්ණ ආදායමෙන් හෝ ලාභ ප්‍රකාශය තුළින් ලාභ හෝ පාඩු පිළිගත් අයිතමයන්හි පරිවර්තන වෙනස්කම් පිළිවෙලින් වෙනත් විස්තීර්ණ ආදායමෙන් හෝ ලාභයෙන් හෝ අලාභය තුළින් පිළිගැනේ).

1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතේ 42 වගන්තියේ 06 වන උපවගන්තිය යටතේ විදේශීය ව්‍යවහාර මුදල් ප්‍රාග්ධනය හා ණය මත පොලිය සම්බන්ධයෙන් විනිමය උච්චාවචන වලින් ඇති වන ලාභ හෝ පාඩු ලංකා විදුලිබල මණ්ඩලය ගිණුම් ගත නොකෙරෙනුයේ ඒවා ශ්‍රී ලංකා රජය විසින් දරන බැවිනි. ආපසු ගෙවිය යුතු නොපියවූ ණය තක්සේරු කරනුයේ ලංකා විදුලිබල මණ්ඩලය විසින් ණය ලබා ගන්නා අවස්ථාවේ පැවති එකඟ වූ විනිමය අනුපාතය මතය.

#### ඇ). විදේශ මෙහෙයුම්

විදේශ මෙහෙයුම් ලෙස සැලකෙන විදේශයන්හි ක්‍රියාත්මක පරිපාලිත සමාගම් සහ හවුල් ව්‍යාපාරවල මූල්‍ය තත්ත්වය සහ ආදායම් ප්‍රකාශය වාර්තා කරන දිනට අදාළ විනිමය අනුපාතය සහ වාර්ෂික හුවමාරු අනුපාතිකය අනුව ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කෙරේ.

පරිවර්ථනය තුලින් මතුවන හුවමාරු වෙනස්කම් සෘජුවම වෙනත් විස්තීර්ණ ආදායමට හදුනාගනු ලැබේ. විදේශීය ආයතනයක් බැහැර කිරීමේදී එම විදේශීය මෙහෙයුමට අදාළව අනෙකුත් විස්තීර්ණ ආදායමෙන් හදුනාගෙන ඇති සමුච්චිත අගය ආදායම් ප්‍රකාශනයට හදුනාගනු ලැබේ

### 2.6.5 බදුකරණය

අදාළ කාලසීමාව සඳහා බදු වියදම්, ප්‍රවර්තන බදු සහ විලම්භිත බදු වලින් සමන්විත වේ. වෙනත් විස්තීරණ ආදායම් වශයෙන් හඳුනා ගත් ආදායම් හෝ වියදම් අයිතමයකට අරෝපණය කළ හැකි වෙනසක්, වෙනත් විස්තීරණ ආදායම් වල සෘජුව හඳුනාගනු ලබන අතර අනෙකුත් බදු ලාභ අලාභ ප්‍රකාශනයට හදුනාගනී.

#### අ). ප්‍රවර්තන බදු

පවත්නා හා පෙර කාලසීමාවන් සඳහා වූ ප්‍රවර්තන ආදායම් බදු වත්කම් හා බැරකම් මනිනුයේ, දේශීය ආදායම් කොමසාරිස් ජෙනරාල්ගෙන් ලැබීමට හෝ ඔහු වෙත ගෙවීමට අපේක්ෂිත මුදල මතය. මුදල් ප්‍රමාණය ගණන් බැලීමට යොදා ගන්නා බදු අනුපාතය හා බදු නීතිය වනුයේ සමාගම ක්‍රියාත්මක හා බදු වලට යටත් ආදායම් ජනනය කරනු ලබන රටේ පනවා ඇති හෝ වාර්තා කරන දිනයේ ප්‍රමාණවත් ලෙස පනවන ලද ඒවාය. හිමිකම් වලදී සෘජුව හඳුනා ගත් අයිතම වලට අදාළ ප්‍රවර්තන ආදායම් බදු හිමිකම් හඳුනා ගන්නේ හිමිකම් වලදී මිස ආදායම් ප්‍රකාශය තුළ නොවේ.

අදායම් බදු සඳහා ප්‍රතිපාදන පදනම් වී ඇත්තේ 2018 අප්‍රේල් 01 වන දින සිට බලාත්මක 2017 අංක 24 දරණ දේශීය අදායම් පනතේ විධිවිධාන සහ එහි සංශෝධන අනුව බදුකරණය සඳහා ගැලපීම් කරන ලද ගිණුම්කරණ ලාභය මතය.

#### ආ). විලම්භිත බදුකරණය

වත්කම් හා බැරකම් වල බදු පදනම් හා මූල්‍ය වාර්තාවල ඔවුන්ගේ ධාරණ වටිනාකම් අතර පැනනගින තාවකාලික වෙනස් වීම් මත, බැරකම් ක්‍රමවේදය යොදා ගනිමින් විලම්භිත ආදායම් බදු ප්‍රතිපාදන සලසා ඇත.

ව්‍යාපාරික සංයෝජනයක් නොවන ගනුදෙනුවක වත්කමක හෝ බැරකමක මුල් හඳුනා ගැනීමකදී විලම්භිත ආදායම් බදු වගකීම් හට ගන්නා අවස්ථාවක ද ව්‍යාපාරික සංයෝජනයක් නොවන ගනුදෙනුවක් සිදු වන අවස්ථාවකදී ද හැර ගිණුම්කරණ ලාභය හෝ බදු වලට යටත් ලාභය හෝ පාඩුවකට බලපෑමක් විලම්බිත ආදායම් බදු බැරකම් පැන නැගීමේදී හැර බදුවලට යටත් සියලුම තාවකාලික වෙනස්වීම් සඳහා විලම්බිත ආදායම් බදු බැරකම් හඳුනාගනු ලැබීම සහ ගනුදෙනු කරන

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

ගිණුම්කරණ ලාභයට හෝ බදු අය කල හැකි ලාභයට හෝ අලාභයට බලපාන්නේ නැත.

අඩු කළහැකි සියලුම තාවකාලික වෙනස්කම් ඉදිරියට ගෙන යන භාවිතයට නොගත් බදු වත්කම් හා භාවිතයට නොගත් බදුපාඩු සඳහා බදුවලට යටත් ලාභ තිබීමේ හැකියාවක් පවතින තාක් විලම්භිත ආදායම් බදු වත්කම් පිළිගනු ලැබේ. මෙයින් අඩු කළහැකි තාවකාලික වෙනස්කම් හා භාවිතයට නොගත් බදු බැර හා භාවිතයට නොගත් බදු පාඩුවල ඉදිරියට ගෙනයෑම් උපයෝගී කර ගත හැකි වනුයේ එය ව්‍යාපාරික සංයෝජනයක් නොවන ගනුදෙනුවකදී ගනුදෙනු කාලය තුළදී හා එම ගනුදෙනු කාලය තුලදී ගිණුම්කරණ ලාභය හෝ බදුවලට යටත් ලාභය හෝ පාඩුවකට බලපෑමක් නොකළ යුතු ගනුදෙනුවකදී වත්කමක හෝ බැරකමක මූලික පිළිගැනීම තුළින් පැන නගින අඩු කළහැකි තාවකාලික වෙනස්කම් වලට අදාල විලම්බිත ආදායම් බදු වත්කම්ය.

පාලිත සමාගම්, ආශ්‍රිත සමාගම් හා බද්ධ ව්‍යාපාර වල ලැදියාවන්ට සම්බන්ධ අඩු කළ හැකි සියලුම තාවකාලික වෙනස්කම් සම්බන්ධයෙන් විලම්බිත බදු වත්කම් පිළිගැනෙන්නේ නුදුරු අනාගතයේදී තාවකාලික වෙනස්වීම් ආපසු හැරීමේ හා තාවකාලික වෙනස්කම් යොදා ගත හැකි බදු යටතේ ලාභයක් ලැබීමේ හැකියාවක් තිබෙනතාක් පමණි.

වාර්තා කරනු ලබන සෑම දිනයකදීම හඳුනානොගත් විලම්භිත ආදායම් බදු වත්කම් නැවත ඇගයෙන අතර අනාගත බදුවලින් විලම්භිත ආදායම් බදු වත්කම් ආපසු ලබා ගැනීමට යටත් ලාභ වලින් ඉඩ ලැබෙන බව හඳුනා ගැනෙයි.

විලම්භිත ආදායම් බදු වත්කම් හා බැරකම් මනිනුයේ වත්කම උපලබ්ද්ධි වන හෝ බැරකම නිරවුල් කරණු ලබන අවස්ථාවන්හිදී හෝ වාර්තා කරන දිනට ක්‍රියාත්මක වන හෝ පසුකාලීනව පනවනු ලබන බදු අනුපාතයන් (හා බදුනීති) පදනම් වූ බදු අනුපාත මතය.

ලාභ අලාභ ප්‍රකාශනයෙන් පිටත හඳුනාගන්නා අයිතමයන්ට අදාළ විලම්භිත බදු ලාභ අලාභ ප්‍රකාශයෙන් පිටත හඳුනාගන්නා අතර, වෙනත් විස්තීර්ණ ආදායම් හෝ ස්කන්ධ ප්‍රාග්ධනයට සෘජුව පිළිගන්නා ලද අයිතම වලට පාදක ගනුදෙනුවට සහ සම්බන්ධව අදාළ විලම්භිත බදු පිළිගනු ලැබේ.

ප්‍රවර්තන බදු වත්කම් ප්‍රවර්තන බදු බැරකම් වලට හිලව් කිරීමට නීත්‍යානුකූලව ක්‍රියාත්මක කළ හැකි අයිතියක් තිබේ නම් හා විලම්භිත බදු අදාළ වන්නේ බදුවලට යටත් එම ආයතනයට හා එම බදුකරණ බලධාරියාටම නම් විලම්භිත බදුවත්කම් හා විලම්භිත බැරකම් හිලව් කරනු ලැබේ.

### ලාභාංශ ආදායම මත බදු

ලාභ හෝ අලාභ ප්‍රකාශයේ දී පරිපාලිත සමාගම් වලින් ලාභාංශ ආදායම සඳහා වන බද්ද වියදමක් ලෙස හදුනාගනු ලැබේ.

### විකුණුම් බද්ද

පහත දැ හරුනු විට ආදායම්, වියදම් සහ වත්කම් විකිණුම් බදු වලින් පසු හදුනා ගෙන ඇත

වත්කමක් හෝ සේවාවක් මිලට ගැනීමේදී ගෙවිය යුතු විකුණුම් බද්ද බදු අධිකාරියෙන් අය කර ගත නොහැකි නම්, වත්කම් හෝ වියදම් අයිතමය අත්පත් කර ගැනීමේ පිරිවැයෙහි කොටසක් ලෙස විකුණුම් බද්ද පිළිගනු ලැබේ. හා

විකුණුම් බද්ද සමඟ සඳහන් කිරීම.

බදු අධිකාරියෙන් අය කර ගත හැකි හෝ ගෙවිය යුතු විකුණුම් බද්දේ ශුද්ධ මුදල මූල්‍ය තත්ත්වය ප්‍රකාශ කිරීමේදී ලැබිය යුතු හෝ ගෙවිය යුතු කොටසක් ලෙස ඇතුළත් කර ඇත.

## 2.6.6 භාණ්ඩ තොග

යල්පැන ඇති හා මන්දගාමීව චලනය වන අයිතම සදහා වෙන් කිරීමෙන් පසු තොග තක්සේරු කරනුයේ පිරිවැය හා ශුද්ධ උපලබ්ධි වටිනාකම යන දෙකෙන් අඩු වටිනාකම මතය. ශුද්ධ උපලබ්ධි වටිනාකම අවසන් කිරීමේ හා විකිණීම කිරීමට අවශ්‍ය වන ඇස්තමේන්තු කළ පිරිවැය අඩු කළ පසු සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලදී භාණ්ඩ විකිණිය හැකි මිල ගණන්ය. භාණ්ඩ දැනට ඇති ස්ථානයට ගෙන ඒමට හා වත්මන් තත්වයට පත් කිරීමට දරන ලද පිරිවැය පහත දැක්වෙන පරිදි ගනණය කෙරේ.

### ලංකා විදුලිබල මණ්ඩලය

බෙදාහැරීම් අංශවල වැඩි වශයෙන් පාවිච්චියට ගන්නා හා වාර්ෂික මිල ලැයිස්තුවේ ඇතුළත් භාණ්ඩ තක්සේරු කරනුයේ සම්මත මිල අනුව වන අතර පාරිභෝගික භාණ්ඩ හා අමතර කොටස් වැනි වෙනත් ඒවා (ජනන හා සම්ප්‍රේෂණ අංශවල)ප්‍රථමයෙන් ලැබ ප්‍රථමයෙන් නිකුත් කෙරෙන ක්‍රමය මතය. එසේ වුවද සම්මත මිල අනුව තක්සේරුකර තිබෙන භාණ්ඩ වල උපලබ්ද්ධි ලාභය මගින් දක්වා ඇති පිරිවැය පහත හෙළීම පිණිස අවශ්‍ය ප්‍රතිපාදන ලංකා විදුලිබල මණ්ඩලය විසින් සලසා ඇත.

| **සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම** | |
|---|---|
| මෙහෙයුම් හා නඩත්තු භාණ්ඩ | - බර තබන ලද සාමාන්‍යය මිල ක්‍රමය පදනමින් සත්‍ය පිරිවැය මත |
| මාර්ගස්ථ තොග හා වෙනත් තොග | - සත්‍ය පිරිවැය මත |
| අමු ද්‍රව්‍ය | - බර තැබූ මිළ ක්‍රමය මත සත්‍ය පිරිවැය |
| නිමි භාන්ඩ සහ කෙරීගෙන යන වැඩ | - සෘජු ද්‍රව්‍ය පිරිවැය ද, සෘජු ශ්‍රම පිරිවැය හා භාණ්ඩ නිෂ්පාදන ක්‍රියාවලියේ සමාන්‍ය ක්‍රියාකාරී ධාරිතාව මත පදනම්ව සමානුපාතිකව අවශෝෂණය කරනලද ස්ථාවර හා විචල්‍ය පොදුකාර්ය පිරිවැය ද මත |

# මුල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

| සීමාසහිත එල්ටීඑල් හෝල්ඩින්ස් (පුද්) සමාගම | |
|---|---|
| අමුද්‍රව්‍ය තක්සේරු කරනු ලබන්නේ | - ප්‍රථමයෙන් ලැබ ප්‍රථමයෙන් නිකුතුවන පදනමට සත්‍ය පිරිවැයට |
| නිමි භාණ්ඩ හා නිම කෙරෙමින් ඇති භාණ්ඩ | - සෘජු ද්‍රව්‍ය පිරිවැය ද, සෘජු ශ්‍රම පිරිවැය ද, සුදුසු අනුපාතයකට අවශෝෂණය කරනලද ස්ථාවර පොදුකාර්ය පිරිවැය ද මත |
| පාරිභෝගික භාණ්ඩ හා අමතර කොටස් | - ප්‍රථමයෙන් ලැබ ප්‍රථමයෙන් නිකුතුවන පදනමට සත්‍ය පිරිවැයට |
| මාර්ගස්ථ තොග | - සත්‍ය පිරිවැය මත |

## 2.6.7 දේපල, පිරියත හා උපකරණ

### අ) හඳුනාගැනීමේ පදනම

දේපල, පිරියත සහ උපකරණ ගිණුම් සඳහා හඳුනාගනු ලබන්නේ වත්කමට ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහය වෙත ගලා ඒමට ඉඩ තිබේ නම් හා වත්කම් වල පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි නම් පමණි.

### ආ) මිනුම්කිරීමේ පදනම

දේපල, පිරියත හා උපකරණ පිරිවැය සම්බන්ධයෙන් දක්වා ඇත්තේ සමුච්චිත ක්ෂය කිරීම් සහ හානි අලාභ කිසිවක් වූයේ නම් සමුච්චිත හානි අඩු කොට පිරිවැය වටිනාකමටය. දේපල, පිරියත හා උපකරණ වල උපාංග කොටස් ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය හා පිළිගැනීමේ නිර්නායක සපුරා තිබේ නම් දීර්ඝ කාලීන ඉදිකිරීම් ව්‍යාපෘති වලට අදාළ ණය ගැනීමේ පිරිවැය එවැනි පිරිවැයට ඇතුළත් ය. දේපල, පිරියත හා උපකරණ වල වැදගත් කොටස් කලින් කලට ප්‍රතිස්ථාපනය කිරීම අවශ්‍ය වන විට ප්‍රතිස්ථාපිත වූ කොටසේ ශුද්ධ පොත් වටිනාකම සමූහය විසින් හඳුනා නොගන්නා අතර එයට අදාළ ප්‍රයෝජනවත් ආයුකාලය හා ක්ෂය වීම් සහිත වන කොටස පමණක් හඳුනා ගැනේ. එලෙසම ප්‍රධාන පරීක්ෂණයක් ඉටු කළ විට පිළිගැනීමේ නිර්නායක සපුරාලන්නේ නම් එහි පිරිවැය, පිරියත හා උපකරණයන්හි ධාරණ වටිනාකමේ ප්‍රතිස්ථාපනයක් ලෙස හඳුනා ගැනේ. අනෙකුත් සියළුම නඩත්තු සහ අළුත්වැඩියා වියදම් ලාභ/ අලාභ ප්‍රකාශනය තුල හඳුනාගැනේ.

දේපල පිරියත සහ උපකරණ වල ධාරණ අගය නැවත අයකර ගත නොහැකි බව පෙන්නුම් කරන සිද්ධීන් හෝ තත්වයන් ඇතිවන විට ඒ සඳහා හාණිකරන පරීක්ෂාවන් සිදුකරනු ලැබේ.

### ඇ) දැනට සිදුකෙරෙමින් පවත්නා ප්‍රාග්ධන කාර්යයන්

වාර්තා කරන දිනට අවසන් කර නොමැති ස්ථාවර වත්කම් හා සම්බන්ධව සිදු කරන ලද ප්‍රාග්ධන වියදම් කෙරීගෙන යන ප්‍රාග්ධන කාර්යයන් ලෙස පෙන්නුම් කෙරෙන අතර එය පිරිවැය අනුව දක්වා ඇත. මෙම කාර්යයන් අවසන් වූ පසු අදාළ වත්කම් දේපල, පිරියත සහ උපකරණ වෙත මාරු කෙරේ.

### ඈ) හඳුනා ගත් වත්කම් පොත් වලින් ඉවත් කිරීම

දේපල, පිරියත සහ උපකරණ භාවිතා කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභයක් බලාපොරොත්තු විය නොහැකි අවස්ථාවක දී හෝ බැහැර කිරීමකදී පොත් වලින් ලියා හැරීම සිදු කෙරේ. වත්කම් පොත් වලින් ලියා හැරීමේදී මතුවන ඕනෑම ලාභයක් හෝ අලාභයක් (වත්කම ඉවත්කිරීමේ ශුද්ධ අගය සහ වත්කමේ ධාරන අගය අතර වෙනස මෙම ලාභය හෝ අලාභය ලෙස ගණනය කෙරේ) අදාල වර්ෂයේ ලාභ හෝ අලාභ ප්‍රකාශයට ඇතුළත් වේ.

### ඉ) ක්ෂය

සින්නක්කර ඉඩම් හැර සෙසු දේපල, පිරියත සහ උපකරණ ඒවායේ පිරිවැය හෝ තක්සේරු වටිනාකම මත සරල රේඛීය ක්‍රමයක් උපයෝගී කරගනිමින් ගණනය කර එම වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආර්ථික ආයු කාලය තුල ඒවායේ වටිනාකම් ලියා හැරීම ක්ෂය වීම් වේ. 2.6.8 යටතේ විස්තර කර ඇති පරිදි වත්කම් විකිණීම සඳහා තබා ඇති ලෙස වර්ගීකරණය කර ඇති විට හෝ වත්කම පොත් වලින් ඉවත් කිරීමට තීරණය කර ඇතිවිට යන සිදුවීම් දෙකෙන් පෙරඇතිවන සිදුවීම් දින සිට වත්කම් සඳහා ක්ෂය කිරීම නතර වේ.

වත්කම් වල සඵල ආයුකාල ඇස්තමේන්තු කරනුයේ පහත දැක්වෙන අයුරිනි:

**ලංකා විදුලිබල මණ්ඩලය**

| | |
|---|---|
| සින්නක්කර ගොඩනැගිලි හා බදු ඉඩම් හා ගොඩනැගිලි | වසර 40 |
| සිවිල්වැඩ : | |
| වාන් දොරටු හා වේලි | වසර 100 |
| වානේ ජලනල හා කොටු දොර | වසර 40 |
| උප පොල හා ස්විච් අංගනය | වසර 35 |
| උත්පාදන යන්ත්‍ර: | |
| පිරියත ඇතුලු විදුලිබලාගාර (ජලවිදුලි) | වසර 35 |
| පිරියත ඇතුලු විදුලිබලාගාර (තාප) | වසර 25 |
| පිරියත ඇතුලු විදුලි බලාගාර (ඩීසල්) | වසර 12-15 |
| පිරියත ඇතුලු විදුලිබලාගාර (ගෑස් ටර්බයින්) | වසර 12 |
| පිරියත ඇතුලු විදුලිබලාගාර (ගල් අඟුරු) | වසර 30 |
| පිරියත ඇතුලු විදුලිබලාගාර (සුළං) | වසර 15 |
| සම්ප්‍රේෂණ මාර්ග කිවො 220, කිවො 132, කිවො 66 | වසර 35 |
| බෙදා හැරීමේ මාර්ග | |
| අධි සැරයටිබහන් - කිවො 33 | වසර 50 |
| අධි සැරයටිබහන් - කිවො 132 | වසර 50 |
| අධි සැරයටිබහන් - කිවො 11 | වසර 40 |
| අධි සැර උඩිස් රැහැන් | වසර 35 |
| අධි සැර භූගත රැහැන් | වසර 40 |
| අඩු සැර උඩිස් රැහැන් | වසර 35 |
| අඩු සැර පෝෂණ කණු | වසර 35 |
| පාරිභෝගික උප පොල | වසර 35 |
| අධිසැර ස්විච්චිපන්න | වසර 35 |
| ප්‍රාථමික හා ජාලක උප පොල | වසර 35 |
| සේවා නඩත්තු- පොදු කාර්යන් | වසර 35 |
| සේවා ගාස්තු භූගත | වසර 40 |
| SCADA (මධ්‍යම පහසුකම්) හා සන්නිවේදන උපකරණ | වසර 15 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

| | |
|---|---|
| මෝටර් වාහන | වසර 07 |
| මෝටර් බෝට්ටු | වසර 07 |
| යන්ත්‍ර හා මෙවලම් | වසර 05 |
| කාර්යාලීය උපකරණ | වසර 05 |
| ලීබඩු හා සවිකිරීම් | වසර 05 |
| සූර්ය පැනල | වසර 10 – 25 |

**සීමාසහිත එල්ටීඑල් හෝල්ඩිංස් (පුද්) සමාගම**

| | |
|---|---|
| ගොඩනැගිලි | වසර 25-50 තුල |
| පිරියත හා යන්ත්‍ර | වසර 8-20 තුල |
| බලාගාරය | වසර 10–20 තුල |
| කම්හල් උපකරණ | වසර 10 තුල |
| විද්‍යුත් පණිවිඩ හුවමාරු උපකරණ | වසර 10 තුල |
| ගිනිනිවීමේ උපකරණ | වසර 10 තුල |
| කාර්යාලීය උපකරණ | වසර 03-10 තුල |
| ලීබඩු හා සවිකිරීම් | වසර 03-10 තුල |
| මෝටර් වාහන | වසර 04 තුල |
| තාප ප්‍රතිසාධන ඒකකය | වසර 06 තුල |
| මෙහෙයුම් හා නඩත්තු අමතර කොටස් | තත්‍ය භාවිතය |
| සූර්ය බල පිවී බලාගාර | වසර 15 තුල |

**සීමා සහිත ලංකාවිදුලි (පුද්) සමාගම**

| | |
|---|---|
| ගොඩනැගිලි | වසර 40 |
| යටිතල පහසුකම් සැපයීම | |
| පලාත් පාලන ආයතන හා ලංවිම වෙතින් භාරගත් උප පොලවල්, උඩිස් රැහැන් හා සේවා රැහැන් | වසර 10 |
| ලෙකෝ සමාගමෙන් ඉදි කළ උප පොලවල්, උඩිස් රැහැන් හා සේවා රැහැන් | වසර 20 – 25 |
| මෝටර් වාහන | වසර 05–07 |
| පරිඝණක | වසර 03– 05 |
| කාර්යාල උපකරණ | වසර 03– 07 |
| පිරියත හා යන්ත්‍ර | වසර 03– 04 |

**සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්) සමාගම**

| | |
|---|---|
| ලීබඩු හා සවිකිරීම් | වසර 5 |
| උපකරණ | වසර 4 |
| මොටර් වාහන | වසර 4 |
| පරිඝණක | වසර 4 |
| කල්බදු වැඩි දියුණු කිරීම | වසර 2 |
| ජාල පද්ධති | වසර 2 |

**ශ්‍රී ලංකා එනජීස් (පුද්) සමාගම**

| | |
|---|---|
| පිරියත හා යන්ත්‍ර | වසර 5 |
| ලී බඩු උපකරණ හා මෙවලම් | වසර 3 |
| මෝටර් වාහන | වසර 5 |

**සීමාසහිත ත්‍රිකුණාමලය විදුලිබල සමාගම**

| | |
|---|---|
| ලීබඩු හා සවිකිරීම් | වසර 5 |
| උපකරණ | වසර 5 |
| ලැප්ටොප් හා පරිඝණක | වසර 3 |

අවසන් වරට වාර්තා කිරීමේ දිනයේ සිට වත්කම් වල වටිනාකම්, ප්‍රයෝජනවත් ජීවිත කාලය හා ක්ෂය වීමේ ක්‍රමවල සැලකිය යුතු වෙනසක් සිදු වන බවට ඉඟියක් තිබේ නම් ඒවා නැවත සමාලෝචනය කර, සුදුසු නම්, ගැලපෙන පරිදි සකස් කරනු ලැබේ

**ඡ) ණය ගැනීම් පිරිවැය**

අරමුදල් ණයට ගැනීම් සම්බන්ධයෙන් මණ්ඩලය විසින් දරන පොලිය හා වෙනත් පිරිවැය වලින් ණය ගැනීම් පිරිවැය සමන්විත වේ. ඒවායේ අපේක්ෂිත භාවිතය හෝ විකිණීමට සූදානම් වීම පිණිස අවශ්‍යවම සැලකිය යුතු කාල සීමාවක් ගත වෙන යෝග්‍ය වන වත්කම් අත්කර ගැනීම, ඉදිකිරීම හෝ නිෂ්පාදනයට සෘජුවම ආරෝපණය කළ හැකි පොදු හා නිශ්චිත ණය ගැනීමේ පිරිවැය, වත්කම් සාරානුකූලව ඒවායේ අපේක්ෂිත භාවිතය හෝ විකිණීම පිණිස සාරානුකූලව සූදානම් කෙරෙන තුරු එම වත්කම් වල පිරිවැයට එකතු කරනු ලැබේ. අනෙකුත් ණය ගැනීමේ සියලුම පිරිවැය, වියදම් දරන ලද කාලසීමාව තුළ වියදම් ලෙස හඳුනා ගනු ලැබේ.

සුදුසුකම් ලත් වත්කම් සඳහා ලබාගත් ණය එම වත්කම් සඳහා වැයවන තෙක් තාවකාලිකව ආයෝජනය කිරීමෙන් උපයනු ලබන ආදායම ප්‍රාග්ධනීත කිරීමට සුදුසුකම් ඇති පිරිවැයෙන් අඩුකර දක්වයි.

### 2.6.8 විකිණීම සඳහා තබා ඇති ජංගම නොවන වත්කම්

වාර්තා ගත වටිනාකම, අඛණ්ඩව භාවිතා කිරීමට වඩා මූලික වශයෙන්ම, විකිණීම මගින් අයකර ගනී නම්, සමූහය විසින් ජංගම නොවන වත්කම් විකිණීම සඳහා ඇති වත්කම් ලෙස වර්ගීකරණය කරයි. අපහරණය සඳහා වර්ගීකරණය කර ඇති එකී ජංගම නොවන වත්කම්ල ඒවායේ පොත්වල අගය හා සාධාරණ අගයෙන් විකුණුම් වියදම් අඩු කල පසු අගය යන දෙකෙන් අඩු අගයට තක්සේරු කරේ. මූල්‍ය පිරිවැය සහ ආදායම් බදු වියදම් හැර වත්කමක් ඉවත් කිරීම සඳහා සෘජුවම දැරිය යුතු වර්ධක පිරිවැය විකිණීමේ පිරිවැය වේ.

කළමණාකරණය (අධ්‍යක්ෂක මණ්ඩලය) විසින් ප්‍රදානය කරනු ලබන අනුමැතිය මත ඉහල විකුණුම් සම්භාවිතයක් ඇති යන නිර්ණායක මත සහ වත්කම එහි වර්තමාන තත්වය තුළ වහාම විකිණීමට හැකිය යන නිර්දේශය මත විකිණීම සඳහා ඇති වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ.

විකිණීම සම්පූර්ණ කිරීමට ගන්නා ක්‍රියාමාර්ග වලින්, විකිණීමේදී සැලකිය යුතු වෙනස්කම් සිදුකිරීමක් හෝ විකිණීමේ තීරණය ඉවත් කර ගැනීමක් නොහැකි වීම දැක්වේ. වත්කම් විකිණීමේ සැලැස්මට කළමනාකාරීත්වය කැපවිය යුතු අතර වර්ගීකරණය කළ දින සිට මාස හයක් ඇතුළත විකිණීම අවසන් කිරීමට අපේක්ෂා කළ යුතුය.

විකිණීම සඳහා වර්ගීකරණය කිරීමෙන් පසු දේපල පිරියත හා උපකරණ සඳහා ක්ෂය ප්‍රතිපාදන අත්හිටුවයි. විකිණීම සදහා වර්ගිකරණය කල වත්කම් සහ වගකීම් මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයේ ජංගම අයිතිමයන් වශයෙන් වෙනමම දක්වනු ලැබේ.

**බැහැර කිරීම**

මණ්ඩල තීන්දුවෙන්, "විකිණීමට තිබෙන වත්කම්" ලෙස වර්ගීකරණය කර ඇති වත්කම් මාස හයක් ඇතුළත විකිණීමට අපොහොසත් වුවහොත්, නැවත එම වත්කම්

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

දේපල පිරියත සහ උපකරණ (PPE) යටතේ වර්ගීකරණය කල යුතු අතර නවතා ඇති ක්ෂය ගැලපීම් කාලානුරූපව නැවත අයකල යුතුය

## 2.6.9 මූල්‍ය නොවන වත්කම් හානිකරණය

වත්කමක් වටිනාකම අඩු වන බවට වාර්තාකරණ සෑම දිනයකදීම එසේ වන බවට යම් සංඥාවක් තිබේ දැයි සමූහය විසින් තක්සේරු කරනු ලබයි. එවැනි කිසියම් සංඥාවක් තිබේ නම්, එම වත්කම හෝ මුදල් ජනන ඒකකය සඳහා හනිකරණ පරීක්ෂාවක් සිදුකරනු ලබයි. වත්කමේ ධාරණ අගයට වඩා නැවත අයකර ගත හැකි අගය අඩුවන ප්‍රමාණයෙන් හාණිකරන අලාභ හඳුනාගනු ලබයි. නැවත අයකර ගත හැකි අගය යනු වත්කම විකිණීමට යන පිරිවැය හා පාවිච්චියේදී එහි අගය අඩු කර වත්කමක් හෝ මුදල් ජනනය කරණ ඒකකයක් යන දෙකෙන් වැඩි වටිනාකමක් ඇති සාධාරණ අගයෙන් අලෙවි කිරීමේ පිරිවැය අඩු කළ විට ලැබෙන අගයත් ප්‍රයෝජ්‍ය අගයත් යන දෙකෙන් වඩා වැඩි අගයටය. ප්‍රයෝජ්‍ය අගය තක්සේරු කිරීම පිණිස, මුදල් වල කාලීන අගයේ වත්මන් වෙළඳපල තක්සේරුව හා වත්කමට විශේෂිත අවදානම් පිළිබිඹු වන බදු අයකර ගැනීමට පෙර වට්ටම් අනුපාතයක් යොදා ගනිමින් ඇස්තමේන්තු කළ අනාගත මුදල් ප්‍රවාහයන්, ඒවායේ වත්මන් අගය දක්වා වට්ටම් කරණු ලැබේ.

හාණිකර අලාභ තක්සේරු කිරීමේ අරමුණින් සමස්ථ මණ්ඩලය වෙනම මුදල් උත්පාදන ඒකකයක් ලෙස සැලකේ.

අඛණ්ඩ මෙහෙයුම් වල හාණිකර අලාභ ලාභ හෝ අලාභ ප්‍රකාශයේදී හඳුනා ගැනේ.

පෙර හඳුනාගත් හාණිකරන අලාභය ආපසු හැරවිය හැක්කේ අවසන් වරට හඳුනාගත් හාණිකරන අලාභය හඳුනා ගත් දා සිට ආපසු අයකර ගත හැකි වත්කම් නිශ්චය කිරීම සඳහා භාවිතා කළ ඇස්තමේන්තු වල වෙනසක් සිදුවී ඇත්නම් පමණි.එය එසේ නම් වත්කම් වල ධාරණ අගය ආපසු අයකර ගත හැකි ප්‍රමාණය දක්වා වැඩි කෙරේ. එම වැඩි කළ මුදල කලින් වසර වල වත්කම් සඳහා වූ අඩුපාඩු හඳුනා නොගත්තේ නම් අවප්‍රමාණය වීමේ ශුද්ධ අගය තීරණය කරන ලද ධාරණ අගයට වඩා වැඩි විය නොහැක. ලාභ හෝ පාඩු ප්‍රකාශ තුළ එවැනි ආපසු හැරවීමක් පිළිගැනේ.

## 2.6.10 කල්බදු

කොන්ත්‍රාත්තුවක් අරම්භයේදී, මණ්ඩලය විසින් එම කොන්ත්‍රාත්තුව හෝ එම කොන්ත්‍රාත්තුව තුල, කල්බදු ගිවිසුමක් තිබේ ද යන්න තක්සේරු කරයි. මූල්‍ය වටිනාකමකට හුවමාරුවක් වශයෙන් යම් කාලයක් සඳහා හඳුනාගත් වත්කමක භාවිතය පාලනය කිරීමේ අයිතිය යම් කොන්ත්‍රාත්තුවක් මඟින් ලබා දෙන්නේ නම්, එම කොන්ත්‍රාත්තුව කල් බද්දක් ලෙස හඳුනා ගැනේ. මෙසේ හඳුනාගත් වත්කමක්, භාවිතය පාලනය කිරීමේ අයිතිය කොන්ත්‍රාත්තුවක් හෝ එම කොන්ත්‍රාත්තුවෙහි අඩංගු කරුණු මඟින් ලබා දී ඇත් දැයි තක්සේරු කිරීම සඳහා මණ්ඩලය විසින්ල ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි අර්ථ දැක්වීම භාවිතා කරයි.

### 2.6.10.1 බදුකරු ලෙස සමූහය

කෙටි කාලීන කල්බදු සහ අඩු වටිනාකමින් යුත් කල්බදු වත්කම් හැර සෙසු කල්බදු සඳහා සමූහය තනි පිළිගැනීමක් සහ මිනුම් ප්‍රවේශයක් භාවිතා කරයි. භාවිතා කිරීමේ අයිතිය නියෝජනය කරන කල්බදු ගෙවීම් සහ භාවිතයේ අයිතිය පිළිබඳ වත්කම් මත සමූහය විසින් බදු වගකීම් හඳුනා ගනී.

#### භාවිතය සඳහා හිමිකම් ඇති වත්කම්

සමූහය විසින් භාවිතය සඳහා හිමිකම් ඇති වත්කම් ඒවා ප්‍රයෝජනයට ගත හැකි විට හඳුනා ගනී.

භාවිතයේ අයිතිය පිළිබඳ වත්කම් මිනිනු ලබන්නේ පිරිවැයෙන් සමුච්චිත ක්ෂයවීම් හාණිකරණ අලාභ හා නැවත තක්සේරු කරන ලද බදු වගකීම් ගැලපීමෙන් පසුවවේ.ආරම්භයේ දීම භාවිතා කිරීමේ අයිතිය ඇති වත්කම්, බදුකරුවන් විසින් ලබා දුන් යම් දිරිගැන්වීම් අඩු කිරීමෙන් පසු ආරම්භක කල් බදු වගකීම, ආරම්භක සෘජු පිරිවැය සහ වත්කම් නවීකරණය කිරීම සඳහා බැඳීම් වලින් සමන්විත වේ. භාවිතා කිරීමේ අයිතිය ඇති වත්කම් කෙටි කාල සීමාවට හෝ පාදක වූ වත්කමේ ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීව කාලයට සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලැබේ.මෙම වත්කම් හාණිකරන පරීක්ෂවට යටත්වේ.

සමූහය සතු භාවිතය සඳහා හිමිකම් ඇති වත්කම් දේපල පිරියත හා උපකරණ යටතේ ඇතුලත්වේ.

#### කල්බදු වගකීම්

කල්බදු ආරම්භ කරන දිනයේදී, කල්බදු කාලය තුළදී ගෙවිය යුතු සම්පූර්ණ ගෙවීම් වල වර්තමාන වටිනාකම අනුව සමූහය විසින් කල්බදු වගකීම් හඳුනාගනු ඇත. කල්බදු ගෙවීම් වල වර්තමාන වටිනාකම ගණනය කිරීමේදී, කල්බදු ගිවිසුමේ ඇති පොලී අනුපාතය පහසුවෙන් තීරණය කළ නොහැකි නම්, කල්බදු ආරම්භක දිනයේ වර්ධක ණය ගැනීමේ අනුපාතය මණ්ඩලය භාවිතා කරයි. ආරම්භක දිනයට පසුව, පොලිය එකතු වීම පිළිබිඹු කිරීම සඳහා කල්බදු වගකීම් ප්‍රමාණය වැඩි කරන අතර බදු ගෙවීම් සඳහා ගෙවීම් අඩු කෙරේ. ඊට අමතරව, ස්ථාවර කල්බදු ගෙවීමේ වෙනසක් බදු කාල සීමාවේ වෙනසක් හෝ වත්කම් මිලදී ගැනීම සඳහා වූ තක්සේරුවේ වෙනසක් ඇත්නම් කල්බදු වගකීම් දරන ප්‍රමාණය නැවත මිනිනු ලැබේ. සමූහයේ කල්බදු වගකීම් පොලී දරණ ණය සහ ණය ගැනීම් යටතේ ඇතුළත් වේ.

### 2.6.10.2 සමූහය බදුකරු ලෙස – එල්ටීඑල්

#### මෙහෙයුම් කල්බදු

වත්කම් වල අයිතියේ සියලුම අවදානම් හා ප්‍රතිලාභ සමූහය විසින් ප්‍රමාණවත් ලෙසින් නොපවරන ජලවිදුලි, වායු බල හා තාප බල බලාගාර වර්ග කරනුයේ මෙහෙයුම් කල්බදු වශයෙනි. සියලුම බලාගාර වලින් ලැබෙන ආදායම් බලශක්ති නිපැයුම මත ආදායම් ප්‍රකාශයේ පිළිගැනෙන්නේ බදු දුන් වත්කම් වලින් ඉපදෙන භාවිතයේ ප්‍රතිලාභ අඩු වන කාල රටාව වැඩියෙන් නියෝජනය වන කාල සීමාවේ බලශක්ති නිපැයුම මතය. බදු ආදායම ඉපයීමේදී දරන ලද ක්ෂයවීම් ඇතුලු පිරිවැය වියදමක් වශයෙන් පිළිගැනේ. ක්ෂයවීමට යටත් බදු වත්කම් වල ක්ෂය වීමේ ප්‍රතිපත්තිය සමාන වත්කම් සඳහා සමූහයේ ක්ෂය වීමේ ප්‍රතිපත්තියට ගැලපේ.

#### මූල්‍ය කල්බදු

පහත සඳහන් නිර්නායකයන්ගෙන් සෑහීමකට පත්වීම හේතුවෙන් සීමාසහිත රාජ් ලංකා විදුලිබල සමාගම

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

හා බංගලාදේශ බලශක්ති සංවර්ධන මණ්ඩලය සහ සීමාසහිත ලක්ද්නව් බංගලා පවර් සහ බංගලාදේශ බලශක්ති සංවර්ධන මණ්ඩලය අතර ඇති විධිවිධාන IFRIC 4- එකඟවීමට කල්බදු ඇතුළත් ද යන්න තීරණය කිරීම සහ "ශ්‍රී.ගි.ප්‍ර - 16 කල්බදු" යටතේ කල්බදු ලෙස ගිණුම් ගත කළ යුතුද යන විෂය පථයට අයත්බව සමූහයේ අදහසයි.

- විදුලිබල මිල දී ගැනීමේ ගිවිසුම යටතේ ඇති විධිවිධානය සපුරාලීම රඳා පවතින්නේ බංගලාදේශයේ හි පිහිටි සමූහයේ නිශ්චිත බලාගාරයේ සුවිශේෂී භාවිතය මතය.
- බලාගාරය ක්‍රියාත්මක කිරීමට හෝ බලාගාරයේ සමස්ත නිෂ්පාදනය පාලනය කරන අතරම එය තීරණය කරන ආකාරයට බලාගාරය ක්‍රියාත්මක කිරීම අන් අයට යොමු කිරීමට බංගලාදේශ බලශක්ති සංවර්ධන මණ්ඩලයට අයිතියක් ඇත.
- සමාගමේ විදුලි බලාගාරය මඟින් උත්පාදනය කරන ලද විදුලිබල නිමැවුම, බංගලාදේශ බලශක්ති සංවර්ධන මණ්ඩලය හැර වෙනත් පාර්ශවයකට ලබාගත නොහැකි අතර බංගලාදේශ බලශක්ති සංවර්ධන මණ්ඩලය විසින් ගෙවනු ලබන ඒකකයකට ධාරිතා ගාස්තුව නැමැවුම මත පදනම් නොවේ.

සමූහයේ විදුලි බලාගාරයේ නෛතික හිමිකාරිත්වයට ආනුෂාංගික සියලු අවදානම් සහ ප්‍රතිලාභ බංගලාදේශ බලශක්ති සංවර්ධන මණ්ඩලයට වෙත මාරු කර ඇති හෙයින් සී/ස රාජ් ලංකා සමාගම හා සීමාසහිත ලක්ද්නව් බංගලා පවර් සමාගම බදුකරු ලෙසත්, බංගලාදේශ බලශක්ති සංවර්ධන මණ්ඩලය බදුගන්නා ලෙසත් ශ්‍රී.ගි.ප්‍ර - 16 කල්බදු යටතේ මූල්‍ය කල්බදු ලෙස විධිවිධානය යටතේ ගිණුම්ගත කෙරේ.

### 2.6.11 අස්පෘශ්‍ය වත්කම්

#### හඳුනාගැනීමේ පදනම

වත්කම් හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහය වෙත ගලා ඒමට ඉඩ තිබේ නම් සහ වත්කම් වල පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි නම් අස්පෘශ්‍ය වත්කම් ලෙස හඳුනාගනු ලැබේ.වෙන් වෙන් වශයෙන් අත්කර ගන්නා ලද අස්පෘශ්‍ය වත්කම් මුලින්ම හඳුනා ගනු ලබන අවස්ථාවේ පිරිවැය මත මැන දක්වයි. ව්‍යාපාර සංයෝජනයකදී අත්කර ගන්නා ලද අස්පෘශ්‍ය වත්කම් වල පිරිවැය වනුයේ අත්කර ගන්නා දිනයේදී ඒවායේ පවත්නා සාධාරන වටිනාකමය. මූලික හඳුනා ගැනීමෙන් පසු සමුච්චිත ක්‍රමක්ෂයක් හෝ සමුච්චිත හානිකරණයක් වේතොත් අදාළ පරිදි පාඩු අඩු කර අස්පෘශ්‍ය වත්කම් පිරිවැය ඉදිරියට ගෙනයනු ලැබේ. ප්‍රාග්ධනිත කළ සංවර්ධණ පිරිවැය හැර අභ්‍යන්තරිකව ජනනය කළ අස්පෘශ්‍ය වත්කම් ප්‍රාග්ධනිත නොකරන අතර වියදම දරන ලද වසරේ ආදායම් ප්‍රකාශයේ අදාළ වියදම පිළිඹිබුවේ.

#### ක්‍රමක්ෂය/හාණිකරණය

අස්පෘශ්‍ය වත්කම් වල සඵල ආයුකාලය තක්සේරු කරනුයේ පරිමිත හෝ අපිරිමිත වශයෙනි.

පරිමිත ජීව කාලයක් තිබෙන අස්පෘශ්‍ය වත්කම් ඒවායේ සඵල ආර්ථික ආයුකාලය ඔස්සේ ක්‍රමක්ෂය කරන අතර අස්පෘශ්‍ය වත්කම් හානියට ලක් විය හැකිබවට සංඥාවක් ලැබෙන සෑම අවස්ථාවකදීම හානිවූ ලෙස තක්සේරු කෙරේ. පරිමිත ජීවකාලයක් තිබෙන අස්පෘශ්‍ය වත්කමක් සඳහා වූ ක්‍රමක්ෂය ක්‍රමවේදය හා ක්‍රමක්ෂය කාලසීමාව අවම වශයෙන් වාර්තා කරන සෑම කාලසීමාවකදීම සමාලෝචනය කෙරේ. අපේක්ෂිත සඵල ජීව කාලයේ වෙනස් වීම් හෝ වත්කමෙහි ඇතුළත්ව තිබෙන අනාගත ආර්ථික ප්‍රතිලාභ පරිභෝජනයේ අපේක්ෂිත රටාව ගිණුම් ගත කරනුයේ අදාළ පරිදි ක්‍රමක්ෂය ක්‍රමවේදය හෝ ක්‍රමක්ෂය කාලසීමාව වෙනස් කිරීමෙන් වන අතර ගිණුම් ඇස්තමේන්තු වල වෙනස්වීම් වශයෙන් සලකනු ලැබේ. සීමිත ආයු කාලයක් තිබෙන අස්පෘශ්‍ය වත්කම් වල ක්‍රමක්ෂය වියදම් ආදායම් ප්‍රකාශයෙන් හඳුනා ගනු ලබන්නේ අස්පෘශ්‍ය වත්කම් වල කාර්ය භාරයට අනුකූල වියදම් ප්‍රභේදයන් යටතේය.

#### මණ්ඩලය

වසර 5 ක ප්‍රයෝජනවත් ජීව කාලයක් සඳහා මෘදුකාංග ක්‍රමක්ෂය කර ඇති අතර බලපත්‍රය සඳහා ගිවිසුම් තුළ නියම කර ඇති ප්‍රයෝජනවත් ආයු කාලය අනුව ක්‍රමක්ෂය කරනු ලැබේ.

#### එල්ටීඑල් හොල්ඩිංන්ස් (පුද්) සමාගම

පරිගණක මෘදුකාංග අත්පත් කර ගත් හා සංවර්ධනය කළ දින සිට වසර 4 ක් වැනි කාලයක් තුළදී ක්‍රමක්ෂය කර ඇත.

#### ලංකා විදුලි (පුද්) සමාගම

පරිගණක මෘදුකාංග බලපත්‍ර වසර 5 ක ප්‍රයෝජනවත් ආයු කාලය තුළ ක්‍රමක්ෂය කර ඇත.

තාක්ෂණික දැනුම ගිවිසුම් කාලය වන වසර 15 දක්වා ක්‍රමක්ෂය කර ඇත.

අසීමිත සඵල ආයුකාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය නොකෙරෙන අතර තනි තනිව හෝ මුදල් ජනනය කරන ඒකකයේ මට්ටමින් හානි කරණය සඳහා වාර්ෂිකව පරීක්ෂාවට ලක් කරනු ලැබේ. අසීමිත ජීවිත කාලය තක්සේරු කිරීම වාර්ෂිකව සමාලෝචනය කෙරෙනුයේ අසීමිත ජීව කාලය උපකාරී ලෙස අඛණ්ඩව පවතීදැයි යන්න තීරණය කිරීමටයි. එසේ නොමැතිනම් ජීවකාලය අසීමිත සිට පරිමිත අවස්ථාව දක්වා අනාගතය සඳහා බලපවත්න පරිදි වෙනස් කෙරේ.

#### හඳුනාගනු ලැබූ අස්පෘශ්‍ය වත්කම් පොත් වලින් ලියා හැරීම

අස්පෘශ්‍ය වත්කමක් බැහැර කිරීම තුළින් පැන නගින ලාභ හෝ පාඩු මනින්නේ බැහැර කිරීමේ ශුද්ධ ලැබීම් හා වත්කම් වල ඉදිරියට ගෙනයන ප්‍රමාණය අතර වෙනස වශයෙන් වන අතර වත්කම පිළිගැනීමෙන් බැහැර කළ විට එය ආදායම් ප්‍රකාශයේ හඳුනා ගනු ලැබේ.

### 2.6.12 මූල්‍ය වත්කම් හා වගකීම්

### 2.6.12.1 මූල්‍ය වත්කම්

#### මූල්‍ය වත්කම් මූලික හඳුනා ගැනීම හා මිනුම්කරණය

මූලික වශයෙන් හඳුනාගැනීමේ දී, මූල්‍ය වත්කම් එහි ක්‍රමක්ෂය පිරිවැය, අනෙකුත් විස්තීරණ ආදායම් හරහා සාධාරණ වටිනාකම (FVOCI), හෝ ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකම (FVPL) ආදී වටිනාකම් මත වර්ගීකරණය කෙරේ.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

මූල්‍ය වත්කමක් (එය සැලකිය යුතු මූල්‍ය සංරචකයක් නොමැතිව වෙළඳ ලැබිය යුතු නම්) හෝ මූල්‍ය වගකීම් මුලින් මනිනු ලබන්නේ සාධාරණ වටිනාකමින්, එය අත්පත් කර ගැනීම හෝ නිකුතුව සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි  වියදම් එක්වූ පසු ගනුදෙනු පිරිවැය වේ

සැලකිය යුතු මූල්‍ය සංරචකයක් නොමැතිව ලැබිය යුතු වෙළඳ ණයක් මුලින් මනිනු ලබන්නේ ගනුදෙනු මිලෙනි.

## පසුකාලීන මිනුම්කරණය

පසු කාලීන මිණුම්කරනය  සඳහා මූල්‍ය වත්කම් කාණ්ඩ හතරකට වර්ගීකරණය කර ඇත;

- ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් (ණය උපකරණ)
- සමුච්චිත ලාභ හා පාඩු ප්‍රතිචක්‍රීකරණය කිරීමත් සමඟ විස්තීරණ අදායම හරහා සාධාරණ වටිනාකම හදුනාගනු ලබන මූල්‍ය වත්කම් (ණය උපකරණ)
- බැහැර කිරීමේදී සමුච්චිත ලාභ හා පාඩු ප්‍රතිචක්‍රීකරණය කිරීමකින් තොරව විස්තීරණ ආදායම තුළින් සාධාරණ වටිනාකම හඳුනාගන්නා මූල්‍ය වත්කම්
- සාධාරණ වටිනාකම ලාභ අලාභ ගිණුම හරහා ගලපන මූල්‍ය වත්කම්

## ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් (ණය උපකරණ)

පහත සඳහන් කොන්දේසි සපුරාලන්නේ නම් සමාගම මූල්‍ය  වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට හදුනාගනු ලබයි:

- කොන්ත්‍රාත් මුදල් ප්‍රවාහ රැස්කර ගැනීම සඳහා මූල්‍ය වත්කම් තබා ගැනීමේ අරමුණ ඇතිව මූල්‍ය වත්කම් ව්‍යාපාර ආකෘතියක් තුළ තබා ඇති විට

  සහ

- මූල්‍ය වත්කම් වල ගිවිසුම් කොන්දේසි නිශ්චිත දිනයන්හිදී මුදල් ගලා ඒමට හේතු වන අතර එය හුදෙක්ම හිඟ මුදලෙහි පොලිය සහ වාරිකය වීම

ක්‍රමක්ෂය පිරිවැයට මිණුම්කර ඇති  මූල්‍ය වත්කම් ඵලදායී පොලී අනුපාත (ඊඅයිආර්) ක්‍රමය උපයෝගී කරගනිමින් පසුව මනිනු ලබන අතර එය හානිකරණ පරීක්ෂාවන්ට යටත්වේ. වත්කම් හඳුනා නොගත් විට, වෙනස් කළ විට හෝ හාණිකරනයට ලක්වූ විට ලාභ හෝ අලාභය ලාභය හා පාඩු ප්‍රකාශනයට හදුනා ගැනේ.

සමූහයේ ක්‍රමක්ෂය පිරිවැයට මිණුම්කර ඇති මූල්‍ය වත්කම් සඳහා වෙළඳ ලැබීම්, සේවකයින්ට ණය, සම්බන්ධිත පාර්ශවයන්ට ණය සහ වෙනත් මූල්‍ය වත්කම් යටතේ ඇතුළත් අනෙකුත් ආයෝජන ඇතුළත් වේ.

## විස්තීරණ අදායම හරහා සාධාරණ වටිනාකම හදුනාග නු ලබන  මූල්‍ය වත්කම් (ණය උපකරණ)

පහත සඳහන් කොන්දේසි සපුරාලන්නේ නම් සමාගම මූල්‍ය වත්කම් විස්තීරණ අදායම හරහා සාධාරණ වටිනාකම හදුනාගනු ලබයි:

- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීම යන අරමුණු දෙක සහිතව  මූල්‍ය වත්කම් ව්‍යාපාර ආකෘතියක් තුළ තබා ඇති විට

  සහ

- මූල්‍ය වත්කම් වල ගිවිසුම් කොන්දේසි නිශ්චිත දිනයන්හිදී මුදල් ගලා ඒමට හේතු වන අතර එය හුදෙක්ම හිඟ මුදලෙහි පොලිය සහ වාරිකය වීම

විස්තීරණ අදායම හරහා සාධාරණ වටිනාකම හදුනාගනු ලබන ණය උපකරණ සඳහා පොලී ආදායම, විදේශ විනිමය නැවත ඇගයීම සහ හාණිකරන පාඩු හෝ ආපසු හැරවීම් ලාභ හෝ අලාභය ප්‍රකාශනයට  හඳුනාගනු ලබන අතර මිණුම්කරනය ක්‍රමක්ෂය පිරිවැයට අගය කල මූල්‍ය වත්කම් සදහා සිදුකරන ආකාරයට සිදුකරනු ලබයි.ඉතිරි සාධාරණ අගයන් වෙනස්වීම් විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගැනේ. ආපසු හැරවීමේදී, විස්තීරන ආදායම් ප්‍රකාශනයේ හඳුනාගත් සමුච්චිත සාධාරණ අගය වෙනස් වීම ලාභයට හෝ අලාභයට ප්‍රකාශයට ගැලපුම් කෙරේ.

## විස්තීරණ අදායම හරහා සාධාරණ වටිනාකම හඳුනාගැනීම නියමන කරනු ලබන මූල්‍ය වත්කම් (කොටස් උපකරණ)

මූලික හදුනාගැනීමෙන්  පසු " SLFRS- 3 යටතේ වෙළඳාම සඳහා හෝ අසම්භාව්‍ය සලකා බැලීම් ලෙස සිය ආයෝජන වර්ගීකරණය කිරීමට සමූහයට තෝරා ගත හැකිය.මෙහිදි ණය උපකරණයෙන් උපකරණය පදනම මත මෙම වර්ගීකරණය තීරණයවේ.

මෙම මූල්‍ය වත්කම් වල ලාභ හා පාඩු කිසි විටෙක ලාභ හෝ අලාභය  ප්‍රකාශයට ප්‍රතිචක්‍රීකරණය නොකෙරේ. මූල්‍ය වත්කම් වල පිරිවැයෙන් කොටසක් නැවත අය කර ගැනීමක් ලෙස සමූහයේ ප්‍රතිලාභ ලැබෙන විට හැර, ගෙවීමේ අයිතිය තහවුරු වූ විට ලාභාංශ අලාභ ප්‍රකාශයේ වෙනත් ආදායමක් ලෙස හදුනාගනු ලබන අතර, පෙරකී ලැබීම් විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ හදුනාගනී. එසේම මෙම මූල්‍ය වත්කම් හාණිකරන පරීක්ෂාවන් සඳහාද යටත් නොවේ.

## මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය

මූල්‍ය වත්කම් කළමනාකරණය සඳහා සමූහය සිය ව්‍යාපාර ආකෘතිය වෙනස් කළ විට පමණක් සමූහය සිය මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය කරනු ලැබේ. සමූහය විසින් ක්‍රමක්ෂය පිරිවැයට අගය කල මූල්‍ය වත්කම්, සාධාරණ අගය විස්තීරණ ආදායම් ප්‍රකාශය තුලින් ගලපන හෝ  සාධාරණ අගය ලාභයෙන් හෝ අලාභයෙන් ගලපනු ලැබූ මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය කරන්නේ නම්,නැවත වර්ගීකරණය කරන ලද දිනයේ සිට ඉදිරියට ගැලපුම් කිරීම සිදු කරයි. සමූහය කලින් හඳුනාගත් කිසිදු ලාභයක්, අලාභයක් (හාණිකරන ලාභයක් හෝ අලාභයක් ඇතුළුව) හෝ පොලිය නැවත නිවැරදි නොකරයි.

සමූහය විසින් ක්‍රමක්ෂය පිරිවැය මිනුම් කාණ්ඩයෙන් සාධාරණ අගය ලාභ අලාභ ගිණුම  තුලින් ගලපනු ලබන මිණුම් කාණ්ඩය වෙත නැවත වර්ගීකරණය කරන්නේ නම්, එහි සාධාරණ අගය නැවත වර්ගීකරණය කරන ලද දිනයේදී මනිනු ලැබේ. මෙම මූල්‍යමය වත්කම් වල සාධාරණ අගයන්වල සහ කලින් හදුනාගත් ක්‍රමක්ෂය පිරිවැය අතර වෙනසකින් මතුවන ඕනෑම ලාභයක් හෝ අලාභයක් ලාභ හෝ අලාභ ප්‍රකාශය තුළ හඳුනා ගැනේ.

සමූහය විසින් ක්‍රමක්ෂය පිරිවැය මිනුම් කාණ්ඩයෙන් විස්තීරණ ආදායම තුලින් සාධාරණ අගය ගලපනු ලබන

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

මිණුම් කාණ්ඩය වෙත නැවත වර්ගීකරණය කරන්නේ නම්, එහි සාධාරණ අගය නැවත වර්ගීකරණය කරන ලද දිනයේදී මනිනු ලැබේ. මෙම මූල්‍ය වත්කම් වල සාධාරණ අගයන් වල සහ කලින් හඳුනාගත් ක්‍රමක්ෂය පිරිවැය අතර වෙනසකින් මතුවන ඕනෑම ලාභයක් හෝ අලාභයක් විස්තීරණ ආදායම් ප්‍රකාශයට හඳුනාගනු ලැබේ. නැවත වර්ගීකරණය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස සඵල පොලී අනුපාතය සහ අපේක්ෂිත ණය පාඩු සඳහා ගැලපීම් සිදු නොකෙරේ.

සමූහය විසින් විස්තීරණ ආදායම තුලින් සාධාරණ අගය ගලපනු ලබන මිණුම් කාණ්ඩයෙන් ක්‍රමක්ෂය පිරිවැය මිනුම් කාණ්ඩය වෙත නැවත වර්ගීකරණය කරන්නේ නම්, එහි සාධාරණ අගය නැවත වර්ගීකරණය කරන ලද දිනයේදී මනිනු ලැබේ. කෙසේ වෙතත්, වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට කලින් හඳුනාගෙන තිබූ සමුච්චිත ලාභ හෝ අලාභය විස්තීරණ ආදායම් ප්‍රකාශයෙන් ඉවත්කර නැවත වර්ගීකරණය කරන දිනයේදී මූල්‍ය වත්කමේ සාධාරණ අගය ගැලපුම් කර ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය කළ දිනයේදී මනිනු ලබන්නේ එය සෑම විටම ක්‍රමක්ෂය පිරිවැයට මිනුම්කල ආකාරයෙනි. මෙම ගැලපීම අනෙකුත් විස්තීර්ණ ආදායමට බලපාන නමුත් ලාභයට හෝ අලාභයට බලපාන්නේ නැති බැවින් එය නැවත වර්ගීකරණය කිරීමක් ලෙස නොසැලකේ. නැවත වර්ගීකරණය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස සඵල පොලී අනුපාතය සහ අපේක්ෂිත ණය පාඩු සඳහා ගැලපීම් සිදු නොකෙරේ.

සමූහය විසින් විස්තීරණ ආදායම තුලින් සාධාරණ අගය ගලපනු ලබන මිණුම් කාණ්ඩයෙන් ලාභ අලාභ තුලින් සාධාරණ අගය ගලපනු ලබන මිනුම් කාණ්ඩය වෙත නැවත වර්ගීකරණය කරන්නේ නම්, සාධාරණ අගය මත මූල්‍ය වත්කම් මැනීම අඛණ්ඩව සිදු කෙරේ. අනෙකුත් විස්තීර්ණ ආදායම් වලදී කලින් හඳුනාගෙන තිබූ සමුච්චිත ලාභ හෝ අලාභය නැවත වර්ගීකරණය කරන දිනයේදී නැවත වර්ගීකරණය කිරීමේ ගැලපීමක් ලෙස ස්කන්ධයෙන් ලාභයට හෝ අලාභයට නැවත වර්ගීකරණය කෙරේ.

#### බැහැර කිරීම

හඳුනා ගත් මූල්‍ය වත්කමක් (හෝ අදාළ පරිදි මූල්‍ය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් සමූහයක කොටසක්) පොත් පත් වලින් ඉවත් කරනුයේ පහත අවස්ථාවලදීය:

- වත්කමෙන් මුදල් ප්‍රවාහ ලබා ගැනීමේ අයිතිය අවසන් වීම
- වත්කමෙන් මුදල් ප්‍රවාහ ලබා ගැනීමේ සිය අයිතිය සමූහය විසින් මාරුකර තිබෙන විට හෝ පරික්‍රමණ වැඩ පිළිවෙලත් මත තෙවන පාර්ශ්වයකට ලැබී ඇති මුදල් ප්‍රවාහ සැලකිය යුතු ප්‍රමාදයකින් තොරව සම්පූර්ණයෙන් ගෙවීමට වගකීමක් භාර ගෙන තිබෙන විට; සහ පහත කරුණු දෙකෙන් එකක්:

(අ) වත්කමේ සියලුම අවදානම් හා ප්‍රතිලාභ සමූහය විසින් හරවත් ලෙස මාරු කර තිබෙන විට

හෝ

(ආ) සමූහය විසින් වත්කමේ අවදානම් හා ප්‍රතිලාභ ප්‍රමාණවත් ලෙස මාරු කිරීමක් හෝ තබා ගැනීමක් නොකර වත්කමේ පාලනය මාරු කර තිබෙන විට

වත්කමකින් මුදල් ප්‍රවාහ ලබා ගැනීමේ සිය අයිතිය සමූහය විසින් පවරා තිබෙන විට හෝ පරික්‍රමණ වැඩ පිළිවෙලකට එළඹ තිබෙන විට හා වත්කමේ අවදානම් හා ප්‍රතිලාභ ප්‍රමාණවත් ලෙස මාරු කිරීමක් හෝ රඳවා ගැනීමක් නොකර වත්කමේ පාලනය ද මාරු කර නොතිබෙන විට ඒ ගැන සමාගම පවත්වා ගෙනයන අඛණ්ඩ සම්බන්ධයේ ප්‍රමාණය දක්වා වත්කම හඳුනා ගැනේ. එවැනි අවස්ථාවකදී සමූහය විසින් ආශ්‍රිත බැඳියාවක්ද හඳුනා ගනී. මාරු කරන ලද වත්කම් හා ආශ්‍රිත බැඳියාව සමූහය විසින් රඳවා ගෙන තිබෙන අයිතිවාසිකම් හා වගකීම් පිළිඹිඹු වන පදනමක් මත මනිනු ලැබේ.

ඇප ප්‍රතිඥාවක ස්වභාවයක් ගන්නා මාරු කරන ලද වත්කම කෙරෙහි වූ අඛණ්ඩ සහභාගිත්වය මනිනුයේ වත්කමේ මුල් ධාරණ අගයත් සමූහයට ගෙවීමට නියමිත විය හැකි උපරිම මුදලත් යන දෙකෙන් අඩු අගයටය.

### 2.6.12.2 මූල්‍ය වත්කම් හානිකරණය

මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිකරණය වී තිබෙන බවට යම් විෂය බද්ධ සාක්ෂියක් තිබෙන බවට වාර්තා කරණ සෑම දිනයකදීම සමූහය විසින් එම වත්කම් අගැයීමට ලක් කෙරේ.

මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිකරණයවී තිබෙන බවට සලකණු ලබන්නේ වත්කමක් මූලික හඳුනා ගැනීමෙන් පසු ඇති වූ සිද්ධියක හෝ සිද්ධි කීපයක ප්‍රතිඵලයක් වශයෙන් (දරණ ලද පාඩු සිද්ධියක්) වන අතර එම පාඩු සිද්ධිය මූල්‍ය වත්කමේ හෝ මූල්‍ය වත්කම් සමූහයේ ඇස්තමේන්තු කළ අනාගත මුදල් ප්‍රවාහයන්ට විශ්වාසයෙන් ඇස්තමේන්තු කළ හැකි බලපෑමක් ඇති කළ විටය. පාඩු සිද්ධියෙන් ඇති කරණ වත්කමක් මූලික හඳුනා ගැනීමෙන් පසු හානිකරණය වන බවට යම් විෂය බද්ධ සාක්ෂියක් තිබේ නම් පමණි. ණය කරුවන් හෝ ණය කරුවන් සමූහයක් සැලකිය යුතු අන්දමින් මුදල් දුෂ්කරතා, ණය නොගෙවීම් හෝ පොලිය හෝ ප්‍රාග්ධන ගෙවීම් වල දී අදාල පැහැර හැරීම් අත්විඳින බවට ඇඟවීම්, ඔවුන්ව වස්තුභංගත්වයට හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානයකට ප්‍රවේශ වීමේ භව්‍යතාවයක් සහ ඇස්තමේන්තු ගත අනාගත මුදල් ප්‍රවාහයන්ගේ මැනිය හැකි අඩුවීමක් ඇති වීම සහ නිරීක්ෂණය කළ හැකි දත්ත වලින් පෙන්වීම ද (එනම් හිඟවීම් වල වෙනස්වීම් හෝ ආර්ථික තත්වයන්ගේ වෙනස්වීම් අතපසුවීම් සමග සම්බන්ධතාවක් ඇති බව) හානිකරණ සාක්ෂි වලට අයත් විය හැකිය.

සමූහය විසින්, ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගය ගලපන උපකරණ හැර අනෙකුත් සියලුම ණය උපකරණ සඳහා අපේක්ෂිත ණය අලාභ (ECL) සඳහා දීමනාවක් හඳුනාගනී. ණය අලාභ සඳහා පදනම් වී ඇත්තේ කොන්ත්‍රාත්තුවට අනුකූලව ගෙවිය යුතු කොන්ත්‍රාත් මුදල් ප්‍රවාහයන් සහ සමූහය ලැබීමට අපේක්ෂා කරන මුදල් ප්‍රවාහයන්හි වෙනස මූලික ඵලදායී පොලී අනුපාතයට වට්ටම් කිරීමෙනි. අපේක්ෂිත මුදල් ප්‍රවාහයට, කොන්ත්‍රාත් කොන්දේසිවලට අනුකූලව සිදුවන ණය, වැඩිදියුණු කිරීම්

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

හෝ ඇප තැන්පතු විකිණීමෙන් ලැබෙන මුදල් ප්‍රවාහයන් ඇතුළත් වේ.

අපේක්ෂිත ණය අලාභ අවස්ථා දෙකකදී හඳුනා ගැනේ

මූලික හඳුනාගැනීමෙන් පසු, ණය අවදානමේ සැලකිය යුතු වර්ධනයක් සිදු නොවූ ණය සඳහා, අපේක්ෂිත ණය අලාභය ලබා දෙනුයේ ඉදිරි මාස 12 තුළදී (මාස 12 ක ඊසීඑල්) සිදුවිය හැකි පැහැර හැරීම් හේතුවෙන් සිදුවන ණය අලාභ සඳහා ය.

මූලික හඳුනාගැනීමෙන් පසු, ණය අවදානම සැලකිය යුතු ලෙස වැඩි වී ඇති ණය සඳහා, ගෙවීම් පැහැර හැරීමේ කාලය නොසලකා, ඉතිරි නිරාවරණ කාලය සඳහා අපේක්ෂිත ණය අලාභ සඳහා අලාභ දීමනාවක් අවශ්‍යවේ.

වෙළඳ ලැබීම් සහ කොන්ත්‍රාත් වත්කම් සඳහා සමූහය අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීමේදී, සරල ක්‍රමය අනුගමනය කරයි. එම නිසා සමූහය ණය අවදානමේ වෙනස්කම් නිරීක්ෂණය නොකරන අතර ඒ වෙනුවට එක් එක් වාර්තාකරණ දිනයේදී ජීවිත කාලය පුරාම අපේක්ෂිත ණය අලාභ මත පදනම් වූ අලාභ දීමනාවක් හඳුනා ගනී. සමූහය විසින් ඓතිහාසික ණය අලාභ අත්දැකීම සඳහා ආර්ථික පරිසරය සම්බන්ධ ඉදිරි සාධක ගලපන ලද ප්‍රතිපාදන අකෘතියක් ස්ථාපිත කර ඇත.

### 2.6.12.3 මූල්‍ය බැරකම්

#### මූලික හඳුනා ගැනීම හා මිනුම්කරණය

SLFRS 9 හි විෂය පථය තුල මූල්‍ය වගකීම් වල වර්ග කිරීම සමූහය විසින් තීරණය කරණු ලබන්නේ මුල් හඳුනා ගැනීමේදීය.

සියලුම මූල්‍ය බැරකම් මුලදී හඳුනා ගනු ලබන්නේ සාධාරණ අගය මත වන අතර, ණය හා අත්මාරු සහ වෙනත් මූල්‍ය බැරකම් වලට අදාලව ක්‍රමක්ෂය පිරිවැය මත හඳුනා ගනී. සෘජුව ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැය මෙහි අඩංගුය.

#### පසුකාලීන මිනුම්කරණය

පහත දැක්වෙන පරිදි මූල්‍ය බැරකම්වල මිනුම් රඳා පවතිනුයේ, වර්ග කිරීම මතය.

ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගය ගලපන ලෙස වර්ගීකරණය කර ඇති මූල්‍ය වගකීම් පසුව සාධාරණ අගයකින් මනිනු ලබන අතර, 'වෙනත් වගකීම්' ලෙස වර්ගීකරණය කරන ලද මූල්‍ය වගකීම් පසුව ක්‍රමක්ෂ්‍ය පිරිවැය යටතේ මනිනු ඇත.

#### බැහැර කිරීම

මූල්‍ය බැරකමක් පොත්පත් වලින් ඉවත් කරනුයේ, අදාළ වගකීම යටතේවූ බැඳීම ඉටු කළ විට හෝ අවලංගු කළ විට හෝ කල් ඉකුත් වූ විටය.

### 2.6.12.4 මූල්‍ය උපකරණ හිලව් කිරීම

මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හිලව් කර ශුද්ධ වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වාර්තා කරනුයේ, හඳුනා ගත් වටිනාකම් දැනට බලාත්මක නීතිමය අයිතියක් හා ශුද්ධ පදනමක් මත වත්කම් උපලබ්ධි කර බැරකම් පියවීම සමගාමීව සිදු කිරීමෙන් ශුද්ධ වටිනාකම පියවීමේ අභිප්‍රායක් තිබෙන විට පමණි.

### 2.6.12.5 මූල්‍ය උපකරණවල සාධාරණ අගය

සමූහය විසින් සෑම වාර්තාකරන දිනයකදීම ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගය ගලපන මූල්‍ය වත්කම් හා විකිණීමට ඇති මූල්‍ය වත්කම් මිණුම්කරනය සිදුකරනු ලබයි

සාධාරණ අගය වනුයේ, මිණුම්කරන දිනයේදී, වෙළෙඳපොළ සහභාගීවන්නන් අතර විධිමත් ගනුදෙනුවක දී වත්කමක් විකිණීමෙන් ලැබෙන හෝ වගකීමක් පැවරීමට ගෙවනු ලබන මිලයි.

සාධාරණ අගය මැනීම පදනම් වන්නේ වත්කම් විකිණීමේ හෝ වගකීම පැවරීමේ ගනුදෙනුව

- වත්කම් හෝ වගකීම් සඳහා ප්‍රධාන වෙළඳපොලකදී
- ප්‍රධාන වෙළඳපොලක් නොමැති විට, වත්කම් හෝ වගකීම් සඳහා වඩාත්ම වාසිදායක වෙළඳපොලේදී සිදුවන බවට ඇති උපකල්පනය මතය.

වත්කම් හෝ වගකීම් වල සාධාරණ අගය මනිනු ලබන්නේ වෙළෙඳපොළ සහභාගිවන්නන් තම ආර්ථික යහපත සඳහා ක්‍රියාකරන බව උපකල්පනය කරමින් වත්කම් හෝ වගකීම් මිල නියම කිරීමේදී වෙළෙඳපොළ සහභාගීවන්නන් භාවිතා කරන උපකල්පන උපයෝගී කරගනිමිනි.

අදාළ තත්ත්වයනට ගැලපෙන සහ සාධාරණ අගය මැනීම සඳහා ප්‍රමාණවත් දත්ත ලබා ගත හැකි, අදාළ නිරීක්ෂණය කළ හැකි යෙදීම් උපරිම ලෙස භාවිතා කිරීම සහ නිරීක්ෂණය කළ නොහැකි යෙදීම් භාවිතය අවම කිරීම සඳහා තක්සේරු කිරීමේ ක්‍රම සමූහය භාවිතා කරයි.

සමස්තයක් වශයෙන් සාධාරණ අගය මිණුම්කරනය සඳහා වැදගත් වන අවම මට්ටමේ යෙදවුම් මත පදනම්ව, මූල්‍ය ප්‍රකාශන වල සාධාරණ අගය මත ගිණුම්කරණය කර ඉදිරිපත් කරන සියලුම වත්කම් හා වගකීම් පහත සඳහන් පරිදි සාධාරණ වටිනාකම් ධූරාවලියකට අනුව වර්ගීකරණය කෙරේ.

1 වන මට්ටම - සමාන වත්කම් හෝ වගකීම් සඳහා සක්‍රීය වෙළඳපළක නියම වූ මිල ගණන් (වෙනස්කම් සිදු නොකළ)

2 වන මට්ටම - සාධාරණ අගය මැනීම සඳහා වැදගත් වන අවම මට්ටමේ යෙදවුම් සෘජුව හෝ වක්‍රව නිරීක්ෂණය කළ හැකි තක්සේරු කිරීමේ ක්‍රම

3 වන මට්ටම - සාධාරණ අගය මැනීමේදී සැලකිය යුතු අවම මට්ටමේ යෙදවුම් නිරීක්ෂණය කළ නොහැක තක්සේරු කිරීමේ ක්‍රම.

සමූහය විසින් එක් එක් වාර්තාකරණ කාලය අවසානයේදී. පුනරාවර්තන පදනමින් මූල්‍ය ප්‍රකාශන වල හඳුනා ගන්නා වත්කම් හා වගකීම්, ධූරාවලියේ මට්ටම් අතර ස්ථාන මාරුවීම් සිදුවී ඇත්ද යන්න වර්ගීකරණය නැවත තක්සේරු කිරීමෙන් තීරණය කරනු ලබයි. (සාධාරණ අගය මැනීමට සැලකිය යුතු අවම මට්ටමේ යෙදවුම් සමස්තයක් ලෙස පදනම් කර)

වෙනත් විස්තීරණ ආදායම තුළින් මනිනු ලබන මිල නියම නොකළ මූල්‍ය වත්කම් වැනි පුනරාවර්තන සාධාරණ

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

අගයන්, මැනීම සඳහා වූ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි, සමූහයේ කළමනාකරණය විසින් තීරණය කරනු ලැබේ.

සාධාරණ වටිනාකම් හෙළිදරව් කිරීම් සඳහා, සමූහයේ වත්කම් හා වගකීම් කාණ්ඩයන්, වත්කම් හෝ වගකීම් වල ස්වභාවය, ලක්ෂණ සහ අවදානම් සහ ඉහත විස්තර කර ඇති සාධාරණ වටිනාකම් ධූරාවලියේ මට්ටම අනුව තීරණය කර ඇත.

## 2.6.13 ප්‍රතිපාදන

අතීත සිද්ධියක ප්‍රතිඵලයක් වශයෙන් සමූහයට ප්‍රවර්තන බැඳීම් (නීතිමය හෝ සම්ප්‍රයුක්තව) තිබෙන විට ආර්ථික ප්‍රතිලාභ මූර්තිමත් කරණ සම්පත් පිටතට ගලායාමේ සම්භාවිතාවක් පවතීනම් සහ බැඳීයාවට අදාළ මුදල් ගැන විශ්වාසය තැබිය හැකි ඇස්තමේන්තුවක් සකස් කළ හැකි වන්නේ නම් ප්‍රතිපාදන හඳුනා ගනු ලැබේ. මුදලේ කාලීන අගයේ බලපෑම ප්‍රමාණවත් වන්නේ නම් මුදලේ කාලීන අගයේ බලපෑම සහ උචිත පරිදි බැඳියාවට විශේෂිත වූ ආදායම පිළිබිඹු වන අයුරින් බදු ගෙවීමට පෙර අනුපාතයන් මත අනාගතයේදී අපේක්ෂිත මුදල් ප්‍රවාහයන් වට්ටම් කර ප්‍රතිපාදන නියම කරනු ලැබේ. වට්ටම් කිරීම භාවිතා කිරීමේ දී කාලයත් සමග ප්‍රතිපාදනයේ වන වැඩිවීම් මූල්‍ය පිරිවැය වශයෙන් හඳුනා ගනු ලැබේ.

## 2.6.14 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීයාවන්

### අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලැස්ම - විශ්‍රාම වැටුප් බැඳීයාව

සේවා කාලය හා පාරිශ්‍රමිකය වැනි සාධක එකක් හෝ එකට වැඩි ගණනක් මත සාමාන්‍යයෙන් සේවකයෙකු හට විශ්‍රාම ගැනීමේදී ලැබෙන විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ප්‍රමාණය, තීරණය කරයි.

ප්‍රතිලාභ විශ්‍රාම වැටුප් සැලැස්ම සම්බන්ධයෙන් මූල්‍ය තත්ව ප්‍රකාශයේ පිළිගෙන තිබෙන බැරකම වන්නේ, සැලසුම් කළ වත්කම් වල සාධාරණ අගය අඩු කර, පිළිනොගත් පැරණි සේවා පිරිවැය වෙනුවෙන් ගැලපීම් සහිතව, වාර්තා කරනු ලබන කාල සීමාව අවසානයේ තිබුන අර්ථ දැක්වූ ප්‍රතිලාභ බැරකමේ වත්මන් අගයයි. ස්වාධීන අයුගණකයින් විසින් ප්‍රක්ෂිප්ත ඒකක ණය ක්‍රමය භාවිතා කරමින් අර්ථ දැක් වූ ප්‍රතිලාභ බැරකම වාර්ෂිකව ගණනය කරති. අර්ථ දැක්වූ ප්‍රතිලාභ බැරකමේ වත්මන් අගය තීරණය වන්නේ ඉහල ප්‍රමිතිව්‍යාප්ත සංයුක්ත බැඳුම් කර වෙළඳපලක් ශ්‍රී ලංකාවේ නොමැති නිසා, ඇස්තමේන්තු කළ අනාගත මුදල් ප්‍රවාහ රජයේ බැඳුම්කර වල පොලී අනුපාතය යොදා ගනිමින් වට්ටම් කිරීමෙනි. රජයේ බැඳුම් කර නාමනය කෙරෙණුයේ අදාළ විශ්‍රාම වැටුප් බැරකමේ නියමයන්ට සමාන වන පරිදි කල්පිරිය යුතු ප්‍රතිලාභ ගෙවනු ලබන්නා වූ ව්‍යවහාර මුදල් වලිනි.

ආයුගණක ලාභ හා පාඩු, ඒවා පැන නගින අවස්ථාවේදී වෙනත් විස්තීර්ණ ආදායම් වල ක්ෂණිකව හඳුනාගැනේ

නිශ්චිත කාල සීමාවක් (පැවරුම් කාල සීමාව) තුළ සේවයේ යෙදී සිටින සේවකයින්ට විශ්‍රාම වැටුප් සැලැස්මේ වෙනස්වීම් කොන්දේසි සහ ගත නොවන්නේ නම්, අතීත සේවා පිරිවැය ආදායම් ප්‍රකාශනයට වහාම හඳුනා ගැනේ. මෙම අවස්ථාවේදී, අතීත සේවා පිරිවැය පැවරුම් කාලය ඔස්සේ සරල රේඛා පදනමක් මත ක්‍රමක්ෂය කරනු ලැබේ.

### අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂිකය

සේවා කාලය හා පාරිශ්‍රමිකය වැනි සාධක එකක් හෝ එයට වැඩි ගණනක් මත සාමාන්‍යයෙන් රඳා පවතින, සේවකයෙකු හට විශ්‍රාම ගැනීමේදී ලැබෙන ප්‍රතිලාභ ගණන අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂිකය මගින් අර්ථ නිරූපනය කෙරෙයි. අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලැස්ම සමන්විත වන්නේ 1983 අංක 12 දරණ පනතෙන් ප්‍රතිපාදිත පාරිතෝෂිකයෙනි. පාරිතෝෂිකය සඳහා ප්‍රතිඥා දී ඇති විශ්‍රාම ප්‍රතිලාභයන්හි ප්‍රවර්තන අගය සමූහය විසින් මනිනු ලබන අතර එම අගය ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය (PUC) මත පාදක වූ ආයු ගණක තක්සේරු ක්‍රමවේදය භාවිතයට ගනිමින් අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලැස්මකි. ආයු ගණක ලාභ හා අලාභ ඒවා සිදුවන කාලසීමාවට අදාළව ආදායම් ප්‍රකාශනයේ සම්පූර්ණයෙන්ම හඳුනා ගනු ලැබේ. පාරිතෝෂික බැඳියාව සඳහා අරමුදල් බාහිරව ලබා නොගැනේ. මෙම අයිතමය ශේෂ පත්‍රයේ අනෙකුත් අර්ථ දැක්වූ ප්‍රතිලාභ වගකීම් යටතේ වර්ග කෙරේ.

### අර්ථ දැක්වූ දායකත්ව සැලැසුම - සේවක අර්ථ සාධක අරමුදල හා සේවානියුක්ත භාර අරමුදල

අදාල නීති හා රෙගුලාසි ප්‍රකාර සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය හා සේවක භාරකාර අරමුදලේ දායකත්වය ලැබීමට සේවකයෝ සුදුසුකම් ලබති. ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයින්ගේ දළ වැටුපෙන් 15% ක් ලංකා විදුලිබල මණ්ඩල අර්ථ සාධක අරමුදලට දායකත්වය ලබා දෙන අතර ලංකා විදුලිබල මණ්ඩලය හැර, සේවකයින්ගේ දළ වැටුපෙන් පිළිවෙලින් 12% ක් හා 3% ක් සමූහය විසින් අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්ති භාරකාර අරමුදලට දායකවේ.

## 2.6.15 ස්වයං රක්ෂණ සංචිතය

සෑම වසරකදීම වසර අවසානයේ දළ වශයෙන් නැවත තක්සේරු කළ ස්ථාවර වත්කම් වලින් 0.1% ක් ලංකා විදුලිබල මණ්ඩලය විසින් ස්වයං රක්ෂණ සංචිතයකට මාරු කරයි. ලංකා විදුලිබල මණ්ඩලය දේපල, පිරියත හා උපකරණ වල පාඩු හා හානි රක්ෂණ සංචිතයට භර කෙරේ. මෙම කාර්යය සඳහා අරමුදල් සපුරා ගන්නේ බැංකුවක වෙනම ගිණුමක ආයෝජනය කර තිබෙන මුදල් වලිනි.

## 2.6.16 රජයේ ප්‍රදාන

රජයේ ප්‍රදාන මූලික වශයෙන්ම සාධාරණ අගයට හඳුනා ගැනෙන අතර, එකී ප්‍රදාන ලැබෙනු ඇති බවට සාධාරණව තහවුරු කොට ඇති විටක, එකී ප්‍රදාන ආශ්‍රිත කොන්දේසි වලට සමාගම අනුගතවනු ඇත. සමූහය විසින් දරන ලද වියදම් සඳහා වන්දියක් වශයෙන් එකී ප්‍රදාන ලැබෙන අවස්ථාවක ලාභ අලාභ ප්‍රකාශයේ සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් යටතේ ආදායම හඳුනා ගන්නා ලද එකී කාලපරිච්ඡේදය සඳහා ක්‍රමානුකූල පදනම මත අනෙකුත් ආදායම් වශයෙන් හඳුනා ගැනේ. වත්කම් පිරිවැය වශයෙන් සමූහයට ගෙවන ලද ප්‍රදාන එකී වත්කමේ ප්‍රයෝජනවත් ජීවිත කාලය මත ක්‍රමානුකූල පදනම මත ලාභ හෝ අලාභ තුළ හඳුනා ගැනේ.

## 2.6.17 මුදල් හා මුදල් හා සමාන දෑ

මුදල් හා මුදල් හා සමාන වෙනත් දේ ලෙස විග්‍රහ කර ඇත්තේ, අත තිබෙන මුදල්, බැංකු තැන්පතු හා ඉක්මණින් හා පහසුවෙන් මාස තුනක් හෝ ඊට අඩු

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

කාලයකදී නිශ්චිත මුදල් ප්‍රමාණයක් බවට පහසුවෙන් පරිවර්තනය කළ හැකි හා අගය වෙනස් වීම පිළිබඳව අල්ප අවදානමකට ලක් වන ඉහළ ද්‍රවශීලතාවයෙන් යුත් කෙටි කාලීන ආයෝජනයන්ය.

සමූහයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්යය සඳහා මුදල් හා මුදල් වලට සමානදේ, අත තිබෙන මුදල්, බැංකු තැන්පතු හා බැංකු අයිරා වල ශුද්ධ ප්‍රමාණයෙන් සමන්විත වේ.

### 2.6.18 පාරිභෝගිකයන් සමඟ වූ ගිවිසුම වලින් ලද ආදායම්

පාරිභෝගිකයෙකුට භාණ්ඩ හෝ සේවා සැපයීම සඳහා ප්‍රමාණවත් වශයෙන් සමූහය අපේක්ෂා කරන වටිනාකමට පොරොන්දු වූ භාණ්ඩය හෝ සේවාව පාරිභෝගිකයා වෙත ලබාදීමෙන් කාර්ය සාධන වගකීමක් තෘප්තිමත් කිරීමේ දී සමූහය විසින් එම වටිනාකම ආදායම හඳුනාගනු ලැබේ.

| 2019 වර්ෂයට පෙර කාලපරිච්ඡේදයට අදාල කෙරීගෙන යන වැඩ ගිණුම | | 916,205,092 |
| 2019 වර්ෂයට අදාල කෙරීගෙන යන වැඩ ගිණුම | | 463,928,760 |

**05. ජනන අංශයේ කෙරීගෙන යන වැඩ ගිණුමෙන් මාරු කරන ලද වත්කම් සඳහා ක්ෂය වීමේ පිරිවැය සඳහා ගිණුම්කරණය**

| | හර<br>රු. | බැර<br>රු. |
|---|---|---|
| 2019 වර්ෂයට පෙර කාලපරිච්ඡේදයට අදාල රඳවාගත් ඉපයීම් | 115,120,218 | |
| 2019 වර්ෂයට අදාල රඳවාගත් ඉපයීම් | 329,132,106 | |
| 2019 වර්ෂයට පෙර කාලපරිච්ඡේදයට අදාල දේපල පිරියත සහ උපකරණ | | 115,120,218 |
| 2019 වර්ෂයට අදාල දේපල පිරියත සහ උපකරණ | | 329,132,106 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**06. මෙහෙයුම් හා නඩත්තු සේවා සඳහා ගෙවිය යුතු මුදල් වැරදි ලෙස හඳුනා ගැනීමේ වරද නිවැරදි කිරීම**

| | හර<br>රු. | බැර<br>රු. |
|---|---|---|
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ | 84,420,715 | |
| 2019 වර්ෂයට පෙර කාලපරිච්ඡේදයට අදාල රඳවාගත් ඉපයීම් | | 84,420,715 |

**07. අමතර කොටස් තොග නිකුත් කිරීම වැරදි ලෙස හඳුනා ගැනීම නිවැරදි කිරීම**

| | හර<br>රු. | බැර<br>රු. |
|---|---|---|
| අමතර කොටස් තොග | 230,207,987 | |
| 2019 වර්ෂයට අදාල රඳවාගත් ඉපයීම් | | 230,207,987 |

**08. ලක්විජය බලාගාරයේ ගල් අඟුරු තොග ගැලපුම් කිරීමේ වැරදි නිවැරදි කිරීම**

| | හර<br>රු. | බැර<br>රු. |
|---|---|---|
| 2019 වර්ෂයට පෙර කාලපරිච්ඡේදයට අදාල රඳවාගත් ඉපයීම් | 3,207,727,326 | |
| තොග ගැලපුම් | | 3,207,727,326 |

**09. පූර්ව ගෙවීම් කරන ලද සේවක පිරිවැය හඳුනා ගැනීමේ වරද නිවැරදි කිරීම**

| | හර<br>රු. | බැර<br>රු. |
|---|---|---|
| අනෙකුත් මූල්‍ය නොවන වත්කම් | 4,879,801 | |
| 2019 වර්ෂයට අදාල අනෙකුත් මූල්‍ය වත්කම් | | 4,879,801 |

**10. ඉන්ධන තොග ගැලපුම් කිරීමේ වැරදි නිවැරදි කිරීම**

| | හර<br>රු. | බැර<br>රු. |
|---|---|---|
| 2019 වර්ෂයට අදාල රඳවාගත් ඉපයීම් | 22,066,110 | |
| තොග ගැලපුම් | | 22,066,110 |

**11. සම්ප්‍රේෂන අංශයේ දේපල පිරියත සහ උපකරණ කෙරීගෙන යන වැඩ ගිණුමෙන් මාරු කිරීමේ වැරදි නිවැරදි කිරීම**

| | හර<br>රු. | බැර<br>රු. |
|---|---|---|
| 2019 වර්ෂයට පෙර කාලපරිච්ඡේදයට අදාල දේපල පිරියත සහ උපකරණ | 135,968,117 | |
| 2019 වර්ෂයට අදාල දේපල පිරියත සහ උපකරණ | 912,114 | |
| 2019 වර්ෂයට පෙර කාලපරිච්ඡේදයට අදාල කෙරීගෙන යන වැඩ ගිණුම | | 135,968,117 |
| 2019 වර්ෂයට අදාල කෙරීගෙන යන වැඩ ගිණුම | | 912,114 |

**12. සම්ප්‍රේෂන අංශයේ කෙරීගෙන යන වැඩ ගිණුමෙන් මාරු කරන ලද වත්කම් සඳහා ක්ෂය වීමේ පිරිවැය සඳහා ගිණුම්කරණය**

| | හර<br>රු. | බැර<br>රු. |
|---|---|---|
| 2019 වර්ෂයට පෙර කාලපරිච්ඡේදයට අදාල රඳවාගත් ඉපයීම් | 16,160,559 | |
| 2019 වර්ෂයට අදාල රඳවාගත් ඉපයීම් | 25,645 | |
| 2019 වර්ෂයට පෙර කාලපරිච්ඡේදයට අදාල දේපල පිරියත සහ උපකරණ | | 16,160,559 |
| 2019 වර්ෂයට අදාල දේපල පිරියත සහ උපකරණ | | 25,645 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

(සියළුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත)

## 34.3 දෙසැම්බර් 31 දිනට සමූහය සඳහා පෙර වසරේ ගැලපුම් වල බලපෑම

| මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය | 2019 ගැලපුම් කිරීමට පෙර | ගැලපුම් | ගැලපුම් අංකය | 2019 ගැලපුම් කිරීමෙන් පසු |
|---|---|---|---|---|
| **වත්කම්** | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | |
| දේපල, පිරියත හා උපකරණ-පිරිවැයට | 799,576,467 | (460,438) | 04/05/11/12 | 799,116,029 |
| කල්බදු ඉඩම් සඳහා ගෙවන වාරිකය | 235,577 | | | 235,577 |
| අස්පෘෂ්‍ය වත්කම් | 499,056 | | | 499,056 |
| බද්ධ ව්‍යාපාරවල ආයෝජන | 36,900 | | | 36,900 |
| ලැබිය යුතු මූල්‍ය කල්බදු | 19,899,441 | | | 19,899,441 |
| රක්ෂණ සංචිත අරමුදලේ ආයෝජන | 8,996,893 | | | 8,996,893 |
| අනෙකුත් මූල්‍ය වත්කම් | 2,596,310 | (4,880) | 09 | 2,591,430 |
| වෙනත් ජංගම නොවන මූල්‍ය වත්කම් | 25,348,198 | 4,880 | 09 | 25,353,078 |
| | 857,188,842 | (460,438) | | 856,728,404 |
| විකිනීම සඳහා රඳවාගත් ජංගම නොවන වත්කම් | 76 | | | 76 |
| **ජංගම වත්කම්** | | | | |
| වෙළඳ තොග | 55,622,767 | 230,208 | 07 | 55,852,975 |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ | 56,491,420 | 325 | 02 | 56,491,746 |
| ලැබිය යුතු උප කල්බදු | 21,110 | | | 21,109 |
| ලැබිය යුතු මූල්‍ය කල්බදු | 910,171 | | | 910,171 |
| අනෙකුත් මූල්‍ය වත්කම් | 27,080,350 | | | 27,080,350 |
| මුදල් හා මුදල් සමාන දෑ | 7,282,167 | | | 7,282,167 |
| | 147,407,985 | 230,533 | | 147,638,518 |
| **මුළු වත්කම්** | 1,004,596,903 | (229,905) | | 1,004,366,998 |
| **ස්කන්ධය හා වගකීම්** | | | | |
| **ස්කන්ධය සහ සංචිත** | | | | |
| දායක ප්‍රාග්ධනය | 323,194,038 | | | 323,194,038 |
| සංචිත | 50,082,923 | | | 50,082,923 |
| රඳවාගත් ඉපැයීම් | (72,806,745) | (15,511,205) | 01/02/03/05/06/ 07/08/10/12 | (88,317,951) |
| **මව් සමාගමේ ස්කන්ධ හිමියන්ට ආරෝපණීය ස්කන්ධය** | 300,470,216 | (15,511,205) | | 284,959,010 |
| පාලනයට යටත් නොවන හිමිකම් | 31,655,307 | | | 31,655,308 |
| **මුළු ස්කන්ධ** | 332,125,523 | (15,511,205) | | 316,614,318 |
| **ජංගම නොවන වගකීම් සහ විලම්භිත ආදායම්** | | | | |
| පොලී ගෙවිය යුතු ණය හා ණය ගැනීම් | 312,115,499 | 11,889,482 | 01 | 324,004,981 |
| විලම්භිත බදු වගකීම | 753,562 | | | 753,562 |
| පාරිභෝගික තැන්පතු | 15,013,791 | | | 15,013,791 |
| ප්‍රතිපාදන සහ වෙනත් විලම්භිත වගකීම් | 11,788,539 | | | 11,788,539 |
| රාජ්‍ය ප්‍රදාන | 297,697 | | | 297,697 |
| ගිවිසුම් වගකීම් | 94,421,389 | | | 94,421,389 |
| | 434,390,477 | 11,889,482 | | 446,279,959 |
| **ජංගම වගකීම්** | | | | |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ | 197,069,250 | 3,391,819 | 03/06/08/10 | 200,461,069 |
| ගෙවිය යුතු ලාභාංශ | 2,303,807 | | | 2,303,807 |
| ආදායම් බදු වගකීම | 2,215,573 | | | 2,215,573 |
| පොලී ගෙවිය යුතු ණය හා ණය ගැනීම් | 36,492,272 | | | 36,492,272 |
| | 238,080,902 | 3,391,819 | | 241,472,721 |
| **මුළු ස්කන්ධ හා වගකීම්** | 1,004,596,903 | (229,905) | | 1,004,366,998 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

(සියළුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත)

### 34.4.1 2019 දෙසැම්බර් 31 දිනට මණ්ඩලය සඳහා පෙර වසරේ ගැලපුම්වල බලපෑම

| විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය | 2019 ගැලපුම් කිරීමට පෙර | ගැලපුම් | ගැලපුම් අංකය | 2019 ගැලපුම් කිරීමෙන් පසු |
|---|---|---|---|---|
| ආදායම | 267,041,265 | | | 267,041,265 |
| විකුණුම් පිරිවැය | (324,453,251) | (12,010,498) | 01/05/10/12/07 | (336,463,749) |
| **දළ ලාභය/(අලාභය)** | **(57,411,986)** | **(12,010,498)** | | **(69,422,484)** |
| අනෙකුත් ආදායම් | 17,021,754 | | | 17,021,754 |
| බෙදාහැරීමේ පිරිවැය | (392,611) | | | (392,611) |
| අනෙකුත් වියදම් | (355,200) | | | (355,200) |
| පරිපාලන වියදම් | (11,967,383) | | | (11,967,383) |
| **මෙහෙයුම් ලාභය/(අලාභය)** | (53,105,426) | (12,010,498) | | (65,115,924) |
| මූල්‍ය ආදායම | 3,848,623 | | | 3,848,623 |
| මූල්‍ය පිරිවැය | (24,103,238) | | | (24,103,238) |
| මූල්‍ය පිරිවැය - ශුද්ධ | (20,254,615) | - | | (20,254,615) |
| හවුල් ව්‍යාපාරයේ අලාභ කොටස | (6,850) | | | (6,850) |
| **ආදායම් බදු ගෙවීමට පෙර ලාභය/(අලාභය)** | **(73,366,891)** | **(12,010,498)** | | **(85,377,389)** |
| ආදායම් හා විලම්භිත බදු වියදම් | (2,423,862) | | | (2,423,862) |
| පාලනයට යටත් නොවන අයිතිය | (6,059,416) | | | (6,059,416) |
| **වසර සඳහා ලාභය/(අලාභය)** | **(81,850,169)** | **(12,010,498)** | | **(93,860,667)** |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

(සියළුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත)

### 34.3.2 2019 ජනවාරි 01 දිනට මණ්ඩලය සඳහා පෙර වසරේ ගැලපුම්වල බලපෑම

| මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය | 2019.01.01 දිනට ගැලපුම් කිරීමට පෙර | ගැලපුම් | ගැලපුම් අංකය | 2019.01.01 දිනට ගැලපුම් කිරීමෙන් පසු |
|---|---|---|---|---|
| **වත්කම්** | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | |
| දේපල, පිරියත සහ උපකරණ - පිරිවැයට | 763,195,966 | (131,281) | 04/05/11/12 | 763,064,685 |
| කල්බදු ඉඩම් සඳහා ගෙවූ වාරිකය | 229,042 | | | 229,042 |
| අස්පෘෂ්‍ය වත්කම් | 532,736 | | | 532,736 |
| බද්ධ ව්‍යාපාරයන්හි ආයෝජන | 43,750 | | | 43,750 |
| ලැබිය යුතු මූල්‍ය කල්බදු | 9,775,319 | | | 9,775,319 |
| රක්ෂණ සංචිතවල ආයෝජන | 8,070,253 | | | 8,070,253 |
| අනෙකුත් මූල්‍ය වත්කම් | 2,303,439 | | | 2,303,439 |
| වෙනත් ජංගම නොවන වත්කම් | 36,461,582 | | | 36,461,582 |
| | 820,612,087 | (131,281) | | 820,480,806 |
| විකිණීම සඳහා ඇති ජංගම නොවන වත්කම් | 76 | | | 76 |
| **ජංගම වත්කම්** | | | | |
| වෙළඳ තොග | 48,309,728 | | | 48,309,728 |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ | 57,740,010 | | | 57,740,010 |
| මූල්‍ය කල්බදුවලින් ලැබිය යුතු දෑ | 569,718 | | | 569,718 |
| අනෙකුත් මූල්‍ය වත්කම් | 19,565,483 | 325 | 02 | 19,565,808 |
| මුදල් හා මුදල් සමාන දෑ | 5,503,939 | | | 5,503,939 |
| | 131,688,878 | 325 | | 131,689,203 |
| **මුළු වත්කම්** | 952,301,041 | (130,956) | | 952,170,085 |
| **ස්කන්ධය සහ වගකීම්** | | | | |
| **ප්‍රාග්ධනය හා සංචිත** | | | | |
| දායක ප්‍රාග්ධනය | 302,694,797 | | | 302,694,797 |
| සංචිත | 44,511,162 | | | 44,511,162 |
| රඳවාගත් ඉපයීම් | 13,398,703 | (3,500,707) | 02/03/05/ 06/08/12 | 9,897,996 |
| **මව් සමාගමේ ස්කන්ධ කොටස් හිමියන්ට ආරෝපිත ස්කන්ධය** | 360,604,662 | (3,500,707) | | 357,103,955 |
| පාලනයට යටත් නොවන අයිතිය | 25,758,561 | | | 25,758,561 |
| **මුළු ස්කන්ධය** | 386,363,223 | (3,500,707) | | 382,862,516 |
| **ජංගම නොවන වගකීම් සහ විලම්භිත ආදායම්** | | | | |
| පොලී සහිත ණය හා ණය ගැනීම් | 288,351,654 | | | 288,351,654 |
| විලම්භිත බදු වගකීම | 276,157 | | | 276,157 |
| පාරිභෝගික තැන්පතු | 14,311,008 | | | 14,311,008 |
| ප්‍රතිපාදන හා අනෙකුත් විලම්භිත වගකීම් | 11,257,055 | | | 11,257,055 |
| රාජ්‍ය ප්‍රදාන | 318,228 | | | 318,228 |
| ගිවිසුම් වගකීම් | 90,809,989 | | | 90,809,989 |
| | 405,324,091 | - | | 405,324,091 |
| **ජංගම වගකීම්** | | | | |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ | 133,023,927 | 3,369,751 | 03/06/08 | 136,393,678 |
| ගෙවිය යුතු ලාභාංශ | 2,258,669 | | | 2,258,669 |
| ආදායම් බදු වගකීම | 2,336,098 | | | 2,336,098 |
| පොලී ගෙවිය යුතු ණය හා ණය ගැනීම් | 22,995,033 | | | 22,995,033 |
| | 160,613,727 | 3,369,751 | | 163,983,478 |
| **මුළු ස්කන්ධය හා වගකීම්** | 952,301,041 | (130,956) | | 952,170,085 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

(සියළුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත)

## 35. ඔඩපනය කර තිබෙන වත්කම්

**මණ්ඩලය**

මූල්‍ය තත්ව ප්‍රකාශන දිනට වත්කම් කිසිවක් ඔඩපනය කර නොතිබුණි.

### 35.1 සීමාසහිත ලංකා විදුලි (පුද්) සමාගම

වගකීම් සඳහා ආරක්ෂණයක් වශයෙන් පහත දැක්වෙන වත්කම් ඔඩපනය කර ඇත.

| වත්කම්වල ස්වභාවය | වගකීමේ ස්වභාවය | ඔඩපනය කළ ධාරණ අගය 2020 | 2019 | යටතේ සඳහන්වේ |
|---|---|---|---|---|
| ස්ථාවර තැන්පතු | මහජන බැංකුවේ බැංකු අයිරා පහසුකම් | 45,500 | 241,552 | ජංගම සහ ජංගම නොවන වෙනත් ආයෝජන |
| ස්ථාවර තැන්පතු | මහජන බැංකුවේ සුමක ණය යෝජනා ක්‍රමය | 196,122 | 57,518 | |
| ස්ථාවර තැන්පතු | උකස් බැංකුවේ සේවක ණය යෝජනා ක්‍රමය HDFC බැංකුවේ ණය පහසුකම | 1,120,464 | 1,061,638 | |
| ස්ථාවර තැන්පතු | ජාතික ඉතිරිකිරීමේ බැංකුව-සූර්ය බලශක්ති ව්‍යාපෘති ණය | 1,230,970 | - | |

### 35.2 සීමාසහිත එල්ටීඑල් හෝල්ඩින්ස් (පුද්) සමාගම

සමූහයේ අදාළ සමාගම් සඳහා පොලී සහිත ණය ගැනීම් හා ණයවර ලිපි සඳහා ආරක්ෂනයක් වශයෙන් පහත සඳහන් වත්කම් ඔඩපනය කර ඇත

| වත්කම්වල ස්වභාවය | වගකීමේ ස්වභාවය | ඔඩපනය කළ ධාරණ අගය 2020 | 2019 | යටතේ සඳහන්වේ |
|---|---|---|---|---|
| **සීමාසහිත ලක්දනව් සමාගම** | | | | |
| ස්ථාවර තැන්පතුවල ආයෝජන | බැංකු ඇප මත උකස් තැබීම | 648,060 | 475,692 | වෙනත් මූල්‍ය වත්කම් |
| | වෙනත් ජංගම වගකීම් | 542,194 | 579,440 | |
| | ණයවර ලිපි පහසුකම් | - | 991,333 | |
| **සීමාසහිත පවන්දනව් (පුද්ගලික) සමාගම** | | | | |
| සුළං විදුලි බලාගාරය, සින්නක්කර ඉඩම හා කල්බදු ඉඩම | ප්‍රාථමික සමගාමී උකස් බැඳීම | - | 1,813,480 | දේපල පිරියත හා උපකරණ |
| සීමාසහිත එල්ටීඑල් හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගම සතු සාමාන්‍ය කොටස් 51% | ප්‍රාථමික සමගාමී උකස් බැඳීම | - | 540,600 | ප්‍රකාශිත ප්‍රාග්ධන |

### 35.3 ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්) සමාගම

ගලිගමුවේ පිහිටි මීටර් පෙට්ටි කර්මාන්ත ශාලාව ඉදිකිරීම් සහ මීටර් පෙට්ටි නිෂ්පාදනයට ලබා ගත් ණය මුදල වෙනුවෙන් සමාගම සතු ස්ථාවර තැම්පත් සහ විද්‍යුත් උපකරණ ඔඩපනය කර ඇති අතර, මෙහි ඇති රු. මිලියන 27.4 ක වටිනාකමක් සම්පත් බැංකු විසින් සපයනු ලබන මුදල් පදනම මත වන ණයවර ලිපි පහසුකම සඳහා හිමිකම් පෑමට ලබාදීමට සමාගම විසින් එකගවී ඇත.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

(සියළුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත)

## 36. මූල්‍ය තත්ව ප්‍රකාශන දිනට පසු සිදුවීම්

මූල්‍ය ප්‍රකාශන සඳහා ගැලපීම් කල යුතු සිදුවීම් කිසිවක් මූල්‍ය ප්‍රකාශන නිකුත්කල දිනෙන් පසුව වාර්ථාවී නොමැත

## 37. අසම්භාව්‍යතාවන්

### 37.1 මණ්ඩලය

2020.12.31 දිනට අභියාචනාධිකරණය, ශ්‍රේෂ්ඨාධිකරණය ඇතුළුව, කම්කරු උසාවිය හා අනෙකුත් අධිකරණයන්හි ලංකා විදුලි බල මණ්ඩලය වග උත්තරකරු කරමින් නඩු පවරා තවමත් අවසන් නොවූ නඩු කටයුතු මත අසම්භව්‍යය වගකීම පැන නැගී ඇත. මෙම සියලු නඩු මණ්ඩලයට අවාසි සහගත ලෙස තීරණය වනු ඇතැයි සිතිය නොහැකි වුව ද, එසේ තීරණය වුවහොත් ඇති වන අසම්භව්‍යය වගකීම රුපියල් මිලියන 4,340 ක් වේ.

### 37.2 සීමාසහිත එල්ටීඑල් හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගම

**නෛතික හිමිකම් අසම්භාව්‍යතාවන්**

**සීමසහිත හෙළදනව් සමාගම**

**සීමාසහිත හෙළදනව් එරෙහිව ලංකා විදුලිබල මණ්ඩලය නඩුකරය HC (Civil) ARB /185/2014**

ලංකා විදුලිබල මණ්ඩලයට එරෙහිව සීමාසහිත හෙළදනව් සමාගම මගින් පවරා ඇති නඩුකරය සම්බන්ධයෙන් සමාගමට වාසිදායක අන්දමින් බේරුම්කාර විනිශ්චය මණ්ඩලය විසින් 2013 ඔක්තෝබර් 29 දින ප්‍රකාශයට පත් කරන ලද තීරණාත්මක නඩු තීන්දුව බලාත්මක කරන ලෙස ඉල්ලා ආයතනය විසින් මෙම නඩුකරය පවරා ඇත. 2017 නොවැම්බර් 10 වන දින මහාධිකරණය විසින් අනුබද්ධ සමාගමට පක්ෂව බලාත්මක කිරීමේ අයදුම්පත ලබා දෙන ලදී.

**සීමාසහිත හෙළදනව් සමාගමට එරෙහිව ලංකා විදුලිබල මණ්ඩලය C (Civil) ARB /268/2013**

සීමාසහිත හෙළදනව් එරෙහිව ලංකා විදුලිබල මණ්ඩලය මහාධිකරණයේ පවරා ඇති ඉහත නඩුව සම්බන්ධයෙන් 2013 ඔක්තෝබර් 29 දින ප්‍රකාශයට පත් කරන ලද තීරණාත්මක නඩු තීන්දුවට එරෙහිව අතුරු තහනම් නියෝගයක් ලබා දෙන ලෙස ඉල්ලා ලංකා විදුලිබල මණ්ඩලය විසින් මෙම නඩුව ගොණු කරනු ලැබ ඇත. 2017 නොවැම්බර් 10 වන දින මහාධිකරණය විසින් අනුබද්ධ සමාගමට පක්ෂව බලාත්මක කිරීමේ අයදුම්පත ලබා දෙන ලදී.

**ශ්‍රේෂ්ඨාධිකරණ අභියාචනා අංක SC/HC/LA ඉල්ලුම්පත්‍රය 142/2017- හෙළදනව් සඳහා වාසිවන ලෙස දුන් තීන්දුව බලාත්මක වීමට එරෙහිව ලංවිම විසින් අවසාන අභියාචනය**

හෙළ දනව් සඳහා වාසි වන ලෙස දුන් තීන්දුවට එරෙහිව සෘජුවම අභියාචනය ඉදිරිපත් කිරීමට ලංවිමට හිමිකම් නැත. කෙසේ වුවද, විශේෂ අවසරයක් මඟින් පළමුව ලබාගන්නා ලද ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව සමඟ අභියාචනයක් කිරීම සඳහා අවසර ලැබී ඇත.ඒ අනුව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් 2019 මැයි 14 දින නඩු දෙකම පෙර තීන්දුව ලබා දුන් මහාධිකරණ විනිසුරුවරයා වෙත ටම යවන ලෙස නියම කරන ලදි. ලංවිම විසින් මතු කරන ලද ඇතැම් විරෝධතා සහ සලකා නොබැලූ කරුණු සැලකිල්ලට ගෙන නැවත තීන්දුව ලිවීමට නියම කළේය. එහි ප්‍රතිඵලයක් වශයෙන් මෙම නඩු දෙකම මහාධිකරණ විනිසුරුවරයා වෙත කැඳවනු ලැබූ අතර දෙපාර්ශවයම වැඩිදුර කරුණු ඉදිරිපත් කළහ. මෙය 2020 ජනවාරි 22 වන දින අවසන් විය. නඩු දෙකම 2020 අප්‍රේල් 3 වන දිනට විනිශ්චය ලබාදීමට නියම කරන ලදී. කෙසේ වෙතත්, කොවිඩ් -19 වසංගතය හේතුවෙන් ඇති වූ සීමාවන් සැලකිල්ලට ගෙන, රටේ තත්වය යථා තත්ත්වයට පත්වන තෙක් විනිශ්චය දිනය වෙනස් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

### 37.2.2 අනෙකුත් අසම්භව්‍යයන්

එල්ටීඑල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගමේ අනුබද්ධ සමාගම්වලට 2016/17, 2017/18 සහ 2018/19 තක්සේරු වර්ෂ සඳහා වැට්, එන්බීටී සහ ඊඑස්සී ලෙස රුපියල් මිලියන 1,158 ක බදු තක්සේරු කිරීම් ලැබී ඇති අතර එයින් රුපියල් මිලියන 479 ක මුදලක් දඩ මුදල් වේ. කෙසේ වෙතත් අදාළ සමාගම් විසින් මෙම බදු තක්සේරු කිරීම්වලට එරෙහිව වලංගු අභියාචනයක් ඉදිරිපත් කර ඇති අතර පවතින තොරතුරු මත පදනම්ව ස්වාධීන බදු උපදේශකයින් සමඟ සාකච්ඡා කිරීමෙන් පසු සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ මතය වන්නේ 2020.12.31 දිනෙන් වර්ෂය සඳහා මේ සම්බන්ධයෙන් අනාගත වගකීමක් පැන නොනගින බවයි.

### 37.3 සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම

ලිබර්ටි කොමොඩිටීස් ආයතනය විසින් හිමිකම ඉක්මවා ඉල්ලුම් කර ඇති මුදල සම්බන්ධයෙන් ලිබර්ටි කොමොඩිටීස් ආයතනයට එරෙහිව සමාගම විසින් නඩුවක් ගොණු කරනු ලැබ ඇත. දැනට නඩුවේ බේරුම්කරණ තීන්දුව අපේක්ෂාවෙන් සිටී.ශේෂපත්‍ර දිනට මෙම හිමිකම් පෑමේ ධාරණ අගය රුපියල් මිලියන 236 කි.

# මුල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

(සියළුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත)

## 38 ප්‍රාග්ධන බැඳීම

### 38.1 මණ්ඩලය

මණ්ඩලය දේපල, පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම වෙනුවෙන් 2020 දෙසැම්බර් 31 වන දිනට (2019 නැත) මිලදී ගැනීම් වලට අදාළව ව්‍යාපාරයේ සාමාන්‍ය කටයුතුවලට අනුෂාංගිකව ප්‍රමාණවත් බැඳීම් ඇති කර ගෙන නොතිබිණි.

### 38.2 සීමාසහිත ලංකා විදුලි (පුද්.) සමාගම

වාර්ථා කරන දිනය වන විට මුල්‍ය ප්‍රකාශන වල ගැලපීම් කල යුතු හෝ හෙළිදරව් කිරීම් අවශ්‍ය වන ප්‍රමාණාත්මක ප්‍රාග්ධන බැඳීම් කිසිවක් නොමැත (2019 නැත)

### 38.3 සීමාසහිත එල්ටීඑල් හෝල්ඩින්ස් (පුද්) සමාගම

**කල්බදු**

බදු ගැනුම්නරුවකු ලෙස සමූහයේ මූල්‍ය කල්බදු බැඳීම් හෙලිදරව්ව-සටහන් අංක 24.4

බදු ගැනුම්නරුවකු ලෙස සමූහයේ මූල්‍ය කල්බදු ලැබිය යුතු දෑ හෙලිදරව්ව - සටහන් අංක 14

**ණයවර ලිපි**

| බැංකුව | 2020 | 2019 |
|---|---|---|
| හැටන් නැෂනල් බැංකුව | 127,106 | 44,572 |
| ස්ටෑන්ඩර්ඩ් චාටර්ඩ් බැංකුව | 305,454 | 556,333 |
| | 432,560 | 600,905 |

**ඇපය**

| බැංකුව | 2020 | 2019 |
|---|---|---|
| හැටන් නැෂනල් බැංකුව | 189,674 | 386,439 |
| කැනරා බැංකුව ඉන්දියාව | - | 1,058 |
| ස්ටෑන්ඩර්ඩ් චාටර්ඩ් බැංකුව | 155,550 | 331,622 |
| හබීබ් බැංකුව | 73,289 | 73,289 |
| | 418,513 | 792,408 |

**ආනයන බිල්පත්‍ර**

| බැංකුව | 2020 | 2019 |
|---|---|---|
| හැටන් නැෂනල් බැංකුව | - | 23,629 |
| ස්ටෑන්ඩර්ඩ් චාටර්ඩ් බැංකුව | 249,686 | 25,077 |
| | 249,686 | 48,706 |

**සීමාසහිත ලක්දනව් සමාගම**

සමාගම බැංකු ඇපකර ලෙස හැටන් නැෂනල් බැංකුව වෙනුවෙන් රුපියල්. 6,148,509,763/- (2019- රු. 6,148,509,763/-) සහ ඇ.ඩො. 25,000/- ක (2019- නැත) වගකීමක් දරයි.

සමාගම බැංකු ඇපකර ලෙස සම්පත් බැංකුව වෙනුවෙන් රුපියල් 5,863,097,020/- (2019- රුපියල් 5,723,265,471/-) ක වගකීමක් දරන අතර 2020 සඳහා ලංසු ඇපකර ලෙස කිසිදු වගකීමක් නැත (2019 වර්ෂය සඳහා - රුපියල් . 350,000,000/- වගකීමක් දරයි)

සමාගම ලංසු ඇපකර ලෙස ස්ටැන්ඩඩ් චාර්ටඩ් බැංකුව වෙනුවෙන් 2019 වර්ෂය සඳහා - ඇ.ඩො. 731,700 ක වගකීමක් දරයි. 2020 වර්ෂය සඳහා ලංසු ඇපකර ලෙස කිසිදු වගකීමක් නැත.

සමාගම බැංකු ඇපකර ලෙස ජාතික සංවර්ධන බැංකුව වෙනුවෙන් ඇ.ඩො. 4,104,000 ක වගකීමක් දරයි.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

(සියළුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත)

## 38.4 වෙනත් බැඳීම්

**සීමාසහිත ලක්දනව් සමාගම**

කෙරවලපිටිය විදුලි බලාගාරය ඉදිකිරීමේදී තාක්ෂණික දෝෂයක් ඇතිවුව හොත් හෝ කෙළවරපිටිය බලාගාර ව්‍යාපෘතියේ ණය ආපසු ගෙවීම සම්බන්ධයෙන් සීමාසහිත වෙස්ට් කොස්ට් පවර් සමාගමෙන් කිසියම් පැහැර හැරීමක් සිදුවුව හොත්, සීමාසහිත වෙස්ට් කොස්ට් පවර් සමාගමෙන් ලැබෙන ලාභාංශවලට සරිලන මුදලක් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ආණ්ඩුවට ගෙවීමට සමාගම බැඳී සිටී.

පරිපාලිත සමාගමක් වන ලක්දනව් බංගලා බලශක්ති සමාගම වෙත මෙහෙයුම් හා නඩත්තු සේවා සැපයීම වෙනුවෙන් ස්ථාවර මිල කොන්ත්‍රාත්තුවක් සමාගම සතුව පවතී (මෙය එක්සත් ජනපද පාරිභෝගික මිල දර්ශකයට අනුව ගැලපුම් කර ඇත)

පරිපාලිත සමාගමක් වන රාජ් ලංකා බලශක්ති සමාගම වෙත මෙහෙයුම් හා නඩත්තු සේවා සැපයීම වෙනුවෙන් ස්ථාවර මිල කොන්ත්‍රාත්තුවක් සමාගම සතුව පවතී (මෙය බංගලාදේශ පාරිභෝගික මිල දර්ශකයේ වෙනස්වීම් වලට අනුව ගැලපුම් කර ඇත)

**සීමාසහිත ලක්දනව් බංගලා විදුලිබල සමාගම**

බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුමට අනුව සමාගමේ කාර්යසාධන බැඳීමක් වශයෙන් බංගලාදේශයේ බලපත්‍රලාභී බැංකුවකින් ආපසු ලබා ගත නොහැකි, කොන්දේසි විරහිත ටකා 117,666,077 කට සමාන ද්වි මාසික ධාරිතා ගෙවීමකට අදාලව බැංකු ඇපකරයක් බංගලාදේශ බලශක්ති සංවර්ධන මණ්ඩලය වෙත ලබා දිය යුතුය. ඒ අනුව සමාගම විසින් ඉහත සහතිකය බංගලාදේශයේ සිටි බෑන්ක් ලිමිටඩ් වෙතින් ලබා දී ඇති අතර ප්‍රමාද ගාස්තුවක් හෝ වෙනත් අවශ්‍යතාවයක් මත සමාගම විසින් BPDB වෙත ගෙවීමට අවශ්‍ය වන විට ඉල්ලුම මත මෙම බැංකු ඇපකර මුදල BPDB වෙත ගෙවීමට සමාගම බැඳී සිටී.

**සීමාසහිත රාජ් ලංකා බලශක්ති සමාගම**

බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුමට (PPA) අනුව සමාගම විසින් බංගලාදේශයේ බලපත්‍රලාභී බැංකුවන් මගින් ආපසු අයකර ගත නොහැකි සහ කොන්දේසි විරහිත බැංකු ඇපකරයක් බංගලාදේශ බලශක්ති සංවර්ධන මණ්ඩලයට ලබා දිය යුතුය. ඒ අනුව සමාගම විසින් ඉහත සහතිකය බංගලාදේශයේ ස්ටෑන්ඩඩ් බෑන්ක් ලිමිටඩ් වෙතින් ලබා දී ඇති අතර එය ටකා 110,163,300 කි. ප්‍රමාද ගාස්තුවක් හෝ වෙනත් අවශ්‍යතාවයක් මත සමාගම විසින් BPDB වෙත ගෙවීමට අවශ්‍ය වන විට ඉල්ලුම මත මෙම බැංකු ඇපකර මුදල BPDB වෙත ගෙවීමට සමාගම බැඳී සිටී.

**ෆෙනි ලංකා බලශක්ති පුද්ගලික සමාගම**

බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුමට අනුව, සමාගම විසින් බංගලාදේශයේ බලපත්‍රලාභී බැංකුවක් මගින් ආපසු අයකර ගත නොහැකි සහ කොන්දේසි විරහිත බැංකු ඇපකරයක් බංගලාදේශයේ බලශක්ති සංවර්ධන මණ්ඩලයට ලබා දිය යුතුය. ඒ අනුව සමාගම විසින් ඉහත සහතිකය බංගලාදේශයේ ඊස්ටර්න් බෑන්ක් ලිමිටඩ් වෙතින් ලබා දී ඇති අතර එය ඇමරිකානු ඩොලර් 2,427,378.39 කි. ප්‍රමාද ගාස්තුවක් හෝ වෙනත් හානියක අවශ්‍යතාවයක් හෝ මත සමාගම විසින් BPDB වෙත ගෙවීමට අවශ්‍ය වන විට ඉල්ලුම මත මෙම බැංකු ඇපකර මුදල BPDB වෙත ගෙවීමට සමාගම බැඳී සිටී.

**ඉන්ෆ්‍රා ඇන්ඩ් ඉංජිනියරින් (පුද්ගලික) සමාගම**

සමූහය ණයවර ලිපි සඳහා හැටන් නැෂනල් බැංකුව වෙනුවෙන් රුපියල් 24,358,320/- (2019- රුපියල් 289,393,902/-)ක වගකීමක් දරයි.

සමූහය කාර්ය සාධන ඇපකර ලෙස හැටන් නැෂනල් බැංකුව වෙනුවෙන් රුපියල් 1,493,670,652/- (2019- නැත)ක වගකීමක් දරයි.

වර්ෂ හතරක කාලයක් වෙනුවෙන් සමූහයේ උප පරිපාලිත සමාගමක් වන නිව්ඳු පුද්ගලික සමාගම වෙත මෙහෙයුම් හා නඩත්තු සේවා සැපයීම වෙනුවෙන් ස්ථාවර මිල කොන්ත්‍රාත්තුවක් සමාගම සතුව පවතී (මෙය වාර්ෂිකව කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ වෙනස් වීම් වලට අනුව ගැලපුම් කරනු ලැබේ)

වර්ෂ දෙකක කාලයක් වෙනුවෙන් සමූහයේ උප පරිපාලිත සමාගමක් වන නිව්ඳු අසුපිනිඇල්ල පුද්ගලික සමාගම වෙත මෙහෙයුම් හා නඩත්තු සේවා සැපයීම වෙනුවෙන් ස්ථාවර මිල කොන්ත්‍රාත්තුවක් සමාගම සතුව පවතී (මෙය වාර්ෂිකව කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ වෙනස් වීම් වලට අනුව ගැලපුම් කරනු ලැබේ)

සමූහයේ උප පරිපාලිත සමාගමක් වන පවන් දනව් පුද්ගලික සමාගම වෙත මෙහෙයුම් හා නඩත්තු සේවා සැපයීම වෙනුවෙන් ස්ථාවර මිල කොන්ත්‍රාත්තුවක් සමාගම සතුව පවතී (මෙය වාර්ෂිකව 5% කින් ගැලපුම් කරනු ලැබේ)

පරිපාලිත සමාගමක් වන ෆෙනී ලංකා බලශක්ති සමාගම වෙත මෙහෙයුම් හා නඩත්තු සේවා සැපයීම වෙනුවෙන් ස්ථාවර මිල කොන්ත්‍රාත්තුවක් සමාගම සතුව පවතී (මෙය එක්සත් ජනපද පාරිභෝගික මිල දර්ශකයේ වෙනස්වීම් වලට අනුව ගැලපුම් කර ඇත)

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

(සියළුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත)

## 39 සම්බන්ධිත පාර්ශව හෙළිකිරීම්

### 39.1. ශ්‍රී ලංකා රජය හා ඒහා සම්බන්ධිත පාර්ශවයන් සමඟ කෙරෙන ගනුදෙනු

ලංකා විදුලිබල මණ්ඩලය ශ්‍රී ලංකා රජය මඟින් සෘජුව පාලනය කරන බැවින් ශ්‍රී ලංකා ආණ්ඩුවද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් පාලනය කරන්නාවූ, ඒකාබද්ධව පාලනය කරන්නාවූ, හෝ ශ්‍රී ලංකා රජය මඟින් සුවිශේෂී ලෙස බලපෑම් කරන්නාවූ ආයතනයන්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 24 - සම්බන්ධිත පාර්ශවයන් හෙලිකිරීම" යන ප්‍රමිතියට අනුව සම්බන්ධිත පාර්ශවයන් ලෙස ලංකා විදුලිබල මණ්ඩලය විසින් සැලකිල්ලට ගනු ලැබ ඇත.

සමූහය සහ මණ්ඩලය රාජ්‍ය සහ අනෙකුත් සම්බන්ධ ආයතන සමග ගනුදෙනු විධිවිධාන සහ ගිවිසුම් වලට එළඹී ඇති අතර ඒවායෙන් සැලකිය යුතු වටිනාකමකින් යුතු ගනුදෙනු පහත සදහන් පරිදි වාර්තා කර ඇත.

| | ගණුදෙනුවේ ස්භාවය | සමූහය | | මණ්ඩලය | |
|---|---|---|---|---|---|
| | | 2020 | 2019 | 2020 | 2019 |
| ලංකා ඛනිජ තෙල් සංස්ථාව | ඉන්ධන මිලට ගැනීම | 30,195,427 | 53,399,860 | 30,195,427 | 53,399,860 |
| රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තුමේන්තුව | ව්‍යාපෘති ණය ලබාගැනීම | 11,515,486 | 18,026,484 | 11,515,486 | 18,026,484 |
| මහජන බැංකුව | බැංකු ණය ලබාගැනීම | 15,890,781 | 83,363,945 | 15,890,781 | 83,363,945 |
| මහජන බැංකුව | ආයෝජන | 14,006,485 | 7,620,302 | - | - |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | බැංකු ණය ලබාගැනීම | 6,229,720 | 16,014,000 | 4,998,750 | 10,000,000 |
| ලංකා බැංකුව | බැංකු ණය ලබාගැනීම | 10,139,296 | 17,404,077 | 5,000,000 | 15,000,000 |
| රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | ආයෝජන | 57,442 | 57,442 | - | - |
| එච්ඩීඑෆ්සී බැංකුව | ආයෝජන | 1,063,021 | 1,061,638 | - | - |

තවද, සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වලට අදාළව පහත විස්තර කෙරෙන ගනුදෙනු ශ්‍රී ලංකා රජය හා අදාළ ආයතන සමඟ එළඹී ඇත

ලංකා බැංකුව හා මහජන බැංකුව සමඟ බැංකු ගිණුම් පවත්වා ගැනීම හා බැංකු ගනුදෙනුවලට එළඹීම

ව්‍යවස්ථාපිත අනුපාතයන්ට බදු ගෙවීම

සේවා විශ්‍රාම ප්‍රතිලාභ - සේ.අ.අ. හා සේ.භා.අ. සඳහා ගෙවීම

ප්‍රධාන වශයෙන් දුරකථන විදුලිය සහ ජලය සමන්විත- උපයෝගිතා ගෙවීම්

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සඳහා මෝටර් වාහන රක්ෂණ වාරික ගෙවීම

රජයට හිමිකාරිත්වය ඇති බැංකු සමග ආයෝජන, ජංගම ගිණුම් සහ ණය ගැනීම (එච්.එන්.බී, එන්ඩීබී, කොමර්ෂල් බැංකුව හා ඩීඑෆ්සීසී බැංකුව)

# මුල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

(සියළුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත)

## 39.2 ලංවිම සම්බන්ධිත සමාගම් සමඟ සම්බන්ධිත පාර්ශව ගනුදෙනු

ව්‍යාපාර කටයුතුවලදී මණ්ඩලයේ සම්බන්ධිත ආයතන සමඟ සිදුකරන සම්බන්ධිත පාර්ශව ගනුදෙනු පහත දක්වා ඇත.

| | සම්බන්ධතාවය | ගණුදෙනුවේ ස්වභාවය | 2020 | 2019 |
|---|---|---|---|---|
| ලංකා විදුලි (පුද්) සමාගම | පරිපාලිත | විදුලි බලය විකිණීම | (24,596,359) | (27,737,578) |
| | | විදුලිබල විකුණුම් සඳහා මුදල් ලැබීම | 28,720,346 | 36,799,539 |
| | | ලාභාංශ ආදායම | 411,300 | 542,409 |
| | | ණය ගැනීම් | 2,000,000 | 2,403 |
| සීමාසහිත එල්ටිඑල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම | පරිපාලිත | ලාභාංශ ලැබීම් | 629,874 | 2,204,559 |
| | | ලාභාංශ ලැබීම් | (2,204,559) | (2,636,334) |
| සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම | පරිපාලිත | ගල් අඟුරු මිලදී ගැනීම | 40,954,618 | 42,414,954 |
| | | ශුද්ධ වියදම ප්‍රතිපූර්ණය | 45,765 | 55,206 |
| සීමාසහිත එල්ටිඑල් ට්‍රාන්ස්ෆෝමර්ස් (පුද්ගලික) සමාගම | උප පරිපාලිත | භාණ්ඩ මිලදී ගැනීම | 1,096,030 | 1,108,165 |
| සීමාසහිත නිව්ඳු (පුද්.) සමාගම | උප පරිපාලිත | විදුලිබලය මිලදී ගැනීම | 78,461 | 56,037 |
| සීමාසහිත නිව්ඳු අසුපිනැල්ල (පුද්.) සමාගම | උප පරිපාලිත | විදුලිබලය මිලදී ගැනීම | 219,644 | 190,808 |
| සීමාසහිත පවන් දනව් (පුද්.) සමාගම | උප පරිපාලිත | විදුලිබලය මිලදී ගැනීම | 187,103 | 597,840 |
| සීමාසහිත ඇන්ට් ලෙකෝ මීටර්ස් (පුද්.) සමාගම | උප පරිපාලිත | භාණ්ඩ මිලදී ගැනීම | 833,185 | 1,076,347 |
| සීමාසහිත ශ්‍රී ලංකා එනර්ජීස්(පුද්.) සමාගම | උප පරිපාලිත | සේවා ලබාගැනීම | 73,742 | 20,269 |
| සීමාසහිත කුඹල්ගමුව මිනිහයිඩ්‍රෝ (පුද්ගලික) සමාගම | උප පරිපාලිත | විදුලිබලය මිලදී ගැනීම | 115,197 | 106,274 |

## 39.3 සමූහයේ අනෙකුත් සමාගම් අතර සම්බන්ධිත පාර්ශව ගනුදෙනු

| ගණුදෙනුවේ ස්වභාවය | එල්ටිඑල් හෝල්ඩින්ස් සහ පරිපාලිතයන් | 2020 | 2019 |
|---|---|---|---|
| භාණ්ඩ හා සේවා විකිණීම | 151,723 | 151,723 | 221,215 |
| මෙහෙයුම් හා ඉංජිනේරු සේවා | 4,777,494 | 4,777,494 | 316,534 |

## 39.4 සමූහයේ ප්‍රධාන කළමනාකරණ පිරිස් සමඟ කරන ගනුදෙනු

මණ්ඩලයේ කාර්යයන් සැලසුම් කිරීම,මෙහෙයවීම හා පාලනය කිරීම සඳහා බලය හා වගකීම තිබෙන පුද්ගලයන් මණ්ඩලයේ ප්‍රධාන කළමනාකරණ මණ්ඩලය ලෙස නිර්වචනය කෙරේ. මණ්ඩලයේ එම ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයට අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් සහ ප්‍රධාන විධායක නිලධාරියා අයත් වේ.

සමූහයේ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය පරිපාලිතයන්හි බද්ධ ව්‍යාපාරවල හා මව් සමාගම ලෙස ලංකා විදුලිබල මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය ලෙස සලකනු ලැබේ.

ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය හා ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ ආසන්න පවුල්වල සාමාජිකයන් (CFMs) වේ නම් එයද පහත සඳහන් හෙළිදරව් කිරීම මගින් සැලකිල්ලට ගනු ලැබේ.

### අ) ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා ගෙවීම්

| | සමූහය | | මණ්ඩලය | |
|---|---|---|---|---|
| | 2020 | 2019 | 2020 | 2019 |
| කෙටිකාලීන සේවක ප්‍රතිලාභ | 149,498 | 162,957 | 3,471 | 4,149 |
| පශ්චාත් - රැකියා ප්‍රතිලාභ | 13,941 | 13,842 | - | |
| | 163,439 | 176,799 | 3,471 | 4,149 |

ඉහත ප්‍රතිලාභ ගෙවීමට අමතරව සමාගම ප්‍රධාන කළමනාකරණ පිරිස් වෙත ඔවුන් සමඟ ඇති රැකියා ගිවිසුම අනුව මුදල් නොවන ප්‍රතිලාභ දෙනු ලබයි.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

(සියළුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත)

## 40 මූල්‍ය අවදානම් කළමනාකරණ අරමුණු හා ප්‍රතිපත්ති

### 40.1 විශ්ලේෂණය

සමූහය සිය මූල්‍ය උපකරණ භාවිතයේදී පහත සඳහන් අවදානම් වලට නිරාවරණය වේ.

ණය අවදානම
ද්‍රවශීලතා අවදානම
වෙළඳපල අවදානම

ඉහත දැක් වූ එක් එක් අවදානමට සමූහය නිරාවරණය වීම, සමූහයේ අරමුණු හා අවදානම් මැන දැක්වීම සහ කළමනාකරණය හා සමූහය විසින් ප්‍රාග්ධන කළමනාකරණය සඳහා වූ කාර්ය පරිපාටි හා කාර්ය ක්‍රම ගැන තොරතුරු මෙම සටහනෙන් ඉදිරිපත් කෙරේ.

### 40.2 අවදානම් කළමනාකරණ රාමුව

සමූහයේ අවදානම් කළමනාකරණ රාමුව ස්ථාපිත කිරීමේ හා සඵල අධීක්ෂණයේ සමස්ථ වගකීම රඳා පවතිනුයේ, අධ්‍යක්ෂක මණ්ඩලය මතය. සමූහයේ අවදානම් කළමනාකරණ කාර්ය පරිපාටි ස්ථාපිත කරනුයේ සමූහය විසින් මුහුණ දෙන අවදානම් සහගත තත්ත්වයන් හඳුනා ගෙන විශ්ලේෂණය කිරීමට, උචිත අවදානම් සීමාවන් හා පාලක නියම කිරීම, අවදානම් හා සීමාවන්ට අනුකූලවීම හා පසු විපරම් සඳහාය.

සමූහයේ අවදානම් සමූහයේ අවදානම් කළමනාකරණ කාර්ය පරිපාටිවලට අනුකූලව කළමනාකරණය විසින් පසුවිපරම් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධීක්ෂණය කනු ලබන අතර සමූහය විසින් මුහුණ පාණු ලබන අවදානම් වලට අදාළව අවදානම් කළමනාකරණ රාමුවේ ප්‍රමාණවත් බව සමාලෝචනය කරනු ලබයි. ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය විසින් සමූහයේ අධ්‍යක්ෂවරුන්ගේ අධීක්ෂණ භූමිකාවට සහාය ලබා දෙයි.

### 40.3 ණය අවදානම

ණය අවදානම යනු මූල්‍ය වගකීමට සම්බන්ධව බැඳීමක් ඉටු කිරීමට අපොහොසත්වීම තුළින් මූල්‍ය කළමනාකරණයක එක් පාර්ශවයක් අනෙක් පාර්ශවයට මූල්‍ය පාඩුවක් ඇති කිරීමේ අවදානමයි.

**ලංකා විදුලිබල මණ්ඩලයේ හා සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගමේ ණය ප්‍රතිපත්තිය පහත දැක්වේ.**

බිල්පත් පියවීම සඳහා තොග පාරිභෝගිකයන්ට දින 15 ක ණය කාලසීමාවක් ලබා දෙන අතර ඉන්පසුව සැපයුම විසන්ධි කිරීමේ නිවිදනයක් නිකුත් කර නිවේදනයේ දින සිට වැඩිමනත් දින 10 ක් ලබා දේ. එයට අවනත නොවන්නේ නම් සැපයුම විසන්ධි කරනු ඇත.

බිල්පත් පියවීම සඳහා සාමාන්‍ය පාරිභෝගිකයන්ට දින 30 ණය කාල සීමාවක් ලබා දෙනු ඇත. මෙයින් අනතුරුව රතු නිවේදනයක් නිකුත් කර වැඩි මනත් දින 10 ක් ලබා දෙයි. දින 40 කින් පසුව එයට අවනත නෙවන්නේ නම් සැපයුම විසන්ධි කිරීම පිණිස විසන්ධි කිරීමේ නියෝගයක් නිකුක් කරනු ඇත.

එක් එක් පාරිභෝගිකයාගේ ණය සුදුසුකම් සැලකිල්ලට ගනිමින් පහසුකම් ලබා දීමට පෙර ණය ලබා දීමේ යෝග්‍යතාවය විශ්ලේෂණය කරනු ලැබේ. සඵල පාලනය හා කාලීනව ණය ආපසු ලබා ගැනීම පිණිස ණයකරුවන්ගේ ණය වටිනාකම් අනුව සිදු කෙරෙන විශ්ලේෂණයකින් ක්‍රියාත්මක කෙරෙන ප්‍රතිඵලදායි ණය පාලන ක්‍රියාවලියක් සමූහය විසින් ක්‍රියාවට නංවා ඇත.

### 40.4 ද්‍රවශීලතා අවදානම

පැන නගින අවස්ථාවන්හිදීම සිය බැඳීම් සපුරාලීම පිණිස ප්‍රමාණවත් මුදල් ප්‍රමාණයක් නොතිබීම නිසා සමූහයේ ද්‍රවශීලතා අවදානම් අවස්ථාවන් ඇතිවේ. ආයෝජක, පාරිභෝගික හා සැපයුම්කරුගේ විශ්වාසය පළුදු වීම තුළින් සමූහයේ තරඟකාරී තත්වය දුර්වල කරමින් ප්‍රමාණවත් ද්‍රවශීලතා සම්පත් නොතිබීම සමූහයේ මෙහෙයුම්වලට අහිතකර බලපෑමක් ඇති කළ හැකිය.

සියලුම ක්ෂේත්‍ර ආවරණය වන උපාය මාර්ගික ක්‍රියාකාරී ප්‍රාග්ධන කළමනාකරණ සැලැස්මක් ක්‍රියාත්මක වන අතර එමගින් ලැබිය යුතු දෑ ඉතා සමීපව අධීක්ෂණය කර කාල පරාසය අවම කර ගැනීමට කටයුතු කෙරේ. විකුණුම්කරුවන් ප්‍රවේශමෙන් අගැයීම හා ප්‍රසම්පාදන උපාය මාර්ග තුලින් ලබා ගැනීම තහවුරු කරනු ලබන අතර උපරිම ණය කාල සීමාවක් ලබාගැනීමෙන් කාරක ප්‍රාග්ධන චක්‍රය ප්‍රශස්ථ මට්ටමට පවත්වා ගැනේ.

මෙහෙයුම් හා වෙනත් මූල්‍යන අවශ්‍යතාවයන් සපුරාලීම පිණිස කෙටි හා මධ්‍ය කාලීන මූල්‍ය උපකරනයන්හි ආයෝජනය කිරීම මගින් සමූහය විසින් සිය ද්‍රවශීලතාවය පවත්වා ගෙන යයි. සහනදායී පොලී අනුපාත මත අයිරා සීමාවන් වැඩි කර ගැනීම පිණිස බැංකුව සමග වන කතිකාවත් තුළින් කෙටි කාලීන ද්‍රවශීලතා ගැටළු ලිහිල් කරගනු ලැබේ. ප්‍රමාණවත් ලෙස ද්‍රවශීලතා වත්කම් නොතිබීම තුලින් සමූහයේ මෙහෙයුම් කටයුතු වලට අහිතකර බලපෑමක් ඇති කල හැකි අතර එමගින් ආයෝජක, පාරිභෝගික හා සැපයුම්කරුවන්ගේ විශ්වාසය පළුදු වී තරඟකාරිත්වය දුර්වල විය හැකිය.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

(සියළුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත)

## 40.5 වෙළඳපල අවදානම

වෙළඳපල අවදානම යනු වෙළඳපල මිල ගණන්වල වෙනස්වීම් නිසා මූල්‍ය උපකරණයක අනාගත මුදල් ප්‍රවාහයන්හි සාධාරණ අගය උච්චාවචනය වීමේ අවදානමයි. වෙළඳපල අවධානම මුදල් අවධානම හා පොළී අනුපාත අවධානමෙන් සමන්විත වේ. වෙළඳපොල අවධානමෙන් බලපෑමට ලක්වන මූල්‍ය උපකරණවලට පොළී සහිත ණය ගැනීම්, තැන්පතු හා විකිණීමට තිබෙන ආයෝජන ඇතුළත් වේ.

### 40.5.1 විදේශීය ව්‍යවහාර මුදල් අවදානම

ව්‍යාපාර සමූහයට අයත් ආයතනයන් හී භාවිතයේ පවත්නා අදාල ව්‍යවහාර මුදල් වලට ඇතුලත් නොවන යම් ව්‍යාවහාර මුදලකින් සිදු කෙරෙන විකුණුම් / මිලදී ගැනීම් වලදී සමූහය ව්‍යවහාර මුදල් අවදානමට අනාවෘතවේ. මෙම ගනුදෙනු ප්‍රධාන වශයෙන් එක්සත් ජනපද ඩොලර් හෝ යුරෝ ව්‍යවහාර මුදල් මගින් නියම කෙරේ. යම් කාලපරාසයක් තුල සිදුවන විනිමය අනුපාත ගනුදෙනුවලට එරෙහිව අභ්‍යන්තර වශයෙන් ආරක්ෂක පියවර ගනිමින් එම ව්‍යාපාර සමූහය විසින් ව්‍යවහාර මුදල් කෙරේ ඇති අවධානම අවම කෙරේ. ගෙවීම් කිරීමට අවශ්‍ය වන එසේ ගෙවීමට සිදුවන විට එම ගෙවීම සිදු කිරීම සඳහා උපයෝගී කර ගැනීම පිණිස අනාගත ගෙවීම් වලට සමාන වන මුදල් ප්‍රමාණයක් කෙටිකාලීන ආදායම් උත්පාදන මෙවලම් වලට යොදනු ලබයි.

### 40.5.2 පොලී අනුපාත අවදානම

පොලී අනුපාත අවදානම යනු වෙළඳපල පොලී අනුපාතයන්හි වෙනස්වීම නිසා මූල්‍ය උපකරණයක අනාගත මුදල් ප්‍රවාහයන්ගේ සාධාරණ අගය උච්චාවචනය වීමේ අවදානමයි. වෙළඳපල පොලී අනුපාතයන් වෙනස්වීමේ අවදානමට සමූහය නිරාවරණය වීම මූලික වශයෙන් අදාළ වන්නේ පාවෙන පොලී අනුපාත සහිත සමූහයේ දීර්ඝ කාලීන ණය බැඳීම්වලටය. සමූහය විසින් ලබා ගන්නා ණය මුදල්වල පොලී අවදානම සමූහය මගින් කළමනාකරණය කරනුයේ, ස්ථාවර හා පාවෙන පොළී අනුපාත වලින් සම්මිශ්‍රණයවූ ණය ලබාගැනීමේ මෙන්ම තැන්පතුද පවත්වා ගෙන යාමෙන් වන අතර එමගින් වෙළඳපොල පොළී අනුපාත උච්චාවචනයෙන් ආවරණය කෙරේ. පොලී අනුපාතයන් අවම කිරීම පිණිස රජයේ ආයතනයක් වශයෙන් ලංකා විදුලිබල මණ්ඩලය විසින් වාසිදායක පොලී අනුපාත සඳහා බැංකුව සමග කතිකාවත් පවත්වයි.

## 41 සධාරණ අගය

වර්ථමාන ගණුදෙනුවකදී මිනුම්කරණ දිනයට පෙළඹවීමකින් හෝ බලහත්කාරයෙන් තොරව කැමැත්තෙන් සිටින පාර්ශ්වයන් අතර මූල්‍ය වත්කම් පැවරීමට හෝ වගකීම් බේරුම් කිරීමට ගෙවන වටිනාකම මගින් මූල්‍ය වත්කම් හා වගකීම් වල සධාරණ අගය සමන්විත වේ.

සාධාරණ අගය තක්සේරු කිරීම සඳහා පහත සඳහන් ක්‍රම සහ උපකල්පන භාවිතා කරන ලදී:

අ) මුදල් හා මුදල් සමාන දෑ, වෙළඳ ලැබිය යුතු, වෙළඳ ගෙවිය යුතු, බැංකු අයිරා සහ අනෙකුත් ජංගම වගකීම් වල පවතින කෙටිකාලිනව කලිපිරීම් ස්භාවය හේතුවෙන් ඒවා ධාරණ අගටය මිනුම් කිරීමට කළමණාකරණය කටයුතු කරන ලදි.

ආ) පොලී අනුපාත, නිශ්චිත අවධානම් සාධක, එක් එක් ගනුදෙනුකරුගේ ණය සුදුසුකම් සහ මූල්‍යනය කරනු ලබන ව්‍යාපෘතියේ අවදානම වැනි සාධක මත පදනම්ව සමූහය විසින් දිගු කාලීන ස්ථාවර අනුපාත යටතේ සහ විචල්‍ය අනුපාත යටතේ ලැබිය යුතු දේ අගය කරනු ලැබිය. එසේ කරනු ලැබූ ඇගයීම මත පදනම්ව ලැබිය යුතු දේවල අපේක්ෂිත අලාභ සඳහා දීමනා සැලකිල්ලට ගනී. ඒ අනුව 2019 දෙසැම්බර් 31 වන විට, එවැනි ලැබිය යුතු දේ, සහ ශුද්ධ දීමනාවල ධාරණ අගය ඒවායේ ගණනය කරන ලද සාධාරණ අගයන්ගෙන් ප්‍රමාණාත්මකව වෙනස් නොවීය.

### 41.1 සධාරණ අගයට මිණුම්කරණය කරන ලද මූල්‍ය කාර්ය සාධනපත්‍ර

සධාරණ අගයට මිණුම්කරණය කරන ලද පහත දැක්වෙන මූල්‍ය කාර්යසාධන පත්‍ර සමූහය සතුවේ

මූල්‍ය වත්කම්

වෙනත් විස්තීරණ ආදායම් යටතේ සධාරණ අගය හදුනා ගනු ලබන මූල්‍ය වත්කම් (සටහන් 15)
ලාභ/ අලාභ ප්‍රකාශය යටතේ සධාරණ අගය හදුනා ගනු ලබන මූල්‍ය වත්කම් (සටහන් 15)

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

(සියළුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත)

## 41.2 සධාරණ අගයට මිණුම්කරණය නොකරන ලද මූල්‍ය කාර්ය සාධනපත්‍ර

මූල්‍ය ප්‍රකාශනයන්හී සාධාරණ අගයට මිණුම්කරණය කර දක්වා නොමැති මූල්‍ය කාර්ය සාධනපත්‍ර වල ධාරණ අගය හා සධාරණ අගය අතර සැසදීමක් පහතින් දක්වා ඇති අතර එහි ධාරණ අගය ආසන්න වශයෙන් සාධාරණ අගයට සමාන වන කාර්ය සාධන පත්‍රවල වල තොරතුරු ඇතුලත් නොවේ. තවද මූල්‍ය නොවන වත්කම් හා වගකීම් වල සාධාරණ අගයද මේ සඳහා සැලකිල්ලට ගෙන නොමැත.

| | ධාරණ අගය | | සාධාරණ අගය | |
|---|---|---|---|---|
| | 2020 | 2019 | 2020 | 2019 |
| ආපසු ගෙවිය යුතු තැන්පතු | 68,675 | 40,739 | 68,675 | 40,739 |
| ස්ථිර තැන්පතුවල ආයෝජන | 28,485,597 | 20,586,151 | 28,485,597 | 20,586,151 |
| ප්‍රති මිලදී ගැනීම්වල ආයෝජන | 199,700 | 303,278 | 199,700 | 303,278 |
| වෙනත් තැන්පතුවල ආයෝජන | 1,759,276 | 2,413,602 | 1,759,276 | 2,413,602 |
| සමාගම් නිලධාරීන්ට ණය | 10,454,647 | 10,714,161 | 10,454,647 | 10,714,161 |
| පාරිභෝගිකයින්ට ණය | 2,771,008 | 4,195,879 | 2,771,008 | 4,195,879 |
| ණයකර සඳහා ආයෝජනය කිරීම | 202,117 | 202,063 | 193,170 | 196,769 |
| | 43,941,020 | 38,455,873 | 43,932,073 | 38,450,579 |

## 41.3 සාධාරණ අගය ධූරාවලිය

ලයිස්තුගත මිළ ගණන් හෝ නිරීක්ෂණය කළ හැකි මිළකරන ක්‍රමයන් භාවිතා කරමින් සාධාරණ අගයන් තීරණය කරනු ලබන සියලුම මූල්‍ය උපකරණ සඳහා ස්වාධීන මිල තීරණය කිරීම් හෝ වලංගු කිරීම් ලබා ගනී. ක්‍රියාකාරී වෙළඳපොලක වෙළඳ මිලක් සෘජුවම නිරීක්ෂණය කළ නොහැකි විය හැකිය. මෙම තත්වයන් තුළ, සමූහය මූල්‍ය උපකරණ වල සාධාරණ වටිනාකම නිර්ණය කිරීම සඳහා වඩාත් අදාළ හා විශ්වාසදායක යැයි සැලකෙන තොරතුරු වලට වැඩි බරක් ලබා දෙමින් විකල්ප වෙළඳපල තොරතුරු භාවිතා කරයි.

පහත දැක්වෙන අනුපිළිවලට සාධාරණ අගය නිර්ණය කරනු ලබයි

**පියවර 1 :** සමාන වත්කම් හෝ වගකීම් සඳහා සක්‍රීය වෙළඳපලවල ලයිස්තුගත මිල ගණන් (සකස් නොකළ)

**පියවර 2 :** වාර්තා කරනු ලබන සාධාරණ වටිනාකම නිරීක්ෂණය කිරීමේදී සෘජුව හෝ වක්‍රව සැලකිය යුතු බලපෑමක් කල හැකි වෙනත් තක්සේරුකරණ ක්‍රම

**පියවර 3:** වාර්තා කරනු ලබන සාධාරණ වටිනාකම නිරීක්ෂණය කිරීමේදී සෘජුව හෝ වක්‍රව සැලකිය යුතු බලපෑමක් කල නොහැකි වෙනත් තක්සේරුකරණ ක්‍රම

2020 දෙසැම්බර් 31 දින වන විට සමූහය විසින් මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය තුල සාධාරණ අගයට හඳුනාගෙන ඇති මූල්‍ය උපකරණ පහත පරිදිවේ.

| සාධාරණ අගයට මිනුම්කරණ ලද වත්කම් | තක්සේරු දිනය | 2020 | පියවර 1 | පියවර 2 | පියවර 3 |
|---|---|---|---|---|---|
| **වෙනත් විස්තීරණ ආදායම් යටතේ සධාරණ අගය හඳුනා ගනු ලබන මූල්‍ය වත්කම්** | | | | | |
| ලයිත්තුගත නොකරන ලද ස්කන්ධ ප්‍රග්ධනය | 31-දෙසැ-2020 | 71 | - | - | 71 |
| **ලාභ/ අලාභ ප්‍රකාශය යටතේ සධාරණ අගය හඳුනා ගනු ලබන මූල්‍ය වත්කම්** | | | | | |
| ප්‍රාග්ධන සුරකුම්පත් වල ආයෝජන | 31-දෙසැ- 2020 | 280,850 | 280,850 | - | - |
| **ක්‍රමක්ෂය පිරිවැය- මූල්‍ය වත්කම්** | | | | | |
| මූල්‍ය කාර්ය සාධනපත්‍ර වල ආයෝජන | 31-දෙසැ-2020 | 30,513,248 | - | - | 30,513,248 |
| පාරිභෝගිකයන්ට හා සේවකයන්ට ලබාදුන් ණය | 31-දෙසැ-2020 | 13,225,655 | - | - | 13,225,655 |
| **සාධාරණ අගය හෙළිදරව් කරන වත්කම්** | | | | | |
| ණයකර වල ආයෝජන | 31-දෙසැ-2020 | 193,170 | 193,170 | - | - |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

(සියළුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත)

**සාධාරණ අගය විස්තීර්ණ ආදායම තුලින් ගලපනු ලබන මූල්‍ය වත්කම් තක්සේරු කිරීමේදී භාවිතා කරනු ලබන වැදගත් නිරීන්ෂණය කල නොහැකි යෙදවුම් පිළිබඳ විස්තර**

**ලංකා විදුලි(පුද්ගලික) සමාගම**

ලයිස්තුගත නොකල කොටස් වල ආයෝජනවල සාධාරණ වටිනාකම වෙළඳපල බහුවිධ ක්‍රමවේදය භාවිතයෙන් තක්සේරු කර ඇත. මෙම ක්‍රමය යටතේ ව්‍යාපාරයේ අපේක්ෂිත අනාගත ඉපයීම් සුදුසු ගුණිතයක් භාවිතයෙන් ගුණකර එය ව්‍යාපාරයේ වටිනාකම ලෙස ප්‍රග්ධණිතකරයි. සමාගම පොළී හා බදු පෙර ලාභය ඉපැයීමේ පදනම ලෙස භාවිතා කරයි. වෙස්ට් කෝස්ට් පවර් (පුද්ගලික) සමාග මේ සාධාරණ වටිනාකම සමාලෝචනය කිරීමේදී එක හා සමාන ව්‍යාපාර ස්භාවයක් ඇති ආයතන අධ්‍යනය කිරීමට අවධානය යොමු කරන ලදී. එහිදී ආසියානු කලාපයේ පොසිල ඉන්ධන භාවිතා කරමින් විදුලිය සැපයීමට සම්බන්ධ ලැයිස්තුගත සමාගම් විශ්ලේෂණය කරන ලද අතර මෙහෙයුම් වල ස්වභාවය සහ ආයතනවල විශාලත්වය මත පදනම්ව මෙම තක්සේරු කරීම් සිදුකරන ලදී.

වෙස්ට් කෝස්ට් පවර් (ප්‍රයිවට්) ලිමිටඩ් හි සුළු කොටස් අයිතියක් පැවතීම හේතුවෙන් කළමනාකරණයට ව්‍යාපාරයේ අභ්‍යන්තර තොරතුරු සඳහා සෘජුවම ප්‍රවේශ විය නොහැක. කෙසේ වෙතත්, කර්මාන්තයේ ස්වභාවය සහ බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුමේ පොදු ලක්ෂණ සලකා බැලීමේදී, වත්කම් හා වගකීම්වල වෙළඳපල වටිනාකම් 2020 දෙසැම්බර් 31 දිනට වාර්තා කර ඇති ධාරණ වටිනාකමට සමාන යැයි උපකල්පනය කෙරේ.

**එල්ටීඑල් හෝල්ඩින්ග්ස් (පුද්) සමාගම**

වට්ටම් කළ මුදල් ප්‍රවාහ ක්‍රමය භාවිතයෙන් ලයිස්තුගත නොකරන ලද සමාන්‍ය කොටස්වල සාධාරණ අගයන් තක්සේරු කර ඇත. තක්සේරු කිරීම සඳහා පුරෝකථනය කල මුදල් ප්‍රවාහ සහ වට්ටම් අනුපාතය ආදිය පිළිබද උපකල්පන කළමණාකරනය විසින් සිදුකරනු ලැබේ. පරාසයක් තුළ ඇති විවිධ ඇස්තමේන්තු වල සම්භාවිතාව සාධාරණ ලෙස තක්සේරු කරමින් කළමනාකරණය ඇස්තමේන්තුගත සාධාරණ ආයෝජනය වටිනාකම් නිර්ණය කරනු ලැබේ.

# විගණකාධිපති වාර්තාව සමූහ මූල්‍ය ප්‍රකාශන

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. පී.ඕ.ඊ/සී/සී.ඊ.බී/සී.එෆ්.ඒ/1/20/11 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2021 සැප්තැම්බර් 15

**සභාපති**
**ලංකා විදුලිබල මණ්ඩලය**

**ලංකා විදුලිබල මණ්ඩලයේ සහ එහි පරිපාලිත සමාගම්වල 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.**

## 1. ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ලංකා විදුලිබල මණ්ඩලයේ ("මණ්ඩලය") සහ එහි පරිපාලිත සමාගම්වල ("සමූහය") 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ. පරිපාලිත සමාගම් වන සී ස එල්.ටී.එල් (පුද්.) සමාගමේ සහ ත්‍රිකුණාමලය බලශක්ති සමාගමෙහි මූල්‍ය ප්‍රකාශන අදාළ පරිපාලිත සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගම් විසින් විගණනය කරන ලදී.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට සමූහයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

#### 1.2.1 ත්‍රිකුණාමලය බලශක්ති සමාගම (ටී.පී.සී.එල්) හි විගණක එහි මූල්‍ය ප්‍රකාශන පිළිබඳව පහත සඳහන් කරුණු අවධාරණය කර ඇත.

සාම්පූර්හි මෙගාවොට් 500 ක ගල් අඟුරු බලාගාරයක් සංවර්ධනය කිරීමේ එකම අරමුණ ඇතිව ක්‍රියාත්මක වූ සමාගම 2016 මුදල් වර්ෂයේදී එම බලාගාරයේ සංවර්ධන කටයුතු නවතා දමා ඇති අතර කලින් ප්‍රාග්ධනීත කළ වියදම් 2018 වර්ෂයේදී කපා හැර ඇත. ඒ වෙනුවට, සාම්පූර්හි ගල් අඟුරු බලාගාරය ඉදිකිරීම සඳහා ලබා දුන් එම ඉඩමේම ටී.පී.සී.එල් විසින් මෙගාවොට් 50 ක සූර්ය විදුලි බලාගාරයක් පිහිටුවීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. තවද, කෙරවලපිටියේ මෙගාවොට් 500 ක එල්.එන්.ජී විදුලි බලාගාරයක් සංවර්ධනය කිරීමට ද අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. කෙසේ වෙතත්, සමාලෝචිත වසර අවසානයේදීත් ඉහත විදුලි බලාගාරවල සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් කිසිදු කටයුත්තක් සිදු කර නොතිබුණි. ඒ අනුව, සමාගමට අඛණ්ඩව පවත්වාගෙන යාමට ඇති හැකියාව පිළිබඳව සැලකිය යුතු සැකයක් මතු කළ හැකි ප්‍රමාණාත්මක අවිනිශ්චිතභාවයක් මෙයින් පෙන්නුම් කෙරේ.

#### 1.2.2 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ පහත සඳහන් සමාගම්වල මූල්‍ය ප්‍රකාශන මත තත්ත්වාගණනය කළ මතය පහත සඳහන් නිරීක්ෂණයන් මත පදනම්ව මා විසින් ප්‍රකාශ කරන ලදී.

**(අ) සී ස ලංකා විදුලි (පුද්.) සමාගම**

(i) එල්.කේ.ඒ.එස් 1 හි 32 ඡේදය අනුව, එස්.එල්.එෆ්.ආර්.එස් මඟින් අවශ්‍ය වුවහොත් හෝ අවසර දුනහොත් හැර සමාගම වත්කම් හා වගකීම් හෝ ආදායම් හා වියදම් හිලව් නොකළ යුතුය. කෙසේවෙතත්,

- සැපයුම්කරුවන්ගෙන් ලද ප්‍රමාද ගාස්තු රු. මිලියන 64.3 ක් සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් වියදම්වලට එරෙහිව හිලව් කර තිබුණි.

# විගණකාධිපති වාර්තාව සමූහ මූල්‍ය ප්‍රකාශන

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

- රු. මිලියන 9 ක් වූ ගනුදෙනුකරුවන්ගේ බැර ශේෂයන් සමාලෝචිත වර්ෂයේ වෙළඳ ලැබිය යුතු දෑවලට එරෙහිව සමාගම විසින් හිලව් කර තිබුණි.
- අත්තිකාරම් ගෙවීමේ හර ශේෂය වූ රු. මිලියන 9.4 ක් සමාලෝචිත වර්ෂයේ විවිධ ණය හිමියන් සහ උපචිත වියදම් වලට එරෙහිව හිලව් කර තිබුණි.

(ii) ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සූර්ය බල සංග්‍රමය ණය සඳහා 2020 දෙසැම්බර් 31 දිනට පොලී වියදම රු. මිලියන 37.4 කින් වැඩියෙන් දැක්වුණි.

(iii) මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2020 දෙසැම්බර් 31 දිනට නුගේගොඩ, මීගමුව සහ ගාල්ල ශාඛාවල කෙරිගෙන යන ප්‍රාග්ධන වැඩවල ශේෂය පිළිවෙලින් රු. මිලියන 215.8 ක්, රු. මිලියන 29.97 ක් සහ රු. මිලියන 77 ක් විය. කෙසේ වෙතත්, කෙරිගෙන යන ප්‍රාග්ධන කාර්යය වාර්තාවට අනුව, ඉහත සඳහන් ශේෂයන් පිළිවෙලින් රු. මිලියන 237.3 ක්, රු. මිලියන 35.3 ක් සහ රු. මිලියන 65.3 ක් විය. ඒ අනුව, ශේෂයන් අතර පිළිවෙලින් රු. මිලියන 21.49 ක, රු. මිලියන 5.3 ක සහ රු. මිලියන 11.9 ක වෙනස්කම් පැවතුණි.

(iv) 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල සහ බිල්පත් ක්‍රමයේ දක්වා ඇති ණය ගැති ශේෂය අතර රු. මිලියන 13.5 ක වෙනසක් පැවතුණි.

(v) කාලීන තැන්පතු සහ ස්ථාවර තැන්පතු සඳහා පොලී ආදායම සමාලෝචිත වර්ෂය තුළදී හඳුනාගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අනෙකුත් මූල්‍ය වත්කම් පොලී ආදායම පිළිවෙලින් රු. මිලියන 136.8 කින් සහ රු. මිලියන 67.9 කින් අඩුවෙන් දැක්වුණි.

(vi) නුගේගොඩ ශාඛාව මඟින් 2020 දෙසැම්බර් 31 දින සිදු කළ රු. මිලියන 6 ක මුදල් තැන්පතුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල බැංකු අයිරාව ලෙස හඳුනාගෙන තිබුණි.

(vii) භාවිතා කිරීමේ අයිතිය සතු වත්කම් සහ භාවිත කිරීමේ අයිතිය සතු වත්කම්වල ක්ෂයවීම් පිළිවෙලින් රු. මිලියන 10 කින් වැඩියෙන් දැක්වුණු අතර රු. මිලියන 5.8 කින් අඩුවෙන් දැක්වුණි.

(viii) සමාලෝචිත වර්ෂයේ ඇන්ටි ලෙකෝ මීටරින් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ් හි ආදායම් බදු වියදම රු. මිලියන 6 ක් විය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී එය සලකා බලා නොතිබුණි.

(ix) භාවිත කිරීමේ අයිතිය සතු වත්කම්වල ක්ෂයවීම් රු. මිලියන 48.7 ක් තොග යටතේ ඇතුළත් කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාලෝචිත වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි.

(x) 2020 වර්ෂයේ මුල් කාර්තුව සඳහා ආරක්ෂිත තැන්පතු වෙනුවෙන් ලද පොලිය රු. මිලියන 8.7 ක් ආයෝජන සඳහා ලැබිය යුතු පොලී යටතේ වැරදි ලෙස සටහන් වී තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාලෝචිත වර්ෂයේ පොලී ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි.

(xi) 2020 දෙසැම්බර් 31 දිනට ලංකා බ්‍රෝඩ් බෑන්ඩ් නෙට්වර්ක් ප්‍රයිවට් ලිමිටඩ් හි සාමාන්‍ය කොටස් සඳහා කරන ලද රු. මිලියන 5 ක ආයෝජනයට අදාළ කොටස් සහතිකයක් හෝ වෙනත් ප්‍රමාණවත් විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය.

**(ආ) සී/ස ලංකා ගල්අඟුරු (පුද්.) සමාගම**

(i) ආදායම් බදු පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (එල්.කේ.ඒ.එස් 12) හි 88 වන ඡේදයට අනුව, 2017/2018 තක්සේරු වර්ෂය සඳහා ආර්ථික සේවා ගාස්තුවට (ඊ.එස්.සී) අදාළ රු. මිලියන 159.54 ක තක්සේරුව සහ ඊට අදාළව පනවන ලද රු. මිලියන 75.46 ක දඩ සම්බන්ධයෙන් කිසිදු හෙළිදරව්වක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල කර නොතිබුණි.

(ii) මණ්ඩලයෙන් ලැබිය යුතු රු. මිලියන 12.07 ක මුදලක්, සමාලෝචිත වර්ෂය අවසානයේදී රු. මිලියන 2.5 ක හර ශේෂයක් සහ 2020.01.01 දිනට රු. මිලියන 4.67 ක ආරම්භක ශේෂයක් පැවති අවිනිශ්චිත ගිණුමක ඇතුළත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී සමාගම විසින් ඉහත සඳහන් අවිනිශ්චිත ගිණුමට කිසිදු හේතුවක් නොමැතිව රු. මිලියන 1.6 ක මුදලක් හර කර තිබුණු අතර රු. මිලියන 3.7 ක මුදලක් බැර කර තිබුණි.

(iii) ගල් අඟුරු ආනයනය කිරීමේදී, ඇත්ත වශයෙන්ම නොදරන ලද රේගු අරමුණු සඳහා වටිනාකම නිශ්චය කිරීමේ සාම්ප්‍රදායික ගැලපීමක් ලෙස රේගුවේදී සියයට 10 ක අංකිත මිලක් (mark-up) වටිනාකමට එකතු කරන ලදී. කෙසේ වෙතත්, සමාගම විසින් රු. බිලියන 3.65 ක් වූ සියයට 10 ක අංකිත මිල ආදායමට එකතු කර තිබූ අතර පසුව සමාගම විසින් ණයගැතියන්ට එය වට්ටමක් ලෙස ලබා දී විකුණුම් පිරිවැයට අය කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, විකුණුම් පිරිවැය හා ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි.

(iv) මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2020.12.31 දිනට මණ්ඩලයෙන් ලැබිය යුතු අවසන් වැට් බද්ද සහ වෙනත් ලැබිය යුතු දෑ හා වෙළඳ ණය ගැතියන්ගෙන් ලැබිය යුතු ශේෂය පිළිවෙලින් රු. මිලියන 197.45 ක් සහ රු. මිලියන 12.07 ක් විය. කෙසේ වෙතත්, එය මණ්ඩලය විසින් තහවුරු කර නොතිබුණි. එම නිසා, විගණනය සඳහා කිසිදු සාක්ෂියක් නොතිබූ හෙයින් වෙළඳ ණයගැති ශේෂයේ නිවැරදි භාවය තහවුරු කර ගැනීමට විගණනයට නොහැකි විය.

# විගණකාධිපති වාර්තාව
# සමූහ මූල්‍ය ප්‍රකාශන

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(v) 2020.12.31 දිනට රු. මිලියන 10.62 ක් වූ දිගු කාලීනව හිඟ ලැබිය යුතු කළමනාකරණ ගාස්තු සඳහා කිසිදු හානිකරණ ප්‍රතිපාදනයක් සමාගම විසින් සලසා නොතිබුණි.

(vi) පවතින ලියකියවිලිවලට අනුව, 2016 සැප්තැම්බර් 19 සිට 2018 අප්‍රේල් 09 දක්වා කාලය තුළ ආනයනය කරන ලද ගල් අඟුරුවල නිවැරදි ගනුදෙනු වටිනාකම ප්‍රකාශයට පත් නොකිරීම මත රු. මිලියන 205 ක දඩ මුදලක් ශ්‍රී ලංකා රේගුවට සමාගම විසින් ගෙවා තිබුණි. 2019 දී ගෙවන ලද දඩ මුදල අදාළ වර්ෂයේ වියදමට ගිණුම්ගත කිරීම වෙනුවට ශ්‍රී ලංකා රේගු වැට් ගිණුමට, වැට් පාලන ගිණුමට සහ සී.එස්.සී.එල් වගකීම් ගිණුමට හර කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් රඳවා ගත් ඉපැයීම් රු. මිලියන 205 කින් වැඩියෙන් දැක්වුණු අතර ශ්‍රී ලංකා රේගු වැට් ගිණුම, වැට් පාලන ගිණුම සහ සී.එස්.සී.එල් වගකීම් ගිණුම පිළිවෙලින් රු. මිලියන 158.19 කින්, රු. මිලියන 39.97 කින් සහ රු. මිලියන 6.8 කින් අඩුවෙන් දැක්වුණි.

(vii) සී.ස ලංකා නැව් සංස්ථාව (සී.එස්.සී.එල්) හරහා සී/ස ටෝරියන් යකඩ හා වානේ සමාගමෙන් (ටී.අයි.එස්.සී.එල්) රු. මිලියන 539.19 ක දිගු කාලීනව හිඟ ලැබිය යුතු ශේෂය අය කර ගැනීමට කටයුතු කිරීමට සමාගම අසමත් වී තිබුණි. 2020.12.31 දිනට ලංකා නැව් සංස්ථාව සිය මූල්‍ය ප්‍රකාශනවල ඉහත ශේෂය ගිණුම් ගත කර නොතිබුණි. ටී.අයි.එස්.සී.එල්/සී.එස්.සී.එල් විසින් මෙම ශේෂය තහවුරු කර හෝ හානිකරණය සඳහා කිසිදු ප්‍රතිපාදනයක් සලසා හෝ නොතිබුණි. එම නිසා, ඉහත ශේෂයේ නිරවද්‍යතාවය සහ පැවැත්ම තහවුරු කර ගැනීමට නොහැකි විය.

(viii) මණ්ඩලයෙන් ලැබිය යුතු රු. මිලියන 578.67 ක් වූ ඊ.එස්.සී ශේෂය, විවිධ ණයගැතියන්ගෙන් රු. මිලියන 18.07 ක්, නෝබල් රිසෝසස් ඉන්ටර්නැෂනල් පී.ටී.ඊ ලිමිටඩ් හි රු. මිලියන 1.1 ක ලැබිය යුතු දෑ, නෝබල් රිසෝසස් ඉන්ටර්නැෂනල් පී.ටී.ඊ ලිමිටඩ් හි රු.මිලියන 85.89 ක වෙළඳ ණය හිමියන් සහ ලිබර්ටි කොමඩිටීස් ලිමිටඩ් වෙතින් ලැබිය යුතු එස්.ජී.එස් ගාස්තුවලින් සියයට 50 ක් වන රු. මිලියන 8.04 ක් තහවුරු කිරීමට අදාළ ශේෂ තහවුරු කිරීම් සහ සාක්ෂි විගණනය සඳහා ලැබී නොතිබුණි.

(ix) ඉදිරි මූල්‍ය වර්ෂය සඳහා ප්‍රවාහන ගාස්තු හා වැට් බදු සඳහා මණ්ඩලය විසින් ගෙවන ලද රු. 285,375,105 ක් වෙන වෙනම හෙළිදරව් කිරීමෙන් තොරව, එය "තාප ගල් අඟුරු නැව්ගත තොගය සඳහා වෙළඳ ණය ගැතියන් (සී.ඊ.බී)" ගිණුමෙන් අඩු කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් "තාප ගල් අඟුරු නැව්ගත තොගය සඳහා වෙළඳ ණය ගැතියන් (සී.ඊ.බී)" සහ මණ්ඩලයෙන් ලැබුණු අත්තිකාරම් රු. මිලියන 285.37 ක් බැගින් අඩුවෙන් දැක්වුණි.

(x) මූල්‍ය ප්‍රකාශනවල වගකීමක් නොමැතිව සමාගම 2019 දී සී.ස ලංකා නැව් සංස්ථාව (සී.එස්.සී.එල්) හරහා මර්කේටර් සිංගප්පූර් ප්‍රයිවට් ලිමිටඩ් වෙත රු. මිලියන 4 ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, සමාගම විසින් මෙම මුදල සී.එස්.සී.එල් ගෙවිය යුතු ශේෂයට වැරදි ලෙස අඩු කර තිබුණි. එම නිසා, වගකීම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි.

(xi) සමාගම විසින් අංක 123 දරන නැව්ගත තොගය සඳහා රේගු වැට් බදු වශයෙන් රු. මිලියන 136.23 ක් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, රේගුවට භාණ්ඩ ප්‍රකාශයට පත් කිරීමේ ලේඛනයට (Cusdec) අනුව තත්‍ය වැට් බදු මුදල රු. මිලියන 106.97 ක් විය. එම නිසා, වැඩිපුර ගෙවන ලද මුදල රු. මිලියන 29.27 ක් විය.

### 1.2.3 මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.3.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (එස්.එල්.ඒ.එස්/ එස්.එල්.එෆ්.ආර්.එස්) සහ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල වීම.

**(අ) මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්ප රාමුව**

(i) සංකල්ප රාමුවේ 4.1 (ආ) ඡේදයට පටහැනිව, මණ්ඩලයේ නිශ්චිත ආදායම් අයිතමයන්හි පිරිවැය සහ ඉපැයීම් අතර සෘජු සම්බන්ධයක් නොමැති සහ වෙනම ආයතනයක පරිපාලන වියදම් වූ රු. මිලියන 43.97 ක වියදමක් මණ්ඩලය සිය ආදායම් ප්‍රකාශනයේ වියදම් ලෙස හඳුනාගෙන තිබුණි.

(ii) 4.3 ඡේදයට පටහැනිව, මණ්ඩලයට ආර්ථික ප්‍රතිලාභ ගලා නොයන සහ වත්කම්වල පාලන බලය හා අයිතිය මණ්ඩලය සතු රු. මිලියන 8 ක් වටිනා වත්කම් වෙනත් ආයතනයක් විසින් ප්‍රයෝජනයට ගෙන තිබුණි.

(iii) වත්කමේ අයිතිය හා සම්බන්ධ ලිපි ලේඛන නොමැති වීම හේතුවෙන් ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල පිහිටි ඉඩමේ අයිතිය තහවුරු කර ගැනීමට නොහැකි විය.

**(ආ) එල්.කේ.ඒ.එස් 2 - තොග සහ එල්.කේ.ඒ.එස් 16 - දේපළ, පිරියත හා උපකරණ**

ඉහත ප්‍රමිතිවල විධිවිධාන අනුව තත්‍ය පිරිවැය යොදා ගැනීම වෙනුවට සිය ප්‍රාග්ධන හා නඩත්තු කාර්යයන්හි පොදු කාර්ය පිරිවැය තක්සේරු කිරීම සඳහා මණ්ඩලය විසින් ප්‍රමිත පිරිවැය ක්‍රමය යොදා ගනු ලබයි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, එකතුව රු. බිලියන 2.61 ක් වූ හිතකර පොදු කාර්ය අනුපාත විචලනයන් මූල්‍ය ප්‍රකාශනවලට ගෙනැවිත් තිබුණි.

එහි ප්‍රතිඵලයක් වශයෙන්, ප්‍රාග්ධන කාර්යයන් සම්බන්ධව ඉහළ මූල්‍ය මැදිහත් වීම හේතුවෙන් මණ්ඩලයේ මෙහෙයුම් ප්‍රතිඵල, වත්කම් සහ ස්කන්ධයට සැලකිය යුතු බලපෑමක් කර ඇත. කෙසේ වෙතත්, එම ප්‍රාග්ධන කාර්යයන්වලට අදාළ අවශ්‍ය තොරතුරු නොලැබීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය.

.

# විගණකාධිපති වාර්තාව
# සමූහ මූල්‍ය ප්‍රකාශන

ජාතික විගණන කාර්යාලය
NATIONAL AUDIT OFFICE
NAOSL

**(ඇ) එල්.කේ.ඒ.එස් 16 - දේපළ, පිරියත හා උපකරණ**

සම්ප්‍රේෂණ අංශයේ රු. 172,019,335,924 ක ස්ථාවර වත්කම් සමාලෝචිත වර්ෂය තුළදී භෞතිකව සත්‍යාපනය කර නොතිබුණි.

**(ඈ) ගිණුම්කරණ ප්‍රතිපත්ති**

මණ්ඩලය විසින් අඛණ්ඩව ප්‍රයෝජනයට ගනු ලබන, සම්පූර්ණයෙන් ක්ෂය වූ ජංගම නොවන වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 2.4.6 (ඉ) සහ 3 (ඇ) සඳහන් පරිදි සමාලෝචනය කර ඉදිරි කාලීනව ගලපා නොතිබුණි. නිදසුනක් වශයෙන්, සම්පූර්ණයෙන් ක්ෂය වූ රු. බිලියන 187.58 ක දේපළ, පිරියත හා උපකරණ තත්‍ය ආයු කාලය තක්සේරු නොකර තවදුරටත් භාවිතා කරමින් සිටියි.

**1.2.3.2 ගිණුම්කරණ අඩුපාඩු**

(අ) රු. මිලියන 189.54 ක හර ශේෂයක් (තොග හිඟය) සහ රු. මිලියන 114.64 ක බැර ශේෂයක් (තොග අතිරික්තය) නිරවුල් නොකර වසරකට වඩා වැඩි කාලයක් තිස්සේ තොග ගැලපුම් ගිණුමේ පැවතුණි.

(ආ) 2010 ඔක්තෝබර් 13 දිනැති කැබිනට් තීරණ අංක 10/2434/423/034 හි අවශ්‍යතාවයන්ට අනුකූලව ලක්විජය බලාගාරය ඉදිකිරීම සඳහා ලබා ගත් රු. බිලියන 159.18 ක් වූ මුළු ණය මුදල ලංකා ගල් අඟුරු සමාගමට (එල්.සී.සී) භාණ්ඩාගාරය විසින් පැවරිය යුතු අතර ණය ගෙවීම සඳහා අවශ්‍ය මුදලට සමාන මුදලක් මණ්ඩලය විසින් එල්.සී.සී වෙත ගෙවිය යුතුය. භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කරන ලද 2014 සැප්තැම්බර් 30 දිනැති අංක PE/EN/CEB/Equity/2014 දරන ලිපිය අනුව, මෙම ණය මණ්ඩලයේ සෘජු ණය ලෙස සැලකිය යුතුය. කෙසේ වෙතත්, කිසිදු උප ණය ගිවිසුමකට මහා භාණ්ඩාගාරය සමඟ එළඹ වී නොමැති වුවත් මහා භාණ්ඩාගාරයෙන් ලබා ගත් ණය ලෙස මණ්ඩලය මෙම ණය වාර්තා කර තිබුණි. එම නිසා, මෙම ණයවල පැවැත්ම සැක සහිත වන අතර මෙම ණය ගෙවීම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම ගණනය කළ නොහැක.

තවද, භාණ්ඩාගාරය විසින් ගෙවනු ලැබූ රු. බිලියන 3.56 ක පොලී ගෙවීම ඇතුළුව රු. බිලියන 20.5 ක සහ රු. බිලියන 3.15 ක පොලී ගෙවීම ඇතුළුව රු. බිලියන 20.54 ක ණය ගෙවීම් පිළිවෙලින් මණ්ඩලයේ ස්කන්ධයට 2019 දී සහ 2020 දී මාරු කර තිබුණි. කෙසේ වෙතත්, ස්කන්ධයට මාරු කරන ලද පොලිය මණ්ඩලය විසින් ආදායම් ප්‍රකාශයට පොලී වියදමක් ලෙස ඇතුළත් කර තිබු අතර එම වියදම මණ්ඩලය විසින් නොදරන ලදී. එම නිසා, 2019 සහ 2020 වසරවල අලාභය පිළිවෙලින් රු. බිලියන 3.56 කින් සහ රු. බිලියන 3.15 කින් වැඩියෙන් දැක්වුණි.

තවද, රජයේ අනුමැතිය සහ ඇපවීම් සහිතව මණ්ඩලයට ලබා දුන් ණයවලට අදාළව ශ්‍රී ලංකා රුපියල නැවත ඇගයීම සම්බන්ධව යම් අලාභයක් හෝ ලාභයක් ලදහොත් එය ඒකාබද්ධ අරමුදලට අය කළ යුතු අතර එම අලාභය හෝ ලාභය රජය විසින් දරනු ලබන බවට 1969 අංක 17 දරන විදුලිබල මණ්ඩල පනතේ 42 (6) වගන්තියේහි සඳහන්ව තිබියේදී මණ්ඩලය විසින් 2019 සහ 2020 වර්ෂයන්හිදී පිළිවෙලින් රු. බිලියන 11.89 ක සහ රු. මිලියන 20.86 ක විනිමය අලාභයක් ආදායම් ප්‍රකාශයට අය කර තිබුණි. එම නිසා, 2019 සහ 2020 වසරවල අලාභය පිළිවෙලින් රු.බිලියන 11.89 කින් සහ රු. මිලියන 20.86 කින් වැඩියෙන් දැක්වුණි.

(ඇ) ව්‍යාපෘති සඳහා 2014 දෙසැම්බර් 31 න් පසුව විදේශ ණයවලින් ලද රු. බිලියන 25.23 ක් මහා භාණ්ඩාගාරයෙන් ලද උප ණය ලෙස මණ්ඩලය විසින් වාර්තා කර තිබුණු අතර මෙම ණය 2014 දෙසැම්බර් 31 න් පසුව භාණ්ඩාගාර මූල්‍ය ප්‍රකාශනවල උප ණය ලෙස හඳුනාගෙන නොතිබුණි. තවද 2015 මාර්තු 18 දින ගත් කැබිනට් තීරණ අංක 15/0228/613/012 ට අනුව මෙම ණය ආපසු ගෙවීම මණ්ඩලය වෙත පවරා තිබුණි. කෙසේ වෙතත්, මෙම ණය සඳහා වාරික ගෙවීම සහ පොලී ගෙවීම මණ්ඩලය විසින් සිදු කර නොතිබුණු අතර වෙන්කිරීමක් හෝ කර නොතිබුණි. එම නිසා, මෙම ණයවල පැවැත්ම සැක සහිත වන අතර, ආපසු ගෙවීමේ කොන්දේසි (වාරික සහ පොලී ගෙවීම) පිළිබඳ මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම ගණනය කළ නොහැක.

(ඈ) කිසිදු උප ණය ගිවිසුමකට මහා භාණ්ඩාගාරය සමඟ එළඹ වී නොමැති වුවත් එකතුව රු. බිලියන 54.71 ක් වූ විදේශ ණය හයක් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල මහා භාණ්ඩාගාරයෙන් ලැබී ඇති ණය වශයෙන් හඳුනාගෙන තිබුණි. එම නිසා මෙම ණය වල පැවැත්ම සැක සහිත වන අතර මෙම ණය ගෙවීම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම ගණනය කළ නොහැක.

(ඉ) 2013 වසරට පෙර රාජ්‍ය ආයතනවලට විදුලි ජනක යන්ත්‍ර, සෝපාන සහ වායුසමීකරණ යන්ත්‍ර සැපයීම, නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කිරීම සඳහා මණ්ඩලය විසින් කරනු ලබු කාර්යයන් ඒවායේ ඉන්වොයිසි වටිනාකම් මත පදනම්ව ගිණුම්ගත කිරීම වෙනුවට, පිරිවැය අනුව තක්සේරු කර තිබු අතර ඒ අනුව ගිණුම්ගත කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ලැබිය යුතු දෑ සහ රඳවාගත් ඉපයීම් රු. මිලියන 66.99 ක් බැගින් අඩුවෙන් දැක්වුණි. මෙම හිඟ ශේෂයන් සහ ඉන්වොයිසි පිළිබඳ පියවීම් විස්තර 2020 දෙසැම්බර් 31 දිනට මණ්ඩලය විසින් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඊ) 2016 වර්ෂයේ බදු ලෙස මහා භාණ්ඩාගාරය වෙත ගෙවනු ලැබූ රු. බිලියන 5 න් රු. මිලියන 500 ක් සමාලෝචිත වර්ෂය තුළදී කළමනාකරණ ගාස්තු ගෙවීම ලෙස ආදායම් ප්‍රකාශනයට ක්‍රමක්ෂය කර තිබුණු අතර රු. බිලියන 1.5 ක් රඳවා ගත් ඉපැයීම් වලට අය කර තිබුණි. ඉතිරි මුදල වන රු. බිලියන 3.0 ක් හිමිකම් ප්‍රකාශනයට අය කිරීම වෙනුවට මූල්‍ය ප්‍රකාශනයේ වෙනත් ණය ගැතියන් ලෙස දැක්වේ. කෙසේ වෙතත්, මණ්ඩලය විසින් මහා භාණ්ඩාගාරයෙන් කළමනාකරණ සේවාවන් ලබාගෙන නොතිබුණි. එම නිසා, වර්ෂයේ අලාභය රු. මිලියන 500 කින් වැඩියෙන් දැක්වුණි.

# විගණකාධිපති වාර්තාව
# සමූහ මූල්‍ය ප්‍රකාශන

(උ) සම්පූර්ණ කරන ලද රු. බිලියන 6.18 ක් වටිනා කාර්යයන් 7,546 ක් බෙදාහැරීම් අංශවල වත්කම්වලට මාරු නොකර කෙරීගෙන යන වැඩ ගිණුමේ පවතී. එම වත්කම්වලට අදාළ ක්ෂයවීම් ආදායම් ප්‍රකාශනයට අය කර නොතිබුණි.

(ඌ) 2012 දී නිම කරන ලද ඉහළ කොත්මලේ ජල විදුලි ව්‍යාපෘතියට අදාළ මුළු පිරිවැය වු රු. මිලියන 979.88 ක් ප්‍රාග්ධනීත කිරීම වෙනුවට කෙරීගෙන යන වැඩ ගිණුමේ තවදුරටත් ඇතුළත් වී තිබුණි. එම නිසා, සමාලෝචිත වර්ෂය සඳහා ක්ෂය වීම සහ රඳවා ගත් ඉපයීම් පිළිවෙලින් රු. මිලියන 27.99 කින් සහ රු. මිලියන 195.98 කින් අඩුවෙන් දැක්වුණි.

(එ) 2014 වර්ෂයේදී නිම කරන ලද පුත්තලම ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතිය සඳහා මිලදී ගත් වාහනවල මුළු පිරිවැය රු. මිලියන 179.19 ක් වු අතර එය ප්‍රාග්ධනීත කිරීම වෙනුවට කෙරීගෙන යන වැඩ ගිණුමේ තවදුරටත් ඇතුළත් වී තිබුණි. එම නිසා, රඳවා ගත් ඉපැයීම් රු. මිලියන 179.19 කින් අඩුවෙන් දැක්වුණි.

(ඒ) කපා හරින ලද ශේෂයන්ට එරෙහිව තොග ගනුදෙනුකරුවන්ගෙන් ලැබුණු එකතුව රු. මිලියන 18.76 ක් වු පොලී ආදායම, වැට් බදු සහ අධිභාර, ණයගැති ගිණුමට බැර කර තිබුණි. එම නිසා ණයගැති ශේෂයන් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි.

(ඔ) වීදි ආලෝකකරණ නඩත්තු වියදම්වලින් අය කර ගත නොහැකි රු. මිලියන 30.56 ක් වෙනුවෙන් මුල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඕ) රු. මිලියන 29.97 ක ගෙවිය යුතු ශේෂය කොළඹ නගර කාර්යාලයේ එකතු කිරීමේ පාලන ගිණුමට වැරදි ලෙස හර කර තිබුණි. එම නිසා ණයගැති ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි.

(ක) සමාලෝචිත වර්ෂයේ ආදායම ලෙස 2021 ජනවාරි 01 සිට 2021 ජනවාරි 15 දක්වා කාලයට අදාළ ආදායම හඳුනාගැනීම හේතුවෙන් විවිධ ණයගැති ශේෂය රු. මිලියන 585.69 කින් වැඩියෙන් දැක්වුණි. එම නිසා, වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි.

(ග) හිමිකම් කිව හැකි කාල සීමාව ඉක්ම වු රු. බිලියන 1.57 ක් වු ආර්ථික සේවා ගාස්තුව (ඊ.එස්.සී) ආදායම් ප්‍රකාශනයට අය කර නොතිබුණි. එම නිසා, අලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි.

(ච) අසාමාන්‍ය බැර ශේෂයන් හිලවු වීම හේතුවෙන් බෙදාහැරීම් අංශවල කෙරීගෙන යන වැඩ ශේෂය රු. මිලියන 52.06 කින් අඩුවෙන් දැක්වුණි.

(ජ) අදාළ වියදම් වලට මාරු නොකර රු. මිලියන 912.69 ක් අවුරුද්දකට වඩා වැඩි කාලයක් තිස්සේ මාර්ගස්ථ තොග ගිණුමේ පවති. එම නිසා, අලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි. තවද, අසාමාන්‍ය බැර ශේෂය වු රු. මිලියන 245.53 ක් මාර්ග ස්ථ තොග ගිණුමේ නිරවුල් නොකර පවති.

(ට) මුල්‍ය ප්‍රකාශනවල වාහන 12 ක වටිනාකම් මඟ හැරීම හේතුවෙන් දේපළ, පිරියත හා උපකරණවල පිරිවැය හා සමුච්චිත ක්ෂය අඩුවෙන් දැක්වුණි.

(ඩ) කැලණිතිස්ස Combined Cycle විදුලි බලාගාරය හා සම්බන්ධ අසම්පූර්ණ වත්කම්වල වියදම් ප්‍රාග්ධනීත කිරීම හේතුවෙන් විදුලි බලාගාරයේ වටිනාකම රු. මිලියන 175.10 කින් වැඩියෙන් දැක්වුණි. තවද මෙම අසම්පූර්ණ වත්කම් සම්බන්ධව ප්‍රාග්ධන වියදම් රු. මිලියන 323.28 ක් සහ ක්ෂයවීම් රු. මිලියන 27.04 ක් සමාලෝචිත වර්ෂය තුළදී ආදායම් ප්‍රකාශනයට අය කර තිබුණි. එම නිසා වර්ෂයේ අලාභය රු. මිලියන 350.32 කින් වැඩියෙන් දැක්වුණු අතර කෙරීගෙන යන වැඩ ශේෂය රු. මිලියන 498.38 කින් අඩුවෙන් දැක්වුණි.

(ණ) 2018 සහ 2019 වර්ෂයන්හි නිම කරන ලද වත්කම්වලට අදාළ ක්ෂයවීම් රු.මිලියන 54.14 ක් සමාලෝචිත වර්ෂය තුළදී ජනන අංශයේ වියදමක් ලෙස හදුනාගෙන තිබුණි. එම නිසා, සමාලෝචිත වර්ෂයේ අලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි.

(ත) 2015 වර්ෂයේ සිට අවසන් නොවී පවතින රු. මිලියන 167.25 ක් වටිනා ව්‍යාපෘති දෙකක් නිරවුල් නොකර කෙරීගෙන යන වැඩ යටතේ පෙන්වයි.

(ද) උපචිත තාප විදුලිය මිලදී ගැනීම්වලට අදාළව කර ඇති අධික ප්‍රතිපාදන හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අලාභය රු. බිලියන 0.99 කින් වැඩියෙන් දැක්වුණි.

(ප) ගිගාවොට් 77.2 ක පුනර්ජනනීය බලශක්ති මිලදී ගැනීම් මඟ හැරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අලාභය රු. බිලියන 1.1 කින් අඩුවෙන් දැක්වුණි.

(බ) 2019 වර්ෂය තුළදී රු. මිලියන 212 ක් වූ ගිගාවොට් 12.2 ක පුනර්ජනනීය බලශක්ති මිලදී ගැනීම් 2020 වර්ෂයේ පුනර්ජනනීය බලශක්ති මිලදී ගැනීමේ ගිණුමට ඇතුළත් කර තිබුණි. එම නිසා වර්ෂයේ අලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි.

(ම) වසර 15 ක කොන්ත්‍රාත් කාලය අවසන් වූ පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදකයින්ගෙන් 2020 දෙසැම්බර් 31 දක්වා පුනර්ජනනීය බලශක්ති මිලදී ගැනීම වෙනුවෙන් ගෙවිය යුතු රු. මිලියන 808 ක් ගිණුම්ගත කර නොතිබුණි. එම නිසා, වර්ෂයේ අලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි.

(ය) මුල්‍ය ප්‍රකාශන වලට අනුව, සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රමාද වී ගෙවීමේ පොලිය රු.මිලියන 2,481 ක් වූ අතර සමාලෝචිත වර්ෂය සඳහා සහතික කරන ලද ප්‍රමාද වී ගෙවීමේ පොලී ගණනය කිරීම්වලට අනුව එය රු. මිලියන 2,885 ක් විය. එම නිසා වර්ෂයේ අලාභය රු. මිලියන 404 කින් අඩුවෙන් දැක්වුණි.

# විගණකාධිපති වාර්තාව
# සමූහ මූල්‍ය ප්‍රකාශන

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ර) අපහරණය කරන ලද රු. මිලියන 14 ක් වු ස්ථාවර වත්කම් සම්ප්‍රේෂණ අංශයේ ස්ථාවර වත්කම්වල තවදුරටත් දැක්වුණි.

(ල) පාර්ශව දෙක අතර ගිවිසුමකට එළඹ වී නොමැතිවීම හේතුවෙන් 2020 මාර්තු මාසයේදී සම්බන්ධිත පාර්ශවයකුගෙන් ලද රු. බිලියන 2 ක ණය මුදලෙහි පැවැත්ම තහවුරු කර ගැනීමට නොහැකි විය. එම නිසා, ණය ආපසු ගෙවීමේදී මූල්‍ය තත්වයට ඇති කරන බලපෑම ගණනය කළ නොහැක.

(ව) ගල් අඟුරු නැව්ගත කිරීමේ ගාස්තු සඳහා රු. මිලියන 63.56 ක ප්‍රතිපාදනයක් මුල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. එම නිසා, එම වර්ෂයේ අලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි.

(ස) මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු වන පරිදි පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ. කෙසේ වෙතත්, මණ්ඩලය විසින් ස්ථාපිත කර ඇති අභ්‍යන්තර පාලනයේ දුර්වලතා හේතුවෙන් 2013 වර්ෂයේ සිට මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩව යළි පිළියෙල කර තිබුණි.

(හ) 2020 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 557.94 ක හර ශේෂයක් සහ රු. මිලියන 556.81 ක බැර ශේෂයක් 2002 වර්ෂයේ සිට නිරවුල් නොකර අන්තර් අංශවල ජංගම ගිණුමේ ශේෂයන් ලෙස පැවතුණි.

(ළ) ආදායම් ප්‍රකාශනයට අයකිරීම වෙනුවට රු. මිලියන 1.25 ක ණය සැකසුම් ගාස්තුවක් ණය ශේෂයට අය කර තිබුණි. එම නිසා, සමාලෝචිත වර්ෂයේ අලාභය සහ ණය ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි.

### 1.2.3.3 නොසැසඳු වෙනස්කම්

(අ) 2020 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ගෙවිය යුතු ලෙස දක්වා ඇති ශේෂය සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවල එදිනට ලැබිය යුතු ලෙස දැක්වෙන ශේෂය අතර රු. මිලියන 753.61 ක වෙනසක් නිරීක්ෂණය විය. තවද, මෙය 2013 සිට අඛණ්ඩව විගණන වාර්තාවල අවධාරණය කර තිබියෙදීත් 2020 දෙසැම්බර් 31 දින වන විටත් මෙම ආරවුල නිරවුල් කර නොතිබුණි.

(ආ) බිල්පත් ක්‍රමයේ මෙන්ම මුල්‍ය ප්‍රකාශනවලද යම් යම් ශේෂයන් මඟහැරීම හේතුවෙන් බෙදාහැරීම් අංශ 01, 02, 03 සහ 04 හි බිල්පත් ක්‍රමයේ දක්වා ඇති 2020 දෙසැම්බර් 31 දිනට තොග වෙලඳ ණයගැතියන්ගේ ශේෂයන් සහ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති අනුරූප ශේෂයන් අතර එකතුව රු. මිලියන 41.18 ක් වූ එකඟ නොවූ වෙනස්කම් නිරීක්ෂණය විය. තවද, 2012 වසරේ සිට හඳුනා නොගත් රු. මිලියන 423.76 ක ශේෂයක් පවතී.

(ඇ) 2020 දෙසැම්බර් 31 දිනට එකතු කිරීමේ පාලන ලෙජර් ගිණුමේ හර සහ බැර වශයෙන් පවතින රු. මිලියන 2,343 ක සහ රු. මිලියන 149 ක ශේෂය සංසන්ධනය කිරීම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එම නිසා, එකතු කිරීමේ පාලන ගිණුමේ ඇති ශේෂයේ නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය.

(ඈ) ශේෂයේ ස්වභාවය හඳුනා ගැනීම සඳහා රු. මිලියන 117.58 ක අවිනිශ්චිත ශේෂයට අදාළ විස්තරාත්මක ලේඛනයක් සහ වයස් විශ්ලේෂණයක් ඉදිරිපත් කර නොතිබුණි.

(ඉ) මණ්ඩලය විසින් පාරිභෝගිකයා සඳහා වැරදි ගාස්තු ක්‍රමයක් යෙදීම හේතුවෙන් 2019 සිට රු. මිලියන 38.76 ක් අයවිය යුතුව පවතී.

(ඊ) ස්වාධීන තාප බලශක්ති නිෂ්පාදකයින්ට ගෙවිය යුතු මුදලට අදාළව මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ශේෂය සහ නොපිය වු සහතික කළ ඉන්වොයිසිවල එකතුව අතර රු. බිලියන 5.9 ක වෙනසක් නිරීක්ෂණය විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු වන පරිදි පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

# විගණකාධිපති වාර්තාව
# සමූහ මූල්‍ය ප්‍රකාශන

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමූහය විසින් සමූහයේ වාර්ෂික සහ කාලීන ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බැවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයක් අනාවරණය කර නොගැනීම මඟින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, වරදවා දැක්වීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- සමූහයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ කළමනාකරණය විසින් කරන ලද ගිණුම්කරන ඇස්තමේන්තුවල සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව අඛණ්ඩ පැවැත්ම පදනම් කරගත් ගිණුම්කරණය පිළිබඳ කළමනාකරණයේ යොදාගැනීම පිළිබඳ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත සමූහයේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- හෙළිදරව් කිරීම් ඇතුළත් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

## 2.1 මණ්ඩලය විසින් සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන් වලින් බැහැරව ඉටු කරන කාර්යයන්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ

- මාගේ වාර්තාවේ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණි.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (සසස) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.
- විගණන නිරීක්ෂණ ඡේද අංක 1.2.1, 1.2.2 (ආ) - (සසස), (ඩස), (ඩසස), (ඩසසස), 1.2.3.1 (අ) - (ස), (සස), (ආ), (ඇ), 1.2.3.2 (අ), (ආ), (ඈ), (ඉ), (ඊ), (උ), (ඌ), (එ), (ස), (හ), 1.2.3.3 (අ), (ආ), (ඇ) සහ (ඈ) හැර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න**
විගණකාධිපති

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු

**2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය අනුව 2020 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ සහ එහි පරිපාලිතයන්ගේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්ථාවට පිළිතුරු**

**1. ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්වාගණනය කල මතය**

දැන ගැනීම සඳහා

**1.2 තත්වාගණනය කල මතය සඳහා පදනම**

**1.2.1 ත්‍රිකුණාමලය බලශක්ති සමාගමේ (ටීපීසීඑල්) විගණක එහි මූල්‍ය ප්‍රකාශන තුල පහත සඳහන් කරුණු අවධාරණය කර ඇත. සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව ගැන සැලකිය යුතු සැකයක් ඇති කළ හැකිය.**

2018 මැයි මාසයේදී මෙගාවොට් 50 ක සූර්ය බලශක්තියක සහ මෙගාවොට් 500 එල්එන්ජී බලාගාර සංවර්ධනය කිරීමට කැබිනට් අනුමැතිය ලබා දෙන ලදී. සාම්පූර්හි ගල් අඟුරු බලාගාරය සඳහා වෙන් කර ඇති භූමියේ ටීපීසීඑල් විසින් මෙගාවොට් 50 ක සූර්ය බලශක්ති බලාගාරයක් සංවර්ධනය කිරීමට තීරණය කර ඇත.එන්ටීපීසී සහ විදුලිබල මණ්ඩලය විසින් කොටස් දායකය 50:50 ලෙස පිහිටුවන ලද නව හවුල් ව්‍යාපාරයක් මඟින් කෙරවලපිටියේ මෙගාවොට් 500 ක එල්එන්ජී බලාගාරය වැඩි දියුණු කිරීම සඳහා ද අනුමැතිය හිමිවී ඇත.

පසුගිය කාලය තුළ ටීපීසීඑල් හි පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී එකී කරුණු අඛණ්ඩව සාකච්ඡා වූ අතර ටීපීසීඑල් මඟින් සූර්ය බලශක්ති ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ටීපීසීඑල් හි සාංගමික සංස්ථාවලිය සංශෝධනය කිරීමට මණ්ඩලය තීරණය කළ අතර සූර්ය බලශක්තිය වැඩි දියුණු කිරීම සඳහා 2021 දී ලංවිම සහ එන්ටීපීසී අතර හවුල් ව්‍යාපාර ගිවිසුම අත්සන් තැබීමට මණ්ඩලය අවශ්‍ය පියවර ගනිමින් සිටී. කෙසේ වෙතත්, හවුල් ව්‍යාපාර ගිවිසුම අත්සන් කිරීමට පෙර අවශ්‍ය නීතිමය අවසරය නීතිපතිගෙන් ලබා ගත යුතුය.

ලංවිම සහ එන්ටීපීසී අතර පැවති සාකච්ඡා මාලාවකින් පසුව දෙපාර්ශවයම කෙරවලපිටියේ එල්එන්ජී බලාගාරය සංවර්ධනය කිරීම සඳහා 2019 ඔක්තෝබර් 25 දින හවුල් ගිවිසුමක් අත්සන් කළහ. 2021 ජූලි මාසයේදී සාංගමික සංස්ථාවලිය සඳහා නීතිපති අවසරය ලැබුණි

කොවිඩ් 19, හි බලපෑම හේතුවෙන් අද වන විට සාකච්ඡා වල ප්‍රගතිය අත්හිටුවා ඇත.කෙසේ වෙතත් යෝජිත ව්‍යාපෘති ඉදිරි කාල සීමාව තුළදී ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නා බව ටීපීසීඑල් අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහසයි.

**1.2.2 පහත සඳහන් නිරීක්ෂකණයන් මත පදනම්ව 2020 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා පහත සඳහන් සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ තත්වාගණනය කල මතය ප්‍රකාශ කර තිබුණි.**

**(අ) ලංකා විදුලි (පුද්) සමාගම**

**(i) ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත අංක 01 හි 32 වගන්තිය අනුව SLFRS මඟින් අවශ්‍ය වුවහොත් හෝ අවසර දුන්නේනම් හැර සමාගම වත්කම් හා වගකීම් හෝ ආදායම් හා වියදම් පියවා නොගත යුතුය.**

**සැපයුම් කරුවන්ගෙන් ලැබුණු ප්‍රමාද ගාස්තු රුපියල් 64,314,868 ක් මෙහෙයුම් වියදම් වලින් පියවා ඇත**

ප්‍රමාද ගාස්තු වරින් වර විශ්ලේෂණය කර මිලදී ගැනීමේ වලට එරෙහිව කපා හැරීම වෙනුවට එම ගාස්තු වෙනත් ආදායමක් ලෙස ඉදිරිපත් කිරීමට අනාගතයේ දී පියවර ගනු ලැබේ.

**සමාගමට ලැබිය යුතු වෙළඳ ණය ගැතියන්ගෙන් පාරිභෝගිකයන්ගේ බැර ශේෂයන් රුපියල් 9,174,474 කපා හැර තිබීම .**

මූල්‍ය ප්‍රකාශනවල බැර ශේෂයන් වෙන වෙනම දැක්වීම ප්‍රයෝගික නැත. ණය ගැතියන්ගේ මුළු වටිනාකම හා සසඳන විට ගෙවිය යුතු බැර ශේෂයේ වටිනාකම ප්‍රමාණාත්මක නොවේ.

පාරිභෝගිකයින් විසින් ගෙවනු ලබන සූර්ය බල ණය වාරික මෙම බැර ශේෂයන් සඳහා ප්‍රධාන හේතුවයි.ගිවිසුමට අනුව මෙම ණය ගෙවිය යුත්තේ නිශ්චිත දිනයන්හිදී වුවත් පාරිභෝගිකයින් එය විවිධ දිනයන්හිදී ගෙවනු ලබයි.එම නිසා බිල්පත් පද්ධතියට මෙය හඳුනා ගැනීමට නොහැකිය.මෙම නිශ්චිත දින වලට පසුව ගෙවීම් ක්‍රමයේ ඇතුළත් කිරීමට අපි පියවර ගන්නෙමු.

කෙසේ වෙතත්, බැර ශේෂයන් හඳුනා ගැනීම සඳහා සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව වෙත ගෙවීම් කිරීම සඳහා බිල්පත් පද්ධතිය තුලින් වරින් වර වාර්තා කිහිපයක් උත්පාදනය කර ගන්නා අතර එමඟින් ජාතික ඉතිරිකිරීමේ බැංකුව වෙත ගෙවීම් සිදු කරයි.

**අත්තිකාරම් ගෙවීමේ හර ශේෂය රු. 9,385,853 ක් විවිධ ණය හිමියන් සහ උපචිත වියදම් වලට එරෙහිව පියවා ඇත**

ණය හිමියන්ගේ හර ශේෂයක් පෙන්නුම් කෙරෙනුයේ රුපියල් 8,772,473 ක ණයවර ලිපි වටිනාකමක් 2020.12.31 දිනට ගිනුම් පද්ධතියට ඇතුලත් කර නොතිබීම හේතුවෙනි

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු

**(ii) ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ සූර්ය බලසංග්‍රමය ණය සඳහා ගෙවිය යුතු පොළී වියදම 2020 දෙසැම්බර් 31 දින වන විට රුපියල් 37,420,500 කින් අධිතක්සේරුවී තිබීම.**

අදහස් දැක්වීමට එකඟවන අතර 2021 වර්ෂයේදී නිවැරදි කරනු ඇත

**(iii) 2020 දෙසැම්බර් 31 දින වන විට නුගේගොඩ, මීගමුව සහ ගාල්ල ශාඛා වල කෙරීගෙන යන වැඩ වල ප්‍රගතිය පිළිවෙලින් රුපියල් 215,834,467, රුපියල් 29,970,666 සහ රුපියල් 77,226,400 ක් විය. කෙසේ වෙතත්, ක්‍රියාත්මක වෙමින් පවතින ප්‍රාග්ධන කාර්ය වාර්තාවට අනුව, ඉහත සඳහන් ශේෂයන් පිළිවෙලින් රුපියල් 237,329,923, රුපියල් 35,308,618 සහ රුපියල් 65,301,260 ක් විය. ඒ අනුව, ශේෂයන් අතර පිළිවෙලින් රුපියල් 21,495,456, රුපියල් 5,337,952 සහ රුපියල් 11,925,140 ක වෙනස්කම් තිබුණි**

2016 දී ප්‍රොන්ටෝ පද්ධතියේ පෙර පිටපතෙන් සටහන් කිහිපයක් සංක්‍රමණයවී ඇත. එසේම කාර්යය පිරිවැය මොඩියුලයේ සමහර කාර්යයන් ඇතුළත් කිරීම් අනුපිටපත් කර ඇති බව සොයා ගන්නා ලදී. මෙම පරතරයට හේතුව මෙය විය හැකිය. ප්‍රොන්ටෝ පද්ධති සේවා සැපයුම්කරු සමඟ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව මේ පිළිබඳව සොයා බලමින් සිටී.

**(iv) 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන සහ බිල්පත් ක්‍රමයේ දක්වා ඇති ණය ගැතියන්ගේ ශේෂයේ වෙනස රුපියල් මිලියන 13.5 කි.**

කරුණු දැක්වීම නිරීක්ෂණය විය. මෙම ශේෂය 2016 වර්ෂයේදී ප්‍රොන්ටෝ පද්ධති සංක්‍රමණය වීමත් සමඟ මෙය දිස්වේ. මෙම කරුණ විගණන කාරක සභා රැස්වීමේදී සාකච්ඡා කෙරෙන අතර නිවැරදි කිරීම් ඒ අනුව සිදු කෙරේ.

**(v) කාලීන තැන්පතු සහ ස්ථාවර තැන්පතු සඳහා පොලී ආදායම පිළිවෙලින් රුපියල් මිලියන 136.8 ක් සහ රුපියල් මිලියන 67.9 ක් සමාලෝචිත වර්ෂයේදී ගිණුම් පොත් වල හඳුනාගෙන නොමැත**

නිරීක්ෂණය කර ඇති අතර 2021 වර්ෂය තුළදී අවශ්‍ය ගැලපීම් සිදු කරනු ඇත

**(vi) මුදල් තැන්පතු රුපියල් මිලියන 6 ක් බැංකු අයිරා ලෙස හඳුනාගෙන තිබීම**

2021 මාර්තු මාසයේ ගිණුම් පොත්වල නිවැරදි කරන ලදී.

**(vii) භාවිතා කිරීමේ අයිතිය සහිත වත්කම් වල වටිනාකම සහ එම වත්කම් මත වන ක්ෂය අගය පිළිවෙලින් රුපියල් මිලියන 10 කින් අධිතක්සේරු වී ඇති අතර රුපියල් මිලියන 5.8 කින් අවතක්සේරු වී ඇත.**

විදුලි (පුද්) සමාගම විසින් මාසික කුලී පදනම මත ලබා ගත් ඉඩම් සහ ගොඩනැගිලි සඳහා අත්සන් කරන ලද කුලී ගිවිසුමට අනුව මෙම වත්කම් හා ණය වගකීම් නිර්මාණයවී ඇත. මෙම ගණනය කිරීමේ පරතරය පැන නැගුනේ වර්තමාන වර්ෂයට සාපේක්ෂව පසුගිය වර්ෂයේ අපේක්ෂිත කල්බදු කාල තක්සේරුව වෙනස් වීම තුලින් පැනනැගුනු ශුද්ධ වර්ථමාන වටිනාකමේ වෙනස්කම් වල ප්‍රතිඵලයක් ලෙසය. 2021 වර්ෂයේදී ගණනය කිරීම් නැවත සලකා බලා අදාළ ගැලපීම් ගිණුම් පොතේ සිදු කරන්නෙමු.

**(viii) සමාලෝචිත වසරේ ඇන්ටි ලෙකෝ මීටර් (පුද්ගලික) සමාගමේ ආදායම් බදු පිරිවැය රුපියල් මිලියන 6 ක් වූ අතර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී එය සැලකිල්ලට ගෙන නොමැත**

සටහන් කර ඇති අතර අවශ්‍ය නම් 2021 වර්ෂය තුළදී ගැලපීම් සිදු කරනු ඇත

**(ix) මිලියන 48.7 ක් වූ භාවිතයට ගැනීමට හිමිකම් ඇති වත්කම් වල ක්ෂය අගය තොග වල ඇතුළත් කර තිබුණි**

භාවිතය සදහා හිමිකම් ඇති වත්කම් ක්ෂය වීම සම්බන්ධ ගිණුම්කරණ සටහන් නිසි පරිදි අදාල ගිණුම් වලට ඇතුළත් කරන ලදි. කෙසේ වෙතත්, මූල්‍ය ප්‍රකාශන අතින් සකස් කිරීමේදී මෙම ගිණුම් කේත වැරදි ලෙස තොග ශේෂයට අනුරූපනය වී ඇත. මෙම වැරැද්ද 2021 දී නිවැරදි කරනු ඇත.

**(x) ආරක්ෂිත තැන්පතු සඳහා ලද පොලී රුපියල් මිලියන 8.7 ක් ආයෝජන සඳහා ලැබිය යුතු පොලී ලෙස වැරදි ලෙස සටහන් වී තිබුණි.**

අවශ්‍ය ගැලපීම් 2021 වර්ෂයේදී සිදු කෙරේ

**(xi) 2020 දෙසැම්බර් 31 දින වන විට ලංකා බ්‍රෝඩ් බෑන්ඩ් නෙට්වර්ක් පුද්ගලික සමාගමේ සාමාන්‍ය කොටස් වල කරන ලද රුපියල් 5,000,000 ක ආයෝජන වටිනාකම තහවුරු කර ගැනීම සඳහා කොටස් සහතිකයක් හෝ වෙනත් ප්‍රමාණවත් විගණන සාක්ෂි ලබා ගත නොහැක.**

ආයෝජනයට අදාළ කොටස් සහතික ලබා දෙන ලෙස සමාගම විසින් ඉල්ලීම් කිහිපයක් ඉදිරිපත් කළද යහපත් ප්‍රතිචාරයක් නොලැබුනු බැවින් මෙම ශේෂය අය කර ගැනීම සඳහා විදුලි (පුද්) සමාගම නීතිපති දෙපාර්තමේන්තුවෙන් නීති උපදෙස් පතයි.

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු

**(ආ) ලංකා ගල් අඟුරු (පුද්) සමාගම**

**(i) ආර්ථික සේවා ගාස්තුවට (ESC) රුපියල් මිලියන 159.5 ක තක්සේරුව සහ ඒ සඳහා දඩ මුදල් රුපියල් මිලියන 75.46 ක් සම්බන්ධයෙන් කිසිදු හෙළිදරව්වක් කර නොමැත.**

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ආර්ථික සේවා ගාස්තුවට පියවීම දීර්ඝ කරන ලෙස ඉල්ලා ලිපියක් යවා ඇති අතර, සමාගමෙන් එකඟතා ගිවිසුමක් ඇති කර ගන්නා තුරු කිසිදු අයකර ගැනීමේ පියවරක් හෝ සමාගමට එරෙහිව කිසිදු ගාස්තු පැනවීමක් සිදු නොකරන ලෙසද ඉල්ලීමක් කළේය.

**(ii) සමාලෝචනය කළ වර්ෂය අවසානයේදී රුපියල් මිලියන 2.5 ක හර ශේෂයක් සහ 2020.01.01 වන විට ආරම්භක ශේෂය රුපියල් මිලියන 4.6 ක් ලෙස දැක්වෙන අවිනිශ්චිත ගිණුමක විදුලිබල මණ්ඩලයෙන් ලැබිය යුතු රුපියල් මිලියන 12.07 ක මුදලක් ඇතුළත් වේ. සමාලෝචනය කරන ලද වර්ෂය තුළදී සමාගම කිසිදු හේතුවක් නොමැතිව ඉහත ගිණුමට හර සහ බැර සටහන් ඇතුළත් කර ඇත**

අභ්‍යන්තර විගණන වාර්තාවල හඳුනාගත් දෝෂ නිවැරදි කිරීම සඳහා ඉහත ගිණුම් සටහන් යොදා ඇත.

**(iii) ගල් අඟුරු ආනයනයේදී රේගු වටිනාකම තහවුරු කර ගැනීම සඳහා සත්‍ය වශයෙන්ම නොදැරූ නාමමාත්‍ර වටිනාකමක් ඇතුළත් කිරීම සහ එම වටිනාකම සමාගමේ ආදායමට හා විකුණුම් පිරිවැයට ඇතුළත් කර තිබීම**

විදුලිබල මණ්ඩලයට වැට් බදු ඉන්වොයිසි නිකුත් කිරීමේදී, රේගු ආන්තිකය පිරිවැය සඳහා එකතු කරන ලෙස දේශීය ආදායම් දෙපාර්තමේන්තුව "(අයිආර්ඩී)" විසින් එල්සීසී වෙත නියෝගයක් ලබා දී ඇත. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු සමග 2018 ජූනි 28 දින අමාත්‍යාංශයේ පැවති රැස්වීමකින් අනතුරුව මෙම මිලකරණ යාන්ත්‍රණය සම්මත කරන ලදී. ලංකා විදුලිබල මණ්ඩලයට ඉන්වොයිසි වල වැට් බද්ද සඳහා එල්සීසී හි මූලික අගය රේගු අවශ්‍යතා සඳහා වන වටිනාකමට වඩා අඩු විය නොහැකි බව දේශීය ආදායම් බදු නිළධාරියා වාර්තා කරන ලදී.එබැවින් 10% ක ආන්තිකය එකතු කරනු ලබන්නේ දේශීය ආදායම් බදු නිලධාරියාගේ නියෝගය මත පමණි. එතැන් සිට විදුලිබල මණ්ඩලය එම නියෝගය අභියෝගයට ලක් කර ඇති අතර 2018-09-07 දිනැති ලිපියෙන් දේශීය ආදායම් බදු දෙපාර්තුමේන්තුව වෙත ලිඛිතව පිළිතුරු ලබා දී ඇත.එවැනි පසුබිමක් තුල ඉන්වොයිසිය සඳහා 10% රේගු ආන්තිකය එකතු කළ නමුත් වැඩිපුර ඇති නිමවුම් බදු දේශීය ආදායම් බදු දෙපාර්තුමේන්තුව වෙත නොයවනු ඇත.

**(iv) වැට් බදු, අනෙකුත් ලැබිය යුතු සහ වෙළඳ ණය ගැතියන්ගෙන් ලැබිය යුතු පිළිවලින් රුපියල් මිලියන 197.45 ක් සහ රුපියල් මිලියන 12.07 ක් වන ශේෂයන් 2020.12.31 දිනට ලංකා විදුලිබල මණ්ඩලය විසින් තහවුරු කර නොතිබීම.**

**විදුලිබල මණ්ඩලයෙන් ලැබිය යුතු අවසාන වැට් බද්ද සහ වෙනත් ලැබිය යුතු වටිනාකම රුපියල් 197,452,711.**

ශ්‍රී ලංකා රේගුව විසින් කරන ලද විමර්ශනයට අනුව, ලංකා ගල් අඟුරු සමාගම විසින් 2016/09/19 සිට 2018/04/09 දක්වා කාලය තුළ ආනයනය කරන ලද ගල් අඟුරු වල නිවැරදි ගනුදෙනු වටිනාකම සඳහන් කර නැත.එල්සීසී සහ ලංවිම නිලධාරීන් විසින් රේගු නිලධාරීන්ගේ උපදෙස් පරිදි ගෙවිය යුතු වැට් බදු ගණනය කර ඇති අතර එමගින් නැවිගත කිරීම බාන්ඩ 123 සිට 154 දක්වා රුපියල් 195,780,909 ක් ගෙවිය යුතුය.එයට අමතරව එම නැවිගත කිරීම් වලට අදාළ විනිමය අලාභය සඳහා රුපියල් 1,671,802 ක් ගෙවීමට එල්සීසී ඉල්ලා සිටියේය.මේ වන විට, ඉහත සඳහන් වැට් බදු ගෙවිය යුතු ශේෂය අනාගත පියවීම් සඳහා තවදුරටත් විශ්ලේෂණය කෙරේ.

**ලංවිම වෙළඳ ණයගැතියන්ගේ සාරාංශය - වාෂ්ප ගල් අඟුරු රු. 12,073,788 පහත දක්වා ඇත**

- විදුලි බල මණ්ඩලයෙන් ලැබිය යුතු රුපියල් 2,563,287 : 2017 දී ලංවිම සමඟ ගිණුම පියවීමෙන් පසු ඉතිරි වූ මුදලකි. මූලාශය/මූලාරම්භය සොයා ගැනීම සඳහා තවදුරටත් විමර්ශනය කෙරේ.
- වෙළඳ ණය (ලංවිම) වාෂ්ප ගල් අඟුරු රු. 7,750,000: ලංවිම වෙනුවෙන් මර්කේටර් වෙත ගෙවූ මුදල වේ.මූලාශය/මූලාරම්භය තහවුරු කිරීම සඳහා සලකා බලනු ලැබේ
- විදුලි බල මණ්ඩලයෙන් ලැබිය යුතු අනෙකුත් ලැබීම් රු.1,760,500 : 2017 දී ලංවිම සමඟ ගිණුම පියවීමෙන් පසු ඉතිරි වූ මුදලකි. මූලාශය/මූලාරම්භය සොයා ගැනීම සඳහා තවදුරටත් විමර්ශනය කෙරේ.

**(v) වසර 3 ක් තිස්සේ පැවත එන ලැබිය යුතු කළමනාකරණ ගාස්තු වන රුපියල් 10,624,394 ක් සඳහා හාණිකරන අලාභ වෙනුවෙන් කිසිදු ප්‍රතිපාදනයක් 2020.12.31 දින වන විට හඳුනා ගෙන නොමැත.**

ලංකා ගල් අඟුරු සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ලබා ගැනීමෙන් පසු ගැටළුව විසඳනු ඇත

**(vi) 2016 සැප්තැම්බර් 19 සිට 2018 අප්‍රේල් 09 දක්වා කාලය තුළ ආනයනය කරන ලද ගල් අඟුරු වල නිවැරදි ගනුදෙනු වටිනාකම ප්‍රකාශ නොකිරීම මත දඩ මුදල රු.205,000,000 කි**

ශ්‍රී ලංකා රේගුව විසින් කරන ලද පරීක්ෂණ වලට අනුව, ලංකා ගල් අඟුරු සමාගම විසින් 2016/09/19 සිට 2018/04/09 දක්වා කාලය තුළ ආනයනය කරන ලද ගල් අඟුරු වල නිවැරදි ගනුදෙනු වටිනාකම් ප්‍රකාශයට පත් කර නොමැත.එම කාලය තුළදී රේගු ප්‍රකාශනය පිළියෙල කිරීම ලංකා නැව් සංස්ථාව විසින් එක් නැව්ගත කිරීමකට රු .1,000,000/- අය කරමින් මුළුමනින්ම හසුරුවන ලද අතර, ඉහත සඳහන් වැරදි ප්‍රකාශය හේතුවෙන් රේගුව විසින් එල්සීසීය වෙත රු. 205,000,000/- ක දඩ මුදලක් නියම කරන ලදී. මෙම ගෙවීමෙන් පසු වෙනත් කිසිදු වැට් බදු ගෙවීමක් සිදුකිරීමට අවශ්‍ය නොවන බව රේගුව විසින් එල්සීසී නිලධාරීන්ට දැනුම් දී තිබුණි.

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු

එවකට එල්සීසී විසින් ඉහත සඳහන් නැව්ගත කිරීම් සඳහා අවසන් වැට් බදු වශයෙන් රුපියල් 37,594,744 ක් ශ්‍රී ලංකා රේගුවට ගෙවා තිබූ අතර නැව්ගත කිරීමේ නිෂ්කාශනය රේගුව විසින් අත්හිටුවීම හේතුවෙන් විදුලිබල මණ්ඩලය විසින් ලබා දුන් අරමුදල් භාවිතා කර රුපියල් මිලියන 205 ක මුදලක් ගෙවීමට එල්සීසීට සිදුවිය .

**(vii) ලංකා නැව් සංස්ථාව (සීඑස්සීඑල්) හරහා ටෝරියන් යකඩ හා වානේ සමාගමෙන් (ටීඅයිඑස්සීඑල්) රුපියල් මිලියන 539.19 ක ලැබිය යුතු ශේෂය දිගු කාලයක් ගතවුවද අය කර ගැනීමට සමාගම කටයුතු කර නැත.**

ටෝරියන් යකඩ හා වානේ පියවීම උසස් මට්ටමේ කමිටුවක් විසින් මෙහෙයවනු ලැබීය. ණය අයකරගත නොහැකි බවට කමිටුව අදහස් දක්වා නැති අතර ගල් අඟුරු සැපයීමෙන් හිඟ මුදල් පියවීමට ගැනුම්කරු පවා එකඟ වී තිබේ.අප සතුව ඇති තොරතුරු වලට අනුව, නිරවුල් කිරීමේ යෝජනාව කැබිනට් මණ්ඩල තීරණය සඳහා ඉදිරිපත් කර ඇත.ලංකා නැව් සංස්ථාවෙන් (ටෝරියන් යකඩ හා වානේ සමාගම) ලැබිය යුතු හිඟ මුදල් වල වර්තමාන තත්ත්වය අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කළ අතර කමිටු නිර්දේශයන් වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය හරහා නැවත කැබිනට් මන්ඩලයට දැනුම් දෙන ලෙස කැබිනට් මන්ඩලය විසින් තවදුරටත් උපදෙස් දී ඇති අතර එම වාර්ථාව ලැබීමට නියමිතය. ටෝරියන් යකඩ හා වානේ සමාගම සමඟ සාකච්ඡා කිරීම සඳහා භාණ්ඩාගාරයේ (සභාපති), ලංකා විදුලිබල මණ්ඩලය,ලංකා නැව් සංස්ථාව, සහ ලංකා ගල් අඟුරු සමාගමෙන් සමන්විත සිවු පුද්ගල කමිටුවක් කැබිනට් මණ්ඩලය විසින් පත්කරන ලදි.

**(viii) ලංවිමෙන් ලැබිය යුතු ESC රුපියල් මිලියන 578.67 ක්, විවිධ ණයගැතියන් රුපියල් මිලියන 18. 7 ක් නොබෙල් සම්පත් ඉන්ටර්නැෂනල් පීටී ලිමිටඩ් වෙතින් ලැබිය යුතු රුපියල් මිලියන 1.1 ක්, වෙළෙඳ ණය හිමියන් මිලියන 85.88 ක් - නොබෙල් සම්පත් ඉන්ටර්නැෂනල් පීටී ලිමිටඩ් රුපියල් මිලියන 8.04 ක් සහ ලිබර්ටි කොමඩිටීස් ලිමිටඩ් වෙතින් ලැබිය යුතු 50% ක් අයකිරීම් යන ශේෂයන් තහවුරු කිරීමට අදාල සාක්ෂි විගණනය සඳහා ලබා දී නොමැත.**

i. **විදුලිබල මණ්ඩලයෙන් ලැබිය යුතු ආර්ථික සේවා ගාස්තු : රු. මිලියන 578.67**

ESC හි පියවීම් කාලය දීර්ඝ කරන ලෙස ඉල්ලා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ලිපියක් යවා ඇත

ii. **විවිධ ණයගැතියන් රු. මිලියන 18.07**

ආපසු ලබා ගත නොහැකි NBT සහ PAL හි වටිනාකම රුපියල් මිලියන 17.83 ක් බව මූලික පරීක්ෂණ වලදී හෙළි විය. මුලාශය/මූලාරම්භය තහවුරු කර ගැනීම සඳහා තවදුරටත් විමර්ශනය කෙරේ.

iii. **නොබෙල් සම්පත් ඉන්ටර්නැෂනල් පීටී ලිමිටඩ් වෙතින් ලැබිය යුතු රු. මිලියන 1.1**

මෙම සමාගම සඳහා රුපියල් මිලියන 85.89 ක ණය ශේෂයක් ඇති අතර ඊට එරෙහිව අපි මෙම ණයගැති ශේෂය කපා හරින්නෙමු.

iv. **ණය හිමියෝ-නොබෙල් සම්පත් ඉන්ටර්නැෂනල් රු. මිලියන.85. 88**

ණයවර ලිපි වලංගු කාලය අවසන් වීම හේතුවෙන් අඩුකරන ලද අගයකින් මෙය සමන්විත වේ.

v. **ලිබර්ටි කොමඩිටීස් ලිමිටඩ් වෙතින් ලැබිය යුතු එස්ජීඑස් ගාස්තු 50%- රු. මිලියන 8.04**

2015/16 කාලය තුල යාත්‍රා තොග 17 ක් වරායෙන් නිදහස්කර ගැනීමේදී ගෙවු සමීක්ෂණ ගාස්තු වලින් සමන්විතවේ.අත්සන් කරන ලද ගිවිසුම ප්‍රකාරව මෙම ගෙවීම සිදු කරන ලෙස 2019 දී ඊමේල් පණිවිඩයක් මාර්ග යෙන් ලිබර්ටි කොමොඩිටිස් වෙත දන්වා යවන ලදි. මෙම කාරණය සම්බන්ධයෙන් බේරුම්කරණ ක්‍රියාවලිය සිදුවෙමින් පවතී.

**(ix) ඉදිරි මූල්‍ය වර්ෂය සඳහා නැව් ගාස්තු හා වැට් බදු සඳහා විදුලිබල මණ්ඩලය ගෙවූ රු.285,375,105 ක මුදල වෙනම ඉදිරිපත් කරනවා වෙනුවට "තාප ගල් අඟුරු නැව්ගත කිරීම සඳහා වූ වෙළඳ ණයගැති" (ලංවීම) ගිණුමෙන් අඩු කර ඇත**

එල්සීසී හි දැනට පවතින ගිණුම්කරණ ක්‍රමයන්ට අනුකූලව සෑම ගල් අඟුරු ආනයනයක් සඳහාම ගිණුම්කරණය සිදු කෙරේ.2020-2021 කාලය සඳහා ගෙවිය යුතු ශුද්ධ අගය 2020 දෙසැම්බර් 31 දින වන විට ලංවිමෙන් ලැබිය යුතු ඉතිරි මුදල ලෙස දැක්වේ.

විගණනයේ දැක්වෙන පරිදි වසර අවසානයේ ගෙවිය යුතු ශුද්ධ ශේෂය හෙළිදරව් වී ඇති නමුත් ලංවිමෙන් ගෙවිය යුතු මුළු මුදල සහ ලැබුණු අත්තිකාරම් වෙන වෙනම හෙළි කර නොමැත.ලබන වසරේ මූල්‍ය ප්‍රකාශන වල ලැබුණු අත්තිකාරම් වෙන වෙනම හෙළිදරව් කිරීමට බලාපොරොත්තු වේ.

**(x) මූල්‍ය ප්‍රකාශනවල වල වගකීම් ලෙස හදුනා ගෙන නොතිබු රුපියල් 4,000,000 ක මුදලක් සමාගම විසින් 2019 දී ලංකා නැව් සංස්ථාව (සීසබ) හරහා එරැ මර්කේටර් සිංගප්පූරුව (පුද්ගලික) සමාගමට ගෙවා තිබුණි**

මෙම ගෙවීම 2019 වර්ෂයේදී ලංකා නැව් සංස්ථාව හරහා මර්කේටර් සිංගප්පූරුව (පුද්ගලික) සමාගමට සිදු කර ඇති අතර මර්කේටර් වගකීමේ මුලාශය/මූලාරම්භය තහවුරු කර ගැනීම සඳහා විමර්ශනය කෙරෙන අතර ඒ අනුව අදාළ ගිණුම්කරන සටහන් ලබා දෙනු ඇත.

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු

**(xi) සමාගම විසින් නැව් තොග අංක 123 සඳහා වැට් බද්ද වශයෙන් රු 136,236,370 ක් ගෙවා ඇත. කෙසේ වෙතත් රේගු ප්‍රකාශ අනුව ගෙවිය යුතු සත්‍ය වැට් බදු මුදල රු 106,969,404 කි.එබැවින් වැඩිපුර ගෙවූ වැට් බදු මුදල රු. 29,266,965 කි.**

රුපියල් 29,266,965 ක් වැට් බදු ලෙස වැඩිපුර ගෙවීම සම්බන්ධව පහත සඳහන් ලියවිලි ශ්‍රී ලංකා රේගුවට ඉදිරිපත් කරන ලදී

- එම්වී.ස්ටාර් ලූටාස් නැව් තොග සම්බන්ධව 2016.11.09 දින 1183769 දරන අවසන් රේගු ප්‍රකාශන වාර්ථාව (Cusdec)
- අවසන් වැට් බදු ගණනය කිරීම
- 2021 පෙබරවාරි 10 දිනැති රේගු ආපසු ගෙවීමේ ලිපියේ පිටපත

### 1.2.3 ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස්

### 1.2.3.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රී ලං ගි ප්‍ර/ ශ්‍රී ලං මු වා ප්‍ර) සහ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල වීම

**(අ) මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්ප රාමුව**

**(iiii) සංකල්ප රාමුවේ 4.1 (ආ) සහ 4.3 ඡේදයට පටහැනිව වෙනමම ආයතනයක පරිපාලන වියදම් වන රුපියල් මිලියන 43.97 ක වියදම ලංවිම විසින් දරනු ලබන අතර මිලියන 8 ක් වන ලංවිම වත්කම්වල අයිතිය වෙනත් ආයතනයක් විසින් භාවිතා කර තිබුනි**

ලංකා විදුලිබල මණ්ඩල පනතේ 12 (ජේ) වගන්තිය මගින් අර්ථසාධක හා විශ්‍රාම වැටුප් අරමුදල් ස්ථාපිත කිරීමේ බලය මණ්ඩලයට පවරා ඇත. එබැවින්, විදුලිබල මණ්ඩල සේවකයින් සඳහා අර්ථසාධක අරමුදල පිහිටුවීම ලංවිම තීරණයක් වේ.

2003 දෙසැම්බර් 31 දින ගැසට් කරන ලද අර්ථසාධක අරමුදල් රීති වල අංක 5 දරන වගන්තියට අනුව, අරමුදලේ කළමනාකරණය සහ පරිපාලනය සිදු කරනු ලබන්නේ මණ්ඩලය විසින් පත් කරන ලද කළමණාකරන කමිටුවක් විසින් බැවින් අරමුදල කළමනාකරණය කිරීම හා පරිපාලනය කිරීම මණ්ඩලයේ වගකීම වේ. එබැවින් අරමුදල කළමනාකරණය කිරීමේ සහ පරිපාලනය කිරීමේ පිරිවැය ජනනය වුයේ විදුලිබල මණ්ඩලය තුලිනි.

තවද, එම රීති වල අංක 20 (i) වගන්තියට අනුව, නිවාස ණය පරීක්ෂා කිරීම හා සම්බන්ධ වියදම් හැර අරමුදලේ සියලුම පරිපාලන වියදම් විදුලිබල මණ්ඩලය විසින් දරනු ලබන අතර මෙම ප්‍රතිපත්තිය අරමුදලේ ආරම්භයේ සිටම ක්‍රියාත්මක විය(1969 නොවැම්බර් 1 දා සිට). එබැවින් අර්ථසාධක අරමුදල වෙනුවෙන් ලංවිම විසින් දරන ලද පිරිවැය අරමුදලේ මූල්‍ය ප්‍රකාශන වල සටහන් නොවේ.

2021 පෙබරවාරි 11 දින පැවති අරමුදලේ කළමනාකරණ කමිටු රැස්වීමට මෙම කරුණ ඉදිරිපත් කරන ලද අතර එම කමිටුව තීරණය කළේ වර්තමාන ප්‍රතිපත්තිය අඛණ්ඩව කරගෙන යාමට සහ ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල එකඟතාවක් ලබා ගැනීමටයි. ඒ අනුව ලංවිම අධ්‍යක්ෂ මණ්ඩලයට මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කළ අතර ඒ පිළිබඳව විස්තරාත්මකව සලකා බැලීමෙන් අනතුරුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අරමුදලේ කළමනාකරණ හා පරිපාලනය වියදම් දැරීමේ වර්තමාන ප්‍රතිපත්තිය අඛණ්ඩව කරගෙන යාමට අනුමැතිය ලබා දී ඇත.

**iii. වත්කම් වල අයිතිය සම්බන්ධ ලිපි ලේඛන නොමැති වීම හේතුවෙන් ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ ඉඩමේ අයිතිය තහවුරු කර ගැනීමට නොහැකි වී තිබේ.**

ලංවිම ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ ඉඩමේ අයිතිය සඳහා අදාළ ලියකියවිලි නොමැති අතර එම නිසා විදුලිබල මණ්ඩල මූලස්ථාන ගොඩනැගිල්ලේ අයිතිය තහවුරු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලෙස විදුලිබල මණ්ඩලය ඉඩම් කොමසාරිස්වරයාගෙන් ඉල්ලා ඇත.

**(ආ) ශ්‍රී ලං ගි ප්‍ර-2 තොග සහ ශ්‍රී ලං ගි ප්‍ර-16 - දේපළ පිරියත හා උපකරණ**

**ලංවිම සිය ප්‍රාග්ධන හා නඩත්තු කාර්යයන් වල පොදු කාර්යය පිරිවැය තක්සේරු කිරීම සඳහා සම්මත පිරිවැය ක්‍රමය ක්‍රියාත්මක කරයි**

ප්‍රාග්ධන කාර්යය සඳහා වාර්ෂික කලින් තීරණය කළ අනුපාතයකට අනුව පොදුකාර්යය පිරිවැය අන්තර්ග්‍රහනය සිදු කරනු ලබන්නේ විදුලිබල මණ්ඩලයේ බෙදා හැරීම් අංශවල පමණි. ප්‍රාග්ධන කාර්යන්ට සෘජුවම සම්බන්ධ වන සෑම ඒකකයකම අයවැය ගත පිරිවැය මත පදනම්ව මෙම වාර්ෂික පොදුකාර්යය පිරිවැය අන්තර්ග්‍රහන අනුපාතය ගණනය කෙරේ. බෙදා හැරීම් අංශවල සත්‍ය පිරිවැය සමඟ අයවැයගත පිරිවැය සංසන්දනය කළ විට, දැරූ සත්‍ය පිරිවැය අයවැය පිරිවැයට වඩා 10% ඉක්මවා ඇති බව හදුනාගෙන ඇත. එබැවින් දැනට භාවිතා කරන අවශෝෂණ අනුපාතය සාධාරණ ය.

**(ඇ) ශ්‍රී ලං ගි ප්‍ර-16 - දේපළ පිරියත හා උපකරණ**

**සම්ප්‍රේෂණ අංශයේ රුපියල් බිලියන 172.2 ක් වූ ස්ථාවර වත්කම් වලින් රුපියල් බිලියන 171.2 ක ස්ථාවර වත්කම් සමාලෝචිත වර්ෂය තුළ භෞතිකව සත්‍යාපනය කර නොමැත**

චංචල ස්ථාවර වත්කම් සියල්ලටම අදාළ භෞතික සත්‍යාපනය සාර්ථකව සිදු කර ඇති අතර වාර්තා විගණනයේ අවධානය පිණිස ලබා දී ඇත. තවද නිශ්චල වත්කම් තුල ඇතුලත් වන්නේ දැනට රටේ අඛණ්ඩ විදුලි බල සැපයුමක් සැපයීමේදී භාවිතා කරනු ලබන විදුලි සම්ප්‍රේෂණ ජාලයේ අත්‍යාවශ්‍ය අංගයන් වන සම්ප්‍රේෂණ මාර්ග, යන්ත්‍ර උපකරණ හා සම්බන්ධ නිශ්චල වත්කම්ය.

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු

**(ඇ) ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**විදුලිබල මණ්ඩලය විසින් අඛණ්ඩව භාවිතයට ගනු ලබන මුළුමනින්ම අවප්‍රමාණය වූ ජංගම නොවන වත්කම් වල ප්‍රයෝජනවත් ආයු කාලය**

සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම් වලින් 53% කට වඩා වැඩි ප්‍රමාණයක් ජනන බලාගාර සහ ඒ ආශ්‍රිත වත්කම් වලින් සමන්විත වේ. සම්පූර්ණයෙන්ම ක්ෂය වූ බලාගාර වල ප්‍රයෝජනවත් ආයු කාලය නැවත සමාලෝචනය කිරීම සඳහා කමිටුවක් දැනටමත් පත් කර ඇත. කෙසේ වෙතත්, බලාගාරයේ සංකීර්ණතාවය සහ සුවිශේෂත්වය හේතුවෙන් තක්සේරුව සඳහා සැලකිය යුතු කාලයක් ගත වේ.

මෝටර් රථ සඳහා සංශෝධිත ප්‍රයෝජනවත් ජීවිත කාලය ක්‍රියාත්මක කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත 2021 වර්ෂයේදී සිදු කෙරේ.

සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම් වලින් 38% ක් වන සම්ප්‍රේෂණ හා බෙදා හැරීමේ මාර්ගයන් පිළිබඳ විගණන නිරීක්ෂණය නිරාකරනය කිරීම සඳහා යාන්ත්‍රණයක් හඳුනා ගැනීමට කටයුතු කෙරේ.

### 1.2.3.2 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) හර ශේෂය රුපියල් මිලියන 189.54 ක් (තොග ඌනතාවය) සහ බැර ශේෂය රුපියල් මිලියන 114.64 ක් (තොග අතිරික්තය) වසරකට වැඩි කාලයක් තොග ගැලපුම් ගිණුමේ පැවතුනි.**

තොග ගැලපුම් ගිණුමේ ශේෂය ඉවත් කිරීම සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග ගෙන ඇත.

- ගැටළු විසඳීම සඳහා කමිටු පත් කිරීම
- වගකිව යුතු නිළධාරීන්ට එරෙහිව විධිමත් පරීක්ෂණ පැවැත්වීම
- නීති උපදෙස් ලබා ගැනීම, සහ
- අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අධ්‍යක්ෂ මණ්ඩලය පත්‍රිකා ඉදිරිපත් කිරීම

ඒ අනුව හිඟ ශේෂයෙන් 46% කට වැඩි ප්‍රමාණයක් සහ අතිරික්ත ශේෂයෙන් 30% ක ප්‍රතිශතයක් ඉහත ක්‍රියාවලියට ඇතුළත් කර ඇත

**(ආ) ලක්විජය බලාගාරය ඉදිකිරීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලබා ගත් රුපියල් බිලියන 159.18 ක ණය මුදල ලංකා ගල් අඟුරු සමාගමට (එල්සීසී) මාරු කළ යුතු අතර 2010 ඔක්තෝබර් 13 දිනැති කැබිනට් තීරණය අංක 10/2434/423/034 පරිදි ණය ගෙවීම සඳහා අවශ්‍ය මුදල ලංවිම විසින් ගෙවිය යුතුය. කෙසේ වෙතත්, මහා භාණ්ඩාගාරය සමග කිසිදු අනු ණය ගිවිසුමක් හෝ නොමැතිව විදුලිබල මණ්ඩලය විසින් මෙය මහා භාණ්ඩාගාරයෙන් ලබා ගත් ණයක් ලෙස සටහන් කර තිබුණි.**

අයවැය යෝජනා -2014 හි ණය ගැනීම් ස්කන්ධය බවට පරිවර්තනය කිරීම යන ශීර්ෂය යටතේ භාණ්ඩාගාර ලේකම් විසින් අත්සන් කරන ලද 2014-09-30 දිනැති අංක:PE/EN/CEB/Equity/2014 දරන ලිපිය මගින් පුත්තලම ගල් අඟුරු බලාගාරය වෙනුවෙන් ලබා ගත් සියළු ණය විදුලිබල මණ්ඩලය විසින් ලබා ගත් සෘජු ණය ලෙස සැලකිය යුතු ලෙස උපදෙස් ලබා දී ඇති අතර පවතින ද්‍රව ශීලතා බාධාවන් ඉවත්වී මෙම ණය ගෙවීමේ පිරිවැය පියවා ගැනීමට විදුලිබල මණ්ඩලයට හැකි වන තුරු භාණ්ඩාගාරය විසින් එය දරනු ලබන බව දන්වා ඇත.

තවද, 2018-01-11 දින රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තුමේන්තුවේ පැවති රැස්වීමේදී අවධාරණය කෙරුනේ වත්කම් හා බැඳීම් යන දෙකම විදුලිබල මණ්ඩලයේ ශේෂ පත්‍රයේ ඇති හෙයින් එම ණය ගෙවීම විදුලිබල මණ්ඩලයට ලබා දිය යුතු බවයි.

ශ්‍රී ලංකා රජය සහ අදාළ ණය දීමේ ආයතනය අතර ණය ගිවිසුම මේ වන විටත් අත්සන් කර ඇති හෙයින්, ණය මුදල විදුලිබල මණ්ඩලය මාරු කිරීමට භාණ්ඩාගාරය අවශ්‍ය කටයුතු සම්පාදනය කරන තුරු එම ණය භාණ්ඩාගාරයට වගකීමක් ලෙස සටහන් වේ.

රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තුමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එවන ලද 2019-10-17 දිනැති අංක:PEP/I/CEB/2/II (i) යන ලිපිය මගින් ලබා දුන් උපදෙස් සලකා බලමින්, ලංවිම විසින් 2019 වර්ෂයේ ගිණුම් පොත් වල රුපියල් 16,942,798,790.95 ප්‍රාග්ධන ආපසු ගෙවීම් සඳහා සහ රුපියල් 3,556,442,931.30 පොළී ගෙවීම් සඳහා ගැලපීම් සිදු කර ඇත.තවද, රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තුමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් යවන ලද 2021.01.15 දිනැති අංක PED/1/CEB/02/11 (i) ලිපිය අනුව පොදු ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ වාර්තාවලට අනුකූලව ලංවිම විසින් රුපියල් 20,536,545,932.04 මුදලක් ශ්‍රී ලංකා ජනරජයේ ස්කන්ධය බවට පරිවර්තනය කර ඇත. ඒ අනුව මහා භාණ්ඩාගාරය ලබා දුන් උපදෙස් පරිදි විදුලිබල මණ්ඩලයේ ගිණුම් සකස් කර ඇත.

1969 අංක 17 දරණ ලංකා විදුලිබල මණ්ඩල පනතේ 42 වෙනි වගන්තියේ 6 වන උප වගන්තියට අනුව, මහා භාණ්ඩාගාරය හරහා ලබාගත් විදේශ මුදල් වල විනිමය අනුපාතික අවදානම දරනු ලබන්නේ ශ්‍රී ලංකා රජය විසින් බැවින් ණය සඳහා වන ප්‍රග්ධනය හා පොළිය ආපසු ගෙවීමේදී විදේශ විනිමය උච්චාවචනයන් හේතුවෙන් ඇති වන ලාභ හෝ පාඩු, මණ්ඩලය ගිණුම්ගත නොකරයි.මණ්ඩලය විසින් ගෙවිය යුතු හිඟ ණය මුලද ණය ලබාගැනීමේදී එකඟවූ විනිමය අනුපාතයෙන් තක්සේරු කෙරේ.කෙසේ වෙතත්, මෙම අලාභ පියවා ගැනීම සඳහා හැකිවන පොළී අනුපාතයක් යටතේ රජය ලංකා විදුලිබල මණ්ඩලය සමඟ උප ණය ගිවිසුමකට එළඹෙන අතර එමඟින් රජය විසින් විදුලිබල මණ්ඩලය සඳහා ලබා ගත් ණය වලින් වන පාඩු පියවා ගනු ඇත.

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු

මෙම ණය ලංවිම මඟින් ලබා ගත් සෘජු ණය ලෙස සැලකීමට භාණ්ඩාගාරය තීරණය කර ඇති හෙයින් එවැනි අනු ණය ගිවිසුම්වලට එළඹ නැත. ලංවිමෙහි ද්‍රවශීලතා බාධාවන් හේතුවෙන් මහා භාණ්ඩාගාරය විසින් ණය සේවා ගෙවීම සිදු කරන හෙයින් ණය දෙන ආයතනයට ගෙවූ සත්‍ය ගෙවීම ණය ගැනීම් ස්කන්ධයට කල පරිවර්තනයක් ලෙස විදුලිබල මණ්ඩලයට මාරු කර ඇත.

විදුලිබල මණ්ඩලය ණය ලබා ගැනීමේදී මුලින්ම එකගවූ අනුපාතයට ණය වාර්තා කර ඇති අතර ඉන් පසුව ණය නැවත තක්සේරු නොකළ හෙයින්, භාණ්ඩාගාරය විසින් සිදු කළ ණය ගැනීම් ස්කන්ධයට පරිවර්තනයට ඇතුළත් වූ ප්‍රාග්ධන ආපසු ගෙවීමට අදාළ විනිමය අලාභය ණයට සමාන බවට පරිවර්තනය කර ඇත.

ඒ අනුව 2020 වර්ෂය ආරම්භයේ විනිමය අනුපාතිකය සහ 2020 වසර අවසානයේ විනිමය අනුපාතිකය අතර විචලනයට අදාල අලාභය ලෙස රු. 20,862,022.88 ක් 2020 මූල්‍ය වර්ෂය තුළදී ගිණුම්ගත කර ඇති අතර 2019 වසර අවසානය දක්වා වූ විනිමය අනුපාතික විචලනය හා සම්බන්ධ රුපියල් 6,154,069,044.78 ක විනිමය අලාභය 2019 වසරට ගැලපුම් කර ඇත.

තවද, 2019 ණය ස්කන්ධ පරිවර්තනයේ ඇතුළත් රුපියල් 5,735,412,848.45 ක විනිමය අලාභය 2019 දී ණය ආපසු ගෙවීමක් ලෙස ගණන් බලා තිබූ අතර 2020 වර්ෂයේදි මුළු විනිමය අලාභය රුපියල් 11,889,481,893.00 ලෙස හදුනා ගනිමින් එය නිවැරදි කර ඇත.

**(ඇ) මහා භාණ්ඩාගාරයෙන් උප ණය වශයෙන් වාර්තා කළ විදේශ ණය වලින් ලද රුපියල් බිලියන 25.23 ක් 2014 දෙසැම්බර් 31 න් පසු ව්‍යාපෘති සඳහා බෙදා හරින ලදී. 2015 මාර්තු 18 දින ගන්නා ලද කැබිනට් තීරණය අංක 15/0228/613/012 ට අනුව මෙම ණය ද ලංවිම වෙත පැවරිය යුතු අතර ණය හා සේවා හා ආපසු ගෙවීම් විදුලිබල මණ්ඩලය විසින් සිදු කළ යුතුය,කෙසේ වෙතත් මෙම ණය වල පැවැත්ම සැක සහිත වන අතර ආපසු ගෙවීමේ කොන්දේසි මත මූල්‍ය ප්‍රකාශනයට ඇති බලපෑම ගණනය කළ නොහැක.**

2015-03-09 දිනැති අමාත්‍යාංශ සංදේශය අනුව මුදල් අමාත්‍යාංශ විසින් විදේශ මුල්‍යකරණ සංවර්ධන ව්‍යාපෘති බෙදා හැරීම, සේවා සැපයීම, ආපසු ගෙවීම සහ ගිණුම්කරණය කිරීමේ යාන්ත්‍රණය විධිමත් කිරීම සහ ඒ සම්බන්ධයෙන් 2015-03-18 දිනැති කැබිනට් තීරණයට අනුව 2015 වසරේ සිට ණය සේවා ගෙවීමට ලංවිම අපේක්ෂා කෙරේ.

ලංකා රජය සහ ණය දෙන ආයතනය අතර ණය ගිවිසුම මේ වන විටත් අත්සන් කර ඇති නමුත් විදුලිබල මණ්ඩලය වෙනුවෙන් ලබා ගත් බැවින් මුලින් මෙම මුදල් භාණ්ඩාගාරයට වගකීමක් ලෙස සටහන් වී ඇත.

ඉන්පසුව, රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් 2018-01-11 පැවති රැස්වීමේදී, කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ඇතිව 2014-12-31 න් පසු මහා භාණ්ඩාගාරය හරහා ලංවිම වෙත ලබා දුන් ණය ශ්‍රී ලංකා ජනරජයේ ස්කන්ධය බවට පත් කිරීමට තීරණය කරන ලදී.

එම නිසා, මෙම ශේෂයන් ප්‍රග්ධනයට පැවරීම සඳහා භාණ්ඩාගාරයට නියෝගයක් ලැබෙන තුරු ,එය භාණ්ඩාගාරයට වගකීමක් ලෙස සටහන් කර ඇත.

**(ඈ) රු. බිලියන 54.71 ක් වන විදේශ ණය හයක වටිනාකම මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන වල මහා භාණ්ඩාගාරයෙන් ලද ණය වශයෙන් සටහන් කර ඇති අතර මහා භාණ්ඩාගාරය සමඟ කිසිදු ණය ගිවිසුමක් පවා අත්සන් කර නැත**

මෙම ණය මුදල විදුලිබල මණ්ඩලය වෙනුවෙන් භාණ්ඩාගාරය හරහා ලබාගෙන ඇති අතර මහා භාණ්ඩාගාරය සමඟ උප ණය ගිවිසුම අවසන් කර නැත.

විදුලිබල මණ්ඩලයට මුදල් ලබා දෙන බැවින් මේවා භාණ්ඩාගාරයට වගකීමක් ලෙස සටහන් වේ. තවද, ශ්‍රී ලංකා රජය සහ අදාළ ණය දීමේ ආයතනය අතර ණය ගිවිසුම් දැනටමත් අත්සන් කර ඇත.

**(ඉ) 2013 වසරට පෙර රජයේ ආයතනවල විදුලි උත්පාදන යන්ත්‍ර , සෝපාන සහ වායුසමීකරණ යන්ත්‍ර සැපයීම, නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කිරීම සඳහා විදුලිබල මණ්ඩලය විසින් සිදු කරන ලද කාර්යයන් ඒවායේ ඉන්වොයිසි වටිනාකම් මත පදනම්ව ගිණුම්ගත කිරීමකින් තොරව පිරිවැයට තක්සේරු කර ඇත**

විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ සහ රජයේ රෝහල් වල විදුලිබල මණ්ඩලය විසින් සිදු කරන ලද කාර්යයන් සඳහා ලැබිය යුතු මුදල් එකතු කිරීමේ සම්භාවිතාවය සැක සහිත බැවින් සේවාලාභියාගෙන් මුදල් එකතු කරන තුරු 2013 ට පෙර ආදායම මුදල් පදනම මත ගිණුම් පොත්වල හඳුනාගෙන ඇති අතර, කාර්යයන්හි සැබෑ පිරිවැය ලැබිය යුතු යැයි පෙන්වන ලදී. 2020-12-31 වන විට රජයේ ආයතන සඳහා සිදු කරන ලද කාර්යයන් වල සත්‍ය පිරිවැය සහ ඇස්තමේන්තු වටිනාකම අතර වෙනස රුපියල් 43,421,695.18 ක් වන අතර එය විගනන විමසුමේ දක්වා ඇති පරිදි 66,987,761 ක් නොවේ.

කෙසේ වෙතත්, 2020-10-06 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේ අංක 20.14.279 යටතේ නියම කරන ලද පරිදි ලංවිම සමාන්‍යාධිකාරී, විසින් ඇගේ අංකය CEB/FM/AFM (Corp)/DFM (P&I)/ Debtors හා 2020-12-21 දිනැති ලිපිය මඟින් විදුලිබල මණ්ඩලය මුහුණ දී ඇති මුදල් ප්‍රවාහ ගැටලුව මගහරවා ගැනීම සඳහා රජයේ ආයතනවලින් කල් ඉකුත් වූ මුදල් ආපසු අය කර ගැනීම සඳහා රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තුමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සහාය පැතූ අතර ඒ සඳහා අපට යහපත් ප්‍රතිචාරයක් ලැබී නැත.

තවද, 2020-12-21 දින පැවති විගණන කමිටු රැස්වීමේ සටහන් අංක 2020/03 හි 03.03 මඟින් ආපසු අයකර ගත නොහැකි දිගුකාලීන ලැබීම් කපා හැරීම සඳහා මණ්ඩල පත්‍රිකාවක් කෙටුම්පත් කරන ලෙස වත්කම් කළමනාකරණ අංශයට විගණන කමිටුව නියෝග කර ඇති අතර 2021-04-07 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අංක 21.06.128A යටතේ වත්කම් කළමනාකරණ අංශයට රජයේ ආයතන වලින් කල් ඉකුත් වූ ලැබීම් නොකඩවා ලබා ගැනීමට නොහැකි වූ බැවින් ඒවා කපා හැරීමට කටයුතු කල යුතු බව තහවුරු කරන ලදී. ඒ අනුව නි.සා(වැ.උ.සේ) මේ සම්බන්ධව මණ්ඩල පත්‍රිකාවක් කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලියේ යෙදී සිටී.

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු

ශ්‍රී ලංකා මුල්‍ය වාර්තාකරණ ප්‍රමිත (SLFRSS) අංක 9 යේ 5.5.4 වගන්තියට අනුකූලව මුල්‍ය උපකරණ වල අපේක්ෂිත මුල්‍ය අලාභය සැලකිල්ලට ගෙන, මෙම ශේෂයන් නැවත අය කර ගත නොහැකි වීම හේතුවෙන් ඒ සඳහා පූර්ණ හාණිකරන ප්‍රතිපාදන ඇති කර ඇත

තවද, SLFRS 15 හි වගන්තිය (9) (ඉ)- ගනුදෙනුකරුවන් සමඟ ඇති කොන්ත්‍රාත් වලින් ලැබෙන ආදායම විමසුමේ සඳහන් පරිදි ලැබිය යුතු ශේෂය (එනම් ඉන්වොයිසි වටිනාකම) නැවත ලබා දෙන ලෙස යෝජනා නොකරයි. තවද SLFRS - 9 - 5.5.4 වගන්තිය අනුව ඉහත සඳහන් රැකියා වල ඉන්වොයිසි වටිනාකම් හඳුනා ගැනීම සඳහා වියදමින් ගෙවිය යුතු ලැබීම් ගිණුම් තුළ නැවත හදුනාගනු ලැබුවද හාණිකර සඳහා 100% ප්‍රතිපාදන සලසා දිය යුතු ය.

ඒ අනුව, ඉන්වොයිසි වටිනාකම් නැවත හදුනාගැනීමෙන් (ලැබිය යුතු ආදායම් සහ රඳවා ගත් ඉපැයීම් වැඩිකිරීම) මත ශේෂයන් ආපසු අය කර ගැනීමට නොහැකි වීම හේතුවෙන් හාණිකරන ප්‍රතිපාදනයක් (ලැබීම් අඩු වීම සහ රඳවා ගත් ඉපැයීම් අඩුවීම) හඳුනා ගැනීමට හේතු වේ.

ඉහත සියල්ල සලකා බැලීමේදී, ඉන්වොයිසි වටිනාකම් ප්‍රතිප්‍රකාශනය කිරීම ඉහත සඳහන් කළ ගිණුම්කරණ ප්‍රමිත වල අදාළ විධිවිධානයන්ට අනුකූල නොවන අතර එය විදුලිබල මණ්ඩලයේ මූල්‍ය කාර්යය සාධනය සහ මුල්‍ය තත්ත්වය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති නොකරනු ඇත. එබැවින්, විගණන විමසුමේ සඳහන් පරිදි මුල්‍ය ප්‍රකාශන වල කිසිදු අවතක්සේරුවක් නොමැත.

විගණනය සඳහා ඉල්ලන ලද බොහෝ තොරතුරු ඒ ඒ අංශ ප්‍රධානීන් විසින් මේ වන විටත් ඉදිරිපත් කර තිබෙන අතර අවශ්‍ය ඕනෑම අමතර තොරතුරක් ඔවුන්ගෙන් ලබා ගත හැකිය.

**(ඊ) 2016 වර්ෂයේදී මහා භාණ්ඩාගාරය වෙත ගෙවන ලද රු. බිලියන 5 න් රු මිලියන 500 ක මුදලක් සමාලෝචනය කරන ලද වර්ෂය තුළ කළමනාකරණ ගාස්තු ගෙවීම ලෙස ආදායම් ප්‍රකාශනය සඳහා ක්‍රමක්ෂය කර ඇති අතර රඳවා ගත් ආදායමෙන් රුපියල් බිලියන 1.5 ක් අය කර ඇත.**

රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ 2019.10.16 දිනැති අංක PDE/I/CEB/2/11/(iii) දරන ලිපිය මත පදනම්ව, මෙම ගෙවීම භාණ්ඩාගාරයට ගෙවා ඇති "කළමනාකරණ ගාස්තුව" ලෙස සලකනු ලැබූ අතර 2017 වසරේ සිට වසර 10 ක කාල සීමාවක් තුළ ක්‍රමක්ෂය කරනු ලැබේ.

**(උ) බෙදාහැරීම් අංශ වල රුපියල් බිලියන 6.18 ක වටිනාකමක් සහිත වැඩ නිම් කාර්යයන් 7,546 ක් වත්කම් වලට මාරු කිරීමකින් තොරව කෙරීගෙන යන ගිණුමේ ඉතිරිව ඇත.**

සම්පූර්ණ කරන ලද ප්‍රාග්ධන කාර්යයන් නියමිත පරිදි දේපල පිරියත හා උපකරණ සඳහා ප්‍රාග්ධනීකරණය කර ගැනීමට අඛණ්ඩ උත්සාහයන් දරනු ලැබේ. දිගු කාලීනව කෙරීගෙන යන වැඩ ගිණුමේ පවතින ප්‍රාග්ධන කාර්යයන් අඛණ්ඩව අධීක්ෂණය කිරීම සහ සුදුසු පරිදි අවසන් කිරීම සඳහා පළාත් මට්ටමේ කමිටු පත් කර ඇත. ඒ අනුව, 2021 මැයි 31 වන විට වසර 4 කට වැඩි කාලයක් ප්‍රග්ධනීකරණය කර නොතිබූ කාර්යයන් වලින්, බෙදාහැරීමේ අංශ 01 විසින් 21% ද බෙදාහැරීමේ අංශ 03 විසින් 28% ද ප්‍රාග්ධනීකරණය කර ඇත.

**(ඌ) 2012 දී වැඩ නිම කරන ලද ඉහළ කොත්මලේ ජල විදුලි ව්‍යාපෘතියේ මුළු පිරිවැය රු. මිලියන 979.88 ක් වූ අතර එය ප්‍රග්ධනීකරණය වෙනුවට කෙරීගෙන යන වැඩ ගිණුමේ ඇතුළත් කර ඇත**

මූලික වත්කම් හුවමාරුවෙන් පසු 2020 දෙසැම්බර් වන විට කෙරීගෙන යන වැඩ ගිණුමේ රුපියල් මිලියන 979.88 ක් එකතු වී ඇත. මෙම මුදලට ප්‍රධාන වශයෙන් සේවක වියදම්, බේරුම්කරණය සඳහා වූ නීති ගාස්තු සහ ඉඩම් පවරා ගැනීමේ පිරිවැය යනාදිය ඇතුලත් වේ. මෙම ඉතිරි මුදල දේපළ පිරියත උපකරණ වෙත මාරු කිරීමට ඇති ගැටලු විසඳීම සඳහා ව්‍යාපෘති කාර්යාලය සමඟ දැනටමත් කටයුතු සිදුකර ඇති අතර මෙය 2021 වසර තුළදී සාක්ෂාත් කරගනු ඇත.

**(එ) 2014 වර්ෂයේදී වැඩ නිම කරන ලද පුත්තලම ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතිය සඳහා මිල දී ගත් පිරිවැය රුපියල් මිලියන 179.19 ක් වන වාහන ප්‍රාග්ධනීකරණය වෙනුවට කෙරීගෙන යන වැඩ ගිණුමේ ඇතුළත් කර ඇත**

මුලික වත්කම් හුවමාරුවෙන් පසු රැස් කරන ලද වියදම් රු 528,013,647.76 ක මුදල 2020 වර්ෂයේදී අදාළ අංශ වෙත මාරු කෙරිණි. කෙසේ වෙතත්, වාහන මිලදී ගැනීමේදී ගෙවූ රුපියල් 179,194,890 ක මුදල වාහන වල අයිතිය ලංවීම වෙත පවරා නොතිබූ හෙයින් ගිණුම් වල ඉතිරිව ඇත. (වාහන 10) මෙම වාහන වල අයිතිය ලංවීම වෙත පැවරීමෙන් පසු එම මුදල අදාළ අංශ වලට මාරු කෙරේ.

**(ඒ) කපා හරින ලද ණය ගැති ශේෂයන් සඳහා ලද රුපියල් මිලියන 18.76 ක පොලී ආදායම, වැට් බද්ද සහ අධිභාරය නිසිපරිදි හඳුනාගෙන නොතිබුණි.**

අවශ්‍ය නිවැරදි කිරීම් ඉදිරියේදී සිදු කෙරේ

**(ඔ) වීදි ආලෝකමත් කිරීමේ නඩත්තු වියදම් සඳහා වූ රුපියල් මිලියන 30.56 ක ආපසු අය කර ගත නොහැකි මුදලක් සඳහා ප්‍රතිපාදන මුල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි.**

පළාත් පාලන ආයතන විසින් සිදු කරනු ලබන වීදි ලාම්පු නඩත්තු කිරීමේ වියදම විදුලිබල මණ්ඩලය විසින් ආපසු ගෙවනු ලබන අතර ඒවා විදුලිබල අමාත්‍යාංශයෙන් ලැබිය යුතු ලෙස සටහන් වේ. 2013 වර්ෂයේ සිට දකුණු පළාත මඟින් සිදු කරන ලද එවැනි කාර්යයන් සඳහා වන සමුච්චිත ප්‍රතිපූර්ණ අගය ඉහත ශේෂයෙන් දැක්වේ. කෙසේ වෙතත්, ඉහත සඳහන් ශේෂය සඳහා අමාත්‍යාංශයෙන් මෙතෙක් මුදල් ලැබී නොමැති අතර, එම නිසා මින්පසු අදාල වියදම් නොගෙවීමට දකුණු පළාත තීරණය කර ඇත.

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු

**(ඕ) කොළඹ නගර කාර්යාල විසින් රුපියල් මිලියන 29.97 ක ගෙවිය යුතු ශේෂය රැස් කිරීම් පාලන ගිණුමට වැරදි ලෙස හර කර තිබුණි**

2021 මූල්‍ය ප්‍රකාශනවල ශේෂය නිවැරදි කෙරේ

**(ක) 2021 ජනවාරි 01 සිට 2021 ජනවාරි 15 දක්වා කාලයට අදාළ ආදායම සමාලෝචනය කළ වසරේ ආදායම ලෙස විවිධ ණයගැති ගිණුමට හදුනාගැනීම හේතුවෙන් විවිධ ණයගැති ශේෂය රුපියල් මිලියන 585.69 කින් අධිතක්සේරු වී ඇත.**

බිල්පත් සාරාංශයේ සහ දින දර්ශනයේ දිනය අතර වෙනස හේතුවෙන් ඉහත ශේෂය නිර්මාණය වී ඇත. කෙසේ වෙතත්, බිල්පත් සාරාංශයේ දිනය දින දර්ශනයේ දිනයට ගැලපීමට කටයුතු කර ඇත. එබැවින් එවැනි ශේෂයක් 2021 වර්ෂයෙන් පසුව නිර්මාණය වී නොමැත.

**(ග) හිමිකම් කිව හැකි කාල සීමාව ඉක්මවා ගිය රුපියල් බිලියන 1.57 ක ආර්ථික සේවා ගාස්තුව (ESC) ආදායම් ප්‍රකාශයට අය කර නොමැත**

2019 සහ 2020 වසර සඳහා වූ මූල්‍ය ප්‍රකාශන වලින් කපා හැරීමට අවශ්‍ය කාලය සම්පූර්ණවූ (අවුරුදු තුන ඉක්මවූ) ලැබිය යුතු ආර්ථික සේවා ගාස්තු ප්‍රමාණය රුපියල් බිලියන 1.57 කි. කපා හැරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාළ මණ්ඩලික පත්‍රිකාව 2019 වර්ෂයේදී ඉදිරිපත් කරන ලදී. කෙසේ වෙතත්, විදුලිබල මණ්ඩල විගණන කමිටු නිර්දේශය වූයේ මෙම ශේෂය කපා හැරීම නොව විදුලිබල අමාත්‍යංශය සහ මහා භාණ්ඩාගාරය වෙත යොමු කර වෙනත් ගෙවිය යුතු ශේෂයන් මඟින් අය කර ගැනීමට හෝ ඉවත් කිරීමට ඇති විකල්පයන් සොයා බැලීමයි.

2018 ජාතික අයවැය යෝජනා වල කොටසක් ලෙස එය මහා භාණ්ඩාගාරය වෙත දන්වා ඇති අතර බදු සහන වල කොටසක් ලෙස එය නැවත විදුලිබල අමාත්‍යංශය හරහා 2020 දී මහා භාණ්ඩාගාරයට දැනුම් දෙන ලදී.

**(ච) අසාමාන්‍ය බැර ශේෂයන් හේතුවෙන් බෙදා හැරීම් අංශවල කෙරීගෙන යන වැඩ ගිණුමේ ශේෂය රුපියල් මිලියන 52.06 කින් අඩුතක්සේරු වී තිබුණි.**

රුපියල් 26,014,986 ක අසාමාන්‍ය ණය ශේෂයන් සඳහා හේතු හඳුනාගෙන ඇති අතර 2021 වර්ෂයේදී එය නිවැරදි කෙරේ. තවද විදුලමු රත්නපුර ව්‍යාපෘතියේ රුපියල් 26,045,997 ක කාර්යයන් තනි තනි කාර්යයන් ලෙස නිරවුල් කිරීමට කටයුතු කෙරේ.

**(ජ) අදාළ වියදම් ගිණුම් වලට මාරු කිරීමෙන් තොරව රුපියල් මිලියන 912.69 ක මුදලක් වසරකට වැඩි කාලයක් මාර්ගස්ථ තොග ගිණුමේ පවතින අතර , රුපියල් මිලියන 245.53 ක අසාමාන්‍ය බැර ශේෂයක් නිරවුල් කිරීමකින් තොරව මාර්ගස්ථ තොග ගිණුමේ ඉතිරිව ඇත**

ඉදිරියේදී එම ශේෂයන් නිවැරදි කිරීමට කටයුතු කෙරේ.

**(ට) වාහන 12 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශන වලට හඳුනාගැනීම අතපසු වීම හේතුවෙන් දේපල පිරියත සහ උපකරණවල පිරිවැය හා සමුච්චිත ක්ෂය වීම අඩුතක්සේරු වී තිබුණි**

වාහන පිලිබඳ සොයාබලා නිසි පරිදි වත්කම් වල හදුනාගැනීමට කටයුතු කෙරේ.

**(ඩ) කැලණිතිස්ස ඒකාබද්ධ මෙහෙයුම් බලාගාරයේ කෙරීගෙන යන කාර්යයන්ට අදාල පිරිවැය ප්‍රාග්ධනීකරණය හේතුවෙන් බලාගාරයේ වටිනාකම රුපියල් මිලියන 17.10 කින් පමණ අධිතක්සේරු වී තිබුණි. තවද මෙම අසම්පූර්ණ වත්කම් සම්බන්ධව ප්‍රාග්ධන වියදම් රුපියල් මිලියන 323.28 ක් සහ ක්ෂයවීම් මිලියන 27.04 ක් සමාලෝචනය කළ වර්ෂය තුළ ආදායම් ප්‍රකාශයට අය කර ඇත**

2021 වර්ෂයේදී නිවැරදි කෙරේ

**(ණ) 2018 සහ 2019 වර්ෂයන්හි නිම කරන ලද වත්කම් වලට අදාළ රුපියල් මිලියන 54.14 ක ක්ෂය වටිනාකම ජනන අංශය විසින් සමාලෝචනය කළ වර්ෂයේ වියදම් වශයෙන් හඳුනාගෙන තිබුණි**

අවධානය යොමු වී ඇති අතර අනාගතයේදී එවැනි වැරදි අවම කිරීම සඳහා පියවර ගනු ඇත.

**(ත) 2015 වර්ෂයේ සිට අවසන් නොවී ඉතිරිව ඇති මිලියන 167.25 ක වටිනාකමින් යුත් ව්‍යාපෘති දෙකක් නිරවුල් කිරීමකින් තොරව කෙරීගෙන යන වැඩ ගිණුමේ පවතින බව පෙන්නුම් කෙරේ.**

අදාළ නිලධාරීන් සමඟ සාකච්ඡා කර ව්‍යාපෘති දෙක සම්බන්ධව කෙරීගෙන යන වැඩ ගිණුමේ ඇති ශේෂය නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇත.

**(ද) තාප විදුලිය මිලදී ගැනීමේ උපචිත වියදම් ලෙස අධිප්‍රතිපාදනයක් සිදු කිරීම හේතුවෙන් සමාලෝචනය කරන ලද වර්ෂය සඳහා වූ පාඩුව බිලියන 0.99 කින් අධිතක්සේරුවී ඇත**

වියදම් ගිණුමේ අතිරික්ත/ ඌණ උපචිත වියදම් ඇතුලත් වීම වැළැක්වීම සඳහා සහතික කළ ඉන්වොයිසි නියමිත වේලාවට ලබා ගැනීමට සහ මාසික ගිණුම් තුල එම ගණුදෙනු නිසිපරිදි ගිණුම්ගත කිරීමට 2021 ජනවාරි මස සිට කටයුතු සූදානම් කර ඇත.

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු

**(ප,බ) සමාලෝචනය කරන ලද වර්ෂය තුළ රුපියල් බිලියන 1.1 කට ගිගාවොට් 77.4 ක පුනර්ජනනීය බලශක්තිය මිලදී ගැනීම පුනර්ජනනීය බලශක්ති මිලදී ගැනීමේ ගිණුමේ සටහන් කර නොමැති අතර 2019 වර්ෂයේදී රුපියල් මිලියන 212 කට ගිගාවොට් 12.2 ක පුනර්ජනනීය බලශක්තිය මිලදී ගැනීම 2020 වර්ෂයේ පුනර්ජනනීය බලශක්ති මිලදී ගැනීම් ගිණුමට හඳුනාගෙන ඇත.**

ලද ඉන්වොයිසි සහ විෂය භාර ඉංජිනේරුවරයා විසින් සකස් කරනු ලබන 'මාසික සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති උත්පාදන වාර්තාව (NCRE) උපයෝගී කරගනිමින් සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති මිලදී ගැනීමේ මාසික උපචිත වියදම තීරණය කෙරේ. අලුතින් ආරම්භ කරන ලද බලාගාර වලින් ඉන්වොයිසි ලැබීමේ ප්‍රමාදයක් පවතින අතර සමහර අවස්ථාවන්හිදී විවිධ හේතූන් මත දැනට ක්‍රියාත්මක වන බලාගාර පවා සැලකිය යුතු ප්‍රමාදයකින් තම ඉන්වොයිසි ඉදිරිපත් කරයි. එබැවින්, තොරතුරු ලද කාලච්ඡේදයේදී ගණුදෙනුව සටහන් වේ. ඒ අනුව 2019 වර්ෂයේ මිලදී ගැනීම් 2021 ජනවාරි මාසය සඳහා වන NCRE උත්පාදන වාර්තාවට ඇතුළත් කර ඇති හෙයින් මෙම ප්‍රමාදවූ ඉන්වොයිසි සමහරක් 2021 ජනවාරි ගිණුම් වලට ඇතුළත් කර ඇත.

**(ම) වසර 15 ක කොන්ත්‍රාත් කාලය අවසන් කළ පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදකයින්ගෙන් 2020 දෙසැම්බර් 31 දක්වා මිලදී ගත් පුනර්ජනනීය බලශක්ති සඳහා ගෙවිය යුතු රුපියල් මිලියන 808 ක් ගිණුම්ගත කර නොතිබුණි**

කල් ඉකුත් වූ පුනර්ජනනීය බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම විවිධ හේතු නිසා කල් ඉකුත් වූ මොහොතේම අළුත් කිරීම සිදු නොකළේය. කෙසේ වෙතත්, අත්සන් කරන ලද ගිවිසුමක් නොතිබුනද මෙම බලාගාර අඛණ්ඩව ක්‍රියාත්මක කෙරිණි. එම නිසා, ගිවිසුමට අදාළ කාලය දීර්ඝ කිරීම පසු අත්සන් තැබීමට යටත්ව ඉන්වොයිසි ලැබුණු විට උපචිත කිරීම සිදු කෙරිණි. එම නිසා, 2020 වර්ෂය සඳහා උපචිත ලෙස 2021 ජනවාරි මාසය සඳහා ගිණුම් ගත කල මුළු එකතුව රුපියල් මිලියන 900 කි.

**(ය) මූල්‍ය ප්‍රකාශන වලට අනුව, සමාලෝචනය කරන ලද වර්ෂය තුළ ප්‍රමාද ගාස්තු සඳහා පොළී ගෙවීම් රුපියල් මිලියන 2,481 කි. නමුත් සහතික කළ ප්‍රමාද පොලී ගෙවීම් ගණනය කිරීම් වලට අනුව එය රුපියල් මිලියන 2,835 කි.**

2020 වර්ෂය සඳහා සහතික කරන ලද ප්‍රමාද වූ පොලී වල වටිනාකම රුපියල් මිලියන 2885 ක් වන අතර (වැඩ පත්‍රිකාව බලන්න) 2019 වර්ෂය හා සම්බන්ධ රුපියල් මිලියන 383 ක අතිරික්ත උපචිත වෙන්කිරීමක් සහ 2020 වර්ෂය සඳහා රුපියල් මිලියන 21 ක ඌන උපචිත වෙන්කිරීමක් 2020 වර්ෂයේ ගිණුම්වල ඇතුළත් විය.

කෙසේ වෙතත්, වියදම් ගිණුමේ අතිරික්ත / ඌන උපචිත වියදම් ඇති වීම වළක්වා ගැනීම සඳහා ඉන්වොයිසි වල සහතික කළ අගයන් උපයෝගී කරගනිමින් ප්‍රමාදවූ පොලී ගණනය කිරීමට 2021 ජනවාරි සිට කටයුතු යොදා ඇත.

**(ර) බැහැර කරන ලද රුපියල් මිලියන 14 ක ස්ථාවර වත්කම් තවමත් සම්ප්‍රේෂණ අංශයේ ස්ථාවර වත්කම් වල සටහන් වී ඇත.**

දේපල පිරියත හා උපකරණ නිවැරදි තොරතුරු සහිතව යාවත්කාලීන කිරීම සඳහා සම්ප්‍රේෂණ අංශයේ සියලුම ශාඛා වලට උපදෙස් දීමට කටයුතු කෙරේ.

**(ල) සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලද රුපියල් බිලියන 2 ක ණය මුදලෙහි පැවැත්ම එම පාර්ශව දෙක අතර ගිවිසුමක් නොමැතිවීම හේතුවෙන් තහවුරු කර ගැනීමට නොහැකි විය.**

2020.02.25 දිනැති අංක 20.03.060 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව ජාතියට අඛණ්ඩව විදුලිය සැපයීමේ අවශ්‍යතාවය සලකා බලා විදුලිබල මණ්ඩලයේ පවතින අයහපත් මූල්‍ය තත්ත්වය හේතුවෙන් කාරක ප්‍රග්ධන අවශ්‍යතා කළමනාකරණය කිරීම වෙනුවෙන් මෙම ණය පහසුකම ලංකා විදුලි (පුද්) සමාගම වෙතින් ලබා ගෙන ඇත. ණය ගිවිසුම අත්සන් කිරීම සඳහා දෙපාර්ශවයම විසින් ණය ගිවිසුම් කෙටුම්පතක් සමාලෝචනය කරමින් පවතී.

**(ව) ගල් අඟුරු නැව්ගත කිරීමේ ගාස්තු සඳහා රුපියල් මිලියන 63.56 ක ප්‍රතිපාදන මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි**

රුපියල් මිලියන 63.56 වු මෙම වියදම පිළිබඳව තවදුරටත් ලංකා ගල් අඟුරු (පුද්) සමාගම සමග සාකච්ඡා කෙරෙමින් පවතින හෙයින් එම මුදල 2020.12.31 දින වන විට ලංචිම ගිණුම් පොත්වල සටහන් කර නොමැත. කෙසේ වෙතත්, මූල්‍ය ප්‍රකාශනා වල දක්වා ඇති සැසඳුම මගින් මෙම වටිනාකම් ප්‍රමාණාත්මකව ඉදිරිපත් කර ඇති අතර 2020 සඳහා වූ ගිණුම් අවසන් කිරීමෙන් පසු, 2021.03.22 දින රුපියල් 22,520,185.72 ක මුදලක් පියවා ඇත.

**(ස) විදුලිබල මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන 2013 වසරේ සිට අඛණ්ඩව ප්‍රතිප්‍රකාශනය සිදු කෙරේ.**

මූල්‍ය ප්‍රකාශන ප්‍රතිප්‍රකාශනය කිරීම ප්‍රධාන වශයෙන් සිදු කරනුයේ ලංචිම තුළ මෙහෙයුම් වල සංකීර්ණතාව සහ ගනුදෙනු වල පරිමාව හේතුවෙනි. කෙසේ වෙතත්, මූල්‍ය ප්‍රකාශන ප්‍රතිප්‍රකාශනය වැළැක්වීම සඳහා අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීමට කටයුතු කෙරේ.

**(හ) රුපියල් මිලියන 557.94 ක හර ශේෂයක් සහ රුපියල් මිලියන 556.81 ක බැර ශේෂයක් 2020.12.31 දිනට අන්තර් අංශ ජංගම ගිණුමේ ශේෂය ලෙස පවතී. මෙම අගය නිෂ්කාශනය වීමකින් තොරව 2002 වර්ෂයේ සිට පැවත එනු ලැබේ.**

බෙදා හැරීම් අංශ විමධ්‍යගතකරණය සිදු වූ 2002 වර්ෂයේ සිට එකී ශේෂය ඉදිරියට ගෙන එන ලදී. අදාල ලියකියවිලි සොයා ඒවා ඉවත් කිරීමට කටයුතු කෙරේ.

**(ළ) රුපියල් මිලියන 1.25 ක ණය සැකසුම් ගාස්තුවක් ආදායම් ප්‍රකාශයට කපා හැරීම වෙනුවට අය කර තිබුණි**

2021 අප්‍රේල් මාස ගිණුම් වලින් මෙය නිවැරදි කර ඇත.

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු

**1.2.3.3 නොසැසඳුනු වෙනස්කම්**

**(අ) 2020 දෙසැම්බර් 31 දින වන විට ලංවිමෙහි මුල්‍ය ප්‍රකාශන වල ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ගෙවිය යුතු ලෙස දක්වා ඇති ශේෂය සහ ඒ වන විට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මුල්‍ය ප්‍රකාශන වල ලැබිය යුතු ලෙස දක්වා ඇති ශේෂය අතර වෙනස රුපියල් මිලියන 753.61 ක් ලෙස නිරීක්ෂණය විය.**

ඉහත සඳහන් ශේෂය තෙල් සංස්ථාවට ගෙවිය යුතු ලෙස ලංවිම මුල්‍ය ප්‍රකාශනවල වල දක්වා නැති අතර එය තෙල් සංස්ථාවට ද දන්වා ඇත. කෙසේ වෙතත්, තෙල් සංස්ථාව සිය මුල්‍ය ප්‍රකාශන වල ලංවිම මඟින් ලැබිය යුතු පොලී ලෙස පෙන්නුම් කර ඇති අතර එයට විදුලිබල මණ්ඩලය එකඟ නොවේ. ගැටලු විසඳීම සඳහා තෙල් සංස්ථාව, ලංවිම, භාණ්ඩාගාරය සහ විදුලිබල අමාත්‍යාංශයේ නියෝජිතයින් සමඟ රැස්වීමක් සංවිධානය කිරීමට විදුලිබල අමාත්‍යාංශයේ පැවති විගණන කමිටු රැස්වීමේදී තීරණය කර ඇත.

**(ආ) බිල්පත් ක්‍රමයේ සහ මුල්‍ය ප්‍රකාශනවල වල යම් යම් ශේෂයන් අතපසු වීම හේතුවෙන් බෙදාහැරීම් අංශ 01, 02, 03 සහ 04 හි 2020.12.31 දිනට තොග වෙළඳ ණයගැති ගිණුමේ හා බිල්පත් පද්ධතියේ ශේෂය අතර නොසැසඳුනු ශේෂය රුපියල් මිලියන 41.18 කි. තවද, 2012 වසරේ සිට හඳුනා නොගත් රුපියල් මිලියන 423.76 ක ශේෂයක් ඉතිරි වී තිබේ**

සියලු බෙදාහැරීම් අංශ විසින් ණයගැති සැසඳුම් ප්‍රකාශ සකස් කර ගිණුම් වාර්ථා සමඟ ඉදිරිපත් කෙරේ.

**(ඇ) රැස් කිරීම් පාලන ගිණුමේ 2020.12.31 දිනට පැවති රුපියල් මිලියන 2,343 ක හර ශේෂය සහ රුපියල් මිලියන 149 ක බැර ශේෂයට අදාලව සැසඳුමක් විගණනයට ඉදිරිපත් කර නොමැත**

මෙම වෙනස්කම් පැන නැගී ඇත්තේ සාමාන්‍ය සැපයුම් බිල්පත් චක්‍රයේ අවසන් දිනය මුල්‍ය ප්‍රකාශන දිනයෙන් වෙනස්වීම හේතුවෙනි.එම නිසා 2021 වර්ෂයේදී සාමාන්‍ය සැපයුම් බිල්පත් චක්‍රයේ දිනය ගිණුම්කරන දිනය හා සමාන කිරීමට කටයුතු කර ඇත.

**(ඈ) රුපියල් මිලියන 117.58 ක අවිනිශ්චිත ශේෂයේ ස්වභාවය හඳුනා ගැනීම සඳහා කාල විශ්ලේෂණය සහ විස්තරාත්මක සටහන් ඉදිරිපත් කර නොතිබුණි.**

වෙළඳ ණය ගැතියන් සම්බන්ධ තොරතුරු, පද්ධතිය තුළින් උත්පාදනය කෙරේ. කෙසේ වෙතත්, පවතින පද්ධතිය තුළින් අවිනිශ්චිත ශේෂයන් සඳහා කාල විශ්ලේෂණයකට පහසුකම් සපයන්නේ නැත. එබැවින් බෙදා හැරීමේ අංශ 2 සහ 4 අවිනිශ්චිත ශේෂයේ කාල විශ්ලේෂණය අතින් සකස් කරන අතර එය දුෂ්කර ක්‍රියාවලියකි. එම නිසා අනාගතයේදී අවිනිශ්චිත ශේෂය සඳහා කාල විශ්ලේෂණයක් සකස් කිරීමට කටයුතු කෙරේ.

**(ඉ) මණ්ඩලය විසින් පාරිභෝගිකයා සඳහා වැරදි ගාස්තු ක්‍රමවේදයක් යෙදීම හේතුවෙන් 2019 වසරේ සිට රුපියල් මිලියන 38.76 ක මුදලක් හිඟව පවතී.**

මෙම ගැටලුව විසඳීම සඳහා කමිටුවක් පත් කර ඇත.එහි කාර්යයන් තවමත් සිදු වෙමින් පවති

**(ඊ) තාප බල ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින් සඳහා ගෙවිය යුතු ශේෂය ලෙස මුල්‍ය ප්‍රකාශනවල වල දක්වා ඇති ශේෂය සහ ගෙවීමට ඇති සහතික කළ ඉන්වොයිසි වල එකතුව අතර රුපියල් බිලියන 5.9 ක වෙනසක් දක්නට ලැබුණි**

L-5806 - 'ගෙවිය යුතු ස්වාධීන තාප බල නිෂ්පාදකයන්ගේ ගිණුම යනු 2020 වර්ෂයේ L - 5920' උපචිත ගිණුමෙන් වෙන්කර ගත් කොටසකි. අයිපීපී තාප විදුලි බලාගාර වලින් සෑම මසකම ලැබුණු ඉන්වොයිසි අගයන් උපයෝගී කරගනිමින් මෙම ගිණුමට සටහන් තබනු ලබන අතර ගෙවීම සඳහා සහතික කරන අවස්ථාවේදී මෙම ශේෂයන් ගලපයි. මෙම ගිණුමෙහි 2020 වසර අවසානයේදී ලෙජර් ශේෂය සහ සහතික කළ හිඟ ඉන්වොයිසි එකතුව අතර වෙනස රුපියල් බිලියන 5.6 ලෙස හදුනා ගෙන ඇත. ඒ අනුව එය උපචිත වියදම් අධි වෙන්කිරීමක් ලෙස ගිණුම්වලින් ලියා හැරීමට නියමිතය

කෙසේ වෙතත්, සහතික කළ අගයන් උපයෝගී කරගනිමින් උපචිත වියදම් හදුනාගැනීමට කල් ඇතිව ඉන්වොයිසි සහතික කිරීම සඳහා විධි විධාන 2021 ජනවාරි මස සිට සකස් කර ඇත. එබැවින් ඉදිරියට මෙම ශේෂ දෙක අතර වෙනසක් සිදු නොවේ

**1.3 මුල්‍ය ප්‍රකාශන සඳහා කළමනාකරණයේ සහ පාලන කටයුතු වල වගකීම දරන අයගේ වගකීම**

දැන ගැනීම සඳහා

**1.4 මුල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකවරුන්ගේ වගකීම**

දැන ගැනීම සඳහා

**2. අනෙකුත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තා**

**2.1 මණ්ඩලය විසින් එහි බලතල , කර්තව්‍යයන් සහ යුතුකම් වලින් බැහැරව ඉටු කරනු ලබන කාර්යයන්**

දැන ගැනීම සඳහා



**එම්.එම්.සී. ප්‍රදීනාන්දු**
සභාපති
ලංකා විදුලිබල මණ්ඩලය



**ඉංජිනේරු. එම්.ආර්. රණතුංග**
සමාන්‍යාධිකාරී
ලංකා විදුලිබල මණ්ඩලය

# විගණකාධිපති වාර්තාව ලංවිම මූල්‍ය ප්‍රකාශන

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } පී.ඕ.ඊ/සී/සී.ඊ.බී/එෆ්.ඒ/1/20/12 ඔබේ අංකය / உமது இல. / Your No } දිනය / திகதி / Date } 2021 අගෝස්තු 05

**සභාපති**
**ලංකා විදුලිබල මණ්ඩලය**

**ලංකා විදුලිබල මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ලංකා විදුලිබල මණ්ඩලයේ ("මණ්ඩලය") 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

**1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (එස්.එල්.ඒ.එස්/ එස්.එල්.එෆ්.ආර්.එස්) සහ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල වීම.**

**(අ) මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්ප රාමුව**

i. සංකල්ප රාමුවේ 4.1 (ආ) ඡේදයට පටහැනිව, මණ්ඩලයේ නිශ්චිත ආදායම් අයිතමයන්හි පිරිවැය සහ ඉපැයීම් අතර සෘජු සම්බන්ධයක් නොමැති සහ වෙනම ආයතනයක පරිපාලන වියදම් වූ රු. මිලියන 43.97 ක වියදමක් මණ්ඩලය සිය ආදායම් ප්‍රකාශනයේ වියදම් ලෙස හඳුනාගෙන තිබුණි.

ii. 4.3 ඡේදයට පටහැනිව, මණ්ඩලයට ආර්ථික ප්‍රතිලාභ ගලා නොයන සහ වත්කම්වල පාලන බලය හා අයිතිය මණ්ඩලය සතු රු. මිලියන 8 ක් වටිනා වත්කම් වෙනත් ආයතනයක් විසින් ප්‍රයෝජනයට ගෙන තිබුණි.

iii. වත්කමේ අයිතිය හා සම්බන්ධ ලිපි ලේඛන නොමැති වීම හේතුවෙන් ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල පිහිටි ඉඩමේ අයිතිය තහවුරු කර ගැනීමට නොහැකි විය.

**(ආ) එල්.කේ.ඒ.එස් 2 - තොග සහ එල්.කේ.ඒ.එස් 16 - දේපළ, පිරියත හා උපකරණ**

ඉහත ප්‍රමිතිවල විධිවිධාන අනුව තත්‍ය පිරිවැය යොදා ගැනීම වෙනුවට සිය ප්‍රාග්ධන හා නඩත්තු කාර්යයන්හි පොදු කාර්ය පිරිවැය තක්සේරු කිරීම සඳහා මණ්ඩලය විසින් ප්‍රමිත පිරිවැය ක්‍රමය යොදා ගනු ලබයි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, එකතුව රු. බිලියන 2.61 ක් වූ හිතකර පොදු කාර්ය අනුපාත විචලනයන් මූල්‍ය ප්‍රකාශනවලට ගෙනැවිත් තිබුණි.

එහි ප්‍රතිඵලයක් වශයෙන්, ප්‍රාග්ධන කාර්යයන් සම්බන්ධව ඉහළ මූල්‍ය මැදිහත් වීම හේතුවෙන් මණ්ඩලයේ මෙහෙයුම් ප්‍රතිඵල, වත්කම් සහ ස්කන්ධයට සැලකිය යුතු බලපෑමක් කර ඇත. කෙසේ වෙතත්, එම ප්‍රාග්ධන කාර්යයන්වලට අදාළ අවශ්‍ය තොරතුරු නොලැබීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය.

**(ඇ) එල්.කේ.ඒ.එස් 16 - දේපළ, පිරියත හා උපකරණ**

සම්ප්‍රේෂණ අංශයේ රු. බිලියන 172.2 ක් වූ ස්ථාවර වත්කම් අතුරින් රු. බිලියන 171.2 ක ස්ථාවර වත්කම් සමාලෝචිත වර්ෂය තුළදී භෞතිකව සත්‍යාපනය කර නොතිබුණි.

**(ඈ) එල්.කේ.ඒ.එස් 37 - ප්‍රතිපාදන, අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම්**

ලබා දුන් අධිකරණ තීන්දුව සහ ඊට අදාළ අභියාචනය පරිදි ගෙවිය යුතු රු. මිලියන 50 ක මුදල මණ්ඩලය විසින් හෙළිදරව් කර නොතිබුණි.

# විගණකාධිපති වාර්තාව
# ලංවිම මූල්‍ය ප්‍රකාශන

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

**1.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

මණ්ඩලය විසින් අඛණ්ඩව ප්‍රයෝජනයට ගනු ලබන, සම්පූර්ණයෙන් ක්ෂය වූ ජංගම නොවන වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 2.4.6 (ඉ) සහ 3 (ඈ) සඳහන් පරිදි සමාලෝචනය කර ඉදිරිකාලීනව ගලපා නොතිබුණි. නිදසුනක් වශයෙන්, සම්පූර්ණයෙන් ක්ෂය වූ රු. බිලියන 187.58 ක දේපළ, පිරියත හා උපකරණ තත්‍ය ආයු කාලය තක්සේරු නොකර තවදුරටත් භාවිතා කරමින් සිටියි.

**1.2.3 ගිණුම්කරණ අඩුපාඩු**

(අ) රු. මිලියන 189.54 ක හර ශේෂයක් (තොග හිඟය) සහ රු. මිලියන 114.64 ක බැර ශේෂයක් (තොග අතිරික්තය) නිරවුල් නොකර වසරකට වඩා වැඩි කාලයක් තිස්සේ තොග ගැලපුම් ගිණුමේ පැවතුණි.

(ආ) 2010 ඔක්තෝබර් 13 දිනැති කැබිනට් තීරණ අංක 10/2434/423/034 හි අවශ්‍යතාවයන්ට අනුකූලව ලක්විජය බලාගාරය ඉදිකිරීම සඳහා ලබාගත් රු. බිලියන 159.18 ක් වූ මුළු ණය මුදල ලංකා ගල් අඟුරු සමාගමට (එල්.සී.සී) භාණ්ඩාගාරය විසින් පැවරිය යුතු අතර ණය ගෙවීම සඳහා අවශ්‍ය මුදලට සමාන මුදලක් මණ්ඩලය විසින් එල්.සී.සී වෙත ගෙවිය යුතුය. භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කරන ලද 2014 සැප්තැම්බර් 30 දිනැති අංක PE/EN/CEB/Equity/2014 දරන ලිපිය අනුව, මෙම ණය මණ්ඩලයේ සෘජු ණය ලෙස සැලකිය යුතුය. කෙසේ වෙතත්, කිසිදු උප ණය ගිවිසුමකට මහා භාණ්ඩාගාරය සමඟ එළඹ වී නොමැති වුවත් මහා භාණ්ඩාගාරයෙන් ලබා ගත් ණය ලෙස මණ්ඩලය මෙම ණය වාර්තා කර තිබුණි. එම නිසා, මෙම ණයවල පැවැත්ම සැක සහිත වන අතර මෙම ණය ගෙවීම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම ගණනය කළ නොහැක.

තවද, භාණ්ඩාගාරය විසින් ගෙවනු ලැබූ රු. බිලියන 3.56 ක පොලී ගෙවීම ඇතුළුව රු. බිලියන 20.5 ක සහ රු. බිලියන 3.15 ක පොලී ගෙවීම ඇතුළුව රු. බිලියන 20.54 ක ණය ගෙවීම් පිළිවෙලින් මණ්ඩලයේ ස්කන්ධයට 2019 දී සහ 2020 දී මාරු කර තිබුණි. කෙසේ වෙතත්, ස්කන්ධයට මාරු කරන ලද පොලිය මණ්ඩලය විසින් ආදායම් ප්‍රකාශයට පොලී වියදමක් ලෙස ඇතුළත් කර තිබූ අතර එම වියදම මණ්ඩලය විසින් නොදරන ලදී. එම නිසා, 2019 සහ 2020 වසරවල අලාභය පිළිවෙලින් රු. බිලියන 3.56 කින් සහ රු. බිලියන 3.15 කින් වැඩියෙන් දැක්වුණි.

තවද, රජයේ අනුමැතිය සහ ඇපවීම් සහිතව මණ්ඩලයට ලබා දුන් ණයවලට අදාළව ශ්‍රී ලංකා රුපියල නැවත ඇගයීම සම්බන්ධව යම් අලාභයක් හෝ ලාභයක් ලදහොත් එය විකාබද්ධ අරමුදලට අය කළ යුතු අතර එම අලාභය හෝ ලාභය රජය විසින් දරනු ලබන බවට 1969 අංක 17 දරන විදුලිබල මණ්ඩල පනතේ 42 (6) වගන්තියේහි සඳහන්ව තිබියේදී මණ්ඩලය විසින් 2019 සහ 2020 වර්ෂයන්හිදී පිළිවෙලින් රු. බිලියන 11.89 ක සහ රු. මිලියන 20.86 ක විනිමය අලාභයක් ආදායම් ප්‍රකාශයට අය කර තිබුණි. එම නිසා, 2019 සහ 2020 වසරවල අලාභය පිළිවෙලින් රු.බිලියන 11.89 කින් සහ රු. මිලියන 20.86 කින් වැඩියෙන් දැක්වුණි.

(ඇ) ව්‍යාපෘති සඳහා 2014 දෙසැම්බර් 31 න් පසුව විදේශ ණයවලින් ලද රු. බිලියන 25.23 ක් මහා භාණ්ඩාගාරයෙන් ලද උප ණය ලෙස මණ්ඩලය විසින් වාර්තා කර තිබුණු අතර මෙම ණය 2014 දෙසැම්බර් 31 න් පසුව භාණ්ඩාගාර මූල්‍ය ප්‍රකාශනවල උප ණය ලෙස හඳුනාගෙන නොතිබුණි. තවද 2015 මාර්තු 18 දින ගත් කැබිනට් තීරණ අංක 15/0228/613/012 ට අනුව මෙම ණය ආපසු ගෙවීම මණ්ඩලය වෙත පවරා තිබුණි. කෙසේ වෙතත්, මෙම ණය සඳහා වාරික ගෙවීම සහ පොලී ගෙවීම මණ්ඩලය විසින් සිදු කර නොතිබුණු අතර වෙන්කිරීමක් හෝ කර නොතිබුණි. එම නිසා, මෙම ණයවල පැවැත්ම සැක සහිත වන අතර, ආපසු ගෙවීමේ කොන්දේසි (වාරික සහ පොලී ගෙවීම) පිළිබඳ මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම ගණනය කළ නොහැක.

(ඈ) කිසිදු උප ණය ගිවිසුමකට මහා භාණ්ඩාගාරය සමඟ එළඹ වී නොමැති වුවත් එකතුව රු. බිලියන 54.71 ක් වූ විදේශ ණය හයක් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල මහා භාණ්ඩාගාරයෙන් ලැබී ඇති ණය වශයෙන් හඳුනාගෙන තිබුණි. එම නිසා මෙම ණය වල පැවැත්ම සැක සහිත වන අතර මෙම ණය ගෙවීම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම ගණනය කළ නොහැක.

(ඉ) 2013 වසරට පෙර රාජ්‍ය ආයතනවලට විදුලි ජනක යන්ත්‍ර, සෝපාන සහ වායුසමීකරණ යන්ත්‍ර සැපයීම, නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කිරීම සඳහා මණ්ඩලය විසින් කරනු ලබූ කාර්යයන් ඒවායේ ඉන්වොයිසි වටිනාකම් මත පදනම්ව ගිණුම්ගත කිරීම වෙනුවට, පිරිවැය අනුව තක්සේරු කර තිබූ අතර ඒ අනුව ගිණුම්ගත කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ලැබිය යුතු දෑ සහ රඳවාගත් ඉපැයීම් රු. මිලියන 66.99 ක් බැගින් අඩුවෙන් දැක්වුණි. මෙම හිඟ ශේෂයන් සහ ඉන්වොයිසි පිළිබඳ පියවීම් විස්තර 2020 දෙසැම්බර් 31 දිනට මණ්ඩලය විසින් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඊ) 2016 වර්ෂයේ බදු ලෙස මහා භාණ්ඩාගාරය වෙත ගෙවනු ලැබූ රු. බිලියන 5 න් රු. මිලියන 500 ක් සමාලෝචිත වර්ෂය තුළදී කළමනාකරණ ගාස්තු ගෙවීම ලෙස ආදායම් ප්‍රකාශනයට ක්‍රමක්ෂය කර තිබුණු අතර රු. බිලියන 1.5 ක් රඳවා ගත් ඉපැයීම්වලට අය කර තිබුණි. ඉතිරි මුදල වන රු. බිලියන 3.0 ක් හිමිකම් ප්‍රකාශනයට අය කිරීම වෙනුවට මූල්‍ය ප්‍රකාශනයේ වෙනත් ණය ගැතියන් ලෙස දැක්වේ. කෙසේ වෙතත්, මණ්ඩලය විසින් මහා භාණ්ඩාගාරයෙන් කළමනාකරණ සේවාවන් ලබාගෙන නොතිබුණි. එම නිසා, වර්ෂයේ අලාභය රු. මිලියන 500 කින් වැඩියෙන් දැක්වුණි.

(උ) සම්පූර්ණ කරන ලද රු. බිලියන 6.18 ක් වටිනා කාර්යයන් 7,546 ක් බෙදාහැරීම් අංශවල වත්කම්වලට මාරු නොකර කෙරිගෙන යන වැඩ ගිණුමේ පවතී. එම වත්කම්වලට අදාළ ක්ෂයවීම් ආදායම් ප්‍රකාශනයට අය කර නොතිබුණි.

(ඌ) 2012 දී නිම කරන ලද ඉහළ කොත්මලේ ජල විදුලි ව්‍යාපෘතියට අදාළ මුළු පිරිවැය වූ රු. මිලියන 979.88 ක් ප්‍රාග්ධනීත කිරීම වෙනුවට කෙරිගෙන යන වැඩ ගිණුමේ තවදුරටත් ඇතුළත් වී තිබුණි. එම නිසා, සමාලෝචිත වර්ෂය සඳහා ක්ෂය වීම සහ රඳවා ගත් ඉපැයීම් පිළිවෙලින් රු. මිලියන 27.99 කින් සහ රු. මිලියන 195.98 කින් අඩුවෙන් දැක්වුණි.

(එ) 2014 වර්ෂයේදී නිම කරන ලද පුත්තලම ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතිය සඳහා මිලදී ගත් වාහනවල මුළු පිරිවැය රු. මිලියන 179.19 ක් වූ අතර එය ප්‍රාග්ධනීත කිරීම වෙනුවට කෙරිගෙන යන වැඩ ගිණුමේ තවදුරටත් ඇතුළත් වී තිබුණි. එම නිසා, රඳවා ගත් ඉපැයීම් රු. මිලියන 179.19 කින් අඩුවෙන් දැක්වුණි.

# විගණකාධිපති වාර්තාව
# ලංවිම මූල්‍ය ප්‍රකාශන

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ඒ) කපා හරින ලද ශේෂයන්ට එරෙහිව තොග ගනුදෙනුකරුවන්ගෙන් ලැබුණු එකතුව රු. මිලියන 18.76 ක් වූ පොලී ආදායම, වැට් බදු සහ අධිභාර, ණයගැති ගිණුමට බැර කර තිබුණි. එම නිසා ණයගැති ශේෂයන් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි.

(ඔ) වීදි ආලෝකකරණ නඩත්තු වියදම් වලින් අය කර ගත නොහැකි රු. මිලියන 30.56 ක් වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඕ) රු. මිලියන 29.97 ක ගෙවිය යුතු ශේෂය කොළඹ නගර කාර්යාලයේ එකතු කිරීමේ පාලන ගිණුමට වැරදි ලෙස හර කර තිබුණි. එම නිසා ණයගැති ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි.

(ක) සමාලෝචිත වර්ෂයේ ආදායම ලෙස 2021 ජනවාරි 01 සිට 2021 ජනවාරි 15 දක්වා කාලයට අදාළ ආදායම හඳුනාගැනීම හේතුවෙන් විවිධ ණයගැති ශේෂය රු. මිලියන 585.69 කින් වැඩියෙන් දැක්වුණි. එම නිසා, වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි.

(ග) හිමිකම් කිව හැකි කාල සීමාව ඉක්ම වූ රු. බිලියන 1.57 ක් වූ ආර්ථික සේවා ගාස්තුව (ඊ.එස්.සී) ආදායම් ප්‍රකාශනයට අය කර නොතිබුණි. එම නිසා, අලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි.

(ච) අසාමාන්‍ය බැර ශේෂයන් හිලවු වීම හේතුවෙන් බෙදාහැරීම් අංශවල කෙරිගෙන යන වැඩ ශේෂය රු. මිලියන 52.06 කින් අඩුවෙන් දැක්වුණි.

(ජ) අදාළ වියදම්වලට මාරු නොකර රු. මිලියන 912.69 ක් අවුරුද්දකට වඩා වැඩි කාලයක් තිස්සේ මාර්ගස්ථ තොග ගිණුමේ පවති. එම නිසා, අලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි. තවද, අසාමාන්‍ය බැර ශේෂය වූ රු. මිලියන 245.53 ක් මාර්ග ස්ථ තොග ගිණුමේ නිරවුල් නොකර පවති.

(ට) මූල්‍ය ප්‍රකාශනවල වාහන 12 ක වටිනාකම් මඟ හැරීම හේතුවෙන් දේපළ, පිරියත හා උපකරණවල පිරිවැය හා සමුච්චිත ක්ෂය අඩුවෙන් දැක්වුණි.

(ඩ) කැලණිතිස්ස Combined Cycle විදුලි බලාගාරය හා සම්බන්ධ අසම්පූර්ණ වත්කම්වල වියදම් ප්‍රාග්ධනීත කිරීම හේතුවෙන් විදුලි බලාගාරයේ වටිනාකම රු. මිලියන 175.10 කින් වැඩියෙන් දැක්වුණි. තවද මෙම අසම්පූර්ණ වත්කම් සම්බන්ධව ප්‍රාග්ධන වියදම් රු. මිලියන 323.28 ක් සහ ක්ෂයවීම් රු. මිලියන 27.04 ක් සමාලෝචිත වර්ෂය තුළදී ආදායම් ප්‍රකාශනයට අය කර තිබුණි. එම නිසා වර්ෂයේ අලාභය රු. මිලියන 350.32 කින් වැඩියෙන් දැක්වුණු අතර කෙරිගෙන යන වැඩ ශේෂය රු. මිලියන 498.38 කින් අඩුවෙන් දැක්වුණි.

(ණ) 2018 සහ 2019 වර්ෂයන්හි නිම කරන ලද වත්කම්වලට අදාළ ක්ෂයවීම් රු.මිලියන 54.14 ක් සමාලෝචිත වර්ෂය තුළදී ජනන අංශයේ වියදමක් ලෙස හඳුනාගෙන තිබුණි. එම නිසා, සමාලෝචිත වර්ෂයේ අලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි.

(ත) 2015 වර්ෂයේ සිට අවසන් නොවී පවතින රු. මිලියන 167.25 ක් වටිනා ව්‍යාපෘති දෙකක් නිරවුල් නොකර කෙරිගෙන යන වැඩ යටතේ පෙන්වයි.

(ද) උපචිත තාප විදුලිය මිලදී ගැනීම්වලට අදාළව කර ඇති අධික ප්‍රතිපාදන හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අලාභය රු. බිලියන 0.99 කින් වැඩියෙන් දැක්වුණි.

(ප) ගිගාවොට් 77.2 ක පුනර්ජනනීය බලශක්ති මිලදී ගැනීම් මඟ හැරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අලාභය රු. බිලියන 1.1 කින් අඩුවෙන් දැක්වුණි.

(බ) 2019 වර්ෂය තුළදී රු. මිලියන 212 ක් වූ ගිගාවොට් 12.2 ක පුනර්ජනනීය බලශක්ති මිලදී ගැනීම් 2020 වර්ෂයේ පුනර්ජනනීය බලශක්ති මිලදී ගැනීමේ ගිණුමට ඇතුළත් කර තිබුණි. එම නිසා වර්ෂයේ අලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි.

(ම) වසර 15 ක කොන්ත්‍රාත් කාලය අවසන් වූ පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදකයින්ගෙන් 2020 දෙසැම්බර් 31 දක්වා පුනර්ජනනීය බලශක්ති මිලදී ගැනීම වෙනුවෙන් ගෙවිය යුතු රු. මිලියන 808 ක් ගිණුම්ගත කර නොතිබුණි. එම නිසා, වර්ෂයේ අලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි.

(ය) මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රමාද වී ගෙවීමේ පොලිය රු.මිලියන 2,481 ක් වූ අතර සමාලෝචිත වර්ෂය සඳහා සහතික කරන ලද ප්‍රමාද වී ගෙවීමේ පොලී ගණනය කිරීම්වලට අනුව එය රු. මිලියන 2,885 ක් විය. එම නිසා වර්ෂයේ අලාභය රු. මිලියන 404 කින් අඩුවෙන් දැක්වුණි.

(ර) අපහරණය කරන ලද රු. මිලියන 14 ක් වූ ස්ථාවර වත්කම් සම්ප්‍රේෂණ අංශයේ ස්ථාවර වත්කම්වල තවදුරටත් දැක්වුණි.

(ල) පාර්ශව දෙක අතර ගිවිසුමකට එළඹ වී නොමැතිවීම හේතුවෙන් 2020 මාර්තු මාසයේදී සම්බන්ධිත පාර්ශවයකුගෙන් ලද රු. බිලියන 2 ක ණය මුදලෙහි පැවැත්ම තහවුරු කර ගැනීමට නොහැකි විය. එම නිසා, ණය ආපසු ගෙවීමේදී මූල්‍ය තත්වයට ඇති කරන බලපෑම ගණනය කළ නොහැක.

(ව) ගල් අඟුරු නැව්ගත කිරීමේ ගාස්තු සඳහා රු. මිලියන 63.56 ක ප්‍රතිපාදනයක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. එම නිසා, එම වර්ෂයේ අලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි.

(ස) මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු වන පරිදි පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ. කෙසේ වෙතත්, මණ්ඩලය විසින් ස්ථාපිත කර ඇති අභ්‍යන්තර පාලනයේ දුර්වලතා හේතුවෙන් 2013 වර්ෂයේ සිට මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩව යළි පිළියෙල කර තිබුණි.

# විගණකාධිපති වාර්තාව
# ලංවිම මූල්‍ය ප්‍රකාශන

(හ) 2020 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 557.94 ක හර ශේෂයක් සහ රු. මිලියන 556.81 ක බැර ශේෂයක් 2002 වර්ෂයේ සිට නිරවුල් නොකර අන්තර් අංශවල ජංගම ගිණුමේ ශේෂයන් ලෙස පැවතුණි.

(අඅ) ආදායම් ප්‍රකාශනයට අය කිරීම වෙනුවට රු. මිලියන 1.25 ක ණය සැකසුම් ගාස්තුවක් ණය ශේෂයට අය කර තිබුණි. එම නිසා, සමාලෝචිත වර්ෂයේ අලාභය සහ ණය ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි.

### 1.2.4 නොසැසඳු වෙනස්කම්

(අ) 2020 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ගෙවිය යුතු ලෙස දක්වා ඇති ශේෂය සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවල එදිනට ලැබිය යුතු ලෙස දැක්වෙන ශේෂය අතර රු. මිලියන 753.61 ක වෙනසක් නිරීක්ෂණය විය. තවද, මෙය 2013 සිට අඛණ්ඩව විගණන වාර්තාවල අවධාරණය කර තිබියෙදීත් 2020 දෙසැම්බර් 31 දින වන විටත් මෙම ආරවුල නිරවුල් කර නොතිබුණි.

(ආ) බිල්පත් ක්‍රමයේ මෙන්ම මූල්‍ය ප්‍රකාශන වලද යම් යම් ශේෂයන් මඟහැරීම හේතුවෙන් බෙදාහැරීම් අංශ 01, 02, 03 සහ 04 හි බිල්පත් ක්‍රමයේ දක්වා ඇති 2020 දෙසැම්බර් 31 දිනට තොග වෙළඳ ණයගැතියන්ගේ ශේෂයන් සහ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති අනුරූප ශේෂයන් අතර එකතුව රු. මිලියන 41.18 ක් වූ එකඟ නොවූ වෙනස්කම් නිරීක්ෂණය විය. තවද, 2012 වසරේ සිට හඳුනා නොගත් රු. මිලියන 423.76 ක ශේෂයක් පවතී.

(ඇ) 2020 දෙසැම්බර් 31 දිනට එකතු කිරීමේ පාලන ලෙජර් ගිණුමේ හර සහ බැර වශයෙන් පවතින රු. මිලියන 2,343 ක සහ රු. මිලියන 149 ක ශේෂය සංසන්ධනය කිරීම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එම නිසා, එකතු කිරීමේ පාලන ගිණුමේ ඇති ශේෂයේ නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය.

(ඈ) ශේෂයේ ස්වභාවය හඳුනා ගැනීම සඳහා රු. මිලියන 117.58 ක අවිනිශ්චිත ශේෂයට අදාළ විස්තරාත්මක ලේඛනයක් සහ වයස් විශ්ලේෂණයක් ඉදිරිපත් කර නොතිබුණි.

(ඉ) මණ්ඩලය විසින් පාරිභෝගිකයා සඳහා වැරදි ගාස්තු ක්‍රමයක් යෙදීම හේතුවෙන් 2019 සිට රු. මිලියන 38.76 ක් අයවිය යුතුව පවතී.

(ඊ) ස්වාධීන තාප බලශක්ති නිෂ්පාදකයින්ට ගෙවිය යුතු මුදලට අදාළව මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ශේෂය සහ නොපිය වූ සහතික කළ ඉන්වොයිසිවල එකතුව අතර රු. බිලියන 5.9 ක වෙනසක් නිරීක්ෂණය විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මණ්ඩලයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන මණ්ඩලයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මණ්ඩලයේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

### 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු වන පරිදි පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

# විගණකාධිපති වාර්තාව
# ලංවිම මූල්‍ය ප්‍රකාශන

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලය විසින් මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි  නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව  විගණනයේ කොටසක් ලෙස මා විසින්  විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයක් අනාවරණය කර නොගැනීම මඟින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, වරදවා දැක්වීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ කළමනාකරණය විසින් කරන ලද ගිණුම්කරන ඇස්තමේන්තුවල සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව අඛණ්ඩ පැවැත්ම පදනම් කරගත් ගිණුම්කරණය පිළිබඳ කළමනාකරණයේ යොදාගැනීම පිළිබඳ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

  මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

### 2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම්  මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 විගණන නිරීක්ෂණ ඡේද අංක 1.2.1 (අ), (i), (ii), (ආ), (ඇ), 1.2.2, 1.2.3 (අ), (ආ), (ඇ), (ඈ), (ඉ), (ඊ), (උ), (ඌ), (එ), (ච), (ස), (හ),  1.2.4 (අ), (ආ), (ඇ) සහ (ඈ) හැර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා  ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සමඟ සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12  (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට, මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද පොදු සහ විශේෂ  විධානවලට අනුකූල  නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

# විගණකාධිපති වාර්තාව ලංවිම මූල්‍ය ප්‍රකාශන

| නීතියට / විධානයට යොමුව | විස්තරය |
|---|---|
| (අ) සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 7 (1) සහ 43 (1) වගන්තිය. | නියාමකගෙන් බලය ලබා නොගෙන, උත්පාදන බලපත්‍රයක් ලබා නොගත් ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින් තිදෙනෙකුගෙන් (අයි.පී.පී) සමාලෝචිත වර්ෂය තුළදී රු. බිලියන 18.91 ක් වූ ගිගාවොට් 732.192 ක බලශක්ති මිලදී ගෙන තිබුණි. |
| (ආ) සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 7 (1), 43 (2) සහ 43 (7) වගන්තිය. | විදුලි බලය මිළදී ගැනීමේ ගිවිසුම (පී.පී.ඒ) සඳහා අනුමැතිය ලබා නොගෙන, 2019 වර්ෂය තුළදී මාස හයක කාලයක් සඳහා උත්පාදන බලපත්‍රය ප්‍රදානය නොකරන ලද විදුලිබල නිෂ්පාදකයින්ගෙන් මෙගාවොට් 100 ක අතිරේක විදුලිබල ධාරිතාවක් මිලදී ගෙන තිබුණි. එය 2020 පෙබරවාරි සිට මාස 6 ක කාලයක් සඳහා දීර්ඝ කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී රු. බිලියන 3.26 ක් වූ ගිගාවොට් 78.669 ක බලශක්ති මිලදී ගෙන තිබුණි. |
| (ඇ) 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනත, 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ 46 සහ 11 (අ) හා (ආ) වගන්තිය. | 2020 දෙසැම්බර් 31 දිනට රක්ෂණ එස්ක්‍රෝ අරමුදලේ මණ්ඩලය විසින් රු. මිලියන 8,996 ක් පමණක් ආයෝජනය කර තිබුණි. එහෙත් 1989 සිට සෑම වර්ෂයක් අවසානයේ දී දළ ස්ථාවර වත්කම්වල මුළු වටිනාකමෙන් සියයට 0.1 ක දායකත්වයක් එම අරමුදලට මාරු කළ යුතු බව සඳහන් වේ. සමාලෝචිත වර්ෂය තුළදී රු. බිලියන 1.2 ක් ආයෝජනය කළ යුතුය. |
| (ඈ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද පී.ඊ.ඩී 12 චක්‍රලේඛයේ 9.4 වගන්තිය. | විධිවිධානයට පටහැනිව, රේඛීය අමාත්‍යාංශය සහ මණ්ඩලයේ අර්ථසාධක අරමුදල සඳහා නිදහස් කරන ලද සේවකයන් 56 ක් සඳහා වැටුප් සහ අනෙකුත් ගෙවීම් ලෙස සමාලෝචිත වර්ෂය තුළදී මණ්ඩලය විසින් රු. මිලියන 79.13 ක් ගෙවා තිබුණි. |
| (ඉ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 1994 ජූනි 14 දිනැති පී.ඊ.ඩී 95 චක්‍රලේඛය සහ අමාත්‍යාංශයේ විගණන කමිටුවේදී 2020 සැප්තැම්බර් 25 දින ගත් තීරණය. | විධිවිධානවලට හා තීරණවලට පටහැනිව, 2020 වර්ෂයේදී ලබා නොගත් නිවාඩු සඳහා ගෙවීම් ලෙස රු.බිලියන 1.2 ක් ගෙවා තිබුණි. |
| (ඊ) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක පනතේ 47 වන වගන්තිය. | විධිවිධානයට පටහැනිව, ඉපැයීම් ගණනය කිරීමේදී නික්මයාමේ දීමනාව, පශ්චාත් උපාධි දීමනාව සහ වෘත්තීය දීමනාව /අර්ධ වෘත්තීය දීමනාව යන දීමනා අතුරින් ඉහළම දීමනාව මණ්ඩලය විසින් සැලකිල්ලට ගෙන තිබුණි. |
| (උ) 2007 ජනවාරි 10 දින සී.ස වෙස්ට් කෝස්ට් පවර් (පුද්.) සමාගම සමඟ එළඹී විදුලි බලය මිලදී ගැනීමේ ගිවිසුමේ 6.1.3 වගන්තිය. | මණ්ඩලය විසින් මණ්ඩලයේ කාර්මික පාරිභෝගිකයින්ට කිලෝවොට් 220 ක ධාරිතාවක් යටතේ විදුලිබල සැපයුමක් කරනු ලබන අවස්ථාවේදී එම විදුලිබල සැපයුමට අදාළ වන නියම හා කොන්දේසි නොමැති නම්, කිලෝවොට් 220ක ධාරිතාවක් යටතේ මණ්ඩලය විසින් සමාගමට සපයනු ලබන විදුලිබල ශක්තිය, සමාගම විසින් මණ්ඩලයට විදුලිබල සැපයුමක් කරනු ලබන අවස්ථාවේදී සමාගම විසින් අයකරනු ලබන විදුලිබල පිරිවැය යටතේ සමාගමෙන් අය කෙරේ. විධිවිධානයට පටහැනිව, ධාරිතා ගාස්තුව සහ අනෙකුත් ගාස්තු නොසලකා සමාගමට මණ්ඩලය විසින් සපයනු ලබන විදුලිබල ශක්තියේ අනුපාතය ගණනය කිරීම සඳහා මණ්ඩලය විසින් බලශක්ති ගාස්තුව පමණක් සැලකිල්ලට ගෙන ඇත. |
| (ඌ) 2018 ඔක්තෝබර් 3 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය | රජයේ ආයතන සතු පොරොත්තු ජනක යන්ත්‍ර උපයෝගී කර ගැනීම පිළිබඳ අමාත්‍ය මණ්ඩලයේ තීරණය ක්‍රියාත්මක කිරීමට මණ්ඩලය අපොහොසත් වී ඇත. |

**2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.**

(අ) 2007 නොවැම්බර් 14 දින අමාත්‍ය මණ්ඩලය ගත් තීරණය සහ 2009 මැයි 26 දිනැති අංක 39 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට වරින් වර විවිධ කාර්ය මණ්ඩල දීමනා ගෙවා තිබුණි. විගණන නියැදි පරීක්ෂණවලදී, එවැනි දීමනා එකතුව රු. මිලියන 1,544.4 ක් සහ රු. මිලියන 1,712 ක් පිළිවෙලින් 2020 සහ 2019 වර්ෂයන්හිදී ගෙවා තිබූ බව හෙළිදරව් විය.

(ආ) වැටුප් සංශෝධනය කරන අවස්ථාවකදී 2007 දෙසැම්බර් 13 වන දින අමාත්‍ය මණ්ඩලය විසින් ගෙන ඇති තීරණය සහ 2015 මැයි 20 වන දින සාමූහික ගිවිසුම සලකා බලන විට, උපයන විට ගෙවන (PAYE) බදු/ අත්තිකාරම් පුද්ගල ආදායම් බදු (APIT)

# විගණකාධිපති වාර්තාව
# ලංවිම මූල්‍ය ප්‍රකාශන

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

වගකීම සේවකයින් වෙත මාරු කර තිබුණි. කෙසේවෙතත්, 2010 සිට 2020 දක්වා කාල සීමාව තුළ අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ ඉහත තීරණවලට සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක 2016/3 දරන චක්‍රලේඛයට පටහැනිව අදාළ සේවකයින්ගේ වැටුපෙන් අඩු නොකර මණ්ඩලය විසින් සිය අරමුදලෙන් රු. බිලියන 4.98 ක PAYE/ APIT බදු ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී බදු මත බදු ගාස්තු රු. මිලියන 5.48 ක් ඇතුළත්ව එසේ ගෙවා ඇති මුදල රු. මිලියන 57.04 ක් විය.

(ඈ) 1998 මාර්තු 08 දිනැති අංක 130 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අනුව සියයට 10 සිට සියයට 14 දක්වා පොලී අනුපාත යටතේ වාහන ණය ලබා දීම වෙනුවට මණ්ඩලය විසින් සියයට 4.2 ක පොලී අනුපාතයක් යටතේ මෙම ණය ලබා දී තිබුණි. තවද, මණ්ඩලය දැඩි ද්‍රවශීලතා ගැටලුවලට මුහුණ දී සිටියෙදීත් කිසිදු පාලනයකින් තොරව කාර්ය මාණ්ඩල ණය ගෙවා ඇති බව නිරීක්ෂණය විය.

(ඇ) සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 24 (1) (ඇ) වගන්තියේ අවශ්‍යතාවයන් සලකා බැලීමෙන් තොරව දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්ම අනුව විදුලි බලාගාර ක්‍රියාත්මක නොවීම සහ තාප විදුලිය කෙටි කාලීන පදනමින් මිලදී ගැනීම නිසා, විදුලි බලය සඳහා සාධාරණ ලෙස කලින් සිතා ගත් ඉල්ලුම සපුරාලීමට උත්පාදනය කිරීමේ පිරියතෙන් ලබා ගත හැකි ප්‍රමාණවත් ධාරිතාවක් ඇති බවට සහතික වීමට මණ්ඩලය (සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා) අසමත් වී ඇත.

(ඉ) 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 28 (3) වගන්තියේ දක්වා ඇති පරිදි මණ්ඩලය පාරිභෝගික තැන්පතු සඳහා පොලිය ගෙවා නොතිබූ අතර, 2020 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් වාර්තා කරන ලද අනුපාතය මත පදනම්ව විගණනය මඟින් කරන ලද ගණනය කිරීම්වලට අනුව ඒ සඳහා ගෙවිය යුතු පොලිය රු. මිලියන 1,613 ක් වූ අතර 2020 දෙසැම්බර් 31 වන දිනට නොගෙවූ සමුච්චිත පොළිය රු. මිලියන 6,731.90 ක් විය.

**2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.**

(අ) සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතට අනුව, 2013 අගෝස්තු 6 න් පසුව සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති (NCRE) ව්‍යාපෘති සඳහා ප්‍රමිත ගාස්තු යොදා ගැනීම වෙනුවට ප්‍රසම්පාදන පටිපාටි අනුගමනය කළ යුතුය. කෙසේ වෙතත්, NCRE ව්‍යාපෘති සඳහා එකතුව මෙගාවොට් 390 ක ධාරිතාවයකින් යුත් ප්‍රසම්පාදන 7 ක් පමණක් 2020 දෙසැම්බර් 31 දින දක්වා ආරම්භ කර ඇති අතර 2020 දෙසැම්බර් 31 දිනට එකතුව මෙගාවොට් 24 ක ධාරිතාවයකින් යුත් විදුලි බලාගාර පමණක් ක්‍රියාත්මක කරන ලදී.

(ආ) මෙගාවොට් 1 ක ධාරිතාවයකින් යුත් සූර්ය විදුලි බලාගාර 60 ක් ප්‍රසම්පාදනය සඳහා 2017 පෙබරවාරි 20 දින යෝජනා ඉල්ලීම් (ආර්.එෆ්.පී) කැඳවන ලදී. විදුලි බලාගාර 38 ක් සඳහා පමණක් ලංසු 65 ක් ලැබුණු අතර සාර්ථක ලංසුකරුවන් 36 දෙනා අතුරින් විදුලි බලාගාර 35 ක් සඳහා කිලෝවොට් පැයකට රු. 12.73 ක සිට කිලෝවොට් පැයකට රු. 18.37 ක් දක්වා වූ අනුපාත පරාසයක් යටතේ අභිප්‍රාය ලිපි නිකුත් කර තිබුණි. විදුලි බලාගාර ක්‍රියාත්මක කිරීමේ දීර්ඝ කරන ලද දිනය 2020 දෙසැම්බර් 31 දිනට හෝ ඊට පෙර දිනයක් වුවද 2020 දෙසැම්බර් 31 දිනට විදුලි බලාගාර 20 ක් පමණක් ක්‍රියාත්මක විය.

(ඇ) 2018-2037 දීර්ඝකාලීන විදුලි ජනන සැලැස්මට අනුව, සීතාවක ගඟ ජල විදුලි ව්‍යාපෘතිය 2022 වන විට ක්‍රියාත්මක කළ යුතුය. ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් (පී.එම්.යූ) 2016 සැප්තැම්බර් මාසයේදී ස්ථාපිත කළ අතර ශක්‍යතා අධ්‍යයනය, සවිස්තරාත්මක සැලසුම් කිරීම සහ කෙටුම්පත් ටෙන්ඩර් ලේඛන සකස් කිරීම වැනි කටයුතු සිදු කළේය. මෙම ව්‍යාපෘතිය මඟින් 2020 වර්ෂය අවසානයේදී රු. මිලියන 289 ක මුළු වියදමක් දරා තිබුණි. කෙසේ වෙතත්, 2020 දෙසැම්බර් 20 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ව්‍යාපෘති කටයුතු අවසන් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණි. තවද, ඉහත ව්‍යාපෘතිය සී.ස ශ්‍රී ලංකා බලශක්ති (පුද්) සමාගම හරහා සංවර්ධනය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණු අතර එසේම මෙම කොන්ත්‍රාත්තුව “තනි ප්‍රභව ප්‍රසම්පාදනයක්” ලෙස එම සමාගමට ප්‍රදානය කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට 2021 පෙබරවාරි 23 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී තීරණය කර තිබුණි. එම නිසා, මෙම අධ්‍යයන ආයෝජකයින් සමඟ බෙදා ගැනීමට නොහැකි නම් ව්‍යාපෘතිය සඳහා වැය කළ රු. මිලියන 289 ක් මණ්ඩලයේ වියදමක් ලෙස පවතින බව නිරීක්ෂණය විය.

(ඈ) සූර්ය විදුලි බලාගාර සඳහා රු. 23.10 ක ස්ථාවර අනුපාතයක්, ප්‍රමිත ගාස්තුවක් ලෙස අමාත්‍ය මණ්ඩලය විසින් 2014 මාර්තු 07 දින අනුමත කරන ලදී. සංශෝධිත 2009 අංක 20 දරණ විදුලිබල පනතට අනුව, 2013 අගෝස්තු 6 න් පසුව සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා ප්‍රමිත ගාස්තු යොදා ගැනීම වෙනුවට ප්‍රසම්පාදන පටිපාටි අනුගමනය කළ යුතුය. කෙසේ වෙතත්, ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළින් තීරණය කරන ලද මිල ගණන් භාවිතා කිරීම වෙනුවට 2016 සහ 2017 දී එම ප්‍රමිත ගාස්තු යටතේ මෙගාවොට් 10 බැගින් වූ ධාරිතාවයෙන් යුත් සූර්ය විදුලි බලාගාර පහක් ක්‍රියාත්මක විය. (විදුලි බලය මිළදී ගැනීමේ ගිවිසුම් 2014 දී අත්සන් කරන ලදි). නව සූර්ය විදුලි බලාගාර සඳහා (1මෙ.වො x 60) 2017 වර්ෂයේදී සිදු කරන ලද ප්‍රසම්පාදනයන්හිදී තීරණය කරන ලද මිල ගණන් රු. 12.73 සිට රු. 18.37 දක්වා වූ පරාසයක පැවතුණු බව නිරීක්ෂණය විය.

(ඉ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළින් තීරණය කරන ලද මිල ගණන් භාවිතා කිරීම වෙනුවට 2013 අගෝස්තු 6 න් පසුව ක්‍රියාත්මක කරන ලද එකතුව මෙගාවොට් 135.62 ක ධාරිතාවයකින් යුත් ජෛව ගෑස් විදුලි බලාගාර, දැව තාප විදුලි බලාගාර, කුඩා ජල විදුලි බලාගාර සහ සුළං විදුලි බලාගාර ව්‍යාපෘති සඳහා 2014 මාර්තු 07 දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රමිත ගාස්තු යොදා ගෙන තිබුණි. (විදුලි බලය මිළදී ගැනීමේ ගිවිසුම් 2013 අගෝස්තු 6 න් පසුව අත්සන් කරන ලදී).

(ඊ) 2013 අගෝස්තු 6 න් පසුව සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා ප්‍රසම්පාදන පටිපාටිය අනුගමනය කළ යුතුව තිබියෙදී. කිලෝවොට් පැයට රු. 36.20 ක ගාස්තුවක් යටතේ (වසර 20 ක් සඳහා ස්ථාවර ගාස්තුව) අපද්‍රව්‍ය

# විගණකාධිපති වාර්තාව
# ලංවිම මූල්‍ය ප්‍රකාශන

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

බලශක්තියට හැරවීමේ තාක්ෂණය මත පදනම්ව ක්‍රියාත්මක කිරීමට නියමිත නාගරික ඝන අපද්‍රව්‍ය විදුලි බලාගාර පහක් සඳහා 2017 දී අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණි. එක් ඝන අපද්‍රව්‍ය විදුලි බලාගාරයක් සඳහා විදුලි බලය මිලදී ගැනීමේ ගිවිසුම 2020 දෙසැම්බර් මාසයේදී අත්සන් කරන ලදී. කිලෝවොට් පැයකට මුළු ගාස්තුව රු. 36.20 ක් මණ්ඩලය දරනු ලබන අතර අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව එයින් රු.13.10 ක් භාණ්ඩාගාරයෙන් ප්‍රතිපූරණය කළ යුතුය.

## 2.3 වෙනත් කරුණු

(අ) 2020 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 42,358 ක් වූ වෙළඳ ණයගැති ශේෂය අතුරින්, සාමාන්‍ය සහ තොග සැපයුම්වලට අදාළව රු. මිලියන 5,122 ක් වූ ණය ශේෂය වසරකට වැඩි කාලයක් තිස්සේ අයවිය යුතුව පැවතුණු අතර ඉන් රු. මිලියන 2,671 ක් වසර පහකට වඩා වැඩි කාලයක් තිස්සේ අයනොවී පැවතුණි.

(ආ) 2020 දෙසැම්බර් 31 දිනට විවිධ ණය ගැතියන්ගෙන් එකතුව රු. බිලියන 3.21 ක් වූ ණය ශේෂයන් වසරකට වඩා වැඩි කාලයක් තිස්සේ අයනොවී පැවතුණි.

(ඇ) වත්කම් කළමනාකරණ අංශය විසින් සෝපාන, වායුසමීකරණ යන්ත්‍රය සහ විදුලි ජනක යන්ත්‍ර සැපයීම වෙනුවෙන් රජයේ ආයතනයවලින් ලැබිය යුතු දෑ යටතේ පෙන්වා ඇති රු. මිලියන 115 ක් වසර පහකට වඩා වැඩි කාලයක් තිස්සේ අය කර ගැනීමෙන් තොරව පැවතී.

(ඈ) ගල් අඟුරු හිඟය සඳහා ලංකා ගල් අඟුරු සමාගමෙන් අයවිය යුතු රු. මිලියන 714.96 ක මුදලක් වසර පහකට වඩා වැඩි කාලයක් තිස්සේ කිසිදු අයකර ගැනීමේ පියවරක් නොගෙන හිඟව පැවතුණි.

(ඉ) 2020 දෙසැම්බර් 31 දිනට එකතුව රු. බිලියන 4.3 ක් වූ පහත සඳහන් ණය ශේෂයන් දීර්ඝ කාලයක් තිස්සේ අයනොවී පැවතුණි.

| **ණයහිමියාගේ නම** | **වටිනාකම රු.** |
|---|---|
| රේගුව | 1,065,828 |
| චීන යන්ත්‍රෝපකරණ ඉංජිනේරු සංස්ථාව | 3,034,971,432 |
| ගෙවිය යුතු උද්දේශිත ලාභාංශ (deemed dividend) බද්ද | 1,270,766,413 |

(ඊ) නොදර්න් පවර් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ් වෙත ගෙවිය යුතු රු. බිලයන 2.9 ක මුදලක් වසර දෙකකට වඩා වැඩි කාලයක් නිරවුල් කිරීමට කටයුතු කිරීමෙන් තොරව සම්ප්‍රේෂණ අංශයේ වෙළඳ ණය හිමියන් ලෙස පැවතුණි.

(උ) 2020 ඔක්තෝබර් 16 දිනට රු.බිලියන 1.04 ක් වටිනා මෙට්රික් ටොන් 51,439.64 ක ගල් අඟුරු තොගයේ හිඟයක් හඳුනාගෙන ඇතත් භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් 2020 දෙසැම්බර් 31 දිනට භෞතික සත්‍යාපනයක් සිදු කර නොතිබුණි. කෙසේ වෙතත්, 2020 දෙසැම්බර් 31 දිනට රු. බිලියන 1.04 ක් වටිනා මෙට්‍රික් ටොන් 51,439.64 ක ගල් අඟුරු තොගයේ හිඟයක් ලෙස ආදායම් ප්‍රකාශනයට ගලපා තිබුණි. එම නිසා, 2020 දෙසැම්බර් 31 දිනට පවත්නා රු. බිලියන 9.99 ක් වටිනා ගල් අඟුරු තොගයේ නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය.

තවද, 2019 දෙසැම්බර් 31 දක්වා ගල් අඟුරු හිඟය ලෙස පැවතුණු රු. බිලියන 3.2 ක් සහ ගල් අඟුරු අතිරික්තයක් ලෙස පැවතුණු රු. බිලියන 1.3 ක් 2020 ඔක්තෝම්බර් 06 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මත රඳවා ගත් ඉපැයීම්වලට අය කර තිබුණි.

(ඌ) මණ්ඩලය විසින් LECO වෙත විදුලිය විකිණීම සහ වසර ගණනාවක් තිස්සේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් ඉන්ධන මිලදී ගැනීම සිදු කළ ඇතත්, මෙම ආයතන දෙක අතර සුමට ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා එම පාර්ශව දෙක සමඟ එළඹ විකුණුම් හා මිලදී ගැනීමේ ගිවිසුම් නොතිබුණි.

(එ) අරමුදල් කාලිනව උපයෝජනය නොකිරීම හේතුවෙන් මණ්ඩලයේ විදේශ අරමුදල් සපයන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ලබා දී ඇති ණයවලින් බැඳීම් ගාස්තු ලෙස 2020 දී රු. මිලියන 92.69 ක මුදලක් ණය දෙන ආයතනය විසින් අඩු කර තිබුණි. කෙසේ වෙතත්, ගණනය කිරීම් ලබා ගැනීමට නොමැති බැවින් බැඳීම් ගාස්තු වල නිරවද්‍යතාවය සත්‍යාපනය කළ නොහැක.

(ඒ) 2018 - 2037 දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්මට අනුව, 2018, 2019 සහ 2020 වර්ෂයන් තුළදී පිළිවෙලින් එකතුව මෙගාවොට් 500 ක, මෙගාවොට් 657 ක සහ මෙගාවොට් 430 ක ධාරිතාවයකින් යුත් නව විදුලි ජනන බලාග ාර ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, සැලසුම් කරන ලද මෙගාවොට් 1,587 ක නව ධාරිතාවයෙන් එකතුව මෙගාවොට් 275.8 ක ධාරිතාවයකින් යුත් විදුලි බලාගාර පමණක් ක්‍රියාත්මක කර තිබුණි. එම නිසා, නව විදුලි ජනන බලාගාර ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සැලකිය යුතු ලෙස අඩු වී තිබුණු අතර සැලසුමේ අරමුණ වූ අඩු පිරිවැයකින් යුත් විදුලි බලය සැපයීම ඉටු වී නොමැත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාලෝචිත වර්ෂය තුලදී රු. බිලියන 22.2 ක් වූ ගිගාවොට් පැය 811 ක හදිසි විදුලිබලයක් ලෙස මිලදී ගෙන තිබුණි.

(ඔ) අවුරුදු තුනක ප්‍රමාදයක් සහිතව 2017 අප්‍රේල් මාසයේදී උතුරු වසන්තය ව්‍යාපෘතිය යටතේ 2014 දී හඳුනාගත් රු. මිලියන 39.55 ක තොග හිඟය සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන ශාඛාව විසින් විශේෂ පරීක්ෂණයක් පවත්වා තිබුණි. කෙසේ වෙතත්, මෙම වාර්තාවේ දිනය වන විටත් රු. මිලියන 2.5 ක හිඟයට වගකිව යුතු නිලධාරියාට එරෙහිව විධිමත් පරීක්ෂණයක් පවත්වා නොතිබුණි. තවද, රු. මිලියන 39.55 ට එරෙහිව රු. මිලියන 31.25 ක් 2020 දී ලෙජර් ගිණුම්වලට ගලපා තිබුණි. භාණ්ඩ අවුරුදු 6 කට පසුව ලද බව දන්වමින් අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව විසින් 2015 දී ත්‍රිකුණාමලයේ මහේස්ත්‍රාත්

# විගණකාධිපති වාර්තාව
# ලංවිම මූල්‍ය ප්‍රකාශන

ජාතික විගණන කාර්යාලය
NATIONAL AUDIT OFFICE

උසාවියේ නඩුවක් (නඩු අංක ඊ / 1164/15) ගොනු කර තිබුණි. කෙසේ වෙතත්, මෙම තොග හිඟයේ ප්‍රමාදය සඳහා වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඕ) විධිමත් පරීක්ෂණය අවසන් වී තිබියදීත්, වත්කම් කළමනාකරණ අංශයේ (බලාගාරය) 2006 නොවැම්බර් 20 සිට 2012 පෙබරවාරි 20 දක්වා කාලය තුළ සිදුවී ඇති රු. මිලියන 3.67 ක තොග හිඟයට වගකිව යුතු පුද්ගලයාට එරෙහිව මණ්ඩලය විසින් 2018 අගෝස්තු 16 වන දින දක්වා කඩිනම් පියවර ගෙන නොතිබුණි. තවද, එම සේවකයාම මණ්ඩලයේ වෙනත් කාර්යාලයක වංචාවක් සිදු කර ඇති අතර, පෙර වංචාව සැලකිල්ලට ගැනීමෙන් තොරව වංචාවේ වටිනාකම ලෙස රු. 99, 155 ක් පමණක් අය කර ගැනීමෙන් පසුව ඔහුගේ රාජකාරිය අවසන් කර ඇත.

(ක) පරීක්ෂණය සඳහා පත්කළ කමිටුව නිර්දේශ කර පරිදි අලාභ අයකර ගැනීමෙන් තොරව රු. මිලියන 3.79 ක තොගය හිඟය සඳහා වගකිය යුතු නිලධාරියකුට 2011 ඔක්තෝබර් 15 වන දින විශ්‍රාම යාමට අවසර දී තිබුණි. තවද, කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමෙන් තොරව ඉහත සඳහන් ප්‍රමාණාත්මක මුදල ගිණුම් පොත්වල පැවතුණි. පැහැර හරින්නාට විශ්‍රාම ගැනීමට අවසර දුන් නිලධාරීන්ට එරෙහිව පියවර නොගෙන මෙම මුදල කපා හැරීමට මණ්ඩලය කටයුතු කරමින් සිටියි.

(ග) ජනන අංශයේ කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ ගිණුමේ 2018 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 260.48 ක ශේෂයක් කිසිදු චලනයකින් තොරව පවතී.

(ච) සමාලෝචිත වර්ෂය තුළදී ජනන අංශයේ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් ක්‍රියාකාරකම් 76 අතුරින් ක්‍රියාකාරකම් 16 ක් පමණක් සාක්ෂාත් කරගෙන තිබුණි.

(ජ) රු. බිලියන 63.55 ක් වු වේලිවල (dams) අයිතිය පවරා ගැනීම සඳහා මණ්ඩලය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ට) 2020 දෙසැම්බර් 31 දිනට රු. බිලියන 26.75 ක් වු පරිභෝජනයට ගත හැකි මුළු තොගයෙන් සියයට 10 ක් නියෝජනය වන රු. බිලියන 2.67 ක තොග සෙමින් චලනය වන, චලනය නොවන සහ පළුදු වු තොග ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. මේ තරම් චලනය නොවන සහ සෙමින් චලනය වන තොග පවත්වාගෙන යාමෙන් හානි, රඳවා ගැනීමේ පිරිවැය සහ වංචාවන් ආදිය වැඩි වීමට හේතු විය හැකිය.

(ඩ) සී.ස ඒස් පවර් ඇඹිලිපිටිය (පුද්.) සමාගම සමඟ එළඹී විදුලිබලය මිළදි ගැනිමේ ගිවිසුම අනුව අවම සහතික කළ බලශක්ති ප්‍රමාණය (එම්.ජී.ඊ.ඒ) වසරකට කිලොවොට් පැය 697,674,432 ක් වුවද, සමාලෝචිත වර්ෂය තුළදී ඒකකයකට රු. 24.42 ක පිරිවැයක් යටතේ කිලොවොට් පැය 475,831,835 ක බලශක්තියක් සපයා ගන්නා ලදි. ඒ අනුව, සමාලෝචිත වර්ෂය තුළදී සපයා නොගත් කිලොවොට් පැය 221,842,597 ක බලශක්තිය සඳහා ධාරිතා ගාස්තු ගෙවා ඇත. කෙටිකාලීනව දකුණු පළාතට බලශක්ති සැපයීම සඳහා මාතරට මෙගාවොට් 20 ක, හම්බන්තොටට මෙගාවොට් 24 ක සහ ගාල්ලට මෙගාවොට් 24 ක ධාරිතාවක් සපයා ගැනීම සඳහා විදුලි බලය මිලදී ගැනීමේ ගිවිසුම් අත්සන් කර තිබුණි. ඒ අනුව, මෙම බලාගාරවලින් එකතුව රු. බිලියන 4.07 ක පිරිවැයකට එකතුව කිලෝවොට් පැය 130,526,364 ක බලශක්තියක් සමාලෝචිත වර්ෂය තුළදී සපයා ගෙන තිබුණි. එකකයක සාමාන්‍ය විකුණුම් මිල රු. 16.72 ක් වන විට මෙම බලාගාරවල ඒකකයක පිරිවැය පිළිවෙලින් රු. 28.30 ක්, රු. 36.84 ක් සහ රු. 39.52 ක් විය. එම නිසා, මෙම බලාගාරවලින් මිලදී ගත් බලශක්තිය ඇඹිලිපිටිය බලාගාරයෙන් සපයා ගත හැකිව තිබු අතර බලශක්ති මිලදී ගැනීමේ අධික පිරිවැය අඩු කිරීමට හැකිව තිබුණි. තවද, අධික පිරිවැයකට හදිසි විදුලි බලාගාර භාවිතා කිරීම වෙනුවට උපරිම ඉල්ලුම සපුරාලීම සඳහා මණ්ඩලයට අයත් බලාගාර ක්‍රියාත්මක කළ යුතුය.

(ණ) 2020 වර්ෂය සඳහා වළකාලන ලද පිරිවැය ක්‍රමය (avoided cost method) මත කුඩා ජල විදුලි බලාගාරවලට අදාළ ගාස්තුව තෙත් කාලය සඳහා රු. 19.51 ක් සහ වියළි කාලය සඳහා රු. 21.25 ක් විය. වළකාලන ලද පිරිවැය ක්‍රමය තාප විදුලි බලාගාර යැවුම් (dispatch) මත පදනම් වන අතර එය ඉන්ධන පිරිවැය අනුව වෙනස් වේ. එම නිසා, එම ක්‍රමය මත තීරණය වූ ගාස්තුව කුඩා ජල විදුලි බලාගාරයක තත්‍ය පිරිවැයට කිසිදු සම්බන්ධයක් නොමැත. ජල විදුලි බලාගාරයක සාමාන්‍ය ඒකක පිරිවැය රු. 10 ට වඩා අඩු විය යුතු බව සහ මණ්ඩලයේ ජල විදුලි බලාගාරයක ඒකකයක පිරිවැය රු.2.49 ක් බව නිරීක්ෂණය විය. තවද, එය සාමාන්‍ය ඒකක විකුණුම් මිල වන රු. 16.72 ඉක්මවා ඇත.

**ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න**
විගණකාධිපති

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු

**2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය අනුව 2020 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා ලංකා විදුලි බල මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්ථාවට පිළිතුරු**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්වාගණනය කල මතය**

දැන ගැනීම සඳහා

**1.2 මතය සඳහා පදනම**

**1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රී ලං ගි ප්‍ර/ ශ්‍රී ලං මු වා ප්‍ර) සහ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල වීම**

**(අ) මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්ප රාමුව**

**(ii) සංකල්ප රාමුවේ 4.1 (ආ) සහ 4.3 ජේදයට පටහැනිව වෙනමම ආයතනයක පරිපාලන වියදම් වන රුපියල් මිලියන 43.97 ක වියදම ලංවිම විසින් දරනු ලබන අතර මිලියන 8 ක් වන ලංවිම වත්කම්වල අයිතිය වෙනත් ආයතනයක් විසින් භාවිතා කර තිබුනි**

ලංකා විදුලිබල මණ්ඩල පනතේ 12 (ජේ) වගන්තිය මඟින් අර්ථසාධක හා විශ්‍රාම වැටුප් අරමුදල් ස්ථාපිත කිරීමේ බලය මණ්ඩලයට පවරා ඇත. එබැවින්, විදුලිබල මණ්ඩල සේවකයින් සඳහා අර්ථසාධක අරමුදල පිහිටුවීම ලංවිම තීරණයක් වේ.

2003 දෙසැම්බර් 31 දින ගැසට් කරන ලද අර්ථසාධක අරමුදල් රීති වල අංක 5 දරන වගන්තියට අනුව, අරමුදලේ කළමනාකරණය සහ පරිපාලනය සිදු කරනු ලබන්නේ මණ්ඩලය විසින් පත් කරන ලද කළමණාකරන කමිටුවක් විසින් බැවින් අරමුදල කළමනාකරණය කිරීම හා පරිපාලනය කිරීම මණ්ඩලයේ වගකීම වේ. එබැවින් අරමුදල කළමනාකරණය කිරීමේ සහ පරිපාලනය කිරීමේ පිරිවැය ජනනය වුයේ විදුලිබල මණ්ඩලය තුලිනි.

තවද, එම රීති වල අංක 20 (i) වගන්තියට අනුව, නිවාස ණය පරීක්ෂා කිරීම හා සම්බන්ධ වියදම් හැර අරමුදලේ සියලුම පරිපාලන වියදම් විදුලිබල මණ්ඩලය විසින් දරනු ලබන අතර මෙම ප්‍රතිපත්තිය අරමුදලේ ආරම්භයේ සිටම ක්‍රියාත්මක විය(1969 නොවැම්බර් 1 දා සිට). එබැවින් අර්ථසාධක අරමුදල වෙනුවෙන් ලංවිම විසින් දරන ලද පිරිවැය, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන වල සටහන් නොවේ.

2021 පෙබරවාරි 11 දින පැවති අරමුදලේ කළමනාකරණ කමිටු රැස්වීමට මෙම කරුණ ඉදිරිපත් කරන ලද අතර එම කමිටුව තීරණය කළේ වර්තමාන ප්‍රතිපත්තිය අඛණ්ඩව කරගෙන යාමට සහ ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල එකඟතාවක් ලබා ගැනීමටයි. ඒ අනුව ලංවිම අධ්‍යක්ෂ මණ්ඩලයට මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කළ අතර ඒ පිළිබඳව විස්තරාත්මකව සලකා බැලීමෙන් අනතුරුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අරමුදලේ කළමනාකරණ හා පරිපාලනය වියදම් දැරීමේ වර්තමාන ප්‍රතිපත්තිය අඛණ්ඩව කරගෙන යාමට අනුමැතිය ලබා දී ඇත.

**iii. වත්කම් වල අයිතිය සම්බන්ධ ලිපි ලේඛන නොමැති වීම හේතුවෙන් ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ ඉඩමේ අයිතිය තහවුරු කර ගැනීමට නොහැකි වී තිබේ.**

ලංවිම ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ ඉඩමේ අයිතිය සඳහා අදාළ ලියකියවිලි නොමැති අතර එම නිසා විදුලිබල මණ්ඩල මූලස්ථාන ගොඩනැගිල්ලේ අයිතිය තහවුරු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලෙස විදුලිබල මණ්ඩලය ඉඩම් කොමසාරිස්වරයාගෙන් ඉල්ලා ඇත.

**(ආ) ශ්‍රී ලං ගි ප්‍ර-2 තොග සහ ශ්‍රී ලං ගි ප්‍ර-16 - දේපළ පිරියත හා උපකරණ**

**ලංවිම සිය ප්‍රග්ධන හා නඩත්තු කාර්යයන් වල පොදු කාර්යය පිරිවැය තක්සේරු කිරීම සඳහා සම්මත පිරිවැය ක්‍රමය ක්‍රියාත්මක කරයි**

ප්‍රාග්ධන කාර්යය සඳහා කලින් තීරණය කළ වාර්ෂික අනුපාතයකට අනුව පොදුකාර්යය පිරිවැය අන්තර්ග්‍රහනය සිදු කරනු ලබන්නේ විදුලිබල මණ්ඩලයේ බෙදා හැරීම් අංශවල පමණි. ප්‍රග්ධන කාර්යන්ට සෘජුවම සම්බන්ධ වන සෑම ඒකකයකම අයවැය ගත පිරිවැය මත පදනම්ව මෙම වාර්ෂික පොදුකාර්යය පිරිවැය අන්තර්ග්‍රහන අනුපාතය ගණනය කෙරේ. බෙදා හැරීම් අංශවල සත්‍ය පිරිවැය සමඟ අයවැයගත පිරිවැය සංසන්දනය කළ විට, දැරූ සත්‍ය පිරිවැය අයවැය පිරිවැයට වඩා 10% ඉක්මවා ඇති බව හඳුනාගෙන ඇත. එබැවින් දැනට භාවිතා කරන අවශෝෂණ අනුපාතය සාධාරණය.

**(ඇ) ශ්‍රී ලං ගි ප්‍ර-16 - දේපළ පිරියත හා උපකරණ**

**සම්ප්‍රේෂණ අංශයේ රුපියල් බිලියන 172.2 ක් වූ ස්ථාවර වත්කම් වලින් රුපියල් බිලියන 171.2 ක ස්ථාවර වත්කම් සමාලෝචිත වර්ෂය තුළ භෞතිකව සත්‍යාපනය කර නොමැත**

චංචල ස්ථාවර වත්කම් සියල්ලටම අදාළ භෞතික සත්‍යාපනය සාර්ථකව සිදු කර ඇති අතර වාර්තා විගණනයේ අවධානය පිණිස ලබා දී ඇත. තවද නිශ්චල වත්කම් තුල ඇතුලත් වන්නේ දැනට රටේ අඛණ්ඩ විදුලි බල සැපයුමක් සැපයීමේදී භාවිතා කරනු ලබන විදුලි සම්ප්‍රේෂණ ජාලයේ අත්‍යාවශ්‍ය අංගයන් වන සම්ප්‍රේෂණ මාර්ග, යන්ත්‍ර උපකරණ හා සම්බන්ධ නිශ්චල වත්කමිය.

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු

**(ඈ) ශ්‍රී ලං ගි ප 37- ප්‍රතිපාදන, අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම්**

**ලබා දුන් අධිකරණ තීන්දුව සහ ඒ අනුව ගොනු කල අභියාචනය පරිදි ගෙවිය යුතු රුපියල් මිලියන 50 ක මුදල සම්බන්ධයෙන් මණ්ඩලය විසින් හෙළිදරව් කිරීම් කර නොතිබුණි.**

විදුලිය අනිසි ලෙස භාවිතා කිරීම ගැන පුවත්පත්වල පළ කිරීම හේතුවෙන් පැමිණිලිකාරයාගේ කීර්ති නාමයට හානි පමුණුවනු ලැබූ නිසා, රුපියල් මිලියන 50 වන්දි මුලලක් ඉල්ලා අංක 259/එම් නඩුව යටතේ කඩුවෙල දිසා උසාවියේදී විදුලි බල මණ්ඩලයට එරෙහිව ජානකී නෙත්තිකුමාරි මහත්මිය නඩු පවරා තිබුණි. සාක්ෂි මත 2019.08.22 දින කඩුවෙල දිසා අධිකරණ විනිසුරුවරයා විසින් තීන්දුව ලබා දුන් අතර පැමිණිලිකරුට රුපියල් මිලියන 50 ක මුදලක් ගෙවන ලෙස ලංවිමට නියෝග කළේය. තීන්දුවට එරෙහිව විදුලිබල මණ්ඩලය අභියාචනයක් ඉදිරිපත් කර තිබේ. මෙය ඉදිරියේදී හෙළිදරව් කිරීමට කටයුතු කෙරේ.

**1.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**විදුලිබල මණ්ඩලය විසින් අඛණ්ඩව භාවිතයට ගනු ලබන මුළුමනින්ම අවප්‍රමාණය වූ ජංගම නොවන වත්කම් වල ප්‍රයෝජනවත් ආයු කාලය**

සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම් වලින් 53% කට වඩා වැඩි ප්‍රමාණයක් ජනන බලාගාර සහ ඒ ආශ්‍රිත වත්කම් වලින් සමන්විත වේ. සම්පූර්ණයෙන්ම ක්ෂය වූ බලාගාර වල ප්‍රයෝජනවත් ආයු කාලය නැවත සමාලෝචනය කිරීම සඳහා කමිටුවක් දැනටමත් පත් කර ඇත. කෙසේ වෙතත්, බලාගාරයේ සංකීර්ණතාවය සහ සුවිශේෂත්වය හේතුවෙන් තක්සේරුව සඳහා සැලකිය යුතු කාලයක් ගත වේ.

මෝටර් රථ සඳහා සංශෝධිත ප්‍රයෝජනවත් ජීවිත කාලය ක්‍රියාත්මක කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත 2021 වර්ෂයේදී සිදු කෙරේ.

සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම් වලින් 38% ක් වන සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ මාර්ගයන් පිළිබඳ විගණන නිරීක්ෂණය නිරාකරනය කිරීම සඳහා යාන්ත්‍රණයක් හඳුනා ගැනීමට කටයුතු කෙරේ.

**1.2.3 ගිණුම්කරණ අඩුපාඩු**

**(අ) හර ශේෂය රුපියල් මිලියන 189.54 ක් (තොග ඌනතාවය) සහ බැර ශේෂය රුපියල් මිලියන 114.64 ක් (තොග අතිරික්තය) වසරකට වැඩි කාලයක් තොග ගැලපුම් ගිණුමේ පැවතුනි.**

තොග ගැලපුම් ගිණුමේ ශේෂය ඉවත් කිරීම සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග ගෙන ඇත

- ගැටළු විසඳීම සඳහා කමිටු පත් කිරීම
- වගකිව යුතු නිළධාරීන්ට එරෙහිව විධිමත් පරීක්ෂණ පැවැත්වීම
- නීති උපදෙස් ලබා ගැනීම, සහ
- අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අධ්‍යක්ෂ මණ්ඩලය පත්‍රිකා ඉදිරිපත් කිරීම

ඒ අනුව හිඟ ශේෂයෙන් 46% කට වැඩි ප්‍රමාණයක් සහ අතිරික්ත ශේෂයෙන් 30% ක ප්‍රතිශතයක් ඉහත ක්‍රියාවලියට ඇතුළත් කර ඇත

**(ආ) ලක්විජය බලාගාරය ඉදිකිරීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලබා ගත් රුපියල් බිලියන 159.18 ක ණය මුදල ලංකා ගල් අඟුරු සමාගමට (එල්සීසී) මාරු කළ යුතු අතර 2010 ඔක්තෝබර් 13 දිනැති කැබිනට් තීරණය අංක 10/2434/423/034 පරිදි ණය ගෙවීම සඳහා අවශ්‍ය මුදල ලංවිම විසින් ගෙවිය යුතුය. කෙසේ වෙතත්, මහා භාණ්ඩාගාරය සමග කිසිදු අනු ණය ගිවිසුමක් හෝ නොමැතිව විදුලිබල මණ්ඩලය විසින් මෙය මහා භාණ්ඩාගාරයෙන් ලබා ගත් ණයක් ලෙස සටහන් කර තිබුණි.**

අයවැය යෝජනා -2014 හි ණය ගැනීම් ස්කන්ධය බවට පරිවර්තනය කිරීම යන ශීර්ෂය යටතේ භාණ්ඩාගාර ලේකම් විසින් අත්සන් කරන ලද 2014-09-30 දිනැති අංක:PE/EN/CEB/Equity/2014 දරන ලිපිය මගින් පුත්තලම ගල් අඟුරු බලාගාරය වෙනුවෙන් ලබා ගත් සියළු ණය විදුලිබල මණ්ඩලය විසින් ලබා ගත් සෘජු ණය ලෙස සැලකිය යුතු ලෙස උපදෙස් ලබා දී ඇති අතර පවතින ද්‍රවශීලතා බාධාවන් ඉවත්වී මෙම ණය ගෙවීමේ පිරිවැය පියවා ගැනීමට විදුලිබල මණ්ඩලයට හැකි වන තුරු භාණ්ඩාගාරය විසින් එය දරනු ලබන බව දන්වා ඇත.

තවද, 2018-01-11 දින රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තුමේන්තුවේ පැවති රැස්වීමේදී අවධාරණය කෙරුණේ වත්කම් හා බැඳීම් යන දෙකම විදුලිබල මණ්ඩලයේ ශේෂපත්‍රයේ ඇති හෙයින් එම ණය ගෙවීම විදුලිබල මණ්ඩලයට ලබා දිය යුතු බවයි.

ශ්‍රී ලංකා රජය සහ අදාළ ණය දීමේ ආයතනය අතර ණය ගිවිසුම මේ වන විටත් අත්සන් කර ඇති හෙයින්, ණය මුදල විදුලිබල මණ්ඩලය මාරු කිරීමට භාණ්ඩාගාරය අවශ්‍ය කටයුතු සම්පාදනය කරන තුරු එම ණය භාණ්ඩාගාරයට වගකීමක් ලෙස සටහන් වේ.

රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තුමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එවන ලද 2019-10-17 දිනැති අංක:PEP/I/CEB/2/II (i) යන ලිපිය මඟින් ලබා දුන් උපදෙස් සලකා බලමින්, ලංවිම විසින් 2019 වර්ෂයේ ගිණුම් පොත් වල රුපියල් 16,942,798,790.95 ප්‍රග්ධන ආපසු ගෙවීම් සඳහා සහ රුපියල් 3,556,442,931.30 පොළී ගෙවීම් සඳහා ගැලපීම් සිදු කර ඇත.තවද, රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තුමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් යවන ලද 2021.01.15 දිනැති අංක PED/1/CEB/02/11 (i) ලිපිය අනුව පොදු ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ වාර්තාවලට අනුකූලව ලංවිම විසින් රුපියල් 20,536,545,932.04 මුදලක් ශ්‍රී ලංකා ජනරජයේ ස්කන්ධය බවට පරිවර්තනය කර ඇත. ඒ අනුව මහා භාණ්ඩාගාරය ලබා දුන් උපදෙස් පරිදි විදුලිබල මණ්ඩලයේ ගිණුම් සකස් කර ඇත.

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු

1969 අංක 17 දරණ ලංකා විදුලිබල මණ්ඩල පනතේ 42 වෙනි වගන්තියේ 6 වන උප වගන්තියට අනුව, මහාභාන්ඩාගාරය හරහා ලබාගත් විදේශ මුදල් වල විනිමය අනුපාතික අවදානම දරනු ලබන්නේ ශ්‍රී ලංකා රජය විසින් බැවින් ණය සඳහා වන ප්‍රග්ධනය හා පොළිය ආපසු ගෙවීමේදී විදේශ විනිමය උච්චාවචනයන් හේතුවෙන් ඇති වන ලාභ හෝ පාඩු, මණ්ඩලය ගිණුම්ගත නොකරයි.මණ්ඩලය විසින් ගෙවිය යුතු හිඟ ණය මුලද ණය ලබාගැනීමේදී එකඟවූ විනිමය අනුපාතයෙන් තක්සේරු කෙරේ.

කෙසේ වෙතත්, මෙම අලාභ පියවා ගැනීම සඳහා හැකිවන පොළී අනුපාතයක් යටතේ රජය ලංකා විදුලිබල මණ්ඩලය සමඟ උප ණය ගිවිසුමකට එළඹෙන අතර එමඟින් රජය විසින් විදුලිබල මණ්ඩලය සඳහා ලබා ගත් ණය වලින් වන පාඩු පියවා ගනු ඇත.මෙම ණය ලංවිම මඟින් ලබා ගත් සෘජු ණය ලෙස සැලකීමට භාණ්ඩාගාරය තීරණය කර ඇති හෙයින් එවැනි අනු ණය ගිවිසුම්වලට එළඹ නැත. ලංවිමෙහි ද්‍රවශීලතා බාධාවන් හේතුවෙන් මහා භාණ්ඩාගාරය විසින් ණය සේවා ගෙවීම සිදු කරන හෙයින් ණය දෙන ආයතනයට ගෙවූ සත්‍ය ගෙවීම ගැනීම් ස්කන්ධයට කල පරිවර්තනයක් ලෙස විදුලිබල මණ්ඩලයට මාරු කර ඇත

විදුලිබල මණ්ඩලය ණය ලබා ගැනීමේදී මුලින්ම එකගවූ අනුපාතයට ණය වාර්තා කර ඇති අතර ඉන් පසුව ණය නැවත තක්සේරු නොකළ හෙයින්, භාණ්ඩාගාරය විසින් සිදු කළ ණය ගැනීම් ස්කන්ධයට කල පරිවර්තනයට ඇතුළත් වූ ප්‍රාග්ධන ආපසු ගෙවීමට අදාළ විනිමය අලාභය ණයට සමාන බවට පරිවර්තනය කර ඇත.

ඒ අනුව 2020 වර්ෂයේ ආරම්භයේ විනිමය අනුපාතිකය සහ 2020 වසර අවසානයේ විනිමය අනුපාතිකය අතර විචලනයට අදාල අලාභය ලෙස රු. 20,862,022.88 ක් 2020 මූල්‍ය වර්ෂය තුළදී ගිණුම්ගතකර ඇති අතර 2019 වසර අවසානය දක්වා වූ විනිමය අනුපාතික විචලනය හා සම්බන්ධ රුපියල් 6,154,069,044.78 ක විනිමය අලාභය 2019 වසරට ගැලපුම් කර ඇත.

තවද, 2019 ණය ස්කන්ධ පරිවර්තනයේ ඇතුළත් රුපියල් 5,735,412,848.45 ක විනිමය අලාභය 2019 දී ණය ආපසු ගෙවීමක් ලෙස ගණන් බලා තිබූ අතර 2020 වර්ෂයේදි මුළු විනිමය අලාභය රුපියල් 11,889,481,893.00 ලෙස හදුනා ගනිමින් එය නිවැරදි කර ඇතග

**(ඇ) මහා භාණ්ඩාගාරයෙන් උප ණය වශයෙන් වාර්තා කළ විදේශ ණය වලින් ලද රුපියල් බිලියන 25.23 ක් 2014 දෙසැම්බර් 31 න් පසු ව්‍යාපෘති සදහා බෙදා හරින ලදී. 2015 මාර්තු 18 දින ගන්නා ලද කැබිනට් තීරණය අංක 15/0228/613/012 ට අනුව මෙම ණය ද ලංවිම වෙත පැවරිය යුතු අතර ණය හා සේවා හා ආපසු ගෙවීම් විදුලිබල මණ්ඩලය විසින් සිදු කළ යුතුය, කෙසේ වෙතත් මෙම ණය වල පැවැත්ම සැක සහිත වන අතර ආපසු ගෙවීමේ කොන්දේසි මත මුදල් ප්‍රකාශනයට ඇති බලපෑම ගණනය කළ නොහැක.**

2015-03-09 දිනැති අමාත්‍යාංශ සංදේශය අනුව මුදල් අමාත්‍යාංශ විසින් විදේශ මුල්‍යකරණ සංවර්ධන ව්‍යාපෘති බෙදා හැරීම, සේවා සැපයීම, ආපසු ගෙවීම සහ ගිණුම්කරණය කිරීමේ යාන්ත්‍රණය විධිමත් කිරීම සහ ඒ සම්බන්ධයෙන් 2015-03-18 දිනැති කැබිනට් තීරණයට අනුව 2015 වසරේ සිට ණය සේවා ගෙවීමට ලංවිම අපේක්ෂාය කෙරේ

ලංකා රජය සහ ණය දෙන ආයතනය අතර ණය ගිවිසුම මේ වන විටත් අත්සන් කර ඇති නමුත් විදුලිබල මණ්ඩලය වෙනුවෙන් ලබා ගත් බැවින් මුලින් මෙම මුදල් භාණ්ඩාගාරයට වගකීමක් ලෙස සටහන් වී ඇත.

ඉන්පසුව, රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් 2018-01-11 පැවති රැස්වීමේදී, කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ඇතිව 2014-12-31 න් පසු මහා භාණ්ඩාගාරය හරහා ලංවිම වෙත ලබා දුන් ණය ශ්‍රී ලංකා ජනරජයේ ස්කන්ධය බවට පත් කිරීමට තීරණය කරන ලදී.

එම නිසා, මෙම ශේෂයන් ප්‍රාග්ධනයට පැවරීම සඳහා භාණ්ඩාගාරයට නියෝගයක් ලැබෙන තුරු, එය භාණ්ඩාගාරයට වගකීමක් ලෙස සටහන් කර ඇත.

**(ඈ) රු. බිලියන 54.71 ක් වන විදේශ ණය හයක වටිනාකම මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන වල මහා භාණ්ඩාගාරයෙන් ලද ණය වශයෙන් සටහන් කර ඇති අතර මහා භාණ්ඩාගාරය සමඟ කිසිදු ණය ගිවිසුමක් පවා අත්සන් කර නැත**

මෙම ණය මුදල විදුලිබල මණ්ඩලය වෙනුවෙන් භාණ්ඩාගාරය හරහා ලබාගෙන ඇති අතර මහා භාණ්ඩාගාරය සමඟ උප ණය ගිවිසුම අවසන් කර නැත.

විදුලිබල මණ්ඩලයට මුදල් ලබා දෙන බැවින් මේවා භාණ්ඩාගාරයට වගකීමක් ලෙස සටහන් වේ. තවද, ශ්‍රී ලංකා රජය සහ අදාළ ණය දීමේ ආයතනය අතර ණය ගිවිසුම් දැනටමත් අත්සන් කර ඇත.

**(ඉ) 2013 වසරට පෙර රජයේ ආයතනවල විදුලි උත්පාදන යන්ත්‍ර , සෝපාන සහ වායුසමීකරණ යන්ත්‍ර සැපයීම, නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කිරීම සඳහා විදුලිබල මණ්ඩලය විසින් සිදු කරන ලද කාර්යයන් ඒවායේ ඉන්වොයිසි වටිනාකම් මත පදනම්ව ගිණුම්ගත කිරීමකින් තොරව පිරිවැයට තක්සේරු කර ඇත**

විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ සහ රජයේ රෝහල් වල විදුලිබල මණ්ඩලය විසින් සිදු කරන ලද කර්යයන් සඳහා ලැබිය යුතු මුදල් එකතු කිරීමේ සම්භාවිතාවය සැක සහිත බැවින් සේවාලාභියාගෙන් මුදල් එකතු කරන තුරු 2013 ට පෙර ආදායම මුදල් පදනම මත ගිණුම් පොත්වල හඳුනාගෙන ඇති අතර, රැකියා වල සැබෑ පිරිවැය ලැබිය යුතු යැයි පෙන්වන ලදී. 2020-12-31 වන විට රජයේ ආයතන සඳහා සිදු කරන ලද කර්යයන් වල සත්‍ය පිරිවැය සහ ඇස්තමේන්තු වටිනාකම අතර වෙනස රුපියල් 43,421,695.18 ක් වන අතර එය විගනන විමසුමේ දක්වා ඇති පරිදි 66,987,761 ක් නොවේ.

කෙසේ වෙතත්, 2020-10-06 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේ අංක 20.14.279 යටතේ නියම කරන ලද පරිදි ලංවිම සමාන්‍යාධිකාරී, විසින් ඇගේ අංකය CEB/FM/AFM (Corp)/DFM (P&I)/ Debtors හා 2020-12-21 දිනැති ලිපිය මඟින් විදුලිබල මණ්ඩලය මුහුණ දී ඇති මුදල් ප්‍රවාහ ගැටලුව මඟහරවා ගැනීම සඳහා රජයේ ආයතනවලින් කල් ඉකුත් වූ මුදල් ආපසු අය කර ගැනීම සඳහා රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තුමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සහාය පැතූ අතර ඒ සඳහා අපට යහපත් ප්‍රතිචාරයක් ලැබී නැත.

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු

තවද, 2020-12-21 දින පැවති විගණන කමිටු රැස්වීමේ සටහන් අංක 2020/03 හි 03.03 මඟින් ආපසු අයකර ගත නොහැකි දිගුකාලීන ලැබීම් කපා හැරීම සඳහා මණ්ඩල පත්‍රිකාවක් කෙටුම්පත් කරන ලෙස වත්කම් කළමනාකරණ අංශයට විගණන කමිටුව නියෝග කර ඇති අතර 2021-04-07 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අංක 21.06.128A යටතේ වත්කම් කළමනාකරණ අංශයට රජයේ ආයතන වලින් කල් ඉකුත් වූ ලැබීම් නොකඩවා ලබා ගැනීමට නොහැකි වූ බැවින් ඒවා කපා හැරීමට කටයුතු කල යුතු බව තහවුරු කරන ලදි. ඒ අනුව නි.සා(වැ.උ.සේ) මේ සම්බන්ධව මණ්ඩල පත්‍රිකාවක් කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලියේ යෙදී සිටී.

ශ්‍රී ලංකා මුල්‍ය වාර්තාකරණ ප්‍රමිත (SLFRSS) අංක 9 යේ 5.5.4 වගන්තියට අනුකූලව මුල්‍ය උපකරණ වල අපේක්ෂිත මුල්‍ය අලාභය සැලකිල්ලට ගෙන, මෙම ශේෂයන් නැවත අය කර ගත නොහැකි වීම හේතුවෙන් ඒ සඳහා පූර්ණ හාණිකරන ප්‍රතිපාදන ඇති කර ඇත

තවද, SLFRS 15 හි වගන්තිය (9) (ඉ)- ගනුදෙනුකරුවන් සමඟ ඇති කොන්ත්‍රත් වලින් ලැබෙන ආදායම විමසුමේ සඳහන් පරිදි ලැබිය යුතු ශේෂය (එනම් ඉන්වොයිසි වටිනාකම) නැවත ලබා දෙන ලෙස යෝජනා නොකරයි. තවද SLFRS - 9 - 5.5.4 වගන්තිය අනුව ඉහත සඳහන් රැකියා වල ඉන්වොයිසි වටිනාකම් හඳුනා ගැනීම සඳහා වියදමින් ගෙවිය යුතු ලැබීම් ගිණුම් තුළ නැවත හදුනාගනු ලැබුවද හාණිකර සඳහා 100% ප්‍රතිපාදන සලසා දිය යුතු ය.

ඒ අනුව, ඉන්වොයිසි වටිනාකම් නැවත හදුනාගැනීමෙන් (ලැබිය යුතු ආදායම් සහ රඳවා ගත් ඉපැයීම් වැඩිකිරීම) මත ශේෂයන් ආපසු අය කර ගැනීමට නොහැකි වීම හේතුවෙන් හාණිකරන ප්‍රතිපාදනයක් (ලැබීම් අඩු වීම සහ රඳවා ගත් ඉපැයීම් අඩුවීම) හඳුනා ගැනීමට හේතු වේ.

ඉහත සියල්ල සලකා බැලීමේදී, ඉන්වොයිසි වටිනාකම් ප්‍රතිප්‍රකාශනය කිරීම ඉහත සඳහන් කළ ගිණුම්කරණ ප්‍රමිත වල අදාළ විධිවිධානයන්ට අනුකූල නොවන අතර එය විදුලිබල මණ්ඩලයේ මුල්‍ය කාර්යය සාධනය සහ මුල්‍ය තත්ත්වය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති නොකරනු ඇත. එබැවින්, විගණන විමසුමේ සඳහන් පරිදි මුල්‍ය ප්‍රකාශන වල කිසිදු අවතක්සේරුවක් නොමැත.

විගණනය සඳහා ඉල්ලන ලද බොහෝ තොරතුරු ඒ ඒ අංශ ප්‍රධානීන් විසින් මේ වන විටත් ඉදිරිපත් කර තිබෙන අතර අවශ්‍ය ඕනෑම අමතර තොරතුරක් ඔවුන්ගෙන් ලබා ගත හැකිය.

**(ජ) 2016 වර්ෂයේදී මහා භාණ්ඩාගාරය වෙත ගෙවන ලද රු. බිලියන 5 න් රු මිලියන 500 ක මුදලක් සමාලෝචනය කරන ලද වර්ෂය තුළ කළමනාකරණ ගාස්තු ගෙවීම ලෙස ආදායම් ප්‍රකාශනය සඳහා ක්‍රමක්ෂය කර ඇති අතර රඳවා ගත් ආදායමෙන් රුපියල් බිලියන 1.5 ක් අය කර ඇත.**

රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ 2019.10.16 දිනැති අංක PDE/I/CEB/2/11/(iii) දරන ලිපිය මත පදනම්ව, මෙම ගෙවීම භාණ්ඩාගාරයට ගෙවා ඇති "කළමනාකරණ ගාස්තුව" ලෙස සලකනු ලැබූ අතර 2017 වසරේ සිට වසර 10 ක කාල සීමාවක් තුළ ක්‍රමක්ෂය කරනු ලැබේ.

**(ඪ) බෙදාහැරීම් අංශ වල රුපියල් බිලියන 6.18 ක වටිනාකමක් සහිත වැඩ නිම් කාර්යයන් 7,546 ක් වත්කම් වලට මාරු කිරීමකින් තොරව කෙරීගෙන යන ගිණුමේ ඉතිරිව ඇත.**

සම්පූර්ණ කරන ලද ප්‍රාග්ධන කාර්යයන් නියමිත පරිදි දේපල පිරියත හා උපකරණ සඳහා ප්‍රාග්ධනීකරණය කර ගැනීමට අඛණ්ඩ උත්සාහයන් දරනු ලැබේ. දිගු කාලීනව කෙරීගෙන යන වැඩ ගිනුමේ පවතින ප්‍රාග්ධන කාර්යයන් අඛණ්ඩව අධීක්ෂණය කිරීම සහ සුදුසු පරිදි අවසන් කිරීම සඳහා පළාත් මට්ටමේ කමිටු පත් කර ඇත. ඒ අනුව, 2021 මැයි 31 වන විට වසර 4 කට වැඩි කාලයක් ප්‍රාග්ධනීකරණය කර නොතිබූ කාර්යයන් වලින්, බෙදාහැරීමේ අංශ 01 විසින් 21% ද බෙදාහැරීමේ අංශ 03 විසින් 28% ද ප්‍රාග්ධනීකරණය කර ඇත.

**(ණ) 2012 දී වැඩ නිම කරන ලද ඉහළ කොත්මලේ ජල විදුලි ව්‍යාපෘතියේ මුළු පිරිවැය රු. මිලියන 979.88 ක් වූ අතර එය ප්‍රාග්ධනීකරණය වෙනුවට කෙරීගෙන යන වැඩ ගිණුමේ ඇතුළත් කර ඇත**

මූලික වත්කම් හුවමාරුවෙන් පසු 2020 දෙසැම්බර් වන විට කෙරීගෙන යන වැඩ ගිණුමේ රුපියල් මිලියන 979.88 ක් එකතු වී ඇත. මෙම මුදලට ප්‍රධාන වශයෙන් සේවක වියදම්, බේරුම්කරණය සඳහා වූ නීති ගාස්තු සහ ඉඩම් පවරා ගැනීමේ පිරිවැය යනාදිය ඇතුලත් වේ. මෙම ඉතිරි මුදල දේපළ පිරියත උපකරණ වෙත මාරු කිරීමට ඇති ගැටලු විසඳීම සඳහා ව්‍යාපෘති කාර්යාලය සමඟ දැනටමත් කටයුතු සිදුකර ඇති අතර මෙය 2021 වසර තුළදී සාක්ෂාත් කර ගනු ඇත.

**(ත) 2014 වර්ෂයේදී වැඩ නිම කරන ලද පුත්තලම ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතිය සඳහා මිල දී ගත් පිරිවැය රුපියල් මිලියන 179.19 ක් වන වාහන ප්‍රාග්ධනීකරණය වෙනුවට කෙරීගෙන යන වැඩ ගිණුමේ ඇතුළත් කර ඇත**

මුලික වත්කම් හුවමාරුවෙන් පසු රැස් කරන ලද වියදම් රු 528,013,647.76 ක මුදල 2020 වර්ෂයේදී අදාළ අංශ වෙත මාරු කෙරිණි. කෙසේ වෙතත්, වාහන මිලදී ගැනීමේදී ගෙවූ රුපියල් 179,194,890 ක මුදල වාහන වල අයිතිය ලංවිම වෙත පවරා නොතිබූ හෙයින් ගිණුම් වල ඉතිරිව ඇත. (වාහන 10) මෙම වාහන වල අයිතිය ලංවිම වෙත පැවරීමෙන් පසු එම මුදල අදාළ අංශ වලට මාරු කෙරේ.

**(ථ) කපා හරින ලද ණය ගැති ශේෂයන් සඳහා ලද රුපියල් මිලියන 18.76 ක පොලී ආදායම, වැට් බද්ද සහ අධිභාරය නිසිපරිදි හඳුනාගෙන නොතිබුණි.**

අවශ්‍ය නිවැරදි කිරීම් ඉදිරියේදී සිදු කෙරේ

**(ද) වීදි ආලෝකමත් කිරීමේ නඩත්තු වියදම් සඳහා වු රුපියල් මිලියන 30.56 ක ආපසු අය කර ගත නොහැකි මුදලක් සඳහා ප්‍රතිපාදන මුල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.**

පළාත් පාලන ආයතන විසින් සිදු කරනු ලබන වීදි ලාම්පු නඩත්තු කිරීමේ වියදම විදුලිබල මණ්ඩලය විසින් ආපසු ගෙවනු ලබන අතර ඒවා විදුලිබල අමාතාංශයෙන් ලැබිය යුතු ලෙස සටහන් වේ. 2013 වර්ෂයේ සිට දකුණු පළාත මඟින් සිදු කරන

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු

ලද එවැනි කාර්යයන් සඳහා වන සමුච්චිත ප්‍රතිපූර්ණ අගය ඉහත ශේෂයෙන් දැක්වේ. කෙසේ වෙතත්, ඉහත සඳහන් ශේෂය සඳහා අමාතාංශයෙන් මෙතෙක් මුදල් ලැබී නොමැති අතර, එම නිසා මින්පසු අදාල වියදම් නොගෙවීමට දකුණු පළාත තීරණය කර ඇත.

**(ඕ) කොළඹ නගර කාර්යාල විසින් රුපියල් මිලියන 29.97 ක ගෙවිය යුතු ශේෂය රැස් කිරීම් පාලන ගිණුමට වැරදි ලෙස හර කර තිබුණි**

2021 මූල්‍ය ප්‍රකාශනවල ශේෂය නිවැරදි කෙරේ

**(ක) 2021 ජනවාරි 01 සිට 2021 ජනවාරි 15 දක්වා කාලයට අදාළ ආදායම සමාලෝචනය කළ වසරේ ආදායම ලෙස විවිධ ණයගැති ගිණුමට හඳුනාගැනීම හේතුවෙන් විවිධ ණයගැති ශේෂය රුපියල් මිලියන 585.69 කින් අධිතක්සේරු වී ඇත.**

බිල්පත් සාරාංශයේ සහ දින දර්ශනයේ දිනය අතර වෙනස හේතුවෙන් ඉහත ශේෂය නිර්මාණය වී ඇත. කෙසේ වෙතත්, බිල්පත් සාරාංශයේ දිනය දින දර්ශනයේ දිනයට ගැලපීමට කටයුතු කර ඇත. එබැවින් එවැනි ශේෂයක් 2021 වර්ෂයෙන් පසුව නිර්මාණය වී නොමැත.

**(ග) හිමිකම් කිව හැකි කාල සීමාව ඉක්මවා ගිය රුපියල් බිලියන 1.57 ක ආර්ථික සේවා ගාස්තුව (ESC) ආදායම් ප්‍රකාශයට අය කර නොමැත**

2019 සහ 2020 වසර සඳහා වූ මූල්‍ය ප්‍රකාශන වලින් කපා හැරීමට අවශ්‍ය කාලය සම්පූර්ණවූ (අවුරුදු තුන ඉක්මවූ) ලැබිය යුතු ආර්ථික සේවා ගාස්තු ප්‍රමාණය රුපියල් බිලියන 1.57 කි. කපා හැරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාළ මණ්ඩලික පත්‍රිකාව 2019 වර්ෂයේදී ඉදිරිපත් කරන ලදී. කෙසේ වෙතත්, විදුලිබල මණ්ඩල විගණන කමිටු නිර්දේශය වූයේ මෙම ශේෂය කපා හැරීම නොව විදුලිබල අමාත්‍යංශය සහ මහා භාණ්ඩාගාරය වෙත යොමු කර වෙනත් ගෙවිය යුතු ශේෂයන් මඟින් අය කර ගැනීමට හෝ ඉවත් කිරීමට ඇති විකල්පයන් සොයා බැලීමයි.

2018 ජාතික අයවැය යෝජනා වල කොටසක් ලෙස එය මහා භාණ්ඩාගාරය වෙත දන්වා ඇති අතර බදු සහන වල කොටසක් ලෙස එය නැවත විදුලිබල අමාත්‍යංශය හරහා 2020 දී මහා භාණ්ඩාගාරයට දැනුම් දෙන ලදී.

**(ච) අසාමාන්‍ය බැර ශේෂයන් හේතුවෙන් බෙදා හැරීම් අංශවල කෙරීගෙන යන වැඩ ගිණුමේ ශේෂය රුපියල් මිලියන 52.06 කින් අඩුතක්සේරු වී තිබුණි.**

රුපියල් 26,014,986 ක අසාමාන්‍ය ණය ශේෂයන් සඳහා හේතු හඳුනාගෙන ඇති අතර 2021 වර්ෂයේදී එය නිවැරදි කෙරෙ. තවද විදුලමු රත්නපුර ව්‍යාපෘතියේ රුපියල් 26,045,997 ක කාර්යයන් තනි තනි කාර්යයන් ලෙස නිරවුල් කිරීමට කටයුතු කෙරේ.

**(ජ) අදාළ වියදම් ගිණුම් වලට මාරු කිරීමෙන් තොරව රුපියල් මිලියන 912.69 ක මුදලක් වසරකට වැඩි කාලයක් මාර්ගස්ථ තොග ගිණුමේ පවතින අතර , රුපියල් මිලියන 245.53 ක අසාමාන්‍ය බැර ශේෂයක් නිරවුල් කිරීමකින් තොරව මාර්ගස්ථ තොග ගිණුමේ ඉතිරිව ඇත**

ඉදිරියේදී එම ශේෂයන් නිවැරදි කිරීමට කටයුතු කෙරේ.

**(ට) වාහන 12 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශන වලට හඳුනාගැනීම අතපසු වීම හේතුවෙන් දේපල පිරියත සහ උපකරණවල පිරිවැය හා සමුච්චිත ක්ෂය වීම අඩුතක්සේරු වී තිබුණි**

වාහන පිලිබඳ සොයාබලා නිසි පරිදි වත්කම් වල හඳුනාගැනීමට කටයුතු කෙරේ.

**(ඩ) කැලණිතිස්ස ඒකාබද්ධ මෙහෙයුම් බලාගාරයේ කෙරීගෙන යන කාර්යයන්ට අදාල පිරිවැය ප්‍රග්ධනීකරණය හේතුවෙන් බලාගාරයේ වටිනාකම රුපියල් මිලියන 17.10 කින් පමණ අධිතක්සේරු වී තිබුණි. තවද මෙම අසම්පූර්ණ වත්කම් සම්බන්ධව ප්‍රාග්ධන වියදම් රුපියල් මිලියන 323.28 ක් සහ ක්ෂයවීම් මිලියන 27.04 ක් සමාලෝචනය කළ වර්ෂය තුළ ආදායම් ප්‍රකාශයට අය කර ඇත**

2021 වර්ෂයේදී නිවැරදි කෙරේ

**(ණ) 2018 සහ 2019 වර්ෂයන්හි නිම කරන ලද වත්කම් වලට අදාළ රුපියල් මිලියන 54.14 ක ක්ෂය වටිනාකම ජනන අංශය විසින් සමාලෝචනය කළ වර්ෂයේ වියදම් වශයෙන් හඳුනාගෙන තිබුණි**

අවධානය යොමු වී ඇති අතර අනාගතයේදී එවැනි වැරදි අවම කිරීම සඳහා පියවර ගනු ඇත

**(ත) 2015 වර්ෂයේ සිට අවසන් නොවී ඉතිරිව ඇති මිලියන 167.25 ක වටිනාකමින් යුත් ව්‍යාපෘති දෙකක් නිරවුල් කිරීමකින් තොරව කෙරීගෙන යන වැඩ ගිණුමේ පවතින බව පෙන්නුම් කෙරේ.**

අදාළ නිලධාරින් සමඟ සාකච්ඡා කර ව්‍යාපෘති දෙක සම්බන්ධව කෙරීගෙන යන වැඩ ගිණුමේ ඇති ශේෂය නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇත

**(ද) තාප විදුලිය මිලදී ගැනීමේ උපචිත වියදම් ලෙස අධිප්‍රතිපාදනයක් සිදු කිරීම හේතුවෙන් සමාලෝචනය කරන ලද වර්ෂය සඳහා වූ පාඩුව බිලියන 0.99 කින් අධිතක්සේරුවී ඇත**

වියදම් ගිණුමේ අතිරික්ත/ ඌණ උපචිත වියදම් ඇතුලත් වීම වැළැක්වීම සඳහා සහතික කළ ඉන්වොයිසි නියමිත වේලාවට ලබා ගැනීමට සහ මාසික ගිණුම් තුල එම ගණුදෙනු නිසිපරිදි ගිණුම්ගත කිරීමට 2021 ජනවාරි මස සිට කටයුතු සූදානම් කර ඇත.

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු

**(ප,බ) සමාලෝචනය කරන ලද වර්ෂය තුළ රුපියල් බිලියන 1.1 කට ගිගාවොට් 77.4 ක පුනර්ජනනීය බලශක්තිය මිලදී ගැනීම පුනර්ජනනීය බලශක්ති මිලදී ගැනීමේ ගිණුමේ සටහන් කර නොමැති අතර 2019 වර්ෂයේදී රුපියල් මිලියන 212 කට ගිගාවොට් 12.2 ක පුනර්ජනනීය බලශක්තිය මිලදී ගැනීම 2020 වර්ෂයේ පුනර්ජනනීය බලශක්ති මිලදී ගැනීම් ගිණුමට හඳුනාගෙන ඇත.**

ලද ඉන්වොයිසි සහ විෂය භාර ඉංජිනේරුවරයා විසින් සකස් කරනු ලබන 'මාසික සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති උත්පාදන වාර්තාව (NCRE) උපයෝගී කරගනිමින් සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති මිලදී ගැනීමේ මාසික උපචිත වියදම් තීරණය කෙරේ. අලුතින් ආරම්භ කරන ලද බලාගාර වලින් ඉන්වොයිසි ලැබීමේ ප්‍රමාදයක් පවතින අතර සමහර අවස්ථාවන්හිදී විවිධ හේතූන් මත දැනට ක්‍රියාත්මක වන බලාගාර පවා සැලකිය යුතු ප්‍රමාදයකින් තම ඉන්වොයිසි ඉදිරිපත් කරයි. එබැවින්, තොරතුරු ලද කාලච්ඡේදයේදී ගණුදෙනුව සටහන් වේ. ඒ අනුව 2019 වර්ෂයේ මිලදී ගැනීම් 2021 ජනවාරි මාසය සඳහා වන NCRE උත්පාදන වාර්තාවට ඇතුළත් කර ඇති හෙයින් මෙම ප්‍රමාදවූ ඉන්වොයිසි සමහරක් 2021 ජනවාරි ගිණුම් වලට ඇතුළත් කර ඇත.

**(ම) වසර 15 ක කොන්ත්‍රාත් කාලය අවසන් කළ පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදකයින්ගෙන් 2020 දෙසැම්බර් 31 දක්වා මිලදී ගත් පුනර්ජනනීය බලශක්ති සඳහා ගෙවිය යුතු රුපියල් මිලියන 808 ක් ගිණුම්ගත කර නොතිබුණි**

කල් ඉකුත් වූ පුනර්ජනනීය බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම විවිධ හේතු නිසා කල් ඉකුත් වූ මොහොතේම අළුත් කිරීම සිදු නොකළේය. කෙසේ වෙතත්, අත්සන් කරන ලද ගිවිසුමක් නොතිබුනද මෙම බලාගාර අඛණ්ඩව ක්‍රියාත්මක කෙරිණි. එම නිසා, ගිවිසුමට අදාළ කාලය දීර්ඝ කිරීම පසු අත්සන් තැබීමට යටත්ව ඉන්වොයිසි ලැබුණු විට උපචිත කිරීම සිදු කෙරිණි. එම නිසා, 2020 වර්ෂය සඳහා උපචිත ලෙස 2021 ජනවාරි මාසය සඳහා ගිණුම් ගත කල මුළු එකතුව රුපියල් මිලියන 900 කි.

**(ය) මූල්‍ය ප්‍රකාශන වලට අනුව, සමාලෝචනය කරන ලද වර්ෂය තුළ ප්‍රමාද ගාස්තු සඳහා පොළී ගෙවීම් රුපියල් මිලියන 2,481 කි. නමුත් සහතික කළ ප්‍රමාද පොලී ගෙවීම් ගණනය කිරීම් වලට අනුව එය රුපියල් මිලියන 2,835 කි.**

2020 වර්ෂය සඳහා සහතික කරන ලද ප්‍රමාද වූ පොලී වල වටිනාකම රුපියල් මිලියන 2885 ක් වන අතර (වැඩ පත්‍රිකාව බලන්න) 2019 වර්ෂය හා සම්බන්ධ රුපියල් මිලියන 383 ක අතිරික්ත උපචිත වෙන්කිරීමක් සහ 2020 වර්ෂය සඳහා රුපියල් මිලියන 21 ක ඌන උපචිත වෙන්කිරීමක් 2020 වර්ෂයේ ගිණුම්වල ඇතුළත් විය.

කෙසේ වෙතත්, වියදම් ගිණුමේ අතිරික්ත / ඌන උපචිත වියදම් ඇති වීම වළක්වා ගැනීම සඳහා ඉන්වොයිසි වල සහතික කළ අගයන් උපයෝගී කරගනිමින් ප්‍රමාදවූ පොලී ගණනය කිරීමට 2021 ජනවාරි සිට කටයුතු යොදා ඇත.

**(ර) බැහැර කරන ලද රුපියල් මිලියන 14 ක ස්ථාවර වත්කම් තවමත් සම්ප්‍රේෂණ අංශයේ ස්ථාවර වත්කම් වල සටහන් වී ඇත.**

දේපල පිරියත හා උපකරණ නිවැරදි තොරතුරු සහිතව යාවත්කාලීන කිරීම සඳහා සම්ප්‍රේෂණ අංශයේ සියලුම ශාඛා වලට උපදෙස් දීමට කටයුතු කෙරේ.

**(ල) සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලද රුපියල් බිලියන 2 ක ණය මුදලෙහි පැවැත්ම එම පාර්ශව දෙක අතර ගිවිසුමක් නොමැතිවීම හේතුවෙන් තහවුරු කර ගැනීමට නොහැකි විය.**

2020.02.25 දිනැති අංක 20.03.060 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව ජාතියට අඛණ්ඩව විදුලිය සැපයීමේ අවශ්‍යතාවය සලකා බලා විදුලිබල මණ්ඩලයේ පවතින අයහපත් මූල්‍ය තත්ත්වය හේතුවෙන් කාරක ප්‍රාග්ධන අවශ්‍යතා කළමනාකරණය කිරීම වෙනුවෙන් මෙම ණය පහසුකම ලංකා විදුලි (පුද්) සමාගම වෙතින් ගෙන ඇත. ණය ගිවිසුම අත්සන් කිරීම සඳහා දෙපාර්ශවයම විසින් ණය ගිවිසුම් කෙටුම්පතක් සමාලෝචනය කරමින් පවතී.

**(ව) ගල් අඟුරු නැව්ගත කිරීමේ ගාස්තු සඳහා රුපියල් මිලියන 63.56 ක ප්‍රතිපාදන මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි**

රුපියල් මිලියන 63.56 වු මෙම වියදම පිළිබඳව තවදුරටත් ලංකා ගල් අඟුරු (පුද්) සමාගම සමග සාකච්ඡා කෙරෙමින් පවතින හෙයින් එම මුදල 2020.12.31 දින වන විට ලංවිම ගිණුම් පොත්වල සටහන් කර නොමැත. කෙසේ වෙතත්, මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති සැසඳුම මගින් මෙම වටිනාකම් ප්‍රමාණාත්මකව ඉදිරිපත් කර ඇති අතර 2020 සඳහා වූ ගිණුම් අවසන් කිරීමෙන් පසු, 2021.03.22 දින රුපියල් 22,520,185.72 ක මුදලක් පියවා ඇත.

**(ස) විදුලිබල මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන 2013 වසරේ සිට අඛණ්ඩව ප්‍රතිප්‍රකාශනය සිදු කෙරේ.**

මූල්‍ය ප්‍රකාශන ප්‍රතිප්‍රකාශනය කිරීම ප්‍රධාන වශයෙන් සිදු කරනුයේ ලංවිම තුළ මෙහෙයුම් වල සංකීර්ණතාව සහ ගනුදෙනු වල පරිමාව හේතුවෙනි. කෙසේ වෙතත්, මූල්‍ය ප්‍රකාශන ප්‍රතිප්‍රකාශනය වැළැක්වීම සඳහා අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීමට කටයුතු කෙරේ.

**(හ) රුපියල් මිලියන 557.94 ක හර ශේෂයක් සහ රුපියල් මිලියන 556.81 ක බැර ශේෂයක් 2020.12.31 දිනට අන්තර් අංශ ජංගම ගිණුමේ ශේෂය ලෙස පවතී. මෙම අගය නිෂ්කාශනය වීමකින් තොරව 2002 වර්ෂයේ සිට පැවත එනු ලැබේ.**

බෙදා හැරීම් අංශ විමධ්‍යගතකරණය සිදු වූ 2002 වර්ෂයේ සිට එකී ශේෂය ඉදිරියට ගෙන එන ලදී. අදාල ලියකියවිලි සොයා ඒවා ඉවත් කිරීමට කටයුතු කෙරේ.

**(ළ) රුපියල් මිලියන 1.25 ක ණය සැකසුම් ගාස්තුවක් ආදායම් ප්‍රකාශයට කපා හැරීම වෙනුවට අය කර තිබුණි**

2021 අප්‍රේල් මාස ගිණුම් වලින් මෙය නිවැරදි කර ඇත.

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු

**1.2.4 නොසැසඳුනු වෙනස්කම්**

**(අ) 2020 දෙසැම්බර් 31 දින වන විට ලංවිමෙහි මුල්‍ය ප්‍රකාශන වල ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ගෙවිය යුතු ලෙස දක්වා ඇති ශේෂය සහ ඒ වන විට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මුල්‍ය ප්‍රකාශන වල ලැබිය යුතු ලෙස දක්වා ඇති ශේෂය අතර වෙනස රුපියල් මිලියන 753.61 ක් ලෙස නිරීක්ෂණය විය'**

ඉහත සඳහන් ශේෂය තෙල් සංස්ථාවට ගෙවිය යුතු ලෙස ලංවිම මුල්‍ය ප්‍රකාශනවල වල දක්වා නැති අතර එය තෙල් සංස්ථාවට ද දන්වා ඇත. කෙසේ වෙතත්, තෙල් සංස්ථාව සිය මුල්‍ය ප්‍රකාශන වල ලංවිම මඟින් ලැබිය යුතු පොලී ලෙස පෙන්නුම් කර ඇති අතර එයට විදුලිබල මණ්ඩලය එකඟ නොවේ. ගැටලු විසඳීම සඳහා තෙල් සංස්ථාව, ලංවිම, භාණ්ඩාගාරය සහ විදුලිබල අමාත්‍යාංශයේ නියෝජිතයින් සමඟ රැස්වීමක් සංවිධානය කිරීමට විදුලිබල අමාත්‍යාංශයේ පැවති විගණන කමිටු රැස්වීමේදී තීරණය කර ඇත.

**(ආ) බිල්පත් ක්‍රමයේ සහ මුල්‍ය ප්‍රකාශනවල වල යම් යම් ශේෂයන් අතපසු වීම හේතුවෙන් බෙදාහැරීම් අංශ 01, 02, 03 සහ 04 හි 2020.12.31 දිනට තොග වෙළඳ ණයගැති ගිණුමේ හා බිල්පත් පද්ධතියේ ශේෂය අතර නොසැසඳුනු ශේෂය රුපියල් මිලියන 41.18 කි. තවද, 2012 වසරේ සිට හඳුනා නොගත් රුපියල් මිලියන 423.76 ක ශේෂයක් ඉතිරි වී තිබේ**

සියලු බෙදාහැරීම් අංශ විසින් ණයගැති සැසඳුම් ප්‍රකාශ සකස් කර ගිණුම් වාර්ථා සමඟ ඉදිරිපත් කෙරේ.

**(ඇ) රැස් කිරීම් පාලන ගිණුමේ 2020.12.31 දිනට පැවති රුපියල් මිලියන 2,343 ක හර ශේෂය සහ රුපියල් මිලියන 149 ක බැර ශේෂයට අදාලව සැසඳුමක් විගණනයට ඉදිරිපත් කර නොමැත**

මෙම වෙනස්කම් පැන නැගී ඇත්තේ සාමාන්‍ය සැපයුම් බිල්පත් චක්‍රයේ අවසන් දිනය මුල්‍ය ප්‍රකාශන දිනයෙන් වෙනස්වීම හේතුවෙනි.එම නිසා 2021 වර්ෂයේදී සාමාන්‍ය සැපයුම් බිල්පත් චක්‍රයේ දිනය ගිණුම්කරන දිනය හා සමාන කිරීමට කටයුතු කර ඇත.

**(ඈ) රුපියල් මිලියන 117.58 ක අවිනිශ්චිත ශේෂයේ ස්වභාවය හඳුනා ගැනීම සඳහා කාල විශ්ලේෂණය සහ විස්තරාත්මක සටහන් ඉදිරිපත් කර නොතිබුණි.**

වෙළඳ ණය ගැතියන් සම්බන්ධ තොරතුරු, පද්ධතිය තුළින් උත්පාදනය කෙරේ. කෙසේ වෙතත්, පවතින පද්ධතිය තුළින් අවිනිශ්චිත ශේෂයන් සඳහා කාල විශ්ලේෂණයකට පහසුකම් සපයන්නේ නැත. එබැවින් බෙදා හැරීමේ අංශ 2 සහ 4 අවිනිශ්චිත ශේෂයේ කාල විශ්ලේෂණය අතින් සකස් කරන අතර එය දුෂ්කර ක්‍රියාවලියකි. එම නිසා අනාගතයේදී අවිනිශ්චිත ශේෂය සඳහා කාල විශ්ලේෂණයක් සකස් කිරීමට කටයුතු කෙරේ.

**(ඉ) මණ්ඩලය විසින් පාරිභෝගිකයා සඳහා වැරදි ගාස්තු ක්‍රමවේදයක් යෙදීම හේතුවෙන් 2019 වසරේ සිට රුපියල් මිලියන 38.76 ක මුදලක් හිඟව පවතී.**

මෙම ගැටලුව විසඳීම සඳහා කමිටුවක් පත් කර ඇත.එහි කාර්යයන් තවමත් සිදු වෙමින් පවති

**(ඊ) තාප බල ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින් සඳහා ගෙවිය යුතු ශේෂය ලෙස මුල්‍ය ප්‍රකාශනවල වල දක්වා ඇති ශේෂය සහ ගෙවීමට ඇති සහතික කළ ඉන්වොයිසි වල එකතුව අතර රුපියල් බිලියන 5.9 ක වෙනසක් දක්නට ලැබුණි**

L-5806- 'ගෙවිය යුතු ස්වාධීන තාප බල නිෂ්පාදකයන්ගේ ගිණුම යනු 2020 වර්ෂයේ L- 5920 'උපචිත ගිණුමෙන් වෙන්කර ගත් කොටසකි. අයිපීපී තාප විදුලි බලාගාර වලින් සෑම මසකම ලැබුණු ඉන්වොයිසි අගයන් උපයෝගී කරගනිමින් මෙම ගිණුමට සටහන් තබනු ලබන අතර ගෙවීම සඳහා සහතික කරන අවස්ථාවේදී මෙම ශේෂයන් ගලපයි. මෙම ගිණුමෙහි 2020 වසර අවසානයේදී ලෙජර් ශේෂය සහ සහතික කළ හිඟ ඉන්වොයිසි එකතුව අතර වෙනස රුපියල් බිලියන 5.6 ලෙස හඳුනා ගෙන ඇත. ඒ අනුව එය උපචිත වියදම් අධි වෙන්කිරීමක් ලෙස ගිණුම්වලින් ලියා හැරීමට නියමිතය.

කෙසේ වෙතත්, සහතික කළ අගයන් උපයෝගී කරගනිමින් උපචිත වියදම් හඳුනාගැනීමට කල් ඇතිව ඉන්වොයිසි සහතික කිරීම සඳහා විධි විධාන 2021 ජනවාරි මස සිට සකස් කර ඇත. එබැවින් ඉදිරියට මෙම ශේෂ දෙක අතර වෙනසක් සිදු නොවේ.

**1.3 ලංවිම 2020 වාර්ෂික වාර්තාවට ඇතුළත් අනෙකුත් තොරතුරු**

දැන ගැනීම සඳහා

**1.4 මුල්‍ය ප්‍රකාශන සඳහා කළමනාකරණයේ සහ පාලන කටයුතු වල වගකීම දරන අයගේ වගකීම**

දැන ගැනීම සඳහා

**1.5 මුල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකවරුන්ගේ වගකීම**

දැන ගැනීම සඳහා

**2. අනෙකුත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තා**

**2.2.2 සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද ලිඛිත නීති හෝ වෙනත් සාමාන්‍ය හෝ විශේෂ උපදෙස් වලට අනුකූල නොවීම.**

**(අ) 2009 අංක 20 දරණ ශ්‍රී ලංකා විදුලි බල පනතේ 7 (1) සහ 43 (1) වගන්තිය**

**නියාමකයාගේ අනුමැතියකින් තොරව රුපියල් බිලියන 18.91 ක වටිනාකමට ගි.වොට්.732.192 ක් ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින් තිදෙනෙකුගෙන් (අයිපීපී) මිලදී ගෙන ඇත.**

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු

ගිවිසුම් කාලය ඉකුත්වූ IPP බලාගාර වලින් විදුලිබල ශක්තිය මිලදී ගැනීම සඳහා සම්ප්‍රේෂණ බලපත්‍ර ලාභියා සඳහා 2009 අංක 20 දරණ විදුලි බල (සංශෝධිත) පනතේ 7 (1) හෝ 43 (1) වගන්ති වලින් කිසිදු නීතිමය බාධාවක් නොමැත. මෙම ගිවිසුම් කාලය ඉකුත්වූ IPP බලාගාර තුනේ කල් ඉකුත් වූ බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම් (IPPA) දීර්ඝ කිරීම සඳහා විදුලිබල මණ්ඩලය විසින් PUCSL ආයතනයේ අනුමැතිය ඉල්ලා තිබූ අතර අනුමැතිය සඳහා කාලය දීර්ඝකිරීමේ ගිවිසුම්ද ඉදිරිපත් කළේය.

පුරෝකථනය කළ ඉල්ලුම සපුරාලීම සඳහා ප්‍රමාණවත් උත්පාදන ධාරිතාවක් ඇති බව සහතික කිරීම සඳහා විදුලි බල පනතේ 24 (1) (ඈ) වගන්තිය යටතේ විදුලි බල මණ්ඩලයේ (සම්ප්‍රේෂණ බලපත්‍ර ලාභියා වශයෙන්) රාජකාරියට අනුකූලව කටයුතු කිරීම සඳහා විදුලි බල මණ්ඩලයට මෙම විදුලි බලාගාර වල ගිවිසුම් කාලය දීර්ඝ කිරීමට සිදු විය. විදුලිබල මණ්ඩලය එය කර තිබුනේ විදුලි කප්පාදුව වැළැක්වීම සඳහා කැබිනට් මණ්ඩලයේ අනුමැතියෙනි.

**(ආ) 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලි බල පනතේ (සංශෝධනය කළ පරිදි) 7 (1) වගන්තිය 43 (2), සහ 43 (7) වගන්ති**

**විදුලි මිලදී ගැනීමේ ගිවිසුම සඳහා අනුමැතියක් නොමැතිව සමාලෝචනය කළ වර්ෂය තුළදී රුපියල් බිලියන 3.26 ක වටිනාකමකින් යුත් ගිගාවොට් 78.669 ක බලශක්තියක් මිලදී ගෙන ඇත.**

2019 වර්ෂය තුළදී විදුලිබල මණ්ඩලයට මෙගාවොට් 100 ක පරිපූරක විදුලි බලයක් මිලදී ගැනීමට කැබිනට් මණ්ඩලය සහ PUCSL යන ආයතන දෙකම මූලික අනුමැතිය ලබා තිබුනි. ඒ අනුව ජාතික ප්‍රසම්පාදන අධිකාරියේ උපදෙස් පරිදි විදුලිබල මණ්ඩලය නියමිත ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කළ අතර ප්‍රසම්පාදන කටයුතු අවසන් වූ පසු නියමිත අනුමැතීන් රජයේ ටෙන්ඩර් පටිපාටිය යටතේ ලබා ගත යුතු අතර, 43 වන වගන්තිය යටතේ එය අනුමතකර අත්සන් කිරීම සඳහා කෙටුම්පත් කරන ලද PPA ගිවිසුම PUCSL වෙත ඉදිරිපත් කරන ලදී.

විදුලිබල පනතේහි 24 (1) (ඈ) වගන්තිය යටතේ විදුලිබල මණ්ඩලයේ රාජකාරියට (සම්ප්‍රේෂණ බලපත්‍ර ලාභියා වශයෙන්) අනුකූල වීම සඳහා, අපේක්ෂිත විදුලි ඉල්ලුම සපුරාලීම සඳහා ප්‍රමාණවත් උත්පාදන ධාරිතාවක් ඇති බව සහතික කිරීම සඳහා, කැබිනට් මණ්ඩල අනුමැතිය ඇතිව, ලංවිම විසින් ප්‍රසම්පාදනය ඉදිරියට ගෙන ගියේය.

එසේම 2020 වසර සඳහාද ඉහත ප්‍රසම්පාදනය යටතේ අත්සන් කළ විදුලි මිලදී ගැනීමේ ගිවිසුම අතිරේක මාස හයක් දක්වා දීර්ඝ කිරීමට කැබිනට් මණ්ඩලය සහ PUCSL යන දෙකම මූලික අනුමැතිය ලබා දුන්හ. කැබිනට් අනුමැතිය ලබා ගැනීමේ නියමිත ක්‍රියාවලිය අනුගමනය කිරීමෙන් පසු විදුලි මිලදී ගැනීමේ ගිවිසුමේ කෙටුම්පත PUCSL වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී.

**(ඇ) 1969 අංක 17 දරන ලංකා විදුලි බල මණ්ඩල පනතේ 46 වන වගන්තිය සහ, 1971 අංක 38 දරණ මුදල් පනතේ II කොටසේ 11 (අ) සහ (ආ) වගන්තිය**

**රක්ෂණ සංචිත අරමුදලේ ප්‍රමාණවත් මුදල් ආයෝජනය කර නොමැත.**

මෙම වෙනස ඇතිවීමට ප්‍රධාන වශයෙන් හේතුවී ඇත්තේ වසර ගණනාවක සිට ලංවිම අයහපත් මුදල් තත්වය හේතුවෙන් රක්ෂණ සංචිත ගිණුමේ ආයෝජනය නොකිරීමයි . කෙසේ වෙතත්, ලංවිම ද්‍රවශීලතා තත්වය සහ මුදල් ප්‍රවාහ තත්වය වැඩි දියුණු වූ පසු දළ ස්ථාවර වත්කම් වලින් 0.1% ට සමාන ප්‍රමාණයක් රක්ෂණ සංචිත ගිණුමේ ආයෝජනය කිරීමට කටයුතු කෙරේ.

**(ඈ) රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද PED අංක 12 දරන චක්‍රලේඛයේ 9.4 වගන්තිය.**

**රේඛීය අමාත්‍යංශය සහ ලංවිම අර්ථසාධක අරමුදල සඳහා නිදහස් කරන ලද සේවකයින් 56 දෙනා සඳහා මණ්ඩලය විසින් වැටුප් හා අනෙකුත් ගෙවීම් ගෙවා ඇත**

**රේඛීය අමාත්‍යංශය සේවකයින් නිදහස් කිරීම**

තම සේවකයින් නිදහස් කරන ලෙස රේඛීය අමාත්‍යංශය කළ ඉල්ලීම් ඉවත දැමීමට විදුලිබල මණ්ඩලයට නොහැකි බැවින් ඒ සඳහා දරන පිරිවැය ලංවිම මඟින් පාලනය කළ නොහැක.

**අර්ථසාධක අරමුදලට සේවකයින් නිදහස් කිරීම**

2003 දෙසැම්බර් 31 දිනැති අර්ථසාධක අරමුදල් නීති ගැසට් අංක 20 (i) වගන්තියට අනුව, නිවාස ණය පරීක්ෂාර කිරීම හා සම්බන්ධ වියදම් හැර අරමුදලේ සියලුම පරිපාලන වියදම් විදුලිබල මණ්ඩලය විසින් දරනු ලබන අතර මෙම ප්‍රතිපත්තිය අරමුදලේ ආරම්භයේ සිට ක්‍රියාත්මකවේ. (1969 නොවැම්බර් 1 දා සිට) එබැවින් අර්ථසාධක අරමුදල වෙනුවෙන් ලංවිම විසින් දරන ලද පිරිවැය අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් නොවේ.

තවද, 2021 පෙබරවාරි 11 දින ලංවිම අර්ථසාධක අරමුදලේ (ගැසට් මගින් පිහිටුවා ඇති පාලක මණ්ඩලය) කළමනාකරණ කමිටුවේදී මෙම කරුණ ඉදිරිපත් කළ පසු කළමනාකරණ කමිටුව විසින් වර්තමාන කළමනාකරණ හා පරිපාලන වියදම් සම්බන්ධව දරන ප්‍රතිපත්තිය අඛණ්ඩව පවත්වා ගෙන යාමට අනුමැතිය ලබා දී ඇත.

**(ඉ) රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් 1994 ජුනි 14 දිනැති අංක 39 දරන PED චක්‍රලේඛයේ සහ 2020 සැප්තැම්බර් 25 දින අමාත්‍යංශ විගණන කමිටුවේදී ගත් තීරණ**

**ඉතිරි අසනීප නිවාඩු සඳහා මුදල් ගෙවීම**

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත, විදුලිබල මණ්ඩලය විසින් 1984 සිට සේවකයින් සඳහා ප්‍රයෝජනයට නොගත් අසනීප නිවාඩු සඳහා දිරි දීමනා ගෙවනු ලැබේ. මණ්ඩලය විසින් මෙම තීරණය වෙනස් කරන තුරු ඉදිරි වර්ෂ සඳහා මෙම යෝජනාව අඛණ්ඩව කරගෙන යාමට 2006 දී අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා දෙන ලදී.

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු

**(ඊ) 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක පනතේ 47 වන වගන්තිය**

**ඉපැයීම් ගණනය කිරීමේදී වැඩිම දීමනාව පමණක් සලකා බැලීම**

1969 අංක 17 දරණ ලංකා විදුලිබල මණ්ඩල පනතට අනුව, මණ්ඩලයේ බලතල 12 වගන්තිය යටතේ ලැයිස්තු ගත කර ඇත.

- 12 (එම්) වගන්තිය: මණ්ඩලයේ කටයුතු පරිපාලනය සම්බන්ධයෙන් නීති සම්පාදනය කිරීම
- 12 (එන්) වගන්තිය: මණ්ඩලයේ මතය අනුව එහි කටයුතු නිසි පරිදි කරගෙන යාමට පහසුකම් සැලසීමට අවශ්‍ය අනෙකුත් සියලුම දේ කිරීමට

ඒ අනුව, සදහන් කර ඇති නිරීක්ෂනයන්, ආයතනයේ අභිවෘද්ධිය සඳහා වැඩ කිරීම වෙනුවෙන් සේවක චිත්ත ධෛර්යය ඉහළ නැංවීම සඳහා මණ්ඩලය විසින් එහි සේවකයින්ට ලබා දෙන ප්‍රතිලාභ හා සම්බන්ධ වේ. තවද, මණ්ඩලයේ කටයුතු පරිපාලනය කිරීමේදී පාලක මණ්ඩලයට නීති සම්පාදනය කිරීමේ අධිකාරිය පනත මඟින්ම පැවරේ. ඒ අනුව සේවකයා වෙනුවෙන් අර්ථසාධක අරමුදල් ගෙවීම ගණනය කිරීම සඳහා ඉහළම දීමනාව සලකා බලන ලදී.

**(උ) 2007 ජනවාරි 10 දින වෙස්ට් කෝස්ට් පවර් (පුද්ගලික) සමාගම සමඟ බලය මිලදී ගැනීමේ ගිවිසුමේ 6.1.3 වගන්තිය**

**ලංවිම විසින් සපයනු ලබන විදුලිබල ශක්තියේ අනුපාතය ගණනය කිරීම සඳහා විදුලිබල මණ්ඩලය සලකා බලනුයේ බලශක්ති ගාස්තුවක් පමණි**

වෝල්ටීයතාව 33kV ට වඩා වැඩි අයිපීපී තාප විදුලි බලාගාර බොහොමයක විදුලි මිලදී ගැනීමේ ගිවිසුම් වල දක්වා ඇති විධිවිධාන සහ විදුලිබල මණ්ඩලයේ ආනයනික බලශක්තිය සඳහා අය කිරීම් පටිපාටිය අපැහැදිලි ය. එම නිසා මෙම ගැටළුව විධිමත් කිරීම සඳහා පුළුල් පරීක්ෂණයක් පැවැත්විය යුතු අතර විශේෂඥ කමිටුවක නිර්දේශය අවශ්‍ය වේ.

**(ඌ)2018 ඔක්තෝබර් 3 දිනැති කැබිනට් මණ්ඩල තීරණය**

**රජයේ ආයතන සතු ජනක යන්ත්‍ර භාවිතය**

විවිධ හේතුන් මත ඉහත තීරණය තවමත් ක්‍රියත්මක කර නැත

**2.2.3 මණ්ඩලය විසින් එහි බලතල, කර්තව්‍යයන් සහ යුතුකම් වලින් බැහැරව සිදු කරන කාර්යයන්**

**(අ) 2007 නොවැම්බර් 14 දින කැබිනට් මණ්ඩලය ගත් තීරණය සහ 2009 මැයි 26 දින කළමනාකරණ සේවා චක්‍රලේඛයේ අංක 39 ට ඇතුළත් විධිවිධානයන්ට පටහැනිව මණ්ඩලයේ අනුමැතිය මත ලංවිම කාර්ය මණ්ඩලයට වරින් වර විවිධ කාර්ය දීමනා ගෙවා තිබුණි.**

1969 අංක 17 දරණ ලංකා විදුලිබල මණ්ඩල පනතට අනුව, මණ්ඩලයේ බලතල 12 වගන්තිය යටතේ ලැයිස්තු ගත කර ඇත.

12 (එම්) වගන්තිය: මණ්ඩලයේ කටයුතු පරිපාලනය සම්බන්ධයෙන් නීති සම්පාදනය කිරීම

12 (එන්) වගන්තිය: මණ්ඩලයේ මතය අනුව එහි කටයුතු නිසි පරිදි කරගෙන යාමට පහසුකම් සැලසීම සඳහා අවශ්‍ය අනෙකුත් සියලුම දේ කිරීමට

ඒ අනුව, සඳහන් කර ඇති නිරීක්ෂනයන්, ආයතනයේ අභිවෘද්ධිය සඳහා වැඩ කිරීම වෙනුවෙන් සේවක චිත්ත ධෛර්යය ඉහළ නැංවීම සඳහා මණ්ඩලය විසින් එහි සේවකයින්ට ලබා දෙන ප්‍රතිලාභ හා සම්බන්ධ වේ. තවද, මණ්ඩලයේ කටයුතු පරිපාලනය කිරීමේදී පාලක මණ්ඩලයට නීති සම්පාදනය කිරීමේ අධිකාරිය පනත මඟින්ම පැවරේ

**(ආ) 2010 සිට 2020 දක්වා කාලය තුළ අදාළ සේවකයින්ගේ වැටුප් වලින් අඩු නොකර තමා සතු අරමුදලෙන් රුපියල් 4,976,201,706 ක උපයන විට බදු මුදලක් විදුලිබල මණ්ඩලය විසින් ගෙවා ඇත**

2020 නොවැම්බර් සිට, අත්තිකාරම් පුද්ගලික ආදායම් බදු (APIT) ගෙවනු ලබන්නේ ලංවිම සේවකයින් විසිනි.

**(ඇ) 1998 මාර්තු 08 දිනැති අංක 130 දරණ පොදු ව්‍යවසාය චක්‍රලේඛයට අනුව සියයට 10 සිට සියයට 14 දක්වා පොලී අනුපාත යටතේ වාහන ණය ලබා දීම වෙනුවට විදුලිබල මණ්ඩලය මෙම ණය ලබා දී ඇත්තේ සියයට 4.2 ක පොලියකට වීම**

1969 අංක 17 දරණ ලංකා විදුලිබල මණ්ඩල පනතට අනුව, මණ්ඩලයේ බලතල 12 වගන්තිය යටතේ ලැයිස්තු ගත කර ඇත.

12 (එම්) වගන්තිය: මණ්ඩලයේ කටයුතු පරිපාලනය සම්බන්ධයෙන් නීති සම්පාදනය කිරීම

12 (එන්) වගන්තිය: මණ්ඩලයේ මතය අනුව එහි කටයුතු නිසි පරිදි කරගෙන යාමට පහසුකම් සැලසීම සඳහා අවශ්‍ය අනෙකුත් සියලුම දේ කිරීමට

ඒ අනුව, සදහන් කර ඇති නිරීක්ෂනයන්, ආයතනයේ අභිවෘද්ධිය සඳහා වැඩ කිරීම වෙනුවෙන් සේවක චිත්ත ධෛර්යය ඉහළ නැංවීම සඳහා මණ්ඩලය විසින් එහි සේවකයින්ට ලබා දෙන ප්‍රතිලාභ හා සම්බන්ධ වේ. තවද, මණ්ඩලයේ කටයුතු පරිපාලනය කිරීමේදී පාලක මණ්ඩලයට නීති සම්පාදනය කිරීමේ අධිකාරිය පනත මඟින්ම පැවරේ

**(ඈ) විදුලිය සඳහා පුරෝකථනය කළ ඉල්ලුම සපුරාලීම සඳහා උත්පාදන බලාගාරවල ප්‍රමාණවත් ධාරිතාවක් ඇති බව සහතික කිරීමට විදුලිබල මණ්ඩලය (සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා) අසමත් වී ඇත.**

ලංවිමෙහි දිගු කාලීන උත්පාදනය පුළුල් කිරීමේ සැලසුම් වල (LTGEP) වසර 20 ක කාලයක් සඳහා කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දිගු කාලීන ධාරිතා අවශ්‍යතා ඇතුළත් වේ. එසේම, ආසන්න වසර කිහිපයක කෙටි කාලීන ධාරිතා අවශ්‍යතාවන්ද හදිසි අවස්ථා විශ්ලේෂණය යටතේ LTGEP හි දක්වා ඇත.

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු

දිගු කාලීනව, අඩු මිලැති බලාගාර නියමිත වේලාවට අපේක්ෂා කළ පරිදි සංවර්ධනය නොකළ විට, (විදුලිබල මණ්ඩලයට පාලනය කළ නොහැකිවූ හේතුවලින් සමන්විතය) විදුලිබල පනතේ 24 (1) (ඇ) වගන්තිය යටතේ විදුලි බල මණ්ඩලයේ (සම්ප්‍රේෂණ බලපත්‍රය දරන්නා වශයෙන්) රාජකාරියට අනුකූලව පුරෝකථනය කළ විදුලි ඉල්ලුම සපුරාලීම සඳහා ප්‍රමාණවත් උත්පාදන ධාරිතාවක් තිබීම තහවුරු කර ගැනීම සඳහා කෙටි කාලීන පරිපූරක ධාරිතාවයක් ලබා ගැනීමට විදුලිබල මණ්ඩලයට සිදු වේ.

මේ අනුව, එම ප්‍රසම්පාදනය සිදු කරනු ලබන්නේ 24 (1) (ඇ) වගන්තියට අනුකූල වීම සඳහා වන අතර එම නිසා එය උල්ලංඝනය කිරීමක් නොවේ.

**(ඉ) 2009 අංක 20 දරණ ලංකා විදුලි බල පනතේ 28 (3) වගන්තියේ දක්වා ඇති පරිදි විදුලි බල මණ්ඩලය පාරිභෝගික තැන්පතු සඳහා පොලිය ගෙවා නොතිබුණි**

2009 අංක 20 දරණ (විදුලිබල පනතේ) අංක 3 (1) (ඩී), අංක 4 (1) (සී) සහ අංක 30 දරන වගන්ති වලට අනුව (සංශෝධනය කළ පරිදි) විදුලි ගාස්තුව සකස් කළ යුත්තේ පීයුසීඑස්එල් විසිනි. කෙසේ වෙතත්, 2013 දී ලබා දුන් සහ 2014 දී සකස් කරන ලද දැනට පවතින විදුලි ගාස්තුව විදුලි බල මණ්ඩලයේ ව්‍යාපාර කටයුතු කරගෙන යාමට ප්‍රමාණවත් මුදලක් උත්පාදනය නොකරයි. පනතේ අදාළ වගන්ති පහත පරිදි වේ

3. (1) කොමිෂන් සභාවේ කාර්යයන් වනුයේ ශ්‍රී ලංකාවේ විදුලි කර්මාන්තයේ ආර්ථික, තාක්ෂණික හා ආරක්ෂණ නියාමකයා ලෙස ක්‍රියාකිරීම සහ

(2) පාරිභෝගිකයින්ට කාර්යක්ෂම සහ ආර්ථික පිරිමැසුම් සහිත සැපයීම සහතික කිරීම සඳහා බලපත්‍රලාභීන් සහ අනෙකුත් විදුලි සමාගම් විසින් අය කරන ගාස්තු නියාමනය කිරීම;

30. (1) මෙම කොටස අදාළ වන්නේ—

(අ) විදුලි සම්ප්‍රේෂණය සහ තොග වශයෙන් විකිණීම සඳහා සම්ප්‍රේෂණය බලපත්‍රලාභියා විසින් අය කරන ගාස්තු (මෙතැන් සිට "සම්ප්‍රේෂණය සහ තොග වශයෙන් විකිණීමේ ගාස්තු" ලෙස හැඳින්වේ); හා

(ආ) විදුලිය බෙදා හැරීම හා සැපයීම සඳහා බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් අය කරනු ලබන ගාස්තු (මෙතැන් සිට " බෙදා හැරීම සහ සැපයුම් ගාස්තු" ලෙස හැඳින්වේ).

(2) අදාල බලපත්‍රයේ දක්වා ඇති කොන්දේසි වලට අනුකූලව සම්ප්‍රේෂණ හා තොග වශයෙන් අලෙවි ගාස්තු, බෙදා හැරීම් සහ සැපයුම් ගාස්තු -

(අ) කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද පිරිවැය පිළිබිඹු කිරීමේ ක්‍රමවේදයකට අනුකූලව අදාළ බලපත්‍රලාභියා විසින් නියම කළ යුතුය;

(ආ) අදාළ බලපත්‍රලාභියාට එම බලපත්‍රය මඟින් අවසර ලත් ක්‍රියාකාරකම් කාර්යක්ෂමව කරගෙන යාමේදී සිදු වූ සාධාරණ පිරිවැය අයකර ගැනීමට අදාළ බලපත්‍රලාභියාට අවසර දීම

(ඇ) 5 වන වගන්තිය යටතේ කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රතිපත්ති මාර්ගෝපදේශනයට අනුකූලව කොමිසම විසින් අනුමත කළ යුතුය; සහ

(ඈ) මහජන දැනුම සහතික කිරීම සඳහා කොමිසමට අවශ්‍ය පරිදි ප්‍රකාශයට පත් කළ යුතුය

2009 අංක 20 දරණ ලංකා විදුලි බල පනතේ අංක 28 (3) වගන්තියට අනුව සෑම බෙදාහැරීමේ බලපත්‍රලාභියෙක්ම සිය ගනුදෙනුකරුවන්ට සුරැකුම්පත් තැන්පතු සඳහා පොලිය ගෙවිය යුතුය. පනතේ අදාළ වගන්තිය පහත පරිදි වේ,

28 (3) වගන්තිය "බෙදාහැරීමේ බලපත්‍රලාභියෙකුට මෙම වගන්තිය යටතේ ආරක්ෂක ක්‍රමයක් මඟින් යම් මුදලක් ලබා දෙන විට කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව, එය බලපත්‍රලාභියාගේ අතේ පවතින කාලය සඳහා වරින් වර නියම කරනු ලබන අනුපාතයට එම මුදලට පොලිය ගෙවිය යුතුය.

මේ වන විට විදුලිබල මණ්ඩලයට සිය ව්‍යාපාර කටයුතු කරගෙන යාමට ප්‍රමාණවත් මුදලක් නොලැබෙන අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් විදුලිබල මණ්ඩලය සිය ගනුදෙනු කරුවන්ගේ ආරක්ෂිත තැන්පතුව සිය කාරක ප්‍රග්ධනයේ කොටසක් ලෙස භාවිතා කරන අතර ශේෂ කාරක ප්‍රග්ධනය බැංකු අයිරා, කෙටි කාලීන ණය ආදියෙන් ලබා ගනී.

ලංවිම විසින් සිය ගනුදෙනු කරුවන්ගේ ආරක්ෂිත තැන්පතු සිය කාරක ප්‍රග්ධනය ලෙස භාවිතා කිරීමෙන් ලබා ගන්නා ප්‍රතිලාභ එනම් බැංකු අයිරා මත පොලිය ඉතිරි කිරීම තුලින් අඩු කරන ලද ගාස්තු සියළුම පාරිභෝගිකයින් අතර බෙදා හරිනු ලැබේ. මෙම වගන්තියට අනුව බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් ආරක්ෂිත තැන්පතු සඳහා පොලිය ගෙවීමට යන්නේ නම් එය බෙදා හැරීමේ බලපත්‍රලාභියා සඳහා මූල්‍යමය බරක් සහ කර්මාන්ත අංශය සඳහා අතිරේක පිරිවැයක් වනු ඇත.

එබැවින් 2009 අංක 20 දරණ ලංකා විදුලි බල පනතින් අංක 28 (3) වගන්තිය මුළුමනින්ම ඉවත් කිරීමට අමාතාංශයට අපි නිර්දේශ කර ඇත්තෙමු. තවද, සරල කිරීමේ නීති හා රෙගුලාසි පිළිබඳ ජනාධිපති කොමිෂන් සභාවේ ලේකම් වරයාට පිටපත් සහිතව විදුලිබල අමාතාංශයේ ලේකම් අමතන ලද ලංවිම යොමු අංකය: ඩීජීඑම් (සීඑස් සහ ආර්ඒ)/ජීඑන්/1 හා 2021-05-28 දිනැති ලිපිය මඟින් 2009 අංක 20 දරණ ශ්‍රී ලංකා විදුලි බල පනතින් අංක 28. (3) වගන්තිය ඉවත් කරන ලෙස ඉල්ලා ඇත.

**2.2.4. මණ්ඩලයේ සම්පත්, කාලසීමාව තුළදී ආර්ථික වශයෙන්, කාර්යක්ෂම ලෙස හා ඵලදායීව ප්‍රයෝජනයට ගෙන නොතිබුණි**

**(අ) සංශෝධනය කරන ලද 2009 අංක 20 දරණ විදුලි බල පනතට අනුව, 2013 අගෝස්තු 6 න් පසු එන්සීආර්ඊ (NCRE) ව්‍යාපෘති සඳහා ප්‍රමිතගත ගාස්තු වෙනුවට ප්‍රසම්පාදන පටිපාටි අනුගමනය කළ යුතුය. කෙසේ වෙතත්, NCRE ව්‍යාපෘති සඳහා මෙගාවොට් 390 ක ධාරිතාවයකින් යුත් ප්‍රසම්පාදන 7 ක් 2020 දෙසැම්බර් 31 දින දක්වා ආරම්භ කර ඇති අතර විදුලි බලාගාර මෙගාවොට් 24 ක ධාරිතාවයක් ආරම්භ කළේ 2020 දෙසැම්බර් 31 දින වන විට පමණි.**

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු

සංශෝධනය කරන ලද 2009 අංක 20 දරණ විදුලිබල පනතට අනුව, 2013 අගෝස්තු 6 න් පසු එන්සීආර්ඊ (NCRE) ව්‍යාපෘති සඳහා ප්‍රමිතගත ගාස්තු වෙනුවට ප්‍රසම්පාදන පටිපාටි අනුගමනය කළ යුතුය. කෙසේ වෙතත්, NCRE ව්‍යාපෘති සඳහා මෙගාවොට් 390 ක ධාරිතාවයකින් යුත් ප්‍රසම්පාදන 7 ක් 2020 දෙසැම්බර් 31 දින දක්වා ආරම්භ කර ඇති අතර විදුලි බලාගාර මෙගාවොට් 24 ක ධාරිතාවයක් ආරම්භ කළේ 2020 දෙසැම්බර් 31 දින වන විට පමණි.

මුළු ධාරිතාව මෙගාවොට් 390 ක් සඳහා NCRE ව්‍යාපෘති වලින් බලශක්ති ප්‍රසම්පාදනය සඳහා ලංසු හතක් ආරම්භ කර ඇත.

2013-08-06 න් පසු විදුලි බලශක්ති ප්‍රසම්පාදනය සඳහා ටෙන්ඩර් පටිපාටි අනුගමනය කළ යුතු බව ප්‍රකාශ කිරීම නිවැරදි නොවේ. එය 2009-04-08 (විදුලි බල පනත බලාත්මක වූ දිනය) සිට විදුලි බලශක්ති ප්‍රසම්පාදනය සඳහා ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කළ යුතුව තිබුණි. කෙසේ වෙතත්, මෙම ප්‍රවේශයේ ශක්‍යතාවය පිළිබඳව කර්මාන්තයේ පාර්ශවකරුවන් අතර අපැහැදිලි තත්වයන් පවතී. එම නිසා, 2017 ජූලි මාසය වන තෙක් ප්‍රමිතගත ගාස්තු ක්‍රමයක් භාවිතා කරමින් NCRE පදනම් කරගත් විදුලි බලශක්ති ප්‍රසම්පාදනය අඛණ්ඩව සිදු කර ඇත. විදුලි බලශක්ති ප්‍රසම්පාදනය තරඟකාරී ලංසු මත පදනම් විය යුතු බවට නීතිපතිවරයා සිය මතය (තුන්වන වරටත්) ලබා දී ඇත.

කෙසේ වෙතත් ලංසු 6 හි තත්ත්වය පහත පරිදි වේ

- වවුනතිව්හි මෙගාවොට් 10 ක සූර්ය බලාගාරය: 2017 සැප්තැම්බර් මාසයේදී ලංසු විවෘත කරන ලද අතර, අභිප්‍රාය ලිපිය (LOI) නිකුත් කරන ලද්දේ 2018 මැයි මාසයේදී ය. සංවර්ධන කටයුතු සඳහා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් හඳුනාගත් ඉඩම ලබා ගැනීමට සංවර්ධකයාට නොහැකි වීම සහ අදාළ පාර්ශවකරුවන්ගෙන් අවශ්‍ය නිෂ්කාශන ලබා ගැනීමට නොහැකිවීම මත  බලශක්ති මිලදී ගැනුම් ගිවිසුම 2020.12.31  දිනවන විට අත්සන් කිරීමට නොහැකි විය
- පොළොන්නරුවේ මෙගාවොට් 10 ක සූර්ය බලාගාරය. 2017 පෙබරවාරි මාසයේදී ලංසු විවෘත කර ඇති අතර 2018 සැප්තැම්බර් මාසයේදී අභිප්‍රාය ලිපිය (LOI) අත්සන් කර ඇත. සංවර්ධන කටයුතු සඳහා SLSEA විසින් හඳුනාගත් ඉඩම සංවර්ධකයාට ලබා ගැනීමට නොහැකි වීම සහ අදාළ පාර්ශවකරුවන්ගෙන් ඒ සඳහා අවශ්‍ය නිෂ්කාශන ලබා ගැනීමට නොහැකි වීම හේතුවෙන් බලශක්ති මිලදී ගැනුම් ගිවිසුම 2020.12.31  දිනවන විට අත්සන් කිරීමට නොහැකි විය
- මෙගාවොට් 1 * 90 සූර්ය බලාගාර ලංසු. 2018 අප්‍රේල් මාසයේදී ලංසු විවෘත කරන ලද අතර, 2018 ඔක්තෝබර් සිට 2019 අගෝස්තු දක්වා කාලය තුළදී සමාගම් 84 ක් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම මත ප්‍රදානය කිරීම සිදු කෙරිණි. ලංසු බැඳුම්කර කල් ඉකුත් වීම සහ ලංසුකරුවන්  විසින් ඒවා  දීර්ඝ නොකිරීම හේතුවෙන් ලංසු 6 ක් සඳහා ප්‍රදානය කිරීම් කල නොහැකි විය. ලංසු 84 කින් ලංසු 14 කට බැඳුම්කර අහිමි වීම නිසා ලංසු  70 ක් සදහා පමනක් ප්‍රදානය කිරීමේ ලිපි නිකුත් කර තිබුනි. 2020.12.31 වන විට බලශක්ති මිලදී ගැනුම් ගිවිසුම් 35 අත්සන් කර තිබූ අතර අනෙකුත් සංවර්ධකයින්ට 2020.12.31 දිනට අවශ්‍ය නිෂ්කාශන ඉදිරිපත් කිරීමට නොහැකි විය.
- කෘෂිකර්මාන්තය/ගොවිතැන සහිත මෙගාවොට් 10 ක සූර්ය බලාගාරයක්. 2019 මැයි මාසයේදී ලංසු විවෘත කරන ලද අතර, ප්‍රදානය කළේ 2020 ජුනි මාසයේදීය. 2020.12.31 දින වන විට LOI අත්සන් කිරීම සඳහා අවශ්‍ය ලියකියවිලි ලබා ගැනීමට සංවර්ධකයාට නොහැකි විය.
- මෙගාවොට් 1-10 පරාසයේ මෙගාවොට් 60 ක සුළං බලාගාර -  ග්‍රිඩ් උපපොළ පහ සඳහා 2020 මාර්තු මාසයේදී ලංසු විවෘත කෙරිණි. බෝලවත්ත සහ කප්පල්තුරේ ග්‍රිඩ් උපපොළ සඳහා ලංසු ඉදිරිපත් නොකළ අතර එමඟින් මෙගාවොට් 25 ක් අහිමිවනු ඇත. ත්‍රිකුණාමලය ග්‍රිඩ් උපපොළ හි මෙගාවොට් 10 ක් ප්‍රසම්පාදනය කිරීමට කැබිනට් අනුමැතිය 2020.12.31 දින ලබා දෙන ලදී. මන්නාරම ග්‍රිඩ් උපපොළ සඳහා පිරිනමන මෙගාවොට් 15  ප්‍රදානය කිරීම සඳහා 2020.12.31 වන විටත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය බලාපොරොත්තුවෙන් සිටියේය. මාදම්පේ ග්‍රිඩ් උපපොළ හි මෙගාවොට් 10 ක් 2020 නොවැම්බර් මාසයේදී නැවත ලංසු කැඳවන ලද අතර 2020.12.31 දිනට ලංසු අවසන් කිරීමට නියමිතව තිබුණි.
- මෙගාවොට් 1-10 පරාසයේ මෙගාවොට් 150 ක සූර්ය බලාගාර 150 ලංසුව. 2020 ජූලි මාසයේදී ලංසු තැබීම අවසන් කරන ලදි. 2020 ඔක්තෝම්බර් මාසය වන විට තාක්ෂණික කමිටු ඇගයීම් අවසන් කර ඇත. 2020.12.31 දින දක්වා කැබිනට් මණ්ඩලයෙන් කිසිදු තීරණයක් ගෙන නොමැත.

2020 මාර්තු මාසයේ සිට කොවිඩ් -19 වසංගතය රට තුළ ආරම්භ වූ අතර දෙවන රැල්ල 2020 ඔක්තෝම්බර් මාසයේදී සිදු වූ බව සැලකිය යුතු ය. මේ හේතුවෙන් බොහෝ ක්‍රියාකාරකම් අවහිර වී ප්‍රමාද ඇති වීමට හේතු වී ඇත.

**(ආ) මෙගාවොට් 1 ක ධාරිතාවයකින් යුත්  සූර්ය බලාගාර 60 ක් මිලදී ගැනීම සඳහා 2017 පෙබරවාරි 20 දින  ලංසු ඉල්ලීම් කරන ලදී (ආර්එෆ්පී) . බලාගාර 38 ක් සඳහා ලංසු 65 ක් ලද අතර සාර්ථක ටෙන්ඩර්කරුවන් 36 දෙනාගෙන් 35 ක් සඳහා අභිප්‍රාය ඉදිරිපත් කිරීමේ ලිපි නිකුත් කර ඇත**

2009-04-08 දින විදුලි බල පනත බලාත්මක වීමෙන් පසු තරඟකාරී ලංසු තැබීමේ ක්‍රියාවලිය තුළින් සූර්ය බලශක්ති විදුලි බලාගාර මිලදී ගැනීම සඳහා විදුලිබල මණ්ඩලය විසින්  ප්‍රකාශයට පත් කරන ලද පළමු ටෙන්ඩරය මෙය විය. එයට ඉහළින්, රජය විසින් බලාගාරයක උපරිම ධාරිතාව මෙගාවොට් 1 කට සීමා කිරීමේ  ප්‍රතිපත්තිමය තීරණයක් ගත් අතර එමඟින් කර්මාන්තයට අලුතින් පැමිණි කුඩා පරිමාණ ව්‍යාපෘති කරුවන්ගේ පුළුල් සහභාගීත්වය ලබා ගැනීමට හැකි විය. එම නිසා, මෙම උත්සාහය ලංවිම සහ ව්‍යාපෘති යෝජකයන් යන දෙපාර්ශවය සඳහාම ඉගෙනුම්  ක්‍රියාවලියක් වී ඇත.

ඊට අමතරව, 2018-02-08 දින LOI නිකුත් කිරීමෙන් පසු, ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතියට දැඩි ලෙස බලපාන පහත දැක්වෙන තත්වයන් රට තුළ ඇති විය.

1. 2018 නොවැම්බර් සිට 2019 ජනවාරි දක්වා අධ්‍යක්ෂ මණ්ඩලය නොතිබීම.
2. පාස්කු ඉරිදා බෝම්බ  ප්‍රහාරය හේතුවෙන් 2019 අවසානය දක්වා රට අඩපන වීම.
3. 2020 ආරම්භයේ සිටම ගෝලීය වශයෙන් කොවිඩ් -19 වසංගතයේ අවස්ථා කිහිපයක් වරින්වර ඇතිවීම සහ පසුව මාර්තු 2020 සිට 2021 ජූනි දක්වා කාලය තුළ දේශීයව අගුලු දැමීමේ ක්‍රියාපටිපාටි හඳුන්වා දීම.

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු

එම නිසා,තත්ත්වයන් හොඳින් තක්සේරු කිරීමෙන් පසු, මණ්ඩලය විසින් වාණිජ මෙහෙයුම් දිනය 2021-06-30 දක්වා දීර්ඝ කරන ලදි. 2021-06-30 වන විට ව්‍යාපෘති 27 ක් ආරම්භ කර ඇති අතර එය ඉහත සඳහන් කළ තත්වයන් මධ්‍යයේ විශිෂ්ට ජයග්‍රහණයක් විය.

**(ඇ) සීතාවක ගඟ ජල විදුලි ව්‍යාපෘතිය සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වැය කළ මුළු වියදම රුපියල් මිලියන 289 ක් ලංවිම සඳහා වියදමක් ලෙස ඉතිරි විය.**

සීතාවක ගඟ ජල විදුලි ව්‍යාපෘතිය විදුලිබල මණ්ඩලයට අයත් උත්පාදන පහසුකමක් ලෙස ක්‍රියාත්මක කිරීමේ අරමුනින් ලංවීම විසින් 2016 වර්ෂයේදී ව්‍යාපෘති කළමණාකරණ ඒකකය ආරම්භ කරන ලදි, එහිදී ආයෝජන සඳහා මුදල් රැස්කර ගැනීමට විදුලිබල මණ්ඩලයට බලයක් නැති හෙයින් එම ව්‍යාපෘතිය සිදු කිරීම සඳහා වන ණය මුදල් ලංකා රජය විසින් ලංකා විදුලිබල මණ්ඩලයට ලබා දෙනු ඇත.

මෙම ව්‍යාපෘති කළමණාකරණ ඒකකය හරහා ශක්‍යතා අධ්‍යයනය, සවිස්තරාත්මක සැලසුම් සකස්කිරීම, ආයෝජකයන් සෙවීම සහ ටෙන්ඩර් ලියකියවිලි සකස් කිරීම වැනි කටයුතු වල නිරත විය. මෙම කටයුතු සඳහා රුපියල් මිලියන 289 ක් වැය කර ඇත. ව්‍යාපෘතියක ශක්‍යතා අධ්‍යනය (තාක්ෂණික හා මුල්‍ය) ඉතා වැදගත් අංගයකි. කෙසේ වෙතත්, 2020-07-09 දින විදුලිබල අමාතාංශය විසින් PE/DEV/02/171/2016 යන ලිපිය මඟින් පහත සඳහන් මුල්‍ය විකල්ප දෙක සලකා බැලීමට ලංකා විදුලිබල මණ්ඩලයට යෝජනා කළේය.

- අරමුදල් රැස් කිරීම සඳහා හරිත බැඳුම්කර නිකුතුව
- නිර්මාණය - අයිතිය - පවත්වා ගැනීම - පැවරීම පදනම් කරගෙන ටෙන්ඩර් සඳහා යාම (BOOT)

එහි ප්‍රතිඵලයක් වශයෙන්, සංවර්ධන මාදිලිය නැවත සලකා බැලීමට සහ විදුලිබල මණ්ඩලයට අයත් පිරියතයක් යන සංකල්පයේ සිට නිර්මාණය කර මාරු කිරීමේ පදනමට සංවර්ධන ආකෘතිය වෙනස් කර හා තරඟකාරී ටෙන්ඩර් කැඳවීමට විදුලිබල මණ්ඩලයට සිදු විය.

ලංවිම යෝජනාව නම් ශක්‍යතා අධ්‍යයනය, ඊඅයිඒ, සියළුම පරීක්ෂණ වාර්තා, සැලසුම් ආදි සියළුම අධ්‍යයනය, අනාගත ලංසුකරුවන් (හෝ සංවර්ධකයින්) සමඟ බෙදා ගැනීම තුළින් එම අධ්‍යයනයන් ලංසුකරුවන්ට (සංවර්ධකයින්ට) ඔවුන්ගේ අවදානම් මට්ටම අඩු කිරීමටත් ඒ හරහා අඩු ලංසු මිලක් හෝ සංවර්ධන පිරිවැයක් නියම කිරීමටත් හැකිවීමයි. මේ අනුව, අධ්‍යයන කටයුතු සඳහා දැරූ පිරිවැය වලින් කොටසක් ගාස්තු අඩු වීමක් මඟින් ලංවිම වෙත ආපසු ලබා දෙනු ඇතැයි අපේක්ෂා කෙරිණි (අවසාන ව්‍යාපෘති සංවර්ධකයා කවුරුන් වුවද).

**(ඈ) සූර්ය බලාගාර සඳහා සම්මත කරන ලද ගාස්තුවක් ලෙස රුපියල් 23.10 ක ස්ථාවර අනුපාතයක් කැබිනට් මණ්ඩලය විසින් 2014 මාර්තු 07 දින විසින් අනුමත කරන ලදී. 2009 අංක 20 දරණ සංශෝධිත විදුලි පනතට අනුව, 2013 අගෝස්තු 6 න් පසු සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා ප්‍රමිත ගාස්තු වෙනුවට ප්‍රසම්පාදන පටිපාටිය අනුගමනය කළ යුතුය. කෙසේ වෙතත්, ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළින් තීරණය කරන ලද මිල ගණන් භාවිතා කිරීම වෙනුවට 2016 සහ 2017 දී ප්‍රමිතගත ගාස්තු යටතේ මෙගාවොට් 10 බැගින් වූ ධාරිතාවයෙන් යුත් සූර්ය බලාගාර පහක් ආරම්භ කරන ලදී.**

2009-04-08 සිට විදුලි බලශක්ති ප්‍රසම්පාදනය සඳහා තරඟකාරී ලංසු ඉදිරිපත් කර ඇත. මේ කාරණයේදී කර්මාන්තය තුළ පැවති අපැහැදිලිතාවයන් නිසා, 2017 දක්වා ප්‍රමිතගත ගාස්තු උපයෝගී කරගනිමින් එන්සීආර්ඊ (NCRE) පදනම් කරගත් විදුලි බලශක්ති ප්‍රසම්පාදනය අඛණ්ඩව සිදු කර ඇත.

**(ඉ) 2013 අගෝස්තු 6 න් පසු ආරම්භ කරන ලද මෙගාවොට් 135.62 ක ධාරිතාවයකින් යුත් ජෛව ගෑස් බලාගාරය, ඩෙන්ඩ්රෝ බලාගාර, කුඩා ජල විදුලි බලාගාර සහ සුළං විදුලි බලාගාර ව්‍යාපෘති සඳහා ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටි මගින් තීරණය කරන ලද මිල ගණන් වෙනුවට 2014 මාර්තු 07 දින කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රමිතගත ගාස්තු අය කෙරේ. (ගිවිසුම් 2013 අගෝස්තු 6 න් පසු අත්සන් කරන ලදි)**

2013-08-06 න් පසු විදුලි බලශක්ති ප්‍රසම්පාදනය සඳහා ටෙන්ඩර් පටිපාටි අනුගමනය කළ යුතු බව ප්‍රකාශ කිරීම නිවැරදි නොවේ. ඇත්තෙන්ම 2009-04-08 (විදුලි බල පනත බලාත්මක වූ දිනය) සිට විදුලි බලශක්ති ප්‍රසම්පාදනය සඳහා ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කළ යුතුව තිබුණි. කෙසේ වෙතත්, මෙම ප්‍රවේශයේ ශක්‍යතාවය පිළිබඳව කර්මාන්තයේ පාර්ශවකරුවන් අතර අපැහැදිලි අංශ පවතී. එම නිසා, 2017 ජූලි මාසය වන තෙක් ප්‍රමිතගත ගාස්තු ක්‍රමයක් භාවිතා කරමින් NCRE පදනම් කරගත් විදුලි බලශක්ති ප්‍රසම්පාදනය අඛණ්ඩව සිදු කර ඇත. විදුලි බලශක්ති ප්‍රසම්පාදනය තරඟකාරී ලංසු මත පදනම් විය යුතු බවට නීතිපතිවරයා සිය මතය (තුන්වන වරටත්) ලබා දී ඇත.

**(ඊ) 2013 අගෝස්තු 03 වැනිදායින් පසුව සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා ප්‍රසම්පාදන පටිපාටිය අනුගමනය කළ යුතුව තිබියදී නාගරික ඝන අපද්‍රව්‍ය බලාගාර පහක් සඳහා කි.වො. එකකට රුපියල් 36.20 බැගින් (වසර 20 ක් සඳහා ස්ථාවර ගාස්තුවක් ලෙස) 2017 වර්ෂයේදී කැබිනට් මණ්ඩලය අනුමැතිය දී ඇත. එක් ඝන අපද්‍රව්‍ය බලාගාරයක් සඳහා බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම අත්සන් කළේ 2020 දෙසැම්බර් මාසයේදී වන අතර කිලෝවොට් එකකට රු 36.20 ක මුළු ගාස්තුවක් විදුලිබල මණ්ඩලය විසින් දරනු ලබන අතර කැබිනට් තීරණයට අනුව භාණ්ඩාගාරයෙන් 13.10 ක් ආපසු ගෙවිය යුතුය.**

2013-08-06 න් පසු විදුලි බලශක්ති ප්‍රසම්පාදනය සඳහා ටෙන්ඩර් පටිපාටි අනුගමනය කළ යුතු බව ප්‍රකාශ කිරීම නිවැරදි නොවේ. ඇත්තෙන්ම 2009-04-08 (විදුලි බල පනත බලාත්මක වූ දිනය) සිට විදුලි බලශක්ති ප්‍රසම්පාදනය සඳහා ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කළ යුතුව තිබුණි. කෙසේ වෙතත්, මෙම ප්‍රවේශයේ ශක්‍යතාවය පිළිබඳව කර්මාන්තයේ පාර්ශවකරුවන් අතර අපැහැදිලි අංශ පවතී. එම නිසා, 2017 ජූලි මාසය වන තෙක් ප්‍රමිතගත ගාස්තු ක්‍රමයක් භාවිතා කරමින් NCRE පදනම් කරගත් විදුලි බලශක්ති ප්‍රසම්පාදනය අඛණ්ඩව සිදු කර ඇත. විදුලි බලශක්ති ප්‍රසම්පාදනය තරඟකාරී ලංසු මත පදනම් විය යුතු බවට නීතිපතිවරයා සිය මතය (තුන්වන වරටත්) ලබා දී ඇත.

ඊට අමතරව, කැබිනට් තීරණ වලට අනුකූල වෙමින් විදුලිබල මණ්ඩලය විසින් කොළඹ අපද්‍රව්‍ය බලශක්ති (නාගරික) බල ව්‍යාපෘති ගිවිසුම සහ තුම්බෝවිල කරදියාන අපද්‍රව්‍ය (නාගරික) බල ව්‍යාපෘති ගිවිසුම සඳහා පිළිවෙලින් 2017-10-10 සහ 2019-02-12 දින අත්සන් කර ඇත.

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු

වෙස්ටර්න් පවර් (පුද්ගලික) සමාගමට ගෙවන ලද ගාස්තුවේ ඉතිරි කොටස ආපසු ගෙවීම සඳහා මහා භාණ්ඩාගාරය වෙත යොමු කෙරේ.

කෙසේ වෙතත්, විදුලිබල මණ්ඩලය 2020 දෙසැම්බර් මාසයේදී නාගරික ඝන අපද්‍රව්‍ය බලාගාරයක් සඳහා ගිවිසුම් අත්සන් කර නැත.

**2.3 වෙනත් කරුණු**

**(අ) 2020 දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 42,358 ක වෙළඳ ණයගැති ශේෂයෙන්, සාමාන්‍ය සහ තොග සැපයුම් යන දෙකටම අදාළ රුපියල් මිලියන 5,122 ක ශේෂයක් වසරකටත් වඩා වැඩි කාලයක් හිඟව පැවති අතර, එයින් මිලියන 2671 ක් වසර 5 කටත් වඩා වැඩි කාලයක් තිස්සේ අයකරගෙන නොතිබුණි.**

වෙළඳ ණය ගැතියන්ගේ ශේෂය විශ්ලේෂණය කරන විට මෙම ශේෂයෙන් 88% ක් අවුරුද්දකටත් වඩා අඩු වයස් සීමාවන්ගෙන් යුක්ත වන අතර වසරකට වැඩි කාලයක් සහිත ණයගැතියන් 12% ක් පමණි. වසරකට වැඩි ශේෂයෙන් 52% ක් වසර පහකටත් වඩා වැඩි වන අතර එය සමස්ත ණයගැතියන්ගෙන් 6% ක් වේ. මෙයින් ඇඟවෙන්නේ වෙළෙඳ ණයගැතියන් නැවත අයකර ගැනීම සඳහා සියළුම බෙදාහැරීම් අංශ අඛණ්ඩ උත්සාහයක් ගන්නා බවයි.

කෙසේ වෙතත්, වසරකට වැඩි ණය ගැතියන්ගේ ශේෂය තවදුරටත් විශ්ලේෂණය කළ විට, එයින් 55% කට වැඩි ප්‍රමාණයක් අවසන් කළ ගැතියන්ගෙන් සමන්විත බව සටහන් වූ අතර දිගු කාලීන හිඟ මුදල් එකතු කිරීම සඳහා අඛණ්ඩ උත්සාහයක් දරමින් සිටී.

**(ආ) 2020 දෙසැම්බර් 31 දින වන විට වසරකට වැඩි කාලයක් තිස්සේ අයකර නොගත් විවිධ ණයගැති ශේෂය රුපියල් බිලියන 3.21 ක් විය.**

ඉහත සඳහන් ණයගැති ශේෂය ප්‍රධාන වශයෙන් පහත සඳහන් ශේෂයන්ගෙන් සමන්විත වේ

| ශේෂයේ ස්භාවය | වටිනාකම (රු.) | හේතු සහ ගෙන ඇති ඉදිරි ක්‍රියාමාර්ග |
|---|---|---|
| ඒ.ඊ.එස්. කැළණිතිස්ස | රු. 1,368,961,445 | විදුලිබල අමාත්‍යංශය විසින් විදුලිබල මණ්ඩලය, තෙල් සංස්ථාව, භාණ්ඩාගාරය සහ විදුලිබල අමාත්‍යංශයේ නියෝජිතයින් සමඟ මෙම දීර්ඝ මතභේදකාරී ශේෂය විසඳීම සඳහා රැස්වීමක් සංවිධානය කිරීමට නියමිතය |
| සුනිත්‍ය බලශක්ති අධිකාරිය | රු. 897,025,999 | සිදු කළ විමර්ශනය පදනම් කරගෙන නිකුත් කළ කමිටු වාර්තාවට අනුව, මෙම ශේෂය ගිණුම් පොත්වලින් කපා හැරීමට නිර්දේශ කර ඇත. එබැවින් ඒ සඳහා පියවර ගනු ඇත. |
| ඉවත්කල තාරාපැවි | රු. 497,144,445 | හේතු සොයා බලා ශේෂය නිසි පරිදි ඉවත් කිරීමට පියවර ගැනේ |

**(ඇ) වත්කම් කළමනාකරණ අංශයේ සෝපාන, වායුසමීකරණ සහ ජනන උත්පාදක යන්ත්‍ර සැපයීම සඳහා ලැබිය යුතු රුපියල් මිලියන 115 ක මුදලක් රාජ්‍ය ආයතනය යටතේ පෙන්වා ඇති අතර එය වසර පහකටත් වැඩි කාලයක් තිස්සේ අය කර ගත නොහැකිව පවතී.**

රජයේ ආයතන වලින් කල් ඉකුත් වූ ලැබීම් ආපසු ලබා ගැනීම සඳහා කළමනාකරණය විසින් ගෙන ඇති ක්‍රියා මාලාව, අංක 1.2.3 (ඊ) විමසුමට මා ලබා දුන් පිළිතුරෙන් බොහෝ දුරට විස්තර කර ඇති අතර එම පිළිතුරම මෙම විමසුමට ද අදාළ වේ.

කෙසේ වෙතත්, පසුගිය වසරවල වාර්තා වූ ගැටලු මඟහරවා ගැනීම සඳහා, 2018 දී, අ.ස. (වක) විසින් රජයේ ආයතන වල පිරිවැය අයකර ගැනීමේ කාර්යයන් සඳහා හොඳ අභ්‍යන්තර පාලනයක් ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ගෝපදේශ නිකුත් කර ඇති අතර ඒ අනුව පිරිවැය අයකර ගැනීමේ කාර්යයන් භාර ගැනීම සහ සේවාලාභීන්ගෙන් ලැබිය යුතු මුදල් නිතිපතා අධීක්ෂණය කෙරේ.

**(ඈ) ගල් අඟුරු හිඟය සඳහා ලංකා ගල් අඟුරු සමාගමෙන් ගෙවිය යුතු රුපියල් මිලියන 714.96 ක මුදලක් වසර පහකටත් වැඩි කාලයක් කිසිදු අයකරගැනීමේ පියවරක් නොගෙන හිඟව පැවතිණි.**

මෙම ශේෂය ටෝරියන් යකඩ හා වානේ සමාගමට අදාළ රු. 478,179,795.00 සහ එම්/එස් ලිබර්ටි කොමොඩිටීස් සමාගමට අදාළ රුපියල් 236,785,639.43යන ශේෂයන්ගෙන් සමන්විතවේ. ටෝරියන් යකඩ හා වානේ සමාගමේ ශේෂය සඳහා කැබිනට් කමිටුවක් පත් කර අවසන් වාර්තාව වරාය හා නාවික කටයුතු අමාත්‍යංශ ලේකම් වෙත භාර දෙන ලදී. ලිබර්ටි වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන් ලංකා ගල් අඟුරු සමාගම බේරුම්කරණ ක්‍රියාවලියක් ආරම්භ කර ඇත. ලංකා ගල් අඟුරු සමාගම විසින් එම්/එස් ලිබර්ටි කොමොඩිටීස් ලිමිටඩ් ආයතනයට එරෙහිව නීතිමය පියවර ගැනීමෙන් පසු මෙම ශේෂය පියවනු ඇත.

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු

**(ඉ) රුපියල් බිලියන 4.3 ක් වූ පහත සඳහන් ණය ශේෂ 2020 දෙසැම්බර් 31 දින වන විටත් දීර්ඝ කාලයක් තිස්සේ නොවිසඳී පවතී.**

| ණය හිමියාගේ නම | වටිනාකම | පිළිතුරු |
|---|---|---|
| රේගුව | 1,065,828 | 2017/18 කාල සීමාව තුළ වාරිකය ගෙවීම රු. 1,065,828.00 ක් 2020 දෙසැම්බර් 31 දින දක්වා ලක්විජය වාරික ගෙවීමේ කමිටුව විසින් අනුමත කර නොමැත. ලක්විජය ගෙවීම් කමිටුවේ අනුමැතිය ලැබීමෙන් පසු මෙම මුදල ගෙවනු ඇත. |
| චීන යන්ත්‍රෝපකරණ හා ඉංජිනේරු සංස්ථාව | 3,034,971,432 | කැබිනට් අනුමැතිය පරිදි 2014, 2015, 2016 සහ 2017 වර්ෂ සඳහා CMEC ආයතනය වෙත ගෙවිය යුතු මෙහෙයුම් සහ නඩත්තු ගාස්තු ගෙවා ඇත. මූල්‍ය ප්‍රකාශවල දක්වා ඇති රු. 4,195,528,526.54 ක මුදල 2017, 2018, 2019 සහ 2020 වර්ෂ සඳහා ගෙවිය යුතු මෙහෙයුම් හා නඩත්තු ගාස්තු වේ. වර්තමාන අහිතකර මූල්‍ය තත්ත්වය හේතුවෙන් විදුලිබල මණ්ඩලය ගෙවන්නේ මසකට ඩොලර් මිලියන 1 ක් පමණි. |
| ගෙවිය යුතු යැයි සැලකෙන ලාභාංශ ආදායම් බදු | 1,270,766,413 | ලාභාංශ බදු වශයෙන් ගෙවිය යුතු රුපියල් 1,270,766,413 ක් නියෝජනය කරන්නේ 2009/2010 සහ 2010/2011 යන තක්සේරු වර්ෂ සඳහා ඉල්ලන ලද ලාභාංශ බදු ගෙවීමට එරෙහිව 2013/2014 තක්සේරු වර්ෂය සදහා නිශ්චල ලාභාංශ බද්දේ නොවිසඳුනු වගකීමයි. ගිණුම් වල ඇති මෙම වගකීම නිරවුල් කිරීම සදහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් කරන ලද ආපසු ගෙවීමේ ඉල්ලීම් තවමත් අවසන් කර නොමැත. |

**(ඊ) උතුරු බලශක්ති (පුද්ගලික) සමාගමට ගෙවිය යුතු රුපියල් බිලියන 2.9 ක මුදල වසර දෙකකට වඩා වැඩි කාලයක් ගෙවීමකින් තොරව සම්ප්‍රේෂණ අංශයේ වෙළඳ ණය හිමි ශේෂයක් ලෙස පවතී.**

මල්ලකම් මහේස්ත්‍රාත් අධිකරණය ලබා දුන් තහනම් නියෝගය හේතුවෙන් උතුරු විදුලි බලාගාරය 2015-01-27 සිට වසා දමා ඇත. කෙසේ වෙතත්, සමාගම මෙය බලහත්කාරී තත්වයක් (Force Majeure) ලෙස ප්‍රකාශ කරමින් ධාරිතා ගාස්තු සඳහා මාසික ඉන්වොයිසි නිකුත් කර ඇත. අධිකරණ තීන්දුව ලැබෙන තුරු විදුලිබල මණ්ඩලය මෙම ඉන්වොයිසි වටිනාකම් ගෙවිය යුතු බවට ගණන් බලා ඇත. බලාගාරය ක්‍රියාත්මක කර ඇත්තේ පාරිසරික නීතිය උල්ලංඝනය කරමින් බව ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දු කර ඇති හෙයින් මෙම ඉන්වොයිසි පියවීම සඳහා විදුලිබල මණ්ඩලයට වගකීමක් නොමැත. මෙම මුදල් කපා හැරීමට අවශ්‍ය පියවර ගැනීමට නියමිත කාලය තුළ සිදු කෙරේ.

**(උ) 2020 ඔක්තෝබර් 16 දින වන විට ගල් අඟුරු තොගයේ හිඟය ලෙස රුපියල් බිලියන 1.04 ක් වටිනා මෙට්‍රික් ටොන් 51,439.64 ක් හඳුනාගෙන ඇතත්, 2020 දෙසැම්බර් 31 දින වන විට සමීක්ෂණ කණ්ඩායම විසින් භෞතික තහවුරු කිරීමක් සිදු කර නොමැත. ඒ අනුව 2020 දෙසැම්බර් 31 දින වන විට ගල් අඟුරු තොගයේ වටිනාකම ලෙස දැක්වෙන රුපියල් 9,991,897,000 ශේෂයේ නිවැරදිතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය.**

2020 සැප්තැම්බර් 3 දිනැති ලංවිම සමානයාධිකාරීගේ අංක 2020/ජීඑම්/42/එෆ්එම් චක්‍ර ලේඛනයට අනුව භෞතික සත්‍යාපනයක් සිදු කර ඇත;

උපුටා ගැනීම;

"ලක්විජය බලාගාරයේ ගල් අඟුරු තොග සහ ජනන හා සම්ප්‍රේෂණ අංශ වල අමතර කොටස් ඒ ඒ අංශ හා ශාඛා ප්‍රධානීන් විසින් තීරණය කරන ලද පරිදි වඩාත් සුදුසු සහ පහසු වේලාවක සිදු කළ යුතුය."

උපුටා ගැනීමේ අවසානය

අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහ කමිටු වාර්තා අනුව ඉහත සඳහන් කළ ගැලපීම් ගිණුම් පොත්වලින් ඉවත් කර ඇත. 2021 වර්ෂය තුළදී ඉතිරි වූ සියල්ල ඉවත් කෙරේ.

**(ඌ)ලංකා විදුලිබල මණ්ඩලය ලංකා විදුලි(පුද්) සමාගමට විදුලිය අලෙවි කිරීම සහ ඛනිජ තෙල් සංස්ථාවෙන් ඉන්ධන මිලදී ගැනීම වසර ගණනාවක් පුරා සිදු කලද මෙම ආයතන දෙක අතර සුමට මෙහෙයුම් සහතික කිරීම සඳහා එම පාර්ශව සමඟ කිසිදු විකුණුම් සහ මිලදී ගැනීමේ ගිවිසුමක් නොතිබුණි.**

**ලංකා විදුලි(පුද්) සමාගම සමග ගිවිසුම**

මෙම කාරණයේදී ලබා ඇති ප්‍රගතිය පහත දැක්වේ

- ලංවිම සහ ලෙකෝ යන ආයතන දෙකේම ඉහළ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් යුත් කමිටුවක් ගිවිසුම් කෙටුම්පතක් සකස් කර ඇති අතර ඒ පිළිබඳව නීතිපතිගේ (ඒජී) මතය විමසා තිබේ.

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු

- එම කමිටුව නීතිපතිවරයාගේ මතය අනුව අවශ්‍ය සංශෝධන සිදු කර ඇති අතර අ.ස (සම්ප්‍රේෂණ) වෙත "අවසන් බල විකුණුම් ගිවිසුම" ඉදිරිපත් කර ඇත.
- කමිටුව විසින් සපයන ලද වාර්තාවේ ලෙකෝ ආයතනයේ නිලධාරීන් 03 දෙනෙකු විසින් කරන ලද යම් යම් අනුමත කිරීම් සම්බන්ධව 2015 මාර්තු 26 දින ලංවීම සාමාන්‍යාධිකාරී විසින් ලෙකෝ ප්‍රධාන කළමනාකරු වෙත ලිඛිතව යොමු කර තිබේ. එම ලිපියේදීම ලංවිම සාමාන්‍යාධිකාරී යෝජනා කර ඇත්තේ ලෙකෝ හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මේ කාරණය සාකච්ඡා කරන ලෙසයි

කමිටුව විසින් සපයන ලද වාර්තාව පිළිබඳව ලෙකෝ ආයතනයේ නිලධාරීන් 03 දෙනෙකු විසින් සිදු කරන ලද අනුමත කිරීම් පිළිබඳව කරුණාකර පහත දක්වා ඇති විස්තර බලන්න.

ජනවාරි 28 දිනැති ලිපියට සහ 2020 ජනවාරි 30 දිනැති ලංවීම සාමාන්‍යාධිකාරීගේ සටහන් කෙරෙහි අවධානය යොමුකරන්න. ඒ අනුව විදුලිබල මණ්ඩලය එහි මූලික නිර්දේශයන්ට එකඟ වී ඇත. තවද, බෙදා හැරීමේ සම්බන්ධීකරණ කමිටුව (ඩීසීසී), අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කිරීමට පෙර ලෙකෝ බලශක්ති බෙදා හැරීම සඳහා කැප කර ඇති 33kV උපපොළ සහ 33kV/11kV ප්‍රාථමික උපපොළවල් ලබා දීම සඳහා මාර්ග සිතියමක් සකස් කිරීමට ලංවිම කමිටුවක් පත් කර තිබේ. එකී කමිටුව මේ වන විට එම කටයුතු කරගෙන යයි.

මෙම කර්තව්‍යයේ අවසානයත් සමඟ, 2015 මාර්තු වාර්තාවේ සඳහන් පරිදි බෙදා හැරීමේ බලපත්‍රලාභීන් (ඩීඑල්) සතු ලෙකෝ සැපයුම් ස්ථාන පිළිබඳ ගැටළුව විසඳීම "යන දිගුකාලීන අපේක්ෂිත ගැටලුව එවකට ලෙකෝ ප්‍රධානියාවූ එච්.එන් ගුණසේකර, ඉන්පසුව ඉංජිනේරු අංශයේ ප්‍රධානී, පී.එස්.එන්. ද සිල්වා මහතා සහ පසුව ප්‍රධාන මෙහෙයුම් නිළධාරී ඩබ්. ඩී.ඒ.එස් පෙරේරා යන අය විසින් විසඳා විකුණුම් ගිවිසුම අත්සන් කිරීමට මාර්ගය සලසා දෙනු ඇත.

මෙම කාරණය සම්බන්ධයෙන් ලෙකෝ විසින් මහජන උපයෝගීතා කොමිසම වෙතින් යම් පියවරක් ඉල්ලා ඇත

**ඛනිජ තෙල් සංස්ථාව සමග ගිවිසුම**

තෙල් සංස්ථාව සමඟ ඉන්ධන සැපයුම් ගිවිසුම පිළිබඳ කෙටුම්පත තවමත් සාකච්ඡා මට්ටමේ පවතී. දෙපාර්ශවයම එකඟ විය යුතු කරුණු කිහිපයක් තිබේ, එනම් ඛනිජ තෙල් සංස්ථාව මහා භාණ්ඩාගාරය විසින් එකඟතාවය ලබා දිය යුතු බිලියන 30 ක වගකීමක් විදුලිබල මණ්ඩලයෙන් ඉල්ලා සිටී. එම නිසා ගිවිසුම තවම අවසන් කර නැත

**(එ) කාලෝචිත ලෙස මුදල් ප්‍රයෝජනයට නොගැනීම හේතුවෙන් ලංවිම විදේශ අරමුදල් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ලබා දුන් ණය වලින් 2020 දී ණය දෙන ආයතනයෙන් මිලියන 92.69 ක් කැපවීම් ගාස්තු ලෙස අඩු කර ඇත. කෙසේ වෙතත්, ගණනය කිරීම් නොමැති වීම හේතුවෙන් කැපවීමේ ගාස්තු වල නිරවද්‍ය තාවය තහවුරු කළ නොහැක.**

සියලුම ව්‍යාපෘති සඳහා කැපවීමේ ගාස්තුව පොදු වන අතර ණය ගිවිසුම් වල ඇති දැඩි ණය කොන්දේසි හේතුවෙන් ව්‍යාපෘති නියමිත වේලාවට සිදු කළත් එය වළක්වා ගත නොහැක.

කෙසේ වෙතත්, ඉහත ශේෂයෙන් ව්‍යාපෘති 3 කට අදාළ රු. 38,881,225.27 ක මුදලක් ලංවිම විසින් දරනු නොලැබේ. තවද, 2020 වර්ෂය සඳහා පිරිසිදු බලශක්ති ජාල කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති සඳහා කිසිදු කැපවීමක් නොමැත.

**(ඒ) 2018 - 2037 දිගු කාලීන උත්පාදන ව්‍යාපෘති සැලැස්මට අනුව මෙගාවොට් 500, මෙගාවොට් 657 සහ මෙගාවොට් 430 ක නව ජනන බලාගාර පිළිවෙලින් 2018, 2019 සහ 2020 වර්ෂයන්හිදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි**

ලංවිම දිගු කාලීන ජනන ව්‍යාපෘති සැලසුම් සකස් කළද, හඳුනාගෙන ඇති එවැනි පිරියත සංවර්ධනය කිරීමේ අධිකාරිය විදුලිබල මණ්ඩලයට නැත. විදුලිබල මණ්ඩලය දැඩි ලෙස අනෙකුත් ආයතන මත යැපෙන අතර PUCSL සහ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ මඟින් ප්‍රකාශයට පත් කරන ලද "2016 අංක 02 දරණ (ප්‍රසම්පාදන) නීති" වැනි අනෙකුත් ආයතන වල නීති හා මාර්ගෝපදේශ මගින් පාලනය වේ.

උදාහරණයක් වශයෙන්, කොමිෂන් සභාව විසින් ප්‍රකාශයට පත් කරන ලද 2016 අංක 02 දරණ විදුලි (ප්‍රසම්පාදන) රීති වල 2 (xi) වගන්තියට අනුව, උත්පාදන ධාරිතාවය ලබා ගැනීමට ඉදිරියට යාමට පෙර විදුලි පනතේ 43 (2) වගන්තිය යටතේ අවශ්‍ය පරිදි මූලික අනුමැතිය ලබාගැනීමට ලංවිම විසින් අදාල යෝජනාව සඳහා වන කෙටුම්පත් කරන ලද ඉල්ලීම (ආර්එෆ්පී) (වෙනත් බොහෝ ලියකියවිලි සමඟ) ඉදිරිපත් කළ යුතුය.

කෙසේ වෙතත්, ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුවකට (බොහෝ විට SCAPC) ඉහත දැක්වූ ආර්එෆ්පී ලේඛනයම ඉදිරිපත් කිරීම අවශ්‍යවේ. PUCSL අනුමත RFP SCAPC මඟින් වෙනස් කරන විට හෝ SCAPC අනුමත ලේඛනය PUCSL මඟින් වෙනස් කරන විට, නැවත ලේඛනය සමාලෝචන ක්‍රියාවලියක් හරහා ගොස් අනුමැතිය සඳහා ආයතන දෙකෙන් එකකට ඉදිරිපත් කළ යුතුය.

**ප්‍රතිපත්ති හා ගුණාංග වෙනස් කිරීම**

තවද, නිතිපතා ප්‍රතිපත්ති වෙනස් කිරීම, මධ්‍යම අදියරේදී සිදු කෙරෙන බලශක්ති ප්‍රසම්පාදනයේ ප්‍රධාන ලක්ෂණ වෙනස් කිරීමට නියෝග කිරීම (තාක්ෂණය, ස්ථානය, හිමිකාරිත්ව ආකෘතිය BOO සිට BOT දක්වා වෙනස් කිරීම වැනි) සහ බලශක්ති ව්‍යාපෘති ඉතා පරිණත අවධියක සම්පූර්ණයෙන්ම අවලංගු කිරීම, ප්‍රසම්පාදනය මාස සහ අවුරුදු ගණන් ලෙස සැලකිය යුතු කාලයකින් පසුපසට ගෙන යාමට හේතු විය හැක

**මුදල් නොමැතිකම**

මුදල් රැස්කර ගැනීම සඳහා ද ප්‍රමාදයන් ඇත (වාර්තාවේ වෙනත් තැනක සඳහන් සීතාවක ගඟ විදුලි බලාගාරය සම්බන්ධයෙන් දැක්වෙන පරිදි).

1969 අංක 17 දරණ ලංකා විදුලිබල මණ්ඩල පනතේ 38 වන වගන්තිය යටතේ, මණ්ඩලයේ සේවාවන්හි සංවර්ධනයේ පිරිවැය සඳහා සාධාරණ අනුපාතයක් සපුරාලීමට ද මණ්ඩලයේ ආදායම ප්‍රමාණවත් බව සහතික කිරීමට මණ්ඩලයට අධිකාරිය ලබා

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු

දෙන ලදී. කෙසේ වෙතත්, එවැනි මූල්‍ය ආරක්ෂාව සඳහා විදුලිබල මණ්ඩලය සතුව (විදුලිබල පනතේ **V** කොටසේ යටතේ) තිබූ "මෙවලම" එනම් ගාස්තු හා ගාස්තු නියම කිරීමේ බලය 2009 දී විදුලිබල මණ්ඩලයෙන් ඉවත් කර ලංකා විදුලිබල පනත මඟින් PUCSL වෙත ලබා දෙන ලදී. එතැන් සිට විදුලි බල මණ්ඩලයට පිරිවැය පිළිබිඹු වන ගාස්තුවක් ලබා නොදීම හේතුවෙන් තමන්ගේම අරමුදල් වලින් කිසිදු සංවර්ධන කාර්යයක් කිරීමට නොහැකි විය.

තවද, රජයේ අනෙකුත් චක්‍රලේඛන හා පනත් හේතුවෙන් ණය දෙන ආයතනවලින් ලබා දෙන සියළුම මුදල් ඉල්ලීම් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා ලබා දිය යුතුය. රජයේ මූල්‍ය අවකාශය තුළ පවතින බාධා හේතුවෙන්, මුදල් නොමැතිකම හේතුවෙන් සම්ප්‍රේෂණ සහ උත්පාදන ව්‍යාපෘති යන දෙකම ප්‍රමාද විය හැකිය.

**(ඔ) 2014 උතුරු වසන්තය ව්‍යාපෘතියට අදාලව වසර 3 ක ප්‍රමාදයකින් පසුව 2017 අප්‍රේල් මාසයේදී හඳුනාගත් රු. මිලියන 39.55 ක තොග හිඟය පිළිබඳව අභ්‍යන්තර විගණන ශාඛාව විසින් විශේෂ විමර්ශණයක් සිදු කර තිබුණි.**

**තොග අතිරික්තය රු. 2,510,056**

නි.සා (උතුරු පළාත) විසින් ඔහුගේ 2017-05-04 දිනැති අංක එන්පී/ඩීජීඑම්/එච්ආර්ඕ/පරීක්ෂණ ලිපිය මඟින් කමිටුව පත් කර ඇති අතර කමිටු වාර්තාව 2019-10-03 දින නි.සා (උතුරු පළාත) වෙත භාර දී ඇත. ඒ අනුව, නි.සා (උතුරු පළාත) විසින් ඔහුගේ 2019-10-09 දිනැති අංක එන්පී/ඩීජීඑම්/මානව සම්පත්/විමසීම් යන ලිපිය මඟින් තොග ඌනතාවය ලෙස රු. 2,510,056.88 (මණ්ඩල ගාස්තු ඇතුළුව) ක මුදලක් ගබඩා භාරකරු ජේ. ඒ. එම්. අසංක ජයකොඩි (අඅ අංක 37432) යන අයගෙන් අයකර ගැනීමට උපදෙස් ලබාදී ඇත. මෙම ගබඩා භාරකරු 2019 ඔක්තෝම්බර් මාසයේදී නි.සා (උ.මැ.) වෙත මාරු කර යවා ඇති අතර ඔහුගෙන් අය කර ගත යුතු ඉතිරි මුදල (රුපියල් මිලියන 2.5) වෙනත් ලැබිය යුතු දේ යටතේ සටහන් කර ඇත. අ.ස (බෙදාහැරීම් අංශ 01) විසින් ඔහුගේ 2019-11-28 දිනැති අංක DGM (C&C)/DD1/HRO/ADMN/10 යන ලිපිය මඟින් සේවකයාගෙන් මෙම මුදල අයකර ගැනීමට උපදෙස් දී ඇත. කෙසේ වෙතත්, එම්.ආර්. ජයකොඩි 2020-01-06 දිනැති ඔහුගේ ලිපියේ විධිමත් පරීක්ෂණයක් කරන ලෙස ඉල්ලා සිටි අතර ඒ අනුව චෝදනා පත්‍රය නිකුත් කර ඇත.

මේ සමඟම, අ.ස (බෙදාහැරීම් අංශ 01) විසින් ඔහුගේ 2020-09-03 දිනැති අංක 180 දරණ ඒජීඑම් (ඩීඩී 1)/ඩීජීඑම් (සී ඇන්ඩ්සී)/එච්ආර්ඕ/ඩීඩී 1/162 දරණ ලිපිය මඟින් විධිමත් පරීක්ෂණ තීන්දුවට යටත්ව හිඟය පියවා ගැනීමට උපදෙස් දී ඇත.

**තොග ඌනතාවය රු. 31,257,161**

ද්‍රව්‍ය ලබා දීමකින් තොරව වංචනික ලෙස රු. 22,584,800.00 ක මුදලක් ලබා ගැනීම හේතුවෙන් ලංවිමෙහි නීති නිලධාරියා විසින් රිචඩ්සන් ප්‍රොජෙක්ට්ස් (පුද්ගලික) සමාගමට 25% වූ මාණ්ඩලීය ගාස්තුවක් සහිතව රු. 28,331,000.00 ක මුදලක් ගෙවන ලෙස ඉල්ලුම් කරමින් ලිපියක් නිකුත් කර ඇත.ඊට අමතරව, අලාභයට එරෙහිව තවදුරටත් ගැලපීම් හඳුනා ගැනීම සඳහා තොග ද්‍රව්‍ය තවදුරටත් සත්‍යාපනය කිරීම කඩිනමින් සිදු කරන ලදී. ඒ අනුව යම් ගැලපීම් සිදු කිරීමෙන් පසු අලාභය රු. මිලියන 8.3කට ගැලපුම් කරන ලදි. මේ වන විට අභ්‍යන්තර පරීක්ෂණය අවසන් කර ඇති අතර ඒ අනුව ගබඩා භාරකරු යූ.පී.උදාර ගුණරත්න මහතාට (අ. අ. අංක 37475) එරෙහිව විනය ක්‍රියාමාර්ග ගනු ඇත. තවද, අංක ඊ/1164/15 දරන අධිකරණ නඩුව ත්‍රිකුණාමලය මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග වෙමින් පවතී.

විනය පියවර ක්‍රියාමාර්ග වෙමින් පවතී

**(ඕ) 2006 නොවැම්බර් 20 සිට 2012 පෙබරවාරි 20 දක්වා කාලය තුළදී වත්කම් කළමණාකරන ඒකකයේ ජනක යන්ත්‍ර අංශයට අයත් රු. මිලියන 3.67 ක කොටස් හිඟය සඳහා වගකිව යුතු පුද්ගලයාට එරෙහිව 2018 අගෝස්තු 16 දින දක්වා මණ්ඩලය විසින් අවශ්‍ය පියවර ගෙන නොතිබුණි**

නඩු පැවරීම පිළිබඳව ලංවීම විසින් නීතිපතිවරයාගේ අදහස් ලබාගෙන ඇති අතර, රටේ පවතින කොවිඩ් -19 තත්ත්වය හේතුවෙන් රැස්වීම කල් දමා ඇත.

**(ක) මිලියන 3.79 ක තොග හිඟයට වගකිව යුතු නිලධාරියෙකුට විමර්ශනය සඳහා පත් කළ කමිටුව නිර්දේශ කළ පරිදි අලාභය අය කර නොගෙන 2011 ඔක්තෝබර් 15 දින විශ්‍රාම ගැනීමට අවසර දී තිබුණි.**

විගණන වාර්තාවට අනුව තොග හිඟය රු. 3,789,893.00 කි. කෙසේ වෙතත්, 2010 වර්ෂයේදී තොග විචලනය පිළිබඳව සොයා බැලීම සඳහා පත් කළ කමිටුව විසින් එම හිඟ මුදල රු. 1,953,484.15 ලෙස දක්වා ඇත. අදාල නිලධාරියා වන සමරසිංහ මහතා වයස අවුරුදු 60 සම්පූර්ණ වීමෙන් පසු 2011-10-15 දින විශ්‍රාම ගොස් ඇත. තොග හිඟය පිළිබඳ තීරණයක් ගන්නා තුරු විශ්‍රාම වැටුප සහ පාරිතෝෂික දීමනාව නැවැත්වීමට ඔහුගේ විශ්‍රාම යාමේදී පියවර ගන්නා ලදී. තොග හිඟය යථා තත්ත්වයට පත් නොකිරීම පිළිබඳව සොයා බැලීම සඳහා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් තුන්දෙනෙකුගෙන් යුත් කමිටුවක් පත් කර ඇත. මෑතකදී කමිටු වාර්තාව ඉදිරිපත් කර ඇති අතර එම කමිටුව විසින් නිර්දේශය සඳහා අනුමැතිය ලබා ගැනීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කෙරෙමින් පවතී.

**(ග) 2018 දෙසැම්බර් 31 දින වන විට ජනන අංශයේ කෙරීගෙන ප්‍රග්ධන වැඩ ගිණුමේ පැවති රුපියල් මිලියන 260.48 ක ශේෂය චලනය නොවී ගිණුම් වල පවතී.**

ඉහත ශේෂය නියෝජනය කරන්නේ 2020 දෙසැම්බර් 31 දින වන විටත් ක්‍රියාත්මක වෙමින් පවතින කාර්යයන්ගෙනි. අවසන් වූ පසු එම ශේෂයන් 2021 මූල්‍ය වර්ෂයේදී ප්‍රාග්ධනීකරණය කෙරේ.

**(ච) සමාලෝචිත වර්ෂය තුළදී ජනන අංශය මඟින් ලගාකර ගෙන ඇත්තේ ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම් 76 න් ක්‍රියාකාරකම් 16 ක් පමණි.**

ක්‍රියාකාරී සැලැස්මේ දක්වා ඇති මූල්‍ය ප්‍රගතිය 16 ක් පමණක් වුවද, සැලැස්මේ සඳහන් ක්‍රියාකාරකම් සිදුවෙමින් පවතී

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු

**(ජ) රුපියල් බිලියන 63.55 ක වටිනාකමින් යුත් වේලි වල අයිතිය ලබා ගැනීමට මණ්ඩලය අවශ්‍ය පියවර ගෙන නොතිබුණි**

වාර්තාවේ දැක්වෙන වටිනාකම වික්ටෝරියා, කොත්මලේ, උකුවෙල, බෝවතැන්න, රන්දෙනිගල, රන්තැඹේ සහ නිල්ලඹේ විදුලි බලාගාර නියෝජනය කරයි. නිල්ලඹේ වේල්ල රුපියල් 596,216,467.81 ක් පිරිවැයට මණ්ඩලය විසින් දැනටමත් අත්පත් කරගෙන ඇති අතර එය ක්‍රියාත්මක කිරීම, නඩත්තු කිරීම සහ කළමනාකරණය කිරීම අදාළ බලාගාරය මඟින් සිදු කෙරේ. කෙසේ වෙතත්, ඉහත සඳහන් විදුලි බලාගාර වලට සම්බන්ධ අනෙකුත් සියලුම වේලි ක්‍රියාත්මක කිරීම, නඩත්තු කිරීම සහ කළමනාකරණය කිරීම එහි නීතිය මඟින් ශ්‍රී  ලංකා මහවැලි අධිකාරිය මඟින් සිදු කෙරේ. කෙසේ වෙතත්, මණ්ඩලය විසින් ජලාශවල විදුලිය ලබා ගන්නා තෙක් ජල මාර්ගය පමණක් ලබාගෙන ඇති අතර ඒවා සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කිරීම, නඩත්තු කිරීම සහ කළමනාකරණය කිරීම අදාළ බලාගාර මඟින් සිදු කෙරේ.

**(ට) පරිභෝජනයට ගත හැකි රුපියල් බිලියන 26.75 ක තොග වටිනාකමින්  10% ක් නියෝජනය කරන රුපියල් බිලියන 2.67 ක මුදලක් 2020 දෙසැම්බර් 31 දින වන විට මන්දගාමී, චලනය නොවන හා හානි වූ තොග වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.**

සෙමින් චලනය වන, චලනය නොවන හා යල් පැන ගිය තොග සම්බන්ධව කමිටු පත් කර, සමීක්ෂණ මණ්ඩලය සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතීන් ලබා ගැනීමෙන් පසු කටයුතු කිරීමට පියවර ගෙන ඇත. ඒ අනුව බෙදාහැරීමේ අංශ- 2 විසින් රුපියල් මිලියන 38,947,687.46 වටිනා මන්දගාමී තොග බැහැර කිරීම සඳහා දැනටමත් මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත.

**(ඩ) ඒස් පවර් ඇඹිලිපිටිය (පුද්ගලික) සමාගම සමඟ ඇතුළත් වූ ගිවිසුම අනුව අවම සහතික කළ බලශක්ති ප්‍රමාණය (එම්ජීඊඒ) වසරකට කිලෝ වොට් 697,674,432 වුවද, සමාලෝචනය කරන ලද වර්ෂය තුළදී ලබා ගත් බලශක්තිය ඒකකයක් රුපියල් 24.42 බැගින් කිලෝ වොට් 475,831,835 කි. ඒ අනුව සමාලෝචනය කළ වර්ෂය තුළදී කිලෝ වොට් 221,842,597 බලශක්තියක් ලබාගෙන නොමැත**

මින් පෙර විගනන වාර්තාවක, ඇඹිලිපිටිය ඒස් පවර් බලාගාරයේ ඌන උත්පාදනයක් තිබියදීත්  එස් පවර් මාතර, හම්බන්තොට සහ ගාල්ල යන පරිපූරක බලාගාර ඇති කල බවට විදුලිබල මණ්ඩලයට චෝදනා එල්ල වී තිබේ.වාර්තාවට අනුව, එහි MGEA වලට වඩා අඩු බල ප්‍රමාණයක් ඒස් පවර් ඇඹිලිපිටිය බලාගාරයෙන් උත්පාදනය වන හෙයින්, ඉහත සඳහන් බලාගාර මඟින් විදුලි උත්පාදනය වෙනුවට එස් පවර් ඇඹිලිපිටිය උත්පාදනය පහසුවෙන් භාවිතා කළ හැකිව තිබුණි.

සටහන් කළ යුතු කරුණ නම්,

1. ඉල්ලුම සහ ශුද්ධ උත්පාදනය ඕනෑම අවස්ථාවක සමාන විය යුතුය.
2. රටේ විදුලි ඉල්ලුම නියත නොවන අතර කාලය අනුව වෙනස් වේ
3. ජලාශ වෙත ගලා යන ජල ගලායාම/ගංඟා බලාගාර, ජල කළමනාකරණ ලේකම් කාර්යාලයේ (WMS) උපදෙස් සහ යන්ත්‍ර නඩත්තු කිරීම ඇතුළුව අනාගත අවශ්‍යතා අනුව ජල විදුලි බලාගාර ඇති කිරීම තීරණය කළ යුතුය.
4. පිරියත වල කුසලතා අනුපිළිවෙල මත ආර්ථික  බාධක සැලකිල්ලට ගෙන තාප බලාගාර ඇතිකිරීම සිදු කෙරේ

බලාගාර ඇතිකිරීම සිදු කරනු ලබන්නේ එහි බලශක්ති පිරිවැය මත පදනම්ව සත්‍ය කාලීන ඉල්ලුමේ අවශ්‍යතාවය අනුව වන අතර එම නිසා බලාගාර ලබා ගත හැකි ප්‍රමාණය මත ධාරිතා ගාස්තු ගෙවීම සඳහා පමණක් MGEA සලකා බලනු ලබන හෙයින් එහි MGEA සමඟ උත්පාදන යැවීම සංසන්දනය කිරීම යථාර්ථවාදී නොවන බව සැලකිල්ලට ගත යුතුය. මේ අනුව MGEA සහ සත්‍ය  කාලීන බලශක්ති යැවීම සමඟ කිසිදු සම්බන්ධයක් නොමැත. සත්‍ය  කාලීන ඉල්ලුමට සරිලනසේ ඒස් පවර් ඇඹිලිපිටිය බලාගාරයට අමතරව එස් පවර් මාතර, හම්බන්තොට සහ ගාල්ලට පරිපූරක බලාගාර  ඇති කල බව ද සඳහන් කළ යුතුය. එබැවින්, විදුලිබල මණ්ඩලය සෑම විටම අඩු මිලැති එස් පවර් ඇඹිලිපිටිය බලාගාරය ඉහළ විචල්‍ය පිරිවැය සහිත මාතර, හම්බන්තොට සහ ගාල්ල පරිපූරක බලාගාර වෙනුවට භාවිතා කර ඇත. අවසාන වශයෙන්, රටේ විදුලි ඉල්ලුම සපුරාලීම සඳහා කුසලතා නියෝග මත පදනම්ව සියලු තාප බලාගාර ඇතිකර ඇත.

**(ණ) 2020 වර්ෂය සඳහා වළක්වා ගැනීමේ පිරිවැය ක්‍රමය මත (Avoided Cost) කුඩා ජල විදුලි බලාගාර සඳහා වන මිල, තෙත් සමය සඳහා රුපියල් 19.51 ක් වූ අතර වියළි කාලය සඳහා රුපියල් 21.25 කි. වළක්වා ගත් පිරිවැය ක්‍රමය පදනම් වී ඇත්තේ තාප බලාගාර මගින් ජනනය කිරීම මත වන අතර එය ඉන්ධන පිරිවැය අනුව වෙනස් වේ. එම නිසා එම ක්‍රමය මත තීරණය වූ අනුපාතය කුඩා ජල විදුලි බලාගාරයේ සත්‍ය  පිරිවැයට කිසිදු සම්බන්ධයක් නැත. ජල විදුලි සාමාන්‍ය  ඒකක පිරිවැය රුපියල් 10 ට අඩු විය යුතු අතර විදුලි බල මණ්ඩලයේ ජල විදුලි ඒකකයක මිල රුපියල් 2.49 ක් වූ බව නිරීක්ෂණය විය. තවද එය සමාන්‍ය ඒකක විකුණුම් මිල රුපියල් 16.62 ඉක්මවා ඇත.**

නැගී එන එන්සීආර්ඊ බලාගාර සංවර්ධනය සඳහා ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා වළක්වා ගත හැකි පිරිවැය මත පදනම් වූ ගාස්තු ක්‍රමය ආරම්භයේදී හඳුන්වා දෙන ලදී. පසුව, මෙම ක්‍රමයේ අඩුපාඩු හඳුනාගෙන ඇති අතර, 'පිරිවැය පිළිබිඹු, තාක්ෂණික විශේෂිත තුන් ස්ථර ගාස්තු ලෙස හඳුන්වන නව ගාස්තු ක්‍රමයක් 2008 වර්ෂයේදී හඳුන්වා දෙන ලදී. පසුව, මෙම ක්‍රමයද ද තරඟකාරී මිල ගණන් ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය මඟින්  ප්‍රතිස්තාපනය කරන ලද අතර වෙළඳපල බලවේග විසින් ගාස්තු තීරණය කරන ලදී.

**ඉංජිනේරු විජිත හේරත්**
සභාපති
ලංකා විදුලිබල මණ්ඩලය

**ඉංජිනේරු එන්.ඩබ්.කේ. හේරත් මිය**
සාමාන්‍යාධිකාරී
ලංකා විදුලිබල මණ්ඩලය

# කෙටි යෙදුම්

| | |
|---|---|
| ABB | Asia Brown Boweri |
| ADB | ආසියානු සංවර්ධන බැංකුව |
| AFD | ප්‍රංශ සංවර්ධන ඒජන්සිය |
| AFM | අතිරේක මුදල් කළමනාකරු |
| AGM | අතිරේක සාමාන්‍යාධිකාරී |
| AIIG | ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව |
| AMHM | වත්කම් කළමනාකරණ තාප යාන්ත්‍රික |
| AMI | උසස් මනුකරණ යටිතල පහසුකම |
| B&OS | ව්‍යාපාර හා මෙහෙයුම් ක්‍රමෝපාය |
| BBC | Brown, Boveri & Compagnie |
| BHPP | බ්‍රෝඩ්ලන්ඩ් ජලවිදුලි ව්‍යාපෘතිය |
| BOI | ආයෝජන මණ්ඩලය |
| BOO | ඉදිකර හිමිකරගෙන ක්‍රියාත්මක කිරීම |
| BOP | බලාගාර ශේෂය |
| BST | තොග සැපයුම් අයක්‍රමය |
| BSTA | තොග සැපයුම් ගනුදෙනු ගිණුම |
| CB | පරිපථ බිඳීනය |
| C&C | වාණිජ හා ආයතනික |
| CCPP-GT | සංයුක්ත චක්‍රීය විදුලි බලාගාරය - වායු ටර්බයින |
| CCPP-ST | සංයුක්ත චක්‍රීය විදුලි බලාගාරය - වාෂ්ප ටර්බයින |
| CCTV | ආවරණිත පරිපථ රූපවාහිනිය |
| CDM | පවිත්‍ර සංවර්ධන යාන්ත්‍රණය |
| CEA | මධ්‍යම පරිසර අධිකාරිය |
| CEB | ලංකා විදුලිබල මණ්ඩලය |
| CE&NEIP | පවිත්‍ර බලශක්ති හා ජාල කාර්යක්ෂමතා ප්‍රවර්ධන ව්‍යාපෘතිය |
| CFL | සංයුක්ත ප්‍රතිදීප්ත පහන |
| CIPM | වරලත් පිරිස් කළමනාකරණ ආයතනය |
| CMMS | පරිගණකගත නඩත්තු කළමනාකරණ පද්ධතිය |
| CNEEC | චීන ජාතික විදුලි උපකරණ සංස්ථාව |
| CPC | ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව |
| CPCDP | කොළඹ වරාය නගරය සංවර්ධන ව්‍යාපෘතිය |
| CPD | අඛන්ඩ වෘත්තීය සංවර්ධනය |
| CS&RA | ආයතනික ක්‍රමෝපාය හා නියාමන කටයුතු |
| CS | ආයතනික ක්‍රමෝපාය |
| CSR | ආයතනික සමාජ වගකීම |
| CSC | පාරිභෝගික සේවා මධ්‍යස්ථානය |
| CT | ධාරා තරාපැවි |
| CW&B | සිවිල් වැඩ හා ගොඩනැගිලි |
| CW&G | සිවිල් වැඩ හා ගරාජ |
| DAS | බෙදාහැරී ඇන්ටනා පද්ධතිය |
| DAQ | දත්ත උකහා ගැනුම් පද්ධතිය |
| DBT | සැලසුම්කොට ගොඩනගා මාරු කිරීම |
| DC | සෘජු ධාරාව |
| DCC | බෙදාහැරීමේ සම්බන්ධීකරණ කමිටුව |
| DD1 | බෙදාහැරීමේ අංශය 1 |
| DD2 | බෙදාහැරීමේ අංශය 2 |
| DD3 | බෙදාහැරීමේ අංශය 3 |
| DD4 | බෙදාහැරීමේ අංශය 4 |
| DFM | නියෝජ්‍ය මුදල් කළමනාකරු |
| DGA | විසුරුම්ගත වායු විශ්ලේෂණය |
| DGM | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී |
| DL | බෙදාහැරීමේ බලපත්ලාභියා |
| DSE&CSM | වෙරළ ආරක්ෂණ පරිසර හා සිවිල් ව්‍යුහ නඩත්තු |
| DSM | ඉල්ලුම් පාර්ශ්ව කළමනාකරණය |
| ECSC | විදුලි පාරිභෝගික සේවා මධ්‍යස්ථානය |
| EENS | නොසපයන ලද ඇස්තමේන්තුගත බලශක්තිය |
| EIA | පාරිසරික බලපෑම් ඇගයීම |
| EP | නැගෙනහිර පළාත |
| EPC | ඉංජිනේරු, ප්‍රසම්පාදන හා ඉදිකිරීම් |
| ERD | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව |
| ERP | ව්‍යාවසාය සම්පත් සැලසුම්කරණය |
| FS&PD | ක්‍රියාකාරී ක්‍රමෝපාය හා කාර්යක්‍රම ප්‍රවර්ධනය |
| FSUR | පාවෙන ගබඩා හා ප්‍රතිවායුකරණ ඒකකය |
| GCT&DLRP | මහ කොළඹ සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ හානි අවමකරණ ව්‍යාපෘතිය |
| GIS | වායු පරිවරණිත ස්විච්චිපන්න |
| GL | ජනන බලපත්ලාභියා |
| GM | සාමාන්‍යාධිකාරී |
| GOSL | ශ්‍රී ලංකා රජය |
| GPD & EEIIPP | හරිත විදුලිබල සංවර්ධන හා බලශක්ති කාර්යක්ෂමතා ප්‍රවර්ධන ආයෝජන වැඩසටහන් ව්‍යාපෘතිය |
| GPRS | General Packet Radio Service |
| GPS | ගෝලීය ස්ථානගතකරණ පද්ධතිය |
| GSS | කොටුමා උපපොළ |
| GT | වායු ටර්බයිනය |
| HDD | තිරස් අංශික විදුම |
| HQ | මූලස්ථානය |
| HR | මානව සම්පත් |
| HRT | පෙරාර උමග |
| HT | අධි ආතති |
| HV | අධි වෝල්ටීයතා |
| HVTLP | හබරණ වේයන්ගොඩ සම්ප්‍රේෂණ මාර්ග ව්‍යාපෘතිය |
| ICBC | චීන කර්මාන්ත හා වාණිජ බැංකුව |
| IEC | ජාත්‍යන්තර විද්‍යුත් තාක්ෂණික කොමිෂන් සභාව |
| IP | අභ්‍යන්තර ප්‍රොටෝකෝලය |
| IPP | ස්වාධීන විදුලි නිෂ්පාදකයෝ |
| IT | තොරතුරු තාක්ෂණය |
| IVR | අන්තර්ක්‍රියාකාරී හඬ ප්‍රතිචාරකය |
| JICA | ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය |
| KNGTP | කැළණිතිස්ස නව වායු ටර්බයින ව්‍යාපෘතිය |
| KPI | ප්‍රධාන කාර්යසාධන දර්ශක |
| KPS | කැළණිතිස්ස විදුලි බලාගාරය |
| LC | ලක්ෂපාන සංකීර්ණය |
| LCEG | අඩු පිරිවැය බලශක්ති ජනනය |
| LCLTGEP | අවම පිරිවැය දිගු කාලීන ජනන ව්‍යාප්ති සැලැස්ම |
| LECO | ලංකා විදුලි (පෞද්ගලික) සමාගම |
| LED | ආලෝක විමෝචන දියෝඩය |
| LHI | ලංකා හයිඩ්‍රෝලික් ආයතනය |
| LKR | ශ්‍රී ලංකා රුපියල් |
| LKAS | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති |
| LNG | ද්‍රව ස්වභාවික වායු |
| LOI | අභිප්‍රාය ලිපිය |
| LRP | ධාරිතා පර්යේෂණ වැඩසටහන |
| LT | අඩු ආතති |
| LTGEP | දිගු කාලීන ජනන ව්‍යාප්ති සැලැස්ම |
| LTTDP | දිගු කාලීන සම්ප්‍රේෂණ සංවර්ධන සැලැස්ම |
| LV | අඩු වෝල්ටීයතා |
| LVPP | ලක්විජය විදුලි බලාගාරය |
| MC | මහවැලි සංකීර්ණය |
| MCM | ඝණ මීටර මිලියන |
| MDMS | මනු දත්ත කළමනාකරණ පද්ධතිය |
| MEPS | අවම බලශක්ති කාර්යක්ෂමතා ප්‍රමිතිය |

# කෙටි යෙදුම්

| | |
|---|---|
| MHPP | මොරගොල්ල ජලවිදුලි ව්‍යාපෘතිය |
| MITFIN | ලං.වි.ම. මූල්‍ය මොඩියුලය |
| MIV | ප්‍රධාන පිවිසුම් වෑල්වය |
| MLKR | ශ්‍රී ලංකා රුපියල් මිලියන |
| MLTS | මධ්‍යම මට්ටමේ තාක්ෂණික කාර්ය මණ්ඩලය |
| MMT | මෙට්‍රික් ටොන් මිලියන |
| MOI | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| MOIWM | වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශය |
| MQTT | පණිවිඩ පෝළිම්ගත ටෙලිමිතික ප්‍රවාහනය |
| MUSD | එක්සත් ජනපද ඩොලර් මිලියන |
| MV | මැදි වෝල්ටීයතා |
| MVA | මෙගා වොට් ඇම්පියර් |
| MVMMS | මැදි වෝල්ටීයතා නඩත්තු කළමනාකරණ පද්ධතිය |
| MWPP | මන්නාරම සුළං විදුලි ව්‍යාපෘතිය |
| NAMA | ජාතික සුදුසු සමන කාර්යයන් |
| NCP | උතුරු මැද පළාත |
| NCRE | සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය |
| NEA | ජාතික පාරිසරික පනත |
| NGO | රාජ්‍ය නොවන සංවිධානය |
| NGR | උදාසීන බිම්ගත ප්‍රතිරෝධකය |
| NRE | පුනර්ජනීය නොවන බලශක්තිය |
| NSCC | ජාතික පද්ධති පාලන මධ්‍යස්ථානය |
| NTDND&EIP | ජාතික සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ ජාල සංවර්ධන හා බලශක්ති කාර්යක්ෂමතා ප්‍රවර්ධන ව්‍යාපෘතිය |
| NVQ | ජාතික වෘත්තීය සුදුසුකම |
| NVTI | ජාතික වෘත්තීය පුහුණු ආයතනය |
| NWP | වයඹ පළාත |
| OEM | මුල් උපකරණ නිෂ්පාදක |
| OH&S | වෘත්තීය සෞඛ්‍යය හා ආරක්ෂාව |
| OLRT | මාර්ගගත තත් කාලීන |
| P&D | සැලසුම් හා සංවර්ධන |
| PABX | පුද්ගලික ස්වයංක්‍රීය ශාඛා හුමාරුව |
| PAP | ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වූ පුද්ගලයා |
| PD | ව්‍යාපෘති අධ්‍යක්ෂ |
| PHM | ව්‍යාපෘති හා අඩිසැර නඩත්තු |
| PIV | ගෙවුම් වවුචරය |
| PLC | බල රැහැන් සංදේශ |
| PMU | ව්‍යාපෘති සංවර්ධන ඒකකය |
| POS | අලෙවි මධ්‍යස්ථානය |
| PPA | විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම |
| PRV | පීඩනය මුදා හැරීමේ වෑල්වය |
| PS | විදුලි බලාගාරය |
| PSS | ප්‍රාථමික උපපොළ |
| PSHPP | පොම්පගත ගබඩා ජල විදුලි බලාගාරය |
| PSRSP | විදුලිබල පද්ධති විශ්වසනීයත්වය බලගැන්වීමේ ව්‍යාපෘතිය |
| PUCSL | ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව |
| PV | ප්‍රකාශ වෝල්ටීයතාව |
| QMS | පෝළිම් කළමනාකරණ ක්‍රමය |
| R&D | පර්යේෂණ හා සංවර්ධන |
| RCC | රෝලර් සංගත කොන්ක්‍රීට් |
| RCL | ආලෝකකරණ ප්‍රාදේශීය මධ්‍යස්ථානය |
| REATDP | පුනර්ජනනීය බලශක්ති අවශෝෂණ සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය |
| PFP | යෝජනා ඉල්ලුම |
| ROI | ආයෝජන ප්‍රතිලාභ |
| ROW | මාර්ග අවසරය |
| RTU | දුරස්ථ පර්යන්ත ඒකකය |
| SAIDI | පද්ධති සාමාන්‍ය බිඳවැටුම් කාල සීමා දර්ශකය |
| SAIFI | පද්ධති සාමාන්‍ය බිඳවැටුම් සංඛ්‍යාත දර්ශකය |
| SAS | උපපොළ ස්වයංක්‍රීයකරණ පද්ධති |
| SC | සමනළ සංකීර්ණය |
| SCADA | අධීක්ෂණ පාලන හා දත්ත උකහා ගැනුම් |
| SCC | පද්ධති පාලන මධ්‍යස්ථානය |
| SCU | ක්‍රමෝපායික සන්නිවේදන ඒකකය |
| SDH | සම්මුහුර්ත අංකිත ධුරාවලිය |
| SESRIP | විදුලිබල සැපයුම් විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියට සහාය වීම |
| SFRA | ඇමදුම් සංඛ්‍යාත ප්‍රතිචාර විශ්ලේෂණය |
| SIU | විශේෂ විමර්ෂණ ඒකකය |
| SLBC | ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව |
| SLE | ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම |
| SLRC | ශ්‍රී ලංකා රූපවාහිනි සංස්ථාව |
| SLS | ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය |
| SLT | ශ්‍රී ලංකා ටෙලිකොම් |
| SME | සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර |
| SP | දකුණු පළාත |
| SPPA | ප්‍රමිතිගත විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් |
| SSBB | අංශ ඒකල බස්බාර් කුලුණ |
| SSL | ගුණ තත්ව ආලෝකකරණය |
| TCPP | ත්‍රිකුණාමලය ගල් අඟුරු විදුලිබල ව්‍යාපෘතිය |
| TIG | ටංග්ස්ටන් අක්‍රිය වායු |
| TL | සම්ප්‍රේෂණ බලපත්ලාභියා |
| TLCP | සම්ප්‍රේෂණ මාර්ග ඉදිකිරීම් ව්‍යාපෘතිය |
| TLM | සම්ප්‍රේෂණ මාර්ග නඩත්තුව |
| TM | භාණ්ඩාගාර කළමනාකරණය |
| TOU | පරිභරණ කාලය |
| TPCL | ට්‍රින්කොමලී පවර් කම්පනි ලිමිටඩ් |
| UG | භූගත |
| UK | එක්සත් රාජධානිය |
| UNT | ඒකරූපී ජාතික අයක්‍රමය |
| UOM | මොරටුව විශ්වවිද්‍යාලය |
| UOMDP | උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය |
| USD | එක්සත් ජනපද ඩොලර් |
| VIP | ඉතා වැදගත් පාර්ශ්ව සේවය |
| VPN | තාත්වික ප්‍රාය පුද්ගලික ජාලය |
| WPN | බස්නාහිර පළාත උතුර |
| WPS | බස්නාහිර පළාත දකුණ |

Designed & Printing by Sharp Graphic House (Pvt) Ltd